වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2010

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පේරාදෙණිය, ශ්‍රී ලංකාව



වාර්ෂික කාර්යසාධන වාර්තාව

2010

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

පේරාදෙණිය

ශ්‍රී ලංකාව

පෙරවදන

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සේවාවන් සැපයීමෙන් වසර තුළදී සාක්ෂාත් කර ගන්නා ලද ප්‍රගතිය පිළිබඳව මෙම වාර්ෂික කාර්ය සාධන වාර්තාවෙන් ගෙන හැර දැක්වේ. පසුගිය වසර වලදී මෙන්ම සමාලෝචනයට ලක් කෙරුණු කාල සීමාව තුළදී වැඩිදියුණු කළ කෘෂිකාර්මික තාක්ෂණය ජනනය කිරීම සහ පතුරුවාලීම මෙන්ම තිරසාර කෘෂිකාර්මික සංවර්ධනය අත්පත් කර ගැනීමෙහිලා අදාල සේවාවන් සැපයීම පරමාර්ථ කර ගෙන විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරුණු අතර 2010 වසර සඳහා වූ අපගේ අයවැය ප්‍රතිපාදනය රු: මිලියන 2312 කි.

2010 වසරේදී, බෝග නිෂ්පාදනය සහ ඵලදායිතාව ඉහළ නැංවීම, ආනයනික ආහාර ද්‍රව්‍ය කෙරෙහි වැය කෙරෙන විදේශ විනිමය අවම කිරීම, කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම, ගුණාත්මක බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම, දෙමුහුම් බීජ බිහි කිරීම ආදිය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරිණි. සහලින් ස්වයංපෝෂිත භාවයෙහි අහිමුවේ සිටින අප ආනයනය සීමා කිරීමේ අභිප්‍රායෙන් සහල්වල ගුණාත්මක ලක්ෂණ වැඩිදියුණු කිරීම සහ වෙනත් ආහාර බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දී ඇත.

දෙපාර්තමේන්තුවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමෙහිලා නන් අයුරින් දායකත්වය ලබා දුන් සියළුම දෙපාර්තමේන්තු නිළධාරීන් වෙත මා බෙහෙවින් කෘතඥ වන අතර මෙම වාර්තාව සම්පාදනය කිරීමේදී සහයෝගය ලබා දුන් සියළුම නිළධාරීන්ටද මාගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

කේ.එන්. මාන්කෝට්ටේ

කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින්

ප්‍රකාශයට පත් කරන ලදී

2010

මෙම වාර්තාව ශ්‍රී ලංකාවේ පේරාදෙණිය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ, ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය විසින් සම්පාදනය කොට සංස්කරණය කරන ලදී.

සියලුම හිමිකම් ඇවිරිණි. විවේචනය හා පුනරීක්ෂණය සඳහා කෙටි වාක්‍ය ඛණ්ඩවප උපුටා ගැනීම් හැරුණුවිට, මෙම ප්‍රකාශනයේ කිසිදු කොටසක් කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පූර්ණ අනුමැතියෙන් තොරව, නැවත ඉදිරිපත් කිරීම, පුනරුත්ථාපනය කළ හැකි වන සේ ගබඩා කර තැබීම, විද්‍යුත්, යාන්ත්‍රික, ඡායාස්ථිත, පටිගත කිරීම හෝ වෙනත් ක්‍රම උපයෝගි කරගනිමින් සම්ප්‍රේෂණය කිරීම සපුරා තහනම් වේ. අසාධාරණයක් නොවන පරිදි වාණිජ නොවන ස්වරූපයේ කටයුතු සඳහා මෙම අවසරය ලබාදීමට කටයුතු කරනු ලැබේ. ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ලබන ප්‍රකාශන වල, වාණිජ නොවන, කාර්යයන් සඳහා ප්‍රයෝජනයට ගැනීමේදී ගාස්තු ගෙවීම අනවශ්‍යවේ. කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතුවලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණාත්මක සොයාගැනීම් සඳහා අව්‍යාජව යොදා ගැනීමට මෙම හිමිකම් ඇවිරීමේ ප්‍රකාශය බාධාවක් නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉදිරි දැක්ම

ජාතියේ සෞභාග්‍යය උදෙසා කෘෂිකාර්මික විශිෂ්ඨත්වය සාක්ෂාත් කර ගැනීම.

මෙහෙවර

නව දියුණු කෘෂිකාර්මික තාක්ෂණය ජනනය කර ව්‍යාප්ත කිරීම සහ අදාල සේවාවන් ගොවීන් වෙත වැඩි අවධාරණයක් සහිතව සියළුම පාර්ශ්වකරුවන් වෙත ලබාදීමෙන් ජාතියේ ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා යෝග්‍ය සහ තිරසාර කෘෂිකාර්මික සංවර්ධනයක් අත්කර ගැනීම.

සම්බන්ධීකරණය

කේ. ඒ. එන්. කුරුකුලආරච්චි

උපදේශකත්වය

පී. කේ. කේ. ආර්. පෙරේරා

සංස්කරණය

පී. සී. පීරිස්

පරිවර්තනය හා සෝදුපත් කියවීම

ඩබ්.ඩී.යූ. නිරංජලා

ඊ. එම්. එස්. කේ. ඒකනායක

තාක්ෂණික සහාය

ඊ. එම්. අයි. සී. කේ. වේරපිටිය

යතුරු ලියනය

ලක්ෂානි සමරසිංහ

පිටු සැකසුම

ඒ. එන්. සාන්ත

අධ්‍යක්ෂ මණ්ඩලය

කේ.එන්. මාන්කෝට්ටේ මයා
(කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්)

ආචාර්ය ඩී.එම්.එන්. දිසානායක මයා

කේ.බී. වහුන්දෙණිය මයා

ආචාර්ය ඒ.ඒ.එල්. අමරසිංහ මයා

ජයන්ති අබේගුණවර්ධන මිය

සුනිල් ගෝවින්නගේ මයා

කේ. පියසේන මයා

ඉංජිනේරු එම්.එච්.එම්.ඒ. බණ්ඩාර මයා

ඒ.එම්.ටී.බී. අධිකාරි මයා

පී. වික්‍රමසිංහ මයා

පටුන

1. කාලගුණ වාර්තාව 1

2.1. ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, මහ ඉලුප්පල්ලම 13

2.1.1 මාෂ සහ තෙල් බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස 22

2.1.2 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, අරලගංවිල 29

2.1.3 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, කිලිනොච්චිය 34

2.2 උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, ගන්නෝරුව 38

2.2.1 පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය, හෝමාගම 57

2.2.2 පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - හොරන 63

2.2.3 ආහාර පර්යේෂණ ඒකකය - ගන්නොරුව 70

2.2.4 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල 73

2.2.6 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සීතාඑළිය 78

2.2.7 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල 85

2.2.8 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, ගිරාඳුරුකෝට්ටේ → කොහේද? 89

2.3 වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, බතලගොඩ 92

2.3.1 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, බෝඹුවල 108

2.4 ගොවිපල යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය මහඉලුප්පල්ලම 112

3.1 බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය - ගන්නොරුව 115

3.1.1 බීජ සහතික කිරීමේ සේවය - ගන්නොරුව 118

3.1.2 පැළෑටි සංරක්ෂණ සේවය - ගන්නොරුව 126

3.1.3 ජාතික පැළෑටි නිරෝධායන සේවය - කටුනායක 130

3.1.4 පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය, පේරාදෙණිය 138

3.1.5 පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය, ගන්නොරුව 143

3.2 බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, පේරාදෙණිය 151

3.3 සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය, පේරාදෙණිය 166

3.4 ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය, පේරාදෙණිය 172

3.5 ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය පේරාදෙණිය 176

3.6 ව්‍යාප්ති පුහුණු අංශය 182

4.1 පාලන අංශය 195

4.2 ඉංජිනේරු අංශය 201

4.3 මුදල් අංශය, පේරාදෙණිය 205

5. ප්‍රකාශන සහ ඉදිරිපත් කිරීම් 210

6. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ජ්‍යෙෂ්ඨ කාර්ය මණ්ඩලය - (2010.12.31 දිනට) 219

7. තාක්ෂණික කාර්ය මණ්ඩල සුදුසුකම් 232

1. කාලගුණ වාර්තාව

ශ්‍රී ලංකාවේ විවිධ කෘෂි පාරිසරික කලාප නියෝජනය කරන කෘෂි කාලගුණික මධ්‍යස්ථාන 13 කින් 2009/2010 මහ (සැප්තැම්බර් - පෙබරවාරි) සහ 2010 යල (මාර්තු - අගෝස්තු) කන්න වලදී එක් රැස් කර ගන්නා ලද කාලගුණික දත්ත සාරාංශ ගත කර තිබෙන මෙම වාර්තාව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ කෘෂි කාලගුණික අංශයෙන් පිළියෙල කරන ලදී.

පහතරට තෙත් කලාපය

බෝඹුවල (WL_{1b})

මෙම කලාපයේ මහ කන්නයේදී සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව අපේක්ෂිත ප්‍රමාණයට වඩා 20% කින් අඩු විය. ඔක්තෝම්බර් සහ ජනවාරි මාස වලදී සාමාන්‍ය වර්ෂාවට වඩා අඩු වර්ෂාපතනයක් පැවතීම මීට ප්‍රධන හේතුව විය. මේ අතර, නොවැම්බර් මාසයේදී ලද වර්ෂාපතනය අපේක්ෂිත ප්‍රමාණයට වඩා බෙහෙවින්ම වැඩි විය. වර්ෂාපතන ව්‍යාප්තිය අවිධිමත් වුවද අනෙකුත් කාලගුණික තත්ත්වයන්, විශේෂයෙන්ම, විහව වාෂ්පීකරණ උත්ස්වේදනය හිතකර පරාසයේ පැවතීම හේතුවෙන් ප්‍රදේශයේ කෘෂිකාර්මික නිෂ්පාදන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොවන්නට ඇත.

එහෙත්, 2010 යල කන්නයේ සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 48% ක් පමණ වැඩිවිය. දැඩි සංවහන ක්‍රියාවලිය සහ නිරිත දිග මෝසම් වැසි කලින් ලැබීම හේතුවෙන් මාර්තු මාසයේ සිට ජූනි දක්වා ලද වර්ෂාපතනයේ ධනාත්මක විෂමතාව මෙයට ප්‍රධාන හේතුව විය. මේ අතර, අනෙකුත් කෘෂි කාලගුණික පරාමිතින් වන විහව වාෂ්පීකරණ උත්ස්වේදනය, සුළඟේ වේගය, ආර්ද්‍රතාව සහ දීප්තිමත් හිරු එළිය පැවති පැය ගණන මෙම කලාපයේ 2010 යල කන්නයේ සාර්ථක බෝග නිෂ්පාදනයක් සඳහා හිතකර සංයෝජනයකින් පැවතුණි.

මැදරට තෙත් කලාපය

පේරාදෙණිය (WM_{2b})

නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලදී සාමාන්‍ය වර්ෂාපතනය ඉක්මවා වැසි ලැබීම හේතුවෙන් මෙම කලාපයේ මහ කන්නයේ සමුච්චිත වර්ෂාපතනය අපේක්ෂිත වැසි ප්‍රමාණය 35% කින් පමණ ඉක්ම වූවකි. ජනවාරි සහ පෙබරවාරි මාස වලදී මෙම ප්‍රදේශයේ සාමාන්‍ය වියළි කාලගුණික තත්ත්වයක් පැතිර පැවති අතර සීතල රාත්‍රී දිනයන්ද විය. කෙසේ වුවද, 2009/10 මහ කන්නයේදී බෝග වගාවේ සක්‍රිය වර්ධන අවධි වල දී අහිතකර පාංශු තෙතමන තත්ත්වයන් ඇති වීමට පැවති ඉඩකඩ අල්ප විය.

2010 යල කන්නයේදී මෙම කලාපයේ සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 60% ක පමණ වැඩිවීමක් වන අතර මෙයට ප්‍රධාන හේතුව වූයේ අප්‍රේල්, ජූලි, සහ අගෝස්තු යන මාස වලදී සාමාන්‍ය වර්ෂාපතනය ඉක්මවා යාමයි. සාමාන්‍යයෙන් අගෝස්තු මාසයේදී පවතින වියළි කාලගුණික තත්ත්වය මෙවර කන්නයේ දී දක්නට නොතිබුණ නමුත් කන්නය පුරා සෑම මාසයකදීම ලද වර්ෂාපතනය විහව වාෂ්පීකරණ උත්ස්වේදනයට වඩා වැඩි විය.

උඩරට තෙත් කලාපය

සීතා එළිය (WU_3)

2009/10 මහ කන්නයේදී මෙම කලාපයේ සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 16% ක් පමණ ඉක්මවා ගිය මි.මී. 1,244 ක වර්ෂාපතනයකි. නොවැම්බර් සහ දෙසැම්බර් යන මාස දෙකේ දී ලද වැසි සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා ගිය අතර ජනවාරි සහ පෙබරවාරි මාස වලදී අසාමාන්‍ය වියළි කාලගුණික තත්ත්වයක් පැවතුණි. අපේක්ෂිත පරිදි කන්නය පුරාවටම මෙම කලාපයේ පැවති විහව වාෂ්පීකරණ උත්ස්වේදනය සෑම මාසයකදීම වර්ෂාපතනයට වඩා පහළ මට්ටමක පැවතුණි. වායු ගෝලයේ වාෂ්පීකරණ ඉල්ලුම පහළ මට්ටමක පැවති බැවින් කන්නය තුළදී අහිතකර පාංශු තෙතමන තත්ත්වයන් වර්ධනය වීමට පැවති ඉඩකඩ අල්ප විය. මෙම කන්නය තුළ උපරිම උෂ්ණත්වය සෙ 15^0 - 24^0 ත් අතර ද අවම උෂ්ණත්වය සෙ. 7^0 --15^0 ත් අතර පරාසයකද පැවතුණි. නමුත් සාමාන්‍ය තත්ත්වය වූ පොළොවේ පිණි මිදී තිබූ අවස්ථා වලින් තොර විය.

2010 යල කන්නයේ දී මෙම කලාපයේ සමුච්චිත වර්ෂාපතනය මි.මී. 1,125 ක් වූ අතර එය 45% කින් පමණ දිගු කාලීන සාමාන්‍ය අගය ඉක්මවූවකි. මාර්තු, මැයි, ජූනි සහ අගෝස්තු මාස වල දී

සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා වැසි ලැබීම මීට ප්‍රධාන හේතුව විය.

කෙසේ වුවද, යල කන්නයේ පැවති වර්ෂා ව්‍යාප්තිය සහ අනෙකුත් කෘෂි කාලගුණික පරාමිතීන් මෙම කලාපයේ සාර්ථක බෝග වර්ධනයක් සඳහා හිතකර සංයෝජනයකින් පැවතුණි. කන්නයේ උපරිම උෂ්ණත්වය සෙ. 19^0 - 24^0 ත් අතරද අවම උෂ්ණත්වය සෙ. 6^0 - 16^0 ත් අතරද පැවතුණි.

පහත රට අතරමැදි කලාපය

බතලගොඩ (IL_1a)

2009/10 මහ කන්නයේ දී ලද සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව අපේක්ෂිත කන්නමය වර්ෂාපතනයට වඩා 12% කින් පමණ අඩු වූවකි. ඔක්තෝම්බර්, ජනවාරි සහ පෙබරවාරි යන මාස වලදී මෙම කලාපයේ පැවති වියළි තත්ත්වයන් මෙයට ප්‍රධාන හේතුව විය. කෙසේ වුවද, දෙසැම්බර් මාසයේදී මෙම කලාපයට තරමක් යහපත් වැසි ලැබිණි. තවද, කලාපයේ මාසික සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදනය කන්නයේ සෑම මසකදීම ලද මුළු වර්ෂාපතන ප්‍රමාණයට වඩා පහළ මට්ටමක පැවති අතර අනෙකුත් කෘෂි කාලගුණික පරාමිතීන්ද හිතකර සංයෝජනයකින් පැවතුණි.

2010 යල කන්නයේදී ලද සමුච්චිත වර්ෂාපතනය මි.මී. 1,124 ක් පමණ වූ අතර එය කලාපයේ දිගු කාලීන සාමාන්‍ය 62% කින් පමණ ඉක්ම වූවකි. අප්‍රේල් මාසයේ දී සංවහන ක්‍රියාවලිය වර්ධනය වීමත් හේතුවෙන් අප්‍රේල් සිට ජූලි මාසය දක්වා සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා වැසි ලැබීම වර්ෂාපතනයේ මෙම සැලකිය යුතු ඉහළ ධනාත්මක විෂමතාවයට ප්‍රධාන හේතුව විය. කන්නයේ සෑම මසකදීම ලද මුළු වර්ෂාපතනය සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදනයට වඩා වැඩි වූ බැවින් මෙම කලාපයේ ගොඩ බෝග කෙරෙහි මෙන්ම වර්ෂා පෝෂිතව සහ සුළු වාරිමාර්ග ක්‍රම යටතේ සිදු කරන ලද වී වගාවන් කෙරෙහිද අඩු පාංශු තෙතමන තත්ත්වයක් ඇති නොවන්නට ඇත.

මොණරාගල (IL_1c)

සැප්තැම්බර් සහ ජනවාරි මාස වලදී ලද වර්ෂාපතනයේ සෘණාත්මක විෂමතාවයන් පැවතීම නිසා මෙම ප්‍රදේශයේ 2009/2010 මහ කන්නයේ වර්ෂාපතනය 13% කින් අඩු වී ඇති බැව් වාර්තා විය. කෙසේ වුවද, කන්නය තුළ අනෙකුත් සෑම මාසයකදීම අපේක්ෂිත ප්‍රමාණයෙන් හෝ ඊට වැඩි ප්‍රමාණයකින් වැසි ලැබීම හේතුවෙන් මෙම ප්‍රදේශයේ බෝග නිෂ්පාදනය කෙරෙහි සැලකිය යුතු අන්දමේ බලපෑමක් ඇති නොවන්නට ඇත.

2010 යල කන්නයේ සමුච්චිත වර්ෂාපතනය මි.මී. 878 ක් වූ අතර දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව එය 55% ක පමණ වර්ධනයකි. මාර්තු, මැයි සහ අගෝස්තු මාස වලදී සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවූ වැසි ලැබීම මෙම සැලකිය යුතු ධනාත්මක විෂමතාවයට ප්‍රධාන හේතුව විය. මේ හේතුවෙන් ජූනි සහ ජූලි මාස දෙක අතර කාලය තුළ දී පමණක් කෙටි කාලීන බෝග සඳහා හිතකර තත්වයක් උදා කරමින් සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදනයට වඩා අඩු වර්ෂාපතනයක් ලැබුණි.

ගිරාදුරුකෝට්ටේ (IL_2)

2009/2010 මහ කන්නය තුළ හිතකර ව්‍යාප්තියකින් යුතුව සාමාන්‍ය සමුච්චිත වර්ෂාපතනයකට ආසන්න වූ මි.මී. 1,687 ක වර්ෂාවක් මෙම කෘෂි පාරිසරික කලාපයෙන් වාර්තා වී ඇත.

මෙම කලාපයේ යල කන්නයේ සමුච්චිත වර්ෂාපතනය මි.මී. 687 ක් පමණ වූ අතර දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව එය 60% ක පමණ වර්ධනයකි. මාර්තු, අප්‍රේල් සහ ජූලි යන මාස වල දී සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා වැසි ලැබීම මීට ප්‍රධාන හේතුව වූ අතර මෙම තත්ත්වය මෙම කලාපයේ කලාතුරකින් ඇතිවන කාලගුණික සංසිද්ධියකි.

මැදරට අතරමැදි කලාපය

කුණ්ඩසාලේ (IM_{3a})

මෙම කලාපයේ 2009/2010 මහ කන්නයේ සමුච්චිත වර්ෂාපතනය මි.මී. 918 ක් වූ අතර දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව එය 14% ක පමණ වර්ධනයකි. ඔක්තෝම්බර්, දෙසැම්බර් සහ ජනවාරි මාස වලදී සාමාන්‍ය වර්ෂාපතනය ඉක්මවා වැසි ලැබීම මීට ප්‍රධාන හේතුව විය. කන්නමය වර්ෂාපතනයේ මෙම ධනාත්මක විෂමතාවයන් සමඟ අනෙකුත් කෘෂි කාලගුණික පරාමිතීන්ද කලාපයේ සාර්ථක බෝග නිෂ්පාදනයක් සඳහා හිතකරව සංයෝජනය වී පැවතුණි.

අප්‍රේල් සහ අගෝස්තු මාස වලදී සාමාන්‍ය ප්‍රමාණය ඉක්මවා වර්ෂාව ලැබුණු බැවින් 2010 යල කන්නයේ සමුච්චිත වර්ෂාපතනය අපේක්ෂිත ප්‍රමාණය 20% කින් ඉක්මවූවකි. මෙම කලාපයේ අනෙකුත් කෘෂි කාලගුණික පරාමිතීන්ද යහපත් බෝග වර්ධනයක් සඳහා හිතකර මට්ටම් වල පැවතුණි.

උඩරට අතරමැදි කලාපය

බණ්ඩාරවෙල (IU_{3c})

මෙම කලාපයේ 2009/2010 මහ කන්නයේ සාමාන්‍ය සමුච්චිත වර්ෂාපතනය එහි දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව 25% කින් පමණ අඩු වූවකි. කෙසේ වුවද, සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදන අගයන් කන්නයේ සක්‍රිය බෝග වර්ධන අවධිවල සෑම මසකම ලද වර්ෂාපතනයට වඩා අඩු වූ අතර මේ හේතුවෙන් අහිතකර වියළි තත්වයන් වර්ධනය වීම වැලකුණි. කන්නයේ උපරිම උෂ්ණත්වය සෙ. 9^0 - 19^0 ත් අතරද අවම උෂ්ණත්වය සෙ. 9^0 - 19^0 අතර පරාසයකද පැවතුණි.

යල කන්නයේ සමුච්චිත වර්ෂාපතනය දිගු කාලීන සාමාන්‍යයට වඩා 52% කින් වැඩි වූවකි. මාර්තු, අප්‍රේල්, මැයි සහ අගෝස්තු මාස වලදී ලද වර්ෂාව සාමාන්‍ය වර්ෂාපතනය ඉක්ම වූවක් වීම මීට ප්‍රධාන හේතුව විය. විභව වාෂ්පීකරණ උත්ස්වේදනය කන්නයේ බොහෝ අවස්ථාවලදී වර්ෂාපතනයට වඩා අඩු මට්ටමක පැවතුණි. මෙම තත්ත්වය කලාපයේ වර්ෂාපෝෂිත එළවළු නිෂ්පාදනය කෙරෙහි හිතකරව පවතින්නට ඇත. කන්නයේ උපරිම උෂ්ණත්වය සෙ. 23^0 - 30^0 ත් අතර සහ අවම උෂ්ණත්වය සෙ 11^0 - 20^0 ත් අතර පරාසයක පැවතුණි.

වියළි කලාපය

මහ ඉලුප්පල්ලම (DL_{1b})

DL_{1b} කෘෂි පාරිසරික කලාපයේ උතුරු මැද කොටසට මහ කන්නයේ දී ලැබුණු සමුච්චිත වර්ෂාපතනය මි.මී. 743 ක් වූ අතර එය දිගු කාලීන සාමාන්‍යයට වඩා 26% කින් අඩු වූවකි. සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාස වල දී ප්‍රමාද වී ආරම්භ වූ වර්ෂාව සාමාන්‍ය ප්‍රමාණයට වඩා අඩු වීම සමුච්චිත කන්නමය වර්ෂාපතනයේ අඩුවීමට ප්‍රධාන හේතුව විය. එසේ වුවද, වායු ගෝලයේ ජල ඉල්ලුම කන්නයේ සක්‍රීය වර්ධන අවධියේ සෑම මාසයකදීම ලද වර්ෂාපතනයට වඩා අඩු විය.

2010 යල කන්නයේ සමුච්චිත වර්ෂාපතනය දිගු කාලීන සාමාන්‍යය වූ මි.මී. 384 හා සංසන්දනාත්මකව 44% ක පමණ වැඩිවීමකි. ජූනි මාසයේදී හැරුණු විට කන්නය පුරාවටම ලද සාමාන්‍ය වර්ෂාපතනය ඉක්ම වූ වැසි මෙයට ප්‍රධාන හේතුව විය. කන්නයේ මුල් මාස තුනේදී වායුගෝලීය ජල ඉල්ලුම වර්ෂාපනයට වඩා පහළ මට්ටමක පැවතුණ අතර එම තත්ත්වය හේතුවෙන් උඩරට කෙටි කාලීන බෝග ජල හිඟයකට අනාවරණය නොවී වර්ධනය වන්නට ඇත.

අඟුණකොළපැලැස්ස (DL_{1b})

DL_{1b} කෘෂි කාලගුණික කලාපයේ දකුණු කොටසට 2009/2010 මහ කන්නයේදී ලැබුණු වර්ෂාපතනය සාමාන්‍ය වර්ෂාපතනයට වඩා 14% කින් පමණ අඩු වූවකි. වර්ෂාව ප්‍රමාද වී ආරම්භ වීමත් සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාස වලදී වර්ෂාව සාමාන්‍ය ප්‍රමාණයට වඩා අඩු වීමත් මෙම ඍණාත්මක විෂමතාවට ප්‍රධාන හේතුව විය. මේ අතර කන්නයේ මාසික විභව වාෂ්පීකරණ උත්ස්වේදනය බෝග වගාවල සක්‍රීය වර්ධන අවධියේ දී ලද මාසික වර්ෂාපතනයට වඩා පහළ මට්ටමක විය.

මෙම කලාපයේ 2010 යල කන්නයේදී සාමාන්‍ය අගයට වඩා 45% ක පමණ වර්ධනයක් පෙන්නුම් කළ සමුච්චිත වර්ෂාපතනය මි.මී. 630 ක් විය. අප්‍රේල් සහ මැයි මාස වලදී හොඳින් වැසි ලැබීම කන්නමය වර්ෂාපතනයේ මෙම ධනාත්මක විෂමතාවයට ප්‍රධාන හේතුව විය. නමුත් අප්‍රේල් සහ මැයි මාස වලදී හැරුණු විට කන්නයේ සෙසු මාස වලදී ලද මාසික වර්ෂාපතනයට වඩා විභව වාෂ්පීකරණ උත්ස්වේදනය වැඩි විය. එබැවින්, අතිරේක ජල සම්පාදනයක් නොවී නම් වර්ෂාපෝෂිතව වගා කෙරෙන උඩරට බෝග ඌන පාංශු තෙතමන තත්වයන්ට ලක්වන්නට ඇත.

අරලගංවිල (DL_{2b})

2009/2010 මහ කන්නයේදී සැප්තැම්බර්, ඔක්තෝම්බර් සහ ජනවාරි මාස වලදී වර්ෂාව අඩු වීම හේතුවෙන් මෙම කලාපයේ වර්ෂාපතනය සාමාන්‍ය අගයට වඩා 14% කින් අඩුවිය. කෙසේ වුවද, දෙසැම්බර් මාසයේ දී අපේක්ෂිත ප්‍රමාණයට වඩා වැඩි වැසි ලැබීමෙන් ඍණාත්මක විෂමතාවයේ පරතරය නොසැලකිය හැකි තරම් විය. මේ අතර කන්නයේ සක්‍රීය වර්ධන අවධියේදී සෑම මාසයකදීම වායු ගෝලීය ජල ඉල්ලුම සමුච්චිත වර්ෂාපතනයට වඩා අඩු වූ බැවින් මෙම කලාපයේ ගොඩබිම වගා කරන ලද බෝග අහිතකර පාංශු තෙතමන තත්ත්වයන්ට ලක් වීමට පැවති ඉඩකඩ අල්ප විය.

මෙම කලාපයේ 2010 යල කන්නයේ සමුච්චිත කන්නමය වර්ෂාපතනය 40% ක වැඩි වීමක් වන අතර අප්‍රේල් සහ මැයි මාස වලදී සාමාන්‍ය වර්ෂාපතනය ඉක්මවා වැසි ලැබීම මෙයට ප්‍රධාන හේතුව විය. නමුත්, කන්නයේ අවසන් භාගයේදී ලද වර්ෂාවට වඩා වායු ගෝලයේ වාෂ්පීකරණ ඉල්ලුම වැඩි විය. මේ හේතුවෙන් යල කන්නයේදී අතිරේක ජල සම්පාදනයක් නොවී නම් බෝග වගාව සාර්ථක නොවන්නට ඇත. සාමාන්‍යයෙන් මෙම කලාපයේ යල කන්නයේදී යහපත් කාලගුණික රටාවක් නොපවතින මුත් 2010

යල කන්නය හිතකරව පැවති බව කාලගුණ වාර්තා වලින් අනාවරණය විය. යාබද IL_2 කලාපයේද 2010 යල කන්නයේ කාලගුණික තත්ත්වයන් මේ හා සමාන තත්ත්වයේ පැවතුණි.

වීරවිල (DL_5)

දිවයිනේ සෙසු කලාප සේම, DL_5 කෘෂි පාරිසරික කලාපය විශේෂත්වයක් නොදරන අතර, මි.මී. 823 ක් වූ දිගු කාලීන සාමාන්‍ය හා සංසන්දනාත්මකව ගත් කළ 2009/2010 මහ කන්නයේ සාමාන්‍ය සමුච්චිත වර්ෂාපතනය 29% කින් පමණ අඩු විය. ප්‍රධාන වශයෙන්ම සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාස වලදී වර්ෂාපතනය අඩු වූ අතර නොවැම්බර් මාසයේදී වැඩි වර්ෂාපතනයක් ලැබුණි. එහෙත් 2009 යල කන්නයේ දී සාමාන්‍ය වර්ෂාපතනයට ආසන්න වූ මි.මී. 294 ක වර්ෂාවක් ලැබුණු නමුත් සමුච්චිත විභව වාෂ්පීකරණ උත්ස්වේදනය කන්නයේ සක්‍රිය වර්ධන අවධියේදී සෑම මාසයකම සමුච්චිත වර්ෂාපතනයට වඩා බෙහෙවින් වැඩි විය. අතිරේක ජල සම්පාදනයකින් තොරව වගා කළ බෝග අසාර්ථක විය හැකි දැඩි සූර්ය රශ්මිය සහ වේගවත් සුළං සහිත ඉහළ උෂ්ණත්වයක් කන්නය පුරාවටම පැවතුණි. කෙසේ වුවද, දිවයිනේ වියළිම කලාපය ලෙස වසරේ මෙම කාල පරිච්ඡේදයේදී මෙවන් කාලගුණික තත්ත්වයක් පැවතීම මෙම කලාපයට අසාමාන්‍ය තත්ත්වයක් නොවේ.

වගු අංක 1:1 2009/2010 මහ සහ 2010 යල කන්න තුළ ලද මුළු වර්ෂාපතනය (මි.මී.)

කෘෂි කාලගුණික ස්ථානය	කෘෂි පාරිසරික කලාප	2009/10 මහ සැප්තැම්බර් - පෙබරවාරි	මහ කන්නයේ දස වසරක සාමාන්‍ය (1999 - 2008)	2010 යල මාර්තු - අගෝස්තු	යල කන්නයේ දස වසරක සාමාන්‍ය (1999 - 2008)
බෝඹුවල	WL_{1b}	1257.1	1571.9	2097.3	1421.1
පේරාදෙණිය	WM_{2b}	1278.1	946.6	1505.3	944.3
සීතා එළිය	WU_3	1244.2	1075.6	1125.5	778.1
බතලගොඩ	IL_{1a}	913.0	1032.2	1124.4	694.8
මාකඳුර	IL_{1a}	1059.6	1095.6	1162.4	915.7
මොණරාගල	IL_{1c}	1096.8	1265.8	877.8	565.3
ගිරාදුරුකෝට්ටේ	IL_2	1687.4	1651.4	687.3	428.1
කුණ්ඩසාලේ	IM_{3a}	918.3	796.5	698.6	586.1
බණ්ඩාරවෙල	IU_{3c}	771.9	1038.3	916.8	590.6
මහ ඉලුප්පල්ලම	DL_{1b}	743.3	1006.5	552.7	384.2
අඟුණකොළපැලැස්ස	DL_{1b}	650.1	758.9	630.1	432.8
අරලගංවිල	DL_{2b}	1302.7	1515.4	507.3	362.0
වීරවිල	DL_5	584.6	823.1	293.8	306.9

වගු අංක 1.2 : 2009/10 මාසික මුළු වර්ෂාපතනය (මි.මී.)

කෘෂි කාලගුණික ස්ථානය	2009				2010							
	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.	ජන.	පෙබ.	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ.
බෝඹුවල	253.4	109.9	538.3	230.7	33.8	91.0	221.3	406.2	714.8	338.6	251.0	165.4
පේරාදෙණිය	169.4	397.5	372.4	294.9	36.4	7.7	119.2	450.6	126.5	203.0	302.4	303.6
සීතා එළිය	165.2	230.6	350.0	352.3	108.0	38.1	170.4	196.9	218.4	255.1	133.0	151.7
බතලගොඩ	117.9	209.4	223.7	304.5	55.8	1.7	127.3	311.5	298.5	128.1	160.9	98.1
මාකඳුර	292.6	150.3	270.4	262.6	77.9	5.8	94.8	320.2	498.5	149.7	83.6	15.6
මොණරාගල	16.0	222.9	468.6	271.9	94.2	23.2	159.2	172.7	308.8	49.4	26.4	161.3
ගිරාඳුරුකෝට්ටේ	50.4	211.7	414.3	767.7	171.3	72.0	92.3	311.1	71.2	40.9	116.4	55.4
කුණ්ඩසාලේ	71.3	238.3	240.3	306.3	45.6	16.5	42.7	255.1	94.2	78.6	79.6	148.4
බණ්ඩාරවෙල	27.5	136.2	263.9	285.7	47.6	11.0	192.8	259.1	240.9	51.1	137.8	35.1
මහ ඉලුප්පල්ලම	1.0	114.4	312.4	215.0	68.6	31.9	95.4	236.5	63.2	2.6	55.9	99.1
අඟුණකොළපැලැස්ස	79.4	42.2	339.6	155.6	14.2	19.1	35.3	172.0	203.9	73.9	42.5	102.5
අරලගංවිල	25.6	117.3	336.4	652.9	123.7	46.8	21.8	149.6	221.8	35.4	31.8	46.9
වීරවිල	22.1	65.1	329.9	146.2	15.3	6.0	18.5	146.0	79.5	14.4	11.9	23.5

අංක 1.3 : මාසික සාමාන්‍ය වර්ෂාපතනය (මි.මී.) - (1999 - 2008)

කෘෂි කාලගුණික ස්ථානය	මාසය											
	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.	ජන.	පෙබ.	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ.
බෝඹුවල	298.5	536.2	295.2	193.0	157.5	135.1	139.6	282.5	434.0	224.5	152.6	188.0
පේරාදෙණිය	132.9	249.0	263.6	161.2	99.3	74.0	145.4	305.3	119.4	153.2	126.7	94.3
සීතා එලිය	151.7	243.1	240.3	187.5	203.0	95.2	100.7	167.4	134.4	148.9	123.4	103.3
බතලගොඩ	111.4	335.7	275.5	148.7	107.7	84.9	120.8	250.2	92.9	96.3	63.3	71.3
මාකඳුර	163.4	419.9	263.8	92.7	73.3	83.8	136.8	246.9	194.2	151.9	85.5	100.4
මොණරාගල	107.7	292.6	344.1	236.8	207.8	123.1	83.8	252.8	78.9	32.3	54.2	63.3
ගිරාඳුරුකෝට්ටේ	79.8	186.3	439.7	426.5	441.3	214.3	117.3	161.9	48.4	18.3	32.4	49.8
කුණ්ඩසාලේ	78.7	176.5	216.5	164.1	121.4	82.6	114.7	184.4	68.4	90.4	60.6	67.6
බණ්ඩාරවෙල	126.4	286.1	259.4	166.8	144.7	80.5	114.7	215.3	112.0	49.5	44.6	54.5
මහ ඉලුප්පල්ලම	92.6	273.1	268.1	185.6	117.2	106.1	84.5	183.8	55.1	23.7	19.7	17.5
අඟුණකොළපැලැස්ස	97.0	166.6	228.1	124.5	87.7	72.0	111.4	104.5	75.3	47.9	41.9	51.8
අරලගංවිල	69.2	266.5	399.2	364.3	302.7	162.2	77.3	125.4	48.3	28.0	33.4	49.7
වීරවිල	48.9	167.9	292.0	160.6	95.9	65.9	69.8	125.0	44.6	17.9	14.5	35.1

වගු අංක 1.4 : මාසික විභව වාෂ්පීකරණ උත්ස්වේදනය (මි.මී.) - 2009/10

කෘෂි කාලගුණික ස්ථානය	2009				2010							
	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.	ජන.	පෙබ.	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ.
බෝඹුවල	81.6	86.8	55.2	71.9	74.4	76.2	101.7	86.4	76.9	76.9	64.5	67.0
පේරාදෙණිය	74.4	86.8	50.4	59.5	89.3	112.0	121.5	84.0	71.9	74.4	71.9	69.4
සීතා එළිය	50.4	69.4	38.4	47.1	69.4	91.8	104.2	67.2	57.0	59.5	54.6	*
බතලගොඩ	84.0	86.8	60.0	62.0	84.3	91.8	111.6	81.6	89.3	86.8	79.4	86.8
මාකඳුර	91.2	89.3	67.2	69.4	96.7	100.8	109.1	86.4	84.3	81.8	111.6	99.2
මොණරාගල	122.4	109.1	50.4	54.6	69.4	85.1	109.1	81.6	91.8	86.8	91.8	91.8
ගිරාඳුරුකෝට්ටේ	103.2	106.6	62.4	*	67.0	69.4	94.2	*	101.7	*	96.7	104.2
කුණ්ඩසාලේ	96.0	81.8	48.0	52.1	64.5	96.3	104.2	76.8	101.7	71.9	94.2	81.8
බණ්ඩාරවෙල	67.2	71.9	40.8	39.7	59.5	71.7	79.4	64.8	64.5	69.4	69.4	69.4
මහ ඉලුප්පල්ලම	100.8	76.9	38.4	37.2	54.6	67.2	96.7	64.8	79.4	89.3	94.2	94.2
අඟුණකොළපැලැස්ස	112.8	131.4	60.0	76.9	101.7	112.0	129.0	110.4	99.2	106.6	109.1	124.0
අරලගංවිල	168.0	131.4	55.2	49.6	67.0	69.4	91.8	91.2	109.1	119.0	124.0	129.0
වීරවිල	144.0	133.9	79.2	*	74.4	94.1	106.6	91.2	91.8	109.1	121.5	129.0

* දත්ත නොමැත

වගු අංක 1.5 : උපරිම සහ අවම වායුගෝලීය උෂ්ණත්වය (සෙ. ^{0}) - 2009/10

කෘෂි කාලගුණික ස්ථානය	2009								2010															
	සැප්.		ඔක්.		නොවැ.		දෙසැ.		ජන.		පෙබ.		මාර්තු		අප්‍රේල්		මැයි		ජූනි		ජූලි		අගෝ.	
	උ.	අව.	උ.	අව.	උ.	අව.	උ.	අව.	උ.	අව.	උ.	අව.	උ.	අව.	උ.	අව.	උ.	අව.	උ.	අව.	උ.	අව.	උ.	අව.
බෝඹුවල	30.4	24.0	31.2	22.9	30.4	22.7	31.0	22.6	31.5	21.7	31.8	22.4	32.3	22.8	32.3	23.8	31.4	23.7	30.7	23.3	30.3	23.5	29.9	25.1
පේරාදෙණිය	29.2	21.3	30.6	20.5	29.6	20.6	29.0	20.8	29.4	19.7	31.9	19.2	33.4	20.8	32.8	22.1	31.3	22.3	29.8	22.0	29.3	21.5	28.7	21.6
සීතා එළිය	19.1	12.9	20.5	11.9	19.2	12.8	19.2	12.7	19.7	11.7	21.8	11.4	22.6	12.2	22.3	13.9	*	14.6	*	13.9	*	13.4	*	*
බතලගොඩ	31.2	23.8	32.3	22.6	31.1	22.7	30.1	22.5	30.1	21.4	32.8	21.2	35.3	22.2	34.1	24.1	32.6	24.4	31.1	24.0	30.7	23.5	30.5	23.5
මාකඳුර	30.9	24.2	32.1	23.6	31.3	23.3	30.5	23.3	31.7	22.3	34,0	22.4	34.9	23.6	33.5	24.6	32.3	25.4	31.6	25.0	31.1	24.7	31.3	24.9
මොණරාගල	36.4	*	35.2	*	29.9	*	30.9	*	30.7	*	32.6	*	35.6	*	35.0	*	34.4	*	34.0	23.1	34.4	22.0	34.7	22.1
ගිරාඳුරුකෝට්ටේ	34.7	23.6	34.6	23.1	31.0	23.2	29.7	23.3	29.9	22.1	31.2	22.2	33.9	23.0	34.6	24.6	35.1	24.9	*	*	*	23.7	34.8	23.7
කුණ්ඩසාලේ	29.6	21.3	31.0	21.9	29.2	19.9	28.7	19.8	28.1	19.0	31.1	18.4	32.9	19.7	32.5	21.5	31.2	22.0	29.8	21.5	29.2	21.1	28.4	20.9
බණ්ඩාරවෙල	27.4	16.8	26.8	15.9	24.5	16.6	23.7	16.6	23.7	15.4	26.5	13.9	27.9	15.2	27.3	17.5	27.8	17.5	27.0	17.6	26.7	16.8	27.2	17.0
මහ ඉලුප්පල්ලම	32.7	24.5	33.3	22.8	30.4	22.7	29.7	22.5	30.6	20.9	32.4	21.3	35.1	22.7	34.8	24.6	33.1	25.0	32.9	24.9	33.0	24.1	32.1	24.1
අඟුණකොළපැල ඇස්ස	32.6	23.9	33.7	23.1	30.7	22.5	31.2	22.7	31.6	21.5	33.1	21.7	34.1	22.8	33.8	23.8	32.4	24.3	32.4	24.1	32.5	23.9	32.7	24.6
අරලගංවිල	35.8	23.2	35.7	22.3	31.5	22.6	30.4	22.6	31.0	21.3	32.3	21.3	35.3	21.9	36.7	23.6	36.0	24.0	35.1	24.2	34.0	23.5	34.4	22.7
වීරවිල	34.5	24.6	34.9	24.2	31.4	23.4	32.8	23.1	31.9	23.8	32.6	23.6	35.0	24.1	34.4	24.7	32.9	25.2	33.6	25.1	34.5	24.6	34.5	24.4

* දත්ත නොමැත

වගු අංක 1.6 : සාපේක්ෂ ආර්ද්‍රතාව (%) - 2009/10

කෘෂි කාලගුණික ස්ථානය	2009								2010															
	සැප්.		ඔක්.		නොවැ.		දෙසැ.		ජන.		පෙබ.		මාර්තු		අප්‍රේල්		මැයි		ජූනි		ජූලි		අගෝ.	
	උ.	ස.	උ.	ස.	උ.	ස.	උ.	ස.	උ.	ස.	උ.	ස.	උ.	ස.	උ.	ස.	උ.	ස.	උ.	ස.	උ.	ස.	උ.	ස.
බෝඹුවල	83	76	82	74	88	80	85	75	81	62	85	69	82	67	87	77	88	81	88	80	87	80	84	79
පේරාදෙණිය	80	75	80	71	86	79	88	80	82	68	75	55	77	55	83	73	85	77	83	79	83	77	84	77
සීතා එළිය	91	88	79	85	88	91	88	90	77	82	63	67	62	74	81	87	88	89	91	90	93	91	*	*
බතලගොඩ	84	72	86	66	91	76	91	80	87	68	86	59	83	51	87	72	86	77	84	77	86	78	85	82
මාකඳුර	84	75	79	69	86	76	89	79	87	71	85	68	87	76	88	83	90	84	89	85	89	84	89	87
මොණරාගල	73	66	77	72	89	85	88	84	86	77	84	68	80	66	85	76	88	77	82	67	80	72	78	60
හිරාඳුරුකෝට්ටේ	72	56	76	58	90	80	91	85	91	75	90	71	87	61	85	*	84	*	79	*	80	65	78	59
කුණ්ඩසාලේ	72	68	78	62	74	76	84	75	77	70	77	53	77	49	81	62	87	70	78	72	80	72	79	68
බණ්ඩාරවෙල	72	65	74	65	86	81	89	82	84	75	75	67	75	62	81	77	79	78	72	70	73	68	71	64
මහ ඉලුප්පල්ලම	77	58	81	56	90	77	93	79	91	65	89	59	85	49	85	71	85	74	81	63	82	66	83	68
අඟුණකොළපැලැස්ස	78	70	75	67	87	83	88	81	86	73	83	72	80	69	81	77	84	79	83	74	81	70	77	68
අරලගංවිල	62	48	68	55	85	77	89	81	86	71	87	64	83	57	74	63	76	58	71	57	68	59	67	56
විරවිල	70	62	68	59	84	83	88	80	81	70	78	71	75	62	80	68	85	76	77	67	76	61	74	61

උ. - උදය 8.30 පැයෙහි අගය

ස. - සවස 15.30 පැයෙහි අගය

* දත්ත නොමැත

වගු අංක 1.7 : දීප්තිමත් හිරු එළිය පැවති පැය ගණන - 2009/10

කෘෂි කාලගුණික ස්ථානය	2009				2010							
	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.	ජන.	පෙබ.	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ.
බෝඹුවල	6.6	7.9	4.7	6.5	8.3	8.2	8.1	6.5	5.9	6.1	5.3	5.5
පේරාදෙණිය	5.8	7.1	3.6	3.1	6.8	8.2	7.9	6.5	5.6	4.5	3.7	4.1
සීතා එළිය	3.2	4.3	1.4	2.9	5.9	8.2	7.8	5.7	3.8	4.0	4.1	*
බතලගොඩ	7.6	8.1	4.9	4.9	7.9	8.7	8.4	7.1	6.6	6.1	5.3	5.5
මාකඳුර	*	*	*	*	*	*	*	*	*	*	*	*
මොණරාගල	*	*	*	*	*	*	*	*	*	*	*	*
ගිරාඳුරුකෝට්ටේ	7.2	6.8	3.2	2.7	5.3	6.6	7.1	6.1	6.3	5.9	5.3	6.2
කුණ්ඩසාලේ	5.6	4.7	3.0	3.2	5.6	7.7	7.0	6.4	7.3	5.1	5.4	5.1
බණ්ඩාරවෙල	5.6	5.8	2.8	2.9	5.0	6.9	7.1	5.7	5.3	6.0	5.8	6.1
මහ ඉලුප්පල්ලම	8.2	7.6	4.1	3.4	6.8	7.7	8.3	7.2	7.5	7.8	7.3	6.1
අඟුණකොළපැලැස්ස	*	*	*	*	*	*	*	*	*	*	*	*
අරලගංවිල	8.7	7.8	4.7	3.2	6.7	7.8	8.3	8.1	8.7	7.7	7.4	7.5
විරවිල	8.0	7.9	3.7	4.7	7.4	8.4	8.2	7.5	6.7	7.8	7.7	7.5

* දත්ත නොමැත

වගු අංක 1.8 : සුළඟේ ප්‍රවේගය (පැයට කි.මී.) -2009/10

කෘෂි කාලගුණික ස්ථානය	2009				2010							
	සැප්.	ඔක්.	නොවැ.	දෙසැ.	ජන.	පෙබ.	මාර්තු	අප්‍රේල්	මැයි	ජූනි	ජූලි	අගෝ.
බෝඹුවල	4.5	2.6	1.1	1.4	1.3	1.6	2.2	1.9	2.4	2.7	1.7	2.6
පේරාදෙණිය	*	*	*	*	*	*	*	*	*	*	*	*
සීතා එලිය	15.2	8.6	5.5	6.0	5.9	6.8	7.6	5.2	7.2	14.3	*	*
බතලගොඩ	7.7	4.6	3.5	4.2	5.1	4.8	3.8	3.4	6.1	8.4	7.1	7.9
මාකඳුර	5.4	4.0	2.5	3.3	4.5	4.8	3.3	3.6	4.2	4.8	5.1	5.5
මොණරාගල	2.3	1.9	1.1	1.6	1.9	1.9	1.6	0.8	1.3	1.7	1.3	1.3
ගිරාඳුරුකෝට්ටේ	*	*	*	*	*	*	*	*	*	*	*	*
කුණ්ඩසාලේ	*	*	*	*	*	*	*	*	*	*	*	*
බණ්ඩාරවෙල	4.5	3.9	3.3	3.0	3.4	3.3	3.5	2.8	3.2	4.7	5.3	4.7
මහ ඉලුප්පල්ලම	8.5	4.7	3.0	3.5	3.7	3.9	3.4	2.9	6.0	8.1	7.2	7.6
අඟුණකොළපැලැස්ස	6.4	5.8	3.3	4.5	5.6	6.0	5.5	4.5	5.1	6.2	6.1	7.1
අරලගංවිල	5.6	3.9	2.1	2.3	2.5	2.5	2.6	2.3	2.8	4.8	5.1	4.8
විරවිල	7.4	4.4	1.7	2.0	3.0	3.8	2.7	2.0	4.7	6.7	6.6	7.2

* දත්ත නොමැත

2.1. කෙෂ්ත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, මහ ඉලුප්පල්ලම

මහ ඉලුප්පල්ලම කෙෂ්ත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වෙත පැවරී තිබෙන වගකීම වනුයේ වෙනත් කෙෂ්ත්‍ර බෝග සම්බන්ධයෙන් පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් සිදු කිරීමත් එම බෝග නිෂ්පාදනය ඉහළ නැංවීම පිණිස තාක්ෂණය සහ ක්‍රමෝපායන් සකස් කිරීමත්ය. වෙනත් කෙෂ්ත්‍ර බෝග වලට කුළු බඩු (මිරිස් සහ ලූණු), ධාන්‍ය, රනිල (මුං, කව්පි, උඳු), තෙල් බෝග (රට කජු, සෝයා, තල සහ සූරියකාන්ත) සහ රළු ධාන්‍ය (බඩ ඉරිඟු කුරක්කන්, ඉඳල් ඉරිඟු සහ අනෙකුත් මෙනේරි වර්ග) අයත් වේ. කලාපීය වශයෙන් වැදගත් පලතුරු සහ එළවළු නිෂ්පාදනය ඉහළ නැංවීමෙහිලාද කටයුතු කරන මෙම ආයතනය වියළි කලාපය කෙරෙහි විශේෂ අවධාරණයකින් යුතුව මෙරට වෙනත් කෙෂ්ත්‍ර බෝග නිෂ්පාදනය වර්ධනය කිරීමට නව තාක්ෂණික ක්‍රම පතුරුවාලීම සඳහා රජයේ සහ රජයේ නොවන ව්‍යාප්ති සංවිධාන සමඟ එක්ව කටයුතු කරයි.

මීට අමතරව, පහත දැක්වෙන වැඩසටහන්ද කෙෂ්ත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මඟින් සිදු කෙරේ.

- කලාපීය වැදගත්කමින් යුත් වෙනත් කෙෂ්ත්‍ර බෝග සහ එළවළු බෝග වල අභිජනක බීජ නිෂ්පාදනය
- ගොවීන්, බීජ නිෂ්පාදකයන්, සිසුන්, වෙනත් කෙෂ්ත්‍ර බෝග නිෂ්පාදනයෙහි නිරතව සිටින උනන්දුවක් දක්වන පුද්ගලයින් වෙත තාක්ෂණය ලබා දීම
- පාංශු පරීක්ෂණ පාදක ස්ථානීය විශේෂිත පොහොර නිර්දේශ ලබා දීම

අයවැය

විවිධ වැය ශීර්ෂ සහ ව්‍යාපෘති යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 2.1.1 හි දැක්වේ.

වගු අංක 2.1.1 වාර්ෂික අයවැය - 2010 (රු:)

වැය ශීර්ෂය	ප්‍රතිපාදන	වියදම	වියදම් %
මූලධන	6,185,852	2,190,966	35
පුනරාවර්තන	18,896,756	16,857,271	89
ව්‍යාපෘති			
"අපි වවමු රට නගමු"	3,181,000	1,462,274	46
කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය වැඩි දියුණු කිරීම	2,300,000	1,134,000	49
දෙමුහුම් ප්‍රභේද වැඩිදියුණු කිරීම, "සම්පත්" දේශීය දෙමුහුම් බඩඉරිඟු බීජ නිෂ්පාදනය	2,700,000	1,787,091	66
කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සහා ව්‍යාපෘති			
ප්‍රෝටීන් සහිත ගුණාත්මක දෙමුහුම් වැඩිදියුණු කිරීම	579,000	563,799	97
මිරිස් ප්‍රවර්ධනයෙහිලා කෘෂි ව්‍යාපාර සංවර්ධනය	250,000	80,032	32
වෙනත් කෙෂ්ත්‍ර බෝග වලට උසස් ශ්‍රේණියේ එප්පාවල රොක් පොස්පේට් සහ සිංගල් සුපර් පොස්පේට් යෙදීම	200,000	97,094	49
එකතුව	**34,292,598**	**24,172,527**	**70**

බෝග වැඩි දියුණු කිරීම

කුළු බඩු

මිරිස්

- MICH – 06 සහ වැරණියා වරණය යන අභිජනක ආර දෙක ප්‍රභේදීය මුදා හැරීමේ කමිටුව වෙත ඉදිරිපත් කෙරෙනු ඇත. මෙම අභිජනක ආරවල වැදගත් ලක්ෂණ පහත දැක්වේ.

MICH – 06

- අමු මිරිස් නිෂ්පාදනය කිරීම සඳහා බෙහෙවින් යෝග්‍ය වේ.
- විභව අමු මිරිස් නිෂ්පාදනය හෙ. 1 කට ටොන් 15 ට වැඩිය.
- මධ්‍යම ප්‍රමාණයේ කරල් (දිග සෙ.මී. 8 -10), තද කොළ පැහැයෙන් යුතු අතර දිලිසෙන පෙනුමකින් යුක්තය.
- මිරිස් කොළ කොඩ වීමේ සංකීර්ණයට මධ්‍යස්ථ ප්‍රතිරෝධිතාවෙන් යුක්තය.

වැරණියා වරණය

- ගෙවතු වගාව සඳහා යෝග්‍යය.
- කරල ප්‍රමාණයෙන් දිගය. (සෙ.මී. 15 - 18) වර්ණයකහවන් කොළ පැහැතිය.
- සැර ගතිය අඩු බැවින් අමු මිරිස් ලෙස මෙන්ම එළවළුවක් ලෙසද යෝග්‍යය.

ලූනු

- කලත්තෑව, දඹුල්ල සහ ගලේවෙල ප්‍රදේශ වලින් එක් රැස් කර ගත් මිශ්‍රිත ලූණු ගහන වලින් නව ලොකු ලූණු ආර අටක් වරණය කෙරුණි. මෙම ආර අට 2011 යල කන්නයේදී සංශුද්ධ කෙරේ.
- සෘජුවම බීජ වපුරන ලද දඹුල්ල වරණයේ සහ "රෙඩ් බෝල්" විදේශීය ප්‍රභේදයේ (විශේෂයෙන්ම ඉන්දියාවේ සෘජුවම බීජ වැපිරීම සඳහා බිහි කර ඇත.) ලූණු බෝග වල වර්ධන ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ඒවායෙහි පැළ උදුරා සිටවූ බෝග වගාවන් සමඟ සම තත්වයෙන් පැවතුණි. අස්වනු නෙලන සමයේදී ඇති වූ අනපේක්ෂිත වැසි හේතුවෙන් අස්වනු නෙලා නොගැනුණි. 2011 යල කන්නයේදී පරීක්ෂණය නැවත සිදු කෙරෙනු ඇත.
- 2009 නොවැම්බර් 29 වැනිදා සිට දෙසැම්බර් 21 වැනිදා දක්වා රහංගල සහ රිවස්ටර්න් ප්‍රදේශයේ ඉහළ කොටසේ පැවති උෂ්ණත්වය "දඹුල්ල වරණය" නැමති ලොකු ලූණු ප්‍රභේදය වසන්තීකරණය කිරීම සඳහා හිතකර අයුරින් පැවතුණි. ප්‍රතිඵල සනාථකර ගැනීම සඳහා 2010/11 මහ කන්නයේදී පර්යේෂණ ස්ථාන දෙකේදී සහ ගොවි ක්ෂේත්‍ර වලදී අත්හදා බැලීම නැවත සිදු කෙරෙනු ඇත.

ධාන්‍ය රනිල

මුං

- නිර්දේශිත ආරි සහ MI – 6 ප්‍රභේද වලට දෙමුහුම්කරණ වැඩසටහනින් හිතකර ලක්ෂණ ඇතුළත් කිරීම සඳහා, තනි මුහුම් සහ තෙමුහුම් බිහි කිරීම පිණිස ජනක ප්ලාස්ම වලින් වරණය කර ගත් හිතකර ලක්ෂණ වලින් සමන්විත ආර (ඉහළ අස්වනු ගෙන දෙන, මුං කහ පැහැවීමේ විචිත්‍ර වෛරසයට සහ සර්කොස්පෝරා පත්‍ර පුල්ලි (*Cercospora* Leaf Spot) රෝගයට ඔරොත්තු දෙන,ඒකාකාරීව පරිණත වන සහ තද බීජ අඩු) මාපියන් ලෙස යොදා ගැනීම සිදු කෙරේ.

- ආනයනය කරන ලද chi Nut 72 මුං ආර කෘෂිකර්ම දෙපාර්තමේන්තුව නිර්දේශ කරන ලද MI – 5 සහ MI – 6 ප්‍රභේද සමඟ පරීක්ෂා කරන ලද අතර එම මුං ආර නිර්දේශිත ප්‍රභේද වලට සාපේක්ෂව අඩු අස්වැන්නක් (හෙ. 1 කට කි.ග්‍රෑ. 125 ක්) ගෙන දුන් බැව් ප්‍රතිඵල මඟින් අනාවරණය විය. තවද මෙම ආර මුං වගාවට වැළඳෙන බරපතළ රෝගයක් වන මුං කහ පැහැවීමේ විචිත්‍ර වෛරසයටද පාත්‍රී විය.

- පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයෙන් ලබා ගත් AC0259, AC0219, AC2993, AC0099, AC3022 සහ AC5179 යන නව මුං එකතුන් වල අස්වැන්න සහ බීජ ලක්ෂණ සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත ප්‍රභේද සමඟ පරීක්ෂාවට ලක් කෙරිණි. එම නියැදි වලින් එකකුදු කෙරෙහි අස්වැන්න හෝ බීජ ලක්ෂණ මත බලාපොරොත්තු තැබිය නොහැකිය.

- බලාපොරොත්තු තැබිය හැකි මුං ආර 7ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සඳහා වරණය කෙරිණි. 8452 නියැදියේ තද බීජ පැවති ප්‍රතිශතය ඉතා අඩු වූයෙන් (< 0.01%) දෙමුහුම්කරණ වැඩසටහනේදී මාපිය ආරක් ලෙස යොදා ගැනෙනු ඇත.

කව්පි

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම යටතේ "IITA" ආර දෙකක් එකිනෙකට වෙනස් කෘෂි පාරිසරික කලාප දෙකකදී අනුවර්ත්‍යතාව සම්බන්ධයෙන් පරීක්ෂාවට ලක් කෙරිණි. මෙම කව්පි ආර දෙක පරීක්ෂණ ප්‍රභේද හා සමානවම හෙ. 1 කට ටොන් 2 කට වැඩි අස්වනු සහිතව ක්‍රියාකාරි වූ අතර පරීක්ෂණ ප්‍රභේද දෙකට වඩා පාරිභෝගික පිළිගැනීමේ හැකියාවෙන් ඉහළ විය. මෙම කව්පි ආර දෙක ලබන කන්නයේදී ගොවි ක්ෂේත්‍ර වලදි තවදුරටත් පරීක්ෂා කෙරෙනු ඇත.
- වත්මන් නිර්දේශිත ප්‍රභේද වැඩිදියුණු කිරීම සඳහා 2009 යල කන්නයේදී දෙමුහුම් කිරීමේ සහ වරණය කිරීමේ වැඩසටහන ආරම්භ කෙරිණි. F1 පරම්පරා 15 කින් පරම්පරා 6ක් වැඩිදුර ඇගයීම සඳහා වරණය කර ගන්නා ලදී.

උඳු

- හොඳින් අනුවර්තනය විය හැකි උඳු ආර වරණය කර ගැනීම සඳහා බලාපොරොත්තු තැබිය හැකි ආර තුනක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම යටතේ තව දුරටත් පරීක්ෂා කෙරේ.

තෙල් බෝග

සෝයා

- විදේශිය සෝයා ආර 6ක් හිතකර ලක්ෂණ සහ අස්වනු ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අගයන ලදී. මින් ආර 2ක් කෙරෙහි බලාපොරොත්තු තැබිය හැකි බැව් අනාවරණය වූ අතර එම ආර හෙ. 1 කට ටොන් 7 කට වැඩි අස්වැන්නක් ගෙන දෙන ලදී. ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා පරීක්ෂණ නැවත සිදු කෙරෙනු ඇත.

රටකජු

- ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමෙන් වරණය කරගත් බීජ ලොකු, මධ්‍යම කාලීන (මාස 3 1/2) රටකජු ආර 4ක් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශිත මධ්‍යම කාලීන ප්‍රභේද සමඟ ගොවි ක්ෂේත්‍ර වලදී පරීක්ෂාවට ලක් කෙරිණි. ICGV97045, ICGV98396 සහ ICGV93704 වඩාත් කැමති රටකජු ආර ලෙස හඳුනා ගැනිණි. විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව සම්බන්ධයෙන් මේවා පරීක්ෂා කෙරෙමින් පවතී.

රළු ධාන්‍ය

බඩ ඉරිඟු

- ගුණාත්මක ප්‍රෝටීන් බඩඉරිඟු (QPM) දෙමුහුම් තුනක් විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව සම්බන්ධයෙන් පරීක්ෂා කිරීම සඳහා වරණය කෙරිණි.
- විදේශිය දෙමුහුම් බඩඉරිඟු 31 ක අනුවර්තන හැකියාව පරීක්ෂා කරන ලදී. මින් දෙමුහුම් 28 ක ක්‍රියාකාරිත්වය පිළිගත හැකි මට්ටමේ පැවතුණි.
- බලාපොරොත්තු තැබිය හැකි කුරක්කන් එකතූන් 7ක් උසස් අස්වනු අත්හදා බැලීමෙන් පරීක්ෂා කරන ලද අතර නියැදි 3ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සඳහා වරණය කෙරිණි.
- විදේශිය ඉඳල් ඉරිඟු දෙමුහුම් 5 ක අනුවර්තන හැකියාව පරීක්ෂා කෙරුණු අතර PAC 501 සහ PAC 509 යන දෙමුහුම් ප්‍රභේද දෙකේ ක්‍රියාකාරිත්වය පිළිගත හැකි මට්ටමේ පැවතුණි.

එළවළු

- බලාපොරොත්තු තැබිය හැකි එළවළු කව්පි ආර 2ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම යටතේ ස්ථාන 4 කදී ඇගයීමට ලක් කරන ලදුව කෙටි කාලීන ඉහළ අස්වනු ගෙන දෙන බලාපොරොත්තු තැබිය හැකි ආරක් (තායි 1) ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම සඳහා වරණය කර ගන්නා ලදී.

  කහ නාරටි විවිත්‍ර වෛරසයට (YvMv) ප්‍රතිරෝධී/ ඔරොත්තු දෙන වන බණ්ඩක්කා (Wild Okra) සමඟ MI 5 බණ්ඩක්කා ප්‍රභේදයේ මුහුම් කර වෛරසයට ඔරොත්තු දෙන ලක්ෂණය ඇතුළත් කිරීම සඳහා දෙමුහුම්කරණ වැඩසටහන් 2011 වසරේදි අබණ්ඩවම සිදු කෙරෙනු ඇත.

  කහ නාරටි විවිත්‍ර වෛරසයට ඉහළ ප්‍රතිරෝධීතාවයකින් යුත් සහ පාරිභෝගිකයින්ට පිළිගත හැකි කරල් ලක්ෂණ වලින් සමන්විත (MI – 5 ට සමාන) බලාපොරොත්තු තැබිය හැකි බණ්ඩක්කා ආර තුනක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම යටතේ ස්ථාන 4 කදී අගයන ලදී. OKS 1 සහ OKS 3 බලාපොරොත්තු තැබිය හැකි ප්‍රතිඵල ගෙන දුන් අතර එම ආර දෙක ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම සඳහා වරණය කෙරිණි.

පලතුරු

මිදි

- විදේශිය මිදි ප්‍රභේද වන නයගරා, ෆ්‍රෙන්ච් MI, මස්කට් MI සහ ඊශ්‍රායල් බ්ලූ ජනක ප්ලාස්ම එකතුවක් ලෙස නඩත්තු කෙරේ.
- මිදි සඳහා අඩු පිරිවැයැති වැල් පුහුණු ක්‍රමයක් හඳුනා ගැනීම සඳහා අධ්‍යයනයක් ආරම්භ කරන ලදී. මෙම අත්හදා බැලීමේදී නිර්දේශිත ප්‍රභේද 4ක් (ඊශ්‍රායල් බ්ලූ (VI), මස්කට් MI(V2), ෆ්‍රෙන්ච් MI (V3) සහ කන්දරා (V4) එකිනෙකට වෙනස් (GDC (ජිනීවා ඩබල් කර්ටින් - පරතර තැබීම - 2.6 x 4 m), ටටුරා (පරතර තැබීම - 2.6 x 4 m), DG (ඩබල් ගීයො - පරතර තැබීම - 2.6 x 4 m) සහ පන්දලම් (පරතර තැබීම - 8 x 4 m) පුහුණු ක්‍රම 4 කින් ඇගයීමට ලක් කෙරේ. මෙම අත්හදා බැලීම ඉදිරි කන්න වලදීද අඛණ්ඩවම සිදු කෙරේ.

දිවුල්

- පසුගිය වසර හය තුළදී දිවුල් එකතුන් අටක් අගයන ලදුව එක් ප්‍රවේශයක් කෙරෙහි බලාපොරොත්තු තැබිය හැකි බැව් හඳුනා ගැනිණි.

කොමඩු

- අස්වැන්න සහ ගෙඩියේ ගුණාත්මය සම්බන්ධයෙන් "හන්ටර්" සහ "ලන්තා" දෙමුහුම් පැණි කොමඩු ප්‍රභේද දෙක තිලිණ පරීක්ෂණ ප්‍රභේදය සමඟ අගයන ලදී. පිළිගත හැකි මට්ටමේ පැවතියේ හන්ටර් ප්‍රභේදය පමණි.

ශෂ්‍ය විද්‍යාව

- ජල සම්පාදිත බඩ ඉරිඟු වගාවට මතුපිට පොහොරක් ලෙස පොටෑසියම් යෙදීමෙන් අස්වැන්නෙහි විශේෂ වැඩිවීමක් ඇති නොවූ බැව් සිදු කළ අධ්‍යයන වලින් අනාවරණය විය.
- වර්ෂාපෝෂිත තත්වය යටතේ වපුරන ලද උඳු සඳහා ප්‍රශස්ත බීජ අනුපාතය සහ නයිට්‍රජන් මට්ටම පිළිවෙලින් හෙ. 1 කට කි. ග්‍රෑ. 62.5ක් සහ කි. ග්‍රෑ. 30ක් බැව් අනාවරණය විය. මෙම සොයා ගැනීම් තාක්ෂණය මුදාහැරීමේ කමිටුවට ඉදිරිපත් කෙරෙනු ඇත.
- විවිධ වයස් පංති තුනක නව වී ප්‍රභේද සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීම් තුනක් සිදු කරන ලදී. දත්ත අවසන් විශ්ලේෂණය සඳහා බතලගොඩ වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වෙත යවන ලදී.

බෝග ආරක්ෂණය

වෘක්ෂවේදය

- මහ කන්නයේදී ඖෂධ ප්‍රභේදය වගා කිරීම සඳහා නිසි තවාන් කළමනාකරණයෙන් යුතුව පැළ උදුරා සිටුවීම හෝ නිර්දේශිත බීජ අනුපාතය අනුව වැපිරීම නිර්දේශ කළ හැකිය.
- මධ්‍යස්ථ ප්‍රතිරෝධිතාවෙන් යුත් දෙමුහුම් බඩ ඉරිඟු ප්‍රභේද වල (සම්පත්, රුවන් හඳුනා) මලකඩ රෝගය පාලනය කිරීම සඳහා (*Puccinia polysora*) පැළ සිටුවා සති පහේදී සහ සති හතේදී සංස්ථානික දිලීරනාශක වන පයිරක්ලෝස්ට්‍රොබින් EC ලීටරයකට ග්‍රෑම් 250 ක්, ප්‍රොපිකොනොසෝල් EC ලිරයකට ග්‍රෑම් 250 ක්, තයෝෆනේට් මෙතිල් SC ලීටරයකට ග්‍රෑම් 500 ක්, ටෙට්‍රාකොනොසෝල් ME ලීටරයකට ග්‍රෑම් 40 ක් සහ ටෙබ්‍යුකොනොසෝල් EW ලීටරයකට ග්‍රෑම් 250 ක් යෙදීම නිර්දේශ කළ හැකිය.
- නව දිලීරනාශක තුනක් වන ට්‍රයිෆ්ලොක්සිස්ට්‍රොබින් + ටෙබ්‍යුකොනොසෝල් 75 WG, පයිරක්ලොස්ට්‍රොබින් + මෙතිරාම් 60 WG සහ ෆ්ලුසිනම් SC ලීටරයකට ග්‍රෑම් 500 ක් යොදා රතු ළෑණු වගාවේ ඇන්ත්‍රැක්නෝස් සහ දම් පුල්ලි රෝගය පාලනය කිරීමට භාවිතා කළ හැකිය.
- සම්පත් දෙමුහුම් බඩ ඉරිඟු ප්‍රභේදයෙන් ප්‍රථම වරට වාර්තා වූ බීජ පැළ අංගමාර රෝගයේ කාරක පීවියා පෙනිසිලියම් විශේෂයක් (*Penicillium* spp) බැව් හඳුනා ගැනිණි.

කීට විද්‍යාව

- මිරිස් කොළ කොඩවීම අවම කිරීම සඳහා කෘමි නාශක දෙකක් කාර්යක්ෂම බැව් හඳුනා ගත් අතර ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා පරීක්ෂණ අඛණ්ඩවම කෙරෙනු ඇත.

මිරිස් කොළ කොඩවීම අවම කිරීම සඳහා තයමොතොක්සම් 70%WS කාර්යක්ෂම බීජ ප්‍රතිකර්මයක් ලෙස සොයා ගත් අතර බීජ ප්‍රතිකර්මය සිදු කිරීමත් සමඟ තයමොතොක්සම් පත්‍ර මතටද යෙදීම බෙහෙවින්ම කාර්යක්ෂම බැව් සොයා ගැනිණි. ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා පරීක්ෂණ අඛණ්ඩවම සිදු කෙරෙනු ඇත.

ආහාර තාක්ෂණය

- පිළිගත හැකි සංවේදක අගයන්ගෙන් යුත් කේක් සහ බිස්කට් සැදීම සඳහා බඩඉරිඟු, ඉඳල් ඉරිඟු සහ කුරක්කන් වැනි රළු ධාන්‍ය පිටි 100% ක්ම යොදා ගත හැකිය.
- කව්පි ප්‍රභේද වන MI 35 ට වඩා ධවල සහ MICP01 ඉහළින්ම පිළිගත හැකි සංවේදක අගයන් ගෙන් යුත් බැව් අනාවරණය විය.

බීජ නිෂ්පාදනය

අභිජනන බීජ නිෂ්පාදනය

ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයෙන් නිපදවන ලද සහ සපයන ලද බීජ ප්‍රමාණ පිළිබඳ වගු අංක 2.1.2 හි දැක්වේ.

සහතික කළ බීජ නිෂ්පාදනය

මෙම ආයතනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ නිෂ්පාදන වැඩසටහනට සහාය වීම පිණිස "අපි වවමු රට නගමු වැඩසටහන" යටතේ සහතික කළ බීජ නිෂ්පාදන වැඩසටහනක් ආරම්භ කරන ලදී. 2009/10 යල සහ 2010 මහ කන්නවලදී නිෂ්පාදිත වෙනත් ක්ෂේත්‍ර බෝග වල සහතික කළ බීජ පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගු අංක 2.1.2: 2010 වසරේදී නිෂ්පාදිත අභිජනන බීජ සහ සහතික කළ බීජ ප්‍රමාණ

බෝගය	ප්‍රභේදය	අභිජනන බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)	සහතික කළ බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)
බඩඉරිඟු	CML 20 ("සම්පත්" බඩඉරිඟු දෙමුහුමේ මාපියන්)	580	
	CML 348 ("සම්පත්" බඩඉරිඟු දෙමුහුමේ මාපියන්)		
	සම්පත් F1	714	
	රුවන්	100	600
කුරක්කන්	රාවණා	5	
මිරිස්	MI ග්‍රීන්	2	
	ගල්කිරියාගම වරණය	2	
	KA 2	2	
මුං	ආරි	25	60
	MI 5	32	103
	MI 6	25	610
ලොකු ඵෑණු (අභිජනක මව් බල්බ)	දඹුල්ල වරණය	40	
උඳු	MI 1	25	25
	අනුරාධ	15	487
සෝයා	Pb 01	100	205
	PH 13	13	
කව්පි	ධවල	24	356
	MI 35	41	60
	වරුණි	45	
	බොම්බෙ	05	
	විජය	10	10
එළවළු කව්පි	BS 1	13	
තක්කාලි	KC 1	1	
එකතුව		**2051**	**2516**

තාක්ෂණය පතුරුවාලීම

පුහුණු වැඩසටහන්, දේශන, වැඩමුළු, ක්ෂේත්‍ර ආදර්ශන, පැළ සායන, ක්ෂේත්‍ර දින, ප්‍රදර්ශන, තාක්ෂණික උපදෙස්

වසර තුළදී සිදු කරන ලද වැඩසටහන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

- ගොවීන්, පාසැල් සිසුන්, විශ්ව විද්‍යාල සිසුන් සහ තාක්ෂණික විද්‍යාල සිසුන් සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග නිෂ්පාදනය පිළිබඳ සිදු කරන ලද පුහුණු වැඩසටහන් සහ ආදර්ශන ගණන – 51 (සහභාගි වූ සංඛ්‍යාව 1379)

- සම්පත් පුද්ගලයින් ලෙස සහභාගි වීම්
  - ක්ෂේත්‍ර ආදර්ශන 48
  - ක්ෂේත්‍ර දින 19
  - පැළ සායන 9
  - ප්‍රදර්ශන 3
- තාක්ෂණික උපදෙස් ලබා දීම – සේවාදායකයන් 750 දෙනෙක් සඳහා
- බෙදා හරින ලද තාක්ෂණික තොරතුරු අත්පත්‍රිකා සංඛ්‍යාව - 12,500
- ගොවීන් සහ වෙනත් ආයතන සඳහා ගාස්තු රහිතව නිකුත් කළ වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නියැදි සංඛ්‍යාව – 650

රූපවාහිනි/ගුවන් විදුලි වැඩසටහන්

- 2010 වසරේදී ගුවන් විදුලි වැඩසටහන් 15 ක් ප්‍රචාරය කරන ලදී.

පුවත්පත් ලිපි

- වසර තුළදී පුවත්පත් ලිපි තුනක් පළ කරන ලදී.

වෙනත් ව්‍යාපෘති / සේවාවන්

- **බඩ ඉරිඟු බීජ සඳහා ඇසුරුම් ද්‍රව්‍ය ඇගයීම**

  කළු පොලිඑතිලීන් සහ ඝනත්වය අඩු පොලිඑතිලීන් යොදා ඇතුල් පැත්ත ආවරණය කළ වියන ලද පොලිප්‍රොපිලීන් ඇසුරුම් වලට සාපේක්ෂව මෙටලයිස්ඩ් පොලිඑතිලීන් ටෙරාප්තලේට් ඇසුරුම් වල ගබඩා කළ විට මාස 6 1/2 ක් යනතුරුම බීජ වල ප්‍රරෝහණ හැකියාව 80% කටත් වඩා ඉහළ මට්ටමින් පවත්වා ගත හැකි විය.

  මෙටලයිස්ඩ් පොලිඑතිලීන් ටෙරාප්තලේට් ඇසුරුම් වල සාමාන්‍ය ඇසුරුම් කිරීම හා සංසන්දනාත්මකව, වාතය අන්තර්ගත නොවන සේ එම ඇසුරුම් ද්‍රව්‍යයම යොදා ගෙන බීජ ගබඩා කළ විට 1.5 ගුණයකටත් වැඩියෙන් මාස 9 ක්ම බීජ ප්‍රරෝහණය වීමේ හැකියාව රැඳවා ගත හැකි විය. මෙම ඇසුරුම් ක්‍රම සම්බන්ධයෙන් සම්පත් දෙමුහුම් ප්‍රභේදයේත් විවෘතව පරාගනය කළ රුවන් ප්‍රභේදයේත් බීජ වල ගබඩාකරණ හැසිරීමෙහි කිසිදු වෙනසක් නොපෙන්විය.

නිෂ්පාදනය ඉහළ නැංවීම සහ කාබනික පොහොර භාවිතය

පහත දැක්වෙන ප්‍රමාණයන්ගෙන් කාබනික පොහොර නිෂ්පාදනය කර බෙදා හරින ලදී.

කොම්පෝස්ට් නිෂ්පාදනය - මෙ.ටො. 5075

කොම්පෝස්ට් ආමුකුලන බෙදා හැරීම - කි.ග්‍රෑ. 1160

"වියළි කලාපයේ විභව කොළ පොහොර ප්‍රභව" පිළිබඳ ආදර්ශන බිම් කොටස් නඩත්තු කළ අතර ගොවී කණ්ඩායම්, පාසල් සිසුන් සහ කෘෂිකර්ම ව්‍යාප්ති නිළධාරින් සඳහා තාක්ෂණය ලබාදීමේ වැඩසටහන් පැවැත් වූ දිනවලදී උපයෝගී කර ගැනිණි.

මීට අමතරව සන්හෙම්ප් (*Crotalaria juncea*) බීජ කි.ග්‍රෑ. 75 ක් නිපදවූ අතර ආයතනයේ ක්‍රියාත්මක කෙරෙන කොළ පෙහොර බීජ ගුණනය කිරීමේ වැඩසටහනට යොදා ගැනේ.

- **"ආදර්ශ ගම්මානය" වැඩසටහන**

මෙම වැඩසටහන දේශීය ආහාර නිෂ්පාදනය ඉහළ නැංවීමේ පරමාර්ථයෙන් ආරම්භ කරන ලදී. ආරම්භයේදී ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ සහායෙන් ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ගම් තුනක් (හිරිපිටියාගම, තිලකපුර සහ පින්පාර) තෝරා ගන්නා ලදී. ඉඩම් අක්කර 9 ක පාංශු සංරක්ෂණ බැම් ස්ථාපිත කරන ලදී.

- **පාංශු පරීක්ෂණ වැඩසටහන**

අනුරාධපුරය සහ මහවැලි එවි ප්‍රදේශීය පළාත් සහ අන්තර් පළාත් ප්‍රදේශවල ගොඩ ඉඩම් වලින් ලබා ගත් පාංශු නියැදි 112 ක් විශ්ලේෂණය කර පාංශු පරීක්ෂණ පාදක පොහොර සහ කාබනික ද්‍රව්‍ය නිර්දේශ ලබා දෙන ලදී.

- සැල්වීනියා සහ ජපන් ජබරවල පේව පාලන කාරක ජීවීන් බෝ කර ගොවීන්, ගොවි සංවිධාන සහ රජයේ අධිකාරී වෙත නියැදි ලබා දෙන ලදී.

2011 වසර සඳහා සැලැස්ම

පර්යේෂණ

කුළු බඩු

- මිරිස් දෙමුහුම්/විවෘතව පරාගනය කළ ප්‍රභේද සහ ලුණු සඳහා නව මුහුම් නිපදවීම සහ අළුතින් බිහි කළ දෙමුහුම් ඇගයීම.

- මිරිස් සහ ලොකු ඵෑණු ජනක ප්ලාස්ම ඇගයීම, බලාපොරොත්තු තැබිය හැකි මිරිස් ආර සහ කලාපීයව වැදගත් භූමි දර්ශ වරණය කිරීම, සංශුද්ධ කිරීම සහ බීජ ගුණනය කිරීම.

- බලාපොරොත්තු තැබිය හැකි මිරිස් අභිජනක ආර සඳහා ජාතික සම්බන්ධී කරණ ප්‍රභේද අත්හදා බැලීම.
- මිරිස් අභිජනක ආර සහ පොකුරු ලුණුවල පරම්පරාව ඉදිරියට ගෙනයාම.
- මිරිස් අභිජනක ආර සඳහා ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම.
- විදේශීය මිරිස් දෙමුහුම් ඇගයීම.
- මිරිස් කොළ කොඩවීමේ වෛරසය කෙරෙහි සෙවන මඟින් සහ දියර පොහොර යෙදීම මඟින් ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම.
- මිරිස් කොළ කොඩවීමේ සංකීරණයට එරෙහිව බීජ ප්‍රතිකර්මය (තයෝමෙතොක්සම් 70% WS) පරීක්ෂා කිරීම.
- මිරිස් කොළ කොඩවීමේ සංකීර්ණය සහ ලුණු පැළ මැක්කා පාලනය කිරීම සඳහා කෘමි නාශක පරීක්ෂා කර බැලීම.
- මිරිස් සඳහා අංකුරය කපා ඉවත් කිරීමේ ශිල්ප ක්‍රමයක් බිහි කිරීම.
- කෙට් කාලීන සහ අවාරයේදී වගා කිරීම සඳහා යෝග්‍ය වැඩිදියුණු කළ ලොකු ලුණු ප්‍රභේද බිහි කිරීම සහ සමූහ වරණය (Stratified mass selection) මඟින් මහ කන්නයේදී අඩු උෂ්ණත්වය යටතේ සත්‍ය බීජ නිෂ්පාදනය කිරීම.
- බලාපොරොත්තු තැබිය හැකි ලුණු ආර සහ තෝරාගත් එකතූන් වල බීජ සහ බල්බ ගුණනය කිරීම.
- රිවස්ටන් ප්‍රදේශයේ ලොකු ලූණු වසන්තීකරණය කිරීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනය.
- විවිධ ශෂ්‍ය පිළිවෙත් මඟින් පත්‍ර අග පිලිස්සීම පාලනය කිරීම.

ධාන්‍ය රනිල

- මුං, උඳු, කව්පි සහ සෝයා සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- මුං, උඳු, කව්පි සහ සෝයා ඇගයීම සහ වරණය.
- මුං,උඳු, සහ කව්පි සඳහා දෙමුහුම්කරණය සහ වරණය කිරීමේ වැඩසටහන.
- මුං, උඳු, සහ කව්පි සඳහා ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම.
- රනිල වලට වැළඳෙන Ascochyta අංගමාරය සඳහා කළමනාකරණ පිළිවෙත් හඳුනා ගැනීම.
- කව්පි කඳ පාමුල කුණු වීමට එරෙහිව ජනක ප්ලාස්ම පරීක්ෂණ බැලීම.
- කව්පිවල කඳ පාමුල කුණුවීම කළමනාකරණය කිරීම සඳහා බීජ වැපිරීමේ ගැඹුර, අතිසුර්යතාපනය සහ කාබනික සංශෝධනයක් මඟින් ඇති කරන සංයුක්ත බලපෑම අධ්‍යයනය කිරීම.
- බලාපොරොත්තු තැබිය හැකි කව්පි ප්‍රභේදවල බීජ ගුණනය කිරීම.
- වර්ෂා පෝෂිත තත්ත්ව යටතේ රනිල සඳහා පොකුරු බීජ ස්ථාපිත කිරීමේ ක්‍රමයක් බිහි කිරීම.

තෙල් බීජ බෝග

- බලාපොරොත්තු තැබිය හැකි මධ්‍යම කාලීන රටකජු ආර සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- බලාපොරොත්තු තැබිය හැකි රටකජු ආරවල බීජ ගුණනය කිරීම.
- රටකජු ජනක ප්ලාස්ම ඇගයීම
- මධ්‍යම කාලීන, බීජ ලොකු බලාපොරොත්තු තැබිය හැකි රටකජු ආර සම්බන්ධයෙන් විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව සොයා බැලීම.

රළු ධාන්‍ය

- ගුණාත්මක ප්‍රෝටීන් බඩඉරිඟු දෙමුහුම් සහ කුරක්කන් එකතූන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමෙන් ඇගයීම.
- දේශීය සහභිජාත ආර යොදා ගෙන බිහිකළ බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුම් ඇගයීම.
- "හයිබ්‍රිඩ් මික්ස්" ගහනයෙන් සහභිජාත බඩඉරිඟු ආර බිහි කිරීම.
- පැණි රසැති විදේශීය බඩ ඉරිඟු දෙමුහුම් ඇගයීම.
- බලාපොරොත්තු තැබිය හැකි දෙමුහුවල සහ මාපිය ආරවල බීජ නිපදවීම.
- ගුණාත්මක ප්‍රෝටීන් බඩ ඉරිඟු සහභිජාත් ආරවල සලකුණු සහායක වරණය.
- බඩ ඉරිඟු කොපු කුණු වීම සම්බන්ධයෙන් ප්‍රභේද පරීක්ෂා කර බැලීමේ ශිල්ප ක්‍රමයක්
- බඩ ඉරිඟු වල මලකඩ රෝගයට එරෙහිව දිලිරනාශක පරීක්ෂා කර බැලීම.

- බඩ ඉරිඟු ගුල්ලා පාලනයට ශාක වලින් සාදා ගන්නා පවුඩර් පිළිබඳ රසායනාගාර ඇගයීම.
- බඩ ඉරිඟු වල කඳ විදින්නා හානිය කෙරෙහි නයිට්‍රජන්වල විවිධ මට්ටම් මඟින් ඇතිවන බලපෑම
- බලාපොරොත්තු තැබිය හැකි තණහාල් සහ මෙනේරි ජනකප්ලාස්ම නඩත්තු කිරීම.
- තණහාල් වල කොළ පාළුව ඇතිවීම කෙරෙහි බීජ අනුපාතය සහ රෝපණ ක්‍රමය මඟින් ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යයන.

එළවළු

- ඉහළ අස්වැන්න සහ පිළිගත හැකි කරල් ගුණාත්මයෙන් යුතුව කහ නාරටි විචිත්‍ර වෛරසයට (YVMV) ප්‍රතිරෝධීතාව/ ඔරොත්තුදීම ඇති කිරීම සඳහා බණ්ඩක්කා ප්‍රභේදීය වැඩි දියුණු කිරීම.
- පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයෙන් ලද එළවළු කව්පි ජනක ප්ලාස්ම ඇගයීම සහ ප්‍රභේදීය වැඩි දියුණු කිරීම සඳහා මාපිය ආර ලෙස යොදා ගැනීමට වඩාත් සුදුසු ආර වරණය කිරීම.
- වම්බටු සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- බලාපොරොත්තු තැබිය හැකි බණ්ඩක්කා සහ එළවළු කව්පි සඳහා ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම.
- මුරුංගා ආදර්ශන බිම් කොටසක් නඩත්තු කිරීම.

පලතුරු

- මිදි සහ අඹ ජනක ප්ලාස්ම නඩත්තු කිරීම.
- දිවුල් ජනක ප්ලාස්ම ඇගයීම.
- මිදි ප්‍රභේද තුනක මව් පැළ නඩත්තු කිරීම.
- දේශීය දෙමුහුම් පැපොල් වල ප්‍රභේදීය වැඩි දියුණු කිරීම.
- මිදි වැල් පුහුණු කිරීමේ ක්‍රම ඇගයීම.
- ඩ්‍රැගන් ෆෘට් ආදර්ශන බිම් කොටසක් පවත්වාගෙන යාම.

වී

- විවිධ වයස් කාණ්ඩ සඳහා ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම සහ ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම.
- විවිධ වයස් කාණ්ඩ සඳහා ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම.

වල් පැළෑටි කළමනාකරණය

- මිරිස් සහ රටකජු වගා සඳහා ක්වින්සලොප්-පී-එතිල් EC ලීටරයකට ග්‍රෑම් 50 ක් සහ බඩ ඉරිඟු වගාව සඳහා හැලොසල්ෆියුරොන්-මෙතිල් 75 WG යෙදූ විට වල් පැළෑටි පාලනය කිරීමේ සාර්ථකත්වය
- ට්‍රිගර් (කාෆෙන්ට්‍රසෝන් – එතිල් ලීටරයකට ග්‍රෑම් 6.5 + ග්ලයිෆොසේට් (a.e.) ලීටරයකට ග්‍රෑම් 179 CS හි වර්ෂාවට ඔරොත්තු දීමේ හැකියාව
- මඩට වැපිරූ වී වගාව සඳහා ජාතික සම්බන්ධීකරණ වල් පැළෑටි නාශක පරීක්ෂා කිරීම.
- රනිල වගාවේ වල් පැළෑටි පාලනයෙහි ඉමසැතපිර් වල සාර්ථකත්වය.

පාංශු සාරවත්භාවය, පොහොර සහ පරිසරය

- උසස් ශ්‍රේණියේ එප්පාවල රොක් ෆොස්ෆේට් සහ එප්පාවල සිංගල් සුපර් ෆොස්ෆේට් කෙරෙහි බඩඉරිඟු දක්වන ප්‍රතිචාරය අධ්‍යයනය කිරීම.
- මිරිස් පැළයේ වර්ධනයට සහ අස්වැන්න කෙරෙහි දිලීරක මූල වලින් ඇතිවන බලපෑම පිළිබඳ ඇගයීම. (බඳුන් තුල සිදු කරන පරීක්ෂණය)
- ගොවි ක්ෂේත්‍රවලින් ප්‍රශස්ත බඩඉරිඟු සහ මිරිස් අස්වැන්නක් ලබා ගැනීම සඳහා නයිට්‍රජන් සමඟ ග්ලිරිසීඩියා යොදන ප්‍රශස්ත මට්ටම සහ කාලය හඳුනා ගැනීම.
- මිරිස්, බඩඉරිඟු සහ ලූණු සඳහා යෝග්‍ය සමෝධානික පැළෑටි පෝෂක (N) කළමනාකරණ ක්‍රමය හඳුනා ගැනීම.
- උද්‍යාන පඨ බෝග වගා ක්ෂේත්‍රයේ දිගු කාලීන පාංශු සාරවත් භාවය
- රතු දුඹුරු පසේ වගා කරන ලද වෙනත් ක්ෂේත්‍ර බෝග වගාවලට එක් කරන ලද කාබනික ද්‍රව්‍ය සහ රසායනික පොහොර සම්බන්ධයෙන් දිගු කාලීනව පාංශු සාරවත්භාවය නිරීක්ෂණය කිරීම.
- පාංශු පරීක්ෂණ වැඩසටහන

ජල කළමනාකරණය

- රතු දුඹුරු පසෙහි වගා කළ දෙමුහුම් බඩ ඉරිඟු (සමිපත්) සඳහා ජල සම්පාදන අවශ්‍යතාව පිළිබඳ අධ්‍යයනය.
- වෑස්සුම් ජල සම්පාදන ක්‍රමය යටතේ රතු දුඹුරු පසෙහි පාංශු ජල ව්‍යාප්ති රටාව පිළිබඳ ඇගයීම.

- DL_{1b} කෘෂි පාරිසරික කලාපයේ හොඳින් ජලාපවහනය සිදුවන සහ ජලාපවහනය හොඳින් සිදු නොවන රෝඩස්ටාෆ් පසෙහි වගා කරන ලද මිරිස් වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි ජලය සම්පාදනය කරන කාල පරතරය මඟින් ඇති කරන බලපෑම.
- වියළි කලාපයේ වගා කෙරෙන මිරිස් සහ ලූණු සඳහා කාර්යක්ෂම ජල කළමනාකරණ පිළිවෙත් බිහි කිරීම.

ආහාර තක්ෂණය

- ගුණාත්මක ප්‍රෝටීන් බඩ ඉරිඟු ප්‍රභේද නිර්ණය කිරීම.
- සෝයා සහ කව්පි ආරවල අඩංගු දල මේද සහ ප්‍රෝටීන් පිළිබඳ ඇගයීම.
- බේකරි නිෂ්පාදන සඳහා රළු ධාන්‍ය පිටි යොදා ගැනීම.
- කෝමාරිකා නිෂ්පාදනය වැඩිදියුණු කිරීම.
- තාක්ෂණ ක්‍රමයක් (MPET) යොදා ගනිමින් දෙමුහුම් බඩ ඉරිඟු බීජවල ගබඩා කර තබා ගත හැකි කාලය නිර්ණය කිරීම.
- බඩ ඉරිඟු කරල් වල ඇති පළිබෝධනාශක අවශේෂ පිළිබඳව නිර්ණය කිරීම.
- දේශීය බඩ ඉරිඟු ප්‍රභේද යොදාගෙන "කෝන් ෆ්ලේක්ස්" නිපදවීම.
- මිරිස් ප්‍රභේදවල අමු මිරිස් ගබඩා කර තබා ගත හැකි කාලය ඇගයීම.
- අභිජනකයින් විසින් ඉදිරිපත් කරන ලද වෙනත් ක්ෂේත්‍ර බෝග/ පලතුරු/එළවළු ප්‍රභේද/ අභිජනක ආරවල ගුණාත්මය ඇගයීම.

අභිජනන බීජ නිෂ්පාදනය

- නිර්දේශිත මිරිස් (KA2, MI - ග්‍රීන් සහ ගල්කිරියාගම වරණය), බඩ ඉරිඟු (බණ්ඩාර, රුවන්, සම්පත් මාපිය ආර් සහ සම්පත්), කුරක්කන් (ඕෂධ), මුං (MI 5, MI 6 සහ ආරී) උඳු (MI 1, අනුරාධ), එළවළු කව්පි (BS 1), තක්කාලි (KC 1), බණ්ඩක්කා (හරිත), කව්පි (ධවල, MI 35, වරුණි සහ බොම්බෙ) සහ සෝයා (Pb 1 සහ PM 13) ප්‍රභේද වල අභිජනන බීජ නිෂ්පාදනය.
- නිර්දේශිත ලූණු ප්‍රභේදයේ (දඹුල්ල වරණය) අභිජනන මව් බල්බ සහ බීජ නිෂ්පාදනය.

කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සේවක සංඛ්‍යාව
අධ්‍යක්ෂ (පර්යේෂණ)	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)	02
පර්යේෂණ නිළධාරි	13
කෘෂිකර්ම ආර්ථික විද්‍යාඥ	01
වැඩසටහන් සහකාර – කෘෂිකර්ම	06
පර්යේෂණ සහකාර	17
කෘෂිකර්ම උපදේශක	10
පර්යේෂණ උප සහකාර	09
රාජ්‍ය කළමනාකරණ සේවා සහයක	15
කාර්යාල සහයක	02
රියදුරු	06
බද්ධකරු	01
ගබඩාකරු	01
සංචාරක බංගලා භාරකරු	01
ට්‍රැක්ටර් ක්‍රියාකරවන්නා	03
මුරකරු	10
සනීපාරක්ෂක කම්කරු	01
කම්කරු (ස්ථිර)	136
කම්කරු (කොන්ත්‍රාත්)	168
මුළු සංඛ්‍යාව	**403**

2.1.1 මාෂ සහ තෙල් බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, අඟුණකොළපැලැස්ස

දකුණු පළාතේ වියළි කලාපයේ පිහිටුවා තිබෙන ප්‍රධාන කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය වන මාෂ සහ තෙල් බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය ප්‍රධාන වශයෙන්ම මාෂ බෝග සහ තෙල් බෝග පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් සිදු කිරීම කෙරෙහි මෙන්ම ඒවායෙහි ඵලදායිතාව ඉහළ නැංවීමෙහිලා තාක්ෂණය පතුරුවාලීම කෙරෙහි සිය අවධානය යොමු කරයි. මෙහි සියළුම පර්යේෂණ වැඩසටහන් කේන්ද්‍රගත කර තිබෙනුයේ බෝග වැඩි දියුණු කිරීම, ශාෂ්‍ය විද්‍යාව, පැළෑටි ආරක්ෂණය සහ පාංශු සහ ජල කළමනාකරණය යන විෂයයන්ට අදාළව ජාතික සහ ප්‍රාදේශිය පර්යේෂණ අවශ්‍යතා පාදක කර ගනිමිනි.

මීට අමතරව, නිර්දේශිත ප්‍රභේදයන්හි අභිජනන බීජ සහ මූලික රෝපණ ද්‍රව්‍ය සැපයීම, ස්ථානීය විශේෂිත පොහොර නිර්දේශ ලබා දීම සහ ක්ෂේත්‍ර නිලධාරීන්, ගොවීන් සහ ක්ෂේත්‍රය පිළිබඳ උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශ්වයන් වෙත තාක්ෂණික තොරතුරු ලබා දීමද මෙම මධ්‍යස්ථානය සිදු කරයි.

අයවැය

2010 වසර තුළදී විවිධ වැය ශීර්ෂ යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන සහ වියදම් පිළිබඳව වගු අංක 2.1.1 හි දැක්වේ.

වගු අංක 2.1.1 වාර්ෂික අයවැය – 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදන	වියදම	වියදම %
මූලධන	3,868,554	1,613,762	42
පුනරාවර්තන	7,755,500	7,358,746	95
ව්‍යාපෘති			
• කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය	2,500,000	578,077	23
• දෙමුහුම් වී, බඩඉරිඟු, පලතුරු සහ එළවළු වැඩිදියුණු කිරීම	425,000	419,012	99
• “අපි වවමු රට නගමු වැඩසටහන”	1,206,200	1,165,480	97
එකතුව	**15,755,254**	**11,135,078**	**71**

ප්‍රගතිය

යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම

ඉඩම් සංවර්ධනය

- පොල් සහ අඹ වගාවක් ස්ථාපිත කිරීමේ අරමුණින් ගොවිපළේ දකුණු පස හෙ. 5 ක් වැඩිදියුණු කරන ලදි.

රසායනාගාරය වැඩි දියුණු කිරීම

- කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ සහ භාවිතා කිරීමේ ව්‍යාපෘති අරමුදලින් පාංශු සහ ජල කළමනාකරණ රසායනාගාරයේ කොටසක් වැඩි දියුණු කරන ලදි.
- රතු පැහැති බීජාවරණයක් සහිත රටකජු ප්‍රභේදයක් සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සිදු කරන ලදී.

බෝග වැඩි දියුණු කිරීම

තෙල් බෝග

රටකජු

- අංකුර කුණුවීම රෝගයට ඔරොත්තු දෙන රටකජු ආර තුනක් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සඳහා වරණය කෙරිණි.
- මධ්‍යම කාලීන, ඉහළ අස්වනු ගෙන දෙන (හෙ. 1 කට ටොන් 2 කට වැඩි වඩා) රටකජු ආර දෙකක අනුවර්තනය වීමේ හැකියාව සම්බන්ධයෙන් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමෙන් (VAT) තෝරා ගැනුනි.
- ලොකු බීජ සහිත (මි.ග. 650 ට වැඩි), මධ්‍යම කාලීන (දින 105) සහ රසකැවිලි සඳහා යොදා ගත හැකි ආකාරයේ රටකජු ප්‍රභේද වල අනුවර්තනය වීමේ හැකියාව ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීමේ පර්යේෂණ මඟින් (MCVT) අගයන ලදී.
- ශ්‍රී ලංකාවේ නැගෙනහිර ප්‍රදේශයෙන් ලබා ගත් නව මෑ/බෝංචි විශේෂයක් (Vigna spp.) වන බඹර රටකජු සම්බන්ධයෙන් අස්වනු අත්හදා බැලීමක් සිදු කෙරිණි.
- රතු පැහැති බීජාවරණයක් සහිත රටකජු ප්‍රභේදයක් සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම (NCVT) සිදු කරන ලදී.

තල

- ඉහළ අස්වනු (හෙ.1 කට කි.ග්‍රෑ.1800 ට වැඩි) ගෙන දෙන ප්‍රභේද බිහි කිරීමේ අරමුණින් අළුතින් හඳුනා ගත් සුදු බීජ සහිත තල ආර 30 ක් සහ කළු බීජ සහිත තල ආර 25 ක් ලක්ෂණීකරණය කෙරිණි. වැඩිදුර ඇගයීම් කටයුතු එළඹෙන කන්නයේදී සිදු කෙරේ.

අඹ

- ප්‍රධාන අස්වනු අත්හදා බැලීම (MYT) මඟින් වරණය කර ගන්නා ලද බලාපොරොත්තු තැබිය හැකි අඹ ආර 6 ක් සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම ආරම්භ කරන ලදී.

ධාන්‍ය රනිල

කව්පි

- ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහනින් F6 පරම්පරාවේ විවිධ කව්පි මුහුම් වල ඉහළ අස්වනු ගෙන දෙන කව්පි ආර 16 ක් (හෙ.1 කට කි.ග්‍රෑ.2000) මූලික අස්වනු අත්හදා බැලීම සඳහා වරණය කර ගන්නා ලදී.

- හිතකර ශෂ්‍ය විදත්මක ලක්ෂණ වලින් යුත් ඉහළ අස්වනු ගෙන දෙන (හෙ.1 කට කි.ග්‍රෑ.1000 <) කව්පි ප්‍රවේශ 4 ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සඳහා වන ජනක ප්ලාස්ම ඇගයීමේ වැඩසටහනින් (NCVT) වරණය කර ගන්නා ලදී.
- නියඟයට ඔරොත්තු දෙන කලින් පරණත වන සහ පළිබෝධ සහ රෝග වලට ඔරොත්තු දෙන උසස් විදේශීය ප්‍රභේද 12 ක් නයිජීරියාවේ IITA වෙතින් ලබාගත් අතර දේශීය තත්ත්ව යටතේ ඒවායෙහි ඇගයීම් සිදු කෙරෙමින් පවතී.
- නව දේශීය ප්‍රවේශ 60 ක් ගොවි ක්ෂේත්‍ර වලින් එක්රැස් කර ගන්නා ලදී.
- දැනට තිබෙන ජනක ප්ලාස්ම, නියඟයට ඔරොත්තු දෙන ආකාරය පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා වූ වැඩසටහන ආරම්භ කරන ලදී.
- මොනරාගල දිස්ත්‍රික්කයේ කෘෂිකර්ම උපදේශක කලාප වල කව්පි වගාවට බලපාන ප්‍රධාන බාධක හඳුනා ගන්නා ලදී. ගුණාත්මක බීජ නොමැතිකම, නව ප්‍රභේද පිළිබඳ දැනුම මදවීම, වර්ෂාපතනයේ අවිනිශ්චිත බව, පළිබෝධ සහ රෝග හට ගැනීම, ගොවීන්ගේ අවධානය මද බව සහ වර්ෂාපෝෂිත තත්ත්ව වලට සුදුසු ප්‍රභේද ලබා ගැනීමට නොමැතිකම මෙම හඳුනාගත් ප්‍රධාන බාධක වන අතර මෙම බාධක පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහනේදී සැලකිල්ලට ගනු ඇත.
- දකුණු පළාතේ වියළි කලාප තත්ත්වයන් යටතේ කව්පි වල ක්‍රියාකාරිත්වය පරීක්ෂාකර බැලීම සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සිදු කරන ලදී.

මුං

- අස්වනු සහ ශෂ්‍ය විද්‍යාත්මක ලක්ෂණ සම්බන්ධයෙන් ජනක ප්ලාස්ම ප්‍රවේශ 73 ක් අගයන ලදී.
- දකුණු පළාතේ වියළි කලාප තත්ත්ව යටතේ මුං වල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කර බැලීම සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සිදු කරන ලදී.

කොල්ලු

- ඒකාකාරී බීජ වර්ණයෙන් යුත් ඉහළ අස්වනු ගෙන දෙන (හෙ. 1 කට කි.ග්‍රෑ. 600 – 1600) කොල්ලු ප්‍රවේශ 6 ක් ප්‍රධාන අස්වනු අත්හදා බැලීම (MYT) සඳහා ජනක ප්ලාස්ම ඇගයීම් මඟින් වරණය කර ගැණිනි.

උඳු

- දකුණු පළාතේ වියළි කලාප තත්ත්වයන් යටතේ උඳු වල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කර බැලීම සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සිදු කරන ලදී.

එළවළු

තක්කාලි

- දකුණු පළාතේ වියළි කලාප තත්ත්වයන් යටතේ තක්කාලි වල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කර බැලීම සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සිදු කරන ලදී.

එළවළු කව්පි

- දකුණු පළාතේ වියළි කලාප තත්ත්වයන් යටතේ එළවළු කව්පි වල ක්‍රියාකාරිත්වය පරීක්ෂා කර බැලීම සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සිදු කරන ලදී.

පලතුරු

අන්නාසි

- අබණ්ඩවම පැළ ලබා ගැනීම සඳහා අන්නාසි මව් පැළ ස්ථාපිත කරන ලදී.

පැළෑටි ආරක්ෂණය

- මුං කරල් හටගත් පසුව ඇතිවන පළිබෝධ හානියට එරෙහිව ක්ෂේත්‍ර තත්ත්ව යටතේ කොහොඹ නිෂ්පාදන වල සහ කෘත්‍රිම කෘමිනාශක වල කාර්යක්ෂමතාව අගයන ලදී. යල සහ මහ කන්න වලදී කෘත්‍රිම කෘමිනාශක යෙදූ මුං වගාවන් වලට ඇති වූ පළිබෝධ හානිය අවම වූ බව දැකගත හැකි විය. කොහොඹ නිෂ්පාදන අතරින් බීජ ජල නිස්සාරකය වඩාත්ම කාර්යක්ෂම ප්‍රතිකර්මය විය.

- කව්පි ගුල්ලාට (calloso bruchus maculates) එරෙහිව ශාක පාදක ආරක්ෂක වල සාරථක්ත්වය රසායනාගාර තත්ත්ව යටතේ ඇගයීමට ලක් කෙරිණි. යොදා ගත් සියළුම ආරක්ෂක ක්‍රම හා සසඳන කල පොල් තෙල් ප්‍රතිකර්මය යෙදූ කව්පි වගාවෙහි බීජ හානි ප්‍රතිශතය අඩු විය. කාලානුරූපව යෙදූ මිරිස් කුඩු සහ පැඟිරි තෙල්ද කෘත්‍රිම නාශක හා සමානව කාර්යක්ෂම ලෙස කව්පි ගුල්ලාට (c. maculates) එරෙහිව යොදා ගත හැක.

- රටකජු වලට බෝවෙන කරල් මකුණා (Elasomolomus sordidus) පාලනය කළ හැකි ක්‍රමයක් හඳුනා ගැනීම සඳහා අත්හදා බැලීමක් සිදු කරන ලදී. කාබොසල්ෆාන් ප්‍රතිකර්මය යෙදූ පැළවල කරල් හානිය සැලකිය යුතු ප්‍රතිශතයකින් අඩුවූ අතර වර්ධන කොටස් ඉවත් කිරීමෙන්ද ඉතිරි කොටස මිටි බැඳ තැබීමෙන්ද ඒ හා සමාන කාය්‍යක්ෂතාවයක් දැක ගත හැකි විය.

- කව්පිවල කරල් විදින්නා පාලනය කිරීම සඳහා යොදා ගන්නා අනෙකුත් පාලන ක්‍රමවේද වලට වඩා සමෝධානික පළිබෝධ කළමනාකරණ ක්‍රමවේදය වඩාත් කාර්යක්ෂම විය. ශාක නිස්සාරක කොහොඹ, සුදුළුණු, සහ සබන් මිශ්‍රණය වඩාත් කාය්‍යක්ෂම හා පහසුවෙන් යොදා ගත හැකි රසායනික නොවන ක්‍රමය විය.

- ප්‍රතිදිලිර ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ඇහැළ (Cassia fistula), රට තෝර, (Cassia alata) සහ බෝගන්විලා යන ශාක විශේෂ තුනක් හඳුනා ගන්නා ලදී.

- තලවල කඳ සහ මුල් කුණුවීමේ රෝගය අවම කිරීම සඳහා Trichoderme harsiana බීජ ප්‍රතිකර්මය බෙහෙවින්ම සාර්ථක ක්‍රමය බැවි හඳුනා ගැනිණි.

පාංශු සහ ජල කළමනාකරණය

බීජ ලොකු රටකජු සඳහා සල්ෆර් අවශ්‍යතාව පිළිබඳ අධ්‍යයනය කරන ලදුව හෙ. 1 කට කි.ග්‍රෑ. 10 ක අනුපාතයෙන් යෙදූ විට අස්වැන්න 9% කින් වැඩි වූ බැවි නිරීක්ෂණය විය.

කෘෂි දේශගුණික දත්ත මූලය

- කෘෂි දේශගුණික දත්ත දෛනිකව වාර්තා ගත කිරීම සහ එම දත්ත මූලය නඩත්තු කිරීම අබණ්ඩවම සිදු කෙරණි.

සංවර්ධන කටයුතු

කොම්පෝස්ට් සහ කොළ පොහොර නිෂ්පාදනය

- නොයෙක් වර්ගයේ කාබනික අවශේෂ යොදා ගනිමින් කොම්පෝස්ට් ටොන් 42 ක් නිපදවිය.
- අක්කර 2 ක බිම් ප්‍රමාණයක් ආවරණය කරමින් මීටර් 100 ක උද්‍යානපථ බෝග වගා ක්‍රමය ස්ථාපිත කෙරණි.
- කොළ පොහොර බෝග වල බීජ නිෂ්පාදනය

  සන්හෙම්ප් (*Crotolaria juncea*) කි.ග්‍රෑ.15

  දිය සියඹලා (*Sesbania rostrata*) කි.ග්‍රෑ.1

  වඳුරු මෑ (*Mucuna prurika*) කි.ග්‍රෑ. 3

තාක්ෂණ ප්‍රචාරණය සහ පුහුණු කිරීම

ප්‍රදර්ශන

- ලබුදුවේ පැවති දකුණු පළාත් කෘෂිකාර්මික ප්‍රදර්ශනයට සහභාගී වූ අතර ප්‍රදර්ශන භාණ්ඩ සපයන ලදී.
- ගොවි සතිය, සඳහා ක්ෂේත්‍ර බෝග ස්ථාපිත කිරීමෙන් සහ නඩත්තු කිරීමෙන් කෘෂි තාක්ෂණික උද්‍යානයට සහාය ලබා දුන් අතර ක්ෂේත්‍ර බෝග, පහතරට එළවළු, පලතුරු බෝග, පේව තාක්ෂණය සහ කොම්පෝස්ට් සහ කොළ පොහොර නිෂ්පාදනය පිළිබඳ ප්‍රදර්ශන කුටි ඉදිරිපත් කිරීමෙන් ප්‍රදර්ශනයේ හවුල්කරුවකු විය.

ආදර්ශ ගම්මාන වැඩසටහන

- මෙම වැඩසටහන සඳහා ආදර්ශ ගම්මාන ලෙස මහඇළුත්ගමි ආර ගම තෝරා ගැනිණි. භූමිය සකස් කිරීමේ ශිල්ප ක්‍රම සමඟ මුං, කව්පි, රටකජු සහ තල වගා පිළිබඳ මූලික දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වූ අතර ස්වයං බීජ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා සෑම බෝගයකම බීජ නියැදි බෙදා දෙන ලදී.

ගොවි උපදේශක සේවා සහ මධ්‍යස්ථානයට පැමිණි පුද්ගලයන්

- මධ්‍යස්ථානයට පැමිණි ගොවීන් 175 දෙනෙකුට අවශ්‍ය උපදෙස් සහ නිර්දේශ ලබා දෙන ලදී.
- ගොවි ක්ෂේත්‍ර වලින් ලබා ගන්නා ලද පාංශු නියැදි 21 ක් විශ්ලේෂණය කරන ලදුව විවිධ බෝග සඳහා පාංශු පරීක්ෂණ පාදකව පොහොර නිර්දේශ ලබා දෙන ලදී.

පුහුණු කිරීම් සහ ගුවන් විදුලි වැඩසටහන්

- තිබ්බටු වගාව, සොලනේසියේ බෝග වල පලිබෝධ සහ රෝග පාලනය සහ බෝංචි කහ පැහැවීම පිළිබඳව ගුවන් විදුලි වැඩසටහන් 06 ක් සිදු කරන ලදී.
- කෘෂිකර්ම විද්‍යාලීය සිසුන් සඳහා පටක රෝපණය පිළිබඳ පුහුණු වැඩසටහන් මෙහෙය විය.
- දකුණු පළාතේ තාක්ෂණික නිලධාරීන් සඳහා වෙනත් ක්ෂේත්‍ර බෝග පිළිබඳ පුහුණු වැඩසටහන් පැවැත්වීමට අවශ්‍ය සම්පත් දායකයින් ලබාදෙන ලදී.
- ගොවීන් සඳහා තුඹ කරවිල සහ රටකජු වගා කිරීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් තුනක් පැවැත්විය.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් පැවැත්වූ පැළෑටි සායන 15කට සම්පත් පුද්ගලයන් ලබාදෙන ලදී.
- කලාපයේ ස්ථානීය විශේෂිත ගැටළු නිරාකරණය කිරිම උදෙසා නිලධාරීන් විසින් ක්ෂේත්‍ර චාරිකා 30 කට ආසන්න ප්‍රමාණයක් සිදු කරන ලදී.
- පළිබෝධ සහ රෝග පාලනය පිළිබඳව නිලධාරීන්ට සහ ගොවීන්ට පුහුණු වැඩ සටහන් 12 ක් පැවැත්විය.
- ගොවීන් 370ක්, පාසැල් සිසුන් 250ක් සහ රජයේ නිලධාරීන් 40ක් සඳහා කොම්පෝස්ට් නිෂ්පාදනය පිළිබඳව න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණු පංති පැවැත්විය. කි.ග්‍රෑ. 5 බැගින් වූ කොම්පෝස්ට් මුහුම් බෑග් 500ක් ගොවීන් අතර බෙදා දෙන ලදී.
- කි.ග්‍රෑ.5 කොම්පෝස්ට් ආමුකුලණ මලු 5000 ක් ගොවීන් අතර බෙදා දෙන ලදී.
- පාංශු තෙතමනය, සංරක්ෂණය කිරීම, කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම, පාංශු සාරවත් භාවය කලමනාකරණය කිරීම, කාර්යක්ෂම පොහොර භාවිතය, පාංශු නියැදි ලබාගැනීම සහ රසායනාගාර ශිල්ප ක්‍රම පිළිබඳව පුහුණු කිරීම් 15ක් සිදුකරන ලදී.

විදේශ පුහුණු

- තෙල් බෝග අංශයේ පර්යේෂණ නිළධාරිනි ඩී.ජී.සී. ජීවනී මිය චීන රජය විසින් අනුග්‍රහය ලබා දෙන ලද "සංවර්ධන වෙමින් පවතින රටවල් සඳහා තෙල් බෝග පිළිබඳ තාක්ෂණය" පිළිබඳව මාස තුනක කෙටි කාලීන පුහුණුව ලැබීය.
- ආචාර්ය පී. වීරසිංහ මයා බංග්ලාදේශයේ පැවති සාර්ක් රටවල ජාතික කෘෂිකාර්මික
- කව්පි ප්‍රභේද සහ වරණය කරගන්නා ලද කොල්ලු ප්‍රවේශ සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සහ ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම.

පලතුරු

- සාම්ප්‍රදායික ක්‍රමවේද හරහා ඩ්‍රැගන් ෆෘට්වල සහ නිර්දේශිත කෙසෙල් ප්‍රභේදවල මුලික රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

එළවළු

- වම්බටු ප්‍රභේද සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- "රුහුණු" වට්ටක්කා ප්‍රභේදය අභිජනක බීජ නිෂ්පාදනය.
- වට්ටක්කා සහ තුඹ කරවිල ජනක ප්ලාස්ම එක්රුස් කිරීම සහ වට්ටක්කා දෙමුහුම් කිරීම.
- බණ්ඩක්කා දෙමුහුම් ප්‍රභේද බිහි කිරීම.
- "විසල්" සහ "කේෂර" යන නිර්දේශිත තුඹ ප්‍රභේද වල මව් ශාක නඩත්තු කිරීම.
- කඳ කැබලි මඟින් තුඹ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
- තුඹ ජනක ප්ලාස්ම නඩත්තු කිරීම.

පැළෑටි ආරක්ෂණය

- කොහොඹ නිෂ්පාදන යොදා ගෙන මුං කරල් හට ගැනීමෙන් පසුව හානිකරන පළිබෝධ සහ මුං ගුල්ලා සම්බන්ධයෙන් ක්ෂේත්‍ර කළමනාකරණය (නියමු පරිමාණයේ පරීක්ෂණ)
- ගබඩාකරණ තත්ත්ව යටතේ කව්පි ගුල්ලාට එරෙහිව (*Callosobruchus maculates*) ආරක්ෂක වල සාර්ථකත්වය ඇගයීම.
- අස්වනු හානිය තක්සේරු කිරීම සහ තල කරල් මකුණා (*Elasomolomum sordidus*) පාලනය කළ හැකි ක්‍රම (නියමු පරිමාණයේ පරීක්ෂණ)
- මුං වගාවට විචිත්‍ර වෛරස් ආසාදනය ඇතිවීම වැළැක්වීම සඳහා තෝරා ගත් කෘත්‍රිම කෘමිනාශක සංයෝජනවල සාර්ථකත්වය පිළිබඳ සංසන්දනය.
- කරල් විදින්නාට ප්‍රතිරෝධී කව්පි ජනක ප්ලාස්ම පිළිබඳ සොයා බැලීම.
- කව්පි වල කරල් විදින්නා පාලනය කිරීම සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ ක්‍රම වල කාර්යක්ෂමතාව සහ යෝග්‍යතාව (නියමු පරිමාණයේ අධ්‍යයනය)
- මිරිස් වල කොළ කොඩවීමේ සංකීර්ණය පාලනය කිරීම සඳහා යොදා ගත හැකි පළිබෝධ කළමනාකරණ ක්‍රම හඳුනා ගැනීම.
- කව්පි කුඩිත්තාට එරෙහිව ශාක නිස්සාරකවල සාර්ථකත්වය ඇගයීම සඳහා නිරීක්ෂණ අධ්‍යයනය.
- *Macrophomina phaseolina* (තල වල කඳ සහ මුල් කුණු වීම) පාලනය කිරීම සඳහා ශාක නිස්සාරක වල ප්‍රතිදිලීර ක්‍රියාකාරිත්වය පිළිබඳව බඳුන් වගාව මඟින් පරීක්ෂා කිරීම.

- "ට්‍රිකොඩර්ම හාර්සිආනා" (*Trichoderme harsiana*) භාවිතා කර *Sclerotium rolfsii* (ස්ක්ලෙරෝටියම් රොල්ස්ෆි) පාලනය කිරීම සඳහා වඩාත් සුදුසු ක්‍රමවේදය හඳුනාගැනීම.
- පර්යේෂණ ක්ෂේත්‍ර තත්ත්ව යටතේ රටකජු වල " ස්ක්ලෙරෝටියම් රොල්ෆ්සි "(*Sclerotium rolfsii*) පාලනය කිරීම සඳහා පැළ නිස්සාරකවල සාර්ථකත්වය අධ්‍යයනය කිරීම.
- ගොවි ක්ෂේත්‍ර තත්ත්ව යටතේ "ෆියුසාරියම් ඔක්සිස්පෝරම් ක්‍යුබෙන්සිස්" (*Fusarium oxysporum* f. sp. Cubencis) වලට එරෙහිව පැළෑටි නිස්සාරක වල ප්‍රතිදිලීර බලපෑම.

පේව තාක්ෂණය

- නේත්‍රපලම් කෙසෙල් ප්‍රභේදය පරීක්ෂණාගාර තුළ නලස්ථව ප්‍රචාරණය කිරීම සඳහා සුදුසු මාධ්‍යයක් බිහි කිරීම.
- පළිබෝධනාශක ලෙස උද්භිද භාවිතා කිරීමට හැකි ප්‍රතිදිලීර ක්‍රියාකාරිත්වය පිළිබඳව සොයා බැලීමට ඖෂධීය ශාක වරණය කිරීම සහ ඇගයීම.
- නේත්‍රපලම් කෙසෙල් පැළ 1000 ක් නලස්ථව නිපදවීම.

පාංශු සහ ජල කළමනාකරණය

- දෙමුහුම් බඩඉරිඟු (සම්පත් ප්‍රභේදය) වර්ධනය සහ අස්වැන්න කෙරෙහි නයිට්‍රජන් සහ සින්ක් වලින් ඇතිවන බලපෑම.
- විවිධ කාබනික ද්‍රව්‍ය වලින් පසෙහි අඩංගු සමස්ථ සහ ප්‍රයෝජ්‍ය නයිට්‍රජන් කෙරෙහි ඇති කරන බලපෑම.
- වෙනත් ක්ෂේත්‍ර බෝග සඳහා සමෝධානික පැළෑටි පෝෂණ ක්‍රමවේදයක් සකස් කිරීම.
- ජල සම්පාදිතව වගා කරන රටකජු වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි විවිධ සල්ෆර් මට්ටම් මඟින් ඇති කරන බලපෑම.

කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	නිළධාරීන් සංඛ්‍යාව
අතිරේක අධ්‍යක්ෂ (වැඩබලන)	01
පර්යේෂණ නිළධාරී	09
ගොවිපළ කළමනාකරු	01
පර්යේෂණ සහකාර	13
කෘෂිකර්ම උපදේශක	08
ආර්ථික විද්‍යාඥ සහකාර	01
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරී	01
වැඩසටහන් සහකාර	04
පරිපාලන නිළධාරී	01
රාජ්‍ය කළමනාකරණ සහකාර	06
රියදුරු	07
කාර්යාල කාර්ය සහායක	01
පර්යේෂණ උප සහකාර	03
ගබඩාකරු	01
පෑස්සුම්කරු	01
සංචාරක බංගලා භාරකරු	01
ට්‍රැක්ටර් ක්‍රියාකරු	02
මුරකරු	12
කම්කරු - (II වැනි ශ්‍රේණිය)	51
කම්කරු - (III වැනි ශ්‍රේණිය)	04
කම්කරු - කොන්ත්‍රාත්	76
පුහුණු කම්කරු	05
මුළු ගණන	**209**

2.1.2 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, අරලගංවිල

අරලගංවිල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය මහවැලි බී. සී. ඩී. සහ පී. කලාප සඳහාත් නැගෙනහිර පළාත් සහ අන්තර් පළාත් ප්‍රදේශ සඳහාත් යෝග්‍ය තාක්ෂණික ශිල්ප ක්‍රම බිහි කිරීමේ සහ එම ශිල්ප ක්‍රම භාවිතයෙහි යෙදීමේ වගකීම දරයි. මෙම ආයතනය ජාතික සහ කලාපීය වැදගත්කමින් යුත් පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් කෙරෙහි සිය අවධානය යොමු කරයි. වෙනත් ක්ෂේත්‍ර බෝග සම්බන්ධයෙන් පර්යේෂණ සහ වැඩිදියුණු කිරීමේ කටයුතු කෙරෙහි වගකීම දැරුවද කලාපීය වැදගත්කමින් යුත් බෝග ලෙස ගැනෙන වී, පලතුරු සහ එළවළු සම්බන්ධයෙන්ද කටයුතු කරයි. මෙම මධ්‍යස්ථානය ශෂ්‍ය විද්‍යාව, කීට විද්‍යාව, ප්‍රවේණිය සහ පැළෑටි අභිජනනය, පැළෑටි ව්‍යාධිවේදය, සමාජ-ආර්ථික, පාංශු සහ ජල කළමනාකරණය යන විවිධ විෂයන් යටතේ පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරයි.

ප්‍රගතිය

පර්යේෂණ

ශෂ්‍ය විද්‍යාව

මිරිස්

මිරිස් ආර තුනක් ඇගයීමෙන් ලබා ගත් දත්ත අනුව "වැරණියා" ප්‍රභේදය වඩාත් සාර්ථක ක්‍රියාකාරිත්වයක් ගෙන දුණි.

වී

සෘජුවම වී වැපිරීම, පැළ උඳුරා සිටුවීම, ක්ෂුද්‍ර වගාව සහ ස්වායු වගාව යන වී වගා ක්‍රම වල ඵලදායිතාව සම්බන්ධයෙන් At 307, Bg 357, Bg 379/2 සහ Bg 300 යන වී ප්‍රභේද යොදා ගනිමින් අගයන ලදී. සෘජුවම වී වැපිරීමෙන් ඉහළම අස්වැන්න වාර්තා වූ අතර 2009/10 මහ කන්නයේදී සහ 2010 යල කන්නයේදී පිළිවෙලින් Bg 300 සහ At 307 ඉහළම අස්වනු වාර්තා කරන ලදී.

අයවැය

වගු අංක 2.1.2.1 වාර්ෂික අයවැය - 2010 (රු:)

වැය ශීර්ෂය	ප්‍රතිපාදන	වියදම	වියදම් %
පුනරාවර්තන	8,033,000	6,397,884	80
මූලධන	3,016,096	1,577,437	52
ව්‍යාපෘති			
"අපි වවමු රට නගමු වැඩසටහන"	815,000	371,840	46
"කොම්පෝස්ට් නිෂ්පාදන සහ භාවිතය පිළිබඳ අත්හදා බැලීම"	2,200,000	1,744,395	79
ප්‍රජා මූලික බීජ නිෂ්පාදන වැඩසටහන	75,000	60,000	80
කොසෙල් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ උප වැඩසටහන	215,000	193,252	90
ගෙවතු සංවර්ධන	70,000	16,912	24
එකතුව	**14,424,096**	**10,361,720**	**72**

- නිසි ලෙස පොහොර කළමනාකරණය කිරීම මඟින් වී බෝගයේ කහ පැහැ වීම සාර්ථකව පාලනය කෙරිණි. හෙ. 1 කට කොම්පෝස්ට් ටොන් 10 ක් යෙදූ විට රසායනික පොහොර භාවිතය 25% කින් අඩු කර ගත හැකි විය.
- පත්‍ර වර්ණ සටහන පාදක කර ගනිමින් යූරියා යෙදීමෙන් කහ පැහැවීම අඩු විය.
- 2009/2010 මහ කන්නයේදී සහ 2010 යල කන්නයේදී වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මඟින් සම්බන්ධීකරණ කරන ලද ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීමේ වැඩසටහන යටතේ මාස 03, 3 1/2 සහ 4 1/2 වයස් පංති වල නව ප්‍රවේශ සම්මත පරීක්ෂණ ප්‍රභේද සමඟ පරීක්ෂාවට ලක් කෙරිණි.
- හෙ. 1 කට ටොන් 5.61 ක අස්වැන්නක් ගෙන දුන් Bg 379/2 හා සංසන්දනාත්මකව Bg 3026 සහ Bg 07-1350 (මාස 04) සාර්ථක ක්‍රියාකාරිත්වයෙන් යුතුව පිළිවෙලින් හෙ. 1 කට ටොන් 5.67 ක සහ 5.68 ක අස්වනු ලබා දුණි.
- නිර්දේශිත ප්‍රභේද හා සංසන්දනාත්මකව At 05-1621 සහ Bw 03-1073 ආර කෙරෙහි බලාපොරොත්තු තැබිය හැකිය.
- 2010 යල කන්නයේදී Ld 5-5-14, At 07-1440 සහ Bw 05-1621 ඉහළම අස්වනු ගෙන දුන් අතර පිළිවෙලින් හෙ. 01 කට ටොන් 6.68 ක් 6.70 ක් සහ 6.17 ක් වාර්තා කරන ලදී.
- සියළුම නව ප්‍රවේශ පොදු පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධී විය.
- මාස 3 සහ 3 1/2 ප්‍රභේද ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම යටතේ පරීක්ෂාවට ලක් කෙරිණි.

පලතුරු සහ එළවළු

- සාමාන්‍ය පරිදි ජලය බැස යන චූර්ණමය නොවන දුඹුරු (NCB) පසේ ජලාපවහන තත්ත්වය ඇල සහ වේලි සකස් කර වැඩිදියුණු කරන ලදි. දොඩම්, පේර, කෙසෙල්, පැපොල්,දෙළුම් සහ කුරුමුරුංගා වේලි මත සාර්ථකව වගා කෙරිණි.

කව්පි

ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මඟින් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීමේ වැඩසටහන යටතේ වරුණි සහ ධවල යන අභිජනක ආර දෙක සම්මත පරීක්ෂණ ප්‍රභේද සමඟ පරීක්ෂාවට ලක් කරන ලදී. IJ 97k – 499 – 39 එකතුව ඉහළම අස්වනු ගෙන දුන් අතර විශේෂයෙන්ම පත්‍ර පටුවිමේ හානියට ප්‍රතිරෝධී විය.

ප්‍රවේණිය සහ පැළෑටි අභිජනනය

පොකුරු ලුනු

ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීම සඳහා නව ආර 5 ක් තෝරා ගන්නා ලදී.

තුඹ කරවිල

ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය සැපයුම සහතික කිරීම සඳහා මව් වැල් ස්ථාපිත කිරීමට රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය අබණ්ඩවම සිදු කෙරිණි.

කීට විද්‍යාව

වී

වියළි කලාපයේ සාමාන්‍ය වී ප්‍රභේද කොපු මයිටාවට දක්වන ප්‍රතිරෝධීතාවය සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලදී. විශේෂයෙන්ම යල කන්නයේදී සියළුම ප්‍රභේද පාහේ විවිධ මට්ටම් වලින් හානියට ලක් වූ අතර මහ කන්නයේදී සිදු වූ හානිය අඩු මට්ටමක පැවතුණි.

උද්‍යාන බෝග වගාව

අඹ

අඹ එකතුන් 10 ක් ක්ෂේත්‍ර ජාන බැංකුවේ නඩත්තු කළ අතර තෝරා ගත් එකතුන් 10 ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීම සඳහා ගුණනය කරන ලදී.

පැපොල්

දුර්වල ජලාපවහන තත්ත්වයන් යටතේ සිදු කරන වාණිජ පැපොල් වගාව සඳහා නිර්දේශිත ජලපවහන ක්‍රමයට සිදු කරන ලද සංශෝධන තවදුරටත් පුළුල් පාංශු විෂමතාවන් වලදී පරීක්ෂාවට ලක් කරන ලදී.

පැළෑටි ව්‍යාධිවේදය

වී

ධාන්‍ය අවපැහැ වීමට එරෙහිව තෝරා ගත් දිලීරනාශක පහක් පරීක්ෂාවට ලක් කළ අතර ඉන් ඩයිෆෙනකොනසෝල් මඟින් සාර්ථකව දිලීර මර්දනය කළ හැකි විය.

පොකුරු ලුනු

දම් පුල්ලි සහ බල්බ කුණු වීමේ රෝග වලට එරෙහිව ප්‍රතිරෝධී ආර සොයා බැලීම පිණිස පොකුරු ලුණු එකතුන් පරීක්ෂාවට ලක් කරන ලදී.

පාංශු සහ ජල කළමනාකරණය

වාරිජලය (IW)/ සමුච්චිත තැටි වාෂ්පීකරණ (CPE) අනුපාතය භාවිතා කර වම්බටු සඳහා කාර්යක්ෂමව ජල සම්පාදනය කිරීම සම්බන්ධයෙන් සිදු කළ ඇගයීමේදී IW/CPE අනුපාතය 1.5 වඩාත් ඵලදායී බැවිද, එනමුත්, කාබනික පොහොර යෙදූ ක්ෂේත්‍ර වලින් ඉහළ නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා IW/CPE අනුපාතය 1 වීම ප්‍රමාණවත් බැවිද සොයා ගැණිනි. B කලාපයේ කුඹුරු වල ක්ෂේත්‍ර ඇළ මාර්ග වලට ජලය සපයන මාදුරු ඔය ජලාශයේ ප්‍රධාන සොරොව්වේ ජල වහනයේ කාර්යක්ෂමතාව සම්බන්ධයෙන් සිදු කළ ඇගයීමේදී 88.6%ක ඉහළ පරිවහන කාර්යක්ෂමතාවයක් ප්‍රධාන ඇළ මාර්ගයෙන් නිරීක්ෂණය වූ අතර ප්‍රධාන ශාඛාවෙන් අතු ශාඛාවට, අතු ශාඛාවෙන් ඇළ මාර්ගට සහ ක්ෂේත්‍ර ඇළ මාර්ග වලින් කුඹුරු වලට ජල සම්පාදනය කිරීමේදී ජල වහනයේ කාර්යක්ෂමතාව පිළිවෙලින් 73.92%, 59.31% සහ 30.81% ක් බැව් නිරීක්ෂණය විය.

- වී වගාව සිදු කෙරෙන ක්ෂේත්‍ර වල ඵලදායිතාව සහ පාංශු සාරවත්භාවය කෙරෙහි (ස්ථානීය සහ ස්ථානයෙන් පිටත) රසායනික පොහොර සමඟ කාබනික අවශේෂ දිගු කාලීනව යෙදීමෙන් ඇතිවන බලපෑම තක්සේරු කිරීම සඳහා වූ දිගු කාලීන අත්හදා බැලීම, වී රනිල බෝග හුවමාරු ක්‍රමය පිළිබඳ අත්හදා බැලීම් අඛණ්ඩවම සිදු කෙරිණි.

වල් පැළෑටි විද්‍යාව

- 2009/10 මහ සහ 2010 යල කන්නවලදී සම්මත ඔක්සිඩයසෝන් EC (රොන්ස්ටා 25 EC) බිස්පයිරිබැක් සෝඩියම් (නොමිනී), ටිලර් ගෝල්ඩ් සහ ප්‍රොපනිල් fb MCPA 60% සමඟ නව පැළෑටි නාශක 4 ක් පරීක්ෂාවට ලක් කරන ලදී. ප්‍රොපනිල් fb MCPA 60% හා සමානවම බෙන්සොළුට් 48% EC සහ ෆෙනොක්සිප්‍රොප් – පී – එතිල් 60g EC සියළුම වල් පාලනය කළ මුත් පෙන්ඩිමෙතලින් (stomp) අසාර්ථක විය.

- නිර්දේශිත ඔරයිසා සැටයිවා ප්‍රභේද වල වල් වී ලක්ෂණ වර්ධනය වීම සහ ප්‍රමුඛ වශයෙන් At 401, Bg 94-1, Bg 357 සහ Bg 352 හි වෙනත් වර්ග ඉස්මතු වීම පළමු කන්නයේදී සිදු කළ අත්හදා බැලීමේදී තහවුරු විය.

සංවර්ධනය

ඩ්‍රැගන් ෆෘට්

මෙම වසරේදී බඳුන් කළ පැළ 190 ක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කිරීම සඳහා බෙදා දෙන ලදී.

තුඹ කරවිල

මව් වැල් ස්ථාපිත කිරීම සඳහා බඳුන් කළ පැළ 26 ක් බෙදා දෙන ලදී.

තිබ්බටු

ඉල්ලුම පරිදි බින්දු ප්‍රභේදයේ අභිජනක බීජ දිවයින පුරා ගොවීන් අතර බෙදා දෙන ලදී. (හෙ. 110ක් වගා කිරීම සඳහා බීජ ග්‍රෑම් 550 ක් අලෙවි කළ අතර හෙ. 112 ක් වගා කිරීම සඳහා ග්‍රෑම් 562 ක් නොමිලයේ බෙදා දෙන ලදී.)

වෙනත්

අන්තර් ජාතික සංසද සහ සම්මන්ත්‍රණ වලට සහභාගී වීම.

- නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ), ආචාර්ය එස්.එච්.ඒ.ද සිල්වා 2010 ඔක්තෝම්බර් 10-12 දිනවල බංග්ලාදේශයේ ධකා නුවර පැවති SAARC TCARD රැස්වීමට ශ්‍රී ලංකා රජය නියෝජනය කරමින් සහභාගි විය.

ව්‍යාපෘති සහ වෙනත් වැඩසටහන්

- **කාබනික පොහොර නිෂ්පාදනය, භාවිතය සහ වැඩිදියුණු කිරීම**

  මෙම ව්‍යාපෘතිය වසර පුරාම ක්‍රියාත්මක වූ අතර අත්හදා බැලීම් සිදු කෙරෙන ක්ෂේත්‍ර වලට සහ ආදර්ශන ක්ෂේත්‍ර වලට කාබනික පොහොර ලබා දෙන ලදී. 627 දෙනෙකුට පුහුණුව ලබා දුන් අතර ඔවුන්ට අත්පත්‍රිකා සමඟ කොම්පෝස්ට් නියැදි ලබා දෙන ලදී.

කෙසෙල් රෝපණ ද්‍රව්‍ය නිපදවීමේ උප වැඩසටහන

රෝපණ ද්‍රව්‍ය නිපදවීම සඳහා ක්ෂේත්‍රයේ ස්ථාපිත කළ මව් පැළ (800) නඩත්තු කරන ලදී.

ගෙවතු

මධ්‍යස්ථානය තුළ ආදර්ශ ගෙවත්තක් ස්ථාපිත කරන ලදී.

තාක්ෂණික දැනුම බෙදා හැරීම

අත්පත්‍රිකා

ලූණු, පැපොල්, ඩ්‍රැගන් ෆෘට් සහ තුඹ කරවිල පිළිබඳව සහ ඒවාට අදාල තාක්ෂණ ක්‍රම පිළිබඳ අත්පත්‍රිකා දැනුවත් කිරීමේ වැඩසටහන් වලදී ජනතාව අතරේ බෙදා දෙන ලදී.

ක්ෂේත්‍ර දින සහ පුහුණු කිරීම්

පුහුණු වැඩසටහන්

විවිධ විෂයන්ට අදාල නිළධාරින්,ක්ෂේත්‍ර සහායකයින්, ගොවීන් සහ පාසල් සිසුන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වන ලදී. 627 දෙනෙකු සඳහා කොම්පෝස්ට් නිෂ්පාදනය පිළිබඳව පුහුණු වැඩසටහන් 11 ක් මධ්‍යස්ථානයේදී පැවැත් වූ අතර විවිධ තේමාවන්ට අදාලව වැඩසටහන් 24 ක් ස්ථානයෙන් පිටතදී සිදු කරන ලදී.

- **බෝග සායන**

  මෙම වසරේදී සම්පත් පුද්ගලයන් ලෙස නිළධාරීන් මහවැලි B,C,D, සහ G කලාප වල පැවති බෝග සායන 13 කට, ක්ෂේත්‍ර පරීක්ෂා කිරීම් 35 කට සහ ක්ෂේත්‍ර දින 4 කට සහභාගි වූ අතර කීට විද්‍යාව, පැළෑටි ව්‍යාධිවේදය සහ පාංශු විද්‍යාවට අදාල ක්ෂේත්‍ර ගැටළු සම්බන්ධයෙන් ගොවීන්ට තාක්ෂණික විසඳුම් ලබා දෙන ලදී.

- **පළාත් සහ මහවැලි තාක්ෂණික කණ්ඩායම් රැස්වීම්**

  මහවැලි සහ පළාත් තාක්ෂණික රැස්වීම් 09 කට සහ ඒවාට අදාල ප්‍රාරම්භක රැස්වීම් වලට අවශ්‍ය තාක්ෂණික සහාය ලබා දෙන ලදී. විශේෂයෙන්ම මහවැලි B සහ C කලාප වල ගොවීන්ගේ ක්ෂේත්‍ර ගැටළු සඳහා තාක්ෂණික විසඳුම් ලබා දුන් අතර පැළෑටි ආරක්ෂණය සඳහා ක්ෂේත්‍ර අධීක්ෂණ කිරීම මඟින්ද සෙසු ගැටළු සඳහා නියැදි විශ්ලේෂණය කිරීම මඟින්ද විසඳුම් ලබා දෙන ලදී.

සේවා

පාංශු පරීක්ෂණ

පාංශු නියැදි 320 ක් විශ්ලේෂණය කර ඒ අනුව ස්ථානීය විශේෂිත පොහොර නිර්දේශ ලබා දෙන ලදී.

2011 වසර සඳහා සැලැස්ම

ශාක විද්‍යාව

- අඹ ජනක ප්ලාස්ම ඇගයීම සහ ලක්ෂණීකරණය සහ ක්ෂේත්‍ර ජාන බැංකුව පුළුල් කිරීම.
- විශාල කෙත්වල වී කහ පැහැවීම කළමනාකරණය කිරීම.
- වල් වී සඳහා කළමනාකරණය කිරීමේ ක්‍රම
- බඩඉරිඟු වගාව පාදක අතුරු බෝග වගා ක්‍රමයේ ඵලදායිතාව සහ ආර්ථිකය

කීට විද්‍යාව

- මහවැලි B කලාපයේ මිරිස් වල සහ ලූණු වල යුෂ උරා බොන පළිබෝධ කළමනාකරණය කිරීම.

- වියළි කලාපයේ වී වගාවේ කොපු මයිටාවන් සහ ගොයම් කොළ මයිටාවන් ඇගයීම.

ප්‍රවේණිය සහ පැළෑටි අභිජනනය

- ඌන භාවිත බෝග වල ප්‍රභේදීය වැඩි දියුණු කිරීම.
- පොකුරු ලුණු සහ වී (මාස 3, 3 1/2 සහ 4 1/2) සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම.
- වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මඟින් සම්බන්ධීකරණය කෙරෙන වී සඳහා ජාතික සම්බන්ධීකරණ පැළෑටි නාශක අත්හදා බැලීම.
- මුල් ඇද්ද වූ මිදි වැල් කැබලි නිෂ්පාදනය කිරීම.
- තිබ්බටු වල අභිජනක බීජ නිෂ්පාදනය.

පැළෑටි ව්‍යාධිවේදය

- පොකුරු ලුනු වල පාදස්ථ කුණු වීම සහ වී වල ධාන්‍ය අවපැහැ වීම පාලනය කිරීම සඳහා දිලීර නාශක පරීක්ෂා කර බැලීම.

පාංශු සහ ජල කළමනාකරණය

- චූර්ණමය නොවන දුඹුරු පසේ සිදු කෙරෙන ලුණු වගාව සඳහා ඒකාබද්ධ පැළෑටි පෝෂණ ක්‍රම පිළිවෙත් සකස් කිරීම.
- පසෙහි බැර ලෝහ එකතුවීමෙන් කෘෂිකර්මාන්ත කෙරෙහි ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම.
- බෝග සමාකරණ සහ ජල කළමනාකරණ ආදර්ශ භාවිතයෙන් ශ්‍රී ලංකාවේ ජල සුරක්ෂිතතාව පිළිබඳ ඇගයුම.
- වාණිජව සිදු කෙරෙන පැපොල් වගාව සඳහා නිර්දේශිත ජලාපවහන ක්‍රමය සංශෝධනය කිරීම.
- බෝග ඵලදායිතාව සහ පාංශු සාරවත්භාවය කෙරෙහි දිගු කාලීනව රසායනික පොහොර සහ කාබනික ද්‍රව්‍ය භාවිතය මඟින් ඇතිවන බලපෑම ඇගයීම (ස්ථානීයව සහ ස්ථානයෙන් පිටත)
- වම්බටු වගාව සඳහා ජල සම්පාදන අවශ්‍යතාවන් පිළිබඳව වාරි ජලය/සමුච්චිත තැටි වාෂ්පීකරණ අනුපාතය මඟින් නිර්ණය කිරීම.
- චූර්ණමය නොවන දුඹුරු පසේ පාංශු බාදනය සහ සෝදා පාළුව කෙරෙහි විවිධ පාංශු සංරක්ෂණ ක්‍රම වලින් ඇතිවන බලපෑම.
- උඩරට බෝග වගා කිරීම සඳහා ජලාපවහනය දුර්වල චූර්ණමය නොවන දුඹුරු පස සංශෝධනය
- චූර්ණමය නොවන දුඹුරු පසෙහි සෝදා පාළුව පිළිබඳ අධ්‍යයනය.

වල් පැළෑටි විද්‍යාව

- වල් වී පාලනය කිරීම සඳහා ප්‍රවේණිය සහ පැළෑටි අභිජනන ප්‍රවේශය.
- දේශීයව ලබා ගත හැකි ද්‍රව්‍ය යොදා ගනිමින් කොම්පෝස්ට් නිෂ්පාදනය, භාවිතය සහ වැඩි දියුණු කිරීම.

කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සේවක සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)	01
පර්යේෂණ නිළධාරි (ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවය)	04
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරි	01
වැඩසටහන් සහකාර	01
පර්යේෂණ සහකාර	03
කෘෂිකර්ම උපදේශක	04
එකතුව	**13**

2.1.3 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, කිලිනොච්චිය

කිලිනොච්චි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය ඇතුළු වවුනියාව, මුරුන්කන් සහ පරන්තන්හි පිහිටා ඇති එහි උප මධ්‍යස්ථාන සතු වගකීම වනුයේ උතුරු පළාතේ ගොවි අවශ්‍යතා සපුරාලීම සඳහා විශේෂයෙන්ම කලාපයට (DL_1,DL_3 සහ DL_4) ආර්ථික වශයෙන් වැදගත් වෙනත් ක්ෂේත්‍ර බෝග සම්බන්ධයෙන් කෘෂිකර්මික පර්යේෂණ සහ වැඩිදියුණු කිරීමේ කටයුතු සිදු කිරීමයි. මෙම මධ්‍යස්ථානය මහ ඉලුප්පල්ලම ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයට අනුබද්ධිතය.

පසුගිය වසර 15 ක කාලය තුළ කිලිනොච්චි සහ පරන්තන් ප්‍රදේශවල පැවති අස්ථාවර තත්ත්වය හේතුවෙන් පර්යේෂණ සහ සංවර්ධන කටයුතු එහි සිදු කිරීමට හැකියාවක් නොවීය. කෙසේ වුවද, 2010 සිට එහි තත්ත්වය සාමාන්‍ය තත්ත්වයට පත්වෙමින් පවතින බැවින් කිලිනොච්චි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ සහ පරන්තන් වී පර්යේෂණ ස්ථානයේ මූලික පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ආරම්භ කර ඇත. මෙම වාර්තාවෙහි දැක්වෙන කාර්යයන් බොහොමයක්ම වවුනියාව උපයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානය, මුරුන්කන් කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, කිලිනොච්චි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සහ පරන්තන් වී පර්යේෂණ ස්ථානයේදී සිදු කරන ලදී.

ප්‍රගතිය

බෝග වැඩි දියුණු කිරීම

රටකජු

විවිධ කෘෂි පාරිසරික කලාප සඳහා බලාපොරොත්තු තැබිය හැකි රටකජු ආර වරණය කර ගැනීමට ඉන්දි, රෙඩ් ටෙස්ටා සහ තිස්ස යන පරීක්ෂණ ප්‍රභේද සමඟ රටකජු ආර පහක් පරීක්ෂාවට ලක් කෙරිණි. 2010 යල කන්නයේදී ICGV 01270 සහ 2009/2010 මහ කන්නයේදී ICGV 93704 යන ආර සැලකිය යුතු ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරන ලදී.

උඳු

වගා කිරීම සඳහා ඉහළ අස්වනු ගෙන දෙන සංයුක්ත ප්‍රතිරෝධිතාවෙන් යුත් උඳු ප්‍රභේදයක් බිහි කිරීම පිණිස උඳු ආර 35 ක් සම්බන්ධයෙන් අධ්‍යයනය සිදු කළ අතර MI – 1 සහ අනුරාධ යන පරීක්ෂණ ප්‍රභේද සමඟ පරීක්ෂාවට ලක් කර වැඩිදුර අධ්‍යයන සඳහා ආර 10 ක් වරණය කෙරිණ

අයවැය

විවිධ වැය ශීර්ෂ යටතේ වූ අයවැය ප්‍රතිපාදන සහ වියදම් වගු අංක 2.1.3.1 හි දැක්වේ.

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
පුනරාවර්තන	2,953,500	2,336,487	79
මූලධන	854,498	72,238	8
ව්‍යාපෘති			
• අපි වවමු රට නගමු	198,000	158,459	80
• කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය	50,000	80,000	16
එකතුව	**4,505,998**	**2,647,184**	**59**

කව්පි -

විවිධ කෘෂි පාරිසරික කලාප සඳහා බලාපොරොත්තු තැබිය හැකි කව්පි ආර වරණය කර ගැනීමට වරුණි පරීක්ෂණ ප්‍රභේදය සමඟ කව්පි ආර තුනක් පරීක්ෂාවට ලක් කෙරිණි. IT 98k-205 -8 2010 යල කන්නයේදී සැලකිය යුතු ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන ලදී.

වී

වවුනියාව උපයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානයේදී වී ප්‍රභේද 12 ක අනුවර්තනය වීමේ හැකියාව සම්බන්ධයෙන් අගයන ලදී. එසේ ඇගයීමට ලක් කළ එක් ප්‍රවේශයක්වත් සාර්ථක අනුවර්තනයක් නොපෙන්විය.

සම්භවය හඳුනානොගත් මෙරට ප්‍රචලිත දේශීය දර්ශයක (Attakkari) සංශුද්ධ ආරක් අගයන ලදී. මෙය හොඳින් අනුවර්තනය වන බව අනාවරණය වූ අතර ඇද වැටීමට සහ දුඹුරු පැළ කීඩැවාට ප්‍රතිරෝධී මධ්‍යම කාලීන (දින 105) ආරක් හඳුනා ගන්නා ලදී. රතු එලාවරණයකින් යුත් මෙම ආර 2010/11 මහ කන්නයේ ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම සඳහා ඇතුළත් කරන ලදී.

ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම සහ ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම්

වවුනියාව සහ මුරුන්කන් කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානවලදී වර්ෂාපෝෂිත සහ ජල සම්පාදිත තත්ත්ව යටතේ මාස 3, මාස 3 1/2 සහ මාස 4 වයස් කාණ්ඩ වල වී ප්‍රභේද පරීක්ෂාවට ලක් කෙරිණි. මෙහි ප්‍රතිඵල කලාපීය පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ සම්බන්ධීකරණ වධ්‍යස්ථානයට වාර්තා කරන ලදී. මන්නාරම සහ වවුනියාව දිස්ත්‍රික්ක සඳහා සුදුසු වී ප්‍රභේදයක් හඳුනා ගැනීමට ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම සිදු කෙරිණි.

පැළෑටි ආරක්ෂණය

මිරිස්

පරීක්ෂණ ප්‍රභේදය ලෙස MI – 2 යොදා ගනිමින් පැළ මැක්කාට එරෙහිව මිරිස් ආර 6 ක් අගයන ලදී. TVC – 5 හෙ. 1 ට ටොන් 4.6 ක ඉහළම අස්වැන්න වාර්තා කළ අතර පැළ මැක්කාගෙන් සිදු වූ හානිය සුළු විය. TVC – 1 සහ TVC – 3 යන මිරිස් ආර දෙකද වවුනියාව දිස්ත්‍රික්කයේදී මනා ක්‍රියාකාරිත්වයක් පෙන්නුම් කරන ලදී.

වම්බටු

වවුනියාව උපයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානයේදී "එක්කුවෙල්ලායි" "කතිපිඩියන්" සහ "අන්ප්ලි(ප්ලාස්ටික්)" යන සාම්ප්‍රදායික වම්බටු ප්‍රභේද තුන පරීක්ෂණ ප්‍රභේදය ලෙස "තින්නවේලි පර්පල්" යොදා ගනිමින් රිකිලි හා ඵල විදින්නාට එරෙහිව (Leucinodes orbanalis) අගයන ලදී. එක්කුවෙල්ලායි ප්‍රභේදය අනෙකුත් ප්‍රභේද වලට වඩා සාර්ථක ක්‍රියාකාරිත්වයකින් යුතුව හෙ. 1 කට ටොන් 15.2 ක අලෙවි කළ හැකි ඉහළ අස්වැන්නක් වාර්තා කළ අතර ඉතා සුළු වශයෙන් රිකිලි සහ ගෙඩි විදින්නාගේ හානියට ලක් වී තිබුණි.

උද්භිදාංග සහ කෘෂි රසායනික පිළිබඳ නිරීක්ෂණ අධ්‍යයන

- කොහොඹ කොළ, දුම් ගැසීමෙන් කරවිල සහ අඹ වල පලතුරු මැස්සා හානිය 70% කින් අඩු වී ඇත.
- පැපොල් පිටි මකුණාට එරෙහිව ඇසිටැම්ප්‍රිඩ් (මොස්පිලාන්) වඩා කාර්යක්ෂම විය.
- ගඳපාන කොළ (Nayunni) දුම අඹ ගස්වල කොළ කීඩැ ගහනය 80% කින් අඩු කර ඇත.

පාංශු ජල කළමනාකරණය

පාංශු නියැදි පරීක්ෂා කිරීම

මන්නාරම දිස්ත්‍රික්කයේ ලවණතාව බලපෑ ප්‍රදේශ වලින් ලබා ගත් පාංශු නියැදි PH අගය සහ CES අගය සම්බන්ධයෙන් පරීක්ෂා කර ඒවායෙහි ලවණතා මට්ටම් පාදකව ගොවීන්ට ප්‍රතිකර්ම ක්‍රම ලබා දෙන ලදී.

බීජ නිෂ්පාදනය

වී

පරන්තන් වී පර්යේෂණ ස්ථානයේ හෙ. 3 ක Attakkari සංශුද්ධ ආරෙහි බීජ නිෂ්පාදනය සිදු කෙරිණි.

මූලික බීජ නිෂ්පාදනය

යල කන්නයේදී කිලිනොච්චි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේදී නිපදවූ මූලික බීජ ප්‍රමාණයන් පහත දැක්වේ.

වගු අංක 2.1.3.2 2010 දී නිෂ්පාදිත මූලික බීජ ප්‍රමාණ

බෝගය	ප්‍රභේදය	ප්‍රමාණය
කරවිල	තින්නවේලි වයිට්	06 Kg
පතෝල	තින්නවේලි ලෝන්ග්	02 Kg
වම්බටු	තින්නවේලි පර්පල්	03 Kg
මිරිස්	KA – 2	03 Kg
තක්කාලි	KC - 1	100 g

පලතුරු ජනක ප්ලාස්ම නඩත්තු කිරීම

කදලි, කප්පාල්, මොන්දන්, ඇම්බම් (අළු, කොළ) ඊතරායි සහ කැවෙන්ඩිෂ් කෙසෙල් ප්‍රභේද වල ජනක ප්ලාස්ම වවුනියාව උපයෝගිතා පර්යේෂණ මධ්‍යස්ථානයේ නඩත්තු කෙරිණි.

වගු අංක 2.1.3.3 අපි වවමු රට නගමු වැඩසටහන් යටතේ බීජ නිෂ්පාදනය

බෝගය	ප්‍රභේදය	ප්‍රමාණය
බඩඉරිඟු	රුවන්	50 Kg
කුරක්කන්	ඕෂධ	50 Kg

කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය

නිෂ්පාදිත කාබනික පොහොර ප්‍රමාණයන් පහත දැක්වේ.

කොම්පෝස්ට් නිෂ්පාදනය - ටොන් 15

සන්හෙම්ප් බීජ නිෂ්පාදනය - කි.ග්‍රෑ. 750

සන්හෙම්ප් කොළ පොහොර නිෂ්පාදනය - හෙ. 01

ග්ලිරිසීඩියා පැළ - හෙ. 0.2

තාක්ෂණය පතුරුවාලීම

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ජාතික සේවය (තෙන්රල්) ඔස්සේ ගුවන් විදුලි වැඩසටහන් 04 ක් ප්‍රචාරය කරන ලදී.

උපදේශක සේවාව

පර්යේෂණ නිළධාරීන් සහ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය ගොවි ක්ෂේත්‍ර අධීක්ෂණය කර පළිබෝධ සහ රෝග සඳහා ප්‍රතිකර්ම ක්‍රම ලබා දෙන ලදී.

යාපනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂගේ (ව්‍යාප්ති) මූලිකත්වයෙන් පාසල් 12 ක පාසල් සිසුන් 870 ක්, ගුරුවරුන් 22 ක් කෘෂිකර්ම ඩිප්ලෝමා සිසුන් 51 ක් සහ ගොවීන් කණ්ඩායමක් මෙම මධ්‍යස්ථානය නැරඹීමට පැමිණියහ.

සංවර්ධන කටයුතු

"උතුරු වසන්තය" ව්‍යාපෘතිය යටතේ කිලිනොච්චි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ ප්‍රධාන කාර්යාල සංකීර්ණය, චමරිය, වැට සහ IV වැනි ශ්‍රේණියේ නිල නිවාස 2 ක් ප්‍රතිසංස්කරණය කරන ලදී.

- කඩිනම් උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ කිලිනොච්චි කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ ශාෂ්‍ය විද්‍යා රසායනාගාර ගොඩනැගිල්ල, වැටේ කොටසක්, සේවක විවේක කාමරය සහ නල ළිං තුනක් ඉදි කරන ලදී.

2010 වසර සඳහා සැලැස්ම

- මිරිස් වලට වැළදෙන රෝග පරිසර හිතකාමීව කළමනාකරණය කිරීම සඳහා උද්භිද පළිබෝධ නාශකවල සාර්ථකත්වය සොයා බැලීම.
- මිරිස් වල ප්‍රධාන පළිබෝධ වලට එරෙහිව ගහන ගතිකත්ව ඇගයීම.
- කරවිල සහ මෑ වල පළිබෝධ වලට එරෙහිව උද්භිද පළිබෝධනාශක ඇගයීම.

- නෙමටෝඩාවන් කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය තාක්ෂණය බිහි කිරීම.
- පැළ මැක්කාට ප්‍රතිරෝධී මිරිස් ආර සම්බන්ධයෙන් මූලික අස්වනු අත්හදා බැලීම.
- ඉහළ අස්වනු සම්බන්ධයෙන් සහ රිකිලි සහ ගෙඩි විදින්නාට දක්වන ප්‍රතිරෝධීතාව සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා දේශීය වම්බටු වගා ප්‍රභේද පරීක්ෂා කිරීම.
- ඉහළ අස්වනු ගෙන දෙන, මනාව අනුවර්තනය වන සංයුක්ත ප්‍රතිරෝධී ප්‍රභේදයක් බිහි කිරීම සඳහා උඳු ආරවල ජාන විචල්‍යතාව සහ ආශ්‍රිත අධ්‍යයන.
- විවිධ කෘෂි පාරිසරික කලාප සඳහා බලාපොරොත්තු තැබිය හැකි උඳු ආර පරීක්ෂා කිරීම.
- විවිධ ගබඩාකරණ පරිසර තත්ත්ව යටතේ ගබඩා කරන ලද උඳු වල ගුණාත්මය ඇගයීම.
- තක්කාලි වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි අගල් යොදා සිදු කරන ජල සම්පාදනයෙන් ඇති වන බලපෑම අධ්‍යයනය කිරීම.
- ජලය ඉතිරි කර ගැනීම සඳහා පිපිසිඳ්දා සහ කරවිල සමූහ ලෙස වගා කිරීම.
- දේශීයව ප්‍රචලිත මාස 3 1/2 වයස් කාණ්ඩයේ රතු වී ප්‍රභේදයේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි පැළ ඝනත්වයෙන් ඇති වන බලපෑම අධ්‍යයනය කිරීම.
- උතුරු කලාපයේ ස්වායු තත්ත්වයන් යටතේ වී ප්‍රභේදවල ක්‍රියාකාරිත්වය අධ්‍යයනය කිරීම.
- ගොවි ක්ෂේත්‍ර වලට හොඳින් අනුවර්තනය වූ රතු එලාවරණය සහිත වී භූමි දර්ශ සංශුද්ධ කිරීම.
- ට්‍රිපල් සුපර් පොස්පේට් සමඟ ශාකමය පොස්පරස් සංසන්දනය
- ලවණතාවය බලපෑ පාංශු පරීක්ෂා කිරීම.
- රතු ලූණු ජනක ප්ලාස්ම ස්ථානීයව සංරක්ෂණය කිරීම.
- තින්නවේලි වයිට් කරවිල ප්‍රභේදයේ අභිජනක බීජ නිෂ්පාදනය කිරීම.
- ස්වායු තත්ත්ව යටතේ වී වල ක්‍රියාකාරිත්වය ඇගයීම.
- වී භූමි දර්ශ සංශුද්ධ කිරීම.
- කාබනික ගොවිතැන දිරිමත් කිරීම සඳහා මෙන්ම හානිදායක අකාබනික පළිබෝධනාශක භාවිතය අඩු කිරීම සඳහා කාබනික පොහොර භාවිතය මඟින් රතු ළූණු වල නෙමටෝඩාවන් සහ රෝග කළමනාකරණය කිරීම.
- යාපනය දිස්ත්‍රික්කයේ ගොවීන් සඳහා ගුණාත්මක පවිත්‍ර ජනක ප්ලාස්ම තොග නිපදවීමට කෙසෙල්, කොස්, අඹ, පැණි දොඩම්, දෙහි, දෙළුම් සහ මිදිවල ජනක ප්ලාස්ම නඩත්තු කිරීම.
- වල් උවදුර පිළිබඳ අධ්‍යයනයක්
- තක්කාලි (KC 1) අභිජනක බීජ නිෂ්පාදනය
- පැණි කොමඩු දේශීය කොමඩු සමඟ අතුරු බෝග වගාව
- උද්‍යාන පට බෝග වගාව යටතේ බෝග වල ක්‍රියාකාරිත්වය ඇගයීම.

කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)	01
ස්ථාන භාර පර්යේෂණ නිළධාරී	01
පර්යේෂණ නිළධාරී	06
කෘෂිකර්ම උපදේශක	07
පර්යේෂණ සහකාර	02
පර්යේෂණ උප සහකාර	02
කළමනාකරණ සහකාර	01
මුරකරු	02
නුපුහුණු කම්කරු	36
එකතුව	**58**

2.2 උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, ගන්නෝරුව

උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය වෙත පැවරී තිබෙන වගකීම වනුයේ පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් මඟින් මෙරට උද්‍යාන බෝග නිෂ්පාදනය ඉහළ නංවාලීමයි. වගකීම පැවරී තිබෙන බෝග අතරට එළවළු, පලතුරු, බිම්මල්, මුල් සහ ආකන්ද සහ මල් වගාව ඇතුළත් වේ. පර්යේෂණ වැඩසටහන ප්‍රධාන වශයෙන්ම වැඩිදියුණු කළ බෝග නිෂ්පාදනය සහ කළමනාකරණ ශිල්පක්‍රම, පැළෑටි පෝෂක කළමනාකරණය, පළිබෝධ සහ රෝග පාලනය, පසු අස්වනු සහ ආහාර සැකසුම් ක්‍රමවේද, රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ ගෙවතු වගාව කෙරෙහි කේන්ද්‍ර ගත කෙරේ.

ප්‍රගතිය

ව්‍යාපෘති

- **එළවළු සහ පලතුරු වල දෙමුහුම් බීජ නිෂ්පාදනය**

අනර්ඝ තත්ත්වයේ දෙමුහුම් එළවළු සහ පලතුරු ප්‍රභේද බිහි කිරීම, නිර්දේශිත ප්‍රභේද වල මාපිය ආර නඩත්තු කිරීම සහ දෙමුහුම් බීජ නිෂ්පාදනය කිරීම සඳහා පර්යේෂණ සිදු කිරීම මෙම වැඩසටහන යටතේ සිදු කරන ප්‍රධාන කාර්යයන් වේ. තක්කාලි, වම්බටු, වැටකොළු, මාළුමිරිස්, පිපිඤ්ඤා, මෑ, කරවිල සහ පලතුරු (පැපොල්) සම්බන්ධයෙන් පර්යේෂණ සිදු කරන ලදී.

අයවැය

වගු අංක 2.2.1 වාර්ෂික අයවැය – 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදන	වියදම	වියදම %
මූලධන	23,613,862	13,346,003	57
පුනරාවර්තන	48,757,000	44,037,420	90
ව්‍යාපෘති			
• එක් ගමක් එක් බෝගයක්	3,870,000	2,933,516	76
• පලතුරු සහ එළවළු දෙමුහුම් බීජ නිෂ්පාදනය	3,060,000	1,986,493	65
• කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම	13,400,000	8,650,347	65
• බෝග නායක – එළවළු	8,000,000	5,367,335	67
එකතුව	**100,700,862**	**76,324,115**	**76**

උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය සමඟ එක්ව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මෙන්ම පෞද්ගලික අංශයේ තෝරා ගත් සංවිධාන වල ගොවිපලවල්හි ඇළුතින් බිහි කරන ලද එළවළු ප්‍රභේද කීපයක දෙමුහුම් බීජ නිෂ්පාදනය කිරීම ආරම්භ කෙරිණි. 2010 වසරේදී විවිධ ආයතන මඟින් නිෂ්පාදිත දෙමුහුම් බීජ ප්‍රමාණ සහ එළවළු වර්ග පිළිබඳව වගු අංක 2.2.2. හි දැක්වේ.

වගු අංක 2.2.2 2010 වසරේ දෙමුහුම් බීජ නිෂ්පාදිතය

බෝග ප්‍රභේදය	ආයතනය	නිෂ්පාදිත ප්‍රමාණය (කි.ග්‍රෑ)
තක්කාලි (හාතිය)	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	9.23
	පෞද්ගලික අංශය	13.5
තක්කාලි (මහේෂි)	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	14.88
	පෞද්ගලික අංශය	9.1
වම්බටු (අමන්දා)	කෘෂිකර්ම දෙපාර්තමේන්තුව	10

- **බෝග නායක – එළවළු**

57 kg

මෙම වැඩසටහන ආරම්භ කරන ලද්දේ ගුණාත්මක බීජ සහ රෝපණ ද්‍රව්‍ය වල සුලභතාව වර්ධනය කර ඉහළ අස්වනු ගෙන දෙන එළවළු ප්‍රභේද හඳුන්වාදීමෙන්ද, කාර්යක්ෂම ඒකාබද්ධ පළිබෝධ සහ රෝග කළමනාකරණ ක්‍රමවේද ප්‍රවර්ධනය කිරීමෙන්ද, වාණිජ පරිමාණයෙන් වගා සිදු කිරීමෙන් සහ පසු අස්වනු කළමනාකරණ තාක්ෂණය සහ අගය එක් කළ නිෂ්පාදන වැඩිදියුණු කිරීමේ තාක්ෂණය යොදා ගනිමින්ද එළවළු නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා වේ. මෙමඟින් ඉලක්ක කරන ලද්දේ තක්කාලි, බෝංචි, වම්බටු, මෑ, දඹල, බණ්ඩක්කා, අර්තාපල්, මුල් සහ ආකන්ද බෝග සහ කොළ එළවළු වේ.

- **එක් ගමක් එක් බෝගයක්**

තෝරා ගත් කලාප වල ඉහළ විභවයක් සහිත පලතුරු ප්‍රවර්ධනය කරන අතරම මෙරට පලතුරු නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා ඉහළ විභවයක් සහිත හඳුනාගත් පලතුරු බෝග වල බෝග කලාප ස්ථාපිත කිරීම මෙම වැඩසටහනෙහි අරමුණ වේ. තෝරාගත් පලතුරු බෝගවල නිෂ්පාදිත රෝපණ ද්‍රව්‍ය පිළිබඳව පහත වගුවෙහි දැක්වෙන අතර බෝග කලාප ස්ථාපිත කිරීම සඳහා අදාළ පළාත් සහ හරහා ඉලක්ක කෙරුණු ගොවීන් අතර රෝපණ ද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් බෙදා දෙන ලදී.

වගු අංක 2.2.3	2010 වසරේදී නිෂ්පාදිත රෝපණ ද්‍රව්‍ය ප්‍රමාණය
පලතුරු	ප්‍රමාණය (රෝපණ ද්‍රව්‍ය)
රඹුටන්	23,155
දොඩම්	4,000
දූරියන්	4,250
අඹ	7,450
අන්නාසි	91,970
පෙයාර්ස්	2,450
ජම්බු	3,360
මිදි	2,815
ස්ට්‍රෝබෙරි	5,635
දෙළුම්	2,500
එකතුව	**147,585**

මෙම වැඩසටහන යටතේ විවිධ ප්‍රදේශ වල බිම්මල් ගම්මාන ස්ථාපිත කරන ලදී. (වගු අංක 2.2.4) පුහුණු වැඩසටහන් සහ වැඩමුළු හරහා බිම්මල් නිෂ්පාදනය පිළිබඳ ගොවීන් 50 දෙනෙකු පමණ පුහුණු කරන ලදී.

වගු අංක 2.2.4 බිම්මල් ගම්මාන ස්ථාපිත කිරීම

දිස්ත්‍රික්කය	ප්‍රා.ලේ. කොට්ඨාශය	ගම	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
මාතර	කඹුරුපිටිය	කඹුරුපිටිය	10
		මාලිම්බඩ	
නුවරඑළිය	නුවරඑළිය	මීපිලිමාන	10
ගම්පහ	වල්පිට	වල්පිට	1
කුරුණෑගල	පන්නල	එලබඩගම	15
		හොරවඩුන්න	
මහනුවර	කුණ්ඩසාලේ	පහළ තැන්නේකුඹුර	10
	ගඟවට කොරලේ	කෙන්ගල්ල මළුවේගම	5

කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

ශ්‍රී ලංකාවේ ගොවීන් අතර කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වූ අතර ගොවි ක්ෂේත්‍ර වල කාබනික පොහොර නිෂ්පාදනයආරම්භ කිරීම සඳහා ගොවීන් අතර බෙදාදීමට මුහුම් විශාල වශයෙන් නිපදවීම ප්‍රධාන කාර්යය විය. කාබනික පොහොර නියැදි සහ

කොම්පෝස්ට් නිපදවීම සඳහා භාවිතා කරන අමු ද්‍රව්‍ය විශ්ලේෂණය කිරීමද සිදු කරන ලදී. විවිධ බෝග වලට කාබනික පොහොර කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා නව පිළිවෙත් මාලා බිහි කිරීම පිණිස ඒකාබද්ධ පැළෑටි පෝෂක ක්‍රම අත්හදා බැලීම් සිදු කෙරුණු අතර 2010 වසරේදී සිදු කරන ලද කාර්යයන් පිළිබඳව වගු අංක 2.2.5 හි සාරාංශගත කර ඇත.

නිෂ්පාදනය කිරීම සඳහා පෞද්ගලික බීජ සමාගම් වලට මාපිය ප්‍රභේද සපයන ලදී.

තක්කාලි

විකෘති අභිජනනය මඟින් බිහි කරන ලද ලංකා චෙරි නැමැති තක්කාලි ප්‍රභේදයක් මුදා හරින ලදී.

වගු අංක 2.2.5 කාබනික වගා ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්

කාර්යය	ප්‍රගතිය
කොම්පෝස්ට් නිෂ්පාදනය පිළිබඳ පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්	1,830
ගොවි පුහුණු (පුද්ගලයන් සංඛ්‍යාව)	155
පාසල් සිසුන් (ළමුන් සංඛ්‍යාව)	783
කොම්පෝස්ට් නිෂ්පාදනය	
කොළ පොහොර වගා කිරීම (හෙක්ටයාර)	5.95
කොම්පෝස්ට් නිෂ්පාදනය (මෙ.ටො.)	443
කොම්පෝස්ට් පර්යේෂණ සහ විශ්ලේෂණය (ඒකාබද්ධ පැළෑටි පෝෂක ක්‍රම පිළිවෙත් මාලා බිහි කිරීම සහ වෙනත් පර්යේෂණ)	21
විශ්ලේෂණ ස්ථාන වැඩිදියුණු කිරීම් (විශ්ලේෂණාත්මක මධ්‍යස්ථානවල යටිතල පහසුකම් සංවර්ධනය)	4
ඒකාබද්ධ පැළෑටි පෝෂක ක්‍රම ආදර්ශනය කිරීම්	24

- **ආදර්ශ ගම්මාන වැඩසටහන**

මෙම වැඩසටහනේ ප්‍රධාන ඉලක්කය වන්නේ ආදර්ශ ගොවි ගම්මාන බිහි කර බෝග නිෂ්පාදනය පිළිබඳ නිවැරදි තාක්ෂණ ක්‍රම පිළිබඳවත්, නිර්දේශිත බෝග හා පළිබෝධ සහ රෝග කළමනාකරණ පිළිවෙත් පිළිබඳවත් ගොවීන්ගේ දැනුම වර්ධනය කර ජීවන තත්ත්වය නංවාලීමයි. ආදර්ශ ගොවි ගම්මාන වල ගොවීන්ට සහන මිල ගණන් වලට බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලබා දුන් අතර ක්ෂේත්‍ර චාරිකා සමඟ පුහුණුව සහ විශේෂඥ දැනුම ලබා දෙන ලදී.

එළවළු අංශය

අභිජනක බීජ නිෂ්පාදනය

තක්කාලි, කරවිල, මෑ සහ දඹල ප්‍රභේද වල අභිජනක බීජ නිෂ්පාදනය කළ අතර භාතිය සහ මෙහෙෂි තක්කාලි ප්‍රභේද වල දෙමුහුම් බීජ

වගු අංක 2.2.6 උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මඟින් සිදු කරන අභිජනක බීජ නිෂ්පාදනය

බෝගය	ප්‍රභේදය	ප්‍රමාණය (කි.ග්‍රෑ.)
තක්කාලි	තිලිණ	225
	රාජිත	33
	T 24	26
	භාතිය ප්‍රභේදයේ මාපියන්	0.38
කරවිල	මාතලේ ග්‍රීන්	60
මෑ	හවරි	16
	පොලොං	18
දඹල	කිෂ්ණා	28

මෙය විවෘත ක්ෂේත්‍රයේ වගා කිරීම සඳහා යෝග්‍ය අඛණ්ඩව වැඩෙන ප්‍රභේදයකි.

- ඉහළ අස්වනු ගෙන දෙන දෙමුහුම් ප්‍රභේදයක් වන HF3 සහ බහු අක්ෂ වර්ධනයකින් යුත් විකෘතියක් වන M127 යන බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද හඳුනා ගැණිනි. ඒවායෙහි අනුවර්ත්‍යතාව සනාථ කර ගැනීම සඳහා තවදුරටත් පරීක්ෂාවට ලක් කෙරේ.

- විදේශීය ප්‍රභේද ඇගයීම – F1 ටයිකිං 5 සහ මොන්ගල් යන තක්කාලි ප්‍රවේශවල අස්වැන්න පරීක්ෂණ ප්‍රභේද වලට වඩා උසස් මට්ටමේ පැවතුණි. F1 15043, TM 701, ස්ටාර් 9062, ස්ටාර් 9064 යන ප්‍රභේද වල ක්‍රියාකාරිත්වය පිළිගත හැකි මට්ටමේ පවතින බවද NS 537, ස්ටාර් 9012, ස්ටාර් 9063 සහ ස්ටාර් 9065 යන ප්‍රවේශ වල සමස්ථ ක්‍රියාකාරිත්වය ආනයනය කිරීම සඳහා පිළිගත නොහැකි බැව්ද හඳුනා ගැනිණි.

මාළු මිරිස්

- හඳුනා ගන්නා ලද බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද – දෙමුහුම් මාළු මිරිස් ප්‍රභේදයක් වන HCAI ඉහළ ඵලදාවක් ගෙන දෙමින් බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේදයක් බැව් ප්‍රකට කරන ලදී.

- විදේශීය ප්‍රභේද ඇගයීම – FST 403 (හෙ. ට ටොන් 18.7) සහ HP 210 (හෙ. ට ටොන් 14.7) මාළු මිරිස් ප්‍රවේශ ඉහළ අස්වනු ගෙන දෙන බැව් අනාවරණය විය. ටෝනස් F1 සහ 21348 යන ප්‍රභේද වලද ක්‍රියාකාරිත්වය පිළිගත හැකි මට්ටමේ පැවතුණි. FST 102 සහ FST 519 ඉහළ අස්වනු ගෙන දෙන බෙල් පෙපර් වර්ගයේ ප්‍රභේද වන අතර පර්ෆෙකටෝ සහ මැග්නිෆිෂෝ අච්චාරු සඳහා යොදා ගැනීමට සුදුසු පිළිගත හැකි ප්‍රභේදයන් වේ.

වැටකොළු

- බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද 2 ක් හඳුනා ගන්නා ලදී.

- මාපිය ආර 6 ක ජාන පාරිශුද්ධතාව නඩත්තු කරන ලදී.

- මුහුම් 12 කින් දෙමුහුම් බීජ ලබා ගන්නා ලදී.

- ස්ථාන දෙකක ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සිදු කෙරේ. (ප්‍රභේද 2 ක්)

- දිස්ත්‍රික්ක තුනක ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සිදු කෙරේ. (ප්‍රභේද 2)

බෝංචි සහ දඹල

- බෝංචි පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම ස්ථාන තුනක සිදු කෙරේ.

- බෝංචි පිළිබඳ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම දිස්ත්‍රික්ක හතරක සිදු කෙරේ.

- ක්‍රිෂ්ණ දඹල ප්‍රභේදයේ අභිජනක බීජ නිෂ්පාදනය සිදු කෙරේ.

පිපිඤ්ඤා

- මූලික අස්වනු අත්හදා බැලීම මඟින් H 50, H 51, H 42 සහ H 44 යන නව ප්‍රවේශ හඳුනා ගන්නා ලදී.

- මාපිය ආර 8 ක ජාන පාරිශුද්ධතාව නඩත්තු කෙරිණි.

- මුහුම් 12 කින් බීජ ලබා ගන්නා ලදී.

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම ස්ථාන 4 ක සිදු කෙරේ.

- ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම දිස්ත්‍රික්ක 4 ක සිදු කෙරේ.

කරවිල

- මාපිය ආර 10ක ජාන පාරිශුද්ධතාව නඩත්තු කෙරිණි.

- මුහුම් 2 කින් බීජ ලබා ගන්නා ලදී.

- F1 විදේශීය දෙමුහුම් ප්‍රභේද 14 ක් ඇගයීමට ලක් කළ අතර එහි ප්‍රතිඵල බෝග සමායෝජක වෙත ලබා දෙන ලදී.

වම්බටු

- පසුගිය කන්න තුනකදී ස්ථාන 05 කදී සිදු කළ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම යටතේ "ලේනෙරි" F1 දෙමුහුමක් ඉහළ අස්වනු ගෙන දීමේ හැකියාව (හෙ. 1 කට ටොන් 30 ට වැඩි), බැක්ටීරියා හිටු මැරීමට ප්‍රතිරෝධීවීම සහ මනා තත්ත්වයේ ඵල වලින් යුතු වීම යන බලාපොරොත්තු තැබිය හැකි ලක්ෂණ ප්‍රකට කරන ලදී. මෙම ප්‍රභේද ගොවි තත්ත්ව යටතේදීද හොඳ අනුවර්තන හැකියාවක් පෙන්නුම් කරන ලදී. මෙහි අනුවර්තන වීමේ හැකියාව සම්බන්ධයෙන් විවිධ කෘෂි පාරිසරික කලාප යටතේ පරීක්ෂා කිරීම සිදු කෙරෙමින් පවතී.

මෑ

- ප්‍රධාන අස්වනු අත්හදා බැලීමේදී F1 දෙමුහුම් 13 කින් දෙමුහුම් තුනක් ඉහළ අස්වනු ගෙන දුණි. මෙම දෙමුහුම් සියල්ලම කඳ පාමුල කුණුවීමේ රෝගයට ප්‍රතිරෝධී විය.

- ඉහළ අස්වනු ගෙන දෙන කඳ පාමුල රෝගයට ප්‍රතිරෝධී ස්වාභාවික පරාගනය සිදු කෙරුණු මෑ ප්‍රභේද 9 ක් ප්‍රධාන අස්වනු අත්හදා බැලීමට ඉදිරිපත් කරන ලදී.

- ස්ථාන 4 කදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සිදු කෙරේ.

- දිස්ත්‍රික්ක 4 කදී ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සිදු කෙරේ.

- මාතලේ ග්‍රීන් (කි.ග්‍රෑ. 9.95), හවරි මෑ (කි.ග්‍රෑ. 32.25) සහ පොලොං මෑ (කි.ග්‍රෑ. 37) අභිජනක බීජ නිපදවා බීජ අංශයට ලබා දෙන ලදී.

කොළ එළවළු - තම්පලා

- ඉහළ අස්වනු ගෙන දෙන දියපාලගොඩ සහ පියෝ ග්‍රීන් යන තම්පලා එකතුන් වල ප්‍රතිඔක්සිකාරක ක්‍රියාව පිළිවෙලින් 47.3 ක් සහ 42.1 ක් වූ ඉහළ මට්ටමක පවතින අතර දියපාලගොඩ ප්‍රභේදයේ කැරටිනොයිඩ වර්ග සෙ.මී. 1 කට මි.ග්‍රෑ. 0.38 ක් සහ පියෝග්‍රීන් වල වර්ග සෙ.මී. 1 කට මි.ග්‍රෑ. 0.2 ක් වූ ඉහළ ප්‍රමාණයක් අන්තර්ගත වේ.

පලතුරු සහ පටක රෝපණ අංශය

කෙසෙල්

- ඇඹුල් කෙසෙල් ප්‍රභේද 37 ක අනුවර්තන හැකියාව ඇගයීමේ අධ්‍යයන ස්ථාන 3 කදී සිදු කරන ලදී.

- ඉහළ අස්වනු ගෙන දෙන, තත්ත්වයෙන් උසස්, පැනමා රෝගයට ඔරොත්තු දෙන සීනි කෙසෙල් එකතුවක් සහ තත්ත්වයෙන් උසස් ඉහළ අස්වනු ගෙන දෙන ඇඹුල් කෙසෙල් එකතුවක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීමට නම් කරන ලදී.

පැපොල්

- අස්වැන්න සහ ගුණාත්මය ඇගයීම සඳහා දේශීයව නිපදවන ලද දෙමුහුම් ප්‍රභේද 06 ක් ස්ථාන 2 ක ස්ථාපිත කරන ලදී.

- සහභිජාත පැපොල් නිපදවීම සඳහා එක්රැස් කරගත් පැපොල් ජනක ප්ලාස්ම වල තුන් වැනි පරම්පරාව කෙෂ්ත්‍රයේ ස්ථාපිත කරන ලදී.

රඹුටන්

- ඒකාබද්ධ පැළෑටි පෝෂක කළමනාකරණ ක්‍රමය පිළිබඳ ව්‍යාපෘතිය යටතේ පස්යාල රතු කහ පොඩ්සොලික් පසෙහි සහ උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ රතු දුඹුරු ලෝම පසෙහි රඹුටන් අගයන ලදී. තෝරාගත් ගස් කීපයක ගෙඩි වල බරෙහි යම් යම් වෙනස්කම් පැවතුණි. එළඹෙන වගා කන්නයේදී ද පර්යේෂණ අඛණ්ඩවම සිදු කෙරේ. අස්වැන්න සහ ගුණාත්මක ලක්ෂණ සම්බන්ධයෙන් අංකුර ප්‍රවිකිරණය කරන ලද බද්ධ රඹුටන් පැළ ඇගයෙමින් පවතී.

වරකා

- වඩාත් හොඳ ප්‍රභේද හඳුනා ගැනීම සඳහා නව එකතූන් ඇගයීම අඛණ්ඩවම සිදු කෙරේ.

අඹ

- වඩාත් හොඳ ප්‍රභේද සොයා ගැනීම සඳහා ජනක ප්ලාස්ම ඇගයීම සිදු කරන ලදී.

- කුරු පැළ ව්‍යූහයක් සකස් කිරීම සඳහා වඩාත් සුදුසු ඉන්ටර් ස්ටොක් එකක් සොයා ගැනීම සඳහා ඇගයීම් අඛණ්ඩවම සිදු කරන ලදී.

දූරියන්

- අනර්ඝ තත්ත්වයේ දූරියන් එකතූන් 6 ක් ඇගයෙමින් පවතී.

- ගුණාත්මක, වැඩි අස්වනු ලබා ගැනීම සඳහා වඩාත් හොඳ සංයෝග අනාවරණය කර ගැනීම සඳහා පර පරාගන අධ්‍යයන සිදු කරන ලදී.

අලිපේර

- ඒකාබද්ධ පැළෑටි පෝෂක කළමනාකරණ ක්‍රමය – නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් පොහොර 50% කින් හෝ 25% කින් අඩු කර හෙ. 1 කට කොම්පෝස්ට් ටොන් 10 ක් හෝ 15 ක් එක් කළ විට කඳෙහි වට ප්‍රමාණය සහ වියනේ විෂ්කම්භයේ වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

ඌණ භාවිත පලතුරු

- ජනක ප්ලාස්ම එක්රැස් කිරීම, සංරක්ෂණය කිරීම සහ ඇගයීම මඟින් දූරියන්, උගුරැස්ස, මොර, මසන් සහ වරකා යන පලතුරු වල ගුණාත්මක ප්‍රභේද හඳුන්වාදීම.

පටක රෝපණය

පැළ පුනර්ව්‍යර්ධන ක්‍රම

එළවළු

- **ලයිකොපර්සිකන්**

  පරාගධානි රෝපණය මඟින් තක්කාලි වල (තිලිණ ප්‍රභේදය) කිණක ලබා ගන්නා ලදී. පරාගධානි මඟින් ලබා ගන්නා ලද කිණක වලින් ඒකගුණ පැළ පුනර්ව්‍යර්ධනය කිරීමේ අත්හදා බැලීම් සිදු කෙරෙමින් පවතී.

පලතුරු

- **කෙසෙල්**

  කෝලිකුට්ටු කෙසෙල් වල මූලික රෝපණ ද්‍රව්‍ය බිහිකිරීම සිදු කෙරෙමින් පවතී. විභාජක පටක රෝපණය මඟින් ව්‍යාධිජනක වලින් තොර මූලික එකතුවක් නිපදවීම සඳහා ඇඹුල් කෙසෙල් ප්‍රභේදයේ මොරෙයියන් මාධ්‍යයේ ස්ථාපිත කරන ලදී.

කෙසෙල් සහ අන්නාසි වල මූලික රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම

ක්ෂේත්‍ර ඇගයීම

- පටක රෝපිත නේත්‍රපලම් වල දෙවන තොගය උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ ස්ථාපිත කළ අතර නලස්ථව ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතී.

- පටක රෝපිත අන්නාසි පැළ (මුරුසි සහ කිව් ප්‍රභේද) පරීක්ෂණ කටයුතු සඳහා උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදී. කෙසේවුවද, මෙමඟින් නිපදවුණු පළතුරු වල රසය සහ ගුණාත්මය සම්බන්ධයෙන් ගැටළු පැන නැඟුණි.

වගු අංක 2.2.7 පටක රෝපිත පැළ වල වත්මන් තත්ත්වය

බෝගය	ප්‍රභේදය	බෙදා හරින ලද පැළ සංඛ්‍යාව	ලද ආයතනය	පැළ ගෘහයේ තිබෙන පැළ සංඛ්‍යාව	නලස්ථව තිබෙන සංඛ්‍යාව
කෙසෙල්	ඇම්බන්	170	කෘ.පර්. ස්ථානය තෙලිජ්ජවිල	305(+7 මව් තොග)	246
	කුරු ඇම්බන්				51
	පුලතිසි			27	12
	රතඹලා			46	39
	සීනි කෙසෙල්			05 (මව් ශාක)	
	නේත්‍රාම්පලම්			67	120
අන්නාසි	මුරුසි			1086	1500
	කිව්			242	220
බෙලි	සුපුන්	10	II වන ඒකකය		420

ව්‍යාප්ත කිරීම

- එක් දින පුහුණු වැඩසටහන් සහ උපදේශක සේවා (පුද්ගලයන් 141 දෙනෙකු සඳහා)

- දේශන – විශ්වවිද්‍යාල සිසුන් සඳහා දේශන දෙකක්

- උපදේශක සේවා – 10 දෙනෙක් සඳහා

- අධීක්ෂණ කළ ව්‍යාපෘති – 03 ක් නිම කෙරිණි (විශ්වවිද්‍යාල සිසුන් සමඟ)

- ජාතික කෘෂිකර්ම ඩිප්ලෝමා සිසුවෙක් සඳහා මාස 2 ක පුහුණුව

- පරිසර අමාත්‍යංශය විසින් සංවිධානය කරන ලද පන්නල, හඟුරන්කෙත සහ කෑගල්ලේ පැවති ප්‍රදර්ශන තුනකට සහභාගී වීම.

කීට විද්‍යා අංශය

පර්යේෂණ සහ සංවර්ධන අංශය

- සුදු මැස්සා (*Bemisia tabaci*) මඟින් බෝංචි වලට සම්ප්‍රේෂණය කරනු ලබන හෝස් ගෑම් යෙලෝ මොසායික් වෛරසය සඳහා හඳුනා ගන්නා ලද පාලන පිළිවෙත තවදුරටත් ඇගයීමේදී කහ පැහැ ගැන්වුණු වැල් සංඛ්‍යාව අඩු විය. කෙසේ වුවද, කහ පැහැ ගැන්වුණු වැල් සංඛ්‍යාව අඩු කිරීමෙහිලා පූර්ව කන්නයේදී හඳුනා ගන්නා ලද ප්‍රතිකර්මය අනෙකුත් ප්‍රතිකර්ම වලට වඩා උසස් මට්ටමේ පැවතුණි. හඳුනාගන්නා ලද පිළිවෙතින් සැලකිය යුතු උසස් අස්වැන්නක්ද වාර්තා විය. ප්‍රතිඵල තවදුරටත් සනාථ කර ගැනීම සිදු කෙරෙමින් පවතී.
- බෝංචි මැස්සා පාලනය කිරීමෙහිලා කාබොසල්ෆාන් 20% SC, තයෝමෙතොක්සම් 25% WG, ඩිනොටිෆියුරාන් 20% WP, ඉමිඩැක්ලොප්‍රිඩ් 70% යන කෘමිනාශක හතර කාර්යක්ෂම බැව් අනාවරණය විය.
- නාග සහ LA 33 සමඟ ඇනමිකා, 041044,038044 LER 533 සහ බොනැන්සා යන ආනයනික දෙමුහුම් ප්‍රභේද ඇගයීමට ලක් කළ අතර 041044 සහ LER 533 ඉතා හොඳින් ක්‍රියාකරන ලදී. කෙසේවුවද, LER 533 ප්‍රභේදයේ කරල් මත කහ පුල්ලි නිරීක්ෂණය වූ අතර බොනැන්සා ප්‍රභේදය වෛරස් රෝග වලට බෙහෙවින් පාත්‍රී විය.

- කරවිල කුලයේ බෝග වගා කරන ගොවීන් හත් දෙනෙකු සමඟ එක්ව කොමඩු මැස්සා පාලනය කිරීම සඳහා මාතලේ ඕවිල්ල කෘෂිකර්ම උපදේශක කොට්ඨාශයේ යාය අක්කර 10 ක සිදු කරන ලද ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණ වැඩසටහන සාර්ථක විය. හානිය 2% ක් දක්වා අඩු වූ අතර ඉහළ ලාභයක් අත්විය.

- ප්‍රදේශයේ කොමඩු මැස්සා (*Bactrocera cucurbitae*) සඳහා පාලන පිළිවෙත පිළිබඳව එක පිට කන්න 4 කදී සිදු කරන ලද ක්ෂේත්‍ර පර්යේෂණ සහ ආදර්ශන සාර්ථක විය. ඉහළ ලාභ ලැබීම් වලට අමතරව මෙම නව තාක්ෂණික පිළිවෙත මඟින් පරිසර දූෂණය, නෙලාගත් අස්වැන්නෙහි කෘමිනාශක අවශේෂ සහ ගොවීන් විසින් පරිසරයට මුදාහරින කෘමිනාශක ප්‍රමාණය අවම විය.

- නියමු මට්ටමේ අත්හදා බැලීමකදී ඇසිටැමිප්‍රිඩ් 20% SP පරීක්ෂා කළ අතර බණ්ඩක්කා වල පත්‍ර කීඩැවා පාලනයෙහි කාර්යක්ෂමව බැව් අනාවරණය කර ගැනිණි.

- එළවළු බෝග වල පත්‍ර කීඩැවන් පාලනය කිරීම සඳහා නිර්දේශිත ඇසිපේට් 75% SP අකාර්යක්ෂම බවත් වම්බටු වලට යෙදීමෙන් පසු පැළ මැක්කන් නැවත බෝවෙන බවත් සොයා ගැනිණි.

- ඖෂධීය කටුවැල් බටු ශාකයේ ගබඩා කර තිබෙන නිෂ්පාදනයට හානි කරන නව පළිබෝධය ෆ්ලැට් ග්‍රේන් බීට්ල් (*Airaphilus* spp. (*Salvanidae:cucujoidea*) නැමැති කුරුමිණියා බැව් හඳුනා ගැනිණි. පාලන පිළිවෙත් නිර්දේශ කරන ලදී.

- පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවයන් සපුරාලන ලද කොහොඹ බීජ නිස්සාරක පාදක නව කෘමිනාශකයක් (Lak Gro Neem) ගෝවා කොළ කහ දළඹු සංකීර්ණය සහ මාළු මිරිස් කොළ කොඩවිමේ සංකීර්ණය පාලනය කිරීම සඳහා නියමු අත්හදා බැලීමෙන් පසු නිර්දේශ කෙරිණි.

- ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී රයිනැක්සිපීර් සහ (කොරගන් 18.5 SC) ස්පිනොසැඩ් (ට්‍රිසර් 450 SC) යෙදූ පසු ලම්බ්ඩා සයිහැලොත්‍රින් (කරාටේ සියන්) යෙදීමෙන් වම්බටු වල රකිළි හා ගෙඩි විදින්නා කාර්යක්ෂමව පාලනය විය. ට්‍රිසර් කෘමිනාශක දැනටමත් නිර්දේශ කර ඇති අතර කොරගන් සහ කරාටේ නිර්දේශ කළ හැක්කේ නියමු පරිමාණයේ අත්හදා බැලීම් වලින් පසුවය.

- ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී රයිනැක්සිපීර් (කොරගන් 18.5 SC) කෘමිනාශකය බෝංචි කරල් විදින්නා කාර්යක්ෂමව පාලනය කරන ලදී. නිෂ්පාදනය නිර්දේශ කිරීම සඳහා වැඩිදුර පරීක්ෂණ සිදු කෙරෙනු ඇත.

- තක්කාලි ගෙඩි විදින්නා හානිය කෘමිනාශක කීපයකින්ම කාර්යක්ෂමව පාලනය විය. නිෂ්පාදන නිර්දේශ කිරීම සඳහා වැඩිදුර පරීක්ෂණ සිදු කෙරෙනු ඇත.

- පසුගිය කන්න තුනකදී සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වලදී නැප්සැක් ඉසිනයක වැඩිදියුණු කරන ලද සවිවර කේතුක නොසලයක් මේ දක්වා භාවිතා කළ නොසලය හා සංසන්දනාත්මකව අබණ්ඩ පෙව සාර්ථකත්වයක් පවත්වා ගනිමින් පත්‍ර මතට ඉසින ප්‍රමාණය 21-46% කින් අඩු කරන ලදී. එබැවින් පළිබෝධනාශක අපතේ යාම සහ පාරිසරික හානිය අඩු කර ගැනීම සඳහා මෙම වැඩිදියුණු කරන ලද නව නොසලය ගොවීන්ට හඳුන්වාදීම සඳහා පියවර ගනු ඇත.

- ප්‍රදේශයේ පලතුරු මැසි පළිබෝධ සඳහා ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණයේදී ආකර්ශනය වන මැස්සන් විනාශ කිරීම සඳහා මැතකදී හඳුන්වා දෙන ලද ප්‍රෝටීන් ඇම (ලක්ග්‍රෝ ඇම) සමඟ ස්පිනොසැඩ් නම් ධූලකය මිශ්‍ර කළ යුතුය. ඇබමෙක්ටින් 1.8 EC මෙම ඇම සමඟ මිශ්‍ර කිරීමට විකල්පයක් ලෙස යොදා ගත හැකි බව රසායනාගාර විශ්ලේෂණ වලදී පෙන්වා දෙන ලදී.

- මසන් වල සිටින කාර්පොමි වර්සුවියානා (*Carpomya versuviana*) සහ බැක්ට්‍රොසෙරා පයිරිෆෝලියා (*Bactrocera pyrifoliae*) නැමැති පළතුරු මැසි පළිබෝධ විශේෂ දෙකක් සහ පැඟිරි බෝග වල සිටින සිට්‍රස් මස්ල් ස්කේල් (*Lepidosapes beckii*) නැමති කොරපොතු කෘමියෙකු ගන්නෝරුවේදී හඳුනා ගැනුණි. මැංගුස් වල පත්‍ර කන දළඹුවෙක්ද (*Stictoptera grisea*) හඳුනා ගැණිනි.

විනිශ්චය කරන ලද නව පළිබෝධ හානි

- ඉලුක්කුඹුර ප්‍රදේශයෙන් වාර්තා වූ ගෙඩි විදීමේ හානිය සලඹයෙක් (*Achaea janata* (*Lepidoptera : Noctuidae*) මඟින් සිදු වන බව හඳුනා ගැනිණි. (තක්කාලි පිළිබඳ පළමු වාර්තාව)

- මාකඳුර කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයෙන් වාර්තා වූ ඉද්ද පිච්ච වල යුෂ උරා බොන හානිය ඔන්කොපෙල්ටස් විශේෂ මඟින් (*Oncopeltus* spp. (*Sangeuniolentus, Hemiptera*: *Hemiptera: Ly gaeidea*) සිදු වන හානියක් බැව් හඳුනා ගැනිණි. මෙම පළිබෝධයා පිළිබඳ ප්‍රථම වාර්තා වීමයි.

- රඹුටන් වලට ආසාදනය වන පෙනුමෙන් පිටි මකුණාට (*Paracoccus marginatus*) බෙහෙවින් සමාන කොරපොතු කෘමියෙක් (*Pulvinaria psidii (Hemiptera : Coccidae*) හඳුනා ගැනිණි.

- ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට මාකඳුර කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයෙන් වාර්තා වූ අන්නාසි ගෙඩි විදීමේ හානිය කාර්පොෆිලස් හැමෙරැලිස් (*carpophilus hymeralis (Coleoptera : Nitidulidae*) මඟින් සිදුවන බැව් හඳුනා ගැනිණි.

- තඹුත්තේගම ප්‍රදේශයේ මහවැලි අධිකාරියේ කෘෂිකර්ම නිළධාරියකු විසින් වාර්තා කරන ලද සීනි කෙසෙල් වල ඇති වන පළිබෝධ හානිය බනානා ෆෘට් ස්පොටින් බග් (*Amblypelta nitida; Hemiptera : Coreidae*) නැමැති පළිබෝධයා විසින් සිදු කරන හානියක් බැව් සැක කෙරේ. ආසාදනයට ලක් වූ කෙසෙල් ගෙඩි මත කළු පැහැති පුල්ලි දැකිය හැකි අතර පරිණත වීමට පෙර ගෙඩි ඉදීම සිදු වේ. ඉදුණු පලතුරු වල මාංසලය තද ගතියකින් සහ දුඹුරු පැහැයෙන් යුතු විය.

- 2009 යල කන්නයේදී කල්පිටිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේ මිදි වැල් 40 ක් පමණ මිය යාමට හේතුව පත්‍ර, පත්‍ර නටු සහ ලපටි රිකිලි වලට පැළ මැක්කා විසින් දැඩි ලෙස හානි කිරීමෙන් වන අතර මෙම පළිබෝධ විශේෂය ලංකාවේ ප්‍රථම වරට වාර්තා වූ විශේෂයක් (*Selenothrips rubrocinctus* (*red banded thrips; Thysanoptera : Thripidae*) බැව් හඳුනා ගැනිණි.

පැළෑටි ව්‍යාධිවේදය

ක්ෂුද්‍ර ජීව විද්‍යා සහ බිම්මල් අංශය

බැක්ටීරියා හිටු මැරීමට ප්‍රතිරෝධීවීම සඳහා ජනක ප්ලාස්ම පරීක්ෂාකර බැලීම

ආනයනය කරන ලද තක්කාලි දෙමුහුම් 8 ක්, මාළු මිරිස් දෙමුහුම් 10 ක් සහ වම්බටු දෙමුහුම් 3 ක් බැක්ටීරියා හිටු මැරීමට දක්වන ප්‍රතිරෝධීතාව සම්බන්ධයෙන් පරීක්ෂා කර බැලූ අතර ඉන් ප්‍රභේද කීපයක් මධ්‍යස්ථ ප්‍රතිරෝධීතාවක් පෙන්නුම් කරන ලදී.

බෝගවල රෝග විනිශ්චය කිරීම සහ රෝග පාලනය කිරීම සඳහා උපදේශක සේවය

රෝග කාරක ජීවීන් පිළිබඳව විනිශ්චය කිරීම සඳහා ගොවි ක්ෂේත්‍ර සහ විවිධ මූලාශ්‍ර හරහා පෞද්ගලික ගොවිපල මඟින් ලද රෝග වලට ලක් වූ පලතුරු බෝග, එළවළු, ආකන්ද, කුළු බඩු, විසිතුරු පැළ, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ තෘණ වර්ග වල රෝගී පැළ නියැදි 500 කට වැඩි සංඛ්‍යාවක් සායනිකව පරීක්ෂා කළ අතර ක්ෂේත්‍රයේදී රෝග පාලනය කර ගැනීම සඳහා උපදෙස් ලබා දුණි.

තක්කාලි වල වර්ධනය සහ අස්වැන්න කෙරෙහි විටොසන් (ප්‍රවිකිරණය කරන ලද කයිටින) මඟින් ඇති කරන බලපෑම

ක්ෂේත්‍ර තත්ත්වය යටතේ විටෝසන් ඔලිගමර් සහ විටෝසන් දිලීරනාශක යන සංයෝග පදක පරීක්ෂා කෙරිණි. වර්ධනය ප්‍රවර්ධනය කිරීමේ සහ අස්වැන්න ඉහළ නැංවීමේ හැකියාව විටෝසන් ඔලිගමර් සතුව පවතින අතර තක්කාලි වල රෝග පාලනය කිරීමේ හැකියාව විටෝසන් දිලීරනාශකය සතුව පවතී.

ව්‍යාධිජනක දිලීරවල වර්ධනය සහ කොනිඩියා ප්‍රභේදනය කෙරෙහි ප්‍රවිකිරණය කරන ලද කයිටින වල (විටොසන්) බලපෑම

නලස්ථ පෙව නිර්ණ පරීක්ෂණය මඟින් විටොසන් සංයෝග එකොළහක විවිධ සාන්ද්‍රණ යොදා ගෙන දිලීර ජාලයේ වර්ධනය අඩු කිරීම සහ දිලීර ව්‍යාධිජනක වල කොනිඩියා ප්‍රරෝහණය නිශේධනය කිරීම පිළිබඳව තක්සේරු කරන ලදී. සංයෝග කීපයකට දිලීර ජාල වර්ධනය සහ (ව්‍යාධිජනක දිලීර වල) කොනිඩියා ප්‍රරෝහණය වීම නිශේධනය කිරීමට හැකි විය.

කරවිල කුලයේ ශාක කහ පැහැවීමේ සින්ඩ්‍රෝමයට සම්බන්ධ නව වෛරස් හඳුනා ගැනීම.

සුදු මැස්සා (Bamisia tabaci) මඟින් සම්ප්‍රේෂණය කරන වෛරස් සහ කරවිල වල කහ පැහැ වීමේ සින්ඩ්‍රෝමය අතර සම්බන්ධතාවයක් පැවතුණි.

බීජ අර්තාපල් තොග පරීක්ෂා කිරීම සහ රසායනාගාර පරීක්ෂණය

බොහෝ බීජ තොග වල රයිසොක්ටෝනියා සොලනි(Rhizoctonia solani) මඟින් ඇති කරන කළු කබොළු රෝගය, හෙල්මින්තොස්පෝරියම් සොලනි (Helminthosporium solani) මඟින් ඇති කරන රිදී කබොළු රෝගය සහ ස්ට්‍රෙප්ටොමයිසිස් විශේෂ (Streptomyces species) මඟින් ඇති කරන ජාලාකාර සහ පොදු කබොළු රෝග පැවතුණි. තොග 42 කින් එක් තොගයක් පමණක් (ග්‍රැනෝලා ප්‍රභේදය) දැඩි ලෙස අර්විනියා (Erwinia) ආසාදනය වී තිබීම නිසා ප්‍රතික්ෂේප කරන ලදී.

එලිසා තාක්ෂණය මඟින් පලතුරු සහ එළවළු වල වෛරස් හඳුනා ගැනීම.

කරවිල, පැපොල්, කෙසෙල්, අර්තාපල් සහ ක්ෂේත්‍රයේ තිබෙන ඇතැම් වල් පැළෑටි ආශ්‍රිත වෛරස් හඳුනා ගැනිණි. දිවයිනේ බොහෝ ප්‍රදේශවල කරවිල කුලයේ ශාක වලට දැඩි ලෙස වෛරස් ආසාදනය වී ඇති බව නිරීක්ෂණය විය. කාරක ජීවීන් හඳුනා ගනුණු අතර ගොවීන්ට පාලන පියවර හඳුන්වා දෙන ලදී.

බණ්ඩක්කා වල පිටිපුස් රෝගයට එරෙහිව ඩෝර්මාර්ක් 40 ME (ටෙට්‍රාකොනසෝල් 40 g/l) නව දිලීරනාශකයේ පෙව සාර්ථකත්වය ඇගයීම.

ඩෝර්මාර්ක් 40 ME (ටෙට්‍රාකොනොසෝල් 40 ග්‍රෑ/ලී) නව දිලීරනාශකය බණ්ඩක්කා වල පිටිපුස් රෝගය පාලනය කිරීමෙහි කාර්යක්ෂම විය.

කරවිල කුලයේ ශාක වලට වැළඳෙන යටිපුස් රෝගයට එරෙහිව දිලීරනාශක වල පෙව සාර්ථකත්වය ඇගයීම

පරීක්ෂාවට ලක් කරන ලද දිලීරනාශක හතරෙන් ඇසොක්සිට්‍රොබින් සහ කැබ්‍රියෝ ටොප් යන නව දිලීරනාශක දෙක කරවිල කුලයේ බෝගවලට වැළඳෙන යටිපුස් රෝගය පාලනයෙහි කාර්යක්ෂම වූ අතර නියමු පරිමාණයේ අත්හදා බැලීම් සඳහා නිර්දේශ කළ හැක.

කරවිල කුලයේ ශාක වලට වැළඳෙන පිටිපුස් රෝගයට එරෙහිව නව දිලීරනාශක වල පෙව සාර්ථකත්වය ඇගයීම

ඩෝර්මාර්ක් 40 ME (ටෙට්‍රාකොනොසෝල් 40 ග්‍රෑ/ලී) සහ නේටිවෝ 75 WG (ටෙබ්‍යුකොනොසෝල් 50% + ට්‍රයිෆ්ලොක්සිස්ට්‍රොබින් 25%) යන නව දිලීරනාශක දෙක කරවිල කුලයේ ශාක වල පිටිපුස් රෝගය පාලනයෙහි කාර්යක්ෂම විය.

සුකිනි යෙලෝ මොසායික් වෛරසයට (ZYMV) එරෙහිව පිපිසඳ්කදා ප්‍රභේද පරීක්ෂා කර බැලීම.

මාර්ස්සන ප්‍රදේශයෙන් එක් දේශීය සුකිනි යෙලෝ මොසායික් වෛරසයක් වෙන් කර ගත් අතර ප්‍රතිරෝධිතාව පරීක්ෂා කර බැලීමේ අධ්‍යයන සඳහා ධාරක ශාක වල නඩත්තු කෙරිණි.

මිල්කි බිම්මල් වගාව සඳහා තාක්ෂණය

පිදුරු යොදා ගනිමින් මිල්කි බිම්මල් වගා කිරීම සඳහා තාක්ෂණය බිහි කරන ලදී.

දියර බීජාණු

බිම්මල් වගාවේදී බීජාණු නිපදවීම සඳහා වැය වන කාලය සහ පිරිවැය අඩු කර ගැනීම සඳහා දියර බීජාණු භාවිතා කළ හැකිය.

වියළි බිම්මල් වලින් අගය එක් කළ නිෂ්පාදන

ගෘහස්ථ මට්ටමින් වියළි බිම්මල් නිපදවීම සඳහා "මිනි ඩ්‍රයර" භාවිතා කළ හැකිය. වියළි බිම්මල් භාවිතා කර ඉහළ පාරිභෝගික පිළිගැනීමේ හැකියාවැති බිම්මල් සීනි සම්බෝල, මෝජු, බැදපු බිම්මල් සම්බෝල සහ බිම්මල් මිශ්‍රණය සකස් කර ගත හැකිය.

බීජාණු නිපදවීම සඳහා අඩු පිරිවැයති තාක්ෂණික ක්‍රමය

බීජාණු නිපදවීම සඳහා අඩු පිරිවැයති ක්‍රමයක් බිහි කරන ලදී.

බිම්මල් වගාව පිළිබඳ පුහුණුව සහ අධ්‍යාපනය

- මුතු බෙලි බිම්මල් වගාව පිළිබඳව දාහකට වැඩි දෙනෙකු පුහුණු කළ අතර කුඩා පරිමාණයේ බිම්මල් නිෂ්පාදකයන් ලෙස ලියාපදිංචි කිරීම සඳහා සහතික 199 ක් නිකුත් කෙරිණි.
- පුද්ගලයන් 100 කට වැඩි ප්‍රමාණයක් පිදුරු බිම්මල් වගාව පිළිබඳ පුහුණු කළ අතර බිම්මල් බීජාණු නිෂ්පාදනය පිළිබඳව පුද්ගලයන් 32 ක් පුහුණු කරන ලදී.
- පුද්ගලයන් 117 දෙනෙකුට බිම්මල් පිසීමේ විවිධ ක්‍රම පිලිබඳ ආදර්ශන පැවැත්විය.
- ගොවීන් 47 දෙනෙකුට තැපෑලෙන්ද 1,024 දෙනෙකුට දුරකථනයෙන්ද උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට පැමිණි ගොවීන් 452 කටද තාක්ෂණික උපදෙස් ලබා දෙන ලදී.
- අ.පොෂ.ස. (උසස් පෙළ) සිසුන් 19 දෙනෙකුට ඔවුන්ගේ ව්‍යාපෘති සඳහා බිම්මල් වගා කිරීමේ තාක්ෂණික ක්‍රම ලබා දෙන ලදී.
- විශ්ව විද්‍යාල සිසුන් දෙදෙනෙක් ඔවුන්ගේ නිවාඩු කාලීන පුහුණු කාල සීමාවේදී බිම්මල් වගාව පිළිබඳව පුහුණු කරන ලදී.
- බිම්මල් වගාව සහ බීජාණු නිෂ්පාදනය පිළිබඳව විශ්ව විද්‍යාල සිසුන් 38 ක්, කෘෂිකර්ම ඩිප්ලෝමා සිසුන් 07 ක් සහ පශ්චාත් උපාධි සිසුන් 38 දෙනෙක් පුහුණු කරන ලදී.
- දැයට කිරුළ - පල්ලේකැලේ වසන්ත උද්‍යානය – නුවරඑළිය යන ප්‍රදර්ශන දෙකට සහභාගි විය.
- රජයේ සහ රජයේ නොවන සංවිධාන වල සහභාගිත්වයෙන් ප්‍රායෝගික පුහුණු වැඩමුළු හරහා පුද්ගලයන් 383 දෙනෙකු පුහුණු කරන ලදී.

විද්‍යුත් මාධ්‍ය හරහා සහභාගීත්ව තාක්ෂණය පතුරුවාලීමේ කාර්යයන්

ගුවන් විදුලි වැඩසටහන් පහක් (අස්වැන්න) සහ රූපවාහිනී වැඩසටහන් දෙකක් (ගොවි බිමට අරුණලු) සිදු කරන ලදී.

කෘෂිකර්ම රසායන විද්‍යා අංශය

කාබනික ගොවිතැන

කාබනික එළවළු බෝගවල පෝෂණ කළමනාකරණය

කාබනික ගොවිතැන යටතේ එළවළු බෝග වගා කිරීමට පෙර කොළ පොහොර වගා කිරීමෙන් ඇති වන බලපෑම පිළිබඳ සිදු කළ පරීක්ෂණයේදී වර්ධනයේ සහ අස්වැන්නේ වැඩි වීමක් අනාවරණය වූ අතර

වැඩිදුර සනාථ කර ගැනීම සඳහා විවිධ එළවළු බෝග යොදා ගනිමින් මෙම අත්හදා බැලීම අබණ්ඩවම සිදු කෙරෙනු ඇත.

එළවළු වගාව සඳහා බාගෙට පිළිස්සූ දහයියා යොදා ගැනීම

පිළිස්සූ දහයියා ග්‍රෑම් 200 ක් යෙදූ විට ලැබුණු අස්වැන්න නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් පමණක් යෙදූ සහ කොම්පෝස්ට් පමණක් යෙදූ වගා වල අස්වැන්නට වඩා වැඩි වූ අතර කාබනික ගොවිතැන යටතේ සිදු කරන එළවළු වගාවේ අස්වැන්න කෙරෙහි පිළිස්සූ දහයියා යෙදීමෙන් ඇතිවන දිගු කාලීන බලපෑම නිරීක්ෂණය කිරීම සඳහා මෙම අත්හදා බැලීම අබණ්ඩවම සිදු කෙරෙනු ඇත.

කාබනික එළවළු අස්වැන්න කෙරෙහි වසුන් ද්‍රව්‍ය භාවිතය

කාබනික එළවළු නිෂ්පාදනයේදී වල් පැළ පාලනය කිරීම සහ අස්වැන්න ඉහළ නැංවීම සඳහා පිදුරු, පොලිතීන් සහ පිළිස්සූ දහයියා වසුන කාර්යක්ෂමව යොදා ගත හැකිය.

කොම්පෝස්ට් අබණ්ඩවම යෙදීම

කොම්පෝස්ට් සහ නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් පොහොර ඒකාබද්ධව යෙදූ විට කොම්පෝස්ට් පමණක් යෙදූ විට ලැබෙන අස්වැන්නට වඩා ඉහළ අස්වැන්නක් ගෙන දුණි.

කොම්පෝස්ට් වල ගුණාත්මය පිළිබඳ පෙව විද්‍යාත්මක පරීක්ෂණය

කොම්පෝස්ට් වල ගුණාත්මය පිළිබඳ පෙව විද්‍යාත්මක තක්සේරු කිරීම සහ ඇගයීම නිර්ණය කර ගැනීම පිණිස සිදු කළ අධ්‍යයනයකදී පෙව විද්‍යාත්මක තක්සේරු කිරීම සහ ඇගයීම නිරිණය කර ගැනීම පිණිස සිදු කළ අධ්‍යයනයකදී පෙව විද්‍යාත්මක පරීක්ෂණය සිදු කරන අතරම විද්‍යාගාරය තුළදී රසායන විශ්ලේෂණයද් සිදු කළ යුතු බැවි අනාවරණය විය.

පණු පොහොර යෙදීමේ ක්‍රියාවලිය හරහා එප්පාවල රොක් පොස්පේට් වල ද්‍රාව්‍යතාව වැඩි කිරීම.

පණු පොහොර යෙදීමේ ක්‍රියාවලිය මඟින් එප්පාවල රොක් පොස්පේට් වල ද්‍රාව්‍යතාව වැඩි වූ අතර පණු පොහොර එක්කළ එප්පාවල රොක් පොස්පේට් වගාවට යෙදූ විට අස්වැන්නේ සැලකිය යුතු වර්ධනයක් සහ පැළ මඟින් පොස්පේට් හොඳින් උරා ගැනීම දැක ගත හැකි විය.

ඒකාබද්ධ පැළ පෝෂණ කළමනාකරණය

රසායනික පොහොර භාවිතය අඩු කිරීම

ගෝවා සහ මුකුණුවැන්න වගාවේ හෙ. 1 කට කොම්පෝස්ට් ටොන් 10 ක් සමඟ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත නයිට්‍රජන් පොස්පරස් සහ පොටෑසියම් ප්‍රමාණයෙන් 75% ක් එක්කර යෙදූ විට ගෙනදුන් අස්වනු ප්‍රමාණය එම වගාවේ හෙ. 1 කට කොම්පෝස්ට් ටොන් 10 ක් සමඟ නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් වල නිර්දේශිත ප්‍රමාණයම යෙදූ විට ලැබෙන අස්වැන්නට සමාන අස්වැන්නක් විය. කෙසේවුවද, ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා වැඩිදුර අධ්‍යයන සිදු කළ යුතුය.

විශ්ලේෂණාත්මක ශිල්ප ක්‍රම

පාංශු පොස්පරස් නිස්සාරණය කර ගැනීම සඳහා ඇනායන හුවමාරු රෙසින් පටි ක්‍රමය ඇගයීම

පාංශු පොස්පරස් නිස්සාරණය කර ගැනීම සඳහා ඔල්සන් නිස්සාරණ ක්‍රමය සමඟ නිරවද්‍යතාව පිළිබඳව සංසන්දනය කරමින් මෙම ක්‍රමය යොදා ගැනීමට පවතින හැකියාව සම්බන්ධයෙන් පරීක්ෂාකර බැලීමෙහිලා මෙම අධ්‍යයනය සිදු කෙරිණි. ක්‍රියා පටිපාටියෙහි යම්යම් වෙනස්කම් සිදු කර දෙනිකව පාංශු පොස්පරස් විශ්ලේෂණ කිරීම සඳහා ඇනායන හුවමාරු රෙසින් පටි ක්‍රමය සාර්ථකව යොදා ගත හැකි අතර විකරණය කරන ලද මෙම ක්‍රමය කාලය සහ විද්‍යුතය ඉතිරි කරන වඩාත් පිරිමැසුම්දායක ක්‍රමයකි.

කාබනික සහ සාම්ප්‍රදායිකව වගා කරන කොළ එළවළුවල නයිට්‍රේට් නයිට්‍රජන් අන්තර්ගතය සංසන්දනය කිරීම

කාබනික වගා ක්‍රමය යටතේ වගා කරන ලද ඇතැම් කොළ එළවළු බෝග වල නයිට්‍රේට් නයිට්‍රජන් අන්තර්ගතය පිළිබඳ සිදු කළ සංසන්දනයේදී සාම්ප්‍රදායික ක්‍රමයට වගා කළ බෝග වල පැවති නයිට්‍රේට් නයිට්‍රජන් අන්තර්ගතයට වඩා කාබනිකව වගා කළ කංකුං සහ මුකුණුවැන්න වල නයිට්‍රේට් නයිට්‍රජන් ප්‍රමාණය සැලකිය යුතු අඩු මට්ටමක පැවති අතර ගොටුකොළ වලින් තුල්‍ය මට්ටම් වාර්තා විය. කෙසේවුවද, සියළුම ප්‍රමාණයන් පිළිගත හැකි සීමාවේ පැවතුණි. නිරීක්ෂණ අබණ්ඩවම සිදු කර ඒ අනුව ගොවීන්ට නිසි පොහොර කළමනාකරණ පිළිවෙත් පිළිබඳව උපදෙස් ලබා දීමෙන් කොළ එළවළු වල නයිට්‍රේට් නයිට්‍රජන් මට්ටම් පිළිගත හැකි මට්ටම් වල පවත්වා ගැනීමට උපකාරී වේ.

වැඩි ඵලදාවක් ලබා ගැනීම සඳහා යෙදවුම් වැඩි ප්‍රමාණයක් යොදා එළවළු වගා කරන ප්‍රදේශවල ජලයේ තත්ත්වය

සිදු කරන ලද අධ්‍යයනයේ ප්‍රතිඵල මඟින් නුවරඑළියේ (සඳහැන්න පෝෂක ප්‍රදේශය) වැඩි යෙදවුම් ප්‍රමාණයක් එක්කළ එළවළු භූගත ජලයද දූෂණය වී ඇති බැවි අනාවරණය විය.

මහවැලි නදියේ ජලයේ තත්ත්වය

වසර දෙකක කලෙයක් මුළුල්ලේ (2008 ජනවාරි – 2009 දෙසම්බර්) පේරාදෙණිය හා ඒ අවට ප්‍රදේශ තුනකදී ජලසම්පාදන සහ පානීය ජලය සම්බන්ධයෙන් සිදු කරන ලද පරීක්ෂණ වල ප්‍රතිඵල මඟින් පීඑච් අගය, විද්‍යුත් සන්නායකතාව, ද්‍රාවික ඔක්සිජන්, නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම්, ක්ලෝරයිඩ්, ෆ්ලෝරයිඩ්, ඇමෝනියම්, නයිට්‍රේට්, මැංගනීස්, සින්ක් සහ කොපර් අන්තර්ගතයේ ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් නිර්දේශිත අගයන් වලට වඩා අඩු මට්ටම් වල පැවති බවත් කැල්සියම් අන්තර්ගතය ලෝක සෞඛ්‍ය සංවිධනය මඟින් දක්වා ඇති සීමාව තරමක් ඉක්මවා ඇති බවත් අනාවරණය විය.

මුල් සහ ආකන්ද බෝග,මල් වගාව සහ ගෙවතු වගා අංශය

මුල් සහ ආකන්ද

බතල

- HORDI C – 05 ඉහළ අස්වැන්නක් ගෙන දෙන, මනා ගුණාත්මයෙන් යුත් ලා කහ පැහැති මාංසලයකින් සමන්විත එමෙන්ම ගොවීන්ගේ ඉහළ කැමැත්තක් දිනාගත් ප්‍රභේදයක් ලෙස වරණය කෙරුණි.
- ඉහළ අස්වනු ගෙන දෙන මනා ගුණාත්මයෙන් යුත් ලවණතාවයට ඔරොත්තු දෙන CIP 440 396, CIP 199043.4 සහ CIP 199062.1 නැමැති ආර තුනක් අන්තර්ජාතික අර්තාපල් මධ්‍යස්ථානයෙන් වරණය කර ගන්නා ලදී.

මස්සදාක්කා

මස්සදාක්කා පිළිබඳ සිදු කරන ලද ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම් වලදී HORDI 6 නැමැති නව ප්‍රභේදීය ඉහළ අස්වනු ගෙන දෙන බැවින් සහ මනාව වර්ධනය වූ දිගු ආකන්දය සිත් ගන්නා සුළු පැහැයෙන් යුත් බැවින් සහ (පිට පොත්ත දුඹුරු සහ ඇතුලත රෝස පැහැයට හුරු) අලෙවි ගුණාංගයන්ද සමන්විත බැවින් ගොවීන් වඩාත් ප්‍රිය කරන මිශ්‍ර බෝග වගාවට සුදුසු බැව් අනාවරණය විය.

කිරි අල

කිරි අල බඩ ඉරිඟු සමඟ අතුරු බෝගයක් ලෙස වගා කළ විට සහ පසට ට්‍රයිකොඩර්මා සෂුද්‍ර ජීවී පළිබෝධනාශක ප්‍රතිකර්මය ලබාදුන් විට මනා ගුණාත්මයෙන් යුත් ආකන්ද සහිතව සැලකිය යුතු ඉහළ අස්වනු ගෙන දුන් අතර පතු කහ පැහැවීමේ රෝගී තත්ත්වයද අඩු විය.

මල් බෝග වගාව

වසර තුළදී සිදු කරන ලද කාර්යයන් පහත දැක්වේ.

- විසිතුරු විභවයක් සහිත වන තුරුලතා වර්ග දොළහක් එක්රැස් කර නඩත්තු කරන ලදී.
- උසස් තත්ත්වයේ කපුරු ප්‍රභේද 5 ක් හඳුන්වා දුන් අතර දේශීය වෙළඳපොළට මල් සැපයීම සඳහා ගන්නෝරුවේ වගා කරන ලදී.
- මුල් ඇදුණු කඳ කැබලි නිෂ්පාදනය කිරීම සඳහා තලාගත් පයින් කොළ යොදා සකස් කර ගත් වගා සාර්ථක වූ අතර අපනයන වෙළඳපළ සඳහා මෙම මාධ්‍ය සහ තාක්ෂණය 2010 දී මුදා හරින ලදී.
- ගෙවතු වගාව සඳහා සුදුසු එකතුන් 8ක ලක්ෂණීකරණය සහ ඇගයීම සිදු කෙරිණි.
- ගන්නොරුව උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ ආදර්ශ ගෙවත්තක් නඩත්තු කරන ලදී.
- පස්යාල සහ වල්පිට ගොවිපළ වල නව ආදර්ශ ගෙවතු ස්ථාපිත කෙරිණි.
- "හරිත" කතුරුමුරුංගා පැළ 500 ක් වගාකරුවන් අතර බෙදා දෙන ලදී.
- රජයේ සහ රජයේ නොවන සංවිධාන සමඟ එක්ව ප්‍රජා සහභාගීත්ව පුහුණු වැඩසටහන් ත්‍රීකුණාමලය, මඩකලපුව, කෑගල්ල සහ ගන්නෝරුවෙහිදී පවත්වන ලදී.

ව්‍යාප්ති, ආර්ථික විද්‍යා සහ දත්ත කළමනාකරණ අංශය

පර්යේෂණ

ශ්‍රී ලංකාවේ වාණිජ දිවුල් වගාව සඳහා පවතින විභවයන් ඇගයීම

ගෝලීය ස්ථානීය නිර්ණ ක්‍රමයේ වාර්තා පාදකව භූ අවකාශ විශ්ලේෂණය මඟින් දිවුල් සඳහා විභවයක් පවතින ප්‍රදේශ පිළිබඳ සිතියම සකස් කරන ලදී. උතුරු ප්‍රදේශයේ බටහිර කොටස, වයඹ වියළි කලාපය සහ දකුණු පළාත යන ප්‍රදේශ වල දිවුල් සඳහා ඉහළ විභවයක් පවතින අතර පොළොන්නරුව, අනුරාධපුරය සහ අම්පාර යන ප්‍රදේශවල මධ්‍යස්ථ විභවයක් පවතින බැව් ප්‍රතිඵල මඟින් අනාවරණය විය. දිවුල් වගා කිරීමට පවතින හඳුනාගත් ඇතැම් බාධක වනුයේ ඇතැම් ශාක ලක්ෂණ, ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය සහ උසස් ප්‍රභේද හිඟවීම සහ මිළ අඩුකම යනාදිය වේ.

ශ්‍රී ලංකාවේ එළවළු වගා වපසරිය සහ නිෂ්පාදනය පිළිබඳ ආදර්ශයක් (ARIMA MODEL) අනුසාරයෙන් පුරෝකථනය කිරීම.

ශ්‍රී ලංකාවේ වගා කෙරෙන විවිධ එළවළු වර්ග වල වගා වපසරිය සහ නිෂ්පාදනය සම්බන්ධයෙන් ඔටෝ රිග්‍රෙසිව් ඉන්ටිග්‍රේටඩ් මූවින් මොඩලය (ARIMA) යොදා ගෙන පුරා වසර 18 ක් සිදු කළ දත්ත විශ්ලේෂණයේදී විමර්ශනයට ලක් කෙරුණු සියළුම උඩරට එළවළු වර්ධනාත්මක අනුපාතයකින් ඉහළ යන ප්‍රවනතාවයක් සහ ඇතැම් පහතරට එළවළු පහළ යන ප්‍රවණතාවයක් පෙන්නුම් කරන ලදී.

බහු කාලීන චන්ද්‍රිකා දත්ත හරහා බෝග ප්‍රදේශවල අවකාශමය ව්‍යාප්තිය සහ බෝග රටාව ඇගයීම

මෙම අධ්‍යයනයේ පරමාර්ථය වනුයේ විවිධ බෝග යටතේ පවතින ඉඩම් රූපරේඛණය කිරීම සඳහා

කාල ශ්‍රේණි චන්ද්‍රිකා දත්ත යොදා ගැනීමේ හැකියාව පිළිබඳව සහ බෝග රටාවන් පිළිබඳව ඇගයීමයි. දත්ත බාගත කිරීමේ කොටසක් සම්පූර්ණ කර ඇති අතර මෙම අධ්‍යයනය අබණ්ඩවම සිදු කෙරෙනු ඇත.

උපාධි අපේක්ෂක සිසුන්ගේ පර්යේෂණ ව්‍යාපෘති

වයඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුන් දෙදෙනෙක් ඔවුන්ගේ අවසන් වසර පර්යේෂණ ව්‍යාපෘති වන "ආදර්ශයක් (ARIMA ආදර්ශය) යොදා ගනිමින් ශ්‍රී ලංකාවේ එළවළු වගා වපසරිය සහ නිෂ්පාදනය පිළිබඳ පුරෝකථනය" සහ "ශ්‍රී ලංකාවේ දිවුල් වගාව සඳහා පවතින විභවයන් සහ බාධක ඇගයීම" පිළිබඳ ව්‍යාපෘති දෙක සම්පූර්ණ කරන ලදී.

දත්ත කළමනාකරණය සහ ප්‍රගති මෙහෙයුම

පහත සඳහන් කාර්යයන් වසර තුළදී සිදු කරන ලදී.

- උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනය සහ අනෙකුත් මධ්‍යස්ථාන යටතේ එන අමාත්‍යාංශයේ සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විශේෂ ව්‍යාපෘති වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය අධීක්ෂණය කිරීම සහ ඇගයීම සම්බන්ධීකරණය කිරීම.

- අනෙකුත් අංශ අතර පුනරාවර්තන සහ මූලධන ප්‍රතිපාදන සම්බන්ධීකරණය කිරීම සහ ප්‍රගතිය වාර්තා කිරීම.

- උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ මානව සම්පත් දත්තමූලය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම.

- රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ දත්ත යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම.

- කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ කෘෂි පර්යේෂණ කළමනාකරණ තොරතුරු ක්‍රමයේ දත්ත එක්රැස් කිරීම සහ සකස් කිරීම.

- උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය යටතේ තිබෙන ගොවිපළ වල දත්තමූලය යාවත්කාලීන කිරීම සහ නඩත්තු කිරීම.

තාක්ෂණය පතුරුවාලීම

- පාසල් සිසුන් 36,439 ක්, ගොවීන් 7,225 ක්, පාසල් ගුරුවරුන් 75 ක්, රජයේ නිළධාරීන් 119 ක්, උසස් අධ්‍යාපනය ලබන සිසුන් 193 ක්, පුද්ගලයන් 208 ක් ඇතුළුව උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයට පැමිණි අයගේ මුළු සංඛ්‍යාව 93,290 කි.

-
- තාක්ෂණික විමසුම් සඳහා ලිඛිත පිළිතුරු - 422
- ගොවි කණ්ඩායම් පුහුණු වැඩසටහන් - 3
- වෙනත් ආයතන සඳහා කණ්ඩායම් වැඩසටහන් සම්බන්ධීකරණ – 6
- විදේශික කණ්ඩායම් දැනුවත් කිරීමේ වැඩසටහන් – 3
- උපදේශාත්මක විස්තර රැගත් අත්පත්‍රිකා 3,982 ක් නිකුත් කරමින් නව තාක්ෂණය පතුරුවාලීම.
- දුරකථන විමසුම් 828 කට තාක්ෂණික උපදෙස්
- එළවළු පිළිබඳ සමෝධානික පළිබෝධ කළමනාකරණය සම්බන්ධයෙන් කණ්ඩායම් පුහුණු කිරීම් 15 ක්
- එළවළු - සමෝධානික පළිබෝධ කළමනාකරණය පිළිබඳ ශ්‍රී ලංකාවේ විවිධ ස්ථානවල ගොවි ක්ෂේත්‍ර ආදර්ශන (කරවිල කුලයේ බෝග, බණ්ඩක්කා, වම්බටු, තක්කාලි සහ මිරිස්) - 254
- උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ සිදු කරන ලද පර්යේෂණවල විශ්ලේෂිත වූ විස්තර රැගත් පොත සකස් කිරීම.
- තාක්ෂණික ලුහුඬු පුවත් සහ අත්පත්‍රිකා සකස් කිරීම – 8
- පෝස්ටර් සකස් කිරීම ($1 \times 1\ m^2$) - 50
- එළවළු පිළිබඳ සමෝධානික පළිබෝධ කළමනාකරණය සම්බන්ධයෙන් ගුවන් විදුලි වැඩසටහන් 4 ක් සහ එක් රූපවාහිනී වැඩසටහනක්

කෘෂිකර්ම කෞතුකාගාරය

කෘෂිකර්ම කෞතුකාගාරය සතියේ දිනවල මෙන්ම ඉල්ලුම පරිදි රජයේ නිවාඩු දිනවලද ප.ව. 4.15 දක්වා විවෘතව ඇත. සාම්ප්‍රදායික කෘෂිකර්ම උපකරණ සහ සාම්ප්‍රදායික ගබඩාකරණ ආකෘති ආදර්ශ මෙම ප්‍රදර්ශන භාණ්ඩ අතරෙහි වේ. කමත් භාෂාවේ සහ සාම්ප්‍රදායික ශ්‍රී ලාංකික කෘෂිකර්මයේදී භාවිතා වන වචන ඇතුළත් අත්පත්‍රිකා 1300 ක් 2010 වසරේදී බෙදා හරින ලදී.

කෘෂිකර්ම කෞතුකාගාරයට පැමිණි නරඹන්නන් සංඛ්‍යාව පහත දැක්වේ.

පාසල් සිසුන්	54,294
පාසල් ගුරුවරුන්	4,194
ගොවීන්	5,160
රජයේ නිළධාරීන්	665
විශ්ව විද්‍යාල සිසුන්	1,280
විදේශිකයින්	124
වෙනත්	7,060

මධ්‍යම පුස්තකාලය

- 2010 වසරේදී නව ග්‍රන්ථ 95 ක් පුස්තකාලයට එක් කරන ලද අතර එකතුවේ ඇති මුළු පොත් සංඛ්‍යාව 10,805 කි. නොමිලයේ සහ හුවමාරු පදනම යටතේ විදේශීය වාර ප්‍රකාශන 251 කට වැඩි සංඛ්‍යාවක් ලැබිණි. පොදු රාජ්‍ය මණ්ඩලීය කාර්‍යාංශයට පුස්තකාලය වාර්ෂික දායක මුදල වශයෙන් ස්ටර්ලිං පවුම් 5,000 ක් ගෙවන ලදී.

- පාඨකයන් 985 කට වැඩි ප්‍රමාණයක් පුස්තකාලයට පැමිණි අතර සාමාජිකයන් අතර පොත් 515 ක් පමණ සංසරණය විය. සාමාන්‍ය පාඨක සේවා මෙන්ම පුස්තකාල අතර ග්‍රන්ථ තාවකාලිකව ලබා ගැනීමේ ක්‍රමය යටතේ ග්‍රන්ථ 26 ක්ද ලබා දෙන ලදී.

- පර්යේෂණ නිළධාරීන්ගේ ඉල්ලීම පරිදි පසුගිය කාලයට අදාල තොරතුරු පිළිබඳ ගවේෂණ කටයුතු 25කට වැඩි ප්‍රමාණයක් සිදු කරන ලදී. කෘෂිකර්ම පර්යේෂණ ප්‍රතිපත්ති සභාවේ සහායෙන් ගවේෂණ 25 ක් පමණ සිදු කෙරිණි.

- පර්යේෂණ නිළධාරීන් 300 ක් පමණ අන්තර්ජාල පහසුකම් භාවිතයෙන් තොරතුරු ලබා ගත් අතර කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික සමුළු වාර්තාවේ නවතම තොරතුරු සහ ට්‍රෝපිකල් ඇග්‍රිකල්චරිස්ට් ජර්නලයේ ලිපි එක් කිරීමෙන් කෘෂි තොරතුරු සේවය (AGRIS – CD – ROM System) සහ කෘෂි දත්ත මූලය (WEBAGRIS database) යාවත්කාලීන කරන ලදී. ඊට අමතරව, 2010 වසරේදී කෘෂිකර්මය පිළිබඳ ජාතික ග්‍රන්ථ නාමාවලිය සඳහා කෘෂිකර්ම දත්ත ලබා දුණි.

- ඇග්‍රිනෙට් පටුන පිටු සේවාව අඛණ්ඩවම සිදු කළ අතර පටුන පිටු 148 කට වැඩි ප්‍රමාණයක් පාඨකයින් 75 දෙනෙකු අතර බෙදා හරින ලදී.

- 2010 වසරේදී ට්‍රෝපිකල් ඇග්‍රිකල්චරිස්ට් ජර්නලය (වෙළුම් 156, 157) දේශීය සහ විදේශීය ආයතන වලට බෙදා හැරිය අතර PURNA දත්ත මූලයට ලිපි 11,000 කට වැඩි ප්‍රමාණයක් සහ ග්‍රන්ථ 1,100 ක් ඇතුළත් කෙරිණි.

සංවර්ධනය සහ තාක්ෂණය ලබා දීමේ කටයුතු

එළවළු

- ආදර්ශ ගම්මාන වැඩසටහන මාරස්සන සහ කම්බිලිවැව පැවති ආදර්ශන ගම්මාන වැඩසටහන් වලට ආදර්ශන පැවැත්වීමත්, වැඩිදියුණු කරන ලද ප්‍රභේදවල බීජ සැපයීමෙන්, අනුවර්තන අත්හදා බැලීම් සිදු කිරීමෙන් සහ ගොවි පුහුණු මඟින් දායකත්වය ලබා දුණි.

- සම්පත් පුද්ගලයන් ලෙස එළවළු නිෂ්පාදනය පිළිබඳව නිළධාරීන් පුහුණු කිරීමේ වැඩසටහන් 8 කට දායක වූ අතර ජාතික උසස් අධ්‍යාපන ඩිප්ලෝමා සිසුන් දෙදෙනෙකු සඳහා එළවළු පිළිබඳ පර්යේෂණ සම්බන්ධයෙන් සේවාස්ථ පුහුණුව ලබා දෙන ලදී.

- සන්නිවේදනයට අදාල අනෙකුත් කටයුතු අතරට ආදර්ශන, ගොවි ක්ෂේත්‍ර අධීක්ෂණය සහ ලිපි සහ දුරකථන මාර්ගයෙන් (200) රූපවාහිනී සහ ගුවන් විදුලි වැඩසටහන් මඟින් (2) ගොවි පැන සඳහා පිළිතුරු ලබා දීම පුවත්පත් ලිපි (3) අත් පත්‍රිකා (1) සහ කෘෂිකාර්මික ප්‍රදර්ශන (2) සඳහා දායක වීම් ඇතුළත් වේ. ඇළුතින් මුදා හරින ලද තක්කාලි සහ මාළු මිරිස් ප්‍රභේද වල බීජ නියැදි විශාල ප්‍රමාණයක් ගොවීන් අතර (100) බෙදා හරින ලදී.

- හම්බන්තොට සහ මහනුවර දිස්ත්‍රික්කවල ස්ථිර බෝග සායන කමිටු වැඩසටහන් 14 ක් ආරම්භ කරන ලදී.

පලතුරු සහ පටක රෝපණය

- දූරියන්, රඹුටන්, වරකා, ගොරකා සහ ඌන භාවිත පලතුරු බෝග කීපයක රෝපණ ද්‍රව්‍ය නිපදවූ අතර ගොවීන් සඳහා නිකුත් කරන ලදී.

- ගොවීන් සහ ව්‍යාප්ති නිළධාරීන් පලතුරු බෝග නිෂ්පාදනය සම්බන්ධයෙන් දැනුවත් කළ අතර ගොවීන් විසින් මුහුණ දෙන ක්ෂේත්‍ර ගැටළු නිරාකරණය කිරීම සඳහා උපදෙස් ලබා දෙන ලදී.

- පලතුරු බෝග කළමනාකරණය පිළිබඳව විශ්ව විද්‍යාල සිසුන් පුහුණු කළ අතර ඔවුන්ගේ ව්‍යාපෘති අධීක්ෂණය කෙරිණි.
- පස්යාල සහ එරමිණිගොල්ල ගොවිපළ වල පලතුරු ගම්මාන ස්ථාපිත කිරීම සඳහා අංකුර බද්ධ රඹුටන් පැළ 9,000 ක් සහ වරකා රිකිලි පැළ 1,500 ක් නිපදවා බෙදා හරින ලදී.
- මව් පැළ ලෙස වෛරස් වලින් තොර බද්ධ පැඟිරි පැළ 90 ක් නිපදවා බෙදා හරින ලදී.
- ආදර්ශ ගම්මාන ලෙස ගම්මාන තුනක් (දුණුකේවෙල, දියගම, මීවිටිය) සංවර්ධනය කෙරිණි.
- පටක රෝපණ තාක්ෂණය මඟින් සමූහ වශයෙන් රෝපණ ද්‍රව්‍ය නිපදවීම සඳහා රසායනාගාර උපකරණ මිලදී ගැනිණි.

මුල් සහ ආකන්ද බෝග

"අපි වවමු රට නගමු" වැඩසටහන යටතේ මුල් සහ ආකන්ද බෝගවල රෝපණ ද්‍රව්‍ය 45,000 කට අධික ප්‍රමාණයක් නිපදවා බෙදා හරින ලදී. වැඩි දියුණු කළ නව ප්‍රභේද පිළිබඳව සහ නිෂ්පාදන පිළිවෙත් මාලා පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා ගොවි ක්ෂේත්‍රවල ආදර්ශ ගම්මාන 10 කට වැඩි ප්‍රමාණයක් ස්ථාපිත කෙරිණි.

කීට විද්‍යාව

පහත සඳහන් කාර්යයන් වසර තුළදී සිදු කෙරිණි.

වගු අංක 2.2.8 : කීට විද්‍යා අංශය මඟින් සිදු කරන ලද තාක්ෂණය බෙදා හැරීමේ කටයුතු

කාර්යය	එකතුව
රසායනාගාරය තුළ සිදු කළ රෝග විනිශ්චය කිරීම	65
විශේෂ රෝග විනිශ්චයාත්මක ක්ෂේත්‍ර අධීක්ෂණය	06
හඳුනා ගන්නා ලද නව පළිබෝධ ගැටළු සංඛ්‍යාව	12
ගොවීන් සඳහා පුහුණු පංති	03
නිළධාරීන් සඳහා පුහුණු පංති	09
සම්පත් පුද්ගලයන් ලෙස සහභාගි වූ පැළ සායන සංඛ්‍යාව	20
ගැටළු සම්බන්ධයෙන් පිළිතුරු ලබාදුන් ලිපි සංඛ්‍යාව	54
ගැටළු වලට විසඳුම් ලබා දුන් දුරකථන ඇමතුම් සංඛ්‍යාව	06
ඒකාබද්ධ පළිබෝධ කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණ	28
මී මැසි පාලනය	
පිළිතුරු ලිපි සංඛ්‍යා	37
ස්ථාපිත කරන ලද මී මැසි ජනපද සංඛ්‍යාව	38
පැවැත් වූ වැඩමුළු සංඛ්‍යාව	01
නව මී මැසි ජනපද ස්ථාපිත කිරීම සඳහා ගොවීන්ට සහාය වීම	45
ප්‍රකාශිත පුවත්පත් ලිපි සහ අත්පත්‍රිකා සංඛ්‍යාව	02
කෘමි උද්‍යානය නැරඹීමට පැමිණි සංඛ්‍යාව	29,917

ව්‍යාධිවේදය සහ බිම්මල්

- සිදු කරන ලද පැළ සායන සංඛ්‍යාව – 19 (ප්‍රතිලාභ ලද සංඛ්‍යාව – 1800), සේවා සංස්කරණ අභ්‍යාස ආයතන පුහුණුවීම් 20/950, ක්ෂේත්‍ර දින 25/2000, රෝග පරීක්ෂා කිරීම් සඳහා ක්ෂේත්‍ර අධීක්ෂණ 43/730, පළාත් තාක්ෂණික වැඩ කණ්ඩායම් රැස්වීම් 18

- උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ බිම්මල් ඒකකයේ සහයෙන් පොල්ගහමුල සී/ස සර්වෝදය ආර්ථික ව්‍යවසාය සංවර්ධන සේවයේ (ගැරන්ටි) බිම්මල් බීජ නිෂ්පාදන ඒකකයක් ස්ථාපිත කරන ලදී.

- බිදුණුවැව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, මිනම්පිටිය ගොවිජන සේවා මධ්‍යස්ථානය, ලබුදූව කෘෂිකර්ම විද්‍යාලය සහ පොතුහැර බිම්මල් බීජ නිෂ්පාදන ඒකකයේ පවත්වාගෙන යන බිම්මල් බීජ නිෂ්පාදන ඒකක වල පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා උපදෙස් ලබාදුණි.

- ගුවන් විදුලි වැඩසටහන් 05 ක් සහ රූපවාහිනී වැඩසටහන් 02 ක් සිදු කෙරිණි.

- මහ ඉලුප්පල්ලම සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයෙහි නව බිම්මල් බීජ රසායනාගාරයක් ඉදිකිරීම සඳහා උපදෙස් ලබා දෙන ලදී.

පාංශු සාරවත්භාවය ඉහළ නැංවීමේ වැඩසටහන

කොළඹ්ස්ස සහ මාරස්සන වී – එළවළු වගා කරන ප්‍රදේශ වල ගොවීන් සඳහා SPICANSOL II ව්‍යාපෘතිය යටතේ පාංශු සාරවත්භාවය වැඩිදියුණු කිරීම සහ වඩා හොඳ කළමනාකරණ පිළිවෙත් මාලා බිහි කිරීම සිදු කෙරිණි. පාංශු සාරවත්භාවය ඉහළ නැංවීමේ වැඩසටහන යටතේ ගොවීන් 60 දෙනෙකු පමණ සිය කොම්පෝස්ට් පොහොර අවශ්‍යතාවන් පිරිමසා ගැනීම සඳහා ගොවිපළ අවශේෂ මඟින් කොම්පෝස්ට් නිපදවීම සිදු කරයි. ගොම පොහොර සුලභතාව ඉහළ නැංවීම පිණිස ගවයින් ඇති කිරීම සඳහා ගොවීන් දිරිමත් කෙරෙමින් පවතින අතර ගවයින් සහන මිළ ගණන් යටතේ බෙදා හැරීම සඳහා සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ සහාය ලබා ගැනීමට පියවර ගෙන තිබේ.

රසායනාගාරය වැඩි දියුණු කිරීම

විශ්ලේෂණාත්මක කාර්යයන්හි ගුණාත්මය ඉහළ නැංවීම පිණිස පැළ සහ පොහොර නියැදි සකස් කිරීමේ ඒකකයක් රසායනාගාරයෙහි ස්ථාපිත කරන ලදී.

විශ්ලේෂණාත්මක සේවා

2010 වසරේදී පාංශු නියැදි 689 ක්, ජල නියැදි 05 ක්, පැළ නියැදි 58 ක් සහ කොම්පෝස්ට් නියැදි 125 ක් විශ්ලේෂණය කර වාර්තා ඉදිරිපත් කරන ලදී. විශ්ලේෂණාත්මක සේවාවන් මඟින් වසර තුළදී රැස් කර ගත් ආදායම රු. 186,165 කි.

ශිෂ්‍ය ව්‍යාපෘති

සබරගමුව විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුවියක් "ජල රෝපිත තක්කාලි වගාවේ වර්ධනය සහ අස්වැන්න කෙරෙහි විවිධ පොහොර මිශ්‍රණ මඟින් ඇතිවන බලපෑම" යන තේමාව යටතේ ඇගේ අවසන් වසර ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලදී.

මල් වගාව

"අපි වවමු රට නඟමු" වැඩසටහන යටතේ මුල් සහ ආකන්ද බෝගවල රෝපණ ද්‍රව්‍ය 45,000 කට අධික ප්‍රමාණයක් නිපදවා බෙදා හරින ලදී. ආදර්ශ ගම්මාන 10 කට වැඩි සංඛ්‍යාවක් ස්ථාපිත කෙරිණි.

2011 වසර සඳහා සැලැස්ම

එළවළු

- දෙමුහුම් දිරිය අභිජනනය කිරීම මඟින් තක්කාලි සහ මාළු මිරිස් ප්‍රභේද බිහි කිරීම.

- විකෘති අභිජනනය මඟින් තක්කාලි ප්‍රභේද බිහි කිරීම.

- හඳුන්වා දෙන ලද තක්කාලි ප්‍රභේද ඇගයීම.

- තක්කාලි, මෑ(මාතලේ ග්‍රීන්, පොලොංමෑ සහ හවරි මෑ), දඹල(ක්‍රිෂ්ණා සහ SLS 44) අභිජනක බීජ සහ මුදා හරින ලද ප්‍රභේද වල මාපිය ආර නිපදවීම.

- අළුතින් මුදා හරින ලද ප්‍රභේද ප්‍රවර්ධනය කිරීම.

- බලාපොරොත්තු තැබිය හැකි "නයි මිරිස්" වර්ගවල සංශුද්ධකරණය සහ බීජ නිෂ්පාදනය.

- වැටකොළු F_1 දෙමුහුම්/ස්වාභාවිකව පරාගනය වූ ප්‍රභේද, මෑ, පිපිඤ්ඤා F_1 දෙමුහුම් සහ කරවිල F_1 දෙමුහුම් ප්‍රභේද බිහි කිරීම.

- සාම්ප්‍රදායික සහ පේව තාක්ෂණ උපකරණ යොදා ගනිමින් බෝංචි ප්‍රභේද බිහි කිරීම.
- මාතර, ත්‍රිකුණාමලය සහ බදුල්ල යන දිස්ත්‍රික්ක වල ස්ථිර බෝග සායන කමිටු වැඩසටහන ආරම්භ කිරීම.
- විදේශීය කරවිල F_1 ප්‍රභේද සහ වම්බටු ප්‍රභේද ඇගයීම.
- පිපිඤ්ඤා ගෙඩි සංඛ්‍යාව සහ ගුණාත්මය කෙරෙහි අස්වනු නෙලන කාලයෙන් ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම.
- බැක්ටීරියා හිටු මැරීමට ප්‍රතිරෝධී සහ ගෙඩි වල ඒකාකාරී ගුණයන්ගෙන් යුත් ඉහළ අස්වනු ගෙන දෙන දෙමුහුම් වම්බටු ප්‍රභේද බිහි කිරීම.
- වම්බටු ප්‍රභේද සංශුද්ධ කිරීම.
- මුදා හරින ලද ප්‍රභේදයන්හි මා පිය ආර වල අභිජනක බීජ නිෂ්පාදනය.
- හොඳ පාරිභෝගික රුචිකත්වයකින් යුත් ඉහළ අස්වනු ගෙන දෙන, කඳ පාමුල කුණු වීමට ප්‍රතිරෝධී මෑ ප්‍රභේද බිහි කිරීම (ස්වාභාවිකව පරාගනය වන ප්‍රභේද සහ දෙමුහුම් ප්‍රභේද)
- කොළ එළවළු වර්ගවල ගුණාත්මක බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

පලතුරු සහ පටක රෝපණය

- ශ්‍රී ලංකාවේ උගුරැස්ස පිළිබඳ ගවේෂණය, සංරක්ෂණය සහ ප්‍රචාරණ අධ්‍යයන
- ඉහළ අස්වනු සහ ගුණාත්මක ඵල ලබා ගැනීම සඳහා වඩාත්ම හොඳ මා පිය සංයෝගය හඳුනා ගැනීම සඳහා දූරියන් ප්‍රභේද දෙමුහුම්කරණය කිරීම.
- ඉහළ අස්වනු සහ ගුණාත්මය සම්බන්ධයෙන් වරකා පිළිබඳ ගවේෂණය, සංරක්ෂණය සහ ඇගයීම.
- ඉහළ අස්වනු සහ ගුණාත්මය සම්බන්ධයෙන් ඇඹුල් කෙසෙල් පිළිබඳ ගවේෂණය, සංරක්ෂණය සහ ඇගයීම.
- ගුණාත්මයෙන් යුත් ඉහළ අස්වනු ගෙන දෙන ඩ්‍රැගන් ෆෘට් ප්‍රභේද බිහි කිරීම සඳහා දෙමුහුම්කරණය සහ වරණය
- කුරු අඹ ගස් සම්බන්ධයෙන් ඉනටර් ස්ටොක් සහ ග්‍රාහකය සඳහා යොදා ගන්නා ප්‍රභේදවල බලපෑම ඇගයීම
- දැනට තිබෙන සහනිජාත ආර යොදා ගනිමින් පැපොල් දෙමුහුම් බිහිකිරීම සහ අස්වනු සහ අනෙකුත් ගුණාත්මක ලක්ෂණ සම්බන්ධයෙන් දෙමුහුම් ඇගයීම
- ආදර්ශ ගම්මාන ස්ථාපිත කිරීම
- පර්යේෂණ ගොවිපළ වැඩිදියුණු කිරීම සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම
- ප්‍රේරිත විකෘතිය මඟින් ඉහළ අස්වනු ගෙන දෙන, මනා ගුණාත්මයෙන් යුත් සහ රෝග වලට ඔරොත්තු දෙන කෙසෙල් සහ රඹුටන් ප්‍රභේද බිහි කිරීම.
- ඉහළ අස්වනු ගෙන දෙන, මනා ගුණාත්මයෙන් යුත් රෝග වලට ඔරොත්තු දෙන කෙසෙල් ජනක ප්ලාස්ම වරණය කිරීම.
- ඉහළ අස්වනු ගෙන දෙන, මනා ගුණාත්මයෙන් යුත් පැපොල් ප්‍රභේද/දෙමුහුම් බිහි කිරීම.
- රඹුටන් අස්වැන්න සහ ගුණාත්මය ඉහළ නැංවීම සඳහා පිළිවෙත් මාලාවක් බිහි කිරීම.
- ෆාදර් ලෝන්ග් වරකා ප්‍රභේදයේ මුල් ඇඳුණු කඳ කැබලි පැළ සහ බද්ධ පැළ වල බීජවල විශාලත්වය සහ වර්ධන මාධ්‍ය මඟින් ඇති වන බලපෑම පිළිබඳ අධ්‍යයනය.
- ආදර්ශ ගම්මාන 4 ක් ස්ථාපිත කිරීම.
- පර්යේෂණ ගොවිපළ 4 ක් සංවර්ධනය කිරීම සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

මුල් සහ ආකන්ද බෝග සහ මල් වගා වැඩසටහන

- බතල සහ මඤ්ඤාක්කා පිළිබඳ ප්‍රභේදීය වැඩි දියුණු කිරීමේ වැඩසටහන අබණ්ඩවම සිදු කිරීම.

- ලවණතාවයට ඔරොත්තු දීමේ ඉහළ හැකියාවැති කැරොටීන් සහ වියළි ද්‍රව්‍ය වැඩි ප්‍රමාණයක් අන්තර්ගත CIP බතල ආර වල ප්‍රභේදීය ඇගයීම.

- නිර්දේශිත බතල, මඤ්ඤාක්කා, කිරි අල, කොලකේසියා, ඩයස්කෝරියා සහ ඉන්නල ප්‍රභේද වල මූලික රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සහ ඉල්ලුම පරිදි ඉලක්කගත විවිධ ප්‍රතිලාභීන් අතර දීප ව්‍යාප්තව බෙදා හැරීම.

- මුල් සහ ආකන්ද බෝගවල ජනක ප්ලාස්ම නඩත්තු කිරීම.

- මූලික ඒකක, ආදර්ශන බිම් කට්ටි, ආදර්ශ ගම්මාන ස්ථාපිත කිරීමෙන් සහ පුහුණු වැඩසටහන් මඟින් මුල් සහ ආකන්ද බෝගවල වැඩිදියුණු කළ නව ප්‍රභේද සහ නිෂ්පාදන පිළිවෙත් මාලා ව්‍යාප්ත කිරීම.

පැළෑටි ව්‍යාධිවේදය, ක්ෂුද්‍ර ජීවී විද්‍යාව සහ බිම්මල්

- මැලවීම සහ කඳ පාමුල කුණු වීම සම්බන්ධයෙන් වම්බටු, තක්කාලි සහ මාළු මිරිස් ජනක ප්ලාස්ම පරීක්ෂා කර බැලීම.

- ෆ්‍යුසාරියම් මැලවීම සඳහා පාලන ක්‍රම බිහි කිරීම.

- රෝග විනිශ්චය සහ උපදේශක සේවා

- පළිබෝධ වලට තක්කාලි සහ මාළු මිරිස් දක්වන ප්‍රතිරෝධීතාව කෙරෙහි ප්‍රවිකිරණය කරන ලද කයිටින මඟින් ඇති කරන බලපෑම.

- රබුටන් වල පිටිපුස් රෝගය ප්‍රවිකරණය කරන ලද චිටෝසන් මඟින් කළමනාකරණය කිරීම.

- ඉඟුරු රයිසෝම කුණුවීම පාලනය කිරීම සඳහා පාලන ක්‍රම බිහි කිරීම.

- තවාන් රෝග පාලනය කිරීම සඳහා ජෛව විද්‍යාත්මක පාලන ක්‍රම බිහි කිරීම.

- වෛරස් හේතුවෙන් කරවිල කුලයේ ශාකවල ඇතිවන කොළ කොඩ වීම පිළිබඳ අධ්‍යයනය

- රෝග විනිශ්චය කිරීම සඳහා ආනයනික බීජ සහ රෝපණ ද්‍රව්‍ය පරීක්ෂා කිරීම

- ව්‍යාධිජනක දිලීර වර්ධනයට එරෙහිව (නලස්ථව) චිටෝසන් සංයෝග පරීක්ෂා කර බැලීම.

- මිදි වලට වැළඳෙන රෝග පාලනය කිරීම පිළිබඳ අධ්‍යයන

- වට්ටක්කා වල රෝග හඳුනා ගැනීම සහ එම රෝග පාලනය කිරීම සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිලිවෙත් මාලාවක් බිහි කිරීම.

- පැඟිරි බෝග වලට වැළඳෙන ප්‍රධාන රෝග පාලනය කිරීම සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් මාලාවක් බිහි කිරීම.

- වැල් දොඩම්වල කඳ ඉදිමීමේ රෝගය පිළිබඳ අධ්‍යයනය කිරීම.

- සුවිනි යෙලෝ මොසායික් වෛරසය සඳහා පිපිඤ්ඤා ජනක ප්ලාස්ම පරීක්ෂා කර බැලීම.

- ඩ්‍රැගන් ෆෘට් වගාවේ රෝග හඳුනා ගැනීම.

- තක්කාලි වලට වැළඳෙන අංගමාරයට එරෙහිව දිලීරනාශක පරීක්ෂා කර බැලීම.

- මාළු මිරිස් වලට වැළඳෙන ඇන්ත්‍රැක්නෝස් වලට එරෙහිව දිලීරනාශක පරීක්ෂාකර බැලීම.

- කෙසෙල් වලට වැළඳෙන සිගටෝකා රෝගයට එරෙහිව දිලීරනාශක පරීක්ෂා කර බැලීම.

- කරවිල කුලයේ බෝග වලට වැළඳෙන පිටිපුස් සහ යටිපුස් රෝග වලට එරෙහිව දිලීරනාශක පරීක්ෂා කර බැලීම.

- මිල්කි බිම්මල් වගා කිරීම සඳහා සුදුසු තත්ත්ව බිහි කිරීම.

- ඔයිස්ටර් බිම්මල් වල නව ප්‍රභේද දෙක සඳහා වගා ක්‍රම පරීක්ෂා කිරීම.

- බිම්මල් බීජ නිෂ්පාදනය කිරීම සඳහා අඩු පිරිවැයැති ක්‍රමයක් බිහි කිරීම.

- එළවළු සහ පලතුරු බෝග වල මයිකොරයිසා මුල් පිළිබඳ ඇගයීම.

පාංශු සාරවත්භාවය පිළිබඳ කළමනාකරණය

- කාබනික එළවළු නිෂ්පාදනයේ පෝෂක කළමනාකරණය

- එළවළු වගා කිරීම සඳහා බාගෙට පිළිස්සූ දහයියා යෙදීම.

- එප්පාවල රොක් ෆොස්ෆේට් වල ද්‍රාව්‍යතාව ඉහළ නැංවීම සඳහා පණු පොහොර සකස් කිරීමේ ක්‍රියාවලිය භාවිතා කිරීම.
- කාබනික එළවළු අස්වැන්න සරු කර ගැනීම සඳහා වසුන් ද්‍රව්‍ය යොදා ගැනීම.
- ගොවිපළ පාදක කොම්පෝස්ට් නියැදි වල සංයෝග (පෝෂක)
- එළවළු වලදාව සහ පාංශු සාරවත්භාවය කෙරෙහි දිගු කාලීනව කොම්පෝස්ට් භාවිතා කිරීමෙන් ඇති වන බලපෑම.
- මාරස්සන එළවළු වගා කරන පසෙහි පාංශු සාරවත්භාවය ඇගයීම සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන.
- ආරක්ෂිත ගෘහ තුළ වගා කරන බෝග සඳහා පොහොර මිශ්‍රණ සංයෝග කිරීම සහ ඇගයීම.
- දෙමුහුම් එළවළු සඳහා පොහොර කළමනාකරණ පිළිවෙත් ඇගයීම.
- කොම්පෝස්ට් ආදේශ කිරීම මඟින් රසායනික පොහොර භාවිතය අඩු කිරීම.
- කොළ පොහොරවල ද්විතියික සහ ක්ෂුද්‍ර පෝෂක තත්ත්වය
- ශ්‍රී ලංකාවේ විවිධ බෝග වගා කරන පද්ධති වල ක්ෂුද්‍ර පෝෂක තත්ත්වය පිළිබඳ විමර්ශනය.
- ෆොස්ෆේට් පොහොර වල බැර ලෝහ තත්ත්වය පිළිබඳ විමර්ශනය.
- කාබනිකව සහ සාම්ප්‍රදායිකව වගා කෙරෙන කොළ එළවළු වල ක්ෂුද්‍ර පෝෂක අන්තර්ගතය.
- නයිට්‍රජන්, ෆොස්ෆරස්, පොටෑසියම් විශ්ලේෂණය කිරීම සඳහා කඩිනම් ශාක පටක පරීක්ෂණය.

ව්‍යාප්තිය, ආර්ථික විද්‍යාව සහ දත්ත කළමනාකරණය

- බහු – කාලීන දුරස්ථ ගෝචර ග්‍රහණ දත්ත මඟින් බෝග රටාව ඇගයීම සහ බෝග වගා කරන ප්‍රදේශ වල අවකාශ ව්‍යාප්තිය.
- තාක්ෂණික ලුහුඬු ප්‍රකාශන 200 ක් යාවත් කාලීන කර නැවත මුද්‍රණය කිරීම.
- නව තාක්ෂණික ලුහුඬු පුවත් සකස් කර මුද්‍රණය කිරීම.
- දැනුවත් කිරීමේ වැඩසටහන් සහ තාක්ෂණය පතුරුවාලීමේ කටයුතු සම්බන්ධීකරණය /මෙහෙයවීම.

- **කාර්ය මණ්ඩල ලැයිස්තුව**

තනතුර	සංඛ්‍යාව
අධ්‍යක්ෂ (වැඩබලන)	01
අතිරේක අධ්‍යක්ෂ (වැඩබලන)	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)	01
පර්යේෂණ නිළධාරි	25
පරිපාලන නිළධාරි	02
ජ්‍යෙෂ්ඨ පුස්තකාලයාධිපති	01
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරි	02
වැඩසටහන් සහකාර (කෘෂිකර්ම)	21
රාජ්‍ය කළමනාකරණ සහකාර	119
ගොවිපළ ලිපිකරු	09
කෘෂිකර්ම උපදේශක	49
පර්යේෂණ සහකාර	11
පර්යේෂණ උප සහකාර	13
කාර්යාල කාර්ය සහායක	02
රියදුරු	09
ට්‍රැක්ටර් ක්‍රියාකරවන්නා	01
ගබඩාකරු	03
යන්ත්‍රකරු	02
යන්ත්‍ර ක්‍රියාකරු	01
වඩුකරු	02
පෙදරේරු	11
පෑස්සුම්කරු	04
විදුලි ශිල්පි	02
පින්තාරුකරු	01
තණකොළ කපන යන්ත්‍ර ක්‍රියාකරු/තණකොළ කපන්නා	22
පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු	04
වතුර පොම්ප ක්‍රියාකරු	01
මී මැසි ප්‍රදර්ශක	01
බද්ධකරු	07
සංචාරක බංගලා භාරකරු	01
තවාන්කරු	01
සනීපාරක්ෂක කම්කරු	02
නුපුහුණු කම්කරු	135
මුරකරු	23
එකතුව	**360**

2.2.1 පැළෑටි වෛරස් හඳුනා ගැනීමේ මධ්‍යස්ථානය, හෝමාගම

ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන මෙම මධ්‍යස්ථානයට පැවරී තිබෙන වගකීම් වනුයේ වත්මන් උසස් තාක්ෂණික ක්‍රම භාවිතා කර පැළෑටි වෛරස් සහ වෛරස් වැනි ජීවීන් අනාවරණය කර ගැනීම, විද්‍යාගාරයේදී සහ ක්ෂේත්‍රයේදී වෛරස් සහ අනෙකුත් ජීවීන් හඳුනා ගැනීම සඳහා පරීක්ෂණ කට්ටල නිපදවීම, වසංගත විද්‍යාත්මක පරීක්ෂා කිරීම්, සිදු කළ හැකි පාලන ක්‍රම සිදු කිරීම, වෛරස් වලින් තොර මූලික රෝපණ ද්‍රව්‍ය තොග නිපදවීම, වෛරස් කෝට් ප්‍රෝටීන් හා සම්බන්ධ ප්‍රතිරෝධිතාව පිළිබඳ පරීක්ෂා කිරීම් සහ අනෙකුත් ව්‍යාධිජනක ජීවීන් (දිලීර, බැක්ටීරියා, නෙමටෝඩාවන්, වෛරොයිඩ සහ ශාක ප්ලාස්ම)පිළිබඳ සොයා බැලීමයි.

අයවැය

විවිධ වැය ශීර්ෂ සහ ව්‍යාපෘති යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 2.2.1.1 හි දැක්වේ.

ප්‍රගතිය

සාම්ප්‍රදායික ක්‍රම භාවිතා කරන පැළෑටි වෛරස් විද්‍යාව

වසර තුළදී පහත සඳහන් අධ්‍යයන සිදු කෙරිණි.

- සැන්තොමොනාස් ඇක්සොනොපොඩිස් pv ඩිෆෙන්බාකියා (Xanthomonas axonopodis pv diffenbachiae) වෛරසය හේතුවෙන් ඇතිවන ඇන්තූරියම් පත්‍ර අංගමාරය සඳහා බහු ක්ලෝනීය ප්‍රතිමස්තු නිපදවිය. ප්‍රතිශක්තිකරණ කාලය තුළදී හාවාගේ ශරීරය තුළ ප්‍රමාණවත් ප්‍රතිදේහ නිපදවන ලදී.
- දේශීයව නිපදවන ලද සැන්තොමොනාස් ඇක්සොනොපොඩිස් pv ඩිෆෙන්බාකියා (Xanthomonas axonopodis pv diffenbachiae) ඇන්තූරියම් අංගමාර ප්‍රතිමස්තු සඳහා එලිසා ප්‍රශස්ත තත්ත්වයන් සකස් කරන ලදී. තවාන්කරුවන්ගෙන් ලද නියැදි සුවිගත කෙරිණි. රෝගී පැළ හඳුනා ගැනීමට සහ වර්ධක ප්‍රචාරණය මඟින් නිරෝගී පැළ නිපදවීම සඳහා පරීක්ෂණ කට්ටල බෙහෙවින් ප්‍රයෝජනවත් විය. උනන්දුවක් දක්වන පාර්ශ්ව සඳහා මධ්‍යස්ථානයෙන් සේවය ලබා දිය හැකි අතර නියැදියක් සුවිගත කිරීම සඳහා පිරිවැය රු: 300/- ක් විය.
- දේශීයව නිපද වූ බහු ක්ලෝනීය ප්‍රතිමස්තු භාවිතා කර වැලිගම පොල් කොළ මැලවීමේ රෝගය පරීක්ෂා කිරීම සඳහා එලිසා සුදුසු තත්ත්වයන් ප්‍රශස්ත කිරීම. මෙය රෝගී පැළ හඳුනා ගැනීම සඳහා භාවිතා කළ හැක.
- එලිසා තාක්ෂණය මඟින් වැලිගම පොල් කොළ මැලවීමේ ශාක ප්ලාස්ම සඳහා ධාරක පන්ති හඳුනා ගැනිණි.
හෙලිකෝනියා, ඇල්ස්ටෝනියා, ඇතැම් තාල වර්ගයේ ශාක විශේෂ සහ පුවක් පැළ මේ දක්වා ධනාත්මක ප්‍රතිඵල පෙන්වා ඇත. තොරතුරු වත පදනම්ව, රෝගය පැතිරී තිබෙන ප්‍රදේශ වලින් පොල් වගා කරන අනෙකුත් ප්‍රදේශ වලට ඇතැම් ශාක විශේෂ ප්‍රවාහනය කිරීම සීමා කෙරිණි. මෙම අධ්‍යයනය අබණ්ඩවම කෙරෙනු ඇත.

වගු අංක 2.2.1.1 වාර්ෂික අයවැය – 2010 (රු:)			
වැය ශීර්ෂය	**ප්‍රතිපාදනය**	**වියදම**	**වියදම %**
පුනරාවර්තන	2,907,616	2,842,508	98
මූලධන	1,151,518	823,842	72
අපි වවමු රට නගමු – කොස්	225,000	80,797	36
පොල් පර්යේෂණ ආයතනය – පොල් කොළ මැලවීමේ ව්‍යාපෘතිය	450,000	397,668	88
එකතුව	**4,734,134**	**4,144,815**	**88**

- දේශීයව නිපදවන ලද PRSV ප්‍රතිමස්තු යොදා ගෙන කරවිල කුලයේ ශාකවල පැපොල් මුදු පුල්ලි වෛරසය අනාවරණය කර ගන්නා ලදී. කරවිල ප්‍රභේදවල පැපොල් මුදු පුල්ලි වෛරසය තිබෙන්නේදැයි සොයා බැලීම පිණිස දේශීයව නිපද වූ PRSV ප්‍රතිමස්තු භාවිතා කළ හැක.
- විභාජක පටක රෝපණය මඟින් උක් ගස්වල වෛරස් තුරන් කිරීම. මෙම අධ්‍යයනය උඩවලව උක් පර්යේෂණ ආයතනය සමඟ එක්ව සහයෝගිතා වැඩසටහනක් ලෙස අබණ්ඩවම සිදු කෙරෙනු ඇත.
- මස්තු විද්‍යාත්මක ක්‍රම මඟින් සිදු කරන දෛනික සුවිගත කිරීමේ වැඩසටහන යටතේ පරීක්ෂා කිරන ලද නියැදිවල විස්තර පහත දැක්වේ.

වගු අංක 2.2.1.2 දෛනික සුවිගත කිරීමේ වැඩසටහන යටතේ පරීක්ෂා කළ නියැදි

බෝගය	රෝගය	පරීක්ෂා කරන ලද නියැදි සංඛ්‍යාව
ඇන්තූරියම්	පත්‍ර අංගමාරය	140
කෙසෙල්	ඉරි වෛරසය	50
මිරිස්	බන්ච් ටොප් වෛරසය	180
	පිපිසඳ්සදා විචිත්‍ර වෛරසය	10
පොල්	වැලිගම පොල් කොළ මැලවීමේ – ශාක ප්ලාස්මා	360
වල් පැළ	වැලිගම පොල් කොළ මැලවීමේ ශාක ප්ලාස්මා	190
පැඟිරි	පැඟිරි කොළ පැහැවීමේ බැක්ටීරියාව ට්‍රිබ්ටෙසා වෛරසය	12
කරවිල කුලයේ ශාක	පැපොල් මුදු පුල්ලි වෛරසය	50
	පිපිසඳ්සදා විචිත්‍ර වෛරසය	20
කිරි අල	දෂීන් මොසායික් වෛරසය	20
පැපොල්	මුදු පුල්ලි වෛරසය	260
අන්නාසි	විප්ටි මොට්ල් වෛරසය	135
වැල් දොඩම්	පැෂන් ෆෘට් වෛරසය	06
අර්තාපල්	පත්‍ර රෝල්වීමේ වෛරසය	108
	අර්තාපල් y වෛරසය	85
	අර්තාපල් x වෛරසය	248
උක්	මොසායික් වෛරසය	31
	පොට් ගෘප් සහ බනානා ස්ට්‍රීක් වෛරසය	31

අණුක ලවෙරස් විද්‍යාව

වසර තුළදී පහත දැක්වෙන අධ්‍යයන සිදු කරන ලදී.

- රිවර්ස් ට්‍රාන්ස්ක්‍රිප්ෂන් පොලිමරේස් දාම ප්‍රතික්‍රියාව (RT-PCR) මඟින් අර්තාපල් y වෛරසය (PVY) සම්බන්ධයෙන් පරීක්ෂාකර බලන ලදී.
  පරීක්ෂා කරන ලද සාම්පල් 30 කින් 19 කම මෙම වෛරසය සොයා ගැනිණි.

- රිවර්ස් ට්‍රාන්ස්ක්‍රිප්ෂන් පොලිමරේස දාම ප්‍රතික්‍රියාව (RT-PCR) මඟින් අර්තාපල් පත්‍ර රෝල් වීමේ වෛරසය (PLRV) සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලදී. නියැදි කීපයක මෙම වෛරසය දැක ගත හැකි විය.
- රිවර්ස් ට්‍රාන්ස්ක්‍රිප්ෂන් පොලිමරේස දාම ප්‍රතික්‍රියාව මඟින් අර්තාපල් x වෛරසය (PVX) සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලදී.
  බදුල්ල, සීතා එළිය, නුවරඑළිය සහ බණ්ඩාරවෙල ප්‍රදේශ වලින් සහ ඌව පළාතේ වැලිමඩ ප්‍රදේශයෙන් අර්තාපල් x වෛරසයේ රෝග ලක්ෂණ සහිත නියැදි එක්රැස් කර ගන්නා ලදී. එම නියැදි එකකවත් අර්තාපල් x වෛරසය නොතිබුණි. තත්ත්වය ප්‍රශස්ථ කිරීම ක්‍රියාත්මක කිරීම සහ කාර්යය ක්‍රමය වැඩිදියුණු කිරීම සිදු කෙරෙමින් පවතී.

- පොලිමරේස දාම ප්‍රතික්‍රියාව (PCR) පාදක ක්‍රමවේදය යොදා ගනිමින් පොල් කොළ මැලවීමේ පයිටෝ ප්ලාස්මා රෝගයේ ධාරක පන්තිය පිළිබඳ අධ්‍යයනය.
  පොල් කොළ මැලවීමේ රෝගයේ ධාරක පන්තිය පිළිබඳ සොයා බැලීම සඳහා PCR ක්‍රමය සාර්ථකව යොදා ගන්නා ලදී. වැලිගම පොල් කොළ මැලවීමේ පයිටෝ ප්ලාස්මා රෝගය සම්බන්ධයෙන් "ස්පෙසිෆික් ප්‍රයිමර්" යොදා ගනිමින් මෙම අධ්‍යයනය අඛණ්ඩවම සිදු කෙරෙනු ඇත. වැඩිදුරටත් සනාථ කර ගැනීම සඳහා ජාන අනුපිළිවෙළට සකස් කෙරෙනු ඇත.

- DNA පාදක තාක්ෂණය යොදා ගැනෙන දෛනික වෛරස් සුචිගත කිරීමේ වැඩසටහන
  මෙම තාක්ෂණය විශේෂයෙන්ම ප්‍රෝද්ගලික අංශයේ සංවිධාන මඟින් වෛරස් වලින් තොර රෝපණ ද්‍රව්‍ය නිපදවීම ප්‍රවර්ධනය කිරීමට සහ නිරෝධායන කටයුතු වලට යොදා ගත හැකි විය.

පටක රෝපණ අංශය

- කෝලිකුට්ටු කෙසෙල් ප්‍රභේදයේ ක්ෂුද්‍ර – ප්‍රචාරණය සඳහා සුදුසු තත්ත්ව හඳුනා ගැනීම. ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා නැවත අත්හදා බැලීම් සිදු කෙරෙනු ඇත.

- ප්‍රරෝහ අග්‍රස්ථ ක්ෂුද්‍ර බද්ධ කිරීම මඟින් "ඉන්දු" ප්මනාරං ප්‍රභේද ප්‍රචාරණය කිරීම.
  බද්ධය සහ ග්‍රාහක කඳෙන් හට ගන්නා ප්‍රරෝහ විභේදනය කර ගැනීමේ අපහසුතාව පැණ නැගුණි. මෙම අධ්‍යයනය අඛණ්ඩවම සිදු කෙරෙනු ඇත.

- ඇන්තූරියම් ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා සුදුසු තත්ත්ව බිහි කිරීම.
  කිණක බිහි කිරීම සඳහා සියළුම රෝපිත තවමත් ආරම්භක මාධ්‍යයේ පවතී. මෙම අධ්‍යයනය අඛණ්ඩවම සිදු කෙරෙනු ඇත.

- මේරියන් ගෝල්ඩ් 3 (MG_3) අන්නාසි ක්ෂුද්‍ර ප්‍රචාරණය
  MG_3 වගා ප්‍රභේදයේ පත්‍ර කොටස් යොදා ගෙන නලස්ථව රෝපණය කිරීම සාර්ථක විය. කෙසේවුවද, වර්ධනය සහ අස්වනු ක්‍රියාකාරිත්වය පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා ක්ෂේත්‍රයේදී ඇගයීම සිදු කළ යුතු අතර මෙම අධ්‍යයනය අඛණ්ඩවම සිදු කෙරෙනු ඇත.
- පැපොල් ක්ෂුද්‍ර ප්‍රචාරණය සඳහා සුදුසු තත්ත්ව බිහි කිරීම.
  පටක රෝපණ තාක්ෂණය යොදා ගනිමින් පරිණත පැපොල් ගස් ප්‍රචාරණය කිරීම සඳහා හැකියාවක් පවතින අතර මෙම අධ්‍යයනය අඛණ්ඩවම සිදු කෙරෙනු ඇත.

- ක්ෂුද්‍ර ප්‍රචාරණය මඟින් කෙසෙල් ප්‍රභේද නිපදවීම
  සම්මත පටක රෝපණ ක්‍රම යොදා ගනිමින් පහත දැක්වෙන කෙසෙල් ප්‍රභේද නිපදවා බෙදා හරින ලදී.

වගු අංක 2.2.1.3 : ක්ෂුද්‍ර ප්‍රචාරණය මඟින් කෙසෙල් ප්‍රභේද නිපදවීම.

ප්‍රභේදය	නිපද වූ පැළ සංඛ්‍යාව	ගොවීන් අතර බෙදූ පැළ සංඛ්‍යාව
ඇම්බම්	1,200	558
අංගවියරු	400	285
නේත්‍රපලම්	380	160
ඇඹුල්	78	58
එකතුව	2,058	1,055

වෛරස් වසංගත විද්‍යාව

- ඉඟුරු සමඟ පැපොල් මිශ්‍ර වගා කිරීමෙන් සහ කොහොඹ තෙල් යොදා ගනිමින් පැපොල් මුදු පුල්ලි වෛරසය පාලනය කිරීම.
  කොහොඹ තෙල් ප්‍රතිකර්මය යෙදූ වගාවේ පැළ 2 ක්, ඉඟුරු සමඟ කළ මිශ්‍ර වගාවේ එක් පැළයක් සහ පාලන පරීක්ෂාවට අනුව කළ වගාවේ පැළ 2 ක් පැපොල් මුදු පුල්ලි වෛරසය කෙරෙහි ධනාත්මක ප්‍රතිචාර දැක්විය. දෘෂ්‍ය නිරීක්ෂණ මඟින් එලිසා පරීක්ෂණවල ප්‍රතිඵල සනාථ විය. ක්ෂේත්‍රයේ රෝපණය කළ විට ඵල දරන අවධියේදී පැපොල් මුදු පුල්ලි වෛරසය ආසාදනය විය හැකි බැවින් ඵල දරන තුරු නිරීක්ෂණ සහ එලිසා පරීක්ෂණ සිදු කෙරේ.

- රසායනික නොවන ක්‍රම භාවිතයෙන් වට්ටක්කා වෛරස් රෝග පාලනය කිරීම (මාකඳුර කලාපීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය සමඟ එක්ව සිදු කරන අධ්‍යයනය)
  වට්ටක්කා වැල් වල වයස තවම මාසයක් වන අතර ප්‍රතිකර්ම ලබා දුන් වැල් එකකින්වත් දෘෂ්‍ය රෝග ලක්ෂණ නිරීක්ෂණය නොවිණි. එළඹෙන කන්නය තුළදී නිරීක්ෂණ අඛණ්ඩවම සිදු කෙරෙනු ඇත.

- තාප ප්‍රතිකර්මය ලබා දෙන ලද අන්නාසි ක්ෂේත්‍රයේදී ඇගයීම.
  ක්ෂේත්‍රයේ රෝපණය කිරීමෙන් පසු මාස 10 ක් ගත වන තුරු සියළුම පැළ වෛරස් වලින් තොර විය.

  MG_3 අන්නාසිවල වෛරස් අනුමාපන අගය, වර්ධනය සහ අස්වනු ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීම.

  වර්ධන ලක්ෂණ සහ පලතුරේ ගුණාත්මක තත්ත්වය අනුව MG_3 කිව් වගා ප්‍රභේදය දේශීය තත්ත්වයන්ට යෝග්‍ය වන අතර වාණිජ වගාව සඳහා සාර්ථකව යොදා ගත හැකිය.

අනෙකුත් ව්‍යාධිජනක ජීවීන්

ශාක සාර යොදා ගනිමින් තම්පලාවල සර්කොස්පෝරා පත්‍ර ප්‍රල්ලි රෝගය (*Crcospora* spp) කලමනාකරණ කිරීම සඳහා පාලන ක්‍රම බිහි කිරීම.

නලස්ථව පරීක්ෂා කරන ලද ශාක සාර තුනෙන් (කහ, සුදු ලූණු, මිරිස්) සුදු ලූණු වඩාත්ම සාර්ථක බැව් අනාවරණය විය. ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා තැටි මත සිදු කරන පරීක්ෂණ නැවත නැවත සිදු කළ යුතුය. ක්ෂේත්‍ර පරීක්ෂණ ඉන්පසු සිදු කෙරෙනු ඇත.

- ශාක නිස්සාරණ යොදා ගනිමින් මාළු මිරිස්වල ඇන්තැක්නෝස් (*Colletorichum* spp) රෝගය පාලනය කිරීම.
  නලස්ථව පරීක්ෂා කරන ලද ශාක නිස්සාරණ හතරෙන් (කහ , සුදු ලූණු, කොහොඹ තෙල්, කොහොඹ බීජ නිස්සාරණය) කහ නිස්සාරණය වඩාත්ම සාර්ථක බැව් අනාවරණය විය. ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා තැටි මත සිදු කරන පරීක්ෂණ ඉන්පසු සිදු කෙරෙනු ඇත.

- කෙසෙල් වලට වැළඳෙන පැනමා රෝගය (*Fusarium oxysporum*) සඳහා සුදුසු පාලන ක්‍රම බිහි කිරීම.
  වඩාත්ම කාර්යක්ෂම ජෛව කාරකය ට්‍රයිකොඩර්මා (*Trichoderma*) බැව් ප්‍රතිඵල මඟින් අනාවරණය විය. ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා තැටි මත සිදු කරන පරීක්ෂණ නැවත නැවත සිදු කළ යුතුය. කාබනික සහ කාබනික නොවන ද්‍රව්‍ය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර අත්හදා බැලීම් සිදු කෙරෙනු ඇත.

- කෘෂිකාර්මික බෝග වලට වැළඳෙන පළිබෝධ සහ පාලනය කිරීම සඳහා ශාක එන්නත් පරීක්ෂා කිරීම. රිකිලි විදින්නා හානියට ලක්වූ ඇහැළ ශාක වලට ක්ලෝපයිරිෆොස් එන්නත් කළ විට හානිය සැලකිය යුතු අයුරින් පාලනය වූ අතර අනවශ්‍ය හොර, කොට්ටම්බා සහ කඳුරු ගස් ඉවත් කිරීමෙහිලා ග්ලයිෆොසේට් කාර්යක්ෂම විය.ශෛලම තුළ පැතිරී යන සංස්ථානික දිලීර නාශක යොදා ගනිමින් අධ්‍යයනය නැවත සිදු කෙරෙනු ඇත.
- දෛනික රෝග විනිශ්චය කිරීමේ වැඩසටහන

  රෝගී නියැදි 168 කට වැඩි ප්‍රමාණයක රෝග විනිශ්චය කර සමෝධානික පළිබෝධ කළමනාකරණය පාදකව ගොවීන් වෙත විසඳුම් ලබා දෙන ලදී.

තාක්ෂණය පතුරුවාලීම

- පුහුණු පන්ති
  ගොවි පුහුණු පන්ති 10 ක් පැවැත්විය. (සහභාගි වූ සංඛ්‍යාව – 143)

  උසස් පෙළ කෘෂිකර්ම ගුරුවරු 36 ක් පුහුණු කරන ලදී. (ජාතික අධ්‍යාපන ආයතනය)

- කොස් වගාව නඟා සිටුවීම සඳහා "අපි වවමු රට නඟමු" වැඩසටහන් යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ විශේෂ පුහුණුවක් සිදු කරන ලදී.

- නිළධාරීන් 1,106 කට දැනුවත් කිරීමේ වැඩසටහන් 12 ක්, 360 දෙනෙකු සඳහා කොස් සැකසුම් කිරීම පිළිබඳ පුහුණු වැඩසටහන් 09 ක් සහ 70 දෙනෙකු සඳහා බද්ධ කොස් පැළ නිපදවීම පිළිබඳ එක් වැඩසටහනක් පැවැත්වීය.
- දින 150 වැඩසටහන යටතේ කෘෂිකාර්මික ආදර්ශ ගම්මානය සහ පොකුරු ආදර්ශ වැඩසටහන් සාර්ථකව නිම කළ අතර ප්‍රජා පාදක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන වැඩසටහන සිදු කෙරෙමින් පවතී.
- පෞද්ගලික අංශයේ ඉල්ලීම මත නාගරික කෘෂිකර්ම ක්‍රම පිළිබඳ ආදර්ශන පන්ති 6 ක් පැවැත්වීය.
- පාදුක්ක, මාලඹේ, කහතුඩුව, කොස්ගම සහ හබරකඩ ගොවිජන සේවා මධ්‍යස්ථාන වලදී ගොවි බෝග සායන 05 ක් පැවැත්වීය.
- කැළණිය විශ්වවිද්‍යාලයේ ක්ෂුද්‍ර ජීව විද්‍යා අධ්‍යයන අංශ වල උපාධි අපේක්ෂකයින් සඳහා වෛරස් විද්‍යා පාඨමාලාවක් පැවැත්වූ අතර එම සිසුන් සහ රුහුණු සහ වයඹ විශ්වවිද්‍යාල උපාධි අපේක්ෂකයින් සඳහා ආදර්ශන සිදු කරන ලදී.
- පුවත්පත් ලිපි 6 ක් පළ කෙරිණි.

පුහුණුවීම්

- 2008 වසරේදී, ජපන් රජයේ අනුග්‍රහයෙන් විවෘත ශිෂ්‍යත්ව පිරිනැමීමේ වැඩසටහන යටතේ ජල සම්පාදනය පිළිබඳ ආචාර්ය උපාධිය හැදෑරීම සඳහා වැඩසටහන් සහකාර එස්. ආර්. අමරසිංහ මිය තෝරා ගැනිණි.
- සබරගමුව විශ්වවිද්‍යාලයේ කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය හැදෑරීම සඳහා 2009 වසරේදී කෘෂිකර්ම උපදේශක එල්. ඩී. කේ. ආරච්චිගේ මයා තෝරා ගැනිණි. මෙය දෙපාර්තමේන්තුවෙන් පිරිනමන ශිෂ්‍යත්වයකි.

සහයෝගිතා අධ්‍යයන

පොල් කොළ මැලවීමේ රෝගයේ විකල්ප ධාරක හඳුනා ගැනීමට සහ රෝග විනිශ්චය කිරීම සඳහා ලුණුවිල පොල් පර්යේෂණ ආයතනය සමඟ එක්ව සහයෝගිතා පර්යේෂණ වැඩසටහනක් ආරම්භ කරන ලදී.

උපාධි අපේක්ෂක පර්යේෂණ ව්‍යාපෘති

වයඹ, ශ්‍රී ජයවර්ධනපුර සහ කැළණිය විශ්වවිද්‍යාල සඳහා උපාධි අපේක්ෂක ව්‍යාපෘති හතරක් මධ්‍යස්ථානය විසින් පිරිනමා ඇති අතර උපාධි අපේක්ෂකයින් තිදෙනකු ඔවුන්ගේ කාර්මික පුහුණුව සම්පූර්ණ කරන ලදී.

2011 වසර සඳහා සැලැස්ම

සාම්ප්‍රදායික පැළෑටි වෛරස් විද්‍යාව

- දේශීයව නිපදවන ලද වැලිගම පොල් කොළ මැලවීමේ ප්‍රතිමස්තු යොදා ගෙන පොල් හැර කෘෂිකාර්මික බෝගවල ශාක ප්ලාස්ම රෝග නිර්ණය කිරීම.
- කුකුම්බර් ග්‍රීන් මොට්ල් මොසායික් වෛරසය සඳහා බහුක්ලෝනීය ප්‍රතිමස්තු නිෂ්පාදනය කිරීම.
- මස්තු විද්‍යාත්මක ක්‍රම යොදා ගනිමින් පොල් කොළ මැලවීමේ රෝගයේ ධාරක පන්ති පිළිබඳ අධ්‍යයන.
- දේශීයව නිපදවන ලද ඇන්තූරියම් අංගමාර ප්‍රතිමස්තුවල සාර්ථකත්වය පිළිබඳ සොයා බැලීම.
- මස්තු විද්‍යාත්මකව දෛනික වෛරස් සුවිගත කිරීම.

අණුක වෛරස් විද්‍යාව

- ස්පෙසිෆික් ප්‍රයිමර් යොදා ගෙන RT-PCR මඟින් අර්තාපල් වගාවල අර්තාපල් X වෛරසය (PVX) අර්තාපල් Y වෛරසය (TVY) සහ අර්තාපල් පත්‍ර රෝල්වීමේ වෛරසය (PLRV) පරීක්ෂා කිරීම.
- පොලිමරේස දාම ප්‍රතික්‍රියාව මඟින් දැනටමත් පරීක්ෂාකර තිබෙන වෛරස් පරීක්ෂා කිරීම සහ ජාන අනුපිළිවෙලට සකස් කිරීමෙන් තතවුරු කර ගැනීම.
- පොලිමරේස දාම ප්‍රතික්‍රියාව පාදක ක්‍රම භාවිතා කර පොල් කොළ මැලවීමේ රෝගයේ ධාරක පන්තිය පිළිබඳව අධ්‍යයනය කිරීම.
- පැපොල් වෛරස් සහ වෛරොයිඩ් රෝග හඳුනා ගැනීම සහ සංවේදී පරීක්ෂණ ක්‍රම බිහි කිරීම.
- RT-PCR ක්‍රමය භාවිතා කර පැඟිරි වගා ප්‍රභේදවල වෛරස් සහ වෛරොයිඩ් රෝග පරීක්ෂා කිරීම සහ බහුවිධ RT-PCR ක්‍රමයක් බිහි කිරීම.
- PCR ක්‍රමවේදය යොදා ගනිමින් දෛනික වෛරස් සුවිගත කිරීම.

පටක රෝපණය

- පටක රෝපිත කෙසෙල් සහ අන්නාසි නිපදවීම.
- පටක රෝපණ ක්‍රම භාවිතා කර පැපොල් ගුණනය කිරීම.
- "ඉන්දු" ජම්බුඵල ප්‍රභේදය අඩ දළ බද්ධ කිරීම.

- පටක රෝපිත MG3 අන්නාසි ප්‍රභේදයේ වර්ධනය සහ අස්වනු ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් ක්ෂේත්‍ර ඇගයීම.
- ඇන්තූරියම් ක්ෂුද්‍ර ප්‍රචාරණය.

වෛරස් වසංගත විද්‍යාව

- පැපොල් මුදු පුල්ලි වෛරසයේ විභව වාහකයන් තහවුරු කර ගැනීම.
- තාප ප්‍රතිකර්මය ලබා දෙන ලද පටක රෝපිත අන්නාසි පැළ ක්ෂේත්‍රයේදී ඇගයීම සහ අන්නාසි මැලවීමේ වෛරස් රෝගය නිරීක්ෂණය කිරීම.
- කිරි අල සහ අනෙකුත් ඇරොයිඩ වලට වැළඳෙන දඹීන් මොසායික් වෛරසය තුරන් කිරීම සඳහා තාප ප්‍රතිකර්මය ලබාදීම අඛණ්ඩවම සිදු කිරීම.
- ඉඟුරු සමඟ මිශ්‍ර වගා කිරීමෙන් සහ ශාක නිස්සාරණ ප්‍රතිකර්ම ලබා දීමෙන් පැපොල් මුදු පුල්ලි වෛරසය පාලනය කිරීම.
- රසායනික නොවන ක්‍රම යොදා ගනිමින් පිපිඤ්ඤාවල වෛරස් රෝග පාලනය කිරීම (මාකඳුර – කලාපීය කෘෂිකර්ම පර්යේෂණ මධ්‍යස්ථානය සමඟ එක්ව සිදු කරන අධ්‍යයනය)
- වෛරස් රෝග සම්බන්ධයෙන් අළුතින් මුදා හරින ලද පැපොල් ප්‍රභේදවල ක්ෂේත්‍ර ඇගයීම.
- රසායනික නොවන ක්‍රම මඟින් කුකර්බිට් වෛරස් පාලනය කිරීම.

අනෙකුත් ව්‍යාධිජනක ජීවීන්

- ශාක නිස්සාරක යොදා ගනිමින් මාළු මිරිස්වල ඇන්ත්‍රැක්නෝස් සහ තම්පලාවල සර්කොස්පෝරා රෝග පාලනය කිරීම.
- රසායනික නොවන ක්‍රම යොදා ගනිමින් කෙසෙල්වල පැනමා රෝගය සඳහා සුදුසු පාලන ප්‍රතිකර්ම බිහි කිරීම.
- පළිබෝධ සහ රෝග පාලනය කිරීම සඳහා ශාක එන්නත් පරීක්ෂා කිරීම.
- ගොවීන්ගෙන් ලබා ගත් කෘෂිකාර්මික බෝග වලට වැළඳී තිබෙන අනෙකුත් ව්‍යාධිජනක හඳුනා ගැනීම සහ ව්‍යාධිජනක පාලනය කර ගැනීම සඳහා උපදෙස් සැපයීම.
- ඇන්තූරියම්වල බැක්ටීරියා මැලවීමේ රෝගය පරීක්ෂා කිරීම සඳහා දේශීයව නිපදවන ලද එලිසා උපකරණ කට්ටලය පරීක්ෂා කිරීම.
- ව්‍යාධිජනකත්වය පරීක්ෂා කිරීම සහ තෝරාගත් දිලීර සහ බැක්ටීරියා රෝග සම්බන්ධයෙන් කෝක් උපකල්පනය (Kock's postulate) මඟින් තහවුරු කර ගැනීම.

තාක්ෂණය පතුරුවාලීම

- පැවැත්වීමට නියමිත දැනුවත් කිරීමේ සහ පුහුණු වැඩසටහන්

  නිළධාරීන් සඳහා පුහුණු කිරීම් – පන්ති 12

  ගොවීන් සහ ගොවි සංවිධාන සඳහා පුහුණු කිරීම් – 06

  පාසල් සිසුන් සඳහා පුහුණු – 06

  වෙනත් පුද්ගලයින් සඳහා පුහුණු – පන්ති 04

- ක්ෂේත්‍ර නිරීක්ෂණ (වගා සහ ගෙවතු) - 150
- ගොවීන්ගේ ගැටළු සම්බන්ධයෙන් කාර්යාලීය කටයුතු කිරීම - 300
- පළ කිරීමට නියමිත පුවත්පත් ලිපි - 12
- පළ කිරීමට නියමිත අත්පත්‍රිකා - 06
- නාගරික කෘෂිකර්ම ආදර්ශන වැඩසටහන්- 01
- විශේෂ වැඩසටහන් - ආදර්ශ ගම්මාන ආදර්ශනය කිරීමේ වැඩ සටහන
- ප්‍රජා පාදක බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ වැඩ සටහන.

කාර්යමණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
ස්ථාන භාර පර්යේෂණ නිළධාරි	01
පර්යේෂණ නිළධාරි	02
වැඩසටහන් සහකාර	09
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරි	05
කෘෂිකර්ම උපදේශක	10
පර්යේෂණ සහකාර	03
සාමාන්‍ය ලිපිකරු	03
රියදුරු	02
කම්කරු	04
කම්කරු (කොන්ත්‍රාත්)	11
ගබඩාකරු	01
මුරකරු	02
එකතුව	**53**

2.2.2 පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය - හොරන

පහතරට තෙත් කලාපයේ පිහිටා තිබෙන පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වෙත පැවරී තිබෙන වගකීම වනුයේ දිවයිනේ පලතුරු බෝගවල ඵලදායිතාව සහ නිෂ්පාදනය ඉහළ නැංවීම සඳහා යෝග්‍ය තාක්ෂණය බිහි කිරීමයි. මෙම මධ්‍යස්ථානයේ වත්මන් පර්යේෂණ වැඩසටහන් මගින් පහතරට තෙත් කලාපයේ වගා කෙරෙන බෝග කෙරෙහි විශේෂ අවධානය යොමු කරයි. විශේෂයෙන්ම වැඩි අස්වනු ගෙනදෙන උසස් තත්ත්වයේ පලතුරු බෝග ප්‍රභේද බිහි කිරීම, වැඩිදියුණු කරන ලද බෝග කළමනාකරණ පිළිවෙත්, බෝග ආරක්ෂණය, පැළෑටි පෝෂණය, කාබනික පලතුරු වගාව සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම යන අංශ සම්බන්ධයෙන් අවධානය යොමු කෙරේ. එමෙන්ම මෙම මධ්‍යස්ථානය කලාපයේ ගොවි අවශ්‍යතා සපුරාලමින් පහතරට තෙත් කලාපයට අනුවර්තනය වන ඵලවළු පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන්ද කටයුතු කරයි.

අයවැය

විවිධ වැය ශීර්ෂ යටතේ ලද වාර්ෂික ප්‍රතිපාදන සහ දරන ලද වියදම් පිළිබඳව වගු අංක 2.2.2.1 හි දැක්වේ.

ප්‍රගතිය

බෝග වැඩි දියුණු කිරීම

කෙසෙල් ජනක ප්ලාස්ම ඇඟයීම

කලාපයේ ගොවි ක්ෂේත්‍ර වලින් හඳුනාගත් සුවඳැල් එකතූන් තුනක් පරීක්ෂාවට ලක් කරන ලදුව අස්වැන්න, වර්ධන ක්‍රියාකාරීත්වය සහ පාරිභෝගික රුචිය පාදකව පහතරට තෙත් කලාපය සඳහා, HOSU3, "මිල්ලෑව සුවඳැල්" ලෙස නිර්දේශ කරන ලදි.

වැල් දොඩම්වල ප්‍රභේදීය වැඩිදියුණු කිරීම

ගහන නවයකින් වරණය කෙරුණු බලාපොරොත්තු තැබිය හැකි එකතූන් හතක් වැඩිදියුණු කළ වගා ප්‍රභේදයක් බිහි කිරීම සඳහා ප්‍රතිවලිත අත්හදා බැලීම මගින් ඇගයෙමින් පවතී.

පැපොල් දෙමුහුම් බිහි කිරීම

දේශීයව බිහි කරන ලද සහභිජාත ආර දෙකක් සහ රත්න ප්‍රභේදය යොදා ගනිමින් පැපොල් දෙමුහුම් හතරක් බිහිකළ අතර ස්ථායිතාව සහ අනුවර්ත්‍යතාව පිළිබඳව සනාථ කර ගැනීම සඳහා වැඩිදුර ඇගයීම් කටයුතු සිදු කෙරේ.

වගු අංක 2.2.2.1 වාර්ෂික අයවැය – 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
මූලධන	1,610,000	1,648,596	102
පුනරාවර්තන	6,924,234	5,985,118	86
ව්‍යාපෘති			
ශ්‍රී ලංකා ඇ.ඒ.ප්. සහයෝගිතා ජනක ප්ලාස්ම වැඩිදියුණු කිරීමේ වැඩසටහන	380,000	339,624	89
කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සහ භාවිතා කිරීම	1,740,000	761,807	44
එක් ගමක් එක් බෝගයක් වැඩසටහන	391,000	104,876	27
පලතුරු බෝග නායක වැඩසටහන			
මැංගුස්	165,000	157,340	95
පැපොල්	162,000	91,502	56
පැණිරි	90,000	107,860	120
කොස්	90,000	92,355	103
කෙසෙල්	15,000	10,000	67
එකතුව	**11,567,234**	**9,299,078**	80

බෝග කළමනාකරණය

මැංගුස් - අස්වනු ලබාගැනීම සඳහා ද්විත්ව ග්‍රාහක බද්ධ ඇඟයීම

මැංගුස් බෝගය අඩුවෙන් ව්‍යාප්ත වී තිබීමට මූලික හේතුව වනුයේ එහි වර්ධනයේ පවතින මන්දගාමී බවයි. තනි ග්‍රාහකය යොදාගෙන සාම්ප්‍රදායික වර්ධක ප්‍රචාරණ තාක්ෂණය හඳුන්වාදීම තරමක් දුරට සාර්ථක විය. වර්ධක වර්ධනය ඉහළ නංවා ඵලදායිතාව වර්ධනය කර ගැනීමේ අභිප්‍රායෙන් ද්විත්ව ග්‍රාහක බද්ධ කිරීම සිදු කරන ලදි. මෙම තාක්ෂණය සාර්ථක වූ අතර බද්ධ පැළ හොඳින් වර්ධනය වී තුන්වන වසරේදී සාමාන්‍ය අස්වැන්න අවුරුදු පහේ පැලයකින් ගෙඩි 96 බැගින් වූ ඵලදාවක් ගෙනෙන ලදි.

පේර - කප්පාදු කිරීම මගින් පේර ප්‍රභේදවල (පුබුදු, හොරණ රෙඩ්, හොරණ වයිට්) (Psidium guajava) නිෂ්පාදකතාව ඉහළ නැංවීම

අස්වැන්න නෙලාගත් පසු රිකිලි කප්පාදු කිරීම මගින් නියමිත කාලයට පෙර මල් පොහොට්ටු වැඩි සංඛ්‍යාවකින් යුතුව සතුටුදායක ගෙඩි ඵලදාවක් ගෙනදීමට හේතු විය. ප්‍රභේද තුනේම කප්පාදු නොකළ ගස්වල ඵල වලට වඩා කප්පාදු කළ ශාක වල ඵලවල සාමාන්‍ය බරෙහි මනා වර්ධනයක් සහිතව සැලකිය යුතු ප්‍රභේදීය ප්‍රතිචාර ප්‍රකට විය. ඇඟයීමට ලක් කළ ප්‍රභේද තුනෙන් "පුබුදු" ප්‍රභේදය දෙවන සහ තුන්වන වසර වලදී පිළිවෙලින් හෙ. 1 කට ටොන් 14ක් සහ 16ක් අස්වනු ගෙන දෙමින් වියන් කලමනාකරණය කෙරෙහි හොඳ ප්‍රතිචාරයක් දැක්විය. ඒ අනුව, අස්වනු නෙලීමෙන් පසු සෙ,මී. 15-30 දක්වා ප්‍රරෝහ කප්පාදු කිරීම මගින් පේරවල නිෂ්පාදකතාව ඉහළ නැංවිය හැකිය.

හොරණදී ඩ්‍රැගන්ෆෘට්වල ක්‍රියාකාරීත්වය

වැඩීම ඵලදාව ජූලි මාසයේදී ගෙන දෙමින් ඩ්‍රැගන්ෆෘට්වල 4 වැනි ඵලදාව 2009 මැයි මාසයේ සිට සැප්තැම්බර් දක්වා වාර්තා විය. මෙම කන්නයේදී පැලයකින් ගෙනදුන් සාමාන්‍ය අස්වැන්න කි.ග්‍රෑ. 12.07ක් විය. පැලයකින් ගෙන දුන් ඵල සංඛ්‍යාව 06ත් 50ත් දක්වා වූ අතර ගෙඩියක බර ග්‍රෑම් 110 සිට 835 දක්වා පැවති අතර පැලවල ඵලදාව කි.ග්‍රෑ. 3 සිට 20 දක්වා පැවතුණි.

පලතුරු සංවර්ධන කටයුතු රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම

මෙම මධ්‍යස්ථානය රඹුටන්, අඹ, දූරියන්, කොස්, අලිපේර, කාමරංගා, සැපදිල්ලා, සියඹලා, දෙහි, මැංගුස්, ජම්බු, ලොවි, අනෝදා, පේර, දොඩම්, බෙලි, වෙරළු, ජමනාරං, වැල්දොඩම්, ජෑම් පේර ආදියෙහි අංකුර බද්ධ පැළ 14,139ක් රිකිලි බද්ධ පැළ 1,344 ක් සහ බීජ පැළ 589ක් අලෙවි කර ලබන ලද මුළු ආදායම රු. 2,516,865.00 ක් විය.

පටක රෝපණය

පටක් රෝපණය මගින් සීනි කෙසෙල්, නේත්‍රාප්පලම්, ඇම්බන් සහ කෝලිකුට්ටු කෙසෙල්වල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීමේ වැඩසටහන ආරම්භ කරන ලදි. සීනි කෙසෙල් සහ නේත්‍රාප්පලම්වල ගුණන අනුපාතය පහළ මට්ටමක පැවතුණි. 2010 නොවැම්බර් දක්වා පැළ 563 ක් නිපදවූ අතර පැළ 3000ක් පමණ ගුණනය කිරීමේ අදියරේ පවතී.

ස්ථාපිත කරන ලද ගෙවතු සංවර්ධනය කිරීම සහ නඩත්තු කිරීම

ස්ථාපිත කරන ලද ගෙවත්ත නැරඹීම සඳහා ගොවීන් 4359ක්, පාසැල් ගුරුවරුන්, සිසුන් සහ කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරීන් පැමිණෙන ලදි.

පුහුණු වැඩසටහන්

2010 වසරේදී පහත සඳහන් පුහුණු වැඩසටහන් පැවැත්විය.

- පාසැල් 41 ක පාසැල් සිසුන් සහ ගුරුවරුන් 3759ක් මධ්‍යස්ථානය නැරඹීමට පැමිණෙන ලදි.
- විශ්වවිද්‍යාල සිසුන් සහ කථිකාචාර්යවරුන් 145 දෙනෙකු සඳහා පුහුණු වැඩසටහන් තුනක් පැවැත්විය.
- නාවික/යුධ හමුදා නිලධාරීන් 135 දෙනෙකු සඳහා විශේෂ පුහුණු වැඩසටහන් 6ක් පැවැත්විය.
- අභ්‍යාසලාභීන් 320 දෙනෙකු සඳහා පලතුරු වගාව සහ ගෙවතු වගාව පිළිබඳ වැඩසටහන් 10ක් පැවැත්විය.
- ගුණාත්මයෙන් උසස් කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීම පිළිබඳ වැඩසටහන් 05ක් පැවැත්වූ අතර ආදර්ශ ගම්මාන වැඩසටහන යටතේ ක්ෂුද්‍රජීවීන්ගෙන් පොහොසත් කොම්පෝස්ට් පැකට්, මැංගුස් සහ කෙසෙල් පැළ දඹර, හඳුපැල්පොල, කුඹුක, හලාපිටිය සහ ගොඩිගමුව යන ප්‍රදේශවල (ප්‍රතිලාභීන් 394) බෙදා දෙන ලදි.
- පොලොන්නරුව සහ කළුතර පැවති ප්‍රදර්ශන 02කට සහභාගි විය.
- උපදෙස් අඩංගු අත් පත්‍රිකා 3986ක් ගොවීන් අතර බෙදා දෙන ලදි.

අඹ දෙමුහුම් බිහි කිරීම

2009 වසරේදී අඹ දෙමුහුම් නවයක් නිපදවූ අතර ඇගයීම සඳහා ඒවායෙහි මාපියන් සමඟ ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදි. තවත් දෙමුහුම් බිහි කිරීම පිණිස දෙමුහුම්කරණ වැඩසටහන අඛණ්ඩවම සිදු කෙරේ.

රඹුටන්

ගොවි ක්ෂේත්‍රවල තිබෙන බීජ පැල ගහනයෙන් වරණය කරගත් එකතූන් නවයක් ඒවායෙහි වර්ධනය සහ ඵල වල ලක්ෂණ සම්බන්ධයෙන් ඇගයෙමින් පවතී. පැළ බොහොමයකම වර්ධනය සමාන බවක් පෙන්වූ මුත් පත්‍ර ලක්ෂණවල යම් යම් වෙනස්කම් නිරීක්ෂණය විය. පලතුරුවල ලක්ෂණ අනුව එකතූන් දෙකක රසය විශිෂ්ට විය. මල්වාන ස්පෙෂල් ප්‍රභේදයේ පැළ 6 ක් එකිනෙකට වෙනස් ඝනත්ව තුනකින් සහ අතු බෙදීමේ උස ප්‍රමාණ දෙකකින් පවත්වා ගත් අතර එම පැළවල ලක්ෂණයන්හි අස්වැන්නෙහි සැලකිය යුතු වෙනසක් නිරීක්ෂණය නොවිණි. ඇගයීම් අඛණ්ඩවම සිදු කෙරේ.

අඹ සංරක්ෂණය සහ ප්‍රභේදීය වැඩි දියුණු කිරීම

විදේශීය අඹ ප්‍රභේද 10ක් (කෝර්, අර්ලි, ගෝල්ඩ්, අර්වින්, පෝ වෙල්ෂ්, කෙන්ට්, මුල්ගෝවා, නාම්ඩොක් මෙයි, පොප් සමර්, සෙන්සේෂන්, සිල්)සහ දේශීය වරණයන් සංරක්ෂණය කිරීම සඳහා 2004 සැප්තැම්බර් මාසයේ සිට සිමෙන්ති බඳුන්වල ස්ථාපිත කර ඇත. දිවුලපිටියෙන් එක් රැස්කරගෙන ක්ෂේත්‍ර ජාන බැංකුවේ ස්ථාපිත කර තිබෙන අඹවල පළමු පරම්පරාවේ පැළය විශාලවූ අතර උසස් තත්වයෙන් පැවතුණි. ප්‍රධාන වශයෙන්ම සිමෙන්ති බඳුන්වල විශාලත්වය ප්‍රමාණවත් නොවූ බැවින් සහ පැළවල වියන් ස්ථරයේ ඝනත්වය හේතුවෙන් අනෙකුත් වගා ප්‍රභේදවල ඵලදාව අඩුවිය. වෙනත් ස්ථානයකට පැළ මාරු කිරීම බෙහෙවින්ම වැදගත්වේ.

බලාපොරොත්තු තැබිය හැකි දූරියන් ප්‍රභේදයක් වරණය කර ගැනීම

ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශ වලින් එක් රැස් කරගත් දූරියන් එකතූන් 48ක් සහ තායිලන්ත එකතූන් දෙකක් ඇගයෙමින් පවතින අතර ඉන් එකතූන් 4ක් බලාපෙරොත්තු තැබිය හැකි බැව් හඳුනා ගැනිණි.

වරණය කෙරුණු එකතූන් මුහුම් කිරීම මගින් F_1දෙමුහුම් 800 ක් බිහි කළ අතර ඒවා පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ ක්ෂේත්‍රයේ ඇගයෙමින් පවති.

පැඟිරි විශේෂවල ප්‍රභේද වැඩිදියුණු කිරීම

මේ වන විට ජම්නාරං එකතූන් 27 ක් *(Citrus reticulate)* හීන් නාරං එකතූන් 11ක් *(Citrus crenatifolia)* සහ ජම්බෝල එකතූන් 09 ක් ඇගයෙමින් පවතී. බලාපොරෙත්තු තැබිය හැකි ජම්නාරං එකතූන් 3ක් සහ 2007 වසරේදී එහිමි/ශ්‍රී ලංකා කෘෂිකාර්මික හුවමාරු වැඩසටහන යටතේ ජපානයෙන් ලද විදේශීය පැඟිරි ප්‍රභේද 8ක් රෝපණය කළ අතර එකිනෙකට වෙනස් කෘෂි පාරිසරික කලාප නියෝජනය කෙරෙමින් ස්ථාන 8ක ඇගයෙමින් පවති.

ඉන්දු ප්‍රභේදයෙන් බද්ධ පැළ 50 ක් නිපදවා ගොවීන් අතරෙහි බෙදා දුන් අතර රෝපණ ද්‍රව්‍ය නිපදවීම සඳහා මව් පැළ 15ක් ගොවිපළවලට නිකුත් කරන ලදි.

බීජ ප්‍රමාණය අඩු, පලතුරුවල ගුණාත්මක ලක්ෂණ වැඩිදුයුණු කිරීම සඳහා මනාව අනුවර්තනය වන ඉහළ ඵලදාවක් ගෙන දෙන පැඟිරි විශේෂ එනම් නස්නාරං සහ HOCR 24 යොදා ගෙන 2007 වසරේදී විකෘති අභිජනන වැඩසටහන ආරම්භ කරන ලදි. සෑම ප්‍රභේදයකින්ම ගැමා කිරණ මගින් ප්‍රවිකිරණය කරන ලද අංකුර දඬු 600 ක් සහ බීජ 300ක් ඇගයෙමින් පවතින අතර අපේක්ෂිත ලක්ෂණ වලින් යුත් විකෘති කීපයක් වැඩිදුර ඇගයීම සඳහා හඳුනා ගැනිණි.

ජම්නාරංවල F_1 දෙමුහුම් පලතුරු බෝග පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ ඇගයෙමින් පවතී.

ඌන භාවිත පලතුරු බෝගවල ජනක ප්ලාස්ම එක්රැස් කිරීම, සංරක්ෂණය කිරීම, ලක්ෂණීකරණය සහ ඇගයීම.

2002 වසරේ සිට හෙ.3.73 ක වපසරියක ක්ෂේත්‍ර ජාන බැංකුවල එකතූන් 303ක් දැනටමත් ස්ථාපිත කර ඇත. බෙලි එකතූන් 24ක්, පැඟිරි එකතූන් 47ක්, ලාවුළු එකතූන් 05ක්, ලොව් එකතූන් 04ක්, වරකා එකතූන් 32ක්, වෙරළු එකතූන් 17ක්, උගුරැස්ස එකතූන් 22ක්, ගොරකා එකතූන් 33ක්, ගඩුගුඩා එකතූන් 13ක්, දූරියන් එකතූන් 35ක්, සැපදිල්ලා එකතූන් 17ක්, අනෝදා එකතූන් 14ක්, ජම්බු එකතූන් 26ක්, ජෑම් පේර එකතූන් 07ක් ඇඹුල් පේර එකතූන් 07ක් මෙම ජාන බැංකුවල තිබෙන අතර නිර්දේශ කිරීම සඳහා බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද හඳුනා ගැනීමට ලක්ෂණීකරණය කිරීම සහ ඇගයීම අඛණ්ඩවම සිදු කෙරෙමින් පවතී.

සැපදිල්ලා (*Manilkara zapota*)

එකතූන් 17ක් රෝපණය කරන ලදි. පැළවල වර්ධනය ඉතා සෙමින් සිදුවූ අතර HoS 6, HoS 14, HoS 15, HoS 16, HoS 19 සහ 18 HoS 19

අනෙකුත් පැළ වලට වඩා වඩාත් ශක්තිමත්ව වර්ධනය විය. අස්වැන්න, ගුණාත්මය, ගෙඩියේ විශාලත්වය සහ හැඩය සම්බන්ධයෙන් HoS 2, HoS 12 සහ 13 උසස් ගුණාත්මක ලක්ෂණ පෙන්නුම් කරන ලදි. මව්පැළ මෙන්ම පළමු පරම්පරාවේ පැළ අතර සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය.

වෙරලු *(Elaeocarpus serratus)*

කළුතර, ගම්පහ, ගාල්ල සහ රත්නපුර දිස්ත්‍රික්ක වලින් එක්රැස් කර ගත් එකුන් බද්ධ කර එක් එක් නියැදි වලින් පැළ තුන බැගින් ක්ෂේත්‍ර ජාන බැංකුවේ ස්ථාපිත කළ අතර ඇගයීම් කටයුතු සිදු කෙරෙමින් පවතී. HoW 3,5,7,8,9 සහ 13 නිදහස් කිරීම සඳහා බලාපොරොත්තු තැබිය හැකි වගා ප්‍රභේදයන් වේ.

වරකා (*Artocarpus heterophylls*)

එක්රැස් කර ගන්නා ලද වරකා එකතූන් වලින් බලාපොරොත්තු තැබිය හැකි නියැදිවල ජනක ප්ලාස්ම ප්‍රචාරණය කර නියැදියකින් පැළ 8 බැගින් ක්ෂේත්‍ර ජාන බැංකුවේ ස්ථාපිත කරන ලදි. එකතූන් 31කින් HoJ 2, HoJ 3 සහ HoJ 20 හි වැඩි ගෙඩි සංඛ්‍යාවක් වල දැරූ අතර ගෙඩිවල ප්‍රමාණයෙහි, හැඩයෙහි සහ වර්ණයෙහි සැලකිය යුතු වෙනස්කම් නිරීක්ෂණය විය.

බෝග ආරක්ෂණය

පේරවල (*Psidium guajava*) මූල ගැටිති නෙමටෝඩාවන් පිළිබඳව පරීක්ෂා කර බැලීම

හොරණ පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පේර ගස් වලට දැඩි ලෙස හානි කරන කාරක ජීවියා මෙලොයිඩොගයින් (*Meloidogyne*) නැමැති ඝනයට අයත් ලොව පුරා විවිධ බෝග අතරේ පුළුල් ලෙස ව්‍යාප්ත වී සිටින, වඩාත් ගැටළුකාරී යැයි වාර්තා වී ඇති පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවකු බැව් හඳුනා ගැනිණි.

රඹුටන්වල පිටි මකුණා පාලනය කිරීම සඳහා පේව-පලිබෝධනාශක හඳුන්වාදීම

ක්‍රියාකාරී ද්‍රව්‍ය ලෙස කාර්බෙන්ඩසිම් අන්තර්ගත බැවිස්ටින් සහ බුලට්, අධික වර්ෂාව පවතින සමයේදී රෝගය පාලනය කරන ලදි. වියලි කාලගුණයක් පවතින කාල පරිච්ඡේදයේදී ෆෝලිකර්, ඉරේසර්, බැවිස්ටින්, චැම්පියන්, බුලට්, මැන්කොසෙබ්, සල්ෆර් සහ ඩැකොනිල් යන දිලීර නාශක පිටිපුස් රෝගය පාලනය කළ අතර නිරෝගි ඵල සංඛ්‍යාව වැඩි කරන ලදි. කොහොඹ තෙල් සහ සිට්‍රනෙල්ලා තෙල් ප්‍රතිකර්මයෙන් සෑහෙන පමණ නිරෝගි ගෙඩි ඵලදාවක් ගෙන දුන් නමුත් ස්පර්ශක දිලීරනාශක ලෙස (සල්ෆර්, ක්ලොරොතැලොනිල්, කොපර් සහ මැන්කොසෙබ්) යොදන ලද ශාක සාර අධික වර්ෂාව පැවති කාලවලදී පිටි මකුණා පාලනය කිරීමෙහි අකාර්යක්ෂම විය. වියලි කාලයේදී සල්ෆර් ප්‍රතිකර්මයෙන් ලබාදුන් අස්වැන්නට වඩා ඉහළම නිරෝගී රඹුටං ඵලදාවක් කොහොඹ තෙල් සහ සිට්‍රනෙල්ලා තෙල් ප්‍රතිකර්මය මගින් ගෙන දුණි.

ඩ්‍රැගන්ෆෘට් වලින් වාර්තා වූ නව රෝගය

කොලොටොට්‍රිකම් ග්ලොස්පොරියොයිඩ්ස් *(Colletotrichum gloesporioides)* සහ ඔයිඩියම් *(Odium* spp.) හේතුවෙන් හටගන්නා ඇන්ත්‍රැක්නෝස් සහ පිටිපුස් දිලීර රෝග දෙක ඩ්‍රැගන්ෆෘට් වලට වැළඳී ඇති බැව් වාර්තා විය. රතු පාටට හුරු දුඹුරු පැහැති තුවාල වූ කොටස්ද කඳේ සහ පලතුරුවල හරිතක්ෂය වූ වලලු ඇති වීමද ඇන්ත්‍රැක්නෝස් රෝගයේ ලක්ෂණ වන අතර පත්‍රාභය මත සුදු පැහැති පුල්ලි මතුවීම පිටිපුස් රෝගයේ ලක්ෂණ වේ. සැන්තොමොනාස් කැම්පෙස්ට්‍රිස් (*Xanthomonas campestris*) හේතුවෙන් හටගන්නා එක් බැක්ටීරියා රෝගයක් පමණක් වාර්තා විය.

පාංශු පෝෂක කලමනාකරණය

පැඟිරිවල අභ්‍යන්තරයේ ඇතිවන තද ගතිය

පැඟිරිවල අභ්‍යන්තරයේ ඇතිවන තද ගතිය පල්පයේ වල්ක ඇතිවීම සහ ඵලයේ අන්තර්ගත යුෂ ප්‍රමාණය අඩුවීමට හේතුවේ. බෝරෝන් උෂ්ණත්වය හේතුවෙන් මෙම තත්වය ඇතිවන බවට සැක කෙරේ. ප්‍රභේද කීපයක් පමණක් මෙම තත්වයට පාත්‍රී බැව් නිරීක්ෂණය විය. මල් හට ගැනීමට පෙර බෝරැක්ස් 0.25% සාන්ද්‍රණය පත්‍ර මතට එක් වරක් යෙදීමෙන්ද මල් හටගත් පසු මාසයක කාලාන්තරයකින් යුතුව දෙවරක් යෙදීමෙන්ද පැඟිරිවල ඇතිවන තද ගතිය අවම කරගත හැකිය.

වැල් දොඩම්වල කඳ ඉදිමීම

මෙම රෝගය හේතුවෙන් වැල් දොඩම් වැලේ කඳ ඉදිමී පැලුම් ඇතිවී ආසාදනයට ලක්වූ කොටසේ ඉහළ කොටස දුර්වල බවට පත්වී මිය යාමට ලක්වේ. දම් පැහැති කඳක් සහිත ප්‍රභේද මෙම

තත්වයට යම් තාක් දුරට ඔරොත්තු දෙන අතර පතු මතට බෝරැක්ස් ඉසීමෙන් ගැටළුව අවම විය. තවද, රෝගයට ලක්වූ ක්ෂේත්‍රවල පැවති කැල්සියම් ප්‍රමාණය ඉතාමත් අඩුවූ අතර මේ පිළිබඳ අධ්‍යයන අඛන්ඩවම සිදු කෙරේ.

- පැගිරි සඳහා එකිනෙකට වෙනස් බෝග ස්ථාපිත කිරීම් සහ ශාක කලමනාකරණ ක්‍රම පරීක්ෂා කර බැලීම
- පැගිරි සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම
- අමතර මූල පද්ධතියක් ලබාදීම මගින් මැංගුස් බද්ධ පැළ සහ බිජ පැළවල වර්ධනය ඉහළ නැංවීම
- පේරවල නෙමටෝඩා ආසාදනයට එරෙහිව සංගත ග්‍රාහක කඳන් ඇගයීම
- යෝග්‍ය පුහුණු කිරීමේ සහ කප්පාදු කිරීමේ ක්‍රමයක් බිහිකර අනෝද්‍යාවල ඵලදායිතාව ඉහල නැංවීම
- ලොවි සඳහා විවිධ වර්ධක ප්‍රචාරණ ක්‍රම පිළිබඳ අධ්‍යයනය
- ඩ්‍රැගන් ෆෘට්වල අස්වැන්න සහ ගුණාත්මය කෙරෙහි කැබලි සංඛ්‍යාව සහ කැබලිවල ප්‍රමාණය මගින් ඇතිවන බලපෑම
- රඹුටන්වල වර්ධනය සහ අස්වැන්න කෙරෙහි පැළ ඝනත්වය සහ කප්පාදු කිරීමේ උස මගින් ඇතිවන බලපෑම
- බද්ධ දූරියන් වගාව සඳහා බෝග කලමනාකරණ පිළිවෙතක් බිහි කිරීම
- එළබටු පිළිබඳ බෝග කලමනාකරණ අධ්‍යයන (තැලුම් බටු)

පැළෑටි පෝෂණය සහ කාබනික පලතුරු නිෂ්පාදනය

- අන්නාසි, වැල්දොඩම්, මැංගුස් සහ පේර අස්වැන්න සහ ගුණාත්මය කෙරෙහි රසායනික පොහොර සමඟ කොම්පෝස්ට් යෙදීමෙන් ඇතිවන බලපෑම
- වැල් දොඩම්වල කඳ ඉදිමීමේ රෝගය පාලනය කිරීම සඳහා නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් වලට අමතරව වෙනත් පෝෂක යෙදීම
- මැංගුස් ගෙඩිය තුලට මැලියම් වැස්සිම පාලනය කිරීමෙහි නයිට්‍රජන්, පොස්පරස්, පොටෑසියම් වලට අමතරව වෙනත් පෝෂකවල බලපෑම
- පේරවලට වැළඳෙන රෝගය පිළිබඳ අධ්‍යයන (bumpy fruit disordes)
- ලී කුඩු සහ එප්පාවල රොක් පොස්පේට් එක්කොට පලතුරු අපද්‍රව්‍ය මගින් සකස් කරන කොම්පෝස්ට්වල ගුණාත්මය ඉහළ නැංවීම
- පණු පොහොර සකස් කිරීම සහ පණුවන් බෝ කිරීම සඳහා විවිධ කාබනික ද්‍රව්‍යවල බලපෑම පරීක්ෂා කිරීම
- වැල් දොඩම් සහ ඩ්‍රැගන් ෆෘට් සඳහා කාබනික පොහොර පිළිවෙත් මාලාවක් බිහි කිරීම
- ගම්පහ දිස්ත්‍රික්කයේ රඹුටන්/අන්නාසි වගා ක්‍රම සඳහා පාංශු කලමනාකරණ තොරතුරු පද්ධතියක් බිහි කිරීම

පැළෑටි ව්‍යාධිවේදය

- කෙසෙල් සහ පැපොල් පශ්චාත් අස්වනු දිලීර රෝග පාලනය කිරීම.
- දිලීරනාශක සහ ජෛව කාරක ජීවීන් මගින් පැෂන් ෆෘට්වල ෆ්‍යුසාරියම් මැලවීම පාලනය කිරීම.
- පැගිරිවල පසු අංගමාර රෝගය පාලනය කිරීම සඳහා කළමනාකරණ පිළිවෙත් මාලාවක්
- අලිපේර වගාව සඳහා රෝග කළමනාකරණ පිළිවෙත් මාලාව
- ඌන උපයෝගී පලතුරු බෝගවල රෝග කාරක ජීවීන් හඳුනා ගැනීම.
- රඹුටන් වල තවාන් රෝග පාලනය කිරීම සඳහා කළමනාකරණ පිළිවෙත් මාලාවක්
- දූරියන්වල මුල් කුණු වීමේ රෝගය පාලනය කිරීම සඳහා ට්‍රයිකොඩර්මා රෝපිත බිහි කිරීම.

කීට විද්‍යාව

- අන්නාසිවල යුෂ උරා බොන කෘමීන්ට එරෙහිව උද්හිදාංග නිස්සාරණ ඇගයීම.
- පතු කනින්නාට එරෙහිව රසායනික ද්‍රව්‍ය පරීක්ෂා කර බැලීම.
- පේරවල සිටින පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් ඇගයීම.
- උගුරැස්ස, වේරළු සහ ගඩුගුඩා වල සිටින කෘමීන් හඳුනා ගැනීම සහ ඔවුන්ගේ හානිය තක්සේරු කිරීම.

පටක රෝපණය

- කෙසෙල් ක්ෂුද්‍ර ප්‍රචාරණය
- අඹවල කලල වෙන්කර ගැනීම

පූර්ව හා පශ්චාත් අස්වනු

- පේර ප්‍රභේද හතරක ගෙඩි නරක් නොවී තබා ගත හැකි කාලය සම්බන්ධයෙන් පූර්ව සහ පශ්චාත් අස්වනු ප්‍රතිකර්ම ඇගයීම.

- කෘෂිකාර්මික පර්යේෂණ තොරතුරු පිළිබඳ දත්ත මූල වාර්තාව සකස් කිරීම – 2011
- පලතුරු බෝගවල සමාජ ආර්ථික තොරතුරු පිළිබඳ දත්ත මූලයක් බිහි කිරීම.

ගොවි උපදේශක වැඩසටහන්

- රෝගී නියැදි 75ක් ගොවීන්ගෙන් ලද අතර ව්‍යාප්ති නිලධාරීන් විසින් පරීක්ෂා කර රෝග හඳුනා ගැනීම සඳහා රසායනාගාරය තුලදී ව්‍යාධිජනක රෝපණය කර ඒවා පාලනය කිරීම සඳහා නිර්දේශ ලබාදෙන ලදි.
- වසර තුලදී ඩ්‍රැගන් ෆෘට්, දූරියන්, රඹුටන්, අන්නාසි සහ එළවළු වගාවල පලිබෝධ සහ රෝග වලට අදාලව ගොවීන් විසින් ඉදිරිපත් කරන ලද ක්ෂේත්‍ර ගැටළු 95ක් පිළිබඳ සොයා බලා පාලන පිළිවෙත් ලබාදෙන ලදි.

ජනමාධ්‍ය

පලතුරු වගාව, පළිබෝධ සහ රෝග පිළිබඳව රූපවාහිනී වැඩසටහන් පහක් (මැංගුස්, පේර, දූරියන්, ජමනාරං සහ කොම්පෝස්ට් නිෂ්පාදනය) සහ ගුවන් විදුලි වැඩසටහන් 05ක් සඳහා නිලධාරීන් සහභාගිවූ අතර පුවත්පත් ලිපි 7ක්ද පළ කරන ලදි.

වෙනත්

විදෙස්/දේශීය පුහුණු

- එස්.එම්. නාගහවත්ත - පෙව තාක්ෂණය පිළිබඳ විද්‍යාපති වැඩසටහන (2008/2010) අලහබාද් කෘෂිකාර්මික ආයතනය, අලහබාද්, ඉන්දියාව
- සී.කේ.ඩී. වෙල්ලාල - ආහාර සහ කෘෂි ව්‍යවසාය සැලසුම්කරණය සහ ප්‍රවර්ධනය (2010/2011) නැෂනල් ඉන්ස්ටිට්‍යුට් ඔෆ් මයික්‍රෝ ස්මෝල් ඇන්ඩ් මීඩියම් එන්ටර්ප්‍රයිසස්, ඉන්දියාව
- යූ.එන්, ද සිල්වා - පශ්චාත් විද්‍යා උපාධි ආයතනය මගින් සංවිධානය කරන ලද පටක රෝපණය පිළිබඳ පුහුණුව

2011 වසර සඳහා සැලැස්ම

බෝග වැඩිදියුණු කිරීම

- ජනකප්ලාස්ම එක්රැස් කිරීම, ඇගයීම සහ වරණය කිරීම මගින් තත්වයෙන් උසස්, ඉහළ එලදාවක් ගෙන දෙන කෙසෙල් සහ අලිපේර ප්‍රභේද බිහි කිරීම
- තෙත් කලාපයේ සහ අතරමැදි කලාපයේ අඹ ජනක ප්ලාස්ම එක්රැස් කිරීම සහ පහතරට තෙත් කලාපයේ වගා කිරීම සඳහා තත්වයෙන් උසස් ගිරා අඹ සහ පෙට්ටි අඹ වරණය කිරීම
- දෙමුහුම්කරණය මගින් ඉහළ අස්වනු ගෙන දෙන තත්වයෙන් උසස් අඹ ප්‍රභේද බිහි කිරීම
- F_1 දෙමුහුම් ඇගයීම
- වරණය කිරීම සහ දෙමුහුම්කරණය මගින් ඉහළ අස්වනු ගෙන දෙන තත්වයෙන් උසස් වැල් දොඩම්, දොඩම් සහ ජමනාරං ප්‍රභේද බිහි කිරීම
- වරණය කිරීම මගින් ඉහළ අස්වනු ගෙන දෙන තත්වයෙන් උසස් පැඟිරි ප්‍රභේද (දොඩම්, ජමනාරං සහ ජම්බෝල) ප්‍රභේද බිහි කිරීම
- විකෘති අභිජනනය තුළින් ඉහළ අස්වනු ගෙන දෙන, තත්වයෙන් උසස් දොඩම් සහ නස්නාරං ප්‍රභේද බිහි කිරීම
- වෙරළු, ගඩුගුඩා, සැපදිල්ලා සහ වරකා ජනකප්ලාස්ම එක්රැස් කිරීම, ලක්ෂණීකරණය සහ ඇගයීම
- බෙලි ගවේෂණය කිරීම, එක්රැස් කිරීම සහ ස්ථාපිත කිරීම
- බෙලි ජනකප්ලාස්ම ඇගයීම, ලක්ෂණීකරණය සහ වරණය කිරීම
- ඌන භාවිත පලතුරු බෝග ගවේෂණය කිරීම
- ලාවුළු සහ ලොවි ජනකප්ලාස්ම එක්රැස් කිරීම, සංරක්ෂණය කිරීම සහ ඇගයීම
- ජම්බු, ජෑම් පේර, අනෝදා විශේෂ සහ වල් පේරවල ජනකප්ලාස්ම එක්රැස් කිරීම සංරක්ෂණය කිරීම සහ ඇගයීම
- ගොරකා සහ උගුරැස්ස ජනකප්ලාස්ම එක්රැස් කිරීම සංරක්ෂණය කිරීම සහ ඇගයීම
- ගොවි ක්ෂේත්‍රවල තිබෙන බීජ පැළ ගහනයෙන් රඹුටන් ප්‍රභේද වරණය කරගැනීම
- පලතුරු බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයේ තිබෙන රඹුටන් ගහනය ලක්ෂණීකරණය, ඇගයීම සහ සමූහ කිරීම
- වාණිජ වගාව සඳහා බලාපොරොත්තු තැබිය හැකි දූරියන් ප්‍රභේද වරණය කිරීම
- ඉහළ අස්වනු ගෙන දෙන තත්වයෙන් උසස් F_1 දූරියන් දෙමුහුම් බිහි කිරීම
- පහතරට තෙත් කලාපයට ගැලපෙන හිතකර ලක්ෂණ වලින් යුත් බණ්ඩක්කා දෙමුහුම් ප්‍රභේද බිහි කිරීම
- වැරණියා මිරිස් ප්‍රභේදය වැඩි දියුණු කිරීම

බෝග කළමනාකරණය

- නිර්දේශිත කෙසෙල් වගා ප්‍රභේදවල ක්ෂුද්‍ර ප්‍රචාරණය
- වැල් කලමනාකරණය කිරීම මගින් වැල් දොඩම්වල කඳ ඉදිමීමේ රෝගය පාලනය කිරීම
- ජපානයෙන් හඳුන්වාදෙන ලද විදේශීය දොඩම් සහ ජමනාරං ප්‍රභේද ඇගයීම
- වෛරස් තොරව පැඟිරි ශාක පවත්වා ගැනීම සඳහා පිළිවෙත් බිහි කිරීම (දොඩම් සහ ජමනාරං මව් පැළ)

සංවර්ධන වැඩසටහන

- ගෙවත්තක් සකස් කර නඩත්තු කිරීම සහ ගෙවතු වගාව පිළිබඳව ගොවීන් පුහුණු කිරීම සහ පාසැල් සිසුන් දැනුවත් කිරීම.

කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
අතිරේක අධ්‍යක්ෂ (වැඩබලන)	01
පර්යේෂණ නිළධාරි	11
ආර්ථික විද්‍යාඥ සහකාර	01
වැඩසටහන් සහකාර	06
සංවර්ධන සහකාර	02
කෘෂිකර්ම පර්යේෂණ සහ ඵලදායිතා නිළධාරි	01
පර්යේෂණ සහකාර	08
කෘෂිකර්ම උපදේශක	15
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	07
රියදුරු	03
ගබඩාකරු	01
ට්‍රැක්ටර් ක්‍රියාකරවන්නා	01
මුරකරු	01
බද්ධකරු	01
ස්ථිර කම්කරු	03
කම්කරු (කොන්ත්‍රාත්)	63
එකතුව	**125**

2.2.3 ආහාර පර්යේෂණ ඒකකය - ගන්නොරුව

ආහාර පර්යේෂණ ඒකකයේ ප්‍රධාන කාර්යයන් අතරට පසු අස්වනු තාක්ෂණයට අදාල පර්යේෂණ සිදු කිරීම, නිෂ්පාදන බිහි කිරීම, බෝග වැඩි දියුණු කිරීමේ වැඩසටහන් වලින් ලබාගත් නියැදිවල ගුණාත්මය ඇගයීම සහ තාක්ෂණය පතුරුවාලීමේ කටයුතු අයත් වේ. තාක්ෂණය වැඩිදියුණු කිරීම සහ පතුරුවාලීම සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වෙනත් බෝග පර්යේෂණ ආයතන, පළාත් කෘෂිකාර්මික පද්ධතිය රජයේ සහ රජයේ නොවන වෙනත් සංවිධාන සහ පෞද්ගලික අංශය සමඟ එක්ව සිදුකරන

වැඩසටහන් මෙහෙයවීමට අමතරව පසු අස්වනු සහ සැකසුම් කිරීමේ තාක්ෂණය පිළිබඳ විවිධ අංශ සම්බන්ධයෙන් පර්යේෂණ සිදුකිරීම සඳහා උපාධි අපේක්ෂක සහ පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන්ට අවශ්‍ය පහසුකම් සහ මාර්ගෝපදේශ ලබාදීමද මෙම ආයතනයෙන් සිදු කෙරේ.

2.2.3.1 : වාර්ෂික අයවැය – 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම%
මූලධන			50
පුනරාවර්තන	1,585,364	1,268,307	80
ව්‍යාපෘති	250,000	210,599	84
මුල් සහ ආකන්ද බෝග සැකසුම් කිරීම සහ කල් තබාගැනීම (අ.ව.ර.න.)			
බෝග නායක (අඹ) (අ.ව.ර.න.)	218,200	108,954	46
කොස් සැකසුම් කිරීම (අ.ව.ර.න.)	125,000	121,125	97
තක්කාලි (සැකසුම් කිරීම) (අ.ව.ර.න.)	44,000	40,879	93
ගොවීන්ගේ ආදායම් ඉහළ නැංවීම සඳහා ආහාර සැකසුම් කිරීමේ කර්මාන්තශාලාවක් ස්ථාපිත කිරීම	3,600,000	255,664	7
රඹුටං බෝතල් කිරීම (අ.ව.ර.න.)	45,000	44,486	99
එකතුව	**6,368,564**	**2,278,333**	**36**

* අ.ව.ර.න. -- අපි වවමු රට නගමු

ප්‍රගතිය

පර්යේෂණ

- පැපොල්වල හට ගන්නා පසු අස්වනු රෝග බරපතල ගැටළුවක් වී ඇති අතර පසු අස්වනු රසායනික නිරන්තරයෙන්ම භාවිතා කිරීම ඉහළ දිලීර නාශක අවශේෂ වලට හේතු වී ඇත. මාසිකව (පෙර අස්වනු) දිලීර නාශක යෙදීම සමඟ ක්ෂේත්‍රය පවිත්‍රව තබාගැනීමෙන්ද, පොත්තේ කහ පැහැය 25% - 30% ත් අතර වන විට පැපොල් (රෙඩ් ලේඩි) ගෙඩි කඩා වෙන වෙනම ඔතා ප්ලාස්ටික් පෙට්ටිවල අසුරා ප්‍රවාහනය කිරීමෙන්ද දිලීර නිසා සිදුවන ගෙඩි නරක්වීම සැලකිය යුතු අන්දමින් අවම විය. මෙම තාක්ෂණය පැපොල් වගාකරුවන් වෙත ලබාදෙන ලදි.
- ටොම් EJC අඹ සඳහා අනර්ඝ තත්වයේ මලු (තායිලන්තයෙන් ආනයනය කරන ලද) යොදන ලදි. මලු යෙදීමෙන් හෞත රසායනික පරාමිතීන් වෙනස් නොවීය.
- කිතුල් පිටි සමඟ දිවුල් එක්කර සෞඛ්‍යයට හිතකර අතුරුපසක් සකස් කරන ලදි. ශීතකරණ තත්ත්ව යටතේ නිෂ්පාදනය නරක් නොවී දින 14කට වැඩි කාලයක් තබාගත හැකි විය.

- කරවිල මෘදු වන තෙක් තැම්බූ විට එහි ඇති ප්‍රතිග්ලයිසීමික් සාධකය අඩුවන බැව් සොයා ගැණුනු අතර ගැඹුරු තෙලේ බැදීමෙන් එය තවදුරටත් අඩුවිය. මේ හේතුවෙන් ප්‍රති ග්ලයිසීමික් බලපෑම උපරිමයෙන් රඳවා ගැනීම සඳහා කරවිල අමුවෙන් ආහාරයට ගත යුතුය.

- කරවිල නිෂ්පාදනයේ තිත්ත රසය අඩු කිරීම සඳහා සකස් කරගත් කරවිල පේස්ට් 60% කට තක්කාලි පේස්ට් 40% ක් එක්කර තිත්ත අඩු පේස්ට් එකක් සකස් කරන ලදි.

- බේකරි සහ රසකැවිලි නිෂ්පාදන කර්මාන්ත සඳහා යොදාගත හැකි ආස්‍රැතිය මගින් විජලනය කළ (Osmotically dehydrated) වට්ටක්කා කැබලි සකස් කරන ලදි.

- කොස් වලින් සකස් කළ පිටිවල ඇතිවන තිත්ත ගතිය ඉවත් කිරීමේ තාක්ෂණයේ අඩු පාඩු සම්පූර්ණ කළ අතර 2010 වසරේදී තාක්ෂණය මුදා හැරීමේ කමිටුව මගින් මුදා හරින ලදි.

- මැද්ඝෙදාක්කා ප්‍රවාහනය කිරීමේදී සහ එහා මෙහා කිරීමේදී සිදුවන හානි අවම කිරීමට සහ ගබඩා කර තබා ගන්නා කාලය උපරිම කර ගැනීම සඳහා ප්ලාස්ටික් පෙට්ටි භාවිතා කිරීම.

සංවර්ධන කටයුතු

- කොරියානු රජයෙන් අරමුදල් සම්පාදිතව සැකසුම් කිරීමේ කර්මාන්තශාලාවක් ස්ථාපිත කර ගොවීන්ගේ ආදායම ඉහළ නැංවීම සඳහා වූ ව්‍යාපෘතිය ගල්කිරියාගම රජරට ගොවිපලේදී ආරම්භ කෙරිණි. පුහුණු කටයුතු සඳහා සුළු පරිමාණයේ සැකසුම් කිරීමේ යන්ත්‍ර කට්ටලයක් කුණ්ඩසාලයේ ස්ථාපිත කෙරෙනු ඇත.

- බෝග නායක වැඩසටහන යටතේ බද්ධ පැළ 500ක් නිපදවූ අතර අක්කර 100ක අඹ වතු පුනරුත්ථාපනය කරන ලදි.

- "රස පෝෂ" නැමැති නිෂ්පාදනයක් (extruded product) නිපදවූ අතර සීමාසහිත සිලෝන් බිස්කට් ආයතනයට තාක්ෂණය ලබාදෙනු ඇත.

- එක්ස්ට්‍රෑඩර් යන්ත්‍රයක් භාවිතයෙන් සුප් මිශ්‍රණයක් සකස් කිරීමේ තාක්ෂණය "රුහුණු ෆුඩ් ප්‍රඩක්ට්ස්" ආයතනයට ලබාදෙනු ඇත.
- පේරාදෙණිය, සබරගමුව, ඌව වෙල්ලස්ස සහ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලවල උපාධි අපේක්ෂක සිසුන් 11 දෙනෙකුට ඔවුන්ගේ පැවරුම් සම්පූර්ණ කර ගැනීම සඳහා ආහාර පර්යේෂණ ඒකකයේදී පුහුණුව ලබා දෙන ලදි.

- පශ්චාත් කෘෂිකර්ම උපාධි ආයතනයේ සිසුන් තිදෙනෙක් ඔවුන්ගේ උපාධි නිබන්ධනයට අදාල පර්යේෂණ සම්පූර්ණ කරන ලදි.

- කුණ්ඩසාලේ සහ ඇක්වයිනාස් කෘෂිකර්ම ඩිප්ලෝමා පාසැල් සිසුන් 5 දෙනෙකු පුහුණු කරන ලදි.

තාක්ෂණය පතුරුවාලීම

- තක්කාලි, මුල් සහ ආකන්ද බෝග සහ කොස් සඳහා සුළු පරිමාණයේ සැකසුම් කිරීමේ තාක්ෂණය ලබා දෙමින් පිළිවෙලින් පුද්ගලයින් 124ක්, 518ක් හා 414ක් පුහුණු කරන ලදි.

- වත්තල "කිඳුරි" නිෂ්පාදන ආයතනයේ තිබෙන මධ්‍යම පරිමාණයේ සැකසුම් යන්ත්‍රය යොදාගෙන එළවළු අවම වශයෙන් සැකසුම් කිරීම සම්බන්ධයෙන් 50 දෙනෙකු පමණ පුහුණු කරන ලදි.

- මධ්‍යම පරිමාණයේ කෝටඩ් පීනට් සකසනයක් යොදාගනිමින් චීස්, කුළු බඩු සහ සිනි එක්කර සකස් කරන ස්නැක් නිෂ්පාදනය සඳහා තාක්ෂණය දෙහිවල, කළුබෝවිල කොක් ස්කෑන් ආයතනයට ලබාදුණි.

- "ඩ්‍රම් වියලනය කළ කොළ කැඳ මිශ්‍රණය" සකස් කිරීම සඳහා පෞද්ගලික අංශයට ආහාර හා පර්යේෂණ ඒකකයේ පහසුකම් ලබාදුන ලදි.

- පලතුරු යුෂ, කෝඩියල් වර්ග සහ ක්ෂණික බීම සැකසීමේ තාක්ෂණය "මිස්ට් ෆෘට් ප්‍රොඩක්ට්ස්" ආයතනයට ලබා දෙන ලදි.

- සහල් පාදක ආහාර නිෂ්පාදනය කිරීමේ තාක්ෂණය කිරිබත්ගොඩ මාකොළ "විජේවර්ධන බේකර්ස්" වෙත ලබාදෙන ලදි.

- පෞද්ගලික අංශයෙන් ලද ක්ෂණික බීම, චට්නි, කෝඩියල්, ජෑම්, විජලනය කළ එළවළු, පේස්ට්, බයිට් සහ ෆ්‍රෙන්ච් ෆ්‍රයි සාම්පල් කීපයක තත්ත්වය විශ්ලේෂණය කිරීම සඳහා රසායනාගාර පහසුකම් සලසන ලදි.

- අභිජ්ඤනකරුවන්ගේ ඉල්ලීම මත නැවුම් නිෂ්පාදන සඳහා වාර්තා 35ක් බෙදා හරින ලදි.

- සැකසුම් කළ නිෂ්පාදන සඳහා වාර්තා 55ක් නිකුත් කරන ලදි.

- කෘෂිකර්ම ව්‍යවසාය සංවර්ධන සහ තොරතුරු සේවයේ අනුග්‍රහයෙන් පලතුරු සහ එළවළු සැකසුම් කිරීම සහ සහල් පාදක නිෂ්පාදන සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් දෙකක් පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් සිදු කරන ලදි.

- පෞද්ගලික අංශයේ සංවිධාන 32ක්, ගුරුවරුන්, කෘෂිකර්ම උපදේශකවරුන්, ඩිප්ලෝමා සහ විශ්ව විද්‍යාල සිසුන් සඳහා පලතුරු සහ එළවළු සම්බන්ධයෙන් පසු අස්වනු තාක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

- සහල් පාදක නිෂ්පාදන, පලතුරු සහ එළවළු සැකසුම් කිරීම සහ කිරි ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් 25ක් පවත්වන ලදි.

- ගුණාත්මයෙන් ඉහළ කිතුල් පැණි සහ හකුරු සැකසීම සහ විපල්නය කිරීම මගින් වට්ටක්කා කල්තබා ගැනීම පිළිබඳව අත්පත්‍රිකා සකස් කෙරිණි.

- මැද්ඥෙදාක්කාවල අගය එක් කිරීම, වට්ටක්කා ආශ්‍රිත ආහාර නිෂ්පාදන, ගබඩා කරන ලද කොස්වල වර්ධනය වන තිත්ත රසය ඉවත් කිරීමේ තාක්ෂණය, පැළ මුං (මුං බීජ අංකුර) නිෂ්පාදන සහ පෝෂණය සපිරි බේකරි නිෂ්පාදන පිළිබඳ ලිපි පහක් කෘෂිකාර්මික පුවත් රැගත් "සෞභාග්‍යා" සහ "කර්මාන්ත" යන සඟරාවල පළ කරන ලදි.

2011 වසර සඳහා සැලැස්ම

- පොටෑසියම් මට්ටම වැඩිකිරීමෙන් අඹ රෝග පාලනය කිරීම
- පුර්ව අස්වනු කලමනාකරණ පිළිවෙත් මගින් පැපොල්වල පසු අස්වනු රෝග පාලනය සහ ගුණාත්මය ඉහළ නැංවීම
- කොස් සහ වෙරළු වල ප්‍රති ඔක්සිකෘත ක්‍රියාවලිය නිර්ණය කිරීම
- මිරිස් නිෂ්පාදන වැඩි දියුණු කිරීම (Jalapeno)
- ක්ෂණික මැංගුස් යුෂ බීමක් සකස් කිරීම
- සහල් පිටි වලින් කේක් මිශ්‍රණයක් සකස් කිරීම
- සහල්-තිරිඟු පූර්ව මිශ්‍රිත පිටි සකස් කිරිම
- ඉඟුරු කල්තබා ගැනීමේ තාක්ෂණ
- නයිට්‍රජන්, පොස්පරස්, සහ පොටෑසියම් සමතුලිතව යෙදීමෙන් අන්නාසිවල ගුණාත්මය ඉහළ නැංවීම සහ අභ්‍යන්තරය දුඹුරු පැහැවීම අවම කිරීම
- පටක රෝපිත කෙසෙල්වල පසු අස්වනු කලමනාකරණ පිළිවෙත් බිහි කිරීම

කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
ස්ථානභාර පර්යේෂණ නිළධාරි	01
පර්යේෂණ නිළධාරි	02
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරි	03
වැඩසටහන් සහකාර	01
රාජ්‍ය කළමනාකරණ සහකාර	02
කෘෂිකර්ම උපදේශක	04
පර්යේෂණ සහකාර	02
රසායනාගාර උප සහකාර	02
රියදුරු	02
යන්ත්‍ර ක්‍රියාකරු	01
විදුලි ශිල්පී	01
සනීපාරක්ෂක කම්කරු	01
නුපුහුණු කම්කරු	04
කම්කරු (කොන්ත්‍රාත්)	06
මුරකරු	02
එකතුව	**28**

2.2.4 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, බණ්ඩාරවෙල

මධ්‍යන්‍ය මුහුදු මට්ටමේ සිට මීටර් 1400 කට ඉහළින් පිහිටි බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය සතු ප්‍රධාන වගකීම වනුයේ ඌව ප්‍රදේශයේ සහ සබරගමුව පළාතේ බලංගොඩ ප්‍රදේශයේ වගාකරන කෘෂිකාර්මික බෝගවල අස්වැන්න සහ ගුණාත්මය ඉහළ නැංවීම සඳහා යෝග්‍ය තාක්ෂණ ක්‍රම බිහි කිරීමයි. මෙහි සහායක මධ්‍යස්ථාන රහංගල සහ මදුරුකැටියෙහිද, පර්යේෂණ ගොවිපල බිබිලේ සහ මුතුකණ්ඩියෙහිද පිහිටා ඇත. IU_2, IM_3, WM_3, IL_2, සහ WM_3, යන කෘෂි පාරිසරික කලාප ආවරණය කිරීමේ වගකීම මෙම පර්යේෂණ මධ්‍යස්ථානයට පැවරී ඇත. පර්යේෂණ කටයුතු වලට අමතරව මෙම මධ්‍යස්ථානය විසින් පෙයාර්ස්,

පැඟිරි, අලිපේර, අඹ සහ අර්තාපල් වල ගුණාත්මයෙන් ඉහළ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීම වැනි කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන් සිදු කරන ලදි. මෙම වැඩසටහන්වල ප්‍රධාන ඉලක්කය වනුයේ එක් එක් බෝගය සඳහා නිෂ්පාදන කලාප ස්ථාපිත කිරීමයි.

අය වැය

විවිධ වැය ශීර්ෂ යටතේ ලද වාර්ෂික ප්‍රතිපාදන සහ දරන ලද වියදම් පහත දැක්වේ.

වගු අංක 2.2.4.1 වාර්ෂික අයවැය - 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම%
මූලධන	7,229,561	1,287,812	18
පුනරාවර්තන	5,183,366	4,919,826	95
ව්‍යාපෘති			
බෝග නායක - බෝංචි	500,000	428,614	86
බෝග නායක - අර්තාපල්	240,000	200,254	83
බෝග නායක - පැඟිරි	270,000	205,34	76
කාබනික පොහොර	2,620,000	2,159,159	82
එක බෝගයක් - එක ගමක්	590,000	479,912	81
දෙමුහුම් බීජ නිෂ්පාදනය	25,000	16,760	67
එකතුව	**16,657,972**	**9,697,680**	**58**

ප්‍රගතිය

බෝග වැඩි දියුණු කිරීම, ශෂ්‍ය විද්‍යාව, පැළෑටි ආරක්ෂණය, උද්‍යාන බෝග වගාව සහ පටක රෝපණය වැනි ප්‍රධාන අංශ පහ ඔස්සේ එළවළු (බෝංචි, කැරට්, ගෝවා, තක්කාලි) අර්තාපල්, අර්ධ ඖර්මකලාපිය සහ සෞම්‍ය කලාපීය පලතුරු බෝග (පැණි දොඩම්, ජම්බුරා, ඇපල්, පෙයාර්ස්, පීච්, ස්ට්‍රෝබෙරි) සහ මල් බෝග (රෝස, ජර්බරා, කපුරු, ඇන්තූරියම්, ඇස්ටර්, මැඩෝනා, ලිලී, කානේෂන්, සුපර් ඩේසි) කේන්ද්‍රගතව පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කරන ලදි.

බෝග වැඩි දියුණු කිරීම

- බීජ නිපදවන "ලංකා කැරට්" ප්‍රභේදය වාණිජ වගාව සඳහා නිදහස් කරන ලදි.

- බෝංචි පිළිබඳ ප්‍රභේදීය වැඩි දියුණු කිරීමේ වැඩසටහන අබණ්ඩවම සිදුකළ අතර ඇගයීමට ලක් කළ බෝංචි ආර 24න් වැල් බෝංචි ආර 3ක් සහ පඳුරු බෝංචි ආර 6ක් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීම සඳහා වරණය කෙරිණි.

- මාළුමිරිස්, වම්බටු සහ තක්කාලි සඳහා ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදිය අත්හදා බැලීම් සිදු කරන ලදි.

- බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන ආයතනය. මොණරාගල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය සහ රහංගල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය යන ස්ථාන වලදී දේශීය සහ ජපන් දොඩම් සහ ජමනාරං ප්‍රභේද අගයන ලදි.

- ඇපල්, පීච්, පෙයාර්ස්, චීන පේර, නෙක්ටරින්, අලිපේර, කාමරංගා ආදී සෞම්‍ය කලාපීය පලතුරු බෝගවල මව් පැල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ ප්‍රයේෂණ ක්ෂේත්‍රයේ නඩත්තු කෙරේ.

ශෂ්‍ය විද්‍යාව

- බඩඉරිඟු සමඟ අර්තාපල් අතුරු බෝග වගා කිරීමෙන් ඉහළ බීජ අර්තාපල් අස්වැන්නක් ගෙන දෙන ලදි. අර්තාපල් වගා කරන විටම බඩඉරිඟු ස්ථාපිත කිරීමෙන් හෝ අර්තාපල් වලට සති දෙකකට පෙර බඩඉරිඟු ස්ථාපිත කිරීමෙන් මෙම වාසිය අත්විය.

- උඩරට අතරමැදි කලාපයේ මාළුමිරිස් වගාව සඳහා සුදුසු පැළ පරතරය සෙ.මී. 10×30 බැව් හඳුනා ගැනිණි.

පැළෑටි ආරක්ෂණය

- තක්කාලිවල පසු අංගමාරය *(Phytophthora infestans)* පාලනය කිරීම සඳහා නව දිලීර නාශක නිර්දේශයක් ලබාදෙන ලදි. නිර්දේශිත රසායනික මැන්කොසෙබ් වලට වඩා ඇළුතින් නිර්දේශ කරන ලද ෆ්ලූ අසිනම් දිලීර නාශකය (Tizca) වඩාත් හොඳින් ක්‍රියාකාරී විය.

- යුරෝමයිසස් ඇපෙන්ඩිකියුලේටස්ට *(Uromyces appendiculatus)* ඇසොක්සිස්ට්‍රොබින් සාන්ද්‍රණ දෙකක් පරීක්ෂා කර බලන ලදි. පරීක්ෂණයට ලක් කළ නිෂ්පාදනය නිර්දේශිත ක්ලෝරොතැලොනිල් ස්පර්ශක දිලීරනාශකය හා සමානවම ක්‍රියාකාරී විය.

- ගොවි පාලිත තත්ව හා සංසඳනාත්මකව පරීක්ෂාවට ලක් කරන ලද ටෙබ්‍යුකොනසෝල් EC සහ EW සංයෝග මගින් බෝංචි මලකඩ රෝගයේ තීව්‍රතාව සැලකිය යුතු මට්ටමකින් අඩු කළ අතර භාවිතය සඳහා ආරක්ෂිත ක්ලොරොතැලොනිල් දිලීර නාශකය නිර්දේශ කරන ලදි. සංයෝග දෙකෙන්ම අස්වැන්නෙහි සැලකිය යුතු වර්ධනයක් ඇති විය.

- මාළුමිරිස්වල පැළ මැක්කා පාලනය කිරීම සඳහා ඉමිඩැක්ලොප්‍රිඩ් (20%5L), (ලීටරයකට ග්‍රෑම් 1.8 EC) සහ ෆිප්රොනිල් දින 14 ක කාල පරතරයකින් යුතුව පත්‍ර මතට ඉසීම එක සමානවම යෝග්‍යවේ. ප්‍රභව රට හා සලකා බැලීමේදී පලිබෝධ කලමනාකරණයේදී මෙම නිෂ්පාදනවල සාර්ථකත්වයෙහි වෙනසක් නොවීය.

- පලිබෝධ කලමනාකරණයේදී සහ අස්වනු ගෙන දීමේදී නිම්බසිඩින් 1% EC ලිටර් 10කට මිලි ලීටර් 20 අනුපාතයෙන් යෙදූ විට ක්ලොරොෆ්ලුඅසියුරොන් හා සමාන ප්‍රතිඵල ගෙන දුණි. මෙය කොහොඹ බීජ නිස්සාරණයට වඩා සාර්ථක වන අතර නිමි නිෂ්පාදනයක් බැවින් ගොවීන්ට භාවිතා කිරීම අපහසු නොවේ.

- ගෝවා දළඹු සංකීර්ණය පාලනය කිරීම සඳහා බ්‍රිස්ට්‍රිෆ්ලූරොන් 10% EC සාරථක වන අතර ගෝවා ගෙඩියේ බර සහ අවසන් අස්වැන්න ඉහළ නංවමින් මෙම රසායනිකය මගින් ගෝවා දළඹුවන් වර්ග තුනකින් සිදුවන හානිය අවම කරයි.

උද්‍යාන බෝග වගාව

කැල්සියම් ක්ලෝරයිඩ් 4% - 6% කින් යුත් සාන්ද්‍රණය අලිපේර ගෙඩි වලට පීඩනයක් යටතේ (රසදිය මි.මී. 250ක් විනාඩි 120) ලබාදුන් විට ඒවායෙහි ඉදීමේ ක්‍රියාවලිය ප්‍රමාද විය.

පටක රෝපණය

චාන්ඩ්ලර් නැමැති ස්ට්‍රෝබෙරි ප්‍රභේදයේ පූර්ව ශාක පත්‍ර වලින් කිණක වර්ධනය කර ගැනීම සඳහා 0.5mg/L BAP සහ 0.75 mg/L NAA යෙදූ MS මාධ්‍ය යෝග්‍ය වේ. එම ප්‍රභේදයේම උපරිම ප්‍රරෝහ පුනර්වර්ධනය 0.1mg/L TDZ යෙදූ MS මාධ්‍යයෙහි නිරීක්ෂණය විය.

විශේෂ ව්‍යාපෘති

බෝග නායක ව්‍යාපෘතිය

- පටක රෝපණ ක්‍රම මගින් තත්ත්වයෙන් උසස් බීජ අර්තාපල් නිපදවීම අබණ්ඩවම සිදු කෙරිණි.

එක බෝගයක් - එක ගමක් වැඩසටහන

- 2010 වසරේදී මෙම වැඩසටහන යටතේ බද්ධ පෙයාර්ස් (400) සහ දොඩම් පැළ (500ක්) නිපදවිය. බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයෙහි පැළ 600කින් සමන්විත පෙයාර්ස් වත්තක් ස්ථාපිත කෙරිණි.

කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය

- පැඟිරි, තක්කාලි සහ බෝංචි සඳහා ඒකාබද්ධ පැළෑටි පෝෂක ක්‍රම පිළිවෙතක් බිහි කිරීම ආරම්භ කෙරිණි. එළවළු සඳහා අක්කර 1/2 ක ඒකාබද්ධ පැළෑටි පෝෂක ක්‍රම පිළිබඳ ආදර්ශන බිමක් ස්ථාපිත කරන ලදි. කොම්පෝස්ට් නිෂ්පාදනය අබණ්ඩවම සිදු කළ අතර ටොන් 17.5ක් නිපදවිය.

සේවා

අභිජනක බීජ නිෂ්පාදනය

- කැප්පෙටිපොල නිල් (කි.ග්‍රෑ. 117), ලංකා බටර් (කි.ග්‍රෑ 190) සහ KWG (කි.ග්‍රෑ. 65) යන වැල් බෝංචි ප්‍රභේදවල (කි.ග්‍රෑ. 14.5) සහතික කරන ලද අභිජනක බීජ නිපදවිය.

පාංශු පරීක්ෂණ පාදක පොහොර නිර්දේශ කිරීමේ වැඩසටහන

- පාංශු නියැදි 190කට වැඩි ප්‍රමාණයක් පරීක්ෂා කර ඒ අනුව ස්ථානීය විශේෂිත පොහොර නිර්දේශ ලබාදෙන ලදි.

තාක්ෂණය පතුරුවාලීම

කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ නිලධාරීන් උඟව සහ සබරගමුව පළාත්වල පවත්වන ලද පළාත් තාක්ෂණික වැඩ කණ්ඩායම් රැස්වීම් 04කට සහභාගි විය. ඔවුන් පූර්ව කන්නමය පුහුණු වැඩසටහන් වලදී ව්‍යාප්ති නිලධාරීන්ට තාක්ෂණික පුහුණුව ලබාදෙන ලදි.

- අර්තාපල්, පෙයාර්ස් සහ අලිපේර වගාකරුවන් සඳහා පුහුණු වැඩසටහන් කීපයක් සිදු කළ අතර එම වැඩසටහන් වලින් කීපයක් ගොවි ක්ෂේත්‍ර වලදී සිදු කරන ලදි.

- එළවළු, පලතුරු, මල්බෝග සහ අර්තාපල් වගාකරුවන්ට පලිබෝධ සහ රෝග කලමනාකරණය සම්බන්ධයෙන් උපදෙස් දෙන ලදි.

- පාසැල් සිසුන් 958කට සහ ගොවීන් 117 කට පුහුණු වැඩසටහන් පවත්වන ලදි.

- විශ්වවිද්‍යාල සිසුවියක් ඇගේ අවසන් වසර ව්‍යාපෘතිය සහ ඩිප්ලෝමාධාරිනියක් ඇගේ ප්‍රායෝගික පුහුණුව සහ ව්‍යාපෘතියද බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේදී සම්පූර්ණ කරන ලදි.

- ගෙවතු සංවර්ධන සහ කෘෂිකර්ම නිෂ්පාදනය සහ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ගෙවතු 500කට වැඩි සංඛ්‍යාවක් අධීක්ෂණය කළ අතර ක්ෂේත්‍ර දින සමඟ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පාසැල් දැනුවත් කිරීමේ වැඩසටහන් සාර්ථකව සිදු කරන ලදි.

සම්මන්ත්‍රණ වැඩසටහන

මෙම වසරේ නව පර්යේෂණ සොයාගැනීම් පාදකව කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේ නිලධාරීන් සම්මන්ත්‍රණ 5ක් පැවැත්විය.

2011 වසර සඳහා සැලැස්ම

එළවළු

- වරණය කරගත් පඳුරු බෝංචි (11) සහ වැල් බෝංචි (3) ආරවල ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීම

- තක්කාලි, මාළුමිරිස් සහ වම්බටු පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම

- ආරක්ෂිත ගෘහ තුළ වගා කෙරෙන බෙල් පෙපර් සඳහා කාබනිකව පිළිගත හැකි වගා මාධ්‍යයක් පිළිබඳ අධ්‍යයනය

- කාබනික ගෝවා වගාවේදී පත්‍ර මතට ඉසින විවිධ පොහොර මගින් වගාවට ඇති කරන බලපෑම

- "ලංකා කැරට්" වගා කිරීම සඳහා විවිධ පැළ ඝනත්ව පිළිබඳ ඇගයීම

බීජ නිෂ්පාදනය

- බෝංචි (කැප්පෙටිපොල නිල්, ලංකා බටර් සහ වේඩි) සහ "ලංකා කැරට්" අභිජනක බීජ නිෂ්පාදනය

අර්තාපල්

- මුල් ඇදුණු කඳ කැබලි මගින් ගුණාත්මක බීජ නිෂ්පාදනය

- සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය එක්ව ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදිය අත්හදා බැලීම සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම

- ජල රෝපිතව බීජ අර්තාපල් නිෂ්පාදනය කිරීම සඳහා තාක්ෂණය වැඩි දියුණු කිරීම

උද්‍යාන බෝග වගාව

- මොණරාගල සහ රහංගල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයන්හි සහ බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සංවර්ධන මධ්‍යස්ථානයේ තිබෙන දොඩම් සහ ජම්බෝරාවල දේශීය සහ ජපන් ප්‍රභේද ඇගයීම

- ඇපල්, පීච්, පෙයාර්ස්, චීන පේර, නෙක්ටරින්, අලිපේර සහ කාමරංගා ආදී සෞම්‍ය කලාපීය පලතුරු බෝගවල මව් පැල නඩත්තු කිරීම

පැළෑටි ආරක්ෂණය

- එළවළු, පලතුරු, අර්තාපල් සහ මල් බෝග වලට වැළඳෙන රෝග සහ පලිබෝධ සඳහා දිලීර නාශක සහ කෘමි නාශක පරීක්ෂා කර බැලීම

- ග්‍රේ මොල්ඩ් *(Botrytis cinerea)* කෙරෙහි ප්‍රතිරෝධී/ඔරොත්තු දෙන රෝස ආර ඇගයීම

- මෘදු කුණුවීමේ රෝගයට *(Erwinia Cartovora)* එරෙහිව ගෝවා ප්‍රභේදවල රසායනාගාර සහ ක්ෂේත්‍ර ඇගයීම

- පැඟිරි මලකඩ මයිටාවන් සහ පොතු කෘමීන් පාලනය කිරීම සඳහා නව රසායනිකවල සාර්ථකත්වය ඇගයීම

- තක්කාලි කරල් විදින්නාට *(Helicoverpa armigera)* එරෙහිව නව කෘමි නාශකයක් වන බිස්ට්‍රිෆ්ලූරොන් (කෘමි වර්ධක නියාමන සංයෝගය) පරීක්ෂා කර බැලීම

- කාබනික මාළුමිරිස් වගාවේ යුෂ උරාබොන පලිබෝධ (පැල මැක්කන්) පාලනය කිරීම

- පෙළට අතුරු බෝග වගා කිරීමේ ක්‍රම මගින් ගෝවා පලිබෝධ කෙරෙහි ඇතිවන බලපෑම

- ගෝවා දළඹු සංකීර්ණය සඳහා බිස්ට්‍රිෆ්ලූරොන් 10% EC (කෘමි වර්ධක නියාමන සංයෝගය) නියමු මට්ටමින් පරීක්ෂා කර බැලීම

මල් බෝග වගාව

- කැපූ ජර්බෙරා සඳහා පාංශු පාදක වගා මාධ්‍ය ඇගයීම

- සුපර් ඩේසිවල බාහිර ලක්ෂණ සහ අස්වැන්න කෙරෙහි පැල ඝනත්වයෙන් ඇතිවන බලපෑම

- කැපූ ජර්බෙරා සඳහා පශ්චාත් අස්වනු තත්ව කළමනාකරණ පිළිවෙත් මාලාවක් බිහි කිරීම

- ගුණාත්මයෙන් ඉහළ කැපූ රෝසමල් නිෂ්පාදනය සඳහා ප්‍රශස්ත පැළ ඝනත්වය හඳුනා ගැනීම

- කපුරු එකතුන් 20ක් ලක්ෂණීකරණය

පටක රෝපණය

- පත්‍ර සහ ධාවක අග්‍රස්ථ පූර්ව ශාක කොටස් වලින් පුනරවර්ධනය කරගත් පටක රෝපිත ස්ට්‍රෝබෙරි පැළ ගුණනය කිරීම දැඩි කිරීම සහ ඇගයීම

- බීජ අර්තාපල් ආකන්දවල සුප්තතාව බිඳහෙලීමේ අධ්‍යයන

- අර්තාපල්, ඇන්තූරියම්, මැඩෝනා ලිලී සහ ජර්බෙරා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම

පාංශු සේවා

- බීජ අර්තාපල් නිෂ්පාදනය සඳහා නයිට්‍රජන් පොහොර නිර්දේශ සංශෝධනය කිරීම
- කෙටිකාලීන මල් ගෝවා ප්‍රභේද සඳහා පොහොර පිළිවෙත් බිහි කිරීම
- බීජ අර්තාපල් ආකන්දවල සුප්තතාව බිඳහෙලීමේ අධ්‍යයන
- අර්තාපල්, ඇන්තූරියම්, මැඩෝනා ලිලී සහ ජර්බෙරා රෝපණ ද්‍රව්‍ය නිපදවීම
- පත්‍ර සහ ධාවක අග්‍රස්ථ පූර්ව ශාක කොටස් වලින් පුනර්වර්ධනය කරගත් පටක රෝපිත ස්ට්‍රෝබෙරි පැළ ගුණනය කිරීම, දැඩි කිරීම සහ ඇගයීම
- පැඟිරිවල පෝෂක ඌනතා ලක්ෂණ පාලනය කිරීම
- බෝංචි, තක්කාලි සහ පැඟිරි සඳහා ඒකාබද්ධ පැළෑටි පෝෂක ක්‍රමවේදය
- ආරක්ෂිත ගෘහ තුල පසෙන් හටගන්නා රෝග පාලනය කිරීම සඳහා කාර්යක්ෂම පාංශු වන්ද්‍යකරණ ක්‍රියාවලියක් බිහි කිරීම
- මැඩෝනා ලිලී සඳහා පොහොර පිළිවෙත් මාලාව වැඩි දියුණු කිරීම

කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)	01
පර්යේෂණ නිලධාරි	10
මෙහෙයුම් නිලධාරි	01
වැඩසටහන් සහකාර	07
පර්යේෂණ සහකාර	03
කෘෂිකර්ම උපදේශක	13
රසායනාගාර උප සහකාර	02
රාජ්‍ය කළමනාකරණ සහකාර	10
කාර්යාල කාර්ය සහායක	03
රියදුරු	06
ට්‍රැක්ටර් ක්‍රියාකරවන්නා	02
පින්තාරුකරු	01
බද්ධකරු	01
පෙදරේරු	01
වඩුබාස්	01
මුරකරු	15
සංචාරක බංගලා භාරකරු	01
ස්ථිර කම්කරු	104
කොන්ත්‍රාත් කම්කරු	81
එකතුව	**263**

2.2.6 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, සීතාඑළිය

සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු මගින් අර්තාපල්, උඩරට එලවළු, තෝරාගත් සෞම්‍ය කලාපීය පලතුරු සහ මල් බෝගවල එලදායීතාව ඉහළ නැංවීම සහ ආරක්ෂිත කෘෂිකර්මය සඳහා අවශ්‍යතා පාදක පර්යේෂණ සිදු කිරීම කෙරෙහි අවධානය යොමු කරයි. ජාතියේ අවශ්‍යතාව උදෙසා අර්තාපල්, ස්ට්‍රෝබෙරි සහ ජර්බෙරාවල මූලික රෝපණ ද්‍රව්‍ය නිපදවීමේ වගකීමද මෙම ආයතනය විසින් දරනු ලබයි. මීට අමතරව, මෙම ආයතනය රජයේ ගොවිපල, ගොවීන්, ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සහ විශ්ව විද්‍යාල, තාක්ෂණික විද්‍යාල සහ පාසැල් සිසුන් සඳහා තාක්ෂණික උපදෙස් හා පුහුණුව ලබාදේ.

අයවැය

විවිධ වැය ශීර්ෂ සහ ව්‍යාපෘති යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 2.2.6.1 හි දැක්වේ.

වගු අංක 2.2.6.1 වාර්ෂික අයවැය -2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
මූලධන	1,320,978	1,051,258	80
පුනරාවර්තන	2,785,643	2,776,655	100
G_0 අර්තාපල් බීජ නිෂ්පාදනය	3,000,000	2,761,916	92
පොහොර නිෂ්පාදනය	1,570,000	866,516	55
එක් ගමක් එක් බෝගයක් - පෙයාර්ස් සහ ස්ට්‍රෝබෙරි	80,000	32,357	40
එක් ගමක් එක් බෝගයක් - බිම්මල්	100,000	35,000	35
එකතුව	**8,856,621**	**7,523,702**	**85**

ප්‍රගතිය

පර්යේෂණ

ශෂ්‍ය විද්‍යාව

- 2009 වසරේදි ආනයනය කරන ලද නව වාණිජ අර්තාපල් ප්‍රභේද දහය නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්ක වලදි අගයන ලදුව රුඩොල්ෆ්, සැපිරා, කැල් වයිට් සහ ඇම්බිෂන් ප්‍රභේද හතර දේශීය තත්ත්ව යටතේ හොඳින් ක්‍රියාකළ අතර වාණිජ වගාව සඳහා පිළිගන්නා ලදි.

- අර්තාපල් වගා ප්‍රභේද 4ක් ජල රෝපිත ක්‍රමයකට වගා කිරීමේ හැකියාව සම්බන්ධයෙන් පරීක්ෂා කෙරුණු අතර මෙම ක්‍රමය සඳහා " ෆැනෝලා" සුදුසු බවත් "හිල්ස්ටාර්" මධ්‍යස්ථ යෝග්‍යතාවයෙන් යුත් බවත් සොයා ගන්නා ලදි 99-06 සහ 99-02 කුඩා ආකන්ද (mini tubers) නිපදවීමට දිගු කාලයක් ගත් බව සහ ආර්ථික වශයෙන් හිතකර නොවන බව සොයා ගැනිණි.

- ශීත ගබඩාකරණයේදී බීජ අර්තාපල්වල ගුණාත්මය කෙරෙහි සාපේක්ෂ ආර්ද්‍රතාව සහ උෂ්ණත්වය මගින් ඇතිවන බලපෑම පිළිබඳ සිදුකළ අධ්‍යයනයකට අනුව,

- වායුගෝලීය උෂ්ණත්වය (සෙ. 14^0 - 26.9^0ක) සහ සාපේක්ෂ ආර්ද්‍රතාව (80%ක්) යටතේ ගබඩා කළ විට බීජ අර්තාපල්වල බර විශාල වශයෙන් අඩුවීමට හේතුවන බවත්

- උෂ්ණත්වය සෙ. 5^0 දී සහ සාපේක්ෂ ආර්ද්‍රතාව 90^0-95^0% යටතේදී G_0 කුඩා ආකන්ද (ග්‍රෑම් 30-55 බීජවල බර අඩුවීමේ ප්‍රතිශතය අවම බවත්

- සෙ. 5^0 සහ සාපේක්ෂ ආර්ද්‍රතාව 85-90% යටතේදී ග්‍රෑ. 20-30 කාණ්ඩයේ බීජ අර්තාපල්වල බර අඩුවීමේ ප්‍රතිශතය අවම බවත්

- සාර්ථකව බීජ අර්තාපල් ගබඩා කිරීම සඳහා ක්‍රමානුකූල ශීත කිරීම අවශ්‍ය බවත් අනාවරණය විය.

පැළෑටි අභිජනනය

- දේශීයව බිහිකළ ඉහළ අස්වනු ගෙනදෙන, පසු අංගමාරයට ප්‍රතිරෝධී "ගෝල්ඩන්ස්ටාර්" අර්තාපල් ප්‍රභේදය මුදා හරින ලදි.

- ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීම සඳහා දේශීයව බිහිකළ අර්තාපල් ආර 10ක් වරණය කෙරිණි.

- ඉහළ අස්වැන්න, පසු අංගමාරයට දක්වන ප්‍රතිරෝධීතාවය සහ අනෙකුත් හිතකර ලක්ෂණ සම්බන්ධයෙන් F_1 පරම්පරාවේ පැළ 2200ක ක්ලෝනීය ඇගයීම් ආරම්භ කරන ලදි.

- අන්තර්ජාතික අර්තාපල් මධ්‍යස්ථානයෙන් (CIP) ලද අර්තාපල් ආර 15ක් ඇගයීම සඳහා බීජ ගුණනය කිරීම ආරම්භ කෙරිණි.

පටක රෝපණය

- ලිලිවල *(Lilium longiflourm)* කිණක ප්‍රවිකිරණය කිරීම සඳහා විනාඩි 30ක් පාරජම්බුල විකිරණයට ලක් කර ගැමා 5-10Gy යොදාගත හැකිය. ප්‍රරෝහ පුනර්වර්ධනය කර ගැනීම සඳහා 0.5mg/L^1 NAA සහ 0.6 mg/L BAP යෙදූ මාධ්‍ය වඩාත් සුදුසු බැව් අනාවරණය විය.

- ලීටරයකට ඉන්ඩෝල් බියුට්‍රික් ඇසිඩ් මි.ග්‍රෑ. 3ක් එක් කරන ලද ෂන MS මාධ්‍යයෙහි සති 6ක් නලස්ථව වැඩෙන්නට සලස්වන ලද බේබිස් බ්‍රෙත් *(Gypsophila paniculata)* විදුරු ගෘහය තුළදී සාර්ථකව පරිසරයට හුරු කළ හැක. නලස්ථව මුල් ඇද්දවීම සඳහා රෝපණ බඳුන් වාතනය කිරීමෙන් බලපෑමක් ඇති නොකරයි. ප්‍රචාරකයක් තුළ කොම්පෝස්ට්: යටි පස්: ගොම 1:1:1 අනුපාතයෙන් සකස් කරගත් මිශ්‍රණයෙහි ප්‍රරෝහ කැබලි රෝපණය කිරීමෙන් සාම්ප්‍රදායික ප්‍රචාරණය සිදු කළ හැකි විය.

- චාන්ඩ්ලර් ස්ට්‍රෝබෙරි ප්‍රභේදයේ නලස්ථ පැළවල සහ නලස්ථව ලබාගත් ප්‍රචාරකවල අස්වැන්න සහ ධාවක නිෂ්පාදන ක්‍රියාකාරීත්වය පිළිබඳව පරීක්ෂා කර බලන ලදි. පරිසරයට හුරු කරන ලද පටක රෝපිත පැළ අඩුම අස්වැන්නක් සහ උපරිම ධාවක/පැළ සංඛ්‍යාවක් නිපදවූ අතර පරීක්ෂා කර බලන ලද අනෙකුත් ප්‍රචාරක සමාන අස්වැන්නක් සහ ධාවක සංඛ්‍යාවක් නිපදවිය. එබැවින්, පටක රෝපිත පැළ රෝපණ ද්‍රව්‍ය නිපදවීම සඳහා පමණක් යොදා ගත යුතුය.

- නලස්ථ මව් අර්තාපල් පැළ වලින් කඳ කැබලි නිපදවීම සඳහා නලස්ථ රෝපිතවල වයස මාධ්‍ය සංයුතිය මගින් ඇතිවන බලපෑම සම්බන්ධයෙන් දැල් ගෘහය තුළදී කන්න දෙකක් පරීක්ෂා කර බලන ලදි. කඳ කැබලි විශාල සංඛ්‍යාවක් ලබා ගැනීම සඳහා අර්ධ වශයෙන් දහනය කළ දහයියා: තේ රොඩු (1:1) සහ අර්ධ වශයෙන් දහනය කළ දහයියා: කොහු බත්: වැලි (1:1:1) අනුපාතයෙන් යුත් බඳුන් මිශ්‍රණය යෝග්‍ය බැව් හඳුනා ගැනිණි. වැඩි කඳ කැබලි සංඛ්‍යාවක් ලබා ගැනීම සඳහා නලස්ථ පැළවල සුදුසුම වයස වනුයේ සති 5-6 ත් අතර කාලයයි.

කීට විද්‍යාව

- බෝංචි කරල් විදින්නා *Maruca vitrata* සඳහා ෆ්ලූබෙන්ඩියමයිඩ් 480 SC හෙ. 1ට ක්‍රියාකාරී ද්‍රව්‍ය ග්‍රෑම් 36 බැගින් යෙදීම නිර්දේශ කරන ලදි.

- අර්තාපල්වල කියත් පණුවා සඳහා ෆ්ලූබෙන්ඩියමයිඩ් 480 SC හෙ. 1ට ක්‍රියාකාරී ද්‍රව්‍ය ග්‍රෑම් 36 බැගින් සහ ෆ්ලූබෙන්ඩියමයිඩ් 24 WG හෙ. 1ට ක්‍රියාකාරී ද්‍රව්‍ය ග්‍රෑම් 36 බැගින් නිර්දේශ කරන ලදි.

- රසායනාගාර තත්ව යටතේ උපරිම උෂ්ණත්වය සෙල්සියස් 17^0 - 30^0 ත් අතර සහ අවම උෂ්ණත්වය සෙල්සියස් 11^0 - 16^0 ත් අතර පවතින විට චෙයිලොමිනස් සෙක්ස්මැකියුලාටාගේ *(Cheilomenes sexmaculata)* ජීවන චක්‍රයේ කාල සීමාව දින 26 සිට දින 36 ක් දක්වා බැව් හඳුනා ගැනිණි.

- දියමන්ති පිට සලඹයා *(Plutella xylostella)* සඳහා බ්‍රිස්ට්ෆ්ලූරෝන් 10% EC ලිටරයකට මිලි ලීටර් 1.5 බැගින් නිර්දේශ කරන ලදි.

ව්‍යාධිවේදය

- අර්තාපල් පසු අංගමාරය කලමනාකරණය කිරීම සඳහා ෆ්ලූඅසිනම් (ටිස්කා) දිලීරනාශකය ලිටරයකට මිලි ලීටර් 0.5 ක් යොදා භාවිතා කිරීම නිර්දේශ කරන ලදි.

- පරීක්ෂා කර බලන ලද ප්‍රභේද අතරින් කැල් වයිට්, ඇලඩින් සහ ඇම්බිෂන් ප්‍රභේද පසු අංගමාර රෝගයට අඩුවෙන්ම පාත්‍රී වූ ප්‍රභේද වන අතර සැප්‍රියා සහ මාර්සි ඉහළම අස්වනු ගෙන දුන් ප්‍රභේද විය.

- පසු අංගමාරයට දක්වන ප්‍රතිරෝධීතාව සම්බන්ධයෙන් සිදු කරන ලද අභිජනක ආර පරීක්ෂාකර බැලීමේදී M 22, 01 – 09- 05, 01 – 01 – 09, 01 – 09 – 06 වඩාත් සාර්ථක ප්‍රතිඵල පෙන්විය.

- ගදා මුල රෝගයට ග්‍රීන් කෝනට් සහ K – 3 – 122 ගෝවා ප්‍රභේද වඩාත් පාත්‍රී වූ අතර KA ක්‍රොස්, ඇවිරුන් වර්ල්ස්, එවර් ග්‍රීන් යන ප්‍රභේද එම රෝගයට ඉහළ ප්‍රතිරෝධීතාවයෙන් යුතු විය.

පාංශු විද්‍යාව

- ජල රෝපිත ක්‍රමය සඳහා බෝග අවශ්‍යතාව මත පදනම්ව නව දියර පොහොර සංයෝගයක් පරීක්ෂා කිරීමේදී එම නව සංයෝගයේ අඩංගු නයිට්‍රජන්, පොස්පරස් සහ පොටෑසියම් ප්‍රමාණයන් ප්‍රමාණවත් නොවූ බැව් අනාවරණය විය.

එළවළු බෝග

- ඇගයීමට ලක් කළ ගෝවා ප්‍රභේද අතරින් TSX 0578, සැමුරායි, නින්ජා, සනි සහ ග්‍රීන් ග්ලෝබ් යන ප්‍රභේද පහ සාර්ථක ප්‍රතිඵල ලබාදුන් අතර, උඩරට තෙත් කලාපයේ වාණිජ වගාව සඳහා පිළිගන්නා ලදි.

- නව දෙමුහුම් කැරට් ප්‍රභේදයක් වන නන්තින්දෝ සාර්ථක ප්‍රතිඵල ලබාදුන් අතර උඩරට තෙත් කලාපයේ වාණිජ වගාව සඳහා නිර්දේශ කරන ලදි.

- HT 1500 සහ HT 1505 නැමැති නව බීට් ප්‍රභේද අස්වැන්න, ආකන්ද ගුණාත්මය, කලින් පරිණත වීම සහ පලිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධී වීම සම්බන්ධයෙන් සාර්ථකව ක්‍රියාකාරී වූ අතර වාණිජ වගාව සඳහා නිර්දේශ කරන ලදි.

සංවර්ධන කටයුතු

ශෂ්‍ය විද්‍යාව

- අර්තාපල් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය - පූර්ව මූලික බීජ (Go)

ජල රෝපිත ක්‍රමයට - ආකන්ද 19,897
භූ රෝපිත ක්‍රමයට - ආකන්ද 226,508
වායු රෝපණ ක්‍රමයට - ආකන්ද 100,000 ක් නිපදවීම

- ආරක්ෂිත ගෘහ තුළ සහ විවෘත ක්ෂේත්‍රයේදී ගුණනය කිරීම සඳහා පූර්ව මූලික බීජ 308,045 ක් ගොවීන් වෙත ලබාදෙන ලදි.

- උඟව පළාතේ ගොවි ක්ෂේත්‍රවල ජල රෝපිතව බීජ නිෂ්පාදනය කිරීමේ ඒකක 11ක් ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණික සහාය ලබා දුණි.

- උඟව පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කැප්පෙටිපොල නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලයේ වායුරෝපණ බීජ අර්තාපල් නිෂ්පාදන ඒකකයක් ස්ථාපිත කිරීම සඳහා තාක්ෂණික සහාය ලබාදෙන ලදි.

- කුඩා ආකන්ද නිෂ්පාදනය කිරීම සඳහා ජල රෝපිත ක්‍රමය පිළිබඳව ව්‍යාප්ති නිලධාරීන් 20දෙනෙකු සහ ගොවීන් 60දෙනෙකුද වායු රෝපණය පිළිබඳව නිළධාරීන් 05දෙනෙකු සහ ගොවීන් 12දෙනෙකුද පුහුණු කරන ලදී.

- පහත දැක්වෙන උපාධි අපේක්ෂක පර්යේෂණ ව්‍යාපෘති තුන සඳහා පහසුකම් ලබා දුණි.

- ජල රෝපිත ක්‍රමයකට අර්තාපල් වගා ප්‍රභේද හතරක කුඩා ආකන්ද නිපදවීමේ විභවය

- ශීත ගබඩාකරණයේදී වාතයේ සාපේක්ෂ ආර්ද්‍රතාව සහ උෂ්ණත්වය බීජ අර්තාපල්වල ගුණාත්මය කෙරෙහි ඇති කරන බලපෑම

- පර්යේෂණ සහ ගොවි කලමනාකරණ තත්ත්වය යටතේ බීජ අර්තාපල් නිෂ්පාදනය- සංසන්දනාත්මක විශ්ලේෂණයක්

පටක රෝපණය

- **රෝග වලින් තොර නලස්ථ අර්තාපල් පැළ නිෂ්පාදනය**

විධිමත් බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන සඳහා ග්‍රැනෝලා ප්‍රභේදයේ නලස්ථ පැළ 5689ක්, අවිධිමත් බීජ අර්තාපල් නිෂ්පාදන වැඩසටහන සඳහා ග්‍රැනෝලා,ඩිසයිරී සහ හිල්ස්ටාර් ප්‍රභේද වලින් පැළ 1663ක්, පරීක්ෂණ කටයුතු සඳහා පැළ 708ක් සහ පෞද්ගලික රසායනාගාර වලදි සහ බණ්ඩාරවෙල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානයේදී ගුණනය කිරීම සඳහා පැළ 137ක් නිකුත් කරන ලදි.

- **අර්තාපල් ජනකප්ලාස්ම සංරක්ෂණය කිරීම**

අර්තාපල් ප්‍රභේද 7ක් (ග්‍රැනෝලා, ඩිසයිරි, රාජා, හිල්ස්ටාර්, කොන්ඩෝරා, ලයිරා සහ කුෆ්රි ගිරිරාජ්), බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද 2ක් (FLS – 7 සහ LBR – 15), අභිජනක ආර තුනක් (99-02, 99-05 සහ 99-06) සහ අන්තර්ජාතික අර්තාපල් මධ්‍යස්ථානයෙන් ලද ආර 15ක් ඉදිරි ප්‍රයෝජනය සඳහා රසායනාගාරයේදී සංරක්ෂණය කෙරේ.

- **ස්ට්‍රෝබෙරි**

"එක් ගමක් එක් බෝගයක්" වැඩසටහන යටතේ චාන්ඩ්ලර් ප්‍රභේදයේ නලස්ථව ලබාගත් රෝපණ ද්‍රව්‍ය 5885 ක් වගාකරුවන්ට ලබාදෙන ලදි. චාන්ඩ්ලර් ප්‍රභේදයේ නලස්ථ පැළ 677ක් සහ නලස්ථව ලබාගත් රෝපණ ද්‍රව්‍ය 2189 ක් පිළිවෙලින් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සහ පලතුරු නිෂ්පාදනය කිරීම සඳහා වගාකරුවන්ට ලබාදුණි. අත්හදා බැලීම් කටයුතු සඳහා පැළ 600ක් යොදාගත් අතර ධාවක සහ පලතුරු නිෂ්පාදනය කිරීම සඳහා පැළ 1625ක් ස්ථාපිත කරන ලදි.

- **පෙයාර්ස්**

"එක් ගමක් එක් බෝගයක්" වැඩසටහන යටතේ පැළ 80ක් (රහංගල වරනය) නිකුත් කරන ලදි.

- **මල් වගාව**

බේබිස් බ්‍රෙත් *(Gypsophila paniculata)* පැළ 1357ක් ලිලියම් වලින් පැළ 42ක් ජර්බෙරා පැළ 20ක් නිෂ්පාදනය කර නුවරඑළියේ වගාරුවන් වෙත නිකුත් කෙරිණි.

- උපාධි අපේක්ෂක පර්යේෂණ ව්‍යාපෘති තුනක් සඳහා පහසුකම් ලබා දුණි.

- බේබිස් බ්‍රෙත් *(Gypsophila paniculata L.)* නලස්ථව සහ නලස්ථව නොවන මුල් ඇද්දවීම සහ පරිසරයට හුරු කිරීම

- විකෘති කරන ලද ලිලී *(Lilium longiflorum* L.) කිණාක වලින් පැළ පුනර්ව්‍යර්ධනය කිරීම සඳහා ප්‍රේරිත විකෘතිකරණය සහ ප්‍රශස්ථ මාධ්‍ය බිහි කිරීම

- බේබිස් බ්‍රෙත් *(Gypsophila paniculata* L.) නලස්ථව මුල් ඇද්දවීම සහ පරිසරයට අනුවර්තනය කිරීම පිළිබඳ අධ්‍යයනය

ව්‍යාධිවේදය

- බැක්ටීරියා හිටු මැරීම සඳහා පරීක්ෂා කරන ලද පාංශු නියැදි සංඛ්‍යාව 1760

- ගොවි පැමිණිලි මත සිදු කළ රෝග විනිශ්චය කිරීම් සංඛ්‍යාව

අර්තාපල්	- 13
එළවළු	- 23
මල් සහ පළතුරු	- 06
බිම්මල්	- 04

කීට විද්‍යාව

- රජයේ බීජ අර්තාපල් ගොවිපල වලින් ලද පාංශු නියැදි 1760 ක් පරීක්ෂා කරන ලදි.

- ජල රෝපිත වගාව යටතේ බීජ අර්තාපල් සඳහා සංයෝග කළ නව දියර පොහොර පරීක්ෂා කර බැලීමේ උපාධි අපේක්ෂක පර්යේෂණ ව්‍යාපෘතිය සිදු කරන ලදි.

පාංශු විද්‍යාව

- පොහොර නිර්දේශ පාදකව සිදු කරන ලද පාංශු විශ්ලේෂණ: විශ්ලේෂණය කළ නියැදි සංඛ්‍යාව පහත දැක්වේ.

pH	286
පොස්පරස් (P)	234
පොටෑසියම් (K)	234

- කොම්පෝස්ට් නිෂ්පාදන වැඩසටහන යටතේ කොම්පෝස්ට් ටොන් 60 ක් නිපදවිය.

වැඩමුළු/ඉදිරිපත් කිරීම්

- ශ්‍රී ලංකාවේ ඉඩම් හායනය පිළිබඳව පරිසර අමාත්‍යාංශයෙන් පවත්වන ලද පළමු ජාතික සමුළුවේදි "උඩරට ඉඩම් හායනය වීමේ වත්මන් තත්ත්වය සහ එම තත්ත්වය පාලනය කිරීමට ගන්නා ලද පියවර" මැයෙන් පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි.

- බංග්ලාදේශයේ ඩකා නුවර පැවති එළවළු නිෂ්පාදනය පිළිබඳ වැඩමුළුවට සහභාගි වූ අතර කලාපීය අත්හදා බැලීම් තුළින් එළවළු බෝගවල වත්මන් තත්ත්වය සහ වැඩිදියුණු කිරීමේ ක්‍රමෝපාය පිළිබඳ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදි.

- ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ බොහෝ පවුල් අතර ආහාර සුරක්ෂිතතාව සහ පෝෂණය ඉහළ නැංවීම සඳහා ක්‍රියාත්මක ආහාර හා කෘෂිකර්ම සංවිධාන ව්‍යාපෘතියේ ප්‍රතිලාභී ගොවීන් සඳහා වූ පර්යේෂණ ව්‍යාපෘති සංවාදයෙහි සම්පත් පුද්ගලයෙක් ලෙස එක් නිලධාරියකු කටයුතු කරයි.

පුහුණුවීම්

- බීජ අර්තාපල් තාක්ෂණය, සහතික කිරීම සහ සැපයුම් පද්ධති පිළිබඳව නෙදර්ලන්තයේ පැවති සති 4ක අන්තර්ජාතික පාඨමාලාවට එක් නිලධාරියකු සහභාගි විය.

- ආසියානු ඵලදායිතා සංවිධානය මගින් සංවිධානය කර ශ්‍රී ලංකා දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානයෙහි පැවැත්වූ හොඳ කෘෂිකාර්මික පිළිවෙත් (GAP) සහ පුළුල් වෙළඳපල ප්‍රවේශය සඳහා ගෝලීය වශයෙන් හොඳ කෘෂිකාර්මික පිළිවෙත් පිළිබඳ දින තුනක විද්‍යුත් අධ්‍යාපන පාඨමාලාවකට එක් නිලධාරියකු සහභාගි විය.

තාක්ෂණය පතුරුවාලීම

- කෘෂිකර්මය පිළිබඳ වෘත්තීය පුහුණුව සම්පූර්ණ කළ 4 දෙනෙකුට මෙම ආයතනයෙහි සය මාසික පුහුණුවක් ලබාදෙන ලදි.

- විවෘත විශ්ව විද්‍යාලයේ සිසුන් 4 දෙනෙක් ඔවුන්ගේ කාර්මික පුහුණුව සම්පූර්ණ කරන ලදි.

- පාසැල් සිසුන් 150 දෙනෙකු සඳහා පුහුණු පංති තුනක් පැවැත්විය.

- නිලධාරීන් බෝග සායන 5කට සම්පත් පුද්ගලයන් ලෙස සහභාගි විය.

- ගොවිපලේදී බීජ අර්තාපල් නිපදවීම සඳහා පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් 20 දෙනෙක් සහ ගොවීන් 60 දෙනෙක් පුහුණු පංති 4කින් පුහුණු කරන ලදි.

- හැටන් නැෂනල් බැංකුවෙන් සංවිධානය කරන ලද ගොවි පුහුණු වැඩසටහනකට සම්පත් පුද්ගලයන් ලෙස නිලධාරීන් සහභාගි විය.

- ගන්නොරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය මගින් සංවිධානය කරන ලද පැළෑටි ආරක්ෂණ මූලධර්ම පිළිබඳ පුහුණු වැඩසටහන යටතේ රෝග සහ පලිබෝධ කළමනාකරණය පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු කරන ලදි.

- පටක රෝපණය සහ පාංශු විද්‍යාව පිළිබඳව ගුරුවරුන් 28 දෙනෙකු පුහුණු කිරීම සඳහා පුහුණු පංතියක් සංවිධානය කරන ලදි.

- විශ්ව විද්‍යාල සිසුන් 60ක්, කෘෂිකර්ම ඩිප්ලෝමා සිසුන් 202ක්, පාසැල් සිසුන් 310ක් තාක්ෂණික විද්‍යාල සිසුන් 30ක් සහ පුහුණු ගුරුවරුන් 60ක් මෙම ආයතනයට පැමිණි අතර විවිධ විෂයන් සම්බන්ධයෙන් ඔවුන්ට පුහුණුව ලබාදුණි.

- 2010දී විශේෂ ව්‍යාපෘති සම්පූර්ණ කළ විද්‍යාවේදී උපාධි අපේක්ෂකයින් සංඛ්‍යාව 07ක් වේ.

- නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය, මධ්‍යම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කළ පැළෑටි සායන වැඩසටහන් 4කට සහභාගි විය.

- කොම්පෝස්ට් නිෂ්පාදනය සහ පොහොර යෙදීමේ ක්‍රමය පිළිබඳව ගොවීන් 50 දෙනෙකු පුහුණු කරන කරන ලදි.

- බිම්මල් නිෂ්පාදනය පිළිබඳව ගොවීන් 28 දෙනෙකු පුහුණු කරන ලදි.

2011 වසර සඳහා සැලැස්ම

පර්යේෂණ

ශෂ්‍ය විද්‍යාව

- 2010දී සහ 2011 දී ආනයන කරන ලද වාණිජ ප්‍රභේද 20 ක් ඇගයීම.

- වායු රෝපණ ක්‍රමය සඳහා නව පොහොර මිශ්‍රණයක් සංයෝග කිරීම.

- ජල රෝපිත සහ භූ රෝපිත ක්‍රම යටතේ වගා කරන විවිධ අර්තාපල් ප්‍රභේද සඳහා නව පෝෂක සංයුතියක් සකස් කිරීම.

පැළෑටි අභිජනනය

- නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්ක වලදී ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීම් යටතේ දේශීයව බිහිකළ අර්තාපල් ආර 10ක් ඇගයීම"

- හිතකර ලක්ෂණ සම්බන්ධයෙන් අන්තර් ජාතික අර්තාපල් මධ්‍යස්ථානයෙන් ලද ජනක ප්ලාස්ම ඇගයීම

- දේශීයව නිපදවූ අර්තාපල් ආරවල ක්ලෝනීය ඇගයීම.

- අන්තර්ජාතික අර්තාපල් මධ්‍යස්ථානයෙන් හඳුන්වා දෙන ලද උෂ්ණත්වයට ඔරොත්තු දෙන අර්තාපල් ප්‍රභේද ඇගයීම.

පටක රෝපණය

- ප්‍රේරිත විකෘතිකරණය මගින් බැක්ටීරියා හිටු මැරීමට ප්‍රතිරෝධී අර්තාපල් ආරක්/ආර බිහි කිරීම.

- අර්තාපල් පරාගධානි රෝපණය: අර්තාපල් පරාගධානි රෝපණය සඳහා සුදුසු මාධ්‍ය වර්ග තත්ත්ව හඳුනා ගැනීම.

- ප්‍රේරිත විකෘතිකරණය මගින් නව ලිලියම් විශේෂ බිහි කිරීම. විකෘති කරන ලද කිණක වලින් පුනර්වර්ධනය කරගත් පැළ පරීක්ෂා කර බැලීම සිදු කෙරෙනු ඇත.

කීට විද්‍යාව/වටපණු විද්‍යාව

- රසායනාගාර තත්ත්ව යටතේ කළු කියත් පණුවාගේ සමූහ බෝ කිරීම සඳහා ක්‍රමයක්.

- පත්‍ර කනින්නාගේ *Liriomyza huidobrensis* විවිධ කීට අවස්ථා හඳුනා ගැනීම සඳහා පහසු ක්‍රමයක්

- පත්‍ර කනින්නා *Liriomyza huidobrensis* ස්පිනෝසඩ් යොදා ගනිමින් රසායනිකව පාලනය කිරීම.

- අර්තාපල්වල යුෂ උරාබොන පලිබෝධ සංකීර්ණය ඩයෆෙන්තියුරොන් යොදා ගනිමින් රසායනිකව පාලනය කිරීම.

ව්‍යාධිවේදය

- රජයේ බිජ අර්තාපල් ගොවිපලවල බැක්ටීරියා හිටුමැරීමේ ආසාදනය නිරීක්ෂණය කර ඇගයීම.

- කැරට් අලය බෙදීම කෙරෙහි බලපාන ජෛව සාධක පිළිබඳ අධ්‍යයන

- බැක්ටීරියා හිටු මැරීමට දක්වන ප්‍රතිරෝධීතාව සම්බන්ධයෙන් විකෘති අර්තාපල් ජනක ප්ලාස්ම පරීක්ෂා කර බැලීම.

- අර්තාපල් පසු අංගමාරයට එරෙහිව දිලිර නාශක පරීක්ෂාකර බැලීම.

පාංශු විද්‍යාව

- කාබනික පොහොර භාවිතා කර කැරට් සහ අර්තාපල් වගාව සඳහා යොදන රසායනික පොහොර ප්‍රමාණය අඩුකර ගැනීමේ හැකියාව පිළිබඳ අධ්‍යයනය.

- බිජ අර්තාපල් නිෂ්පාදනය කිරීම සඳහා නයිට්‍රජන් කළමනාකරණය කිරීමෙන් ඇතිවන බලපෑම.

එළවළු බෝග

- කැරට් අස්වැන්නෙහි ගුණාත්මක වර්ධනයක් සඳහා යෝග්‍ය ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් ක්‍රම හඳුනාගැනීම සහ බිහි කිරීම.

- කැරට් සහ බීට් සඳහා බිජ නිෂ්පාදන තාක්ෂණ ක්‍රම බිහි කිරීම.

- විදේශීය එළවළු ඇගයීම.

පලතුරු බෝග

- ජපානයෙන් ආනයනය කරන ලද පැඟිරි ප්‍රභේදවල ක්‍රියාකාරීත්වය ඇගයීම.

- පෙයාර්ස් ප්‍රභේද ඇගයීම.

සංවර්ධන කටයුතු

ශෂ්‍ය විද්‍යාව

- ගොවීන් අතර බෙදා දීම සඳහා G_0 කුඩා ආකන්ද මිලියන 5ක් නිපදවීම.

- සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානයේ නව බිජ නිෂ්පාදන ඒකකයක් ස්ථාපනය කිරීම.

- වායු රෝපණ සහ ජල රෝපණ ක්‍රම යොදා ගනිමින් පූර්ව මූලික බීජ නිපදවීම ඉහළ නැංවීම සඳහා බීජ

- හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ ආරක්ෂිත ගෘහයක 8m x 50m ක වායු රෝපණ ඒකකය සැලසුම් කර ඉදි කිරීම.

පටක රෝපණය

- රෝග වලින් තොර නලස්ථ අර්තාපල් පැල නිෂ්පාදනය කිරීම.
- අර්තාපල් ජනක ප්ලාස්ම සංරක්ෂණය කිරීම
- චාන්ඩ්ලර් ස්ට්‍රෝබෙරි ප්‍රභේදයේ ක්ෂුද්‍ර ප්‍රවාරණය සහ ගුණනය.
- බේබිස් බ්‍රෙත්, ලිලියම් විශේෂ සහ ජර්බෙරා ක්ෂුද්‍ර ප්‍රවාරණය
- රහංගල පෙයාර්ස් වරණයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.

පාංශු විද්‍යාව

- කොම්පෝස්ට් ටොන් 60ක් නිපදවීම.
- ආදර්ශ ගම්මාන වලට කොම්පෝස්ට් නිෂ්පාදන වැඩසටහන් හඳුන්වා දීම

කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
ස්ථාන භාර පර්යේෂණ නිලධාරි	01
පර්යේෂණ නිලධාරි	04
වැඩසටහන් සහකාර	03
කෘෂිකර්ම උපදේශක	08
පර්යේෂණ සහකාර	04
පර්යේෂණ උප සහකාර	02
රාජ්‍ය කළමනාකරණ සහකාර	03
රියදුරු	02
ස්ථිර කම්කරු	21
කොන්ත්‍රාත් කම්කරු	37
එකතුව	85

2.2.7 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය - තෙලිජ්ජවිල

තෙලිජ්ජවිල කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය දකුණු පළාතේ විශේෂයෙන්ම ගාල්ල සහ මාතර දිස්ත්‍රික්කවල ක්ෂේත්‍ර ගැටළු විසඳීම සඳහා පර්යේෂණ කටයුතු ක්‍රියාත්මක කිරීමේ වගකීම දරයි. ප්‍රධාන වශයෙන්ම පලතුරු , එළවළු, මුල් සහ ආකන්ද බෝග සඳහා ශෂ්‍ය විද්‍යාව සහ පැළෑටි ආරක්ෂණය පිළිබඳව සිදු කරන පර්යේෂණ වලට අමතරව "අපි වවමු - රට නගමු", එක් ගමක් එක් බෝගයක්, කාබනික පොහොර නිෂ්පාදනය කිරීම සහ ප්‍රචලිත කිරීම, ආදර්ශ ගොවිපල ස්ථාපිත කිරීම. ගොවින් පදනම් කරගෙන බීජ නිෂ්පාදනය කිරීම (ප්‍රජා මූලික බීජ නිෂ්පාදනය) යන සංවර්ධන වැඩසටහන්ද, උෂ්ණ පලාතේ සෙවනගල ප්‍රදේශයේ කෙසෙල් වගාව ව්‍යාප්ත කිරීමේ විශේෂ ව්‍යාපෘතියක්ද ක්‍රියාත්මක කර තිබෙන මෙම ආයතනය විසින් රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම, ආදර්ශන පැවැත්වීම, තිරසාර තාක්ෂණික ක්‍රම බිහි කිරීම සහ විශේෂයෙන්ම දකුණු කලාපයේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සහ ගොවි ප්‍රජාව අතරේ තොරතුරු පතුරුවාලීම සඳහා ප්‍රමුඛත්වයක් ලබාදී ඇත.

අයවැය

2010 වසරේදී අයවැය ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 2.2.7,1 හි දැක්වේ.

වගු අංක 2.2.7.1 වාර්ෂික අයවැය - 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
මූලධන	726,124	548,786	76
පුනරාවර්තන	3,118,011	777,993	25
ව්‍යාපෘති			
• කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය	665,000	549,756	83
• අපි වවමු රට නගමු			
- කෙසෙල් ඵලදායිතාව ඉහළ නැංවීම (බෝග නායක)	1,000,000	871,274	87
• කෙසෙල් ඵලදායිතාවය ඉහළ නැංවීම (රෝපණ ද්‍රව්‍ය)	1,000,000	666,677	67
පළතුරු පැළ (අන්නාසි)	48,000	43,039	90
දේශීය ආහාර නිෂ්පාදන වැඩසටහන (කොළ එළවළු)	100,000	87,732	88
එක් බෝගයක් එක් ගමක්			
- අන්නාසි	50,000	49,145	98
- අඹ	55,000	48,835	89
- බිම්මල්	125,000	119,561	96
දැයට කිරුළ	2,085,000	2,084,229	100
එකතුව	**8,972,135**	**5,847,027**	**65**

විශේෂ ව්‍යාපෘති

"අපි වවමු රට නගමු"

කෙසෙල් ඵලදායිතාව ඉහළ නැංවීම

- හෙ. 05 ක පමණ වපසරියක් ආවරණය කරමින් කෙසෙල් වගාවේ නව තාක්ෂණික ක්‍රම පිළිබඳව ස්ථාන 18ක ආදර්ශන ස්ථාපිත කිරීම සම්පූර්ණ කරන ලදි.

- නිර්දේශිත කෙසෙල් ප්‍රභේදවල මව් වගාවන් 6ක් වයඹ, මධ්‍යම, ඌව, දකුණු සහ උතුරු මැද පලාත්වල ස්ථාපිත කර ඇති අතර වසර අවසන් වන විට ගොවින්ට රෝපණ ද්‍රව්‍ය ලබාගැනීමට හැකියාව සැලසෙනු ඇත.

- කෙසෙල් මොරෙයියන් 30,000ක් නිපදවීමේ ඉලක්කය ඉක්මවමින් සාම්ප්‍රදායික ප්‍රචාරණ ක්‍රමය යොදාගෙන මොරෙයියන් 50,000ක් පමණ නිපදවූ අතර ඉන් පැළ 25,000ක් නැගෙනහිර පළාතට ලබාදෙන ලදි.

අන්නාසිවල ඵලදායිතාව ඉහළ නැංවීම

- ඉලක්කය සාක්ෂාත් කර ගනිමින් මොරෙයියන් 8000ක් පමණ නිපදවිය.

- අඹේපුස්ස ගොවිපලට මොරෙයියන් 2500ක් පමණ ලබාදෙන ලදි.

එක් ගමක් එක් බෝගයක්

කොළ එළවළු

- ඉලක්කය ඉක්මවා මූලික රෝපණ ද්‍රව්‍ය කි.ග්‍රෑ. 100ක් පමණ නිපදවන ලදි.

බිම්මල්

- ආදර්ශ ගම්මාන දෙකක් ස්ථාපිත කරන ලදි.

අන්නාසි

- මොරෙයියන් 1200ක් පමණ ප්‍රමාණයක් නිපදවිය.

කාබනික පොහොර නිෂ්පාදනය

- පුහුණු වැඩසටහන් 15ක් සිදුකරන ලදි.

- කොම්පෝස්ට් මෙ.ටො. 58ක් නිපදවිය.

- අන්නාසි, කෙසෙල් සහ පේර සඳහා සමෝධානික පැළෑටි පෝෂක ක්‍රමය පිළිබඳ වැඩසටහන සිදු කෙරෙමින් පවති.

මොණරාගල දිස්ත්‍රික්කයේ සෙවනගල ප්‍රදේශයේ කෙසෙල් වගාව ව්‍යාප්ත කිරීම

- අක්කර 262ක කෙසෙල් ස්ථාපිත කරන ලදි.

- කෙසෙල් වගාවට යෙදීමට පිලිස්සූ දහයියා නිපදවීම සඳහා දිරිගැන්වීමක් ලෙස කුන්තානි 16ක් එක් එක් කලාප වලට ලබාදෙන ලදි.

පර්යේෂණ

අන්නාසි වගාවේ වල් පැළ පාලනය කිරීම සඳහා සුදුසු ආවරණ බෝග හඳුනා ගැනීම

වල් පැළ පාලනය කිරීමේදී පවතින දුෂ්කරතාව දකුණු කලාපයේ අන්නාසි වගාව ව්‍යාප්ත කිරීමෙහි ප්‍රධාන බාධකයක් වී ඇති බැවින් මෙයට විසඳුමක් වශයෙන් කොළ එළවළු ආවරණ බෝග වගාව වල් පැළ පාලනයෙහි කාර්යක්ෂම සහ පරිසර හිතකාමී ක්‍රමයක් බැව් හඳුනා ගන්නා ලදි. මෙම තාක්ෂණය පිළිබඳව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික සමුළු ප්‍රකාශයේ පළ කිරීමෙන් අනතුරුව ගොවි ක්ෂේත්‍රවල ක්‍රියාත්මක කරනු ඇත.

පත්‍ර අරමුණු කරගත් කෙසෙල් වගාවේ කැනේ ගුණාත්මය ඉහළ නැංවීම සඳහා තාක්ෂණික ක්‍රමයක් බිහි කිරීම

මූලික වශයෙන් පත්‍ර අරමුණු කෙරුණු කෙසෙල් වගාවේ, විශේෂයෙන්ම අහිතකර වගා තත්වයන් යටතේ, ගුණාත්මයෙන් අඩු කුඩා කැන් නිපදවන බැවින් කෙසෙල් කැනේ ගුණාත්මය ඉහළ නැංවීම සඳහා යෝග්‍ය තාක්ෂණික ක්‍රම බිහි කිරීම වැදගත් බව හඳුනා ගන්නා ලදි.

කෙසෙල් ඇවරි විහේදනය වීම සම්පූර්ණ වීමට පෙර ඇවරි 4ක් තිබියදී කෙසෙල් මුව කපා ඉවත් කරන ලදි. මෙම ප්‍රතිකර්මය මගින් කෙසෙල් කැනේ බර 19% කින් සහ මුළු ඵලදාව 18% කින් අඩුවූ නමුත් ඇවරියක මධ්‍යන්‍ය බර 55% කින් වැඩිවී ගෙඩිවල

බාහිර පෙනුම යහපත් විය. එබැවින් කෙසෙල් පත්‍ර අරමුණු - කරගත් වගාවේ කෙසෙල් ඇවරියේ ගුණාත්මය ඉහළ නැංවීම සඳහා කෙසෙල් මුව ඉවත් කිරීමේ තාක්ෂණය වඩාත් යෝග්‍ය පිළිවෙතක් බැව් හඳුනා ගැනිණි.

මෙම පර්යේෂණය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික සමුළු වාර්තාවේ පළ කෙරුණු අතර වගා කරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ගොවි ක්ෂේත්‍ර වලදී ප්‍රායෝගික ආදර්ශන සහිතව සිදු කරන ලදි.

ගුණාත්මක එලදාවක් ලබාගැනීම සඳහා අඹ ගස් කලමනාකරණය කිරීමට යෝග්‍ය පිළිවෙතක් බිහි කිරීම

ගුණාත්මක එලදාවක් ලබාගැනීම සඳහා අඹ ගස් උස අඩුකර කලමනාකරණය කිරීමේ පිළිවෙත් අත්හදා බලන ලදි. රෝපණ ඝනත්වය මීටර් 10 × මීටර් 5 කින් යුතුව අතු දෙකක් පමණක් ඉතිරි කර Y හැඩයට පුහුණු කෙරුණු බද්ධ කළ ගස්වල අංකුර වර්ධනය වීමක් පෙන්නුම් කරන ලදි. දකුණු කලාපයේ ස්ථාන 6කදී ඇගයීම් සිදුකෙරෙමින් පවතින අතර මෙම තාක්ෂණය 2011 දී තාක්ෂණය මුදාහැරීමේ කමිටුව වෙත ඉදිරිපත් කෙරෙනු ඇත.

ඔයිස්ටර් බිම්මල් වගාව සඳහා උපස්තරය සාරවත් කිරීම පිණිස භාවිතා කළ බිම්මල් උපස්තරය යොදා ගැනීමේ ශක්‍යතාව

භාවිත කළ බිම්මල් උපස්තරය සමඟ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සංයෝගය විවිධ අනුපාත වලින් සසඳන ලදි. ප්‍රතිඵල මගින් බිම්මල් වගාව සඳහා බිම්මල් උපස්තරය නැවත භාවිතා කිරීමේ හැකියාව අනාවරණය විය. ප්‍රතිඵල සනාථ කර ගැනීම සඳහා තවදුරටත් පරීක්ෂණ සිදු කෙරේ.

ගැනොඩර්මා බිම්මල් මලු වගාව සඳහා මූලික නිරීක්ෂණ

ශ්‍රී ලංකාවේ වන රක්ෂිත වලින් සොයා ගන්නා ලද එකිනෙකට වෙනස් ගැනොඩර්මා බිම්මල් විශේෂ (දම්, දුඹුරු, සහ තැඹිලි) තුනක් අධ්‍යයනය සඳහා යොදා ගනිමින් ඒවායෙහි දිලීර ජාල, අර්තාපල් ඩෙක්ස්ට්‍රෝස් ඒගාර් (PDA) මාධ්‍යයේ සහ මෝල්ට් එක්ස්ට්‍රැක්ට් ඒගාර් (MEA) මාධ්‍යයේ පටක රෝපණය කෙරිණි. දහයියා, පිප්සම් සහ සීනි එක් කරන ලද අඹ ලී කුඩු යොදාගෙන ගැනොඩර්මා බිම්මල් විශේෂ සකස් කළ අතර මෙහල වර්ධනය වීම දම් පැහැති මාදිලියේ පමණක් නිරීක්ෂණය විය. මනාව වැඩුණු බැසිඩියොකාපයක් වර්ධනය වීමට දින 22ක් ගතවේ. වන බිම්මල් සඳහා කෘත්‍රිම වගා ක්‍රමවල අඩු පාඩු සාර්ථකව සම්පූර්ණ කළ මුත් බිම්මල් නිස්සාරණයේ පෙර්ව රසායනික විශ්ලේෂණය සඳහා පහසුකම් මද බැවින් තවදුරටත් අධ්‍යයන සිදු කළ නොහැකි විය.

ප්‍රමාද වී මුදාහරින පෝෂක (DRN) සැපයූ උපස්ථරයක වගා කරන ඔයිස්ටර් බිම්මල්වල (P. ostreatus) වර්ධනය සහ එල දරීමේ රටා

ඔයිස්ටර් බිම්මල් වගාවේ උපස්ථරයට මුං පිටි වෙනුවට කැබලි කළ මුං යොදා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිර්දේශිත මිශ්‍රණය සමඟ සසඳන ලදි. මෙම ප්‍රතිකර්මය බිම්මල්වල වර්ධනය හෝ අස්වැන්න කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති නොකරන බව ප්‍රතිඵල මගින් අනාවරණය විය.

ජාතික සම්බන්ධීකරණ ප්‍රහේදීය අත්හදා බැලීම- තම්පලා

අස්වැන්න සහ පලිබෝධ හානි සම්බන්ධයෙන් රතු තම්පලා, දියපලාගොඩ, පියෝ ග්‍රීන් සහ DOA ග්‍රීන් සංසඳනය කෙරිණි. දියපලාගොඩ කුරුමිණි හානියට සහ දිලීර හානි වලට ඉහළ ප්‍රතිරෝධිතාවක් ප්‍රකට කළ මුත් රතු තම්පලා මෙම හානි වලට පාත්‍රී විය. දියපලාගොඩ ඉහළ අස්වැන්නක් ලබාදුන් අතර දිගු කාලයක් තබා ගත හැකි විය. වැඩිදුර අධ්‍යයන සිදු කෙරෙමින් පවතී.

වෙනත් සේවාවන්

- ගොවීන්, පාසැල් සිසුන් සහ රජයේ නොවන සංවිධාන සහ පෞද්ගලික ආයතනවල නියෝජිතවරුන් ඇතුළු 1200 දෙනෙකු තාක්ෂණික සහාය සහ රෝපණ ද්‍රව්‍ය ලබාගැනීම සඳහා මෙම මධ්‍යස්ථානයට පැමිණෙන ලදි.

- ගුරුවරුන්, පාසැල් සිසුන්, ගොවි කාන්තාවන්, ආයෝජකයින්, ගොවීන් සහ සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා ප්‍රායෝගික පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 17ක් සිදුකරන ලදි.

- වගකීම පැවරී තිබෙන සියළුම බෝග පිළිබඳව ගුවන් විදුලි වැඩසටහන් 7ක් සහ රූපවාහිනී වැඩසටහන් 2ක් සිදුකළ අතර පුවත් පත් ලිපි 16ක් පළ කරන ලදි.

2011 සඳහා සැලැස්ම

- කෙසෙල් , අන්නාසි, අඹ, කිරි අල, පැඟිරි, පේර, ඌන භාවිත පලතුරු බෝග, බිම්මල් සහ කොළ එළවළු සම්බන්ධයෙන් සිදුකරන පර්යේෂණ වැඩසටහන් අබණ්ඩවම සිදු කිරීම.

- හෙ. 1ක බිම් කොටසක පලතුරු බෝග වගා කිරීම

- "වැලිගම හිටු මැරීමේ" රෝගය වැළඳී තිබෙන පොල් ඉඩම් විවිධාංගීකරණය කිරීම සඳහා අන්නාසි 100,00 ක් සහ කෙසෙල් මොරෙයියන් 5000 ක් නිපදවීම.

- ආදර්ශ ගම්මාන 5ක් ස්ථාපිත කිරීම

- වැසිකිලි පද්ධතිය සහ ගරාජය ඉදිකිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම

කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
ස්ථානභාර පර්යේෂණ නිළධාරි	01
පර්යේසෂණ නිළධාරි	01
වැඩසටහන් සහකාර	03
කෘෂිකර්ම උපදේශක	06
පර්යේසෂණ සහකාර	04
පර්යේෂණ ළිප සහකාර	01
රාජ්‍ය කළමනාකරණ සහකාර	03
රියදුරු	02
මුරකරු	04
සනීපාරක්ෂක කම්කරු	01
කම්කරු	04
කම්කරු (කොන්ත්‍රාත්)	33
එකතුව	**63**

2.2.8 කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය, ගිරාඳුරුකෝට්ටේ

ගන්නෝරුව උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ පරිපාලනය යටතේ ක්‍රියාත්මක වන ගිරාඳුරුකෝට්ටේ කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන කටයුතු පිළිබඳව සහ මහවැලි "C" කලාපයේ බෝග නිෂ්පාදනයට අදාල ක්ෂේත්‍ර ගැටළු සඳහා විසඳුම් ලබාදීම සම්බන්ධයෙන් වගකීම දරයි. එළවළු, පලතුරු, මුල් සහ ආකන්ද බෝගවල ඵලදායීතාව ඉහළ නැංවීමෙහිලා පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සිදු කරන මෙම ආයතනය වෙත මෑත කාලයේදී වී පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන යටතේ වැදගත් කාර්යයන් ක්‍රියාත්මක කිරීමේ වගකීම පැවරුණු අතර පසුව එම වගකීම ආසන්න වශයෙන් හෙ. 05 ක පමණ වපසරියක අභිජනක බිත්තර වී නිෂ්පාදනය කිරීම දක්වා පුළුල් කෙරිණි.

පර්යේෂණ සහ නිෂ්පාදන වැඩසටහනට අමතරව මෙම ආයතනය නිළධාරීන්, ගොවීන්,පාසල් සිසුන් සහ වෙනත් ආයතනවල සේවකයින් සඳහා නිරන්තර පුහුණු වැඩසටහන් පවත්වමින් මහවැලි C කලාපයේ ගොවි ප්‍රජාවට සිය සේවය සපයයි.

අයවැය

2010 වසරේදී විවිධ වැය ශීර්ෂ සහ, ව්‍යාපෘති යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 2.2.8.1 හි දැක්වේ.

ප්‍රගතිය

බීජ නිෂ්පාදන වැඩසටහන

දෙමුහුම් බඩ ඉරිඟු බීජ නිෂ්පාදනය

2010 වසරේදී මහ සහ යල කන්න වලදී හෙ. 01 ක බඩ ඉරිඟු බෝගය ස්ථාපිත කර "සම්පත්" ප්‍රභේදයේ F1 බීජ කි.ග්‍රෑ. 249 ක් නිෂ්පාදනය කරන ලදී.

බිත්තර වී නිෂ්පාදනය

2010 වසරේදී Bg 300 න් සහ මෙ.ටො. 07 ක් සහ Bg 250 න් මෙ.ටො. 16.3ක් බිත්තර වී නිෂ්පාදනය කර බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට දෙන ලදී.

රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය

2010 වසරේදී නිෂ්පාදිත රෝපණ ද්‍රව්‍ය පිළිබඳව වගු අංක 2.2.8.2 හි දැක්වේ.

වගු අංක 2.2.8.1 : වාර්ෂික අයවැය – 2010)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
මූලධන	742,300	619,985	84
පුනරාවර්තන	2,388,780	1,587,302	66
ව්‍යාපෘති			
• දෙමුහුම් බඩඉරිඟු ව්‍යාපෘතිය	375,000	320,000	86
• කාබනික පොහොර නිෂ්පාදනය සහ ප්‍රවර්ධන ව්‍යාපෘතිය	951,800	572,559	60
• එළවළු පිළිබඳ ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීම	40,000	39,811	100
• එක් ගමක් එක් බෝගයක්	175,000	105,630	60
• BG 250 බිත්තර වී නිෂ්පාදනය	700,000	606,050	87
• කෙසෙල් ඵලදායීතාව ඉහළ නැංවීම	200,000	151,619	76
• පැපොල් බීජ නිෂ්පාදන වැඩසටහන (රත්න)	150,000	136,280	91
එකතුව	**5,722,887**	**4,140,057**	**72**

වගු අංක 2.2.8.2, 2010 වසරේදී නිෂ්පාදිත රෝපණ ද්‍රව්‍ය

බෝගය	ප්‍රභේදය	2010 දී නිෂ්පාදිතය
කෙසෙල්	සීනි කෙසෙල්, ඇඹුල් කෙසෙල්, කෝලි කුට්ටු ඇළු කෙසෙල් කණ්ඩුල සහ අනෙකුත් ප්‍රභේද	මොරෙයියන් 4682
පැපොල්	රත්න	බඳුන් කළ පැළ 1515
අන්නාසි	මුරුසි	බඳුන් කළ පැළ 9806
කිරි අල	ඉසුරු	පැළ 4700
මඤ්ඤාක්කා	කිරිකවඩි සහ යාපනය වරණය	කඳ කැබලි මීටර් 8700
බතල	ගන්නෝරුව සුදු, රණබිම, අමා, ධවල	කැබලි කි.ග්‍රෑ. 216
අඹ	කර්තකොලොම්බන් විලාඩ්	බඳුන් කළ පැළ 149
ඩ්‍රැගන් ෆෘට්		බඳුන් කළ පැළ 74

- කෝලිකුට්ටු, ඇඹුල්, අළු කෙසෙල් සහ සීනි කෙසෙල් වල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා හෙ. 05 ක කෙසෙල් මව් පැළ ස්ථාපිත කරන ලදී.
- රෝපණ ද්‍රව්‍ය ලෙස මොරෙයියන් 5000 ක් නිපදවීම සඳහා කෙසෙල් පැළ තවානක් හෙ. 0.5 ක ස්ථාපිත කෙරිණි.

පර්යේෂණ

පලතුරු

- දේශීය සහ හඳුන්වා දෙන ලද පැඟිරි ප්‍රභේද වල ප්‍රභේදීය ඇගයීම අබණ්ඩවම සිදු කිරීම.
  - දේශීය ප්‍රභේද – 07 (ආරෝග්‍යා, බිබිල ස්වීට්, MKD, රහංගල වරණය, HocR 25 සහ HocR 29)
  - හඳුන්වා දෙන ලද ප්‍රභේද – ජපානයෙන් ප්‍රභේද 08 ක් (NCN, HYG, OTA, NAN, OUT, YSD, SRD, KYM)
- පැපොල් සහ අන්නාසි වල වර්ධන ක්‍රියාකාරිත්වය කෙරෙහි විවිධ කාබනික සහ රසායනික පොහොර සංයෝග වලින් ඇති වන බලපෑම.

වී (ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේදීය අත්හදා බැලීම)

2010 වසරේදී මාස 03, 31/2 සහ 41/2 වයස් පංතිවල වී ප්‍රභේද පරීක්ෂාවට ලක් කෙරිණි.

එළවළු

පහත සඳහන් එළවළු සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීම් සිදු කරන ලදී.

බණ්ඩක්කා	-	ප්‍රභේද 09
එළවළු කව්පි	-	ප්‍රභේද 04
වම්බටු	-	ප්‍රභේද 05
පිපිඤ්ඤා	-	ප්‍රභේද 08
කව්පි	-	ප්‍රභේද 04

කොම්පෝස්ට් නිෂ්පාදනය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

- කොම්පෝස්ට් මෙ.ටො. 42 ක් නිෂ්පාදනය කළ අතර කි.ග්‍රෑ. 760 ක් ආමුකුලණ වශයෙන් බෙදා දෙන ලදී.

තාක්ෂණය පතුරුවාලීම

මෙම වසරේදී පහත දැක්වෙන පුහුණු වැඩසටහන් සිදු කරන ලදී.

- කොම්පෝස්ට් නිෂ්පාදනය (598 දෙනෙකු සඳහා වැඩසටහන් 03 ක්)
- ආදර්ශ ගම්මාන වැඩසටහන (10 දෙනෙකු සඳහා එක වැඩසටහනක්)

තවද, මෙම වසරේදී පාසල් සිසුන්, ගුරුවරුන්, උපාධි අපේක්ෂකයින්, පශ්චාත් උපාධි අපේක්ෂක සිසුන් සහ ගොවීන් ඇතුළු 600 කට වැඩි දෙනෙක් පුහුණු වීම්, තොරතුරු ලබා ගැනීම් සහ වෙනත් සේවාවන් ලබා ගැනීම් සඳහා ආයතනයට පැමිණෙන ලදී.

පුහුණු

- කෘෂිකර්ම උපදේශක ඒ. ඩබ්ලිව්. ඒ. සමරසිංහ මහතා තායිලන්තයේ තායිලන්ත අන්තර්ජාතික සහයෝගිතා නියෝජිතායතනයේ පැවති (2010 මැයි 03-24) "ආහාර සුරක්ෂිතභාවය සඳහා සහභාගිත්ව ප්‍රවේශ මඟින් විවිධාංගිකරණය කළ වගා පිළිබඳව පුහුණුව ලබන ලදී.

2011 වසර සඳහා සැලැස්ම

- "සම්පත්" ප්‍රභේදයේ දෙමුහුම් බඩ ඉරිඟු බීජ නිෂ්පාදනය
- තෝරාගත් එළවළු සම්බන්ධයෙන් ජාතික සම්බන්ධීකරණ ප්‍රභේදීය අත්හදා බැලීම්.
- ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම.
- කාබනික පොහොර නිෂ්පාදනය සහ ප්‍රවර්ධන වැඩසටහන
- "රත්න" පැපොල් ප්‍රභේදයේ මූලික බීජ සහ සම්මත බීජ නිෂ්පාදනය
- BG 250 ප්‍රභේදයේ බිත්තර වී නිෂ්පාදනය
- සමෝධානික පැළෑටි පෝෂණ ක්‍රම පිළිබඳ වැඩසටහන
- මුල් සහ ආකන්ද බෝග, පලතුරු සහ එළවළුවල බීජ සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
- පාසල් සිසුන් සහ ගොවීන් සඳහා ව්‍යාප්ති සහ පුහුණු වැඩසටහන්

කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
ස්ථාන හාර පර්යේෂණ නිළධාරි	01
පර්යේෂණ නිළධාරි	01
කෘෂිකර්ම උපදේශක	06
පර්යේෂණ සහකාර	02
පර්යේෂණ උප සහකාර	02
රාජ්‍ය කළමනාකරණ සහකාර	01
ට්‍රැක්ටර් ක්‍රියාකරවන්නා	01
ගබඩාකරු	01
පෙදරේරු	01
මුරකරු	03
නුපුහුණු කම්කරු (III ශ්‍රේණිය)	28
කම්කරු (කොන්ත්‍රාත්)	26
එකතුව	**73**

2.3 වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය, බතලගොඩ

වී සඳහා ඉහළ විභවයක් සහිත ප්‍රදේශ වල අස්වනු පරතරය හෙ. 1 කට ටොන් 2 – 3 ක් පමණ වන අතර මධ්‍යස්ථ හිතකර සහ අහිතකර පරිසර තත්ත්වයන්ගෙන් යුත් ප්‍රදේශ වල පවතින අස්වනු පරතරය බෙහෙවින් විශාලය. ඉහළ පොහොර සහනාධාර මෙන්ම ගොවි මට්ටමින් තාක්ෂණික දැනුම පැවතියද මෙම තත්ත්වය පැවතුණි. ගුණාත්මක බීජතර වී සහ පරිසර පද්ධතිය පාදක යෝග්‍ය ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් භාවිතය සහ පළිබෝධ, රෝග සහ වල් පැළෑටි කළමනාකරණය තවමත් ප්‍රශස්ත මට්ටමේ නොපවතී. හිතකර පරිසර පද්ධති වල ගොවීන් විසින් නිර්දේශිත තාක්ෂණය නොපිළි පැදීමට හේතුව ගොවි මට්ටමින් පවතින සමාජ ආර්ථික බාධක විය හැකිය. කෙසේ වුවද, යෝග්‍ය ප්‍රභේද වලත් අදුල තාක්ෂණයන්ගේ හිඟයත් අහිතකර පරිසර පද්ධතියෙහි අස්වනු පරතරය තවදුරටත් වර්ධනය කරන්නට ඇත.

උපරිම අස්වැන්න තවදුරටත් ඉහළ නැංවීම සඳහා හිතකර තත්ත්වයෙන් යුත් ජල සම්පාදිත වී පරිසර පද්ධතිය කෙරෙහි අඛණ්ඩ අවධානය යොමු කරමින් වර්ෂාපෝෂිත පරිසර පද්ධතියේ ඵලදායිතාව වර්ධනය කිරීමෙහිලා නව ප්‍රවේශයක් ආරම්භ කර ඇත. පිලිපීනයේ අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයේ අන්තර්ජාතික ජාන සම්පත් ජාලයේ සහයෙන් වී පර්යේෂණ ආයතනය විසින් ජලය සීමිත පරිසර සඳහා සහ ජල ගැලීම් වලට ලක්වන/ජලයෙන් යටවන තත්ත්වයන් සඳහා වී ප්‍රභේද හඳුනා ගැනීමේ කටයුතු ආරම්භ කර ඇත.

තවද, වී පැළෑටි විවිධ අපේව තත්ත්වයන් වන ජලයේ සහ උෂ්ණත්වයේ අහිතකර තත්ත්වයන්ට සහ පළිබෝධ සහ රෝග පීඩාවන්ගේ වෙනස්කම් වැනි පේව තත්ත්වයන්ට මුහුණ පෑ හැකි බැවින් වී නිෂ්පාදනය කෙරෙහි දේශගුණික විපර්යාසයෙන් ඇතිවන බලපෑම ජය ගැනීම උදෙසා දිගු කාලීන වැඩසටහන් ආරම්භ කළ යුතුය. එමෙන්ම, පාංශු පරිසරය හායනය වීම, පොහොර භාවිත කාර්යක්ෂමතාව අඩුකම සහ වල්නාශක අධික ලෙස අවශ්‍ය වීම වැනි වත්මන් සහ එළඹෙන අභියෝග වලට විසඳුම් සෙවීම විද්‍යාත්මක විමර්ශනය අවශ්‍ය කෙරෙන විෂය පථයන් කීපයකි.

අයවැය

වගු අංක 2.3.1 හි දැක්වෙන පරිදි වාර්ෂික අයවැය, විශේෂ ව්‍යාපෘති සහ විදේශ ආධාර ලද ව්‍යාපෘති මඟින් වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයට අවශ්‍ය අරමුදල් ලැබුණි.

වගු අංක 2.3.1 වාර්ෂික අයවැය - 2010 (රු:)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
මූලධන	2,319,000	2,292,640	99
පුනරාවර්තන	24,598,431	23,234,426	94
විදේශ ආධාර ලද ව්‍යාපෘති			
ශ්‍රී ලංකා - ඇ.එ.ජ්. (4)	500,000	356,870	71
ග්‍රීන් සුපර් රයිස්	1,600,000	880,366	55
ව්‍යාපෘති (දේශීය)			
කාබනික පොහොර	11,100,000	6,243,968	56
අපි වවමු රට නගමු	1,133,400	743,315	66
යටිතල පහසුකම් සංවර්ධනය	110,000,000	69,220,455	63
දෙමුහුම් වී ව්‍යාපෘතිය	4,000,000	1,830,403	46
එකතුව	**115,250,831**	**104,802,443**	**68**

ශ්‍රී ලංකාවේ වී ප්‍රභේදවල ව්‍යාප්තිය

ශ්‍රී ලංකාවේ ගොවීන් විසින් වගා කරන වී ප්‍රභේද පිළිබඳ ලැයිස්තුවේ ප්‍රමුඛ ස්ථානයේ Bg 352 අබණ්ඩවම රැඳී සිටින අතර අනතුරුව දැක්වෙනුයේ Bg 300 සහ Bg 358 යන වී ප්‍රභේදයන් වේ. (වගු අංක 2.3.2)

වගු අංක : 2.3.2: 2009/10 මහ සහ 2010 යල කන්න වලදී ශ්‍රී ලංකාවේ වී වගා කරන ලද වපසරිය, මුළු වපසරිය, මුළු වපසරියේ ප්‍රතිශතය සහ වගා කරන ලද එක් එක් වී ප්‍රභේදයේ ධාන්‍ය වර්ගය

වී ප්‍රභේදය	වර්ගය	2009/10 මහ		2010 යල		2010 වාර්ෂික	
		වපසරිය, හෙ.	%	වපසරිය, හෙ.	%	වපසරිය, හෙ.	%
		මාස 2 1/2					
Bg 250	සුදු නාඩු	1,635	0.25	1,449	0.35	3,084	0.29
උප එකතුව		1,635	0.25	1,449	0.35	3,084	0.29
		මාස 3					
Bg 300	සුදු නාඩු	109,475	16.95	58,320	13.9	167,795	15.8
At 307	සුදු නාඩු	7,467	1.2	7,146	1.7	14,614	1.4
Bg 305	සුදු නාඩු	7,736	1.2	5,932	1.4	13,669	1.3
At 303	රතු නාඩු	4,025	0.6	2,395	0.6	6,420	0.6
Bw 272-6/B	රතු නාඩු	3,034	0.5	2,084	0.5	5,118	0.5
Bg 304	සුදු නාඩු	1,237	0.2	1,200	0.3	2,438	0.2
At 308	සුදු සම්බා	985	0.6	1,252	0.3	2,237	0.2
Bg 34-8	සුදු නාඩු	598	0.09	597	0.1	1,195	0.1
Bg 301	රතු නාඩු	382	0.06	528	0.1	910	0.09
At 306	බාස්මතී වර්ගය	389	0.06	171	0.04	560	0.05
උප එකතුව		135,356	21	79,655	19	214,956	20
		මාස 3 1/2					
Bg 352	සුදු නාඩු	118,154	18.3	78,053	18.6	196,207	18.4
Bg 358	සුදු සම්බා	98,068	15.2	49,476	11.8	147,544	13.9
Bg 94-1	සුදු නාඩු	64,084	9.9	42,643	10.2	106,727	10.
At 362	රතු නාඩු	36,841	5.7	32,316	7.7	69,158	6.5
Bg 359	සුදු නාඩු	31,087	4.8	24,516	5.9	55,603	5.2
Bg 357	සුදු නාඩු	18,747	2.9	22,612	5.4	41,359	3.9
At 353	රතු නාඩු	23,240	3.6	14,682	3.5	37,921	3.6

වී ප්‍රභේදය	ධාන්‍ය වර්ගය	2009/10 මහ		2010 යල		2010 වාර්ෂික	
		වපසරිය,හෙ.%		වපසරිය, හෙ.%		වපසරිය, හෙ.%	
		මාස 3 1/2					
Bg 360	සුදු සම්බා	15,446	2.4	9,951	2.4	25,397	2.4
Ld 356	රතු සම්බා	12,840	2.0	9,827	2.3	22,667	2.1
Bg 350	රතු නාඩු	8,826	1.4	5,199	1.2	14,025	1.3
At 354	සුදු නාඩු	2,882	0.5	5,125	1.2	8,006	0.8
Bw 361	රතු නාඩු	4,567	0.7	2,516	0.6	7,082	0.7
Bw 351	රතු නාඩු	4,060	0.6	2,007	0.5	6,067	0.6
Bw 363	සුදු නාඩු	1,838	0.3	3,315	0.8	5,153	0.5
Ld 355	සුදු සම්බා	2,165	0.3	1,546	0.4	3,712	0.4
Bw 364	රතු නාඩු	1,561	0.2	1,284	0.3	2,844	0.3
Bw 267-3	සුදු නාඩු	911	0.1	1,030	0.3	1,941	0.2
Ld 365	රතු සම්බා	177	0.03	141	0.03	317	0.03
Bg 94-2	සුදු නාඩු	133	0.02	128	0.03	261	0.02
උප එකතුව		445,627	69	306,367	73	751,991	71
		මාස 4-4 1/2					
Bg 379-2	සුදු නාඩු	14,394	2.23	9,526	2.27	23,920	2.25
පොකුරු සම්බා**	සුදු සම්බා	13,317	2.06	7,645	1.82	20,962	1.97
Bg 403	සුදු නාඩු	9,569	1.48	3,891	0.93	13,461	1.26
Bg 450	සුදු සම්බා	4,321	0.67	1,262	0.30	5,584	0.52
At 402	රතු නාඩු	3,195	0.49	232	0.06	3,426	0.32
Bg 454	සුදු නාඩු	2,803	0.43	333	0.08	3,136	0.29
Bg 400-1	සුදු නාඩු	1,388	0.21	379	0.09	1,767	0.17
H-4	රතු නාඩු	1,541	0.24	188	0.04	1,729	0.16
Bg 406	රතු නාඩු	1,487	0.23	173	0.04	1,660	0.16
At 401	රතු නාඩු	311	0.05	6	<0.001	317	0.03
Bg 380	සුදු නාඩු	34	0.01	24	0.01	58	0.01
Bg 407H	සුදු නාඩු	32	<0.001	0	<0.001	32	<0.001
Bw 400	රතු නාඩු	20	<0.001	0	<0.001	20	<0.001
උප එකතුව		52,412	8	23,659	6	76,072	7

වී ප්‍රභේදය	ධාන්‍ය වර්ගය	2009/10 මහ		2010 යල		2010 වාර්ෂික	
		වපසරිය, හෙ.	%	වපසරිය, හෙ.	%	වපසරිය, හෙ.	%
		මාස 5-6					
Bg 38	සුදු සම්බා	304	0.05	41	0.01	344	0.03
Bg 745	සුදු සම්බා	142	0.02	19	<0.001	161	0.02
Bg 3-5	සුදු නාඩු	53	0.01	14	<0.001	68	0.01
Bg 407	සුදු නාඩු	35	0.01	12	<0.001	47	<0.001
උප එකතුව		534	0.08	86	0.02	620	0.06
වැඩි දියුණු කරන ලද අනෙකුත් නව ප්‍රභේද		7,232	0.12	7,171	0.03	14,403	0.08
සාම්ප්‍රදායික වී ප්‍රභේද		937	0.15	699	0.17	1,637	0.15
මුළු එකතුව		**646,037**	**100.0**	**419,244**	**100.0**	**1,065.281**	**100.0**

** වගා කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් අනුමත කර නැත.

Bg 352 මාස 3 1/2 වයස් පංතියට වර්ග කළ මුත් එම වී ප්‍රභේදය දින 100 ක් පමණ කාලයකින් පරිණත වේ. Bg 300 සහ Bg 358 යන වී ප්‍රභේද වියළි කළාපයේදී දින 96 ක සහ දින 102 ක පමණ කාලයකින් පරිණත වේ. මෙයින් ගම්‍ය වනුයේ ශ්‍රී ලංකාවේ බොහෝ වී පරිසර පද්ධති සඳහා ගොවීන් දින 100 ක පමණ කාලයකින් පරිණත වන වී ප්‍රභේද වලට වඩාත් ප්‍රිය කරන බවයි.

ප්‍රභේද වැඩි දියුණු කිරීම

වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය සහ එහි සහායක මධ්‍යස්ථානය සාම්ප්‍රදායික සහ දෙමුහුම් දිරිය මගින් වී ප්‍රභේද වැඩි දියුණු කිරීමේ කටයුතු අඛණ්ඩවම සිදු කළ අතර පෛව සාධක කෙරෙහි ප්‍රතිරෝධී පුළුල් ජාන පදනමක් සහිත ප්‍රභේද සහ නව උසස් ආර වැඩි දියුණු කිරීමෙන් සැළකිය යුතු ප්‍රතිඵල නෙලා ගන්නා ලදි. ජලයෙන් සහ ලවණතාවයෙන් ඇති වන අයහපත් බලපෑම් වලට ප්‍රතිරෝධී වී ආර වැඩිදුර පරීක්ෂණ සඳහා හඳුනා ගන්නා ලදි.

අළුතින් නිර්දේශ කරන ලද වී ප්‍රභේද

බතලගොඩ වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ අභිජනනය කරන ලද වියළි සහ සුදු තරමක් රවුම් හැඩැති වී ප්‍රභේදයක් වන Bg 366 දිවයින පුරා වගා කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් නිර්දේශ කරන ලදි. හෙ. 1 කට ටොන් 9 ක අස්වනු විභවයක් සහිත මෙම ප්‍රභේදය ගොක් මැස්සා, දුඹුරු පැළ කීඩැවා, කොළ පාළුව සහ බැක්ටීරියා පත්‍ර අංගමාරයට ප්‍රතිරෝධීවේ.

ලබුදුව වී පර්යේෂණ ස්ථානයේ අභිජනනය කරන ලද වියළි සහ අතරමැදි කලාප වලදී දින110 ක පමණ කාලයකදී පරිණත වන රතු තරමක් රවුම් හැඩැති වී ප්‍රභේදයක් වන Ld 408 දිවයින පුරා වගා කිරීම සඳහා මුදා හරින ලදී. හෙ. 1 කට ටොන් 07ක විභවයක් සහිත මෙම නව ප්‍රභේදය ගොක් මැස්සා, දුඹුරු පැළ කීඩැවා සහ කොළ පාළුවට ප්‍රතිරෝධී වේ.

සාම්ප්‍රදායික වී අභිජනන වැඩසටහන - මාස 4-4 1/2 වයස් පංතිය

මාස 4-4 1/2 වී අභිජනන වැඩසටහන මඟින් අවධානය යොමු කරන ලද්දේ පළිබෝධ සහ රෝග කෙරෙහි ප්‍රතිරෝධීතාව ඇති සහ විවිධ පාරිසරික පද්ධති වලට අනුවර්තනය විය හැකි බව එක් කරමින් ධාන්‍ය ගුණාත්මය වර්ධනය කර අස්වනු විභවය ඉහළ නැංවීම කෙරෙහිය.

2010 වසරේදී විවිධ මුහුම් සංයෝග 58 ක් සිදු කළ අතර ඇගයීම සඳහා F_1 ගහන 49 ක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදි. ඉන් තවදුරටත් වැඩි දියුණු කිරීම සඳහා F_1 ගහන 30 ක් වරණය කෙරිණි. මෙම වසරේදී ඇගයීම් සහ වරණය කිරීම සඳහා බල්ක් ගහන F_2 පරම්පරාවෙත 26 ක්, F_3 පරම්පරාවෙන් 13 ක් සහ F_4 පරම්පරාවෙන් 10 ක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කරන ලදි. කන්න දෙකේදීම වැඩිදුරටත් ඇගයීම සහ වරණය කිරීම සඳහා වැඩිදියුණු කරන ලද ගහන 30 ක ප්‍රජනිත 1035 ක් F_5 පරම්පරාවේ සිට ඉදිරියට ස්ථාපිත කරන ලදි. Bg 379 – 2 සම්මත ප්‍රභේදය ලෙස ගෙන උසස් ආර 18 ක ධාන්‍ය අස්වනු විභවය සහ ධාන්‍යවල ගුණාත්මක ලක්ෂණ

පිළිබඳව සොයා බැලීම සඳහා මූලික අස්වනු අත්හදා බැලීම් සහ ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් මගින් අගයන ලදි. එළඹෙන කන්නයේදී වැඩිදුර ඇගයීම සඳහා පහත දැක්වෙන බලාපොරොත්තු තැබිය හැකි ආර හඳුනා ගැනිණි.

වගු අංක 2.3.3: ඇගයීම සඳහා හඳුනා ගන්නා ලද බලාපොරොත්තු තැබිය හැකි ආර

ආර අංකය	පෙළපත
07 - 1597	Bg 2949- 1/06-1214
08 - 1909	IR 74052- 72- 1 -3/ Bg 380
08 - 301	IR 74052-721-1-3/ Bg 380
09 - 2641	Ld 99-12-38/ Bg 1816

Bg 403, Bg 379-2, Bg 450, Bg 454 සහ Bg 406 හි ජානමය වශයෙන් සංශුද්ධ කරන ලද අභිජනක බීජ වල අවශ්‍ය ප්‍රමාණයන් මෙන්ම ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම, ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සහ මහා පරිමාණයෙන් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සඳහා වැඩිදියුණු කරන ලද ප්‍රභේද වලින් අවශ්‍ය ප්‍රමාණයන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ ප්‍රමිතීන්ට අනුව නිපදවන ලදී.

Bg 403, Bg 379-2, Bg 450, Bg 454 සහ Bg 406 හි ජානමය වශයෙන් සංශුද්ධ කරන ලද අභිජනක බීජ වල අවශ්‍ය ප්‍රමාණයන් සහ ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම, ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සහ මහා පරිමාණයෙන් ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සඳහා වැඩිදියුණු කරන ලද ප්‍රභේද වලින් අවශ්‍ය ප්‍රමාණයන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රමිතීන්ට අනුව නිපදවිය.

සාම්ප්‍රදායික අභිජනන වැඩසටහන – 3 1/2 පංතිය

වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ අභිජනන වැඩසටහනින් ප්‍රධාන වශයෙන්ම මෙම වයස් පංතිය කෙරෙහි අවධානය යොමු කළ අතර දුඹුරු පැළ කීඩැවා, වී ගොක් මැස්සා, බැක්ටීරියා පත්‍ර අංගමාරය සහ කොළ පාළුව කෙරෙහි ප්‍රතිරෝධී ඉහළ අස්වනු ගෙන දෙන ගුණාත්මක වී ආර හඳුනා ගැනීම අබණ්ඩවම සිදු කරන ලදී.

2010 වසරේදී. මුහුම් 36 ක් සිදු කළ අතර F_1 පරම්පරා 29 ක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කෙරිණි. F_2 පරම්පරාවෙන් කලින් වියුක්ත වන ගහන 8 ක්ද, F_3 පරම්පරාවෙන් 3 ක් සහ F_4 පරම්පරාවෙන් 12 ක් හඳුනා ගත් අතර පරම්පරාව ඉදිරියට ගෙන යාම සඳහා වරණය කර ගන්නා ලදී.

Bg 357 සහ Bg 358 සම්මත ප්‍රභේද ලෙස යොදා ගනිමින් උසස් ආර 8 ක අස්වනු විභවය සහ ධාන්‍යවල ගුණාත්මක ලක්ෂණ පිළිබඳව සොයා බැලීම සඳහා මූලික අස්වනු අත්හදා බැලීම සහ ප්‍රධාන අස්වනු අත්හදා බැලීම මගින් අගයන ලදී. පරීක්ෂාවට ලක් කළ ආර අතරින් Bg 08-2398 සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම සඳහා නම් කෙරිණි.

Bg 94-1, Bg 352, Bg 357, Bg 358, Bg 359 Bg 360 සහ Bg 366 හි ජානමය වශයෙන් සහ භෞතික වශයෙන් සංශුද්ධ කරන ලද අභිජනක බීජ වල අවශ්‍ය ප්‍රමාණයන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රමිතීන්ට අනුව නිපදවන ලදී.

සාම්ප්‍රදායික අභිජනන වැඩසටහන – මාස 3 වයස් පංතිය

වර්ධන කාල සීමාව දින 10-15 කින් පමණ අඩු වුවද මෙම කාණ්ඩයේ ප්‍රභේද වලද අස්වැන්න මාස 3 1/2 වයස් පංති හා සංසන්දනාත්මක ධාන්‍ය අස්වැන්නක් වාර්තා කරයි. එබැවින් වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ අභිජනන වැඩසටහනින් දෙවනුව ප්‍රමුඛත්වය ලබා දෙනුයේ දුඹුරු පැළ කීඩැවා වී ගොක් මැස්සා, බැක්ටීරියා පත්‍ර අංගමාරය සහ කොළ පාළුව කෙරෙහි කල් පවත්නා ඔරොත්තු දීමේ හැකියාවැති ඉහළ අස්වනු ගෙන දෙන මනා ගුණාත්මයෙන් යුත් මෙම වයස් පංතියේ වී ආර හඳුනා ගැනීම සඳහායි.

අභිජනන ගහන වැඩිදියුණු කිරීම

අස්වනු විභවය ඉහළ නැංවීම, ප්‍රධාන පළිබෝධ (දුඹුරු පැළ කීඩැවා, ගොක් මැස්සා) සහ රෝග (කොළ පාළුව, බැක්ටීරියා පත්‍ර අංගමාරය) කෙරෙහි ප්‍රතිරෝධය එක් කිරීම, ධාන්‍ය ගුණාත්මය ඉහළ නැංවීම සහ විවිධ පරිසරයන්ට ඔරොත්තු දීමේ හැකියාව එක් කිරීම පරමාර්ථ කරගෙන මුහුම් 56 ක් බිහි කරන ලදී. බිහි කළ මුහුම් 56 න් F_1 ගහන 54 ක් ක්ෂේත්‍රයේ ස්ථාපිත කළ අතර පරම්පරාව ඉදිරියට ගෙන යාම සඳහා ගහන 22 ක් වරණය කර ගන්නා ලදී. බල්ක් ගහන 28 ක් ස්ථාපිත කළ අතර මුහුම් 22 ක් වරණය කර ගන්නා ලදී. F_5 පරම්පරාවේ සිට ඉදිරියට ප්‍රජනිත 836 ක් පළිබෝධ සහ රෝග කෙරෙහි දක්වන ප්‍රතිරෝධීතාව සහ ධාන්‍ය අස්වැන්න සම්බන්ධයෙන් අගයන ලදී.

සම්මත ප්‍රභේදය වූ Bg 09-1888, Bg 07-2947, Bg 09-1871, Bg 07-1412, Bg 07-2787, Bg 09-1851 සහ Bg 09-1873 හඳුනා ගැනිණි. බහු ස්ථානීය ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සඳහා Bg 06-985, Bg 02-465, 06-2270, At 405 (රතු), Bg 360 BC 4, 06-2112, Bg 304, Bg 305, 07-2828,07-1950 හි ජානමය වශයෙන් සංශුද්ධ කරන ලද බීජ ද්‍රව්‍ය නිපදවීමත් සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහන සඳහා Bg 06-985 සහ Bg 02-465 නම් කිරීමත් සිදු කෙරිණි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රමිතීන්ට අනුකූලව Bg 300 හි ජානමය වශයෙන් සංශුද්ධ කරන ලද අභිජනක බීජ වල අවශ්‍ය ප්‍රමාණයක් නිපදවිය.

සාම්ප්‍රදායික අභිජනක වැඩසටහන – මාස 2 ½ වයස් පංතිය

දුඹුරු පැළ කීඩැවා, ගොක් මැස්සා, බැක්ටීරියා පත්‍ර අංගමාරය, වී කොළ පාළුව සහ පැළ මැක්කා කෙරෙහි බහුවිධ ප්‍රතිරෝධීතාව සහිතව ධාන්‍ය අස්වනු විභවය ඉහළ නැංවීමේ පරමාර්ථයෙන් වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයෙහි ඉතා කෙටි වයස ප්‍රභේද බිහි කිරීමේ වැඩසටහන අඛණ්ඩවම සිදු කරන ලදි. ජාන සංචිතය පුළුල් කිරීම සඳහා ජාන්‍යන්තර වී පර්යේෂණ ආයතනයෙන් හඳුන්වාදෙන ලද වී එකතුන් 20 ක් ඇගයීමට ලක් කරන ලදුව මාපිය ආර ලෙස එකතුන් 4 ක් වරණය කෙරිණි.බල්ක් ගහන 10 ක් සහ ප්‍රජනිත 233 ක් තවදුරටත් වැඩිදියුණු කෙරිණි. Bg 250 සහ At 308 සම්මත ප්‍රභේද ලෙස යොදා ගනිමින් කෙටි රටුම් ධාන්‍ය (සුදු නිවුඩු 2 ක් සහ රතු නිවුඩු 2 ක්) වලින් සමන්විත ආර 4 ක මූලික අස්වනු අත්හදා බැලීම් සිදු කෙරිණි.

අන්තර් ජාතික වී පර්යේෂණ ආයතනයෙන් හඳුන්වා දෙන ලද එකතුන් 4 ක්, ග්‍රීන් සුපර් රයිස් ව්‍යාපෘතියේ එකතුන් 03 ක් සහ සාම්ප්‍රදායික වගා ප්‍රභේද 3 ක් (සූදුරු සම්බා, හැත්තෑපස්දා වී, හැටදා වී) මාස 2 1/2 අභිජනක වැඩසටහන සඳහා මාපියන් ලෙස යොදා ගැනිණි.

බීජ සහතික කිරීමේ සේවයේ ප්‍රමිතීන්ට අනුකූලව Bg 250 හි බීජ නිපදවිය.

විකෘතිකරණය මඟින් සාම්ප්‍රදායික ප්‍රභේද වැඩිදියුණු කිරීම

මෙම ව්‍යාපෘතියේ පරමාර්ථය වනුයේ විකෘති තාක්ෂණික ක්‍රම සහ වරණය කිරීම තුළින් සාම්ප්‍රදායික වගා ප්‍රභේද සූදුරු සම්බා සහ සුවඳ සම්බා වල ඇද වැටීමට ප්‍රතිරෝධී වූත් ආහාරයට ගැනීම සඳහා මනා ගුණාත්මයෙන් යුතු වූත් ප්‍රභේද බිහි කිරීමයි. වැඩිදියුණු කරන ලද ආර වූ සුවඳ සම්බා 25 ක්, සූදුරු සම්බා 08 ක් සහ සූදුරු සම්බා 26 ක් සංශුද්ධ කර සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේදී වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා ගුණනය කරන ලදී.

වල් වී (ඔ. නිවාරා) සමඟ ඔ. සැටයිවා වල දුරස්ථ ඥාතීත්වයක් සහිත විශේෂ දෙමුහුම්කරණය කිරීම පිළිබඳ අධ්‍යයන

දුඹුරු පැළ කීඩැවාට ප්‍රතිරෝධී ජානය ඔ. නිවාරා (WR AC 04) වෙතින් Bg 380ට එක් කිරීමේ වැඩසටහන අඛණ්ඩවම සිදු කරන ලදී. ඔ. නිවාරා පසුබිමකින් වරණය කෙරුණු දුඹුරු පැළ කීඩැවාට ප්‍රතිරෝධී වැඩිදියුණු කරන ලද ආර 06ක් යොදා ගනිමින් මූලික අස්වනු අත්හදා බැලීම සිදු කෙරිණි.

ජනක ප්ලාස්ම ගුණනය කිරීම, ලක්ෂණීකරණය කිරීම සහ සංරක්ෂණය කිරීම අඛණ්ඩවම සිදු කිරීම

සාම්ප්‍රදායික වගා ප්‍රභේද, හඳුන්වාදීම් සහ වාඩිදියුණු කරන ලද ආර ඇතුළු වී එකතුන් 1500ක් වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ කෙටි කාලීන සංරක්ෂණ ඒකකයෙහි සංරක්ෂණය කෙරිණි. 2010 වසරේදී එකතුන් 1140ක් ගුණනය කළ අතර ගොවීන් කීප දෙනෙකු, පාසැල් සිසුන්, රජයේ නොවන සංවිධාන සහ උනන්දුවක් දක්වන වෙනත් කණ්ඩායම් සඳහා අවශ්‍ය බීජ නියැදි ලබා දෙන ලදී.

"මාවී" අභිජනක බීජ නිෂ්පාදනය කිරීම

දිගු කාලීන වයස් පංතියේ පළාත් බිත්තර වී වැඩසටහනේ ඌණපූරණය සඳහා එම වයස් කාණ්ඩයට අයත් Bg 38,Bg 745, Bg 3-5 සහ Bg 407 හි අභිජනක බීජ නිපදවන ලදී.

දෙමුහුම් වී

කලින් පරිණත වන මාස 3 1/2 වී ආර අවශ්‍ය වී වගා කරන බොහෝ පරිසර පද්ධති සඳහා බලාපොරොත්තු තැබිය හැකි ලක්ෂණ සමඟ හෙ. 1 කට ටොන් 10 ක පමණ අස්වනු විභවයක් සහිත ඉහළ අස්වනු ගෙන දෙන මාස 3 1/2 Bg HR – 8 බිහි කරන ලදී. බීජ නිෂ්පාදන වැඩසටහන ක්‍රියාත්මක කෙරෙමින් පවති.

කලින් පරිණත වන නව දෙමුහුම් සංයෝග 10 ක් බිහි කළ අතර ඉහළ ධාන්‍ය අස්වනු සහ අනෙකුත් හිතකර ලක්ෂණ සහිත සංයෝග 4 ක් වැඩිදුර පරීක්ෂණ සඳහා හඳුනා ගැනිණි.

නව ප්‍රකෘතිකාරක 3 ක් (6 R, 7 R සහ 8 R) සහ 45 % ක බහීර් මුහුම් ප්‍රතිශතයකින් යුත් එක් නව සෛල ප්ලාස්මීය පුං වන්ද්‍ය ආරක් වන Bg CMS 5 A බිහි කරන ලදි. ඉහළ මට්ටමේ දෙමුහුම් දිරියකින් යුත් නව දෙමුහුම් සංයෝග බිහිකිරීම සඳහා මෙම මාපිය ආර යොදා ගනු ඇත.

ඉන්දීය දෙමුහුම් සංයෝග 8 ක අනුවර්තනය වීමේ හැකියාව සහ අස්වනු ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් දේශීය දෙමුහුම් සමඟ අගයන ලදි. CRH 501 ප්‍රභේදය දේශීය දෙමුහුම් හා සමාන ක්‍රියාකාරීත්වයක් පෙන්නුම් කරන ලදි. ග්‍රීන් සුපර් රයිස් ව්‍යාපෘතිය හරහා අනුවර්තනය වීමේ හැකියාව හඳුනා ගැනීම සඳහා ලද දෙමුහුම් සංයෝග 35 ක් ඇගයීමට ලක් කළ අතර ගොවි ක්ෂෙත්‍ර වලදී තව දුරටත් පරීක්ෂා කර බැලීම සඳහා දින 100 – 105 කාලයකින් පරිණත වන GSRH 0156, GSRHO161 සහ GSRH0113 යන ආර වරණය කෙරිණි.

ගොවීන් අතර දෙමුහුම් වී ප්‍රචලිත කිරීම සඳහා ව්‍යාප්ති සහ පුහුණු මධ්‍යස්ථානයේ සහයෙන් “දෙමුහුම් වී සරුකෙත යාය වැඩසටහන” දියත් කරන ලදි. Bg 407 හි F1 බීජ කි.ග්‍රෑ. 200 ක් නිපදවා ගොවීන් අතර බෙදා හරින ලදි. තවද Bg 407 H හි සෛල ප්ලාස්මීය පුං වන්ද්‍ය ආරක් වන Bg CMS 1A හි කි.ග්‍රෑ.365 ක් Bg CMS 4A හි කි.ග්‍රෑ. 25 ක් නිපදවිය.

F1 සහ CMS වල බීජ අස්වැන්න ඉහළ නැංවීම සඳහා වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය සහ මාකඳුර කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මඟින් සිදු කරන ලද අධ්‍යයන වලින් Bg 407 H හි F1 සහ CMS වල බීජ හට ගැනීම සඳහා හෙ. 1 කට කි. ග්‍රෑ. 75 ක අනුපාතයෙන් GA3 යෙදූ විට අස්වැන්න කෙරෙහි සැලකිය යුතු ධනාත්මක බලපෑමක් ඇති කරන බැව් අනාවරණය විය.

2010 යල කන්නයේදී වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය සහ කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය මඟින් සිදු කළ අත්හදා බැලීමකදී Bg 407 H හි F1 බීජ අස්වැන්න කෙරෙහි GA3 යෙදීමෙන් අනතුරුව පත්‍රයක් කපා ඉවත් කළ විට සැලකිය යුතු ධනාත්මක බලපෑමක් ඇති වන බැව් අනාවරණය විය. පත්‍රයක් කපා ඉවත් කිරීමෙන් පමණක් වුවද F1 බීජ අස්වැන්න කෙරෙහි සැලකිය යුතු ධනාත්මක බලපෑමක් ඇති විය. මල් හටගන්නා මුල් කාලයේදී ගිබ්බරලික් ඇසිඩ් යොදනවාට වඩා මල් හට ගන්නා අවධියේදී 5-10% ක ප්‍රමාණයක් යෙදීම වඩාත් ප්‍රතිඵලදායක බැව් සොයා ගැනිණි.

රෝග කළමනාකරණය

ධාන්‍ය අවපැහැ ගැන්වීමට ප්‍රතිරෝධී ප්‍රභේද

සංකීර්ණ දිලීර විශේෂ (Bipolaris oryzae, Curvularia sp., Magnaporthe grisea., Sarocladium oryzae, Phoma sp., Alternaria sp., Microdochium sp., Nigrospora sp., and Fusarium sp.) හේතුවෙන් වී වල ඇති වන ධාන්‍ය අව පැහැ ගැන්වීම ශ්‍රී ලංකාවේ වර්ධනය වෙමින් පවතින වැදගත් ක්ෂේත්‍ර ගැටළුවක් බවට පත්ව ඇත. මෙම තත්ත්වය ධාන්‍ය ගුණාත්මය, ප්‍රරෝහණ ප්‍රතිශතය සහ බීජ බර අඩු කරයි. වගා කරන ලද වී ප්‍රභේද 19 ක් ධාන්‍ය අව පැහැ වීම කෙරෙහි දක්වන ප්‍රතිචාරයත් ධාන්‍ය අවපැහැ ගැන්වීමට වඩාත් වගකිව යුතු පොදු ව්‍යාධිජනකත් සම්බන්ධයෙන් අධ්‍යයනය කරන ලදී. තෝරා ගන්නා ලද ප්‍රභේද වල අව පැහැ ගැනුණු බීජ වලින් PDA සහ බ්ලොටර් ක්‍රමය මඟින් දිලීරය වෙන්කර ගැනිණි. At 307, Bw 361, Bw 267-3, B357 සහ At 353 හි ධාන්‍ය අවපැහැ ගැන්වීම සැලකිය යුතු පහළ මට්ටමක විය. කර්වියුලේරියා විශේෂය, ෆියුසාරියම් විශේෂය, සාරොක්ලැඩියම් ඔරයිසේ, ඕල්ටනේරියා විශේෂය සහ බයිපොලාරිස් ඔරයිසේ වැනි දිලීර වෙන් කර ගන්නා ලදී. කෙසේ වුවද, ඉහත ප්‍රභේදවල ධාන්‍ය අවපැහැ වීම කෙරෙහි වගකිව යුතු වඩාත් පොදු ව්‍යාධිජනක ලෙස කර්වියුලේරියා විශේෂය, ෆියුසාරියම් විශේෂය සහ සාරොක්ලැඩියම් ඔරයිසේ යන දිලීර අනාවරණය කර ගැනිණි.

වී කොළ පාළුව කෙරෙහි දක්වන ප්‍රතිරෝධීතාව පිළිබඳව සොයා බැලීම

මැග්නපෝර්තේ ග්‍රිසියා (Magnaporthe grisea) මඟින් සිදුවන වී කොළ පාළුව වී වගාවේ විනාශකාරී දිලීර රෝගයකි. මෙය බෝගයේ සෑම අවධියකදීම සියළුම වායව කොටස් වලට හානි කරන අතර සැලකිය යුතු අස්වනු හානියක් සිදු කරයි. මෙම රෝගයට එරෙහිව 2010 යල කන්නයේදී ප්‍රවේශ 1697ක් සහ 2009/2010 මහ කන්නයේදී ප්‍රවේශ 1414ක් පරීක්ෂා කර බලන ලදී. පරීක්ෂාවට ලක් කරන ලද එම ආර අතරින් වී කොළ පාළුවට මුළුමනින්ම ප්‍රතිරෝධී සහ මධ්‍යස්ථ ප්‍රතිරෝධී ප්‍රවේශ 1015 ක් 2009/2010 මහ කන්නයේදී සහ 1094 ක් 2010 යල කන්නයේදී අනාවරණය කර ගැනිණි.

බැක්ටීරියා අංගමාරයට දක්වන ප්‍රතිරෝධීතාව සම්බන්ධයෙන් සොයා බැලීම

සැන්තොමොනාස් කැම්පෙස්ට්‍රිස් (Xanthomonas compestries pv oryzae) මඟින් සිදුවන බැක්ටීරියා පත්‍ර අංගමාරය ශ්‍රී ලංකාවේ වී වගාවට ආර්ථික වශයෙන් හානි කරන එකම බැක්ටීරියා රෝගයයි. තවම මෙම රෝගය රසායනිකව පාලනය කිරීම සාර්ථක වී නැත. බැක්ටීරියා පත්‍ර අංගමාරයට ප්‍රතිරෝධී වී වර්ග අභිජනනය කිරීම වඩාත් පිරිමැසුම්දායක, කාර්යක්ෂම සහ පරිසර හිතකාමී විකල්පයකි. සියළුම අස්වනු අත්හදා බැලීම් සහ සම්බන්ධීකරණය කරන ලද වී ප්‍රභේද අත්හදා බැලීම් වලින් ලබා ගත් වී ආර ඇතුළුව 2009/2010 මහ කන්නයේදී වී ආර 106 ක් සහ 2010 යල කන්නයේදී වී ආර 90 ක් බැක්ටීරියා පත්‍ර අංගමාරයට එරෙහිව පරීක්ෂා කර බලන ලදී. පරීක්ෂාවට ලක් කරන ලද ආර අතරින් 2009/2010 මහ කන්නයේදී ආර 16 ක් සහ 2010 යල කන්නයේදී ආර 15 ක් සම්පූර්ණයෙන්ම ප්‍රතිරෝධී සහ මධ්‍යස්ථ ප්‍රතිරෝධී ලෙස වර්ග කෙරිණි.

වී කොපු අංගමාරය පාලනය කිරීම සඳහා දිලීරනාශක

රයිසොක්ටෝනියා සොලනි (Rhizoctonia solani) මඟින් ඇති කරන කොපු අංගමාරය දිවයින පුරා බහුලව වාර්තා වන රෝගයකි. කොපු අංගමාරය සඳහා ජානමය ප්‍රතිරෝධීතාවයක් නොමැති අතර එය පාලනය කළ යුත්තේ නිසි ශස්‍ය කළමනාකරණය සහ දිලීරනාශක යොදා ගනිමින් සමෝධානිකවය. කාර්යක්ෂම සමෝධානික රෝග පාලන පියවරක් සඳහා ආරක්ෂිත සංයෝගයකින් යුත් දිලරනාශක වඩාත් යෝග්‍ය වේ. වී කොපු අංගමාරය සඳහා දැනටමත් හෙක්සකොනොසෝල් තෙලෝද්‍ද සාන්ද්‍රණ සංයෝගය නිර්දේශ කර තිබුණද තෙලෝද්‍ද සාන්දුණ සංයෝගයට වඩා ද්‍රාව්‍ය සාන්ද්‍රණ සංයෝග ආරක්ෂිතය. 2010 යල කන්නයේදී සිදු කළ නියමු පරීමාණයේ දිලීරනාශක පරීක්ෂයේදී හෙක්සකොනොසෝල් 5% SC (එම්සෝල් මි.ලී. 20/ලී.10) හෙක්කොනොසෝල් 5% EC (ඉරේසර මි.ලී 20/ ලී.10) සමඟ සමාන කළ හැකි බව අනාවරණය විය. ඒ අනුව හෙක්සකොනොසෝල් 5% (ඉරේසර) වෙනුවට හෙක්සකොනොසෝල් 5% SC (එම්සෝල් මි.ලී 20/ලී.10) යොදා ගත හැකි බව ගම්‍ය වේ.

වී කොළ පාළුව කෙරෙහි ඔලිගොචිටොසන් මඟින් ඇතිවන බලපෑම අධ්‍යයනය කිරීම.

ඔලිගොචිටොසන් (ප්‍රවිකරණය කරන ලද චිටෝසන්) සතුව ප්‍රතික්ෂදු ජීවී ක්‍රියාකාරිත්වය සහ වර්ධනය ප්‍රවර්ධනය කිරීමේ ක්‍රියාකාරිත්වය පවතින අතර ඉතා හොඳ ජල අවශෝෂකයක්ද වේ. වී කොළ පාළුව පාලනය කිරීමෙහි මෙමගින් ඇති කරන බලපෑම සම්බන්ධයෙන් අධ්‍යයනය කළෙමු. මෙය ඉසීමෙන් රෝගයෙහි සතුටුදායක පාලනයක් නොවීය.

පළිබෝධ කළමනාකරණය

ප්‍රධාන පළිබෝධ වලට දක්වන ප්‍රතිරෝධීතාව පිළිබඳ පරීක්ෂා කර බැලීම

පළිබෝධ පාලනය කිරීමෙහි වඩාත්ම වාසිදායක සහ පරිසර හිතකාමී ක්‍රමය වන්නේ පළිබෝධ කෙරෙහි ප්‍රතිරෝධී ප්‍රභේද වගා කිරීමයි, දුඹුරු පැළ කීඩැවා (Nilaparvata lugens) (BPH) සහ හොක් මැස්සා (orseolia oryzae) (GM) ශ්‍රී ලංකාවේ වී වගාවේ සිටින උග්‍ර පළිබෝධයන්ය. එබැවින් ශ්‍රී ලංකාවේ වගා කිරීම සඳහා මුදා හරින කවර වී ප්‍රභේදයක් වුවද දුඹුරු පැළ කීඩැවා සහ ගොක් මැස්සා කෙරෙහි ප්‍රතිරෝධීතාව සහිත විය යුතුය.

වී දුඹුරු පැළ කීඩැවා කෙරෙහි දක්වන ප්‍රතිරෝධීතාව

වැඩිදියුණු කරන ලද ප්‍රජනිත, අස්වනු අත්හදා බැලීම්, ඉන්පර්, සම්බන්ධීකරණය කරන ලද වී ප්‍රභේද අත්හදා බැලීම් සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් වලින් හඳුනා ගන්නා ලද ප්‍රවේශ 1453 ක් 2009/2010 මහ කන්නයේදී සහ 1824 ක් 2010 යල කන්නයේදී දුඹුරු පැළ කීඩැවාට එරෙහිව පරීක්ෂා කරන ලදුව ප්‍රතිරෝධී හෝ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී ප්‍රවේශ 922 ක් 2009/10 මහ කන්නයේදී සහ ප්‍රවේශ 889 ක් 2010 යල කන්නයේදී හඳුනා ගැනිණි.

වී ගොක් මැස්සා කෙරෙහි ප්‍රතිරෝධීතාව

වැඩිදියුණු කරන ලද ප්‍රජනිත, අස්වනු අත්හදා බැලීම්, සම්බන්ධීකරණය කරන ලද වී ප්‍රභේද අත්හදා බැලීම් සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් වලින් ලබා ගන්නා ලද ප්‍රවේශ 1453 ක් 2009/2010 මහ කන්නයේදී සහ ප්‍රවේශ 1824 ක් යල කන්නයේදී ගොක් මැස්සාට එරෙහිව පරීක්ෂා කර බලන ලදුව ප්‍රතිරෝධී හෝ මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී ප්‍රවේශ 922 ක් 2009/10 මහ කන්නයේදී සහ ප්‍රවේශ 889 ක් 2010 යල කන්නයේදී හඳුනා ගැනිණි.

ගොයම් පත්‍ර හකුළුවන්නා සඳහා වූ නව කෘමිනාශකය

උග්‍ර වශයෙන් ආසාදනය වූ විට ධාන්‍ය අස්වැන්න 20% කින් පමණ අඩු කරන ගොයමේ පත්‍ර හකුළුවන්නා (Cnaphalocrosis medimalis) වර්ධක

සහ ප්‍රජනන අවධි වලදී ගොයමට හානි කරන හානිදායක පළිබෝධකයෙකි. මෙම පළිබෝධයට ප්‍රතිරෝධී ආරක්/ප්‍රභේදයක් තවමත් හඳුනා ගෙන නැති අතර පාලනය කළ යුත්තේ වගා පිළිවෙත් මඟින් සහ ශෂ්‍ය විද්‍යාත්මක සහ රසායනික ක්‍රම අනුසාරයෙනි. මෙම පළිබෝධය පාලනය කිරීමෙහි විවිධ අයුරින් ක්‍රියා කරන එහෙත් ස්වාභාවික සතුරන්ට සහ පරිසරයට අවම හානියකින් යුත් නව කෘමිනාශකයක් හඳුනා ගැනීමේ අවශ්‍යතාවය පැන නැඟි ඇත.

ඇසිෆේට් 97 DF (හෙ. 1 කට ග්‍රෑම් 460) ගොයමේ පත්‍ර හකුළුවන්නා පාලනය කිරීමෙහි කාර්යක්ෂම වුවද එමඟින් ස්වාභාවික සතුරන් කෙරෙහි ඇතිවන අහිතකර බලපෑම් හේතුවෙන් භාවිතය සඳහා නිර්දේශ කළ නොහැකිය.

ගොයම් පළිබෝධ වලට එරෙහිව පෙව විද්‍යාත්මක නිෂ්පාදන පරීක්ෂා කර බැලීම

දුඹුරු පැළ කීඩැවා සහ පැළ මැක්කා වී වගාවේ උග්‍ර පළිබෝධ වේ. මෙම පළිබෝධ පාලනය කිරීම සඳහා රසායනික පළිබෝධනාශක තිබෙන මුත් දුඹුරු පැළ කීඩැවා සහ පැළ මැක්කා පාලනය කිරීම සඳහා ඔලිගොචිටොසන් මෙන් බයෝ එලිසයිට බලපෑමකින් යුතුව ක්‍රියා කළ හැකි පරිසර හිතකාමී පෙව විද්‍යාත්මක නිෂ්පාදන හඳුනා ගැනීම බෙහෙවින්ම වැදගත් වේ. ඔලිගොචිටොසන් ප්‍රතිකර්මය යෙදූ ගොයම් පැළ දුඹුරු පැළ කීඩැවා සහ පැළ මැක්කා ආසාදනය වීම සම්බන්ධයෙන් අගයන ලදි. මිලියනයකට කොටස් 50 ක් සාන්ද්‍රණයකින් යුතුව ඔලිගොචිටොසන් ප්‍රතිකර්මය යෙදූ ගොයමේ පැළ මැක්කා සහ දුඹුරු පැළ කීඩැවා පාලනය සතුටුදායක මට්ටමක පැවතුණි.

වල් පැළෑටි කළමනාකරණය

මඩට වපුරන වී සඳහා ජාතික සම්බන්ධීකරණ පැළෑටිනාශක

වියළි, අතරමැදි සහ තෙත් කලාපවල ස්ථාන 5 ක ජාතික සම්බන්ධීකරණ පැළෑටිනාශක පරීක්ෂා කර බැලීමේ වැඩසටහන් සිදු කළ අතර නව පැළනාශක 6 ක වල් පැළෑටි පාලන කාර්යක්ෂමතාව තහවුරු කර ගැනීම සඳහා නිර්දේශිත පැළෑටි නාශක 2 ක් සමග පරීක්ෂාවට ලක් කෙරිණි. පැළෑටි නාශක අතරින් ෆෙනොක්සප්‍රොප් -පී- එතිල් 69/1 EC සහ මෙටාම්ෆොප් 10% EC යන තෘණ නාශක දෙක සහ බිස්පයිරිබැක් සෝඩියම් 20% WP, ඔක්සිඩයසෝන් EC සහ බෙන්ටසෝන් 48% SL යන තෘණ, පුළුල් පත්‍ර සහ පන් වර්ග නසන පැළෑටි නාශක තුන නියමු පරිමාණයේ අත්හදා බැලීමේ වැඩසටහන යටතේ වැඩිදුර පරීක්ෂා කර බැලීම සඳහා තෝරා ගැනිණි.

වල් පැළෑටි සහ වී අස්වනු කෙරෙහි ශූන්‍ය බිම් සැකසුම් ක්‍රමය මඟින් ඇති වන දිගු කාලීන බලපෑම

තිරසාර වී වගා ක්‍රමයේදී වගා පිරිවැය අඩු කර ගැනීම සඳහා බිම සකස් කිරීමේ තීව්‍රතාවය අඩු කිරීමේ ප්‍රවණතාවයක් පවතී. ගොවිතැනේදී පැළවල මූල මණ්ඩල කලාපයේ පාංශු තත්ත්වය වඩාත් යහපත්ව පවත්වා ගැනීමටත් වල් පැළ වලක්වාලීම සඳහා බිම සකස් කිරීම වඩාත් යෝග්‍ය වේ. වල් ඉවත් කරන ලද තත්ත්වය යටතේ කන්න තුනකදීම ධාන්‍ය අස්වනු කෙරෙහි බිම සකස් කිරීමේ ක්‍රමයෙන් සැලකිය යුතු බලපෑමක් ඇති නොවූ මුත් පිළිවෙළින් 4 වන සහ 5 වන කන්න වලදී ධාන්‍ය අස්වැන්නෙහි 10% කින් සහ 18% කින් අඩු වීමක් වාර්තා විය. 6 වන වසරේදී වල් ප්‍රජාව කෙරෙහි කන්නමය බලපෑමක් ඇති විය. පූර්ව පැළෑටිනාශක යොදා ශූන්‍ය බිම් සකස් කිරීමේ ක්‍රමයේදී බහු වාර්ෂික වල් බීජ තැන්පතු ප්‍රමාණය සහ වාර්ෂික වල් පැළෑටි, විශේෂයෙන්ම, පුළුල් පත්‍ර වල් පැළ සහ පන් වර්ග අඩු විය.

වගා කරන වී සතු වල් මර්දන හැකියාව

තිරසාර වී වගාව සඳහා වී ප්‍රභේද සතු වල් මර්දන හැකියාව වැදගත් යැයි සැළකේ. ඉහත ලක්ෂණය සම්බන්ධයෙන් At 362, Ld 356 සහ At 353 පරීක්ෂාවට ලක් කළ අතර At 362, Ld 356 සහ At 353 වගා කළ කුඹුරුවල පැතිර තිබූ වල් පැළ ප්‍රමාණය අඩු මට්ටමක පැවති අතර At 362, Bg 357, Bg 358, Bg 359 සහ ඊට 360 යන ප්‍රභේද ගෙන දෙන අස්වැන්නට වඩා (හෙ.1 කට ටොන් 0.5 ක් පමණ) සැලකිය යුතු ඉහළ ධාන්‍ය අස්වැන්නක් (හෙ. 1 කට ටොන් 2 ක් පමණ) වාර්තා කරන ලදි.

කුරුණෑගල දිස්ත්‍රික්කයේ මානපහ යාය ප්‍රදේශයේ වල් වී

එකිනෙකට වෙනස් වල් වී වර්ග 10 ක ධාන්‍ය ලක්ෂණයන්හි විශාල වශයෙන් රූපවිද්‍යාත්මක වෙනස්කම් පවතින බැව් සිදු කළ නිරීක්ෂණ වලින් අනාවරණය විය. ධාන්‍ය ඇටය අතරමැදි විශාලත්වයෙන් යුතු වීම, සරුතුෂය සහ අවතුෂය ලා කහ පැහැයෙන් යුතු වීම, භ්‍රෑණ පෝෂය සුදු වීම සහ නන්ඩුව රහිත වීම වල් වී වල වඩාත් පොදුලක්ෂණයන්ය. වල් වී හේතුවෙන් මානපහ යාය ප්‍රදේශයේ වී අස්වැන්න බොහෝ සෙයින් අඩු වී තිබුණි.

ශ්‍රී ලංකාවේ වල් වී වල රූපවිද්‍යාත්මක විවිධත්වය

2004 සිට 2009 දක්වා කාලය තුළදී රූපවිද්‍යාත්මකව විවිධ වූ වල් වී ප්‍රවේශ 2,500 ක් පමණ විවිධ වී පාරිසරික පද්ධති වලින් අහඹු ලෙස එක් රැස් කර ගැනිණි. කරලේ සහ ධාන්‍ය ලක්ෂණ අනුව වල් වී කාණ්ඩ 112 කට වර්ග කෙරේ. වරණය කර ගත් වල් වී ලක්ෂණීකරණය කිරීම සඳහා ප්‍රතිවලිත තුනකින් බඳුන්වල රෝපණය කළ අතර රූපවිද්‍යාත්මකව වෙනස්කම් වලින් යුත් ප්‍රවේශ 1300 ක් පමණ හඳුනා ගැනිණි. ඉන් 90% ක පමණ උස සෙ.මී. 90-165 ක් පමණ වූ අතර හට ගන්නා කරල් ප්‍රමාණය 6-21 ක් පමණ විය. ධජ පත්‍රයේ දිග සෙ.මී. 24-68 ක් පමණ පරාසයේ පැවති අතර පත්‍ර කෝණය සෘජුව පවතින තත්ත්වයේ සිට නමා වැටෙන පරාසය දක්වා පැවතුණි.

වල් වී කළමනාකරණය කිරීම

කුඹුරු වල හට ගන්නා වල් වී පාලනය කිරීම සඳහා වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය මඟින් බිහි කරන ලද තාක්ෂණික පිළිවෙත් මාලාව ව්‍යාප්ති නිළධාරීන්ගේ සහ ගොවීන්ගේ සහභාගිත්වයෙන් යුතුව ක්‍රියාත්මක කළ අතර වල් වී පාලනය කිරීමේ කාර්යක්ෂම ක්‍රම ආදර්ශනය කරන ලදී.

පාංශු විද්‍යාව

පුත්තලම සහ පොළොන්නරුව දිස්ත්‍රික්ක වල ලවණතාවයට ඔරොත්තු දෙන නව වී ප්‍රභේද දෙකක් ලවණතාවය සහිත කුඹුරු වලදී අනුවර්තනය වීමට ඇති හැකියාව සම්බන්ධයෙන් පරීක්ෂාවට ලක් කළ අතර ජලාපවහන ඇල මාර්ගය පිරිසිදු කිරීම, කාබනික පොහොර යෙදීම, මල් හට ගන්නා අවධිය දක්වා සෙ.මී. 2 ක මට්ටමට ජලය රඳවා තබා ගැනීම යනාදී පිළිවෙත් මාලාවක් යොදා ගනිමින් පුනරුත්ථාපනය කෙරිණි. වැඩිදියුණු කරන ලද පාංශු තත්ත්ව වලදී ලවණතාවයට පාත්‍රී ප්‍රභේදයක් වන Bg 352 හෙ. 1 කට ටොන් 4 ක අස්වැන්නක් ගෙන දුන් අතර ලවණතාවයට ප්‍රතිරෝධී නව ආර වන Bg 11-139 සහ Bg 5-110 හෙ. 1 කට ටොන් 07 ක අස්වනු වාර්තා කරන ලදී.

විවිධ වයස් කාණ්ඩ වලට අයත් නිර්දේශිත වී ප්‍රභේද 20 ක් වසර 30 ක කාලයක් ජල සම්පාදනය කිරීම හැරෙන්නට කිසිදු පොහොරක් හෝ පිදුරු යෙදීමක් නොකරන ලද බිම් කොටසක පරීක්ෂා කර බලන ලදී. මෙම බිම් කොටස් වල අන්තර්ගත පාංශු ෆොස්ෆරස්, පොටෑසියම්, සින්ක් සහ කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය පිළිවෙළින් 2.5 mg/kg, 25 mg/kg, 0.3 mg/kg සහ 1% ක් විය. එම තත්ත්වය යටතේ Bg 352, Bg 358, Bg 305, At 353, At 354, At 462, මුරුන්ගකායන් සහ සුදු හීනටි යන වී ප්‍රභේද හෙ. 1 කට ටොන් 2.5 සිට 3 දක්වා අස්වනු වාර්තා කරන ලදී.

සෑම කන්නයකදීම ෆොස්ෆරස් පොහොර යෙදූ සහ කන්න 4 ක් පුරා ෆොස්ෆරස් නොයෙදූ බිම් කොටස් සමඟ කන්නයක් හැර කන්නයක් ෆොස්ෆරස් යෙදූ බිම් කොටස් වල පාංශු ෆොස්ෆරස් මට්ටම් සසඳා බලන ලදී. පසට ෆොස්ෆරස් එක් නොකළ තත්ත්වයේදී පාංශු ෆොස්ෆරස් මට්ටම් කි.ග්‍රෑ. 1 කට මි.ග්‍රෑ. 10 සිට මි.ග්‍රෑ. 3.5 දක්වා අඩු වූ අතර කන්නයක් හැර සහ සෑම කන්නයකදීම ෆොස්ෆරස් යෙදූ බිම් කොටස් වල පාංශු ෆොස්ෆරස් මට්ටම් පිළිවෙළින් කි.ග්‍රෑ. 1 කට මි.ග්‍රෑ. 7 ක් සහ මි.ග්‍රෑ. 8 ක් විය. කන්න හතරක් අවසානයේ පාංශු ෆොස්ෆරස් වල වෙනස්කම් පැවතියද කන්න හතරේදීම ෆොස්ෆරස් පොහොර යෙදීමෙන් හෝ නොයෙදීමෙන් ධාන්‍ය අස්වැන්නෙහි සැලකිය යුතු වෙනසක් ඇති නොවීය. වී සඳහා පසෙහි අවධි ඔල්සෝන් ෆොස්ෆරස් මට්ටම කි.ග්‍රෑ. 1 කට මි.ග්‍රෑ. 10 ක් යැයි අදහස් කරන ලද මට්ටමට වඩා බෙහෙවින් අඩු විය හැකි බැව් ගම්‍ය වේ.

පසෙහි අන්තර්ගත පොටෑසියම් ප්‍රමාණය ක්ෂය නොවන අයුරින් ප්‍රශස්ත වී අස්වනු ලබා ගැනීම සඳහා පොටෑසියම් යෙදීමේ වඩාත් යෝග්‍ය අනුපාතය පිළිබඳ අධ්‍යයනය කරන ලදී. පළමු සී සෑමෙන් සති 4 ක් ගත වන තුරු පාංශු පොටෑසියම් මට්ටම වර්ධනය වී තිබුණු අතර සති 4 න් පසුව පිදුරු හෝ පොටෑසියම් පොහොර යෙදුව මුත් අඩු වූ බැව් අනාවරණය විය. කන්නයකදී වී බෝගයෙන් ලබා ගන්නා පොටෑසියම් ප්‍රමාණය හෙ. 1 කට කි.ග්‍රෑ. 100 ක් විය. අධ්‍යයනය සිදු කළ පළමු කන්නයේදී පොටෑසියම් යෙදූ විට වී බෝගයෙන් ප්‍රතිචාරයක් නොතිබූ අතර ගෙන දුන් ධාන්‍ය අස්වැන්න හෙ. 1 කට ටොන් 5 ක් විය.

නයිට්‍රජන් පොහොර කෙරෙහි Bg 14-360, Bg 997, Bg 1350 යන උසස් අභිජනක ආර මඟින් දක්වන ප්‍රතිචාර පිළිබඳව Bg 379-2 යොදා ගනිමින් පරීක්ෂා කර බලන ලදී. Bg 14-360 සහ Bg 1350 යන අභිජනක ආර Bg 379-2 හා සමාන ප්‍රතිචාරයක් දැක් වූ අතර Bg 997 නයිට්‍රජන් අඩු කන්න වලදී වඩාත් සාර්ථක ප්‍රතිචාරයක් දැක්වීය.

ධාන්‍ය අස්වැන්න කෙරෙහි බලපෑමක් ඇති නොවන සේ පොහොර පිරිමසා ගැනීම පිළිබඳව ප්‍රමාණ කිරීම සඳහා කාබනික පොහොර එකතු කර නයිට්‍රජන් පොහොර අවශ්‍යතාවය පිළිබඳව අධ්‍යයනය කරන ලදී. කාබනික පොහොර එක් කළ විට පාංශු සාරවත්භාවය, රසායනික පොහොර වල

කාර්යක්ෂමතාවය සහ ධාන්‍ය අස්වැන්න සැලකිය යුතු අයුරින් වර්ධනය විය. කාබනික පොහොර ප්‍රමාණවත් ප්‍රමාණයන්ගෙන් එක් කිරීමෙන් වී ධාන්‍ය අස්වැන්නට බලපෑමක් ඇති නොවන සේ 25% කින් නයිට්‍රජන් පොහොර අවශ්‍යතාවය අඩු කළ හැකි විය. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ අඹන්ගඟ සහ කාලිංග ඇළ යන ප්‍රදේශවල පාංශු සාරවත්භාවය කෙරෙහි පවතින සීමාකාරී සාධක සහ ඒවා ජය ගැනීම සඳහා අවශ්‍ය කරන කළමනාකරණ විකල්පයන් පිළිබඳව අධ්‍යයනය කරන ලදී. එක දිගට කන්න 4 කදී ඉලක්ක කරන ලද අස්වැන්න පාදකව සින්ක්, කාබනික පොහොර සහ රසායනික පොහොර යෙදූ විට හෙ. 1 කට ටොන් 4 සිට ටොන් 8 දක්වා වී අස්වැන්න වර්ධනය විය. පද්ධතියේ පහළ කොටසේ EC, PH, කැල්සියම්, මැග්නීසියම් සහ සෝඩියම් ඉහළ මට්ටම් වලින් පැවතීම ප්‍රධාන සීමාකාරී සාධක විය. ජලාපවහන ඇළ පද්ධති පිරිසිදු කළ විට PH, EC, කැල්සියම්, මැග්නීසියම් සහ සෝඩියම් සාන්ද්‍රණයන් අඩු වූ අතර ඒ හේතුවෙන් එම කුඹුරු වල ඵලදායිතාව වර්ධනය විය. ලවණතාවයට ඔරොත්තු දෙන වී ප්‍රභේද හඳුන්වා දීමෙන් ලවණතාවය සහිත කුඹුරු වලින් හෙ. 1 කට ටොන් 4 සිට 7 දක්වා අස්වනු මට්ටම වැඩි කිරීමට ඉවහල් වේ.

ජල කළමනාකරණ සහ භූගෝලීය තොරතුරු ක්‍රමය

ජල සම්පාදිත වී වගාවේ ජල තුලනය

පොළොන්නරුව සහ අඹන්ගඟ යන ප්‍රදේශවල ජල සම්පාදිත කුඹුරුවල ජල සන්තුලිතතාව සම්බන්ධයෙන් වාෂ්පීකරණ උත්ස්වේදනය (ET), කාන්දුවීම (S), වැස්සීම (P), ගලායාම (RO), වර්ෂාව (RF), සහ ඇතුළට කාන්දු වීම (I) යනාදිය යොදා ගනිමින් ජල භාවිතය සහ ජල ව්‍යාප්තිය පිළිබඳ නිරීක්ෂණය කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී. සකස් කරන ලද සිතියම්වල ප්‍රතිඵල අනුව බිම සකස් කිරීමේදී ජලය ඉවතට ගලා යාමෙන් සැලකිය යුතු ජල ප්‍රමාණයක් (50%) අපතේ යන බැව් අනාවරණය විය. දින 10ක කාල පරතරයකින් යුතුව සකස් කරන ලද ජල සම්පාදන ක්‍රමය විශේෂයන්ම වී බෝගයේ ප්‍රජනක අවධියේ ජල අවශ්‍යතාව සමඟ නොගැලපුණි. පසෙහි වැලි සහිත ස්භාවය (75% වැලි) හේතුවෙන් වැස්සීමෙන් සහ කාන්දු වීමෙන් සිදු වන අපතේ යාම ඉහළ විය. එක් වටමාරුවකින් සපයන ලද ජල ප්‍රමාණය පහළ කෙළවරේ පිහිටා තිබෙන කුඹුරු සඳහා ප්‍රමාණවත් නොවන බැව් සිතියම් මගින් අනාවරණය විය.

Bg 359 වී ප්‍රභේදයේ ධාන්‍ය අස්වැන්න කෙරෙහි ජලයෙන් ඇති වන බලපෑම පිළිබඳව තෙතමන තත්ත්ව තුනකදී විවිධ පොහොර ප්‍රතිකර්ම සමඟ නයිට්‍රජන්, ෆොස්ෆරස් පොටෑසියම්, නයිට්‍රජන් ෆොස්ෆරස් පොටෑසියම් + පිදුරු, නයිට්‍රජන් ෆොස්ෆරස් + පිදුරු, නයිට්‍රජන් සහ ෆොස්ෆරස් පමණක් අධ්‍යයනය කරන ලදි. අහිතකර ජල තත්ත්වයකින් තොරවූ පළමු සහ දෙවන කන්න වලදී ධාන්‍ය අස්වැන්නෙහි සැලකිය යුතු වෙනසක් නොවීය. කෙසේ වුවද, අහිතකර ජල තත්ත්ව යටතේ නයිට්‍රජන්, ෆොස්ෆරස් සහ පොටෑසියම් (හෙ. 1 කට ටොන් 5.8) සහ නයිට්‍රජන් සහ ෆොස්ෆරස් පමණක් (හෙ. 1 කට ටොන් 4.3) යොදා ලද අස්වැන්නට වඩා සැලකිය යුතු ඉහළ අස්වැන්නක් (හෙ. 1 කට ටොන් 6.9) යෙදූ කුඹුරු වලින් ගෙන දුණි.

ශාෂ්‍ය විද්‍යාව

ජලය සීමිත පරිසර සඳහා ප්‍රභේද තෝරා ගැනීම

වර්ෂාපෝෂිත සහ ජල සම්පාදිත බොහෝ පරිසර පද්ධතිවල වී වගා කිරීම සඳහා ජලය හිඟ සම්පතක් බවට පත් වෙමින් පවතී. යල සහ මහ කන්න වලදී වී වගා කළ ඉඩම් වපසරිය අතර පවතින වෙනසත් වගා කළ සහ අස්වනු නෙලාගත් වපසරියේ වෙනසත් බොහෝ විට ඇති වනුයේ පවතින ජල ප්‍රමාණය පහළ අනුපාතයකින් යුතු වීම හේතුවෙනි. එබැවින් ජලය සීමිත පරිසර පද්ධති සඳහා යෝග්‍ය වී ආර වරණය කර ගැනීමේ වැඩසටහන අඛණ්ඩවම සිදු කරන ලදි. අර්ධ ස්වායු සහ වියළි පරිසර තත්ත්ව යටතේ වී ජාන ඇගයීම සඳහා වන අන්තර්ජාතික ජාලය (INGER) සහ ග්‍රීන් සුපර් රයිස් (GSR) හරහා අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් ලද වී ආර සහ දේශීය ජනක ජලාස්ම ඇගයීමට ලක් කෙරෙණි. ඉන්පසු ස්වායු පැළ තවාන හරහා 2009 දී ලද වී ආර 31 සහ 2010දී ලද වී ආර 38 අතරින් පිළිවෙළින් වී 15ක් සහ ආර 12 ක් වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා තෝරා ගැනිණි. ග්‍රීන් සුපර් රයිස් වැඩසටහන හරහා නියඟයට ඔරොත්තු දෙන ආර 95 ක් ලද අතර ඉන් 17 ක් ඊළඟ කන්නය දක්වා ඉදිරියට ගෙන එන ලදි. 2009/10 මහ, 2010 යල සහ 2010/11 මහ කන්න වලදී මෙම වී ආර වල ක්‍රියාකාරීත්වය මත ස්වායු සහ වියළි පරිසර යටතේ අස්වනු ඇගයීම සඳහා වී ආර තෝරා ගැනේ.

කලින් තෝරා ගත් CNI 9024 සහ CNI 9028 නැමැති නියඟයට ඔරොත්තු දෙන ආර දෙක ඒවායෙහි අනුවර්තනය වීමේ හැකියාව සම්බන්ධයෙන් සහ ගොවින් විසින් පිළිගත හැකි තත්ත්වයන් පිළිබඳව අතරමැදි කලාපයේ ගොවි ක්ෂේත්‍ර වලදී පරීක්ෂාවට ලක් කෙරිණි.

ප්‍රවිකිරණය කරන ලද ඔලිගොවිටොසන් භාවිතය

ශ්‍රී ලංකා පරමාණු බලශක්ති අධිකාරිය විසින් ග්‍රෝත් එල්සයිටර එකක් ලෙස හඳුනා ගන්නා ලද ප්‍රවිකිරණය කරන ලද ඔලිගෝ විටොසන් වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේදී ක්ෂේත්‍ර පරීක්ෂාවට ලක් කරන ලදි. පරීක්ෂා කර බලන ලද සම්මිශ්‍රණ අතරින් ඔලිගොවියොසන් 1, මිලියනයකට කොටස් 300 බැගින් සහ ඔලිගොවිටොසන් 3; මිලියනකට කොටස් 500 බැගින් බීම සකස් කිරීමේදී, මල් හට ගන්නා විටදී සහ මහ බණ්ඩි ඇති වන අවස්ථා වලදී යෙදූ විට ප්‍රතිකර්මයක් නොකළ වී වගාව මඟින් ගෙන දෙන ධාන්‍ය අස්වැන්නට වඩා සැලකිය යුතු අස්වැන්නක් ගෙන දුන් අතර ගොයම් ඛොළ වල අන්තර්ගත නයිට්‍රජන් ප්‍රමාණයද ඉහළ නැංවිය.

මල් හට ගන්නා අවධියේදී වියනේ උෂ්ණත්වය

අවධි මට්ටමට වැඩියෙන් හෝ අඩුවෙන් වායු ගෝලීය උෂ්ණත්වය ඉහළ යාම හෝ පහළ යාම හේතුවෙන් ධාන්‍ය වන්ද්‍යතාව ඇති විය හැකිය. දෙන ලද කාල පරාසයකදී උෂ්ණත්වය සහ ආර්ද්‍රතාව ස්වයංක්‍රීයව සටහන් කර ගන්නා "මින්සර්" නැමැති උපකරණය යොදා ගනිමින් මහ බණ්ඩි ඇති වන අවස්ථාවේ සිට කායික පරිණතභාවයට පත් වන තුරු වියනේ උෂ්ණත්වය සහ ආර්ද්‍රතාව අධ්‍යයනය කරන ලදී. ගොයමේ වියන තුළ උෂ්ණත්වය සෙ. $1\text{-}2^0$ දක්වා පැවති අතර එය බාහිර වායු ගෝලීය උෂ්ණත්වයට වඩා අඩු වූවකි. වියනට පහළින් වී කරල පිහිටි විට සහ ධජ පත්‍රය වී කරලට සෙවන ලබා දෙමින්/ආවරණය කරමින් තිබෙන විට සූර්ය විකිරණයේ සෘජු බලපෑම අවම කළ හැකි බවත් ශුෂ්කකාව තාපනය වීම වැලකිය හැකි බවත් මින් ගම්‍ය වේ. එබැවින් මල් පිපෙන කාලයේදී ඉහළ වායු ගෝලීය උෂ්ණත්වයෙන් ඇති වන අයහපත් බලපෑම් අවම කළ හැකිය.

වී කරලේ පිහිටීම කෙටි කළ විට ඇද වැටීමට ඔරොත්තු දීමද ඉහළ නංවයි. එබැවින්, මෙම වියන් නිර්මාණ සැලසුම කාලගුණ විපර්යාසයෙන් ඇති වන බලපෑම් ජය ගැනීම සඳහා මෙන්ම යන්ත්‍රාණුසාරීව අස්වනු නෙලීම සඳහා ඇද නොවැටෙන වී ප්‍රභේද බිහි කිරීම සඳහා හඳුන්වා දිය හැකිය.

බෝග වර්ධන ආදර්ශය සප්‍රමාණකරණය

බෝග ආදර්ශ ORYZA 2000 සහ DSATA 4.5 සප්‍රමාණකරණය කිරීම සඳහා ධීවනි විචාරී සහ කායික දත්ත එක්රැස් කරීම ආරම්භ කෙරිණි. මූලික නිරීක්ෂණ වලින් ආදර්ශ පුරෝකථනය සමඟ ධීවනි විචාරී නිරීක්ෂණ ගැලපීම් වඩාත් නිරවද්‍යතාවයක් පෙන්නුම් කරන ලදි.

ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද පරීක්ෂා කිරීමේ වැඩසටහන (NCRVT)

2010 වසරේදී ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද පරීක්ෂා කිරීමේ වැඩසටහන මාස 3, 3 1/2 සහ මාස 4 න් පරිණත වන වී ප්‍රභේද යොදා ගනිමින් අබණ්ඩවම සිදු කරන ලදි. මාස 3 නව වී ආර 3 ක්, මාස 3 1/2 නව ආර 6 ක් සහ මාස 4 නව ආර 4 ක් සම්මත පරීක්ෂණ ප්‍රභේද සමග ස්ථාන 8 කදී 2009 යල කන්නයේදී සහ 2009/2010 මහ කන්නයේදී පූර්ණ පර්යේෂක කළමනාකරණ තත්ත්ව යටතේ පරීක්ෂාවට ලක් කරන ලදි.

ප්‍රභේද අනුවර්තන වැඩසටහන (VAT)

මාස 03 සහ 3 1/2 වයස් පංති වල ප්‍රභේද අනුවර්තන වැඩසටහන වියළි, අතරමැදි සහ තෙත් කලාපවල ස්ථාන 75 කදී සිදු කළ අතර සම්බා සහ සම්බා නොවන වී ප්‍රභේද වල විවිධ වයස් පංති වලට අයත් නව උසස් ආර 5 ක්ද පරීක්ෂාවට ලක් කරන ලදී. තවද, මාස 03 වයස් පංතියේ ආර 2 ක් සහ මාස 3 1/2 වයස් පංතියේ ආර 03 ක් සම්මත පරීක්ෂණ ප්‍රභේද සමඟ 2009/2010 මහ කන්නයේදී සහ 2009 යල කන්නයේදී පරීක්ෂාකර බලන ලදී. පරීක්ෂාවට ලක් කරන ලද ආර අතර At6-486 (මාස 03 සුදු සම්බා), At 06-650 (මාස 3 1/2 රතු සම්බා) සහ Ld 3-6-12 (මාස 3 1/2 සුදු සම්බා) සම්මත පරීක්ෂණ ප්‍රභේද වලට වඩා උසස් තත්ත්වයේ පැවති අතර එම ආර මහා පරිමාණයේ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන සඳහා නම් කරන ලදී.

At 07-800 – මාස 03 ආර, අතරමැදි ගෝලාකාර ධාන්‍ය සහිතයි.

At 06 - 631 – මාස 3 1/2 ආර, සූදුරු සම්බා වැනි ඉතා කුඩා ධාන්‍ය සහිතයි.

BW 05 – 1621- මාස 3 1/2 ආර, යකඩ විෂමතාවට ඔරොත්තු දේ.

මහා පරිමාණයේ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන (LSVAT)

At 632 (මාස 3 1/2 රතු සම්බා), Bg 3171 (මාස 3 1/2, සුදු, සම්බා නොවන – අතරමැදි ගෝලාකාර), BW 4- 992 (මාස 3 1/2 සුදු සම්බා), Ld 3-12-50 (මාස 3 1/2 රතු සම්බා), Bg 2-465 (මාස 3, සුදු, සම්බා නොවන, අතරමැදි ගෝලාකාර) සහ At 6-676 (මාස 3, සම්බා නොවන – අතරමැදි ගෝලාකාර) යන නව උසස් ආර 6 2010 වසරේදී ගොවීන් විසින් පිළිගැනීමේ හැකියාව සම්බන්ධයෙන් විශාල ගොවි ක්ෂේත්‍ර වලදී පරීක්ෂා කර බලන ලදී. At 632, Bg 3171 සහ BW 4-992 කෙරෙහි බලාපොරොත්තු තැබිය හැකි බැව් අනාවරණය විය. කෙසේ වුවද, මැතකදී මුදා හරින ලද ප්‍රභේද වන බැවින් තවමත් ගොවීන් අතර ජනප්‍රිය වෙමින් පවතී. මෙම වී ප්‍රභේද වල කුඩා බීජ පැකට් ගොවීන් අතර බෙදා හැර තවදුරටත් ප්‍රචලිත කිරීමටත් ජාතික වශයෙන් මුදා හැරීමට පෙර ගොවීන්ගේ ප්‍රතිචාර ලබා ගැනීමටත් තීරණය කෙරිණි.

බීජ නිෂ්පාදනය

නිර්දේශිත ප්‍රභේද වල මාස 2 1/2, 3, 3 1/2, 4, 4 1/2 යන සියළුම පරිණත පංති වල අභිජනක බීජ සහ සැලසුම් කළ පරිදි දිගු කාලීන "මාවී" වැඩසටහන සඳහා මාස 5-6 ප්‍රභා අවධි සංවේදී අත්තිවාරම් බීජ නිෂ්පාදනය කිරීම අබණ්ඩවම සිදු කරන ලදී.

වගු අංක 2.3.4: 2009/ 2010 මහ සහ 2010 යල කන්නයේදී අභිජනක බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)

ප්‍රභේදය/ පරිණත වන කාලය	අභිජනක බීජ (කි.ග්‍රෑ.)	
	2009/ 10 මහ	2010 යල
දින 150- 180 (ප්‍රභා අවධි සංවේදී)		
Bg 3-5	20 (අත්තිවාරම්)	වගා නොකරන ලදී (ප්‍රභා අවධි සංවේදී)
Bg 745	20	- එම -
Bg 38	20	- එම -
මාස 4		
Bg 379 – 2	20	100
Bg 450	20	50
Bg 403	20	20
Bg 454	20	20
Bg 406	01	40
මාස 3 1/2		
Bg 94 - 1	100	80
Bg 352	180	180
Bg 357	20	20
Bg 358	200	220 (අත්තිවාරම්)
Bg 359	120	160
Bg 360	20	40
Bg 366	-	20
මාස 3		
Bg 300	160	240
Bg 304	20	120
Bg 305	20 (අත්තිවාරම්)	-
දින 80		
Bg 250	40	40

වී පිළිබඳ ජාතික සම්මේලනය 2010

වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය දස වසරකට වරක් පවත්වනු ලබන වී පිළිබඳ ජාතික සම්මේලනය සංවිධානය කරමින් එහි මෙහෙවර පිළිබඳව නැවත සලකා බලන ලදී. 2010 දෙසැම්බර් 2 සහ 3 යන දිනයන්හි පවත්වන ලද මෙම සම්මේලනයට ගරු කෘෂිකර්ම ඇමතිතුමා, කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙහි චීන ජන රජයේ, ඉන්දියාවේ සහ පිලිපීනයේ විද්‍යාඥයින් සහ 300 කට අධික ශ්‍රී ලාංකීය ප්‍රතිපත්ති සැලසුම්කරුවන්, විද්‍යාඥයින් සහ රජයේ සහ පෞද්ගලික අංශයේ නිළධාරීන් පැමිණෙන ලදී. "ගන්නෝරුව ප්‍රකාශනය" මඟින් සකස් කරන ලද ඉලක්ක 2010 වසරේදී සම්පූර්ණයෙන්ම සාර්ථක කර ගත් බව අනාවරණය විය. ප්‍රතිපත්ති, පර්යේෂණ සහ සංවර්ධන කටයුතු වල ප්‍රගතිය පිළිබඳව සාරාංශ කර දැක්වීමට සහ වී අංශය සඳහා ඉදිරි ක්‍රමෝපායන් සකස් කිරීම සඳහා සමාලෝචන පත්‍රිකා 39 ක් සහ පෝස්ටර් 38 ක් 2010 වී පිළිබඳ ජාතික සම්මේලනයේදී ඉදිරිපත් කෙරිණි.

තාක්ෂණය ව්‍යාප්ත කිරීම

පුහුණු මධ්‍යස්ථානය විධිමත්ව ආරම්භ කිරීමත් සමඟම අද්‍යාල පර්ශ්වකරුවන් වෙත ප්‍රත්‍යක්ෂ ශිල්පීය ක්‍රම ව්‍යාප්ත කිරීම අඛණ්ඩවම සිදු කෙරිණි. 2010 වසරේදී ක්ෂේත්‍ර ව්‍යාප්ති කාර්ය මණ්ඩලය, ගොවීන්, කෘෂිකර්ම ගුරුවරු, විශ්වවිද්‍යාල සිසුන් සහ පාසල් සිසුන් 4898 කට අධික ප්‍රමාණයකට පූර්ණ දින පුහුණු වැඩසටහන් 141 ක් පැවැත්විය. මීට අමතරව, නිළධාරීන් 346 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පර්යේෂණ-ව්‍යාප්ති සංවාද 12 ක්, පාසැල් ගුරු පුහුණු වැඩසටහන් 9 ක්, ගොවි නියෝජන පුහුණු වැඩසටහන් 19 ක් සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ති කාර්ය මණ්ඩලය සහ අනෙකුත් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් කන්නමය රැස්වීම් කීපයක් පැවැත්විය. එමෙන්ම, විශ්වවිද්‍යාල සිසුන් සහ තාක්ෂණික විද්‍යාල සිසුන් 20 කට වැඩි දෙනෙකුට ඔවුන්ගේ උපාධි සහ ඩිප්ලෝමා පාඨමාලා සම්පූර්ණ කර ගැනීම සඳහා මාස 3 සිට මාස 6 දිගු කාලීන පුහුණු වැඩසටහන් පැවැත්විය. වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ආදර්ශනය කිරීම සඳහා ගරු කෘෂිකර්ම ඇමතිතුමා, අනෙකුත් අද්‍යාල නිළධාරීන් සහ ගොවීන්ගේ සහභාගිත්වයෙන් 2010 යල කන්නයේදී ක්ෂේත්‍ර දිනයක් පවත්වන ලදී.

වී පර්යේෂණ ආයතනය, අම්බලන්තොට

අම්බලන්තොට වී පර්යේෂණ ආයතනයේ පරමාර්ථ වනුයේ පිළිගත හැකි ධාන්‍ය ගුණාත්මයෙන් යුතු පළිබෝධ සහ රෝග වලට ප්‍රතිරෝධී රතු ඵලාවරණයකින් යුත් නව වී ප්‍රභේද, ලවණතාවයට ඔරොත්තු දෙන වී ප්‍රභේද සහ ඉහළ අස්වනු ගෙන දෙන කෙටි කාලීන වී ප්‍රභේද බිහි කිරීම සහ කලාපයේ ක්ෂේත්‍ර ගැටළු නිරාකරණය කිරීම සඳහා ආශ්‍රිත ශිල්ප ක්‍රම බිහි කිරීමයි.

ප්‍රභේද වැඩිදියුණු කිරීම

ඉහත පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා 2010 වසරේදී මුහුම් 80 ක් පමණ බිහි කෙරිණි. බල්ක් ගහන 116 ක් ඇගයීමට ලක් කළ අතර වැඩිදුර පරීක්ෂා කිරීම සඳහා 97 ක් වරණය කර ගන්නා ලදී. F_5 පරම්පරාවේ සිට ඉදිරියට වැඩිදියුණු කරන ලද ප්‍රජනිත 1564 ක් ස්ථාපිත කර ප්‍රජනිත ලෙස සහ අස්වනු අත්හදා බැලීම් වලදී තවදුරටත් ඇගයීම සඳහා 238 ක් වරණය කෙරිණි. පූර්ව අස්වනු අත්හදා බැලීමෙන් (PYT) ආර 47 ක් පරීක්ෂා කළ අතර ආර 23 ක් ප්‍රධාන අස්වනු අත්හදා බැලීම් (MYT) මඟින් පරීක්ෂා කිරීම සඳහා තෝරා ගැනිණි.

මහා පරිමාණයේ ප්‍රභේද අනුවර්තන වැඩසටහන මඟින් වැඩිදුර ඇගයීම සඳහා ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමෙන් බලාපොරොත්තු තැබිය හැකි නව ආරක් වන At 06-650 වරණය කර ගන්නා ලදී. ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමෙන් වැඩිදුර ඇගයීම සඳහා ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමෙන් At 07-800 සහ At 06-631 නැමැති අළුතින් බිහි කළ ආර දෙක වරණය කෙරිණි.

2010 සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහන සඳහා At 08-413, At 08-593, At 08-617, At 08-648, At 09-854, At 09-861 සහ At 09-1078 නැමැති මාස 3 සිට 3 1/2 ක කාලයකින් පරිණත වන බලාපොරොත්තු තැබිය හැකි නව ආර නම් කළ අතර ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම මාතර සහ හම්බන්තොට දිස්ත්‍රික්ක වල ස්ථාන 11 කදී සිදු කරන ලදී.

හඳුන්වා දෙන ලද ජනක ප්ලාස්ම ඇගයීම

පිලිපීනයේ අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් ලද ඉන්ජර් පැළ තවාන් දෙකක් (IIRON සහ IRSSIN) අගයන ලදුව වැඩිදුර ඇගයීම සඳහා බලාපොරොත්තු තැබිය හැකි ආර 06 ක් අභිජනක වැඩසටහන් වලදී යොදා ගැනීම සඳහා හඳුනා ගැනිණි.

අභිජනක බීජ නිෂ්පාදනය

At 303, At 306, At 307, At 308, At 353, At 354, At 362 සහ At 402 හි අවශ්‍ය අභජනක බීජ ප්‍රමාණයන් නිපදවූ අතර ජාතික බිත්තර වී වැඩසටහන සඳහා රජයේ ගොවිපළ වලට සපයන ලදි.

සහල් පොඟවා ගැනීමෙන් පිසීමට ගතවන කාලය සහ අවශ්‍ය විදුලිය අඩුකර ගැනීම

විදුලි පරිභෝජනය අඩු කර ගැනීම සහ කාලය ඉතිරි කර ගැනීම සඳහා ජනප්‍රිය වී ප්‍රභේද 4 ක් වන Bg 300, Bg 352 සහ At 306 පිසීමට පෙර පොඟවා ගන්නා කාලය පිළිබඳ පරීක්ෂා කර බලන ලදි. පැය 8 ක් සහල් පොඟවා ගත් විට පිසීමට ගතවන කාලය 17.4% කින් අඩු විය. පොඟවා නොගත් සහල් පිසීමට විනාඩි 17.5 ක් ගතවූ අතර පැය 8 ක් පොඟවා ගත් සහල් කුඩා රයිස් කුකර එකක පිසීමට ගතවූයේ විනාඩි 14.5 ක් පමණි. Bg 300, Bg 352, Bg 358 සහ At 306 සහ වී ප්‍රභේද පැය 08 ක් පොඟවා ගත් විට පිස ගැනීමට ගතවූ කාලයෙහි මධ්‍යන්‍ය අගයන් පිළිවෙළින් විනාඩි 15.02, 16.32, 15.4 ක් සහ 14.47 ක් විය. පිසීමට පෙර පැය 8 ක් සහල් පොඟවා ගැනීමෙන් විදුලි පරභෝජනය 17.4% කින් අඩු කර ගත හැකි බැව් මෙයින් ගම්‍ය වන අතර මෙය ජාතික ඉර්ථිකය උදෙසා සැලකිය යුතු අන්දමේ විදුලි අරපිරිමැස්මක් ලෙස සැලකිය හැකිය.

වායුරෝධී ඇසුරම් මලු භාවිතා කර වී ගබඩා කිරීම

වායුරෝධී මලුවල ගබඩාකරණය සාමාන්‍ය පොලිසක් වල ගබඩාකරණය හා සසඳමින් බලාපොරොත්තු තැබිය හැකි ප්‍රභේද වන Bg 352, Bg 300, Bg 358, Bg 360, At 405 සහ At 306 යන වී ප්‍රභේද වල ධාන්‍ය ගුණාත්මක ලක්ෂණ අගයන ලදි. වායුරෝධී ගබඩාකරණය මගින් වී වල බොහොමයක් හිතකර ධාන්‍ය ගුණාත්මක ලක්ෂණ රඳවා ගත හැකි වූ නමුත් රෝපණය කිරීම සහ ධාන්‍ය වල සුදු පැය රැක ගැනීම සම්බන්ධයෙන් සලකා බලන විට බීජ සංරක්ෂණයේදී එම ගබඩාකරණය පිළිගත හැකි විකල්පයක් නොවේ. මාස 9 ක් අවසානයේදී වායුරෝධී මලු වල ගබඩා කර තිබූ ධාන්‍ය වල සුදු පැහැය පොලිසැක් මලු වල ගබඩා කර තිබූ ධාන්‍ය වල සුදු පැහැයට වඩා අඩු විය.

තාක්ෂණය ව්‍යාප්ත කිරීම

2010 වසරේදී, ක්ෂේත්‍ර ව්‍යාප්ති කාර්ය මණ්ඩලය, ගොවීන්, කෘෂිකර්ම ගුරුවරුන්, විශ්ව විද්‍යාල සහ තාක්ෂණික විද්‍යාල සිසුන් සහ පාසැල් සිසුන් සඳහා ගොවිපළ පුහුණු වැඩසටහන් කීපයක් පැවැත්විය.

වී පර්යේෂණ ආයතනය, සමන්තුරේ

ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ, විශේෂයෙන්ම අම්පාර දිස්ත්‍රික්කයේ වී වගාවේදී ගොවීන් සතු දැනුම් පරතරය හඳුනා ගැනීමේ පරමාර්ථය සහිතව නැගෙනහිර ප්‍රදේශයේ වී ගොවිතැන සඳහා වූ අවශ්‍යතාවයන් සපුරාලීම සහ යෝග්‍ය ප්‍රතිකර්ම ක්‍රම බිහි කිරීම උදෙසා සමන්තුරේ වී පර්යේෂණ ස්ථානය පිහිටුවන ලදී.

මෙම පර්යේෂණ ස්ථානය බලාපොරොත්තු තැබිය හැකි යෝග්‍ය උසස් වී ප්‍රභේද වරණය කිරීම සහ කලාපයේ වී අස්වනු උපරිම මට්ටමට ගෙන ඒම සඳහා පවත්නා සම්පත් ප්‍රයෝජනයට ගනිමින් සුදුසු ශෂ්‍ය විද්‍යාත්මක පිළිවෙත් බිහි කිරීම කෙරෙහි වගකීම දරයි. 2010 වසර තුළදී සියළුම වයස් පංතිවල වී වර්ග සඳහා ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම් (NCRVTS), වී ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් (VAT) සහ මහ පරිමාණයේ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් (LSVAT) පර්යේෂණ ස්ථානයේදී මෙන්ම ගොවි ක්ෂේත්‍ර වලදී සිදු කරන ලදී.

ප්‍රදේශයේ සියළුම පාර්ශ්වකරුවන් වෙත වී වගාවට අදාල තාක්ෂණික ක්‍රම ව්‍යාප්ත කිරීම මෙම පර්යේෂණ ස්ථානයේ ඉටු කරන වැදගත් කාර්යයක් ලෙස සැලකේ. ගොවීන්, තාක්ෂණික විද්‍යාල සිසුන් සහ පෞද්ගලික අංශයේ නිළධාරීන්ගේ සහභාගීත්වයෙන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් තුනක් මෙහෙය වීය. 2010 වසරේදී වයඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂක සිසුන් දෙදෙනෙකු සිය අවසන් වසර ව්‍යාපෘති අවශ්‍යතාව සම්පූර්ණ කරන ලදී. කාබනික පොහොර නිෂ්පාදන වැඩසටහන් යටතේ කොම්පෝස්ට් රෝපිත විශාල ප්‍රමාණයක් නිපද වූ අතර පුහුණු වැඩසටහන් වලට සහභාගී වූ ගොවීන් අතර බෙදා දෙන ලදී. කාබනික කොම්පෝස්ට් නිෂ්පාදනය සහ භාවිතය පිළිබඳව පුහුණු වැඩසටහන් 11 ක් ගොවීන් 820 දෙනෙකුගේ සහභාගීත්වයෙන් මෙහෙය වූ අතර කලාපයේ ගොවීන් සඳහා වල් වී ගැටළු

සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහනක්ද පැවැත්විය.

පර්යේෂණ ස්ථානයේ පරිශ්‍රයෙහි ප්‍රධාන පරිපාලන සහ රසායනාගාර ගොඩනැඟිලි වල ඉදි කිරීම් කටයුතු 70% ක් පමණ අවසන් කෙරිණි.

2011 වසර සඳහා සැලැස්ම

පාරිභෝගිකයන්ගේ ආහාර පුරුදු වෙනස් වීම හේතුවෙන් සහල් සඳහා ඉහළ යන ඉල්ලුම, මධ්‍යසාර පානයන් නිපදවීම ඇතුළු සහල් පාදක නිෂ්පාදන සඳහා සහල් භාවිතය, ඉහළ ගිය සංචාරක ආගමනය සහ වෙනත් ආහාර ද්‍රව්‍යයන්ට අදාලව ගෝලීය වෙළඳපළේ පවතින අස්ථාවර තත්ත්වයන්ට මුහුණ දීම සඳහා වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය සහ එහි සහායක ආයතන විසින් නිෂ්පාදනය සහ ආරක්ෂණ තාක්ෂණික ශිල්ප ක්‍රම බිහි කිරීම අබණ්ඩවම සිදු කරනු ඇත. කෙසේවුවද, මෙම ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේදී පවතින අභියෝග විවිධ වන අතර ඒවා කාලයත් සමඟ වෙනස් වේ. ශ්‍රී ලංකාවේ වී වගාව ජලය අධික වීම සහ හිඟවීම, නව පළිබෝධ සහ රෝග සංකීර්ණ, උෂ්ණත්වයේ ඉහළ සහ පහළ තත්ත්වයන්, ක්ෂය වූ පාංශු පෝෂක සැපයීම් සහ වල් සහ වල් වී වලින් එල්ල වන තර්ජනයන්ට ලක් වේ.

එබැවින්, පෙව සහ අපෙව තත්ත්වයන් දෙක යටතේ සාර්ථක අස්වනු ගෙන දෙන සම්පත් භාවිත කාර්යක්ෂමතාව ඉහළ නව ප්‍රභේද සහ පැළ වර්ග හඳුනා ගැනීම වහාම සිදු කළ යුතු නිරන්තර අවශ්‍යතාවයකි. බිත්තර වී වැඩසටහන පාරිසරික විපර්යාසයන්ට බෙහෙවින්ම ලක් වෙමින් පවතින අතර බහුල වශයෙන් බාහිර මුහුම් වීම වාර්තා වී ඇත. එබැවින් එවැනි අභියෝග ජය ගැනීම සඳහා ගොවීන්ගේ බීජ අවශ්‍යතාවයන් පිරිමසාලීමට නිරන්තරයෙන්ම මනා ගුණාත්මයෙන් යුත් බීජ සැපයීම අනිවාර්ය අවශ්‍යතාවයක් ලෙස සැලකේ. ආධුනිකයන් සඳහා නේවාසික පහසුකම් ස්ථාපිත කිරීමත් සමඟ වී පර්යේෂණ සහ සංවර්ධන ආයතනය සහ එහි සහායක ආයතන මඟින් බිහි කළ මෙම තාක්ෂණික ශිල්ප ක්‍රම ඵලදායී ලෙස ව්‍යාප්ත කළ හැකිය. වත්මන් අවශ්‍යතාවන්ට අනුව නව කෙටි කාලීන සහ දිගු කාලීන වී වගා පුහුණු වැඩසටහන් තවදුරටත් වැඩිදියුණු කර බලගන්වනු ඇත.

කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
අධ්‍යක්ෂ	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ (පර්යේෂණ)	01
සහකාර අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිළධාරි	13
කෘෂිකර්ම නිළධාරි	02
කෘෂිකර්ම ආර්ථික විද්‍යාඥ	01
ආර්ථික විද්‍යාඥ සහකාර	01
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරි	06
වැඩසටහන් සහකාර	09
කෘෂිකර්ම උපදේශක	31
පර්යේෂණ සහකාර	17
කළමනාකරණ සහකාර සේවය	13
රියදුරු	09
වඩු බාස්	01
පෙදරේරු	01
සංචාරක බංගලා භාරකරු	01
මුරකරු	12
සනීපාරක්ෂක කම්කරු	02
නුපුහුණු කම්කරු	225
එකතුව	**347**

2.3.1 කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය, බෝඹුවල

මෙම කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය පහතරට තෙත් කලාපයේ පිහිටා ඇති අතර එහි උප මධ්‍යස්ථාන බෙන්තොට සහ ලබුදූවේ පිහිටා ඇත. මෙම මධ්‍යස්ථානය මඟින් සිදු කරනු ලබන පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන මඟින් කළුතර, කොළඹ, ගම්පහ සහ ගාල්ල දිස්ත්‍රික්කයේ කොටසක් සහ පහතරට තෙත් කලාපයේ රත්නපුර යන පරිපාලන දිස්ත්‍රික්ක පහේ වී වල ඵලදායිතාව ඉහළ නැංවීමේ කටයුතු සිදු කෙරේ. බෝඹුවල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන ආයතනය විශේෂයෙන්ම යකඩ විෂමතාවට ඔරොත්තු දෙන ඉහළ අස්වනු ගෙන දෙන රතු සහ සුදු වී ප්‍රභේද බිහි කිරීම සම්බන්ධයෙන්ද ලබුදූව කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය මඟින් ප්‍රධාන වශයෙන් පහතරට තෙත් කලාපයේ දකුණු ප්‍රදේශය තුළ ඉහළ ඉල්ලුමක් පවතින රතු නිවුඩු සම්බා ආකාරයේ වී ප්‍රභේද බිහි කිරීම සම්බන්ධයෙන්ද වැඩි අවධානය යොමු කරයි. බෙන්තොට කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය එම ස්ථානයේ සහ ගොවි ක්ෂේත්‍ර වල ගොවි සහභාගීත්ව වැඩසටහන් සිදු කරමින් කලාපයේ ගංවතුරට ලක්වන ප්‍රදේශ සඳහා සහ ලවණතාවය සහිත ප්‍රදේශ සඳහා වී ප්‍රභේද බිහි කිරීම උදෙසා අදාල තාක්ෂණික ක්‍රම බිහි කිරීම පිළිබඳව අවධානය යොමු කරයි.

අයවැය

මූලධන සහ පුනරාවර්තන වැය ශීර්ෂ සහ ව්‍යාපෘති යටතේ 2010 වසර තුළ ලද වාර්ෂික අයවැය ප්‍රතිපාදන සහ දරන ලද වියදම පහත දැක්වේ.

ප්‍රගතිය

වී අභිජනනය

ප්‍රභේදීය වැඩිදියුණු කිරීම

ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ වැඩසටහන, ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන සහ මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන් අබණ්ඩවම සිදු කළ අතර ප්‍රවේශ 26 ක් අගයන ලදී. BW 05 – 1621 (එලාවරණය රතු, මධ්‍යස්ථ වටකුරු, මාස 31/2) ආර ප්‍රභේදීය අනුවර්තන අත්හදා බැලීම සඳහා වරණය කෙරුණු අතර BW 04 – 992 (සුදු සම්බා, මාස 3 1/2) මහා පරිමාණයේ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සඳහා වරණය කෙරුණි. බලාපොරොත්තු තැබිය හැකි ආර 5 ක් කොළඹ, ගම්පහ, කළුතර සහ රත්නපුර යන දිස්ත්‍රික්ක වලදී පරීක්ෂාවට ලක් කරන ලදී.

වගු අංක 2.3.1.1 වාර්ෂික අයවැය – 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
මූලධන	3,821,434	3,821,434	100
පුනරාවර්තන	9,563,500	8,930,570	93
ව්‍යාපෘති			
• කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම	1,855,000	1,721,437	93
එකතුව	**15,239,934**	**14,721,437**	**95**

අභිජනක බීජ නිෂ්පාදනය

BW 363 හි සහ BW 364 හි අභිජනක බීජ පහත දැක්වෙන ප්‍රමාණයන්ගෙන් නිපදවූ අතර කලාපීය අවශ්‍යතාවන් සපුරාලීම සඳහා 61 සහ BW 272 - 66 බීජ ගුණනය කරන ලදි.

වගු අංක 2.3.1.2 – 2010 වසරේදී නිෂ්පාදිත බීජ ප්‍රමාණය (කි.ග්‍රෑ.)		
ප්‍රභේදය	අභිජනක බීජ	වාණිජ බීජ
BW 272- 66	82.5	59.5
BW 351	41.0	98.0
BW 361	61.5	447.0
BW 363	4.0	213.0
BW 364	41.0	47.0

කාබනික වගාව සඳහා වී ප්‍රභේද

කාබනික වගා කිරීම සඳහා සාම්ප්‍රදායික ප්‍රභේද 7 කින් බීජ කි.ග්‍රෑ. 100 ක් පමණ නිපදවූ අතර වැඩි දියුණු කරන ලද BW 363, BW 361, Bg 359, BW 272 -6b, සහ BW 364 වී ප්‍රභේද කාබනිකව වගා කළ විට ඉහළ අස්වනු (හෙ. 1 කට ටොන් 3.0- 3.3) ගෙන දුණි.

ශෂ්‍ය විද්‍යාව

දෙමුහුම් වී සෘජුව වැපිරීම

නව තාක්ෂණයක් ලෙස නිර්දේශ කිරීමට පෙර පහත රට තෙත් කලාප තත්ත්වයන් යටතේ ගොවි ක්ෂේත්‍ර වලදී හෙ. 1 කට දෙමුහුම් බිත්තර වී ක්‍රි.ග්‍රෑ. 30 බැගින් සෘජුව වැපිරීම සම්බන්ධයෙන් මේ වන විට පරීක්ෂාවට ලක් කෙරෙමින් පවතී.

වල් පැළෑටි විද්‍යාව

වල් පැළෑටි රසායනිකව පාලනය කිරීම

මඩට වපුරා වී වගාවේදී පරීක්ෂා කර බලන ලද පැළෑටි නාශක කීපයකින් බිස්පයිරිබැක් සෝඩියම් 20 % WP සහ ඔක්සිඩයසෝන් 25% EC සියළුම වර්ගයේ වල් පැළ පාලනයෙහි කාර්‍යක්ෂම විය. මෙටමිෆොප් 10 % EC සහ ෆෙනොක්සා ප්‍රොප් – පී – එතිල් ලීටරයකට ග්‍රෑම් 69 තෘණ පාලනයෙහිද බෙන්සොඒට් 48 % SL ප්‍රළුල් පත්‍ර සහ පන් පාලනයෙහි කාර්‍යක්ෂම විය.

කීට විද්‍යාව

කෘමීන් කෙරෙහි ප්‍රතිරෝධී වී තෝරා ගැනීම

මෙම වැඩසටහන යටතේ ගොක් මැස්සාට ප්‍රතිරෝධී ආර 15 ක්, දුඹුරු පැළ කීඩැවාට ප්‍රතිරෝධී ආර 17 ක් සහ පැළ මැක්කාට ප්‍රතිරෝධී ආර 12 ක් හඳුනා ගැනිණි.

වී කොපු මයිටාවාගේ විකල්ප ධාරක ශාක විශේෂ තුනක් (Sacciolepis interrupta, Echiocloa curs-gali සහ leptochinensis) සොයා ගන්නා ලදී.

වී ගබඩා පළිබෝධකයින් පාලනයෙහි කාර්‍යක්ෂම උද්භිදාංග හඳුනා ගැනීමේ වැඩසටහනේදී සයිටොට්‍රොගා සෙරියලෙල් (Sitotroga cerealell) පාලනයෙහි පැපොල් කොළ වඩාත් කාර්‍යක්ෂම විය. අනතුරුව දෙහි සහ නික කොළ සාර්ථක විය. කෙසේ වුවද, සයිටොෆිලස් ඔරයිසේ (Sytophilus oryzae) පාලනයෙහිද මෙම කොළ වර්ග කාර්‍යක්ෂම විය.

ව්‍යාධිවේදය

වී කොළ පාළුව සඳහා ප්‍රභේදීය පරීක්ෂා කිරීම

- බෝඹුවල, අම්බලන්තොට සහ ලබුදූව වී වැඩිදියුණු කිරීමේ වැඩසටහන් වලින් ලබා ගන්නා ලද වී ආර 230 ක් පරීක්ෂාවට ලක් කෙරුණු අතර ඉන් 40 ක් වී කොළ පාළුවට ප්‍රතිරෝධී බැව් හඳුනා ගැනිණි.
- වී කොළ පාළුව (pyricularia grisea) සහ වී කොපු අංගමාරය සහ කොපු අංගමාරය (Rhyzoctonia solani) පාලනය කිරීම සඳහා චිටෝසන් වල වඩාත්ම කාර්‍යක්ෂම සාන්ද්‍රණය ලීටරයකට මිලි ග්‍රෑම් 400 ක් බැව් සොයා ගැනිණි.

කාබනික පොහොර ප්‍රවර්ධනය සහ නිෂ්පාදනය

- කොම්පෝස්ට් ටොන් 35 කට වැඩි ප්‍රමාණයක් නිපද වූ අතර මෙම ව්‍යාපෘතිය යටතේ පාර්ශ්වකරුවන් 500 දෙනෙක් සඳහා පුහුණු පංති 13 ක් පැවැත්විය.

ආදර්ශ ගම්මාන වැඩසටහන සහ ප්‍රජා මූලික බීජ නිෂ්පාදන වැඩසටහන

- වසර අග භාගයේදී කළුතර දිස්ත්‍රික්කයේ ගම් දෙකකදී මෙම ව්‍යාපෘතිවල ක්ෂේත්‍ර කටයුතු ආරම්භ කෙරිණි.

තාක්ෂණය පතුරුවාලීම

- කළුතර දිස්ත්‍රික්කයේ පැවති පූර්ව කන්නමය පුහුණු පන්ති සහ පැළැටි සායන වලදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිළධාරීන් 235 ක් ද කෑගල්ලේදී ගොවීන් 70 ක් සහ නිළධාරීන් ස්ථානීයවද පුහුණු කරන ලදි. මීට අමතරව පර්යේෂණ කාර්ය මණ්ඩලය ප්‍රදර්ශන 07 කට ක්‍රියාකාරීව සහභාගී විය.

- බෝඹුවල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ පර්යේෂණ කාර්ය මණ්ඩලය මගින් වැඩි දියුණු කරන ලද නව තාක්ෂණය පිළිබඳව රූපවාහිනී වැඩසටහන් 04 ක් ප්‍රචාරය කළ අතර ආයතනයේ පැවති මාසික සම්මන්ත්‍රණ වැඩසටහනේදී විෂයන් මාලාවක් ආවරණය කරමින් මාතෘකා 45 ක් ඔස්සේ ඉදිරිපත් කිරීම් සිදු කරන ලදි.

වී පර්යේෂණ ආයතනය, ලබුදුව

ලබුදුව වී පර්යේෂණ ආයතනය පහත රට තෙත් කලාපයේ දකුණු කලාපයේ පවතින ඉහළ විභවයක් සහිත කුඹුරු ඉඩම් සඳහා වී ප්‍රභේද සහ තාක්ෂණ ක්‍රම වැඩිදියුණු කිරීම කෙරෙහි වගකීම දරයි.

වී අභිජනනය

දිවයින පුරා වගා කිරීම සඳහා දින 110 රතු වී ප්‍රභේදයක් වන LD 408 නිර්දේශ කර මුදා හරින ලදි.

ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීම, ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම සහ මහා පරිමාණයේ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන්

Ld 3-6-12, Ld 1-5–15 (මාස 3 1/2 සුදු සම්බා ප්‍රභේද) සහ Ld 3-12-50 (මාස 3 1/2 රතු සම්බා) මහා පරිමාණ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේදී පරීක්ෂාවට ලක් කළ අතර Ld 8-6-7 (මාස 3 1/2 රතු සම්බා) ප්‍රභේදය ජාතික සම්බන්ධීකරණ ප්‍රභේද අත්හදා බැලීම සඳහා නම් කෙරිණි.

අභිජනක බීජ නිෂ්පාදනය

අභිජනක බීජ පහත සඳහන් ප්‍රමාණවලින් නිපදවිය.

වගු අංක 2.3.1.3	2010 වසරේ අභිජනක බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)
ප්‍රභේදය	**ප්‍රමාණය (කි.ග්‍රෑ.)**
Ld 365	100
Ld 356	40
Ld 408	20
එකතුව	**160**

වෙනත් ව්‍යාපෘති

ප්‍රථම කන්නය සඳහා කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම ආරම්භ කළ අතර කොම්පෝස්ට් පොහොර ටොන් 10 ක් නිපදවිය.

කෘෂිකර්ම පර්යේෂණ ආයතනය, බෙන්තොට

දිස්ත්‍රික්ක 07 කදී විශේෂ වගා තත්ත්ව යටතේ Bg 96-741 සහ Bg 5 R දේශීය ආර සමඟ අන්තර්ජාතික වී පර්යේෂණ ආයතනයෙන් වරණය කරගන්නා ලද (IR 119, උප 1 සම්බා මසූරි, උප 1 IR 64, ස්වර්ණ උප 1) ආර 4 ජල ගැලීම් වලට ඔරොත්තු දීම සම්බන්ධයෙන් පරීක්ෂාවට ලක් කෙරිණි.

ජාතික සම්බන්ධීකරණ වී ප්‍රභේද අත්හදා බැලීමේ සහ ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීමේ වැඩසටහන්ද ගොවි ක්ෂේත්‍ර වලදී ආදර්ශක ගොවි තත්ත්ව යටතේ සිදු කරන ලදි.

කාබනික පෙහොර නිෂ්පාදනය කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

කොම්පෝස්ට් කි.ග්‍රෑ. 5000 ක් නිපදවිය. කොම්පෝස්ට් ආරම්භක පැකට් (කි.ග්‍රෑ. 972) තුන්සිය අසු නවයක් ගොවීන් අතර බෙදා දෙන ලදී. උඩරට කොළ පොහොර පැළවල (ග්ලිරිසීඩියා සහ කඳුරු) පැළ ඉනි 1600 ක් රෝපණය කෙරිණි.

බෙන්තොට කෘෂිකර්ම පර්යේෂණ ආයතනයේදී කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය කිරීම සහ භාවිතා කිරීම සම්බන්ධයෙන් 389 දෙනෙකු (කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිළධාරීන්, ගුරුවරුන් සහ සිසුන්) පුහුණු කරන ලදී.

පුහුණුවීම්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු

- ඒ. පී. බෙන්තොට (පර්යේෂණ නිළධාරී), තුන් වැනි අන්තර්ජාතික වී පර්යේෂණ සමුළුව, හොනායි, වියට්නාමය (2010 නොවැ. 08-12)
- ඒ. පී. බෙන්තොට (පර්යේෂණ නිළධාරී), අන්තර්ජාතික සමුළුව 2010, කෘෂිකර්ම විද්‍යා පීඨය, රුහුණු විශ්වවිද්‍යාලය, (2010 නොවැ. 16)
- ඒ. පී. බෙන්තොට (පර්යේෂණ නිළධාරී), පස්වැනි ආසියානු පෙවතාක්ෂණ සමුළුව, 2010. අමායා හිල්, මහනුවර. 2010 දෙසැ. 15-17
- ජේ.ඩී.කේ.එම්. ජයවර්ධන (පර්යේෂණ නිළධාරී). තුන්වැනි අන්තර්ජාතික වී පර්යේෂණ සමුළුව. හොනායි, වියට්නාමය. (2010 නොවැ. 08-12)
- වයි.ජේ.පී.කේ. මිත්‍රසේන (පර්යේෂණ නිළධාරී). තුන්වැනි අන්තර්ජාතික වී පර්යේෂණ සමුළුව, හොනායි, වියට්නාමය (2010 නොවැ. 08-12)
- වයි.ජේ.පී.කේ. මිත්‍රසේන (පර්යේෂණ නිළධාරී). පස්වැනි ආසියානු පෙවතාක්ෂණ සමුළුව, 2010. අමායා හිල්, මහනුවර. 2010 දෙසැ. 15-17
- ඒ.එස්.පුෂ්පකුමාරි (පර්යේෂණ නිළධාරී). කෘෂිකර්මාන්තයේදී යොදා ගැනීම පිණිස පොලිමර්වල විකිරණය යම් යම් වෙනස්කම් වලට ලක් කිරීමෙන් කයිටොසාන් ගොවි ක්ෂේත්‍ර වල පුළුල් ලෙස පරීක්ෂා කරන්නේ කෙසේද යන්න පිළිබඳ පුහුණු පාඨමාලාව සහ ආදර්ශනය – හෝචිමිං සිටි, වියට්නාමය. 2010 ජූලි 12-17
- ඒ. එස්. පුෂ්පකුමාරි (පර්යේෂණ නිළධාරී). තුන්වන ජාත්‍යන්තර වී පර්යේෂණ සමුළුව, හොනායි, වියට්නාමය (2010 නොවැ. 08-12)
- ජේ.බී.ඩී.එස්. කහදවල (පර්යේෂණ නිළධාරී). "ශ්‍රී ලංකාවේ කාබනික කෘෂිකර්මයේ පිබිදීම" පිළිබඳ අන්තර්ජාතික සම්මන්ත්‍රණය. ලක්ෂ්මන් කඳිරගාමර් ජාත්‍යන්තර සබඳතා සහ උපක්‍රම පිළිබඳ අධ්‍යයන ආයතනය, කොළඹ 07, 2010 ජනවාරි 07-08

කාර්ය මණ්ඩල ලැස්තුව

තනතුර	සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිළධාරී	13
කෘෂිකර්ම නිළධාරී	01
කෘෂිකර්ම මෙහෙයුම් නිළධාරී	04
වැඩසටහන් සහකාර	09
කෘෂිකර්ම උපදේශක	15
පර්යේෂණ සහකාර	12
කළමනාකරණ සහකාර සේවය	07
සංචාරක බංගලා භරකරු	01
රියදුරු	01
සනීපාරක්ෂක කම්කරු	01
මුරකරු	02
කම්කරු	17
එකතුව	**84**

2.4 ගොවිපල යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය
මහඉලුප්පල්ලම

ගොවිපල යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානය මහඉලුප්පල්ලම කෘෂිකර්ම සංකීර්ණයෙහි ස්ථාපිත කර ඇත්තේ කෘෂිකාර්මික නිෂ්පාදනවල පිරිවැය අඩුකරගැනීම, ඒවායෙහි තත්වය වැඩිදියුණු කරගැනිම, ඵලදායිතාව වර්ධනය කරගැනීම සහ නිෂ්පාදන ප්‍රමාණය ඉහළ නැංවීම සඳහා ගොවිපල යාන්ත්‍රීකරණ තාක්ෂණය හඳුන්වා දීමෙන් යෝග්‍ය ගොවිපල යාන්ත්‍රීකරණය ශ්‍රී ලංකාව තුළ ප්‍රවර්ධනය කිරීම සඳහාය.

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථිකයට සහ විවිධ ප්‍රදේශවල පවතින ක්ෂේත්‍ර තත්වයන්ට ගැලපෙන කාර්යක්ෂම කෘෂිකර්ම යාන්ත්‍රීකරණ තාක්ෂණයන් හඳුන්වාදීම ප්‍රධාන පරමාර්ථය වන මෙහි ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

- ප්‍රමුඛතා අනුව හා සීමාකාරකම් අනුව යාන්ත්‍රීකරණ අවශ්‍යතා සහ විවිධ වගා පද්ධතිවල ගැටළු හඳුනාගැනීම
- බලාපොරොත්තු තැබිය හැකි යන්ත්‍ර සූත්‍ර සහ උපකරණවල නිර්මාණය, කාර්යයන්, ආරක්ෂිත බව, ලාභදායක බව සහ සමාජ ආර්ථික සාධක අනුව තෝරා ගැනීම සහ පරීක්ෂා කිරීම
- දේශීය තත්වයන්ට ගැලපෙන පරිදි කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ වැඩි දියුණු කිරීම, වෙනස්කම් සිදු කිරීම සහ අනුවර්තනය කිරීම
- තෝරාගත් උපකරණ සඳහා තාක්ෂණික සිතියම්/සැලසුම්, සටහන්, පරීක්ෂණ වාර්තා සහ උපදෙස් අත්පොත් සකස් කිරීම
- දේශීය නිෂ්පාදකයන් වෙත තාක්ෂණය ලබාදීම සහ යෝග්‍ය කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ නිෂ්පාදනයෙහි ලා ඔවුන්ගේ හැකියාවන් ඉහළ නැංවීම
- ගොවීන් සහ අනෙකුත් උපයෝජකයන් අතර කෘෂිකාර්මික යාන්ත්‍රීකරණය සහ තාක්ෂණ ක්‍රම ප්‍රචලිත කිරීම සඳහා කෘෂිකාර්මික ව්‍යාප්ති සහ අනෙකුත් නියෝජිතායතන වලට සහාය ලබාදීම

මෙම මධ්‍යස්ථානය සතුව අංශ 4 ක් ඇත. ඒවා නම්

1. පර්යේෂණ සහ සංවර්ධන අංශය
2. පරීක්ෂණ සහ ඇගයීම් අංශය
3. කෘෂිකාර්මික සහ කර්මාන්ත ව්‍යාප්ති අංශය
4. වාහන නඩත්තු කිරීමේ සහ අළුත්වැඩියා කිරීමේ අංශය

අයවැය

2010 වසර සඳහා විවිධ වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 2.4.1 හි දැක්වේ.

වගු අංක 2.4.1 වාර්ෂික අයවැය - 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම %
මූලධන	6,999,125	6,447,942	92
පුනරාවර්තන	4,090,000	3,459,531	85
එකතුව	**11,089,125**	**9,907,473**	**89**

ප්‍රගතිය

පර්යේෂණ සහ සංවර්ධන

බඩඉරිඟු කොළ මඩින යන්ත්‍රය

බීජ වලට සිදුවන හානිය 1% කටත් වඩා අඩු කිරීම පිණිස බඩඉරිඟු කොළ මඩින යන්ත්‍රය වැඩි දියුණු කළ අතර ධාරිතාව පැයට කි.ග්‍රෑ. 2000 ට වඩා වැඩි කරන ලදි.

මෝටරයක් යොදන ලද බීජ වප්කරය

යාන්ත්‍රික වල් මර්දනය පහසු කිරීමට සහ බිත්තර වී අපතේ නොයවා අරපිරිමැසුම්ව වැපිරීම සඳහා දැනට පවතින අතින් ක්‍රියාකරන ඩ්‍රම් හැඩැති බීජ වප්කරය මෝටරයකින් ක්‍රියා කරන බීජ වප්කරයකට පරිවර්තනය කිරීම සිදු කෙරෙමින් පවති.

බිත්තර වී පිරිසිදු කරන යන්ත්‍රය

නව දෝලන පද්ධතියක් හඳුන්වා දෙමින් දැනට පවතින බිත්තර වී පිරිසිදු කිරීමේ උපකරණය වැඩි දියුණු කරන ලදී. තත්ත්වයෙන් උසස් බිත්තර වී අඩු මිලට නිපදවීම සඳහා නව බ්‍රෑසින් පද්ධතිය යන්ත්‍රයට සම්බන්ධ කර ඇත.

ගොඩ බිම් බීජ වප්කරයේ වැඩි දියුණු කිරීම්

බීජ වැපිරීමේදී බීජ හානිය අඩු කිරීම සඳහා මනා පස් ආවරණයකින් යුතුව නිවැරදි ගොඩැලි පරතරයක් පවත්වා ගැනීම සඳහා බොක්ස් බීජ වප්කරය සම්බන්ධ කරන ලද ට්‍රැක්ටරයේ දැනට පවතින ක්ලච් පද්ධතිය වැඩි දියුණු කරන ලදී.

මඩබිම් බලවේග වල් නෙලනයේ වැඩිදියුණු කිරීම

පසුපස මල්ච් වීල් වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා දැනට පවතින යන්ත්‍රවල බලවේග සම්ප්‍රේෂණ පද්ධතියේ යම් යම් වෙනස්කම් සිදු කිරීම.

ගොඩබිම බලවේග වල් නෙලනය

වල් නෙලීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමට සහ අතින් සහ යාන්ත්‍රික ක්‍රම මගින් වල් නෙලීමේදී ඇතිවන දැඩි වෙහෙස අවම කිරීමට බලවේගයෙන් ක්‍රියාත්මක කෙරෙන නව වල් නෙලනයක් හඳුන්වා දීම. මෙම ගොඩබිම බලවේග වල් නෙලනය බඩඉරිඟු වගාවේ සහ බොහෝ රනිල බෝග වගාවල වල් පාලනය කිරීම සඳහා සැලසුම් කර ඇත.

පරීක්ෂා කිරීම සහ ඇගයීම

නිෂ්පාදන පිරිවිතර සහ අනුවර්තනය සනාථ කරගැනීම සඳහා පහත සඳහන් යන්ත්‍ර පරීක්ෂා කර ඇගයීමට ලක් කරන ලදි.

යන්ත්‍රය	ප්‍රභව රට	පරීක්ෂා කරන ලද යන්ත්‍ර සංඛ්‍යාව
රෝද හතරේ ට්‍රැක්ටරය	ඉන්දියාව	4
රෝද දෙකේ ට්‍රැක්ටරය	චීනය	8
උදලු	ශ්‍රී ලංකාව/ඉන්දියාව/චීනය	9
තණකොළ කපන යන්ත්‍රය	ඉතාලිය	1
කොකු නගුල	ඉන්දියාව	1
ඉසින යන්ත්‍ර	මැලේසියාව/ඉන්දියාව/තායිවානය	5
වතුර පොම්ප	ශ්‍රී ලංකාව	8

කෘෂිකාර්මික සහ කර්මාන්ත ව්‍යාප්තිය

උපාධි අපේක්ෂකයින්, ගොවින්, ගුරුවරුන්, පාසැල් සිසුන්, තාක්ෂණික විද්‍යාලිය සිසුන් සහ කාර්ය මණ්ඩලය මෙම ආයතනයට පැමිණෙන ලදි. ගොවින් සහ අනෙකුත් සේවා දායකයන් සඳහා ක්ෂේත්‍ර ආදර්ශන සහ ප්‍රහුණු කිරීම් බටඅත (ගොවි සතිය) ත්‍රිකුණාමලය, කුණ්ඩසාලය (දැයට කිරුළ 2010) සහ කහටගස්දිගිලිය යන ප්‍රදේශ වලදී පවත්වන ලදි. සියළුම ව්‍යාප්ති නිලධාරීන්ට වී සහ බඩඉරිඟු සඳහා යන්ත්‍ර සූත්‍ර පැකේජ ලබාදීම සඳහා ව්‍යාපෘතියක් සංවිධානය කරන ලදි.

වාහන නඩත්තු කිරීම සහ අළුත්වැඩියා කිරීම

ගොවිපල යාන්ත්‍රිකරණ සහ පර්යේෂණ මධ්‍යස්ථානයේ සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනෙකුත් ආයතනවල වාහන අළුත්වැඩියා කිරීම, වාහන නඩත්තු කිරීම සහ වාහන කොටස් මිළදී ගැනීම සම්බන්ධයෙන් නිර්දේශ සහ ඇස්තමේන්තු ලබාදීම සිදුකරනුයේ මෙම මධ්‍යස්ථානයේ වාහන නඩත්තු කිරීමේ සහ අළුත්වැඩියා කිරීමේ අංශය මගිනි.

වගු අංක 2.2.4 වාහන අළුත්වැඩියා කිරීම

	මෝටර් සයිකල්	සැහැල්ලු වාහන	බර වාහන	එකතුව
නිර්දේශ	0	96	23	129
අළුත්වැඩියා කිරීම්	4	26	18	59

වෙනත් කාර්යයන්

- රජයේ දෙපාර්තමේන්තු සහ රජයේ නොවන සංවිධාන සඳහා යෝග්‍ය උපකරණ සහ යන්ත්‍ර සූත්‍ර මිළදී ගැනීම සඳහා තාක්ෂණික කමිටු අනුමැතිය සහිත තාක්ෂණික ඇගයීම් වාර්තා නිකුත් කරන ලදි. 2010 වසරේදී වෙනත් ආයතන සඳහා තාක්ෂණික ඇගයීම් වාර්තා 25ක් පමණ නිකුත් කෙරිණි.

- ගොවිපල යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානයේ කාර්යාල ගොඩනැගිලි, නිල නිවාස සහ නේවාසිකාගාරයේ අළුත්වැඩියා කිරීම.

2011 වසර සඳහා සැලැස්ම

- කෘෂිකර්මය සඳහා භූමි සුලභතාවය වැඩි කරගැනීමට සහ මඩසහිත වගුරු බිම් වලදී භාවිතා කිරීම සඳහා හයිඩ්‍රෝ ටිලර් උපකරණයේ යම් යම් වෙනස්කම් සිදු කිරීම

- අන්වක්ෂ ප්‍රවාහ ජල පොම්පයේ විශ්වසනීයතාව ඉහළ නැංවීම. ජල සම්පාදන ගැටළු හේතුවෙන් සිදුවන බෝග හානිය අවම කිරීමට ඉහළ ධාරිතාවයෙන් යුත් විශ්වාසදායී වතුර පොම්පයක් හඳුන්වා දීම.

- මඩබිම් බලවේග වල් නෙලනය සැලසුම් කිරීම සහ නිර්මාණය කිරීම සම්පූර්ණ කිරීම.

- ගොඩබිම බෝග සඳහා ඇන්පිමකින් ක්‍රියා කරන වල් නෙලනයක් සැලසුම් කිරීම සහ නිර්මාණය කිරීම සම්පූර්ණ කිරීම.

- පස් ආවරණය කරන ප්ලේට් ක්ලච් පද්ධතිය සහ සිඩ් හොපර් උපාංගය වැඩි දියුණු කර ගොඩබිම බිජ වප්කරය තවදුරටත් වැඩි දියුණු කිරීම.

- දැනට තිබෙන බීජ වප්කරයට මෝටරයක් සම්බන්ධ කිරීමේ කටයුතු සම්පූර්ණ කිරීම.

- ධාරිතාව ඉහළ නැංවීම සඳහා බඩඉරිඟු කොළ මඩිනය වැඩි දියුණු කිරීම.

- බඩඉරිඟු වගාව සඳහා රෝද 4 ට්‍රැක්ටරයට සම්බන්ධ කරන ලද බීජ සිටුවන යන්ත්‍රය සැලසුම් කිරීම.

- වී පිරිසිදු කිරීමේ යන්ත්‍රයේ වෙනස්කම් සිදු කිරීම සම්පූර්ණ කිරීම.

- බිජ වැපිරීමේ ක්‍රම සමඟ අස්වැන්න සැසඳීම සහ ව්‍යාප්ති කටයුතු සඳහා උපදෙස් මාලාවක් ලෙස භාවිතා කිරීම සඳහා විවිධ බිජ වැපිරීමේ ක්‍රම පිළිබඳව සැසඳුම් වාර්තාවක් පිළියෙල කිරීම.

කාර්ය මණ්ඩල ලැයිස්තුව

තනතුර	සංඛ්‍යාව
ඉංජිනේරු (යාන්ත්‍රික)	04
කෘෂිකර්ම උපදේශක	02
ගොවිපල යන්ත්‍ර උපදේශක	02
වැඩ මුලික (ඉංජිනේරු)	01
සැලසුම් ශිල්පී	01
රාජ්‍ය කළමනාකරණ සහකාර	02
රියදුරු	02
යන්ත්‍ර ශිල්පී	02
කාර්මික ශිල්පී	03
ගබඩාකරු	01
වැද්දුම්කරු	01
පෑස්සුම්කරු	02
කම්මල්කරු	01
යන්ත්‍රාගාර උපස්ථායක	02
යන්ත්‍ර ක්‍රියාකරු	01
මුරකරු	01
සනීපාරක්ෂක කම්කරු	01
නුපුහුණු කම්කරු	06
කම්කරු (අනියම්)	11
එකතුව	**47**

3.1 බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය - ගන්නොරුව

බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානය සතු වගකීම ශ්‍රී ලංකාව තුළ ජාතික මට්ටමින් පැළෑටි සංරක්ෂණය, බීජවල ගුණාත්මකබව සහ පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය සහතික කිරීමයි. මෙම මධ්‍යස්ථානය බීජ සහතික කිරීමේ සේවය, පැළෑටි සංරක්ෂණ සේවය, ජාතික පැළෑටි නිරෝධායන සේවය, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය සහ පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය සඳහා ප්‍රධාන කළමනාකරණ ආයතනය වශයෙන් ක්‍රියා කරයි. මෙය උසස් තත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිධන්තු කිරීම හා නිෂ්පාදනය කිරීම, පැළෑටි සංරක්ෂණය, පළිබෝධනාශක භාවිතය පාලනය කිරීම සහ පැළෑටි නිරෝධායන සම්බන්ධ විදගත් සේවා ගොවින්ට සැපයීමේ වගකීම දරයි. එමෙන්ම ආහාර බෝගවල පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය කිරීමේ හා පහත දැක්වෙන පනත්වලට අදාළ නියාමන කටයුතු ඉටු කිරීමේද වගකීම දරයි.

- 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනත
- 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත
- 2003 අංක 22 දරන බීජ පනත

මෙම මධ්‍යස්ථානය ශ්‍රී ලංකාවේ ජාතික පැළෑටි සංරක්ෂණ ආයතනය සහ උද්භිද / ස්වස්ථතා කටයුතුවලට අදාළ ජාතික විමසුම් ඒකකය වශයෙන්ද ක්‍රියා කරයි.

අයවැය

2010 වසර තුළ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම පහත දැක්වේ.

වගු අංක 3.1.1 : වාර්ෂික අයවැය – 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදමේ %
මූලධන	1,729,000	844,365	49
පුනරාවර්තන	3,202,480	2,620,583	82
එකතුව	**4,931,480**	**3,464,948**	**70**

ප්‍රගතිය

ආනයන බලපත්‍ර

පහත දැක්වෙන අයතම සඳහා 2010 වසර තුළ ආනයන බලපත්‍ර නිකුත් කරන ලදී.

වගු අංක 3.1.2 : 2010 වසර තුළ නිකුත් කරන ලද ආනයන බලපත්‍ර

බලපත්‍ර වර්ගය	සංඛ්‍යාව
එළවළු බීජ	907
නැවුම් පලතුරු	566
පැළෑටි හා රෝපණ ද්‍රව්‍ය	725
පැළෑටි නිෂ්පාදන	260
බීජ අර්තාපල්	30
සත්ව ආහාර	9
ආගමික කටයුතු සඳහා ගන්නා කැපූ මල්	11
මිනිස් පරිභෝජනය සඳහා වූ නිෂ්පාදන	40
පේව කාරකයින්	0
එකතුව	**2,548**

බීජ අර්තාපල් ආනයන

2010 වසර තුළ ආනයනය කිරීමෙන් පසු පරීක්ෂා කරන ලද බීජ අර්තාපල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

වගු අංක 3.1.3 : බීජ අර්තාපල් ආනයන

රට	ආනයනය කළ ප්‍රමාණය (මෙ.ටො)	නිදහස් කළ ප්‍රමාණය (මෙ.ටො)	විද්‍යාගාර පරීක්ෂා/ තොග සංඛ්‍යාව
නෙදර්ලන්තය	676	676	43
අ.එ. ජනපදය	122	122	3
ප්‍රංශය	37	37	9
ජර්මනිය	75	75	2
එකතුව	**911**	**911**	**57**

ආනයනය කරන ලද බීජ අර්තාපල් තොග සඳහා ප්‍රවේශ ස්ථාන පරීක්ෂා 14ක් සිදු කරන ලද අතර ප්‍රතික්ෂේපවීම් කිසිවක් නොතිබිණි.

ප්‍රවේශ කොන්දේසි සංශෝධනය කිරීම

අ. එ. ජනපදයෙන් බීජ අර්තාපල් (ජී‍්‍ය පංතිය) ආනයනය පහසු කිරීම සඳහා බලපත්‍ර කොන්දේසි යටතේ බීජ අර්තාපල්වල පැවතිය හැකි වෛරස් මට්ටම් සංශෝධනය කෙරිණි.

බලපත්‍ර කොන්දේසි සංශෝධනය කිරීම

යුරෝපීය රටවල් 2010 මාර්තු මස සිට මීතෙල් බ්‍රෝමයිඩ් භාවිතයෙන් ඉවත් කර ගන්නා ලදී. ඒ අනුව, බලපත්‍ර කොන්දේසිවලට අදාළ උද්භිද ස්වස්ථතා ක්‍රියාමාර්ග වත්මන් අවශ්‍යතා සපුරාලන අන්දමින් වෙනස් කරන ලදී.

පශ්චාත් නිරෝධායන පරීක්ෂා කිරීම්

සත්ව ආහාර සඳහා තිරිඟු තොග සැකසුම් කිරීමේ ස්ථාන ද අන්තර්ගත වන පරිදි බලපත්‍ර කොන්දේසි සපුරාලන්නේදැයි තහවුරු කර ගැනීම පිණිස පශ්චාත් ප්‍රවේශ නිරෝධායන පරීක්ෂා 15ක් සිදු කෙරිණි.

අපනයන සහතිකකරණය

අපනයනය සඳහා ඇති තොග සහතික කිරීම පහසු කිරීම සඳහා අපනයන සමාගම්වල කම්හල් පරිශ්‍ර පහසුකම් හා පැළෑටි සහ පැළෑටි නිෂ්පාදන ක්‍රියාදාමය පරීක්ෂාවට ලක් කෙරිණි.

ක්ෂේත්‍ර පරීක්ෂා

නුවරඑළිය ප්‍රදේශයේ අර්තාපල් වගා කරන ක්ෂේත්‍රවල ඇති නිරෝධායන පළිබෝධ සොයා ගැනීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂා සිදු කෙරිණි. මෙම දත්ත පදනම් කරගෙන පළිබෝධ පරීක්ෂා කිරීමේ වැඩසටහන් ඉදිරියේදී ආරම්භ කෙරෙනු ඇත.

දේශීය ධාන්‍ය නිෂ්පාදනය දිරි ගැන්වීම

දේශීය බඩඉරිඟු සහ ඉඳල් ඉරිඟු නිෂ්පාදනය දිරිමත් කිරීම සඳහා බඩඉරිඟු සහ ඉඳල් ඉරිඟු බීජ ආනයනය කරන ප්‍රමාණය සීමා කෙරිණි.

අපනයන තොග රැඳවා ගැනීම්

2010 වර්ෂයේදී අනිවාර්ය උද්භිද ස්වස්ථතා ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට අසමත් වූ තොග 13 ක් රැඳවා ගැනීම සම්බන්ධයෙන් ඒවා යවන ලද රටවල්වලින් වාර්තා විය. මෙය 2009 වර්ෂය සමඟ සසඳා බලන විට අපනයන තොග රැඳවා ගැනීම 44%කින් අඩු වීමකි. ඉදිරි අපනයන කටයුතුවලදී නිරෝධායන විධිවිධානවලට අනුකූලව ක්‍රියා කරන ලෙස අපනයනකරුවන්ට විධිමත්ව දැනුම් දෙන ලදී.

තොග දෙකක් තුළින් පණුවති කෘමීන් සොයා ගැනීම

ඕස්ට්‍රේලියානු නිරෝධායන පරීක්ෂණ සේවය මඟින් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත කරන ලද ඉල්ලීමක් මත ඉදිරියේදී එවැනි සිදුවීම් ඇතිවීම වැළැක්වීමට අවශ්‍ය තාක්ෂණික නිර්දේශ ලබා දීම හා අනෙකුත් පියවර ගැනීම සඳහා පුළුල් විමර්ශනයක් සිදු කෙරිණි.

ඕස්ට්‍රේලියානු ධූමකරණ සහතිකය ලබාදීමේ ක්‍රමය

ඕස්ට්‍රේලියානු නිරෝධායන පරීක්ෂණ සේවය සමඟ "සහයෝගිතාත්මක පෙව සුරක්ෂිතතා දිරි ගැන්වීම් ක්‍රමය" ක්‍රියාත්මක කිරීමට මුල පිරිණි.

ශ්‍රී ලංකාවෙහි පලතුරු සඳහා පැළෑටි නිරෝධායන අවසරය ලබා ගැනීම

ඉන්දියානු කෘෂිකාර්මික බලධාරීන් විසින් කරන ලද ඉල්ලීමකට අනුව ශ්‍රී ලංකාවේ අඹ සහ රඹුටන්වල ඇතිවන පළිබෝධ සහ එම පළිබෝධ පාලනය කිරීමට අනුගමනය කෙරෙන අවදානම් අඩු කිරීමේ ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු ලබා දෙන ලදී.

පැළෑටි නිරෝධායනය පිළිබඳ සම්මන්ත්‍රණ/ දැනුවත් කිරීමේ වැඩසටහන්/පුහුණු

කුණ්ඩසාලේ කෘෂිකර්ම පාසලේ සිසුන් 180 දෙනෙකු සඳහා පැළෑටි නිරෝධායනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

නිරෝධායන කටයුතුවලට අදාළ රාජකාරී ඉටු කිරීමේදී නිරෝධායන නිලධාරීන් සහ රේගු නිලධාරීන් අතර අන්‍යෝන්‍ය අවබෝධතාව වර්ධනය කිරීම සඳහා රේගු නිලධාරීන් වෙනුවෙන් පැළෑටි නිරෝධායනය පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

බීජ සහතික කිරීමේ සහ පැළෑටි සංරක්ෂණ මධ්‍යස්ථානයේ, ජාතික පැළෑටි නිරෝධායන සේවයේ සහ වරාය හා ගුවන් තොටුපළ තුළ පිහිටි ප්‍රවේශ ස්ථාන දෙකෙහි සේවය කරන නිරෝධායන නිලධාරීන් සඳහා ආනයනය කරන ලද බීජ අර්තාපල් ප්‍රභේදවල පැවතිය හැකි රෝග හඳුනා ගැනීම සඳහා අධ්‍යයන චාරිකාවක් සූදානම් කරන ලදී. මෙම කණ්ඩායම් ගොවි ක්ෂේත්‍ර ගණනාවක චාරිකා කළ අතර අඹේවෙල කොන්ත්‍රාත් වගාකරුවන්ද හමුවූහ. බීජ අර්තාපල් තොග

නිදහස් කිරීමට පෙර ඒවා නිරීක්ෂණය කර පරීක්ෂා කිරීමට එක් වූ නිලධාරීන් බීජ අර්තාපල් ස්ථාපිත කිරීමේ සිට රෝපණය කිරීම දක්වා වන නිෂ්පාදන ක්‍රියාදාමයේ අනෙකුත් අංග පිළිබඳවද දැන ගැනීම සඳහා යොමු කිරීම මෙම චාරිකාවෙහි අරමුණ විය. එමඟින් ඔවුන්ට කලාපය සඳහා බීජ අර්තාපල් ප්‍රභේද තෝරා ගැනීමේදී සලකා බැලිය යුතු නිර්ණායක පිළිබඳ ප්‍රායෝගික අත්දැකීමක්ද ලැබිණි.

2011 වසර සඳහා සැලැස්ම

- පැළෑටි හා පැළෑටි නිෂ්පාදන සුරක්ෂිතතා විධිවිධානවලට අනුකූලව ආනයනය හා අපනයනය පහසු කිරීම සඳහා අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීම
- උසස් තත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනයට අදාළ යෝග්‍ය සැලසුම් හා ප්‍රතිපත්තිමය තීරණ සකස් කිරීම
  - දිවයිනෙහි බීජ ව්‍යවසායන් සංවර්ධනය කිරීම
  - ජාතික මට්ටමින් උද්භිද ස්වස්ථතාව පවත්වාගෙන යෑමේ හැකියාවන් ශක්තිමත් කිරීම
  - තාක්ෂණික හැකියාවන් වැඩිදියුණු කිරීම
  - නියාමන ක්‍රියාමාර්ග අතර අනුරූපීබවක් ඇති කිරීම
  - වඩාත් ඵලදායී සහ ආරක්ෂිත පළිබෝධ පාලන ක්‍රමෝපාය ප්‍රවර්ධනය කිරීම
- ශ්‍රී ලංකාව තුළ ඕස්ට්‍රේලියානු ධූමකරණ සහතික ලබාදීමේ ක්‍රමය ක්‍රියාත්මක කිරීම

ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම:

2011 ජනවාරි - ඕස්ට්‍රේලියානු ධූමකරණ සහතික ලබාදීමේ ක්‍රමය මඟින් නිරීක්ෂණ චාරිකාවක් සංවිධානය කිරීම

2011 පෙබරවාරි - ශ්‍රී ලංකා ධූමකරණ කර්මාන්තය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව දැනුවත් කිරීම

2011 මාර්තු - ඕස්ට්‍රේලියානු ධූමකරණ සහතික ලබාදීමේ ක්‍රමය මඟින් ධූමකරණ පුහුණු පාඨමාලාවක් පැවැත්වීම

2011 අප්‍රේල් - ඕස්ට්‍රේලියානු ධූමකරණ සහතික ලබාදීමේ ක්‍රමය මඟින් විගණන පුහුණුවක් සහ පුහුණුකරුවන් පුහුණු කිරීමේ පාඨමාලාවක් පැවැත්වීම

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරි/සේවක සංඛ්‍යාව
අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිලධාරි	01
කෘෂිකර්ම නිලධාරි	01
වැඩසටහන් සහකාර	03
කෘෂිකර්ම උපදේශක	01
පරිපාලන නිලධාරි	01
කළමනාකාර සහකාර	12
ගබඩා භාරකරු	01
කා.කා.ස.	02
රියදුරු	03
කම්කරු (අනියම්)	02
කම්කරු (කොන්ත්‍රාත්)	02
එකතුව	**30**

3.1.1 බීජ සහතික කිරීමේ සේවය - ගන්නොරුව

බීජ සහතික කිරීමේ සේවය ගොවින්ට උසස් තත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය ලැබීම සහතික කිරීමට අදාළ නියාමන කාර්යයන් ඉටු කරයි. මෙම ආයතනයට පැවරී ඇති අනෙකුත් වගකීම් පහත දැක්වේ.

- බීජ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ උසස් තත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සම්බන්ධයෙන් බීජ වගාකරුවන්, පැළ තවාන්කරුවන්, බීජකරුවන් සහ නිලධාරීන් පුහුණු කිරීම සහ දැනුවත් කිරීම
- වී, එළවළු, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ අර්තාපල්වල මූලික හා වාණිජමය බීජ හා රෝපණ ද්‍රව්‍යවල තත්වය සහතික කිරීම
- පලතුරු පැළ සහතික කිරීම සහ පලතුරු පැළ තවාන් ලියාපදිංචි කිරීම
- රජයේ සහ පෞද්ගලික පැළ තවාන්වලින් මව් ශාක තෝරා ගැනීම
- ආනයනය කරන ලද සහ දේශීය වශයෙන් නිපදවන ලද බීජ සඳහා පසු පාලන ක්ෂේත්‍ර වගා අත්හදා බැලීම් පැවැත්වීම
- නව බෝග ප්‍රභේද නිදහස් කිරීමට පෙර විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පිළිබඳව පරීක්ෂා කිරීම
- බීජ ස්වස්ථතාව පරීක්ෂා කිරීම සහ ව්‍යවහාරික බීජ පර්යේෂණ වැඩසටහන් පැවැත්වීම
- ආනයනය කරන ලද එළවළු බීජවල තත්වය සහතික කිරීමේ වැඩසටහන
- බීජ වැඩිදියුණු කිරීමේ සහ ඒවායෙහි තත්වය ඉහළ නැංවීමේ කටයුතු
- දත්ත මූලයේ කළමනාකරණ හා මෙහෙයුම් කටයුතු
- පලතුරු පැළ තවාන්කරුවන්ගේ සහ බීජ නිෂ්පාදකයින්ගේ නාමාවලි ප්‍රකාශයට පත් කිරීම

අයවැය

විවිධ වැය ශීර්ෂ සහ ව්‍යාපෘති යටතේ ලද ප්‍රතිපාදන හා දරන ලද වියදම් වගු අංක 3.1.1.1හි දැක්වේ.

ප්‍රගතිය

- බීජ නිෂ්පාදනය සඳහා වගා කරන ලද වී හෙ. 5,204ක්, වෙනත් ක්ෂේත්‍ර බෝග හෙ. 521ක්, එළවළු හෙ. 197ක් සහ අර්තාපල් හෙ. 52ක් පරීක්ෂා කරන ලදී.
- බිත්තර වී මෙ.ටො. 11,121ක්, වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ මෙ.ටො. 267ක්, එළවළු බීජ මෙ.ටො. 70ක් සහ බීජ අර්තාපල් මෙ.ටො. 709ක් ආවරණය වන පරිදි බීජ නියැදි 8,950ක් පරීක්ෂා කර බලන ලදී.
- 2009 වර්ෂයේ සංඛ්‍යා ලේඛන සමඟ සසඳා බැලූ විට 2010 වර්ෂයේදී ලියාපදිංචි වී, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ එළවළු වගා බිම් ප්‍රමාණය පිළිවෙළින් 27%කින්, 51%කින් සහ 45%කින් ඉහළ නැංවී ඇත.

වගු අංක :- 3.1.1.1 : වාර්ෂික අයවැය – 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
පුනරාවර්තන	14,010,000	14,010,000	100
මූලධන	8,980,000	6,800,000	76
ව්‍යාපෘති අපි වවමු රට නගමු	3,500,000	3,400,000	97
බීජ පනත	15,000,000	11,590,000	77
එකතුව	**41,490,000**	**35,800,000**	**86**

- සහතික කරන ලද රෝපණ ද්‍රව්‍ය නිපදවන උද්‍යාන බෝග පැළ තවාන් 222ක් ලියාපදිංචි කර පරීක්ෂා කරන ලද අතර බද්ධ පලතුරු පැළ 202,276ක් ලේබල් කිරීම මගින් ඒවායෙහි තත්වය සහතික කරන ලදී.
- විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පරීක්ෂා කරන වැඩසටහන යටතේ වී ප්‍රභේද 9ක්, වෙනත් කෙෂ්ත්‍ර බෝග ප්‍රභේද 7ක්, එළවළු ප්‍රභේද 15ක් සහ මුල් හා ආකන්ද බෝග ප්‍රභේද 1ක් ඇගයීමට ලක් කෙරිණි.
- වී වෙනත් කෙෂ්ත්‍ර බෝග, එළවළු සහ අර්තාපල්වල පශ්චාත් පාලන නියැදි 445ක් පරීක්ෂා කරන ලදී.
- බීජ පනත යටතේ බීජ හසුරුවන්නන් 777දෙනෙකුට ලියාපදිංචිය ප්‍රදානය කරන ලදී.
- රජයේ නිලධාරීහු සහ බීජ හසුරුවන්නන් 2840 දෙනෙකුට පුහුණුව ලබාදිණි.
- වී, වෙනත් කෙෂ්ත්‍ර බෝග සහ එළවළු බීජ සහතික කිරීම සඳහා නව ලේබල් ක්‍රමයක් හඳුන්වා දෙන ලදී.

බිත්තර වී සහතික කිරීම

සහතික කරන ලද බිත්තර වී නිෂ්පාදන වැඩසටහන සඳහා ගොවීන් මෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළ, සමූපකාර සමිති, පළාත් සභා, ගොවිජන කේන්ද්‍ර, මහවැලි අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවි සංවිධාන, පෞද්ගලික සමාගම්, රාජ්‍ය නොවන සංවිධාන වැනි රාජ්‍ය හා පෞද්ගලික ආයතන රැසක් ලියාපදිංචි කරන ලදී.

බිත්තර වී නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙ. 5,204ක් වූ අතර එහි පෞද්ගලික අංශ දායකත්වය 74%ක් විය. විවිධ ප්‍රභව සහ බීජ පංති යටතේ සහතික කළ බිත්තර වී නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද බිම් ප්‍රමාණයන් වගු අංක 3.1.1.2හි දැක්වේ. බීජ නිෂ්පාදනය සඳහා සියලුම ප්‍රභවයන්හි දායකත්වය ඉහළ ගිය හෙයින් 2009 වර්ෂයට සාපේක්ෂව 2010 වර්ෂයේදී බිත්තර වී නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කළ බිම් ප්‍රමාණයේ 27%ක වර්ධනයක් නිරීක්ෂණය කිරීමට ලැබිණි.

2010 වර්ෂය තුළ බිත්තර වී ටො. 11,121ක් නිපදවන ලද අතර එයින් බිත්තර වී ටො. 8,789ක තත්වමය ප්‍රමිති, විද්‍යාගාර පරීක්ෂා තුළින් පිළි ගන්නා ලදී (වගු අංක 3.1.1.3). කොන්ත්‍රාත් වගා වැඩසටහන යටතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළ විසින් මෙ. ටො. 3,845ක්ද (44%) පෞද්ගලික වගාකරුවන් විසින් මෙ. ටො. 4,944ක්ද (56%) නිපදවන ලදී.

වගු අංක : 3.1.1.2 : 2010 වර්ෂයේ බිත්තර වී නිෂ්පාදනය යටතේ පැවති බිම් ප්‍රමාණය

ප්‍රභවය	බීජ පංතිය	ලියාපදිංචි කරන ලද බිම් ප්‍රමාණය (හෙ.)	පරීක්ෂා කර බලන ලද බිම් ප්‍රමාණය (හෙ.)	පිළිගත් %
පර්යේෂණ ස්ථාන	අභිජනන	5.2	5.2	100
රජයේ ගොවිපළ	අත්තිවාරම්	53	42	100
	ලියාපදිංචි	459	431	100
	සහතික කළ I	132	106	98
	සහතික කළ II	3.5	3.5	100
කොන්ත්‍රාත් වගාකරුවන්	ලියාපදිංචි	12	12	100
	සහතික කළ I	598	551	95
	සහතික කළ II	74	67	92
පෞද්ගලික වගාකරුවන්	ලියාපදිංචි	29	27	98
	සහතික කළ I	3,416	2,974	90
	සහතික කළ II	422	371	90
එකතුව		**5,204**	**4,590**	**88**

වගු අංක : 3.1.1.3 : 2010 වර්ෂයේදී පරීක්ෂා කර බලන ලද බිත්තර වී ප්‍රමාණයන් සහ පිළිගත් ප්‍රතිශතයන්

ප්‍රභවය	පරීක්ෂා කර බලන ලද ප්‍රමාණය (ටො.)	පිළිගත් %
පර්යේෂණ ස්ථාන අභිජනන බීජ	3.7	79
රජයේ ගොවිපළ	2,672	92
කොන්ත්‍රාත් වගාකරුවන්	1,476	95
පෞද්ගලික වගාකරුවන්	6,969	71
එකතුව	11,122	

වෙනත් කෙෂ්ත්‍ර බෝග බීජ සහතික කිරීම

වෙනත් කෙෂ්ත්‍ර බෝග බීජ නිෂ්පාදනය යටතේ ලියාපදිංචි කරන ලද මුළු වගා බිම් ප්‍රමාණය හෙ. 521ක් වූ අතර එයින් 84% ක් සඳහා කොන්ත්‍රාත් වගාකරුවන්ගේ දායකත්වය ලැබිණි. බඩඉරිඟු, මුං, රටකජු, තල, කව්පි, කුරක්කන්, උඳු, සෝයා බෝංචි සහ තෝර පරිප්පු වෙනත් කෙෂ්ත්‍ර බෝග බීජ නිෂ්පාදන වැඩසටහනට ඇතුළත් කෙරිණි. විවිධ බීජ ප්‍රභව සහ පංති යටතේ බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද වගාබිම් ප්‍රමාණයන් වගු අංක 3.1.1.4හි දැක්වේ.

2009 වර්ෂය සමඟ සසඳා බැලූවිට වෙනත් කෙෂ්ත්‍ර බෝග බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද වගාබිම් ප්‍රමාණයේ 50%ක වර්ධනයක් විය.

වගු අංක 3.1.1.4 : 2009 සහ 2010 වර්ෂවල වෙනත් කෙෂ්ත්‍ර බෝග බීජ නිෂ්පාදනය යටතේ පැවති වගාබිම් ප්‍රමාණය

ප්‍රභවය	බීජ පංතිය	2009		2010		
		ලියාපදිංචි කරන ලද වගාබිම් ප්‍රමාණය (හෙ.)	පරීක්ෂා කරන ලද වගාබිම් ප්‍රමාණය (හෙ.)	ලියාපදිංචි කරන ලද වගාබිම් ප්‍රමාණය (හෙ.)	පරීක්ෂා කරන ලද වගාබිම් ප්‍රමාණය (හෙ.)	පිළිගත් %
පර්යේෂණ ස්ථාන	අභිජනක	2.7	2.5	2.8	2.7	100
රජයේ ගොවිපළ	අත්තිවාරම්	24.0	23.0	33.2	30.0	100
	ලියාපදිංචි	18.0	16.0	17.0	14.6	97
	සහතික කළ 1	18.0	13.0	7.9	7.9	100
කොන්ත්‍රාත් වගා කරුවන්	අත්තිවාරම්	0.9	0.9	0.9	0.9	55
	ලියාපදිංචි කළ	41.0	37.0	58.0	53.8	98
	සහතික කළ 1	205.0	177.0	328.0	306.0	97
	සහතික කළ 11	32.0	30.0	49.8	46.0	98
පෞද්ගලික වගාකරුවන්	අත්තිවාරම්	0.4	0.4	2.0	2.0	80
	සහතික කළ 1	2.4	2.4	21.0	20.4	80
	සහතික කළ 11			0.8	0.8	100
එකතුව		**344.4**	**302.2**	**521.4**	**485.1**	

ටො. 267ක් වූ මුළු වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිෂ්පාදනයෙන් 94%ක්ම සහතික කරන ලදී. විවිධ ප්‍රභවයන් යටතේ පරීක්ෂා කර බලන ලද ප්‍රමාණයන් සහ පිළිගත් ප්‍රතිශතයන් වගු අංක 3.1.1.5හි දැක්වේ.

එළවළු බීජ සහතික කිරීම

එලවළු බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද බිම් ප්‍රමාණය හෙ. 197ක් වූ අතර එයින් 45%ක් සඳහා පෞද්ගලික වගාකරුවන්ගේ දායකත්වය ලැබිණි. විවිධ බීජ ප්‍රභව සහ පංති යටතේ ලියාපදිංචි කරන ලද බිම් ප්‍රමාණයන් වගු අංක 3.1.1.6හි දැක්වේ. තක්කාලි, බණ්ඩක්කා, මිරිස්, පතෝල, බෝංචි, වම්බටු, කරවිල, රාබු, වැටකොළු, මාළු මිරිස්, මෑ, පිපිඤ්ඤා, වට්ටක්කා, තම්පලා, කව්පි, දඹල සහ කොමඩු බීජ නිෂ්පාදන වැඩසටහනට ඇතුළත් කරන ලදී. 2009 වර්ෂය සමඟ සැසඳීමේදී 2010 වර්ෂයේදී එලවළු බීජ නිෂ්පාදනය සඳහා ලියාපදිංචි කරන ලද බිම් ප්‍රමාණය 45%කින් වර්ධනය වූ අතර නිපදවන ලද බීජ ප්‍රමාණය දෙගුණ විය.

වගු අංක 3.1.1.5 : 2009 සහ 2010 වර්ෂවලදී පරීක්ෂා කර බලන ලද වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ ප්‍රමාණයන්

ප්‍රභවය	2009		2010	
	පරීක්ෂා කර බලන ලද ප්‍රමාණය (මෙ.ටො.)	පිළිගත් ප්‍රතිශතය %	පරීක්ෂා කර බලන ලද ප්‍රමාණය (මෙ.ටො.)	පිළිගත් %
පර්යේෂණ ස්ථාන	1.4	95	1.9	98
රජයේ ගොවිපළ	28.0	93	22.1	78
කොන්ත්‍රාත් වගාකරුවන්	104.0	95	236.9	36
පෞද්ගලික වගාකරුවන්	2.0	75	6.6	85
එකතුව	**135.4**		**267.5**	

වගු අංක 3.1.1.6 : 2009 සහ 2010 වර්ෂයන්හිදී බීජ ප්‍රභවය සහ පංතිය අනුව එළවළු බීජ නිෂ්පාදන බිම් ප්‍රමාණය පිළිබඳ සාරාංශය

ප්‍රභවය	බීජ පංතිය	2009		2010		
		ලියාපදිංචි කළ බිම් ප්‍රමාණය (හෙ.)	පරීක්ෂා කරන ලද බිම් ප්‍රමාණය (හෙ.)	ලියාපදිංචි කරන ලද බිම් ප්‍රමාණය (හෙ.)	පරීක්ෂා කර බලන ලද බිම් ප්‍රමාණය (හෙ.)	පිළිගත් %
පර්යේෂණ ස්ථාන	අභිජනක	1.5	1.3	1.4	1.3	100
රජයේ ගොවිපළ	මූලික	10.7	10.7	23.5	21.3	100
	සම්මත	29.0	29.0	27.1	22.3	100
කොන්ත්‍රාත් වගා කරුවන්	මූලික	0.3	0.3	2.8	1.7	95
	සම්මත	35.7	33.0	53.9	49.4	96
පෞද්ගලික වගාකරුවන්	සම්මත	58.7	49.0	88.5	74.2	99
එකතුව		**135.9**	**123.3**	**197.2**	**170.2**	

වසර තුළ එළවළු සහ පලතුරු බීජ ටො. 70ක් අතරින් ටො. 54ක් සහතික කරන ලදී. විවිධ ප්‍රභවයන් යටතේ පරීක්ෂා කරන ලද සහ පිළිගත් ප්‍රතිශතයන් වගු අංක 3.1.1.7හි දැක්වේ.

බීජ අර්තාපල් සහතික කිරීම

විවිධ බීජ අර්තාපල් පංතිවලට අදාළව වගා කරන ලද බිම් ප්‍රමාණයන් වගු අංක 3.1.1.8හි දැක්වේ. බීජ අර්තාපල් වගා කරන ලද සමස්ත බිම් ප්‍රමාණය හෙ. 52ක් වූ අතර ප්‍රචලිත අර්තාපල් ප්‍රභේද 2කට (ග්‍රැනෝලා සහ ඩිසයිරී) අයත් බීජ අර්තාපල් ටො. 709ක් සහතික කරන ලදී. එමෙන්ම, විශේෂ බීජ අර්තාපල් වැඩසටහන යටතේ ආරක්ෂිත ගෘහ තුළ නිපදවන ලද කුඩා ආකන්ද 445,609ක්ද සහතික කරන ලදී.

බීජ පරීක්ෂා කිරීම

පේරාදෙණිය, මහඉලුප්පල්ලම, අලුත්තරම සහ බටඅත යන කෘෂිකර්ම දෙපාර්තමේන්තු බීජ පරීක්ෂණාගාරවලදී බීජ නියැදි 8,950ක් ඒවායෙහි තත්වය සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා පරීක්ෂා කර බලන ලදී.

රෝපණ ද්‍රව්‍ය සහතික කිරීම

රජයේ සහ පෞද්ගලික පැළ තවාන්වල නිපදවූ පලතුරු පැළ 202,276ක් සහතික කර ලේබල් කරන ලදී (වගු අංක 3.1.1.9).

පැළ තවාන් ලියාපදිංචි කිරීම

2010 වර්ෂය තුළ පැළ තවාන් 222ක් ලියාපදිංචි කරන ලදී.

වගු අංක 3.1.1.7 : 2009 සහ 2010 වර්ෂවල එළවළු බීජ නිෂ්පාදන ප්‍රමාණයන්

ප්‍රභවය	2009		2010	
	පරීක්ෂා කර බලන ලද ප්‍රමාණය (ටො.)	පිළිගත් %	පරීක්ෂා කර බලන ලද ප්‍රමාණය (ටො.)	පිළිගත් %
පර්යේෂණ ස්ථාන	0.6	100	0.4	82
රජයේ ගොවිපළ	6.0	95	9.4	99
කොන්ත්‍රාත් වගාකරුවන්	12.8	94	24.2	84
පෞද්ගලික වගාකරුවන්	13.7	85	36.2	68
එකතුව	**33.1**		**70.2**	

වගු අංක 3.1.1.8 : 2009 සහ 2010 වර්ෂවල බීජ අර්තාපල් නිෂ්පාදනය යටතේ පැවති බිම් ප්‍රමාණය

ප්‍රභවය	පංතිය	2009		2010	
		ලියාපදිංචි කළ බිම් (හෙ.)	පිළිගත් බිම් ප්‍රමාණය	ලියාපදිංචි කළ බිම් ප්‍රමාණය (හෙ.)	පිළිගත් බිම් ප්‍රමාණය (හෙ.)
රජයේ ගොවිපළ	පූර්ව මූලික	0.38	0.38	0.10	0.10
	මූලික	48.93	38.13	13.28	12.28
	සහතික කළ	0.92	0	25.87	24.01
පෞද්ගලික වගාකරුවන්	සහතික කළ	64.00	54.00	13.00	12.90
එකතුව		**114.23**	**92.51**	**52.25**	**49.29**

වගු අංක 3.1.1.9 : 2009 සහ 2010 වර්ෂවලදී සහතික කළ බද්ධ පලතුරු පැළ සංඛ්‍යාව

විශේෂය	සහතික කරන ලද පලතුරු පැළ සංඛ්‍යාව	
	2009	2010
අඹ - බද්ධ කරන ලද	124,884	99,565
රඹුටන් - බද්ධ කරන ලද	92,683	63,960
දොඩම් - බද්ධ කරන ලද	60,753	30,572
ජමනාරං	3,072	6,854
අලිපේර	907	580
දූරියන්	370	304
වරකා	80	441
එකතුව	**282,749**	**202,276**

මව් ශාක සහතික කිරීම

අඹ, රඹුටන්, දොඩම්, ජමනාරං, පෙයාර්ස්, දූරියන් සහ වරකා ශාක 697ක් තෝරා ලියාපදිංචි කරන ලදී.

වගු අංක 3.1.1.10 : 2010 වර්ෂයේදී ලියාපදිංචි කරන ලද මව් ශාක සංඛ්‍යාව

විශේෂය	ලියාපදිංචි කරන ලද පැළ සංඛ්‍යාව
අඹ - බද්ධ කරන ලද	42
රඹුටන් - බද්ධ කරන ලද	346
දොඩම් - බද්ධ කරන ලද	163
ජමනාරං	61
පෙයාර්ස්	77
දූරියන්	1
වරකා	7
එකතුව	**697**

පශ්චාත් පාලන පරීක්ෂාව

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සහතික කරන ලද බීජ නියැදි හා විවිධ බෝග ප්‍රභේදවලට අයත් ආනයනය කරන ලද බීජද ඇතුළු බීජ නියැදි 445ක් ඇගයීම සඳහා පශ්චාත් පාලන පරීක්ෂා සිදු කරන ලදී. විවිධ බෝග කාණ්ඩ යටතේ සිදු කරන ලද පශ්චාත් පාලන පරීක්ෂා සංඛ්‍යාව වගු අංක 3.1.1.11හි දැක්වේ.

වගු අංක 3.1.1.11 : පශ්චාත් පාලන පරීක්ෂා

බෝග කාණ්ඩය	පරීක්ෂා කර බලන ලද ක්ෂේත්‍ර සංඛ්‍යාව
වී	152
වෙනත් ක්ෂේත්‍ර බෝග	178
එළවළු	108
පලතුරු	7
එකතුව	**445**

විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පරීක්ෂා කර බැලීම

ගන්නොරුව පශ්චාත් පාලන පරීක්ෂණ ක්ෂේත්‍රයේදී වී ප්‍රභේද 9ක් ඒවායෙහි විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව සම්බන්ධයෙන් පරීක්ෂා කර බලන ලදී. එමෙන්ම එළවළු ප්‍රභේද 15ක්ද වෙනත් ක්ෂේත්‍ර බෝග ප්‍රභේද 7ක්ද මුල් හා ආකන්ද බෝග ප්‍රභේද 1ක්ද පරීක්ෂාවට ලක් කෙරිණි. වර්ෂය තුළ වී ප්‍රභේද 2ක, එළවළු ප්‍රභේද 2ක, මුල් හා ආකන්ද බෝගයක සහ වෙනත් ක්ෂේත්‍ර බෝගයක විශේෂත්වය, ඒකාත්මිකතාව සහ ස්ථායිතාව පරීක්ෂා කිරීම නිම කෙරිණි.

වගු අංක 3.1.1.12 : සිදු කරන ලද විශේෂත්ව. ඒකාත්මිකතා සහ ස්ථායිතා පරීක්ෂණ සංඛ්‍යාව

බෝග කාණ්ඩය	සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව	නිම කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව
වී	9	2
වෙනත් ක්ෂේත්‍ර බෝග	7	1
එළවළු	15	5
මුල් හා ආකන්ද බෝග	1	1
එකතුව	**32**	**9**

බීජ පනත ක්‍රියාත්මක කිරීම

මෙරට කෘෂිකර්මාන්තයේ වැදගත් අංශයක් වන බීජ කර්මාන්තයට හානිකර අයථා කටයුතුවලින් ගොවීන් මෙන්ම බීජ හසුරුවන්නන්ද

ආරක්ෂා කිරීමේ අරමුණ ඇතිව 2008 වර්ෂයේ සිට 2003 අංක 22 දරන බීජ පනත ක්‍රියාත්මක කෙරෙමින් තිබේ. දැනට පවතින ව්‍යවස්ථාපිත විධිවිධාන ශක්තිමත් කිරීම හා බීජ පනත සඳහා යෝජිත සංශෝධන සකස් කිරීමේ කටයුතු නිම කිරීම පිණිස නීති උපදේශකයින්ගේ සහභාගිත්වය ඇතිව තෙදින වැඩමුළුවක් පවත්වන ලද අතර දැනට ක්‍රියාත්මක බීජ පනත අහෝසි කිරීමට අවසානයේදී තීරණය විය. අහෝසි කළ බීජ පනතෙහි කෙටුම්පතක් පිළියෙල කර අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම පිණිස අදාළ නිලධාරීන්ට ලබාදෙන ලදී.

බීජ පනත යටතේ වසර තුළ බීජ හසුරුවන්නන් 777දෙනෙකුට ලියාපදිංචිය ලබා දෙන ලදී. ලැබුණු පැමිණිලි 5ක් සම්බන්ධයෙන් පරීක්ෂණ පවත්වා පනත උල්ලංඝනය කළ පුද්ගලයින්ට එරෙහිව අවශ්‍ය පියවර ගන්නා ලදී. මෙම පනත පිළිබඳව පුවත්පත් ලිපි 3ක් (ලංකාදීප පත්‍රයෙහි 2ක් සහ සිරිකත පත්‍රයෙහි 1ක් වශයෙන්) පළ කර ගුවන්විදුලි වැඩසටහන් 8ක් (රජරට සේවයෙහි 2ක්, කඳුරට සේවයෙහි 2ක්, රන්ගිරි දඹුළු සේවයෙහි 4ක් වශයෙන්) විකාශනය කෙරිණි. එමෙන්ම ලියාපදිංචි කිරීමේ සහතික නිකුත් කිරීම සහ බීජ පනතෙහි විධිවිධාන සම්බන්ධයෙන් දිවයින පුරා සිටින බීජ හසුරුවන්නන් දැනුවත් කිරීම පිණිස දැනුවත් කිරීමේ වැඩසටහන් 25ක්ද පවත්වන ලදී. දිවයින පුරා බීජ පනත ක්‍රියාත්මක කිරීමේ කටයුතු ශක්තිමත් කිරීම පිණිස ප්‍රාදේශීය ඒකක සඳහා ආසන 14කින් යුතු වෑන් රථයක් සහ යතුරු පැදි 8ක් මිලදී ගන්නා ලදී.

පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්

පහත දැක්වෙන අධ්‍යයන ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු ඉටු කෙරිණි.

- ඇසුරුම් කළ එළවළු සඳහා කල් ඉකුත්වීමේ දිනය
- පලතුරු පැළ සහතික කිරීමේ වැඩසටහන සම්බන්ධයෙන් නිතිපතා ඇතිවන ගැටලු සඳහා විද්‍යාත්මක විසඳුම්
- ආනයනය කළ බීජ තොග ආශ්‍රිත අවදානම
- විවිධ ඇසුරුම් ද්‍රව්‍යවලින් ජල වාෂ්ප ගමන් කරන ආකාරය

පුහුණු වැඩසටහන්

උසස් තත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳව නිලධාරීන්ගේ සහ බීජ පරිහරණය කරන්නන්ගේ දැනුම වර්ධනය කරලීම පිණිස බීජ සහතික කිරීමේ සේවය විසින් පුහුණු වැඩසටහන් අබණ්ඩව සිදු කරන ලදී.

වගු අංක 3.1.1.13 පුහුණු කරන ලද පුහුණුකරුවන් සංඛ්‍යාව

පුහුණු වැඩසටහන්	පුහුණුකරුවන් සංඛ්‍යාව
බීජ ගොවීන්/පැළ තවාන් කරුවන්	1098
පෞද්ගලික අංශය	40
රජයේ නිලධාරීන්	554
අලෙවිකරුවන්	588
එකතුව	**2,280**

බීජ සහතික කිරීමේ සේවා තොරතුරු ක්‍රමය

තොරතුරු කළමනාකරණය සඳහා දත්ත ආපසු ලබා ගැනීම හා විශ්ලේෂණය පහසු කිරීම පිණිස දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය බීජ සහතික කිරීමේ සේවා ස්ථාන 22, බීජ පරීක්ෂණ විද්‍යාගාර 4 සහ පශ්චාත් පාලන ඒකක 4 සම්බන්ධ කිරීම මඟින් බීජ සහතික කිරීම පිළිබඳ දත්ත මූලය වැඩිදියුණු කිරීම අබණ්ඩව සිදු කෙරිණි. ප්‍රධාන කාර්යාලයේ, ප්‍රාදේශීය ඒකකවල, විද්‍යාගාරවල සහ පශ්චාත් පාලන ඒකකවල සේවය කරන සියලුම කාණ්ඩවල සේවකයින් පිළිබඳ පෞද්ගලික දත්ත රැස් කෙරෙන නව දත්ත මූලයක සැලසුම් කටයුතු නිම කෙරිණි. අවශ්‍ය විට තොරතුරු ලබා ගැනීම සඳහා බීජ පනත යටතේ ලියාපදිංචි කළ බීජ හසුරුවන්නන් පිළිබඳ දත්ත මූලයද නඩත්තු කෙරිණි.

2011 වර්ෂය සඳහා සැලැස්ම

- ජාතික බිත්තර වී අවශ්‍යතාවෙන් 31%ක් සහතික කළ බීජ මඟින් සපුරා ගැනීමේ ඉලක්කය ළඟාකර ගැනීම සඳහා බීජ සහතික කිරීමේ සේවය බල ගැන්වීම
- බීජ මඟින් පැතිරෙන ව්‍යාධිජනක හඳුනා ගැනීම මඟින් බීජ ස්වස්ථතාව වර්ධනය කිරීම සඳහා බීජ ස්වස්ථතා පරීක්ෂණ ඒකකය වැඩිදියුණු කිරීම
- විශේෂයෙන්ම බීජ ඇසුරුම් කිරීම, ගබඩා කිරීම සහ කල් ඉකුත්වීමේ දින සම්බන්ධයෙන් බීජ පරිහරණය කරන්නන්ට මතු වූ ගැටලුවලට අදාළ පර්යේෂණ කිරීම සඳහා බීජ පර්යේෂණ ඒකකය වැඩිදියුණු කිරීම
- දූෂණ කාරක වන වල් පැළෑටි බීජ හඳුනා ගැනීම, නව පැළෑටි ආක්‍රමණ පිළිබඳ අවදානම තක්සේරු කිරීම සහ විශේෂයෙන්ම ආනයනය කරන බීජ හරහා ආක්‍රමණශීලී වල් පැළෑටි විශේෂ පැමිණීම වැළැක්වීම උදෙසා ආක්‍රමණශීලී හා හානිකර වල් පැළෑටි පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා වල් පැළෑටි විද්‍යා ඒකකයක් ස්ථාපිත කිරීම

- පරිගණක ජාලය වැඩිදියුණු කිරීම – බීජ සහතික කිරීමේ වැඩසටහනේ කාර්යක්ෂමතාව උපරිම කිරීම සඳහා පරිගණක ජාලගත කිරීම පිණිස බීජ සහතික කිරීමේ සේවා ප්‍රධාන කාර්යාලය ප්‍රාදේශීය ඒකක, බීජ විද්‍යාගාර සහ පශ්චාත් පාලන ඒකක සමඟ සම්බන්ධ කිරීම
- පරිගණක ජාල ක්‍රමය උපයෝගී කර ගනිමින් බීජ විද්‍යාගාර වාර්තා සකස් කිරීම සඳහා මෘදුකාංග හඳුන්වාදීම
- පරිගණකය මඟින් බීජ විද්‍යාගාර වාර්තා කාබන් පිටපත් සහිතව ලබා ගැනීමේ නව ක්‍රමයක් හඳුන්වාදීම
- මහජනයා දැනුවත් කිරීමට, බීජ සහතික කිරීමේ වැඩසටහන පිළිබඳ තොරතුරු ප්‍රචාරණය වැඩිදියුණු කිරීමට සහ තොරතුරු අඩවියට පහසුවෙන් ප්‍රවිශ්ට වීමට හැකිවන අයුරින් බීජ සහතික කිරීමේ සේවයේ තොරතුරු අඩවිය සැලසුම් කිරීම
- බීජ සහතික කිරීමේ සේවා දත්ත මූලයේ කළමනාකරණ කටයුතු, බීජ පනත පිළිබඳ දත්ත මූලය සහ බීජ පරීක්ෂණ ප්‍රතිඵල සහිත වාර්තාවල ස්වරූපය වැඩිදියුණු කිරීම පිණිස මෘදුකාංග වැඩිදියුණු කිරීම
- බීජ කර්මාන්තය තුළ සිදුවන අයථා කටයුතු වළක්වාලන අතර දිවයිනෙහි උසස් තත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයුමක් ඇති කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශවල බීජ පරිහරණය කරන්නන් අතර බීජ නිෂ්පාදන ක්‍රියාවලිය විධිමත් කිරීම පිණිස බීජ පනත ක්‍රියාත්මක කිරීම
- බීජ පනත යටතේ ලියාපදිංචි වී ඇති සියලුම බීජ පරිහරණය කරන්නන් අතර බෙදා හැරීම සඳහා උසස් තත්වයේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම
- ඒ ඒ වගා කන්නය තුළ බීජ නිෂ්පාදකයින්ගේ නාමාවලියක් සහ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදකයින්ගේ නාමාවලියක් පිළියෙල කර බෙදා හැරීම
- පලතුරු පැළ සඳහා නව ලේබලයක් හඳුන්වාදීම
- "අපි වවමු-රට නගමු" වැඩසටහන යටතේ ප්‍රාදේශීය ඒකක 20ක බීජ නිෂ්පාදක ගම්මාන ස්ථාපිත කිරීම
- ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය ඒකකවල ඵලදායිතාව ඉහළ නැංවීම සහ කාර්යාල කළමනාකරණය වැඩිදියුණු කිරීම
- "ඵලදායිතාව ඉහළ නැංවෙන අයුරින් සහ මෙරට ගොවි ප්‍රජාවට වඩා ඉහළ මට්ටමේ සේවයක් සැලසෙන අයුරින් ප්‍රධාන කාර්යාලය මඟින් ඉටු කෙරෙන කටයුතු සිත්ගන්නා සුළු අන්දමින් කරගෙන යාම" යන්න 2011 වර්ෂය සඳහා බීජ
- සහතික කිරීමේ සේවයේ තේමාව වශයෙන් හඳුනා ගැනීම
- බීජ පරිහරණය කරන්නන් වෙනුවෙන් බෝග පිළිබඳ මාර්ගෝපදේශ ප්‍රකාශයට පත් කිරීම
- අලුතින් සංශෝධනය කරන ලද බීජ ජනත හා විධිවිධාන පිළිබඳ වැඩකටයුතු අවසන් කිරීම

කාර්ය මණ්ඩලය

තනතුර	සේවක/ නිලධාරී සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිලධාරී	02
කෘෂිකර්ම නිලධාරී	05
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරී	06
වැඩසටහන් සහකාර	04
කෘෂිකර්ම උපදේශක	106
පර්යේෂණ සහකාර	02
පර්යේෂණ උප සහකාර	05
රාජ්‍ය කළමනාකරණ සහකාර	11
රියදුරු	15
විදුලි ශිල්පි	1
මුරකරු	15
කම්කරු	50
බීජ කාර්මික	13
බීජකරු	1
කාර්යාල කාර්ය සහායක	1
එකතුව	**238**

3.1.2 පැළෑටි සංරක්ෂණ සේවය - ගන්නොරුව

පැළෑටි සංරක්ෂණ සේවයට පැවරී ඇති වගකීම වන්නේ ගොවි ක්ෂේත්‍ර තත්වයන් යටතේ පාරිසරික වශයෙන් හිතකර එමෙන්ම ආර්ථිකමය වශයෙන් වාසිදායී සහ ප්‍රායෝගිකව භාවිත කළ හැකි පළිබෝධ පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීමයි. දැනට ඇති පළිබෝධ කළමනාකරණ තාක්ෂණික ක්‍රම වැඩිදියුණු කරන අතරම ක්ෂේත්‍ර මට්ටමේ සමෝධානික පළිබෝධ කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, මෙහෙයවීම සහ ඇගයීම මඟින් මෙම පුළුල් අරමුණ ළඟාකර ගැනීමට අපේක්ෂා කෙරේ.

පළිබෝධ හා රෝග පැතිරීම පාලනය කිරීම, බීජ සහ පාංශු ධූමකරණය සහ කෘෂිකාර්මික හා ජලජ පරිසරයන්හි ඇති විදේශීය ආක්‍රමණික විශේෂ ඇතුළු සමහර හානිකර ආක්‍රමණශීලි වල් පැළ කළමනාකරණය කිරීම පැළෑටි සංරක්ෂණ සේවයට වගකීම පැවරී ඇති කාර්යයන් වේ.

විශේෂිත පළිබෝධ පාලනය සම්බන්ධ උපදේශක සේවා සැපයීමද පැළෑටි සංරක්ෂණ සේවය මඟින් ඉටු කෙරේ. මෙම කාර්යයන් තුළින් 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනත මඟින් පවරා ඇති වගකීමෙන් විශාල කොටසක් ආවරණය කෙරේ.

මෙම ආයතනය, ගොවි ක්ෂේත්‍රවල නියමු මට්ටමින් නව පළිබෝධනාශක ඇගයීම මඟින් 1981 පළිබෝධනාශක පනත ක්‍රියාත්මක කිරීමෙහිලා අතිරේක කාර්යභාරයක්ද ඉටු කරයි.

අයවැය

2010 වර්ෂයට අදාළ වාර්ෂික අයවැය පහත වගුවේ දැක්වේ.

ප්‍රගතිය

වගු අංක :- 3.1.2.1 : වාර්ෂික අයවැය - 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම
පුනරාවර්තන	1,888,500	1,637,088
මූලධන	3,205,000	2,564,604
ව්‍යාපෘති		
ආහාර හා කෘෂිකර්ම සංවිධානය/සමෝධානික පළිබෝධ හා වාහක කළමනාකරණ ව්‍යාපෘතිය	160,000	92,985
එකතුව	**5,253,500**	**4,294,677**

සමෝධානික පළිබෝධ කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම

වී සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණය

මෙම වැඩසටහනෙහි අරමුණ කෘත්‍රිම පළිබෝධනාශක භාවිතය අවම කරන අතර අඩු පිරිවැයැති එමෙන්ම පාරිසරික වශයෙන් හිතකර පළිබෝධ කළමනාකරණ ක්‍රමෝපාය භාවිත කිරීම මඟින් ප්‍රධාන වී වගා ප්‍රදේශවලින් තිරසාර වී නිෂ්පාදනයක් ලබා ගැනීම සඳහා තාක්ෂණික සහය ලබා දීමයි.

2010 වර්ෂයේදී පහත දැක්වෙන කාර්යයන් නිම කරන ලදී.

- වී වගාවේදී යොදා ගන්නා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් පිළිබඳව අගුණකොළපැලැස්ස සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළ කළමනාකරුවන් 27දෙනෙකු සඳහා පුහුණු වැඩසටහනක් පැවැත්වීම
- අම්පාර දිස්ත්‍රික්කයේ තෝරාගත් ව්‍යාප්ති නිලධාරීන් 18දෙනෙකු සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් පැවැත්වීම
- මහවැලි අධිකාරියේ සී කලාපයේ ව්‍යාප්ති නිලධාරීන් 56දෙනෙකු පුහුණු කිරීම
- වී සහ එළවළුවලට අදාළ සමෝධානික පළිබෝධ කළමනාකරණය පිළිබඳව "ඇග්ස්ටාර්" සමාගමේ නිලධාරීන් 60දෙනෙකු පුහුණු කිරීම

එළවළුවල සමෝධානික පළිබෝධ කළමනාකරණය

ප්‍රදේශයේ ව්‍යාප්ති නිලධාරීන්ගේ සහයෝගය ඇතිව බෝංචි වගාකරන්නන් සඳහා රිකිල්ලගස්කඩ ප්‍රදේශයේ ගොවි ක්ෂේත්‍ර පාසැල් වැඩසටහනක් පැවැත්විණි.

බෝංචි කහපැහැ ගැන්වීම පාලනය කිරීම සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් අනුගමනය කිරීම සම්බන්ධයෙන් කන්නය තුළ ගොවීන් 20දෙනෙකු පමණ පුහුණු කිරීම පිණිස ගොවි ක්ෂේත්‍ර පාසැල් ප්‍රවේශය යොදා ගනිමින් පුහුණු සැසි 10ක්ද පවත්වන ලදී. මිරිස් පිළිබඳ සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් සම්බන්ධයෙන් මහවැලි අධිකාරියේ "එච්" කලාපයේ නිලධාරීහු 22දෙනෙක්ද පුහුණු කරන ලදහ.

කොළ එළවළුවලට අදාළ සමෝධානික පළිබෝධ කළමනාකරණය

කොළ එළවළුවලට අදාළව සමෝධානික කළමනාකරණය ව්‍යාප්ත කිරීම සම්බන්ධයෙන් වැඩිදුරටත් ගවේෂණය කර කොළඹ දිස්ත්‍රික්කයේ කොළ එළවළු වගාකරුවන්ට තාක්ෂණික සහාය ලබාදෙන ලදී.

කොළ එළවළු පිළිබඳ සමෝධානික පළිබෝධ කළමනාකරණ පිළිවෙත් සම්බන්ධයෙන් බස්නාහිර පළාතේ අලුතින් බඳවාගත් කෘෂිකර්ම උපදේශකයින් 17දෙනෙකුටද පුහුණුව ලබා දෙන ලදී.

පළිබෝධනාශක නියමු මට්ටමින් පරීක්ෂාකර බැලීම

පහත දැක්වෙන නව පැළෑටිනාශකවල පේව කාර්යක්ෂමතාව දැන ගැනීම සඳහා ගොවි ක්ෂේත්‍රවලදී ඇගයීමට ලක් කෙරිණි. ඉලක්කගත කාර්යය සඳහා වඩා විශේෂිතවීමත් සාපේක්ෂව අඩු ප්‍රමාණයන්ගෙන් යෙදිය හැකිවීමත් නිර්දේශිත පැළෑටිනාශක සමඟ සැසඳීමේදී මෙම පැළෑටිනාශක සතු අමතර වාසි වේ.

වී වගාවේ වල් පැළ පාලනය සඳහා යොදාගත හැකි පැළෑටිනාශක

- වී වගාවේ තෘණ, පන් වර්ග සහ පුළුල් පත්‍ර පාලනය සඳහා දැනට නිර්දේශිත පයිරිබෙන්සොසිම් 5% (පයන්කෝර්) සම්මිශ්‍රණයට විකල්පයක් වශයෙන් පයිරිබෙන්සොසිම් 3% EC නිර්දේශ කෙරිණි.
- වී වගාවේ තෘණ, පන් වර්ග සහ පුළුල් පත්‍ර පාලනය සඳහා දැනට නිර්දේශිත බිස්පයිරිබැක් සෝඩියම්වලට (නොමිනී) විකල්පයක් වශයෙන් බිස්පයිරිබැක් සෝඩියම් 20% WP නිර්දේශ කෙරිණි.

බඩඉරිඟුවල වල් පැළ පාලනය සඳහා යොදා ගත හැකි පැළෑටිනාශක

- බඩඉරිඟු වගාවේ වාර්ෂික වල් පැළ පාලනය කිරීම සඳහා පසු නිර්ගමන පළිබෝධනාශකයක් වශයෙන් ටොප්‍රමසෝන් නිර්දේශ කෙරිණි. මෙම සම්මිශ්‍රණය හෙ. 1කට මි.ලී. 100 බැගින් යෙදීම ඵලදායී වන අතර බීජ වැපිරීමෙන් දින 15කට පමණ පසුව යෙදීම සුදුසු වේ.

ආක්‍රමණික විශේෂ පාලනය

සැල්වීනියා පේව විද්‍යාත්මකව පාලනය කිරීම

පේව පාලන කාරක කෘමියා (*Cyrtobagous salviniae*) වර්ධනය කර නඩත්තු කර ඉන්පසු දිවයින පුරා ඇති සැල්වීනියා පැතිරුණු ජලාශ ආදියට මුදාහැර සාර්ථක ප්‍රතිඵල ලබා ගැනිණි.

මේ සම්බන්ධයෙන් ගොවි සංවිධාන දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා පේව පාලන කාරකයා (*Cyrtobagous salviniae*) මොණරාගල, මහනුවර, මාතලේ, කුරුණෑගල, අනුරාධපුර සහ ගම්පහ යන දිස්ත්‍රික්කවල පිහිටි වැව් 14කට හඳුන්වා දෙන ලදී. කෘමියා මාස කිහිපයක් තුළ වල් පැළෑටිය සාර්ථකව පාලනය කළ බව සමහර ගොවි සංවිධාන විසින් වාර්තා කරන ලදී.

ජපන් ජබර පේව විද්‍යාත්මකව පාලනය කිරීම

පේව පාලන කාරකයින් දෙදෙනෙකු (*Neochetina bruchi* හා *Neochetina eichorniae*) වර්ධනය කිරීමෙන් හා නඩත්තු කිරීමෙන් පසු එම කෘමීන් මාතලේ, අනුරාධපුර, කුරුණෑගල, මොණරාගල, හම්බන්තොට සහ මහනුවර යන දිස්ත්‍රික්කවල ජපන් ජබර පැතිරුණු වැව් 12කට හඳුන්වා දෙන ලදී.

1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බලය ලත් නිලධාරීන් සඳහා පැවති පුහුණු වැඩසටහන

පේරවල මූල ගැටිති ඇති කරන නෙමටෝඩාවා (*Meloidogyne* spp.) පාලනය කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කරමින් පළිබෝධ පැතිරීමේ වත්මන් වර්ධනයන් පිළිබඳව 1999 අංක 35 දරන පැළෑටි සංරක්ෂණ පනත යටතේ පත් කරන ලද බලයලත් නිලධාරීන් සඳහා එක්දින වැඩමුළුවක් පවත්වන ලදී.

ඇලිගේටර් වල් පැළෑටිය (*Alternanthera philoxeroides*) රසායනිකව පාලනය කිරීම

නුවරඑළිය නගර සීමාව තුළ පහත් බිමක් වශයෙන් පිහිටි මිටියාවතක් වන බැරැක් තැන්නෙහි පැවති විශාල ඇලිගේටර් වල් පැළෑටි ගහනයක් පාලනය කරන ලදී. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ

සහයෝගය ඇතිව රසායනිකව වල් පැළ පාලනය කිරීමේ වැඩසටහනක් පවත්වා හෙ. 15ක පැතිර තිබූ වල් පැළ පැළෑටිනාශක යොදා සාර්ථකව පාලනය කෙරිණි.

බීජ ධූමකරණය

ගබඩා පළිබෝධවලින් ආරක්ෂා කිරීම පිණිස පහත සඳහන් බීජ ප්‍රමාණයන් කුණ්ඩසාලේ, පැල්වෙහෙර, පොළොන්නරුව, රිකිල්ලගස්කඩ සහ අලුත්තරම රජයේ ගොවිපළවලදී ධූමකරණය කෙරිණි.

බිත්තර වී	ටො. 328
පරිභෝජනය සඳහා ගන්නා වී	ටො. 20
වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ (බඩඉරිඟු, කව්පි ආදිය)	ටො. 320
එළවළු බීජ	ටො. 31

පුත්තලම දිස්ත්‍රික් ලේකම්වරයාගේ පාලනය යටතේ පවතින රජයේ ආහාර ගබඩාවල පැවති පහත දැක්වෙන ආහාර ද්‍රව්‍ය ප්‍රමාණයන්ද ධූමකරණය කෙරිණි.

වී	ටො. 47
පරිප්පු	ටො. 13
පිටි	ටො. 6

වේයන් පාලනය කිරීම

පේරාදෙණිය හා ගන්නොරුවෙහි පිහිටි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි රැසක හා ගබඩාවත්ත, ගන්නොරුව සහ ලබුදූව වැනි පර්යේෂණ ස්ථානවල වේයන් ආසාදනය වීම පාලනය කිරීම සඳහා පියවර ගැනිණි.

එමෙන්ම රාජකීය උද්භිද උද්‍යානයෙහි ඉල්ලීම මත පේරාදෙණිය සහ ගම්පහ උද්භිද උද්‍යානවල වේ ආසාදන පාලනයටද පියවර ගැනිණි.

මීයන් පාලනය

කැගල්ල දිස්ත්‍රික්කයේ ව්‍යාප්ති නිලධාරින් සහ ගොවීන් සඳහා ක්ෂේත්‍රයේ සිටින මීයන් පාලනය කිරීම පිළිබඳ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී. මීයන් බෝවීම දිස්ත්‍රික්කයේ වගා ප්‍රදේශ රැසක ප්‍රධාන ගැටලුවක්ව පැවතිණි. මෙම වැඩසටහන සඳහා ගොවීහු සහ නිලධාරීහු 350ක් පමණ සහභාගි වූහ.

එයට අමතරව, කැගල්ල දිස්ත්‍රික්කයට අයත් ගලිගමුව ප්‍රදේශයේදී මීයන් පාලනය කිරීම සම්බන්ධ ක්ෂේත්‍ර ආදර්ශනයක් පවත්වන ලදී.

සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ වසංගත රෝග විද්‍යා, ඒකකයේ ඉල්ලීම පරිදි වවුනියාව දිස්ත්‍රික්කයට අයත් මඩු ප්‍රදේශයේදී මීයන් කලමනාකරණය කිරීමේ විශේෂ වැඩසටහනක්ද පැවැත්විණි.

පේරවල සිටින මූල ගැටිති නෙමටෝඩාවන් (*Meloidogyne* spp.)

2010 වර්ෂයේදී පුත්තලම, අනුරාධපුරය සහ කළුතර යන දිස්ත්‍රික්ක තුළ පේරවල මූල ගැටිති නෙමමෝඩාවා ඇතිවීමේ ගැටලුව වසංගත මට්ටමට ළඟාවිය.

තේ පර්යේෂණ ආයතනය, සීතාඑළිය කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය සහ යටෝක්ත දිස්ත්‍රික්කවල පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල සමඟ සහයෝගයෙන් පැළෑටි සංරක්ෂණ සේවය මහජනයා සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් පවත්වා පාලන කටයුතු ක්‍රියාවට නැංවීම පිණිස ඔවුන්ගේ සහයෝගය ලබා ගන්නා ලදී.

පේර වගා කරන්නන් දැනුවත් කිරීමේ වැඩසටහන්වලදී යොදා ගැනීම පිණිස සිංහල සහ දමිළ භාෂාවලින් පත්‍රිකාවක් සහ පෝස්ටරයක් සකස් කෙරිණි. එයට අමතරව, තවත් පත්‍රිකාවක් ව්‍යාප්ති සේවය හරහා ඒ ඒ දිස්ත්‍රික්කයේ සිටින පැළ තවාන් හිමියන් අතර බෙදා හරින ලදී.

එමෙන්ම එම ගැටලුව සම්බන්ධයෙන් දැනුවත් කර පැළ තවාන් මට්ටමින් පාලන පියවර හඳුන්වාදීම සඳහා, ලියාපදිංචි පැළ තවාන් හිමියන් 250දෙනෙකු වෙනුවෙන් බීජ සහතික කිරීමේ සේවයේ සහයෝගය ඇතුව පුහුණු වැඩසටහනක්ද සංවිධානය කරන ලදී.

එම ගැටලුව හඳුනාගෙන කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් සීතාඑළිය පර්යේෂණ ස්ථානයෙහි සහ තලවකැලේ තේ පර්යේෂණ

ආයතනයේ කීට විද්‍යාඥයින්ගේ සහාය ඇතිව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයෙන් තෝරාගත් විෂයානුගත විශේෂඥයින් සහ කෘෂිකර්ම විද්‍යාල වලින් තෝරාගත් කථිකාචාර්යවරුන් සඳහා එක්දින දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

වෙනත් කාර්යයක් (මෑතකදී හඳුනාගත් කෘමි පළිබෝධ)

කෙසෙල් පිටිමකුණා

2009 වර්ෂයේ උතුරු නැගෙනහිර පළාතේ කෙසෙල් වගාවන්ගෙන් ඩයිස්මිකොකස් නියොබ්‍රෙව්පෙස් (*Dysmicoccus neobrevipes*) වශයෙන් හඳුනා ගන්නා ලද නව පිටිමකුණු වර්ගයක් වාර්තා විණි.

පළිබෝධයා හඳුනා ගැනීම සහ පාලනය කිරීම සම්බන්ධයෙන් පත්‍රිකාවක් පිළියෙළ කර ප්‍රදේශයේ සිටින සියලුම කාණ්ඩවල රාජ්‍ය නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් පවත්වා පාලන පියවර ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුන්ගේ සහයෝගය ලබා ගැනිණි.

එයට අමතරව, පළිබෝධයා ආසාදිත ප්‍රදේශවල කෙසෙල් වගාකරුවන් සහ පැළ තවාන් හිමියන්

සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක්ද පවත්වන ලදී.

පිටි මකුණා සහ පේර ගෙඩි විදින කෘමියා

දිවයිනේ සමහර පළාත්වල ඇති විවිධ ශාක වර්ගවල අනෙකුත් පිටිමකුණු වර්ග පැතිරී ඇති අයුරු උද්‍යාන බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයේ කීට විද්‍යාඥයන්ගේ සහාය ඇතිව සොයා ගැනුණු අතර එම පැතිරීම පාලනය කිරීම සඳහා පියවර ගැනිණි.

පූජනීය බෝධි වෘක්ෂවල ඇති වූ පළිබෝධ හා රෝග

ඉල්ලීම පරිදි ඓතිහාසික විහාරස්ථාන රැසකට අයත් බෝධි වෘක්ෂ ගණනාවකට පිළියම් යොදන ලදී.

කෘෂිකාර්මික ප්‍රදර්ශන

විවිධ පළිබෝධ සහ පැළෑටි සංරක්ෂණ කාර්යයන් පිළිබඳ ප්‍රදර්ශන ද්‍රව්‍ය සහ පෝස්ටර් පිළියෙල කර සැපයීම හා ප්‍රදර්ශන කුටියක් සංවිධානය කිරීම මඟින් 2010 වර්ෂයේදී බටඅත රජයේ ගොවිපළෙහි (ගොවි සතිය තුළ) පවත්වන ලද කෘෂිකාර්මික ප්‍රදර්ශනයේදී පැළෑටි සංරක්ෂණ සේවය ක්‍රියාකාරී කාර්යභාරයක් ඉටු කළේය.

පෝස්ටර් සහ පත්‍රිකා පිළියෙල කිරීම

පහත සඳහන් පත්‍රිකා සහ පෝස්ටර් 2010 වර්ෂයේදී පිළියෙල කර මුද්‍රණය කිරීමෙන් පසු ව්‍යාප්ති නිළධාරීන් සහ මහජනයා අතර බෙදා හරින ලදී.

- සැල්වීනියා පෙව විද්‍යාත්මකව පාලනය කිරීම
- ජපන් ජබර පෙව විද්‍යාත්මකව පාලනය කිරීම
- පේරවල නෙමටෝඩා ගැටළුව කළමනාකරණය කිරීම

2011 වර්ෂය සඳහා සැලැස්ම

- පැළෑටි සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන ශක්තිමත් කිරීම
- වී වගාව සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- එළවළු සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- කොළ එළවළු සඳහා සමෝධානික පළිබෝධ කළමනාකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- කෘෂිකාර්මික හා ජලජ පරිසරයන්හි ඇති ආක්‍රමණික විදේශීය වල් පැළෑටි තුරන් කිරීම/පාලනය කිරීම සඳහා රසායනික හා පෙව විද්‍යාත්මක පාලන ක්‍රම යොදා ගැනීම
- ඉලක්කගත ක්ෂේත්‍රයන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම
- ගොවි ක්ෂේත්‍ර තත්වයන් තුළ නියමු මට්ටමින් නව පැළෑටිනාශක ඇගයීම
- රජයේ ගොවිපළවල බීජ ගබඩා ධූමකරණය කිරීම
- රජයේ ගොඩනැගිලිවල ගෘහස්ථ පළිබෝධ පාලන කටයුතු කිරීම
- පළිබෝධ වසංගත තත්වයන් කළමනාකරණය කිරීම
- මාධ්‍ය කටයුතු සඳහා අදාළ දෑ පිළියෙල කිරීම
- යටිතල පහසුකම් සංවර්ධනය
  - පෙව පාලන කාරකයින් බෝ කිරීමේ ඒකකය වැඩිදියුණු කිරීම
  - වැටක් ඉදි කිරීම
  - ගබඩා වැඩිදියුණු කිරීම

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරී/ සේවක සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිලධාරී	01
කෘෂිකර්ම නිලධාරී	03
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරී	01
වැඩසටහන් සහකාර	01
කෘෂිකර්ම උපදේශක	09
පර්යේෂණ සහකාර	01
කළමනාකරණ සහකාර සේවය	05
රියදුරු	04
මුරකරු	02
ලොරි සහායක	01
විශේෂ ගබඩා කම්කරු	01
කම්කරු	05
එකතුව	**35**

3.1.3 ජාතික පැළෑටි නිරෝධායන සේවය - කටුනායක

ශ්‍රී ලංකා ජාතික පැළෑටි නිරෝධායන සේවයට පැවරී ඇති වගකීම වන්නේ පැළෑටි සහ පැළෑටි නිෂ්පාදන හරහා මෙරටට පැමිණෙන හා මෙරටින් පිටවන පළිබෝධ පිළිබඳ නියාමන කටයුතු කිරීමයි. මෙම වගකීම සපුරාලීම පිණිස මෙම මධ්‍යස්ථානය විසින් ජාතික පැළෑටි නිරෝධායන පනත ක්‍රියාත්මක කරන අතර පර්යේෂණ හා සේවා කටයුතු අරමුණු කරගත් නිරෝධායන කාර්යයන් කෙරෙහි වැඩි අවධානයක්ද යොමු කරයි.

උද්භිද ස්වස්ථතා සහතිකකරණය, ආනයනය හා අපනයනය කරන පැළෑටි හා පැළෑටි නිෂ්පාදන පරීක්ෂා කර ප්‍රතිකර්ම යෙදීම, රඳවා ගනු ලබන තොග නියැදි පරීක්ෂා කිරීම සහ පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් හරහා සියලු පැළෑටි නිරෝධායන කටයුතු පිළිබඳ දැනුම බෙදා හැරීම මෙම මධ්‍යස්ථානය මගින් ඉටු කරන ප්‍රධාන කාර්යයන් වේ. එමෙන්ම, පැළෑටි නිරෝධායන මධ්‍යස්ථානය ජාතික පර්යේෂණ ආයතන, විශ්වවිද්‍යාල සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අනෙකුත් ආයතන හා මධ්‍යස්ථාන සමග නිරතුරුවම සහයෝගයෙන් කටයුතු කරයි.

අයවැය

පුනරාවර්තන, මූලධන සහ ව්‍යාපෘති වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන හා දරන ලද වියදම වගු අංක 3.1.3.1හි දැක්වේ.

වගු අංක 3.1.3.1 : වාර්ෂික අයවැය - 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	4,921,100	2,874,328	58
පුනරාවර්තන	5,354,060	4,217,015	79
එකතුව	**10,275,160**	**7,091,343**	**69**

ප්‍රගතිය

පැළෑටි නිරෝධායන මෙහෙයුම් කටයුතු

2010 වසර තුළ ඉටු කරන ලද කාර්යයන් සහ අත්කරගත් කාර්යඵල පිළිබඳ තොරතුරු වගු අංක 3.1.3.2හි දැක්වේ.

වගු අංක 3.1.3.2 : 2010 වර්ෂයේදී ඉටු කරන ලද කාර්යයන් සහ අත්කරගත් ප්‍රගතිය

කාර්යය	ප්‍රගතිය (සංඛ්‍යාව)
රඳවාගත් තොග ලියාපදිංචි කිරීම	177
රඳවාගත් තොග සම්බන්ධයෙන් යවන ලද වාර්තා සංඛ්‍යාව	176
පරීක්ෂා කරන ලද තොග ලියාපදිංචි කිරීම	565
ප්‍රවේශ ස්ථාන වෙත යවන ලද තොග පරීක්ෂා කිරීම් පිළිබඳ වාර්තා සංඛ්‍යාව	549
පරීක්ෂා කර බැලීම සඳහා කොහු පදනම් කරගත් නිෂ්පාදන ලියාපදිංචි කිරීම	162
පරීක්ෂා කර බලන ලද කොහු පදනම් කරගත් නිෂ්පාදන පිළිබඳ වාර්තා	156
පරීක්ෂා කිරීම සඳහා ඉදිරිපත් කරන ලද නියැදි ලියාපදිංචි කිරීම	20
පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව	08
උද්භිද ස්වස්ථතා සහතික නිකුත් කිරීම	03
විනාශ කරන ලද ගැටලු සහිත තොග සංඛ්‍යාව	647

කීට විද්‍යාව

2010 වර්ෂයේදී ඉටු කරන ලද කාර්යයන් පහත සඳහන් වේ.

- විසිතුරු පැළෑටි සහ පැළෑටි නියැදි පරීක්ෂා කර බැලීම.

වගු අංක 3.1.3.3 කෘමි පළිබෝධ, මයිටාවන් සහ පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් සිටීදැයි අපනයනය කිරීමට තිබූ විසිතුරු පැළෑටි නියැදි පරීක්ෂා කර බැලීම

විස්තරය	පරීක්ෂා කර බලන ලද නියැදි සංඛ්‍යාව	ආසාදිත නියැදි සංඛ්‍යාව
අපනයනය කිරීමට තිබූ විසිතුරු පැළෑටි නියැදි තුළ පැළෑටි නෙමටෝඩාවන් සිටීදැයි පරීක්ෂා කර බැලීම	8,625	ප්‍රතික්ෂේප කිරීම් - 1176 ප්‍රතික්ෂේප කිරීම් - 64
අපනයනය කිරීමට තිබූ විසිතුරු පැළෑටි නියැදි තුළ කෘමීන් හා මයිටාවන් සිටීදැයි පරීක්ෂා කර බැලීම	1,005	කෘමීන් . 10 මයිටාවන් - 01
අපනයනය කිරීමට තිබූ ස්ට්‍රෝබෙරි නියැදි පරීක්ෂා කර බැලීම	40	ආසාදිතව නොතිබිණි
කෘමි පළිබෝධ, මයිටාවන් සහ පැළෑටි නෙමටෝඩාවන් සිටීදැයි අපනයනය කිරීමට තිබූ කොහු පදනම් කරගත් නිෂ්පාදන පරීක්ෂා කර බැලීම	61	පාංශු - 11 කෘමීන් - 01

වගු අංක 3.1.3.4 : කෘමි පළිබෝධ, මයිටාවන් සහ පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් සිටීදැයි ආනයනය කළ පැළෑටි නියැදි පරීක්ෂා කර බැලීම

පරීක්ෂා කරන ලද ද්‍රව්‍යය	නියැදි සංඛ්‍යාව	ආනයනය කළ රට	ආසාදනයවීම් හඳුනා ගැනීම
විසිතුරු පැළෑටි	52	නෙදර්ලන්තය, ඉන්දියාව, ජපානය, තායිවානය, ඊශ්‍රායලය, පැපුවා නිව් ගිනියාව, තායිලන්තය අ.එ.ජ.	ආසාදිතව නොතිබිණි
පලතුරු පැළ	27	තායිලන්තය	කුඩිත්තන් සහ පිටි මකුණන්
වියළි පලතුරු	03	අ.එ.ජ.	ආසාදිතව නොතිබිණි
බීජ අර්තාපල්	67	ජර්මනිය, අ.එ.ජ, ඉන්දියාව නෙදර්ලන්තය	ආසාදිතව නොතිබිණි
බීජ - කජු	02	ඉන්දියාව	සයිටොෆිලස් විශේෂ (*Sitophilus* spp.) සහ කාපොෆිලස් විශේෂ (*Carphophillus* Spp.)
- බඩඉරිඟු	152	ඉන්දියාව, තායිලන්තය, දකුණු අප්‍රිකාව, ඕස්ට්‍රේලියාව	ට්‍රිබොලියම් විශේෂ (*Tribolium* spp.) මයිටාවන්, සිටොෆිලස් විශේෂ (*Sitophillus* spp.) ක්‍රිප්ටොලෙස්ටස් විශේෂ (Cryptolestus
- රටකජු	52	ඉන්දියාව	ආසාදිතව නොතිබිණි

- පළිබෝධවලින් තොර විසිතුරු පැළෑටි නිෂ්පාදන අපනයනය ප්‍රවර්ධනය කිරීම සඳහා අපනයනට විසිතුරු පැළ වගා කරන තවාන් පරීක්ෂා කර බලන ලදී.
- අපනයනට විසිතුරු පැළ වගා කරන තවාන්වල පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් සිටින මට්ටම නිරීක්ෂණය කිරීම

පරීක්ෂා කර බලන ලද පැළ තවාන් සංඛ්‍යාව - 15

පරීක්ෂා කර බලන ලද පාංශු නියැදි සංඛ්‍යාව

එම නෙමටෝඩාවන් විනාශ කර දැමීම සඳහා ආසාදන පිළිබඳ තොරතුරු පැළ තවාන් හිමියන් වෙත ලබාදිණි.

පර්යේෂණ කටයුතු

- වරා පත්‍ර නිස්සාරකය, නැවුම් සුදුලූණු නිස්සාරකය, කොහොඹ තෙල්, පැඟිරි තෙල් සහ නැවුම් ආඩතෝඩා පත්‍ර නිස්සාරකය යෙදීමෙන් අපනයනය කිරීමට තිබූ කපුරු මල්වල සිටි පිටි මකුණන් සාර්ථකව පාලනය කිරීමට හැකිවිය.
- ඕස්ට්‍රේලියාවේ ආනයන සම්බන්ධයෙන් පවතින අවශ්‍යතා සපුරාලීම සඳහා පළිබෝධ හා රෝග පවතින මට්ටම සොයා ගැනීමේ අරමුණෙන් අපනයන විභවයක් සහිත අන්නාසි වගා ක්ෂේත්‍ර අළලා දීප ව්‍යාප්තව සිදු කරන ලද සමීක්ෂණය නිම කෙරිණි.

පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

- අපනයන විසිතුරු පැළ තවාන්වල කාර්ය මණ්ඩලයේ පළිබෝධ හඳුනාගැනීමේ සහ කළමනාකරණය කිරීමේ දැනුම වැඩිදියුණු කිරීම පිණිස පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් 2ක් පවත්වන ලදී.
- අපනයනය සඳහා ඇන්තූරියම් වගාකරන්නන්, කෘෂිකර්ම උපදේශකයින් සහ විසිතුරු පැළ වගාවෙහි නියැළෙන උප වගාකරුවන් වෙනුවෙන් අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍යාධාර උපයෝගී කර ගනිමින් වයඹ පළාතේදී පුහුණු වැඩසටහන් 4ක් පැවැත්විණි.
- පැළෑටි නිරෝධායනය හා සම්බන්ධ කීට විද්‍යාව සහ වටපණු විද්‍යාව පිළිබඳව ඩිප්ලෝමා සහ උපාධි අපේක්ෂක සිසුන් 36දෙනෙකුට පුහුණුව ලබාදිණි.
- කෘෂි පළිබෝධ, මයිටාවන් සහ පැළෑටි නෙමටෝඩාවන් ඇත්දැයි දැන ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද නියැදි 32ක් පරීක්ෂා කර බලන ලදී.

ව්‍යාධිවේදය

මේ යටතේ 2010 වර්ෂයේදී ඉටු කරන ලද කාර්යයන් පහත දැක්වේ.

වගු අංක 3.1.3.5 : පරීක්ෂා කර බලන ලද රඳවා ගත් පැළෑටි නියැදි සංඛ්‍යාව සහ එම නියැදිවලින් සොයාගත් පළිබෝධ

නියැදි වර්ගය	නියැදි/තොග/පැළෑටි සංඛ්‍යාව	පළිබෝධ සොයා ගැනීම්
අර්තාපල්	තොග 20 – නෙදර්ලන්තය	පොදු කබොළු රෝගය (*Streptomyces scabies*)
		සිල්වර් සකර්ෆ් රෝගය (*Helminthosporium solani*)
	ප්‍රංශය	වියළි කුණුවීම (*Fusarium* sp.)
	ජර්මනිය	මෘදු කුණුවීම (*Erwinia* sp.)
		බිලැක් ස්කර්ෆ් රෝගය (*Rhizoctonia solani*)
		ජාලාකාර කබොළු රෝගය (*Streptomyces reticuliscabies*)
බඩ ඉරිඟු	නියැදි 161 – තායිලන්තය, දකුණු අප්‍රිකාව, ඕස්ට්‍රේලියාව, ඉන්දියාව	දිලීර (*Aspergillus* spp., *Mucor* spp., *Fusarium* spp., *Penicillium* spp., *Colletotrichum* spp., *Rhizopus* spp., *Curvularia* spp.)
රටකජු	නියැදි 95 – ඉන්දියාව, චීනය	දිලීර (*Aspergillus* spp., *Penicillium* spp., *Mucor* spp., *Rhizopus* spp., *Colletotrichum* spp.)
කජු	නියැදි –1 අයිවරි කෝස්ට්	දිලීර (*Rhizopus* spp., *Penicillium* spp., *Mucor* spp., *Aspergillus* spp.)
කොකෝ ඇට	නියැදි –14 ඉන්දියාව, එ. රාජධානිය, ඝානාව	දිලීර (*Rhizopus* spp., *Aspergillus* spp.)
උඳු	නියැදි –1 ඉන්දියාව	දිලීර (*Aspergillus* spp., *Alternaria* spp.)
මුං	නියැදි –1 තායිලන්තය	දිලීර (*Colletotrichum* spp., *Fusarium* spp., *Mucor* spp.)
බොත්තම් බිම්මල් බීජ	නියැදි –1 ඕස්ට්‍රේලියාව	-
තල් කෙඳි	නියැදි –2 බෙල්ජියම	-
ට්‍රැම්පිකෝ කෙඳි	නියැදි –2 අ.එ.ජ.	-
ලූනු බීජ	නියැදි –1 ඉන්දියාව	දිලීර (*Aspergillus* spp.)
බෝල්ටික් පීට් මොස්	නියැදි –1 නෙදර්ලන්තය	දිලීර (*Fusarium* spp.)

වගු අංක 3.1.3.6 : අතිරේක ප්‍රකාශය සහිතව උද්භිද ස්වස්ථතා පරීක්ෂණ වාර්තා නිකුත් කිරීම සඳහා පරීක්ෂා කර බලන ලද නියැදි පිළිබඳ විස්තර

ද්‍රව්‍යය	නියැදි සංඛ්‍යාව	පරීක්ෂණය	යවන රට
කොහු	34	දිලීර සහ බැක්ටීරියා	ඊජිප්තුව, ප්‍රංශය, නවසීලන්තය, තුර්කිය, දෝහා කටාර්
කොහු	12	පාංශු හා වෙනත් ආසාදිතවලින් තොරවීම	නවසීලන්තය
ජලජ පැළෑටි	130		ප්‍රංශය
විසිතුරු පැළෑටි	50	හානිකර දිලීර, බැක්ටීරියා,පළිබෝධ, පාංශු ක්ෂුද්‍රජීවීන්	කොරියාව, ජපානය, නෙදර්ලන්තය, ජර්මනිය, ස්විස්ටර්ලන්තය,සිංගප්පූරුව
විසිතුරු පැළෑටි	15	සින්කෙට්‍රියම් එන්ඩොබයෝට්‍රිකම් (*Synchetrium endobiotricum*) ක්ලැවිබැක්ටර් මිචිගනෙන්සිස් (*Clavibacter michiganensis*) සයිලෙලාෆැස්ටිඩිඕසා (*Xylellafastidiosa*) කොරිනෙ බැක්ටීරියම් සෙපෙඩොනිකස් (*Corynebacterium sepedonicus*)	ග්‍රීසිය, නෙදර්ලන්තය
විසිතුරු පැළෑටි	1,640	අතිරේක ප්‍රකාශය නොමැති	නෙදර්ලන්තය,සුඩානය,දකුණු කොරියාව,ජපානය
ඒගාර් මාධ්‍යයේ ඇති පටක රෝපිත පැළ	1,140	මාධ්‍ය ආසාදනයෙන් තොර	ඩෙන්මාර්කය, අ.එ.ජ. , ඕස්ට්‍රේලියාව
ඒගාර් මාධ්‍යයේ ඇති පටක රෝපිත පැළ	50	අතිරේක ප්‍රකාශය නොමැති	නෙදර්ලන්තය
කොකෝ ඇට	1	බ්ලැක් පොඩ් රෝගය, වෙස්නට් පිට්පුස් රෝගය	ඉන්දියාව
ස්ට්‍රෝබෙරි	7	බැක්ටීරියා හා දිලීර	දකුණු අප්‍රිකාව

වගු අංක 3.1.3.7 : ව්‍යාධිජනක ඇත්දැයි පරීක්ෂා කර බලන ලද වෙනත් නියැදි සංඛ්‍යාව

නියැදිය	සංඛ්‍යාව	දිලීර	බැක්ටීරියා
තෘණ	02	හෙල්මින්තොස්පෝරියම් විශේෂ (*Helminthosporium* spp.), කර්වුලේරියා විශේෂ (*Curvularia* spp.)	
නෙපෙන්තස් විශේෂ (*Nepenthus* spp.)	13	කලෙටොට්‍රිකම් විශේෂ (*Colletotrichum* spp.) , පයිටොප්තොරා විශේෂ (*Phytophthora* spp.), නීග්‍රොස්පොරා විශේෂ (*Nigrospora* spp.)	
ලිවිස්ටොනියා (*Livistonia spp.*)	12	කලෙට්‍රොකම් විශේෂ (*Colletotrichum* spp.), ඕලිටර්නේරියා විශේෂ (*Alternaria* spp.)	හඳුනා නොගත් බැක්ටීරියාවක්
ඇන්තූරියම්	03		සැන්තොමොනාස් කැම්පෙස්ට්‍රිස් (*Xanthomonas campestris* pv. *diffenbachiae*)
ෆිකස්	03	කර්වුලේරියා විශේෂ (*Curvularia* spp.)	හඳුනා නොගත් බැක්ටීරියාවක්
නීම්	05		හඳුනා නොගත් බැක්ටීරියාවක්
උණ බට	03		
විසිතුරු පැළෑටි	07	ෆියුසාරියම් විශේෂ (*Fusarium* spp.)	හඳුනා නොගත් බැක්ටීරියාවක්

වෙනත් කාර්යයන්

- ප්‍රදර්ශනවලට සහ ගම්පහ දිස්ත්‍රික්කයේ පවත්වන ලද ජගත් විද්‍යා දිනයට දායක වීම

- පැළ තවාන්වල ඇති රෝග කළමනාකරණය කිරීම පිළිබඳව ඇන්තූරියම් වගාකරුවන් සඳහා දැනුවන් කිරීමේ වැඩසටහන් 3 ක් පැවැත්වීම

වල් පැළෑටි විද්‍යාව

- වල් පැළෑටි තොග 117ක් වල් පැළෑටි බීජ ඇත්දැයි පරීක්ෂා කර බලන ලද අතර ඉන් තොග 4ක් වල් පැළෑටි බීජ හේතුවෙන් අපවිත්‍ර වී තිබිණි.

- අපනයනය සඳහා වූ කොහුබත් තොග 238ක් පරීක්ෂා කර බලන ලද අතර ඉන් තොග 44ක් ජීව්‍යතාවෙන් යුතු බීජ හේතුවෙන් අපවිත්‍ර වී තිබිණි.

- ගණ 4කට සහ ශාක කුල 2කට අයත් වල් පැළෑටි බීජ විශේෂ 9ක් එක්රැස් කර හඳුනා ගැනීමෙන් පසු ශාකාගාර පත් මත සංරක්ෂණය කරන ලදී.

- ගණ 5කට සහ කුල 1කට අයත් නව වල් පැළෑටි බීජ විශේෂ 9ක් එක්රැස් කර බඳුන් (vials) තුළ සංරක්ෂණය කරන ලදී.

- සෙ.ග්‍රේ. 100° උෂ්ණත්වයේ ජල වාෂ්ප ප්‍රතිකර්මය කළ විට කොහුබත්වල තිබූ බීජවල තිබූ ජීව්‍යතාව මිනි. 20ක් තුළ විනාශ කළ හැකිවිය.

ධූමකරණය

වාණිජමය ධූමකරණය

- මීතයිල් බ්‍රෝමයිඩ් යොදා ගනිමින් පැළෑටි හා පැළෑටි නිෂ්පාදන තොග 190ක් ධූමකරණය කරන ලදී. ඉන්දියාවේ සිට ආනයනය කළ විවිධ මල් තොග 8ක් රඳවා තබා ආනයනකරුට නිදහස් කිරීමට පෙර ධූමකරණය කරන ලදී. ධූමකරණය පිළිබඳ තොරතුරු වගු අංක 3.1.3.8හි දැක්වේ.

  වගු අංක 3.1.3.8 2010 වර්ෂයේදී කටුනායක ජාතික පැළෑටි නිරෝධායන සේවයේදී සිදු කළ වාණිජමය ධූමකරණ

ධූමකරණයට ලක්කළ ද්‍රව්‍ය	ධූමකරණ සංඛ්‍යාව
විසිතුරු පැළෑටි	06
කැපූ මල්	08
දැව/දැවමය භාණ්ඩ	34
කොහුවලින් නිෂ්පාදිත ද්‍රව්‍ය	126
සෙරිබ්‍රා	08
ඖෂධ පැළෑටි කුඩු	08
එකතුව	**190**

නිරෝධායන ප්‍රතිකර්ම අධීක්ෂණය

අපනයනකරුවන්ගේ ඉල්ලීම් මත පෞද්ගලික ධූමකරුවන් විසින් ලිවලින් නිම කළ ඇසුරුම් සඳහා සිදු කළ ධූමාකරණ 34 හි සහතිකකරණ කටයුතු සඳහා පිළියම් තාක්ෂණ අංශයේ නිලධාරීන් විසින් අධීක්ෂණය කරන ලදී.

2011 වර්ෂය සඳහා සැලැස්ම

- අපනයන නියැදි පරීක්ෂා කර බැලීම

- රඳවා ගනු ලැබූ නියැදි පරීක්ෂා කර බැලීම

- බීජ අර්තාපල් තොග ප්‍රවේශ ස්ථානයේදී පරීක්ෂා කර බැලීම

- බීජ අර්තාපල් නියැදි පරීක්ෂා කර බැලීම

- අපනයන විසිතුරු පැළ තවාන්වල පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් සිටින මට්ටම අධ්‍යයනය කිරීම සඳහා පාංශු නියැදි එක්රැස් කිරීම

- පරිසර හිතකාමී ක්‍රම උපයෝගී කර ගනිමින් අපනයන විසිතුරු පැළ තවාන්වල හිඳින පැළෑටි පරපෝෂිත නෙමටෝඩාවන් පාලනය කිරීම

- අපනයන විභවයක් ඇති පලතුරුවල (අඹ, පැපොල් සහ රඹුටන්) සිටින දේශීය පලතුරු මැසි විශේෂ විනාශ කර දැමීම සඳහා γ – විකිරණ ප්‍රතිකර්මයන් වැඩිදියුණු කිරීම

- විමර්ශන කෘමි එකතුව වර්ධනය කිරීම සඳහා ක්ෂේත්‍ර චාරිකාවන්හි නියැළීම

- විසිතුරු පැළෑටිවල හිඳින පැළ මැක්කන් හඳුනා ගැනීමේ අධ්‍යයනය

- පොතු කෘමීන් පළවා හැරීම සඳහා සමහර උද්භිදාංග මඟින් ඇති කරන බලපෑම පිළිබඳ අධ්‍යයනය

- ජාතික පැළෑටි නිරෝධායන සේවයට ඉදිරිපත් කරන ලද නියැදිවල හිඳින ව්‍යාධිජනක හඳුනා ගැනීම
- දිලීර සඳහා ස්ථිර කඳා (Permanent slides) පිළියෙල කිරීම
- පැළෑටි ව්‍යාධිජනකවල පවිත්‍ර රෝපිත නඩත්තු කිරීම
- පැළෑටි ව්‍යාධිජනක හඳුනා ගැනීම සඳහා විද්‍යාගාර අත්පොත් වැඩිදියුණු කිරීම (ග්‍රන්ථ ඡායා පිටපත් කිරීම, ඡායාරූප හා මුද්‍රිත)
- අනාගතයේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා බීජ අර්තාපල් නියැදි නඩත්තු කිරීම
- එලයිසා තාක්ෂණය භාවිතයෙන් වයිරස්/බැක්ටීරියා හඳුනා ගැනීම (වයිරස් හඳුනා ගැනීම සඳහා අර්තාපල් නියැදි 200ක්, බැක්ටීරියා හඳුනා ගැනීම සඳහා අර්තාපල් නියැදි 200ක් සහ බැක්ටීරියා හඳුනා ගැනීම සඳහා බඩඉරිඟු නියැදි 400ක්,

  වෙනත් නියැදි 200ක්)
- කොහු ආශ්‍රිත නිෂ්පාදන අපනයනය සඳහා නිරෝධායන වැදගත්කමක් සහිත රෝග හඳුනා ගැනීම
- ශ්‍රී ලංකාවේ අපනයනය අරමුණු කරගත් පැළ තවාන්වල ඇති ප්ලප් පැළෑටිවලට වැළඳෙන රෝග හඳුනා ගැනීම
- ඇන්තූරියම් පත්‍ර අංගමාරය පිළිබඳ වත්මන් තත්වය සහ එය කළමනාකරණය කිරීමේ ක්‍රමෝපාය පිළිබඳව අධ්‍යයනය කිරීම
- වල් පැළෑටිගාරය නඩත්තු කිරීම (එක්රැස් කර ගැනීමට අපේක්ෂිත පැළෑටි විශේෂ සංඛ්‍යාව)
- විමර්ශන වල් පැළෑටි බීජ එකතුව නඩත්තු කිරීම
- සජීවී ප්ලප් පැළෑටි එකතුව නඩත්තු කිරීම
- අපනයන සහ ආනයන තොගවල ඇති වල් පැළෑටි බීජ සොයා ගැනීම සහ හඳුනා ගැනීම
- ජාතික පැළෑටි නිරෝධායන සේවයේදී වාණිජ ධූමකරණ සිදු කිරීම
- ධූමකරණ අධීක්ෂණය කිරීම
- පරීක්ෂා කර බැලීම සහ විගණනය සඳහා ධූමකරණ සමාගම්වලට යෑම
- ප්‍රතිකර්ම පිළිබඳ ප්‍රමිති සකස් කිරීම
- අපනයන විසිතුරු පැළෑටි සහ කොහු ආශ්‍රිත නිෂ්පාදන පිළිබඳ වාර්තා
- රඳවා ගනු ලැබූ තොග නියැදි පිළිබඳ වාර්තා
- පශ්චාත් ප්‍රවේශ නිරෝධායන කටයුතු
- උපාධි අපේක්ෂක සහ ඩිප්ලෝමා හදාරන සිසුන් පුහුණු කිරීම
- පාර්ශ්වකරුවන් සඳහා පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්
- සමුළු, වැඩමුළු, සම්මන්ත්‍රණ සහ රැස්වීම්වලට සහභාගී වීම
- අත් පත්‍රිකා සහ පෝස්ටර් පිළියෙල කිරීම
- පළිබෝධ පිළිබඳ අවදානම් විශ්ලේෂණය
- උද්භිද ස්වස්ථතා සහතික නිකුත් කිරීම
- ඉදිරිපත් කරන ලද නියැදි පරීක්ෂා කිරීම
- පැළෑටි සංරක්ෂණ පනත උල්ලංඝනය කරමින් ආනයනය කරන ලද ද්‍රව්‍ය විනාශ කිරීම

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරි/සේවක සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිලධාරි	06
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි	05
වැඩසටහන් සහකාර	06
කෘෂිකර්ම උපදේශක	11
පර්යේෂණ සහකාර	05
කළමනාකරණ සහකාර සේවය	07
රියදුරු	04
විදුලි කාර්මික	01
විශේෂ කම්කරු	01
කම්කරු-ස්ථිර	04
කම්කරු-කොන්ත්‍රාත්	08
මුරකරු	02
කාර්යාල කාර්ය සහායක	03
එකතුව	**64**

3.1.4 පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය, පේරාදෙණිය

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයට පැවරී ඇති වගකීම වන්නේ 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනතෙහි සඳහන් ව්‍යවස්ථාපිත විධිවිධාන ක්‍රියාත්මක කිරීමයි. පළිබෝධනාශක ආනයනයේ සිට පළිබෝධනාශක ප්‍රතිකර්ම යොදන ලද බෝග අලෙවි කිරීම දක්වා වන මෙරට පළිබෝධනාශක ජීවන චක්‍ර කළමනාකරණයට අදාළ වැදගත්ම ක්‍රියාමාර්ගය වන්නේ පළිබෝධනාශක ලියාපදිංචියයි.

අයවැය

විවිධ වැය ශීර්ෂ යටතේ ලද වාර්ෂික ප්‍රතිපාදනය හා දරන ලද වියදම වගු අංක 3.1.4.1 හි දැක්වේ.

ප්‍රගතිය

පළිබෝධනාශක ලියාපදිංචිය

මෙහිදී පළිබෝධනාශක ලියාපදිංචිය අපේක්ෂා කරන්නා විසින් ඉදිරිපත් කරන අදාළ තොරතුරු සහ ලිපි ලේඛන ඇගයීම සිදු කෙරේ. එම ඇගයීම මඟින් සතුටුදායක ප්‍රතිඵල ලැබුණහොත් අනුමත ලේබල් සහ බඳුන් සමඟ ලියාපදිංචිය ප්‍රදානය කෙරේ. ඉන්පසු ලියාපදිංචි අංකයක් වෙන් කිරීම සහ ලියාපදිංචි සහතිකය නිකුත් කිරීම සඳහා ලියාපදිංචි ගාස්තුවක් අය කෙරේ. මෙමගින් වසර තුළ එක්රැස් කර ගත් ආදායම රු. 2,467,500කි.

පළිබෝධනාශක නැවත ලියාපදිංචි කිරීම

නිෂ්පාදනයක ලියාපදිංචිය වලංගු වන්නේ වසර 3ක් සඳහා පමණක් වන අතර ඉන්පසු නව ප්‍රමිති, සොයා ගැනීම් සහ ආරක්ෂිතබව පිළිබඳ ගැටලු මත පදනම්ව එහි තත්වය නැවත තක්සේරු කෙරේ. වසර තුළ මෙම කාණ්ඩය යටතේ අයදුම්පත් 141ක් සම්බන්ධයෙන් පියවර ගැනිණි. මෙම කාණ්ඩය යටතේ ලබා ගන්නා ලද ආදායම රු. 705,000කි.

පළිබෝධනාශක ඇගයීම සහ නව පළිබෝධනාශක ලියාපදිංචිය

දේශීය අත්හදා බැලීම් සඳහා නිපැයුම්වල පූර්ව ඇගයීම් කටයුතු කිරීමේදී ආරක්ෂාකාරී සහ පාරිසරික වශයෙන් හිතකර පළිබෝධනාශක හඳුනාගෙන ප්‍රවර්ධනය කරන ලදී. එමගින් වෙළඳපොළෙහි ඇති අනතුරුදායක නිපැයුම් ඉවත් කිරීම පහසු කෙරේ. පළිබෝධනාශක ලියාපදිංචි කිරීමේ ලිපි ලේඛන කාර්යක්ෂමව සහ කඩිනමින් ඇගයීම පිණිස ලිපි ලේඛන ඇගයීම් ක්‍රියාවලියේදී සම්මන්ත්‍රණ ආකාරයේ ප්‍රවේශයක් හඳුන්වාදීමට පියවර ගැනිණි. මෙම ප්‍රවේශය තුළින් ලැබෙන වාසියක් වන්නේ පළිබෝධනාශක ඵලදායීව ඇගයීම සඳහා විවිධ විෂයයන්ට අදාළ දැනුම හුවමාරු කර ගැනීමේ අවස්ථාවක් උදාවීමයි. වසර තුළ සම්මිශ්‍රණ 67කටද වැඩි සංඛ්‍යාවක් ඇගයීමට ලක්කර ඉන් 4ක් ලියාපදිංචි කරන ලදී.

වගු අංක 3.1.4.1 : වාර්ෂික අයවැය - 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %	ආදායම
මූලධන	1,691,000	1,234,548	73	
පුනරාවර්තන	2,091,480	1,961,641	94	
ලියාපදිංචි කිරීමේ හා නැවත ලියාපදිංචි කිරීමේ ගාස්තු				2,467,500
අලෙවිකරු සහතිකකරණ ගාස්තු				583,605
එකතුව	**3,782,480**	**3,196,189**	**84**	**3,051,105**

- ඉන්ඩොක්සකාබ් 15.8%
- ප්‍රොපිලෙනිග්ලයිකෝල් මොනාලොරේට්
- තයොසයික්ලැම් හයිඩ්‍රජන් ඔක්සලේට්
- ෆ්ලූඅසිනම්

සාමාන්‍යයෙන් භාවිත කෙරෙන පළිබෝධනාශකවල කාර්යක්ෂමතාව, තත්වය සහ ආරක්ෂාකාරී බව තහවුරු කර ගැනීම සඳහා ලියාපදිංචි කිරීමේ ලිපි ලේඛන සම්පූර්ණ හා පුළුල් ඇගයීමකට ලක්කර වැඩිදියුණු කළ මාර්ගෝපදේශ අනුව ඉදිරිපත් කළයුතු දත්ත දැක්වෙන පරිදි වැඩිදුරටත් විධිමත් කෙරිණි. වසර තුළ විවිධ වෙළඳ නාම යටතේ ඇති ක්‍රියාකාරී ද්‍රව්‍ය (Commodity active ingredients) සහ ගෘහස්ථ පළිබෝධනාශක ඇතුළු පළිබෝධනාශක නිපැයුම් 30ක් ලියාපදිංචි කෙරිණි.

ආනයන අනුමැතිය ලබාදීම

මෙම ක්‍රියාදාමය මඟින් නිපැයුම් අවශ්‍ය තත්වමය ප්‍රමිතිවලට අනුකූලව නිවැරදි සැපයුම් ප්‍රභවයෙන් ආනයනය කිරීම හා අතිරික්ත ප්‍රමාණයන්ගෙන් ආනයනය කිරීම වැළැක්වීම තහවුරු කෙරේ. මේ සඳහා වසර තුළ ආනයන අනුමැති ලබාදීමට පෙර ආනයනකරුවන් විසින් ඉදිරිපත් කරන ලද තත්ව සහතික 906ක් ඇගයීමට ලක් කෙරිණි.

ලේබල් සහ ප්‍රචාරණ ද්‍රව්‍යාදිය පරීක්ෂා කර බැලීම

ලේබල් අනුමත කිරීමේ ක්‍රියා පටිපාටිය මඟින් නියමිත තොරතුරු අවසන් පරිශීලක වෙත ලබාදීම පහසු කෙරේ. මෙම ක්‍රියාදාමය පහසු කිරීම පිණිස ලේබල්වල අන්තර්ගතයේ තත්වය වැඩිදියුණු කිරීම සඳහා සියලුම කෘෂිකාර්මික පළිබෝධනාශක කාණ්ඩවලට අදාළ ලේබල් සැලසුම් සකස් කෙරිණි. වසර තුළ ලේබල් 445කට අධික සංඛ්‍යාවක් පරීක්ෂාවට ලක් කර ඇත. මෑතකදී පළිබෝධනාශක නිර්දේශ වැඩිදියුණු කිරීම් හේතුවෙන් පිළිපැදිය යුතු නිවැරදි කිරීම් පියවර සංඛ්‍යාව දෙගුණ කරන ලදී. ඒ අනුව, "මාත්‍රා කාණ්ඩය" සම්බන්ධයෙන් පරිහරණය කරන්නාට හිතකර උපදෙස් වැඩි ප්‍රමාණයක් පළිබෝධනාශක ලේබල්වලට හඳුන්වා දෙන ලදී.

කෙෂ්ත්‍රයේ ක්‍රියාත්මක කිරීම

ක්‍රියාත්මක කෙරෙමින් පවතින වැඩසටහනක් වශයෙන්, පළිබෝධනාශක අලෙවිකරු සහතිකකරණ ක්‍රමය ක්‍රියාවට නැංවීම සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය පළාත්, අන්තර් පළාත් සහ මහවැලි අධිකාරියේ කෙෂ්ත්‍ර ක්‍රියාත්මක කිරීම් කාර්ය මණ්ඩල සම්බන්ධීකරණය කිරීම අබණ්ඩව සිදු කළේය. පළිබෝධනාශක අලෙවිකරුවන් සඳහා පවතින නීතිය යටතේ අලෙවිසැල් සහතික කිරීම සම්බන්ධයෙන් එක්දින පුහුණු පංති 23ක් පවත්වන ලදී. විශේෂිත හේතූන් මත අවලංගු නොකළේ නම් පළිබෝධනාශක අලෙවිකරු සහතික වසරක් සඳහා වලංගු වේ. සහතිකයක් නිකුත් කිරීම සඳහා නියාමන අවශ්‍යතාවල අංගයක් වශයෙන් ගාස්තුවක් අය කෙරේ. මෙම කාණ්ඩය යටතේ ලබා ගන්නා ලද ආදායම රු. 583,605කි.

පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

වසර තුළ පුහුණු පංති රැසක් අලෙවිකරුවන් (23) සහ නිලධාරීන් (06) සඳහා පවත්වන ලදී. 2010 වර්ෂයේදී පුහුණු සහතික 654ක් සහ අලෙවිකරු සහතික 936ක් නිකුත් කරන ලදී.

විද්‍යාගාර කටයුතු

- **පළිබෝධනාශක සම්මිශ්‍රණ විශ්ලේෂණය**

පළිබෝධනාශකවල තත්වය එහි කාර්යක්ෂමතාව හා පරිසරය හා මනුෂ්‍ය සෞඛ්‍යය කෙරෙහි බලපාන ආකාරය තීරණය කරන ප්‍රධාන සාධකයකි. ලියාපදිංචි කරන ලද සියලුම පළිබෝධනාශක ආහාර හා කෘෂිකර්ම සංවිධානය හා ලෝක සෞඛ්‍ය සංවිධානය වැනි ජාත්‍යන්තර සංවිධාන මඟින් පනවා ඇති භෞත රසායනික ප්‍රමිතිවලට අනුකූල විය යුතුය. ඒ අනුව, දේශීය වශයෙන් සිදු කරන පරීක්ෂාවන්ට අනුකූල වේනම් ඒ ඒ තොගය අලෙවි කිරීම සඳහා මුදා හැරේ. 2010 වර්ෂයේදී කාණ්ඩ 796ක් සම්බන්ධයෙන් සම්මිශ්‍රණ විශ්ලේෂණ 1833ක් සිදුකර එමගින් කි. ග්‍රෑ. 815,467ක හා ලීටර් 4,530,941ක ප්‍රමාණයක් මුදා හරින ලදී.

විශේෂිත කාර්යයන්

- **ජාතික කාබනික ප්‍රමිති සහ සහතිකකරණ ව්‍යාපෘතිය**

පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයේ විද්‍යාගාර පහසුකම් පුළුල් කිරීම නිම කරන ලද අතර මෙම පරිශ්‍රය තුළ වැඩිදුරටත් සිදු කරන විශ්ලේෂණාත්මක කටයුතු ආරම්භ කිරීමට ආසන්නය.

- **පළිබෝධනාශක නිර්දේශ කිරීම**

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද පළිබෝධනාශක නිර්දේශ සහිත කුඩා

පොත මගින් සුදුසු පළිබෝධනාශකයක් තෝරා ගැනීම, එහි සම්මිශ්‍රණ සහ භාවිත කිරීමේ ක්‍රමය පිළිබඳ තොරතුරු ලබා දීම සහතික කෙරේ. දෙපාර්තමේන්තුවේ අනෙකුත් අදාළ ආයතනවල සහයෝගය ඇතිව 2010 වර්ෂයේ පළිබෝධනාශක නිර්දේශ සම්බන්ධයෙන් දැනට පවතින කුඩා පොත සංශෝධනය කර ප්‍රකාශයට පත් කරන ලදී.

වෙනත් කාර්යයන්

වගු අංක 3.1.4.2 : 2010 වර්ෂයේදී ඉටුකළ අනෙකුත් කාර්යයන්හි ප්‍රගතිය

- **පළිබෝධනාශක පාලන පනතේ 26වන වගන්තිය යටතේ ඇති විධිවිධාන**

පළිබෝධ පාලන සේවා සැපයුම්කරුවන් සම්බන්ධයෙන් 2010 මැයි 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලන පනත යටතේ නව විධිවිධාන හඳුන්වා දී ඇත (අංක 1655/7 සහ 2010 මැයි 25 දින දරන අති විශේෂ ගැසට් නිවේදනය). වසර තුළ මෙම කාර්යය තුළින් එක්රැස් කර ගන්නා ලද ආදායම රු. 120,000කි.

ගොවීන්ට වඩා හොඳ සේවාවක් ලබා දීම පිණිස පළිබෝධනාශක අලෙවිසැල් සඳහා අලෙවි සහ තාක්ෂණික සහකාරවරුන් බඳවා ගැනීම සම්බන්ධ නව විධිවිධාන මාලාවක් හඳුන්වාදීමේ යෝජනාවක්ද බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇත.

උප කාර්යය	සමස්ත වාර්ෂික භෞතික ප්‍රගති ඉලක්කය	වසර අවසානය වන විට අත්කර ගත් ප්‍රගතිය
• අයදුම්පත් පරීක්ෂා කර බැලීමෙන් සහ අංක වෙන්කර දීමෙන් පසු ලියාපදිංචිය සඳහා අයදුම්පත් පිළිගැනීම	150	179
• ලියාපදිංචිය සඳහා ලද මුල් අයදුම්පත් ඇගයීම	60	67
• තෙවන පාර්ශ්වයේ ලියාපදිංචි කිරීම් අයදුම්පත් ඇගයීම	140	94
• නැවත ලියාපදිංචි කිරීම් අයදුම්පත් ඇගයීම	140	141
• දේශීය අත්හදා බැලීම් සඳහා දත්ත ඇගයීම	30	52
• ආනයන අනුමැති නිකුත් කිරීම	1,000	1,357
• පළිබෝධනාශක තත්ව සහතික ඇගයීම	1,000	906
• අනුමැතිය සඳහා ලේබල් පරීක්ෂා කර බැලීම	600	447
• අනුමැතිය සඳහා ප්‍රචාරණ ද්‍රව්‍ය පරීක්ෂා කර බැලීම	175	88
• කම්හල් පරීක්ෂා කර බැලීම	12	06
• අනුමත යළි ඇසුරුම් කිරීමේ කම්හල් සහ ගබඩා පරීක්ෂා කර බැලීම	02	04
• ධූමකරණ පරිශ්‍ර සහ ගෘහස්ථ පළිබෝධ පාලන කටයුතුවල යෙදෙන්නන් පරීක්ෂා කිරීම සහ සහතික කිරීම	12	10
• වගකිය යුතු පදනමක් මත නිරෝධායන සහ පූර්ව නැව්ගත කිරීම් ප්‍රතිකර්ම සඳහා එතිලීන් බ්‍රෝමයිඩ් ලබා ගැනීමේ අනුමැතිය ප්‍රදානය කිරීම	50	49
• සීමා කරන ලද පළිබෝධනාශක මිලදී ගැනීම සඳහා බලයලත් ආයතනවලට අනුමැතිය ලබා දීම	100	63

• ඉල්ලුම්පත්‍ර පිළිගැනීම සඳහා යෝග්‍යතාව පිළිබඳ පරීක්ෂණ වාර්තා ලබා ගැනීම පිණිස නියැදි වෛද්‍ය පර්යේෂණ ආයතනය සහ කාර්මික තාක්ෂණික අයතනය වෙත යැවීම	25	26
• තොග පදනම මත සිදු කරන නියැදිවල තත්ව විශ්ලේෂණයට අනුව නිපැයුම් ඇසුරුම් කිරීම සඳහා අනුමැතිය ලබාදීම	700	796
• අලෙවිසැල් පරීක්ෂා කිරීම	100	39
• නිලධාරි පුහුණු පංතිය	05	06
• අලෙවිකරු පුහුණු පංති	26	23
• අලෙවිකරු පුහුණු සහතික නිකුත් කිරීම	1,000	654
• අලෙවිකරු සහතික නිකුත් කිරීම	2,000	936
• ක්ෂේත්‍ර පැමිණිලි	10	10
• නීතිමය පියවර ගැනීම්	04	01
• තාක්ෂණික උපදේශක කමිටු රැස්වීම්		
• සම්මිශ්‍රණ විශ්ලේෂණය	600	1,833
• අවශේෂ විශ්ලේෂණය	200	76
• තත්වය සහතික කිරීම සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් නියැදි එක්රැස් කිරීම	12	06
• දෙපාර්තමේන්තුව තුළ හා දෙපාර්තමේන්තු අතර ආයතනික රැස්වීම් සඳහා තාක්ෂණික විශේෂඥයින්/සාමාජිකයින්/සම්පත්දායකයින් වශයෙන් සේවය කිරීම හෝ සහභාගී වීම	04	01
• අනෙකුත් ආයතනවලින් ලැබෙන ඇරයුම් පරිදි සම්පත්දායකයින් වශයෙන් සහභාගී වීම	10	19
• වැදගත් සංඛ්‍යා ලේඛන එක්රැස් කිරීම, සම්පාදනය කිරීම සහ බෙදා හැරීම (මහ බැංකුව, විශ්වවිද්‍යාල, පර්යේෂකයින්, රජයේ ආයතන ආදිය)	40	28
• ක්ෂේත්‍ර සමීක්ෂණ වැනි අනෙකුත් කටයුතු	04	02

2011 වර්ෂය සඳහා සැලැස්ම

- අයදුම්පත්‍ර පරීක්ෂා කර බැලීමෙන් සහ අංක වෙන්කර දීමෙන් පසු ලියාපදිංචිය සඳහා ඒවා බාර ගැනීම
- ලියාපදිංචිය සඳහා ලද මුල් අයදුම්පත්‍ර ඇගයීම
- තෙවන පාර්ශ්ව ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍ර ඇගයීම
- නැවත ලියාපදිංචි කිරීමේ අයදුම්පත්‍ර ඇගයීම
- දේශීය අත්හදා බැලීම් සඳහා දත්ත ඇගයීම
- ආනයන අනුමැති නිකුත් කිරීම
- පළිබෝධනාශක තත්ව සහතික ඇගයීම
- අනුමැතිය සඳහා ලේබල් පරීක්ෂා කර බැලීම
- අනුමැතිය සඳහා ප්‍රචාරණ ද්‍රව්‍යාදිය පරීක්ෂා කර බැලීම
- කම්හල් පරීක්ෂා කර බැලීම
- අනුමත යළි ඇසුරුම් කිරීමේ කම්හල් සහ ගබඩා පරීක්ෂා කර බැලීම
- ධූමකරණ පරිශ්‍ර හා ගෘහස්ථ පළිබෝධ පාලන කටයුතුවල නිරතවන්නන් පරීක්ෂා කර බලා සහතික කිරීම
- වගකිය යුතු පදනමක් මත නිරෝධායන සහ පූර්ව නැව්ගත කිරීම් ප්‍රතිකර්ම සඳහා එතිලීන් බ්‍රෝමයිඩ් ලබා ගැනීමේ අනුමැතිය ප්‍රදානය කිරීම
- සීමා කළ පළිබෝධනාශක මිලදී ගැනීම සඳහා බලයලත් ආයතන සඳහා අනුමැතිය ලබා දීම
- අලෙවිසැල් පරීක්ෂා කිරීම
- ඉල්ලුම්පත්‍ර බාර ගැනීම සඳහා යෝග්‍යතාව පිළිබඳ පරීක්ෂණ වාර්තා ලබා ගැනීම පිණිස වෛද්‍ය පර්යේෂණ ආයතනය සහ කාර්මික තාක්ෂණික ආයතනය වෙත නියැදි යැවීම
- තොග පදනම මත නියැදිවල තත්ව විශ්ලේෂණය කර නිපැයුම් ඇසුරුම් කිරීම සඳහා අනුමැතිය ලබා දීම
- "නිව්ස් ලෙටර්" ප්‍රකාශයට පත් කිරීම
- නිලධාරී පුහුණු පංති පැවැත්වීම
- පාසැල් සිසුන් සඳහා සම්මන්ත්‍රණ පැවැත්වීම
- අලෙවිකරු පුහුණු පංති පැවැත්වීම
- අලෙවිකරු පුහුණු සහතික නිකුත් කිරීම
- අලෙවිකරු සහතික නිකුත් කිරීම
- කෙෂ්ත්‍ර ගැටලු සහ නීතිමය පියවර ගැනීම්
- තාක්ෂණික උපදේශක කමිටු රැස්වීම් පැවැත්වීම
- සම්මිශ්‍රණ විශ්ලේෂණය
- අවශේෂ විශ්ලේෂණය
- තත්වය සහතික කිරීම සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය විසින් නියැදි එක්රැස් කිරීම
- නාවිතයෙන් ඉවත් කළ තොග අපහරණය කිරීම
- දෙපාර්තමේන්තුව තුළ සහ දෙපාර්තමේන්තු අතර පැවැත්වෙන ආයතනික රැස්වීම් සඳහා තාක්ෂණික විශේෂඥයින් / සාමාජිකයින් / සම්පත්දායකයින් වශයෙන් සහභාගී වීම
- අනෙකුත් ආයතනවලින් ලැබෙන ඇරයුම් පරිදි සම්පත්දායකයින් වශයෙන් සහභාගි වීම
- වැදගත් සංඛ්‍යා ලේඛන එක්රැස් කිරීම, සම්පාදනය සහ බෙදා හැරීම (මහ බැංකුව, විශ්වවිද්‍යාල, පර්යේෂණ, රජයේ ආයතන ආදිය)

කාර්ය මණ්ඩලය

තනතුර	සංඛ්‍යාව
පර්යේෂණ නිලධාරී	04
කෘෂිකර්ම උපදේශක	07
පර්යේෂණ සහකාර	04
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරි	02
වැඩසටහන් සහකාර (කෘෂිකර්ම)	02
පර්යේෂණ උප සහකාර	01
රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය	05
රියදුරු	03
මුරකරු	02
කම්කරු	02
කා.කා.ස.	01
කොන්ත්‍රාත් කම්කරු	01
එකතුව	**34**

3.1.5 පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය, ගන්නොරුව

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ ප්‍රධාන අරමුණු වන්නේ මෙරට පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය සහිතක කිරීම සහ වත්මන් හා අනාගත පරපුරෙහි යහපත උදෙසා,එම සම්පත් උපයෝගී කර ගැනීම ප්‍රවර්ධනය කිරීමයි. මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය ආහාර බෝග හා එම බෝග ආශ්‍රිත විශේෂයන්හි ජානමය විවිධත්වය පිළිබඳ ගවේෂණ හා එක්රැස් කිරීම් කටයුතුද ජානමය විවිධත්වය හඳුන්වාදීම, සංරක්ෂණය, ඇගයීම සහ ලේඛනගත කිරීමද සිදු කරයි. මෙම මධ්‍යස්ථානය සතු ප්‍රධාන පහසුකම් වශයෙන්ම පැළෑටි ජාන සම්පත් ඇගයීම සහ වර්ධනය කර ගැනීමට අදාළ උසස් පර්යේෂණ කටයුතු වෙනුවෙන් භාවිත කෙරේ.

ප්‍රගතිය

පැළෑටි ජාන සම්පත් ගවේෂණය සහ එක්රැස් කිරීම

වසර තුළ ජාන සම්පත් නියැදි 82ක් එක්රැස් කර ගැනිණි. මෙයට හඳුන්වාදීම් 12ක්ද වෙනත් ආයතනවලින් ලද ජාන සම්පත් එකතුන් 31 ක්ද මින් පෙර කෙෂ්ත්‍රයෙන් එක්රැස් කරගත් නියැදි අතරින් ඇගයීම් ඒකකය විසින් තෝරාගනු ලැබූ උප නියැදි 39ක්ද ඇතුළත් විය.

බීජ සංරක්ෂණය

බීජ ආදී ද්‍රව්‍ය සංරක්ෂණය

වසර තුළ නව ජාන සම්පත් එකතුන් 129 ක් ජාන බැංකුව තුළ සංරක්ෂණය කරන ලද අතර ගුණනය කරන ලද නියැදි 104ක්ද සංරක්ෂණය කරන ලදී. 2010 වසර අවසන් වන විට ජාන බැංකුවේ තිබූ මුළු ජාන සම්පත් එකතුන් හා නියැදි සංඛ්‍යාව 12,778ක් විය.

විදේශ රටවලින් ජනකප්ලාස්ම ආනයනය කිරීම

ධාන්‍ය රනිල සහ තෙල් බෝග පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය විසින් කරන ලද ඉල්ලීමකට අනුව විශේෂයෙන්ම පර්යේෂණ කටයුතු සඳහා කව්පි (*Vigna unguiculata* L.) ජාන සම්පත් එකතුන් 12ක් ආනයනය කරන ලදී.

අයවැය

2010 වර්ෂයට අදාළ වාර්ෂික අයවැය වගු අංක 3.1.5.1හි දැක්වේ.

වගු අංක 3.1.5.1 : වාර්ෂික අයවැය – 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
පුනරාවර්තන	9,921,400	8,569,794	86
මූලධන	3,095,000	2,813,506	91
ව්‍යාපෘති			
ශ්‍රී ලංකා - අ.එ.ජ. සහයෝගිතා ජනකප්ලාස්ම සංවර්ධන ව්‍යාපෘතිය	5,930,000	4,110,000	69
ආහාර හා කෘෂි. සංවිධානය - ජාතික තොරතුරු හුවමාරු යාන්ත්‍රණය – ගෝලීය ක්‍රියාකාරී සැලැස්ම	819,360	306,971	37
එකතුව	**19,765,760**	**15,800,271**	**80**

වගු අංක 3.1.5.2 : 2010 දෙසැ. 31 දිනට ජාන බැංකුවේ පැවති ජාන සම්පත් එකතූන් සංඛ්‍යාව

බෝග කාණ්ඩය	ජාන සම්පත් එකතූන් සංඛ්‍යාව
වී සහ ආශ්‍රිත විශේෂ	4,518
වෙනත් ධාන්‍ය සහ ආශ්‍රිත විශේෂ	1,629
ධාන්‍ය රනිල සහ ආශ්‍රිත විශේෂ	1,969
එළවළු රනිල බෝග	1,295
සොලනේසියේ කුලයේ එළවළු සහ කුළුබඩු ආශ්‍රිත විශේෂ	1,201
කුකුබිට් කුලයේ එළවළු	764
බ්‍රැසිකේසියේ කුලයේ එළවළු	31
ලූනු	20
වෙනත් එළවළු	371
කොළ එළවළු	166
මුල් හා ආකන්ද බෝග	09
අඹ සහ ආශ්‍රිත විශේෂ	124
තෙල් බෝග	425
කෙඳි සහිත බෝග	66
ඖෂධීය පැළෑටි	27
පලතුරු	163
එකතුව	**12,778**

ජනකප්ලාස්ම බෙදාදීම

විවිධ බෝග ප්‍රභේදවල ජාන සම්පත් එකතූන් 446ක් දේශීය පර්යේෂණ ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, ගොවීන් සහ විශ්වවිද්‍යාලවල ඉල්ලීම පරිදි ඔවුන් අතර බෙදා හරින ලදී.

බීජවල ක්‍රියාකාරිත්ව රටාව පිළිබඳ පර්යේෂණ

1989 වර්ෂයේ සිට ජාන බැංකුවේ පවතින ක්‍රියාකාරී සහ මූලික එකතූන්හි (Active and Base collections) ජීව්‍යතාව නිරීක්ෂණය කිරීම පිණිස අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙහිදී මූලික එකතුවෙන් (Base collection) ජාන සම්පත් එකතූන් 174කද ක්‍රියාකාරී එකතුවෙන් (Active collection) ජාන සම්පත් එකතූන් 1566කද ජීව්‍යතාව පරීක්ෂා කරන ලදී. මෙහි ප්‍රතිඵල මඟින් මූලික එකතුවෙහි (Base collection) වූ වී සහ තල බීජවල ජීව්‍යතාව මුල් ප්‍රරෝහණ මට්ටමින් පැවති අතර රනිල කුලයේ බෝගවල (කව්පි, මුං, උඳු, සෝයාබෝංචි, රටකජු, කොල්ලු) ප්‍රරෝහණ මට්ටම 5%කින් පහත වැටී ඇති බව නිරීක්ෂණය කිරීමට ලැබිණි. ක්‍රියාකාරී එකතුවෙහි (Active collection) වූ සොලනේසියේ කුලයේ එළවළුවල (වම්බටු, එළබටු, අහස්බටු, ගෝනබටු, තිබ්බටු, දැල්බටු, තක්කාලි, මාළු මිරිස්) ප්‍රරෝහණ මට්ටම 5-25%කින් පහත වැටීමක් ද එළවළු රනිල බෝගවල (බෝංචි, මෑ, දඹල, කොස් දඹල, අවර, හාල් මැස්සන් දඹල, අල බෝංචි) සහ ධාන්‍ය රනිල බෝගවල (කව්පි, මුං, උඳු, සෝයා, රටකජු, කොල්ලු) ප්‍රරෝහණ මට්ටම 1-5% අතර ප්‍රමාණයකින් පහත වැටීමක්ද නිරීක්ෂණය කිරීමට ලැබිණි.

බෝග ගොවිපළ තුළදීම සංරක්ෂණය කිරීම

බෝග තම ගොවිපළවලම සංරක්ෂණය කිරීම සඳහා උස්සාපිටිය සහ ඒදඬුවාව යන ගම්මානවල තෝරාගත් ගොවීන් 5දෙනෙකුට තක්කාලි, වම්බටු, කරවිල, බෝංචි, දඹල, මාළු මිරිස් යන එළවළු වර්ග 6 ලබාදෙන ලදී. ගොවීන් 4දෙනෙකු සාර්ථකව එම එළවළු වගා කළ අතර අධික වර්ෂාව හේතුවෙන් එක් ගොවියෙකුගේ බෝග විනාශ විය.

පැළෑටි ජාන සම්පත් ලක්ෂණීකරණය, ගුණනය සහ පුනර්ව්‍යර්ධනය

ජනකප්ලාස්ම ගුණනය

කව්පි ජාන සම්පත් එකතූන් 42ක් සහ කුරක්කන් ජාන සම්පත් එකතූන් 25ක් ගුණනය කර ජාන බැංකුවේ සංරක්ෂණය කරන ලදී.

ලක්ෂණීකරණ විස්තර සහිත අත්පොත් ප්‍රකාශයට පත් කිරීම

තක්කාලි, වැටකොළු සහ වම්බටු යන බෝගවලට අදාළ ලක්ෂණීකරණ විස්තර සහිත අත්පොත් 2011 පෙබරවාරි මාසයේදී ප්‍රකාශයට පත් කෙරෙනු ඇත.

එම්අයි-7 නමැති වගා කරන බණ්ඩක්කා ප්‍රභේදයට කහ පැහැ විචිත්‍ර වයිරස් රෝග ප්‍රතිරෝධිතා ජාන(ය) අන්තර්ග්‍රහණය කිරීම

දායක මාපිය දර්ශයක් (*Abelmoschus angulosus*) යොදා ගනිමින් පෙව තාක්ෂණ ඒකකය විසින් කහ පැහැ නාරටි ඇතිවන විචිත්‍ර වයිරස් රෝගය සඳහා ප්‍රතිරෝධිතාව ඇති කරන ජාන(ය) වගා කරන එම්අයි – 7 නමැති බණ්ඩක්කා ප්‍රභේදයට අන්තර්ග්‍රහණය කරන ලදී. මෙයින්

ප්‍රජනිත 40ක් බිහි කරන ලද අතර එම ප්‍රජනිත 2010/2011 මහ කන්නයේදී කෙෂ්ත්‍රයේ ස්ථාපිත කරන ලදී. මේ සම්බන්ධ සිවුවන පිළි දෙමුහුම යථා කාලයේදී සිදු කෙරෙනු ඇත.

ජනකප්ලාස්ම ලක්ෂණීකරණය

තක්කාලි (*Lycopersicon esculentum* Mill) ජාන සම්පත් එකතුන් 23ක්ද වැටකොළු (*Luffa acutangula* L Roxb.) සහ වම්බටුවලින් (*Solanum melongena* L.) ජාන සම්පත් එකතුන් 25 බැගින්ද ලක්ෂණීකරණය කරන ලදී. එම බෝගවල එක් එක් ලක්ෂණයට අදාළ ෂැනන් – වීවර් (Sh.W) සහ නෙයි (Nei) විවිධත්ව දර්ශක හා ඇලීල සංඛ්‍යාව නිශ්චය කරන ලද අතර එම තොරතුරු වගු අංක 3.1.5.3, 4 හා 5හි දැක්වේ. වඩා වැඩි සමානතාවන් සහ අසමානතාවන් සහිත ජාන සම්පත් එකතුන් හඳුනා ගැනීම සඳහා එම එකතුන් සමූහ විශ්ලේෂණයට (Cluster analysis) ලක් කෙරිණි.

වගු අංක : 3.1.5.3: තක්කාලිවල විවිධ ලක්ෂණ කෙරෙහි බලපාන විවිධත්ව දර්ශක සහ ඇලීල සංඛ්‍යාව

ලක්ෂණය	ෂැනන් වීවර් දර්ශකය	නෙයි දර්ශකය	ඇලීල
මල් හට ගැනීමට යන දින ගණන	1.607	0.741	7
පූර්ණ පුෂ්ප අවධියේදී පරාගධානියට සාපේක්ෂව කලංකය පිහිටි අන්දම	0.387	0.227	2
පරිණතවීමට ගතවන දින ගණන	1.132	0.609	4
ගෙඩියක ප්‍රධාන වශයෙන්ම දක්නට ලැබෙන හැඩය	1.469	0.752	5
ඉදුණු ගෙඩියක පිටත පැහැය	1.616	0.756	7
ඉදුණු ගෙඩියක දැඩිබව	0.877	0.529	3
අරීය හේදනය	1.036	0.563	4
ඉදුණු ගෙඩියක දිග	2.834	0.938	18
ගෙඩියක පළල	3.075	0.953	22
පීඑච් අගය	2.894	0.941	19
යුෂවල ඇති මුළු ද්‍රාව්‍ය ඝන ද්‍රව්‍ය ප්‍රමාණය	3.015	0.949	21
ගෙඩියක සාමාන්‍ය බර	2.955	0.945	20

වගු අංක 3.1.5.4 : වැටකොළුවල විවිධ ලක්ෂණ කෙරෙහි බලපාන විවිධත්ව දර්ශක සහ ඇලීල සංඛ්‍යාව

ලක්ෂණය	ෂැනන් වීවර් දර්ශකය	නෙයි දර්ශකය	ඇලීල
මල් (පුමංගී) පිපීමට ගතවන දින ගණන	1.898	0.797	10
මල් (ජායාංගී) පිපීමට ගතවන දින ගණන	1.796	0.8	8
අස්වනු නෙලීමට සුදුසු නොමේරූ අවස්ථාවට පත්වීමට ගතවන දින ගණන	1.459	0.736	5
පරිණතවීමට ගතවන දින ගණන	1.839	0.826	7
ගෙඩියේ බර (ග්‍රෑ.)	2.443	0.896	14

වගු අංක 3.1.5.5 : වම්බටුවල විවිධ ලක්ෂණ කෙරෙහි බලපාන විවිධත්ව දර්ශක සහ ඇලීල සංඛ්‍යාව

ලක්ෂණය	ෂැනන් වීවර් දර්ශකය	නෙයි දර්ශකය	ඇලීල
මල් හට ගන්නා අවස්ථාව වනවිට පැළයේ උස (සෙ.මී.)	3.135	0.957	23
මල් හට ගැනීමට ගතවන දින ගණන	1.771	0.779	8
කායික විද්‍යාත්මකව ඉදුණු ගෙඩියක පැහැය	0.387	0.227	2
ගසකට හටගත් ගෙඩි සංඛ්‍යාව	1.4	0.715	5
ගසකට ගෙඩි එලදාව (ආහාරයට පිළියෙළ කර ගැනීමට සුදුසු මට්ටමට පරිණත වූ)	2.955	0.945	20
ආහාරයට පිළියෙළ කර ගැනීමට සුදුසු මට්ටමට පරිණත වූ ගෙඩියක බර	2.502	0.907	14

පෙර තාක්ෂණය

වී ජනකප්ලාස්ම ඇගයීම සහ ඒවායෙහි ඇති දුඹුරු පැළ කීඩැවාට (*Nilaparvata lagens* (stal)) ප්‍රතිරෝධී ජාන ලක්ෂණීකරණය කිරීම

දුඹුරු පැළ කීඩැවාට දක්වන ප්‍රතික්‍රියාව පිළිබඳව දැන ගැනීම සඳහා වී ජනකප්ලාස්ම එකතූන් 60ක් පරීක්ෂා කර බලන ලදී. එහිදී එකතූන් 3ක් ප්‍රතිරෝධී බව ද එකතූන් 14ක් මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී බවද ඉතිරි එකතූන් සංඛ්‍යාව දුඹුරු පැළ කීඩැ හානියට ගොදුරු විය හැකි බවද පෙන්නුම් කෙරිණි. ප්‍රතිරෝධීතාව සහිත මෙම ජනකප්ලාස්ම ප්‍රතිරෝධීතා ප්‍රභවයන් වශයෙන් ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන්වලදී තව දුරටත් අත්හදා බලා ගවේෂණය කෙරිණි. මේ සම්බන්ධයෙන් වැඩි දුරටත් සිදු කෙරෙන අණුක සහ ජානමය අධ්‍යයන තුළින් ප්‍රතිරෝධීතාව කෙරෙහි බලපාන ජාන ලක්ෂණීකරණය කර සිතියම්ගත කිරීමට අරමුණු කෙරේ.

වීවල ජනකප්ලාස්ම ඇගයීම සහ ඒවායෙහි ඇති පැළ මැක්කන්ට (*Stenchaetothrips biformis*) ප්‍රතිරෝධී ජාන ලක්ෂණීකරණය කිරීම

පැළැටි ජාන සම්පත් මධ්‍යස්ථානයේ පවතින ක්ෂේත්‍ර තත්වය තුළ පළිබෝධයින් සම්බන්ධයෙන් වී ජනකප්ලාස්ම 135 ක් පරීක්ෂා කර බලන ලදී. එහිදී දහනල වැඩිම ප්‍රතිරෝධීතාව පෙන්නුම් කළේය. 3134, 10941, 3147, 10508, 11522, 11470, සහ 11489 යන ජනකප්ලාස්ම එකතූන් සැලකිය යුතු මට්ටමින් ඉහළ ප්‍රතිරෝධීතාවක් පෙන්වීය. ජනකප්ලාස්ම බොහොමයක් මෙම පළිබෝධ හානියට ගොදුරුවීමේ හැකියාවෙන් යුතු වූ අතර කිහිපයක් ඒ සඳහා මධ්‍යස්ථ වශයෙන් ප්‍රතිරෝධී විය.

මෙම ජනකප්ලාස්ම ප්‍රතිරෝධීතා ප්‍රභවයන් වශයෙන් ප්‍රභේද වැඩිදියුණු කිරීමේ වැඩසටහන්වලදී තවදුරටත් අත්හදා බලා ගවේෂණය කෙරිණි. මේ සම්බන්ධයෙන් වැඩිදුරටත් සිදු කෙරෙන අණුක සහ ජානමය අධ්‍යයන තුළින් ප්‍රතිරෝධීතාව සඳහා බලපාන ජාන ලක්ෂණීකරණය කර සිතියම් ගත කිරීමට අරමුණු කෙරේ.

අණුක සහ සෛල විද්‍යාත්මක විශ්ලේෂණය තුළින් ක්ෂුද්‍ර ප්‍රචාරණය කරන ලද "ඇඹුල් කෙසෙල්වල" දෙහික ක්ලෝන ප්‍රභේදනයන් හඳුනා ගැනීම

වෙනත් ප්‍රභේදීය ලක්ෂණ මිශ්‍ර වූ පැළ (Off type plants) 7ක සහ නීරෝගී පැළයක ඩීඑන්ඒ යොදා ගනිමින් පීසීආර් විශ්ලේෂණය අබණ්ඩව සිදු කර ඒවායෙහි බහුරූපීතාව පිළිබඳව සොයා බලන ලදී. එහිදී මූලික (Primers) 7ක් වෙනත් ප්‍රභේදීය ලක්ෂණ මිශ්‍ර වූ පැළ (Off types) අතරද නිරෝගී හා වෙනත් ප්‍රභේදීය ලක්ෂණ මිශ්‍ර වූ පැළ අතරද බහුරූපී සලකුණු (Polymorphic bands) පෙන්නුම් කළේය. බහුරූපී සලකුණු (Polymorphic bands) විශ්ලේෂණයෙන් වෙනත් ප්‍රභේදීය ලක්ෂණ මිශ්‍රවූ පැළ (Off types) අතර 21%ක ප්‍රභේදනයක් ඇති බව පෙනිණි. සමූහ විශ්ලේෂණයෙන් (Cluster analysis) වෙනත් ප්‍රභේදීය ලක්ෂණ මිශ්‍ර වූ පැළ (Off types) අතරද නීරෝගී හා වෙනත් ප්‍රභේදීය ලක්ෂණ මිශ්‍රවූ පැළ (Off types) අතරද පවතින ජානමය වෙනස පැහැදිලිව පෙන්වන ලදී. මෙම ජානමය ප්‍රභේදනයට හේතුවන්නට ඇත්තේ කෙසෙල් පැළ ක්ෂුද්‍ර ප්‍රචාරණයේදී හා නිෂ්පාදනයේදී සිදුවන්නට ඇති දෙහික ක්ලෝන ප්‍රභේදනයයි.

දේශීය වශයෙන් බිහි කරන ලද "භාතිය" හා "මහේෂි" නමැති දෙමුහුම් තක්කාලි ප්‍රභේද දෙකෙහි සහ "සම්පත්" නැමැති දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේදයේ පවිත්‍රතාව පරීක්ෂා කිරීම සඳහා අණුක සලකුණු ජනනය කිරීම

එස්එස්ආර් මූලික (SSR Primers) යොදා ගනිමින් අදාළ සහභිජාත ආරවල සහ දෙමුහුම්වල ඩීඑන්ඒ සම්බන්ධයෙන් පීසීආර් විශ්ලේෂණය (PCR Analysis) සිදු කර බහුරූපී සලකුණු ඇත්දැයි සොයා බලන ලදී. 2010 වර්ෂයේදී එස්එස්ආර් මූලික (SSR Primers) 20ක් යොදා ගනිමින් තක්කාලි දෙමුහුම් 2කට අදාළව පීසීආර් විශ්ලේෂණය (PCR Analysis) සම්පූර්ණ කෙරිණි. කෙසේවුවද, කිසිදු එස්එස්ආර් මූලිකයක් (SSR Primers) දෙමුහුම් 2හි කිසිදු ප්‍රභේදයක සහභිජාත මාපිය ආර අතර බහුරූපීතාවක් පෙන්නුම් නොකෙළේය. මාපිය ආර අතර බහුරූපීතාව දක්වන විශ්වසනීය සලකුණු හඳුනා ගැනීම සඳහා මෙම විශ්ලේෂණය අබණ්ඩව සිදු කෙරෙනු ඇත. සම්පත් නමැති දෙමුහුම් බඩඉරිඟු ප්‍රභේදය සඳහා පීසීආර් විශ්ලේෂණය (PCR Analysis) සම්පූර්ණ කරන ලදී. සලකුණු 2ක් මාපිය ආර දෙක අතර බහුරූපීතාවක් ඇතිබව පෙන්වීය. ඒවායෙහි ක්‍රියාකාරිත්වය තහවුරු කර ගැනීම සඳහා වැඩිදුරටත් විශ්ලේෂණය කෙරෙනු ඇත. එමගින් බලාපොරොත්තු තබාගත හැකි මට්ටමේ ප්‍රතිඵල

ලබාදුනහොත් අණුක සලකුණු දෙක සම්පත් නමැති දෙමුහුම් ප්‍රභේදයේ වාණිජමය බීජ තොගවල පවිත්‍රතාව පරීක්ෂා කර බැලීම සඳහා යොදා ගත හැකිය.

නලස්ථ සංරක්ෂණය

කෙසෙල්, බතල, කිරි අල සහ අර්තාපල්වල ජනකප්ලාස්ම 08ක්, 115ක්, 60ක්, සහ 15ක් වශයෙන් විද්‍යාගාර තුළ නලස්ථ ස්වරූපයෙන් නඩත්තු කෙරිණි. එමෙන්ම බතල හා කිරි අල ජනකප්ලාස්මවලින් ලබාගත් ප්‍රතිවලිත පැළ පැළෑටි ගෘහය තුළ බඳුන්ගත ස්වරූපයෙන් නඩත්තු කෙරිණි.

විශේෂ ව්‍යාපෘති

ශ්‍රී ලංකා - අ.ඒ.ජ. ව්‍යාපෘතිය

ශ්‍රී ලංකා - අ.ඒ.ජ. සහයෝගීතා ජනකප්ලාස්ම සංවර්ධන වැඩසටහන යටතේ ක්ෂුද්‍ර ප්‍රචාරණය මඟින් කෙසෙල් සහ පැණි දොඩම්වල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම පිණිස 2009 අගෝස්තු මස ආරම්භ කරන ලද ව්‍යාපෘති අංක 1 හි කාර්යයන් අබණ්ඩව සිදු කෙරිණි. මෙම ව්‍යාපෘතියේ අරමුණ කෙසෙල් සහ පැණි දොඩම් ප්‍රභේදවල රෝග නොමැති රෝපණ ද්‍රව්‍ය නිපදවීමයි. මෙම වැඩසටහන මඟින් 2010 ජනවාරි - මැයි මස දක්වා කෙසෙල් ප්‍රභේදවල ක්ෂුද්‍ර ප්‍රචාරණය සහ පැණි දොඩම් ප්‍රභේද පරීක්ෂණ නල තුළම බද්ධ කිරීම හා අර්ධ ක්ෂුද්‍ර – බද්ධ කිරීම සඳහා අවශ්‍ය මාධ්‍ය ආදි තත්වයන් (Protocols) ප්‍රශස්ත කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී.

කෙසෙල් ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීම

රතඹලා, ඇම්බන්, පූවාළු, සීනි, අග්‍රා (කෝලිකුට්ටු), කණ්ඩුල (ද්විත්ව වර්ගය), ප්‍රසාද් (අළු කෙසෙල්) සහ පුලතිසි (පිසීමට ගන්නා වර්ගය) යන කෙසෙල් ප්‍රභේදවල නලස්ථ රෝපිත ඇති කෙරිණි. ඇම්බන්, ප්‍රසාද්, පූවාළු සහ ඇඹුල් යන ප්‍රභේදවල ගුණනය කරන ලද පැළ 177ක් පමණ දැඩි කිරීමේ අදියරෙහි පවතින අතර මාස කිහිපයකින් ක්ෂේත්‍රයේ වගා කිරීම සඳහා සූදානම් කර ඇත. 2010 වර්ෂය අවසානය වනවිට මෙම වැඩසටහන යටතේ විවිධ කෙසෙල් ප්‍රභේදවල ක්ෂුද්‍ර ප්‍රචාරණය කරන ලද රෝපිත 1,000ක් පමණ විවිධ ගුණන අදියරවලද සීනි, ඇම්බන් හා රතඹලා යන ප්‍රභේදවල සාර්ථක නව රෝපිත 60ක් ආරම්භක අදියරෙහිද පැවතිණි.

පැණි දොඩම් ක්ෂුද්‍ර ප්‍රචාරණය කිරීම

පැඟිරි විශේෂ කිහිපයක බීජ එක්රැස් කරගෙන පැණි දොඩම් ප්‍රභේදවල ක්ෂුද්‍ර හා අර්ධ ක්ෂුද්‍ර බද්ධ සඳහා ග්‍රාහක වශයෙන් ගත හැකිදැයි පරීක්ෂා කර බලන ලදී. රළු ලෙමන්. යොන් දෙහි, ලීමා හෝ යක්දෙහි (*Citrus jambhiri*), ඇඹුල් දොඩම් (*Citrus aurantium*) සහ පිලිපීන රතු දෙහි (*Citrus madurensis loureiro* හෝ *Citrofortunella mitis*) මෙම විශේෂ තුළ අන්තර්ගතය. මෙම වැඩසටහන හරහා පරීක්ෂණ නල තුළ ක්ෂුද්‍ර බද්ධ පැළ රාශියක් නිපදවීමට හැකිවිය. කෙසේවුවද, මෙහි සාර්ථකත්ව ප්‍රතිශතය අඩු මට්ටමක පැවති අතර පැළ හට ගන්නා අදියරේදී ඇතිවූයේ පැළ 60ක් පමණ වූ සංඛ්‍යාවකි. 2010 වසර අවසානයට දැඩි කිරීමේ අදියරේ පැවති පැළ සංඛ්‍යාව 75කි. අර්ධ ක්ෂුද්‍ර බද්ධ කිරීමේ සාර්ථකත්ව ප්‍රතිශතය එයට වඩා ඉහළ මට්ටමක් පැවතිණි.එමගින් පැළ හට ගන්නා අදියරේදී පැළ 30ක් පමණ ලබාදුන් අතර 2010 වසර අවසානයට දැඩි කිරීමේ අදියරෙහි පැවති පැළ සංඛ්‍යාව 60ක් විය.

පැළෑටි ජාන සම්පත් තොරතුරු කළමනාකරණ ක්‍රමය

පැළෑටි ජාන සම්පත් පිළිබඳ දත්ත මූලය

දත්ත මූලයට දත්ත ඇතුළු කිරීම සහ එම දත්ත වැඩිදියුණු කිරීම අබණ්ඩව සිදු කෙරිණි. දැනට මෙම දත්ත මූලයෙහි ජාන සම්පත් එකතුන් 12,620ක ක්ෂේත්‍ර දත්ත සහ වී, බඩඉරිඟු, කුරක්කන්, තණහාල්, ඉඳල් ඉරිඟු, සෝයා බෝංචි, උඳු, කව්පි, මුං, කොණ්ඩ කඩල, රටකජු, තම්පලා, බෝංචි, දඹල, මෑ, වම්බටු, තක්කාලි, මාළුමිරිස්, වැටකොළු, වට්ටක්කා, පතෝල, කරවිල, නියං වැටකොළු, වට්ටක්කා, අඹ සහ තල ඇතුළු බෝග 25ක ලක්ෂණීකරණ දත්ත ඇතුළත් වේ.

ආහාර හා කෘෂිකර්ම සංවිධාන ව්‍යාපෘතිය : ආසියාවේ පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය සහ ඒවායෙහි තිරසාර භාවිතය වර්ධනය කිරීම සඳහා ධාරිතාව සහ හැකියාවන් වැඩිදියුණු කිරීම සහ කලාපීය සහයෝගිතාවක් ඇති කිරීම

ආහාර හා කෘෂිකර්මික කටයුතු සඳහා පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය සහ තිරසාර උපයෝජනය පිළිබඳ ගෝලීය ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම පිණිස ජාතික තොරතුරු හුවමාරු යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම

ජර්මනියේ ලෙප්සිග්හි 1996 ජූනි මස පවත්වන ලද පැළෑටි ජාන සම්පත් පිළිබඳ සිවුවන අන්තර් ජාතික තාක්ෂණික සමුළුවේදී ශ්‍රී ලංකාව ඇතුළු නියෝජිත

රටවල් 150ක් විසින් ආහාර හා කෘෂිකාර්මික කටයුතු සඳහා -පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය සහ තිරසාර උපයෝජනය පිළිබඳ ගෝලීය ක්‍රියාකාරී සැලැස්ම නිල වශයෙන් අනුමත කර ගන්නා ලදී.

මෙම සැලැස්ම තුළ ප්‍රදේශීය, ජාතික, කලාපීය සහ අන්තර්ජාතික මට්ටමින් හඳුනා ගන්නා ලද ප්‍රමුඛතාව හිමිවිය යුතු කාර්යයන් ඇතුළත් වන අතර මෙය සංරක්ෂණ හා උපයෝජන කටයුතු ස්ථිර පදනමක් මත සිදු කිරීමට ඉවහල් වන රාමුවක් සපයයි.

ආසියාවේ පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය සහ තිරසාර භාවිතය වර්ධනය කිරීම සඳහා ධාරිතාව හා හැකියාවන් වැඩිදියුණු කිරීම සහ කලාපීය සහයෝගිතාව ඇති කිරීම පිළිබඳ ආහාර හා කෘෂිකර්ම සංවිධාන ව්‍යාපෘතිය යටතේ 2009 වසරේ සිට ගෝලීය ක්‍රියාකාරී සැලැස්මට අදාළ ජාතික තොරතුරු යාන්ත්‍රණය අබණ්ඩව ක්‍රියාත්මක කිරීමේ කටයුතු (GCP/RAS/240/JPN) 2010 වසරේදී ආරම්භ කරන ලදී. ඒ අනුව, යථාවත් කිරීම හා වැඩි පාර්ශ්වකරුවන් පිරිසක් සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම තුළින් දත්ත මූලය වැඩිදියුණු කෙරෙනු ඇත.

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය විසින් මෙම ව්‍යාපෘතිය යටතේ සංවිධානය කරන ලද පාර්ශ්වකරුවන්ගේ පළමු ජාතික වැඩමුළුව 2010 ජූනි 14 – 15 දක්වා මීගමුවේ පැරඩයිස් බීච් හෝටලයේදී පැවැත්විණි. පාර්ශ්වකරුවන් වූ විවිධ ආයතනවලින් 35දෙනෙකුගෙන් සමන්විත පිරිසක් මෙම වැඩමුළුවට සහභාගි වූහ. ව්‍යාපෘතියේ අරමුණ සහ අනුගමනය කළයුතු ක්‍රියාපටිපාටි පාර්ශ්වකාර ආයතනවල ප්‍රධානීන්ට පැහැදිලි කර දෙන ලද අතර එහිදී සම්බන්ධීකාරක නිලධාරීන් නිශ්චය කර ගන්නා ලදී. පාර්ශ්වකරුවන්ගේ දෙවන ජාතික වැඩමුළුව 2010 අගෝස්තු 27 දින පේරාදෙණිය, ගන්නොරුවෙහි පිහිටි පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන ලදී. මෙයට 49දෙනෙකුගෙන් යුතු පිරිසක් සහභාගි වූ අතර එහිදී ගෝලීය ක්‍රියාකාරී සැලැස්මෙහි ජාතික තොරතුරු හුවමාරු යාන්ත්‍රණයට අදාළ පරිගණක වැඩසටහන ප්‍රදර්ශනය කරන ලදී. එමෙන්ම දත්ත මූලය සඳහා මූලික තොරතුරු ලබාදෙන ලෙස පාර්ශ්වකරුවන්ගෙන් ඉල්ලා සිටින ලදී. දත්ත රැස් කිරීමේ කටයුතු 2010 නොවැම්බර් මාසයේදී ආරම්භ කෙරිණි.

අන්තර්ජාතික ජෛව විවිධත්ව වසර සැමරීම

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය විසින් අන්තර්ජාතික ජෛව විවිධත්ව වසර සැමරීම පිණිස 2010 දෙසැ. 27 දින දඹාන සංස්කෘතික මධ්‍යස්ථානයේදී වැඩමුළුවක් සංවිධානය කෙරිණි. එහි අරමුණ වූයේ ආහාර හා කෘෂිකාර්මික කටයුතු සඳහා පැළෑටි ජාන සම්පත් සංරක්ෂණය හා භාවිතය වර්ධනය කිරීම පිණිස ගොවීන් සහ ආදිවාසී ගොවීන් සමඟ සහයෝගිතා වැඩසටහනක් ක්‍රියාවට නැංවීමයි.

හසලක ප්‍රදේශයේ ගොවිහු 22දෙනෙක්, ආදිවාසී ගොවිහු 53දෙනෙක්, කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිලධාරීහු 31දෙනෙක් සහ දඹාන සංස්කෘතික මධ්‍යස්ථානයේ නිලධාරියෙක් මෙම වැඩමුළුව සඳහා සහභාගි වූහ. ආදිවාසී නායක උෟරු වරිගේ වන්නියා ඇත්තන්ට ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වීමට ඇරයුම් කරන ලදී.

දැනට පවතින පැළෑටි ජාන සම්පත් ආහාර හා කෘෂිකාර්මික කටයුතු සඳහා සංරක්ෂණය හා උපයෝජනය කිරීමේ වැඩසටහන ආරම්භ කර ශක්තිමත් කිරීමේ අරමුණින් ජෛව විවිධත්වය පිළිබඳ ඉදිරිපත් කිරීම්, සාකච්ඡා සහ අදාළ ද්‍රව්‍ය හුවමාරු කර ගැනීම මෙම වැඩසටහනට ඇතුළත් විය.

බීජ නියැදි ආදිවාසී නායකයාට ලබාදුන් අතර උමා නමැති තල ප්‍රභේදය, කැකිරි නියැදියක් (*Cucumis*) සහ කුරක්කන් නියැදියක් මෙතුළ අන්තර්ගත විය. ක්ෂේත්‍ර බෝග පර්යේෂණ සහ සංවර්ධන ආයතනයෙන් ලද මිරිස් ප්‍රභේද 2ක්ද (වන්නි මිරිස් සහ වැඩිදියුණු කරන ලද ආරක් – MICH – 06) බෙදා හරින ලදී. මෙම වැඩසටහන උතුරු සහ නැගෙනහිර පළාත්වල අබණ්ඩව ක්‍රියාත්මක කෙරෙනු ඇත.

පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන්

පාසැල් 60ක සිසුන් හා ගුරුවරුන්ගෙන් සමන්විත කණ්ඩායම් 8ක්, විශ්වවිද්‍යාල සිසුන් කණ්ඩායම් 20ක්, වනජීවී දෙපාර්තමේන්තුවේ කණ්ඩායම් 4ක්, කෘෂිකර්ම විද්‍යාල සිසුන් කණ්ඩායම් 3ක්, ගොවි සංවිධාන කණ්ඩායම් 3ක්, මහජන සෞඛ්‍ය පරීක්ෂක කණ්ඩායම් 1ක් සහ වෙනත් කණ්ඩායම් 4ක් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් 62ක් පවත්වන ලදී. පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය විසින් නයිවල කෘෂිකර්ම විද්‍යාලයේ සිසුන් 5දෙනෙකු උදෙසා ආයතනික පුහුණුවක් ද ලබාදෙන ලදී.

- ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සිසුන් තිදෙනෙකු සඳහා මාස 3ක් පුරා පෙව තාක්ෂණය පිළිබඳ පුහුණුවක් ලබාදෙන ලදී.
- කැලණිය විශ්වවිද්‍යාලයේ සිසුන් දෙදෙනෙකු සඳහා මාස 2ක් පුරා පෙව තාක්ෂණය පිළිබඳ පුහුණුවක් ලබාදෙන ලදී.
- රුහුණු විශ්වවිද්‍යාලයේ සිසුන් දෙදෙනෙක් මාස 5ක පුහුණුවක් ලබා ගෙන උපාධි පාඨමාලාවට

අදාළ සුදුසුකම් සපුරාලීමට අවශ්‍ය තම පර්යේෂණ ව්‍යාපෘති සම්පූර්ණ කළහ.

- පේරාදෙණිය කෘෂිකර්ම විද්‍යා පශ්චාත් උපාධි ආයතනයේ සිසුවෙක් මාස 6ක පුහුණුවක් ලබා එම්.එස්සී. උපාධියට අදාළ තම පර්යේෂණ ව්‍යාපෘතිය සම්පූර්ණ කළේය.

ප්‍රදර්ශන

පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය පල්ලේකැලේ "දැයට කිරුළ" ප්‍රදර්ශනය සඳහා සහභාගි වී සංරක්ෂණ කාර්යයන් සහ බෝග විවිධත්වය මහජනයාට ප්‍රදර්ශනය කළේය.

2010වසර සඳහා සැලැස්ම

- උතුරු නැගෙනහිර පළාත්වල විශේෂයෙන්ම තෝරාගත් ප්‍රදේශවල ජනකප්ලාස්ම ගවේෂණ හා එක්රැස් කිරීම් කටයුතු අබණ්ඩව සිදු කිරීම
- බීජ ජාන බැංකුව, පරීක්ෂණ නල, හරිතාගාර සහ ක්ෂේත්‍ර ජාන බැංකුව තුළ ජාන සම්පත් සංරක්ෂණය අබණ්ඩව සිදු කිරීම
- ජනකප්ලාස්ම හුවමාරුව අබණ්ඩව සිදු කිරීම
- කහ විචිත්‍ර වයිරසයට ප්‍රතිරෝධිතාවක් දක්වන එම්අයි – 7 නමැති බණ්ඩක්කා ප්‍රභේදය වැඩිදියුණු කිරීම සඳහා පිළි දෙමුහුම් අභිජනනය අබණ්ඩව සිදු කිරීම
- දුඹුරු පැළ කීඩෑවන්ට (*Nilaparvata lugens* sta^{0}l) සහ පැළ මැක්කන්ට (*Stenchaetothrips biformis*) ප්‍රතිරෝධී වී ජනකප්ලාස්ම ඇගයීම සහ ලක්ෂණීකරණය
- දේශීය වශයෙන් බිහි කරන දෙමුහුම් තක්කාලි, වම්බටු සහ බඩඉරිඟු ප්‍රභේදවල දෙමුහුම් කිරීමේ හැකියාව පරීක්ෂා කර බැලීම සඳහා ඩීඑන්ඒ සලකුණු පදනම් කරගත් තත්වයන් (Protocols) සකස් කිරීම
- රාම්පූර් නමැති ලූනු ප්‍රභේදවලට අයත් බීජ නියැදිවල ජානමය පවිත්‍රතාව පිළිබඳ අණුක විශ්ලේෂණය
- විදේශීය සහ දේශීය වශයෙන් බිහි කරන ලද සහනිජාත බඩඉරිඟු ආර අතර ජානමය සබඳතාව අධ්‍යයනය කිරීම.
- ක්ෂුද්‍ර බද්ධය තුළින් කෙසෙල් සහ පැණි දොඩම්වල රෝගවලින් තොර රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය
- නියඟයට ඔරොත්තු දෙන වී ජනකප්ලාස්මවල රූපීය සහ අණුක ලක්ෂණීකරණය
- පේව තාක්ෂණය, ජාන වෙනස් කරන ලද ද්‍රව්‍ය, ආහාර, සත්ව ආහාර සහ සකස් කරන ලද නිෂ්පාදනවල අවදානම තක්සේරු කිරීම පිළිබඳ දැනුවත් කිරීමේ, ආදර්ශනය කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- වත්මන් තොරතුරු කළමනාකරණ ක්‍රමය නඩත්තු කිරීම සහ වැඩිදියුණු කිරීම.

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරී/සේවක සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිලධාරී	08
පරිපාලන නිලධාරී	01
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරී	04
වැඩසටහන් සහකාර	03
කළමනාකරණ සහකාර සේවය	08
කෘෂි උපදේශක	05
පර්යේෂණ සහකාර	04
විද්‍යාගාර උප සහකාර	05
කාර්යාල කාර්ය සහායක	01
සිනමා යන්ත්‍ර ක්‍රියාකරු	01
රියදුරු	04
ගබඩා භාරකරු	01
ලොරි සහායක	01
වඩු කාර්මික	01
විදුලි කාර්මික	03
සංචාරක බංගලා භාරකරු	01
මුරකරු	06
කම්කරු	21
එකතුව	**79**

3.2 බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය, පේරාදෙණිය

බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානයේ මෙහෙවර වනුයේ ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාව වෙත තරඟකාරී මිල ගණන් යටතේ තත්වයෙන් උසස් බීජ හා රෝපණ ද්‍රව්‍ය සැපයුම සහතික කිරීමයි. මෙම මධ්‍යස්ථානය මෙරට බීජ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ බෙහෙවින් වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මෙරට නිර්දේශිත සියලුම බෝග ප්‍රභේදවලට අයත් මූලික බීජ මෙම මධ්‍යස්ථානය මගින් පාලනය වන රජයේ බීජ ගොවිපළ 18කදී නිෂ්පාදනය කෙරේ.

කෙසේ වුවද, ප්‍රධාන වශයෙන්ම වී, එළවළු සහ වෙනත් කෙෂ්ත්‍ර බෝගවල සහතික කළ බීජ නිෂ්පාදනය කෙරෙනුයේ තෝරාගත් කොන්ත්‍රාත් වගාකරුවන් මගිනි. ඒ ඒ කලාපය භාර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් (බීජ) 13දෙනෙකු මගින් බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය තම කටයුතු මෙහෙයවයි.

අයවැය

වගු අංක 3.2.1 : වාර්ෂික අයවැය - 2010 (රු.)

ප්‍රගතිය

බිත්තර වී නිෂ්පාදනය හා සැපයුම

රජයේ බීජ ගොවිපළවල මූලික බිත්තර වී නිෂ්පාදනය

රජයේ බීජ ගොවිපළ 7කදී නිර්දේශිත වී ප්‍රභේද 28ක අත්තිවාරම් බීජ හා ලියාපදිංචි බීජ නිෂ්පාදනය කෙරිණි. බතලගොඩ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය, බෝඹුවල කලාපීය කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය, අම්බලන්තොට වී පර්යේෂණ ස්ථානය සහ ලබුදූව කෘෂිකර්ම පර්යේෂණ ස්ථානය විසින් සපයන ලද අභිජනන බීජ යොදා ගනිමින් අත්තිවාරම් බීජ නිෂ්පාදනය කෙරිණි. 2010 වර්ෂයේදී ලියාපදිංචි කළ බිත්තර වී බු. 105,243ක් (ටො. 2,157.5ක්) නිපදවන ලද අතර 2009 වර්ෂයට සාපේක්ෂව ලියාපදිංචි කළ බිත්තර වී නිෂ්පාදනය 6.42%කින් ඉහළ නැංවිණි. එයට අමතරව මූලික බිත්තර වී නිෂ්පාදනය සඳහා ප්‍රයෝජනයට නොගත් වී වගා කෙෂ්ත්‍ර යොදා ගනිමින් බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථාන බීජ ගොවිපළවලදී සහතික කළ බිත්තර වී නිපදවිණි. මූලික බීජ නිෂ්පාදන වැඩසටහනෙන් ලැබුණු තත්වයෙන් අඩුබවට වර්ගීකරණය කරන ලද බිත්තර වී ප්‍රමාණයද ඇතුළුව 2010 වර්ෂයේදී නිපදවන ලද මුළු සහතික කළ බිත්තර වී ප්‍රමාණය බු. 17,729කි (ටො.363.5).

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	18,850,000	18,400,000	98
පුනරාවර්තන	53,220,000	51,390,000	97
වැපෑති			
බීජ නිෂ්පාදනය හා මිලදී ගැනීම	174,500,000	163,560,000	94
අපි වවමු – රට නගමු	5,750,000	4,910,000	85
කොම්පෝස්ට් නිෂ්පාදනය	500,000	20,000	4
බඩඉරිඟු දෙමුහුම් බීජ නිෂ්පාදනය	1,275,000	790,000	62
ජල සම්පාදන පහසුකම්	13,000,000	11,200,000	86
අපි වවමු - රට නගමු වැඩසටහන - අන්නාසි	546,000	306,000	56
එකතුව	**267,600,000**	**250,600,000**	**94**

වගු අංක 3.2.2 : 2010 වර්ෂයේදී රජයේ බීජ ගොවිපළවල මූලික බිත්තර වී නිෂ්පාදනය (මෙ.ටො.)

බීජ ගොවිපළ	2009/10 මහ			2010/ යල			එකතුව		
	අත්තිවාරම් බීජ	ලියාපදිංචි කළ බීජ	සහතික කළ බීජ	අත්තිවාරම් බීජ	ලියාපදිංචි කළ බීජ	සහතික කළ බීජ	අත්තවාරම් බීජ	ලියාපදිංචි කළ බීජ	සහතික කළ බීජ
අලුත්තරම	10.72	140.06	75.79	5.55	79.48	46.17	16.27	219.54	121.96
අම්බලන්තොට	1.93	65.99	19.06	1.84	39.87	44.36	3.77	105.86	63.42
බටඅත	1.09	23.70	19.23	1.27	12.05	29.33	2.36	35.75	48.56
කන්තලේ	8.63	266.87	1.72	13.75	250.20	2.93	22.38	517.07	4.65
මහ ඉලුප්පල්ලම	22.86	212.50	66.97	15.27	169.08	-	38.13	381.58	66.97
මල්වත්ත	11.77	174.66	43.62	8.92	150.62	3.98	20.69	325.28	47.60
පොළොන්නරුව	16.23	242.00	10.29	11.91	330.40	-	28.14	572.4	10.29
එකතුව (මෙ.ටො.)	**73.23**	**1125.78**	**236.68**	**58.51**	**1031.70**	**126.77**	**131.74**	**2157.48**	**363.45**
එකතුව (බු.)	**3572**	**54,916**	**11,546**	**2,855**	**50,327**	**6,184**	**6,426**	**105,243**	**17,729**

කොන්ත්‍රාත් වගා වැඩසටහන යටතේ සහතික කළ බීත්තර වී නිෂ්පාදනය

සහතික කළ බීත්තර වී නිෂ්පාදනය ප්‍රධාන වශයෙන්ම කොන්ත්‍රාත් වගාකරුවන් මගින් සිදු කළ අතර 2009/2010 මහ කන්නයේදී සහ 2010 යල කන්නයේදී බු. 60,000ක් මිලදී ගැනීමට (එක් කන්නයකට බු. 30,000ක්) බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය ඉලක්ක කළේය. හිතකර කාලගුණික තත්වයන් පැවතීමත් කෘෂිකර්ම දෙපාර්තතමේන්තුව විසින් අස්වැන්න සඳහා වඩා ඉහළ මිලක් ගොවියාට ලබා දීමත් නිසා බීත්තර වී බුසල් 83,776ක් මිලදී ගැනීම හැකිවිය. 2010 වර්ෂයේදී සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාප 9ක් තුළ මිලදී ගන්නා ලද සහතික කළ බීත්තර වී ප්‍රමාණයන් වගු අංක 3.2.3හි දැක්වේ.

වාණිජමය වගාව සඳහා උසස් තත්වයේ බීත්තර වී යොදා ගැනීම වැඩි කිරීම සඳහා පෞද්ගලික අංශයේ ආයතනද ඇතුළු බාහිර ආයතන ගණනාවක සහභාගිත්වය ඇතිව මෙම මධ්‍යස්ථානය විසින් උසස් තත්වයේ බීජ නිෂ්පාදනය කිරීමට සාමූහික වැඩසටහනක් ක්‍රියාත්මක කෙරිණි. මෙම වැඩසටහන යටතේ, ලියාපදිංචි කළ බීත්තර වී අදාළ ආයතනවලට නිකුත් කරන ලද අතර එයින් ඇතිකළ වී වගාවන් සහ බීජ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ සහතික කිරීමේ සේවය මගින් සහතික කරන ලදී. එමෙන්ම, උසස් තත්වයේ බීත්තර වී නිපදවීම සහතික කිරීම සඳහා ද්විතියික බීජ ගොවිපළ වැඩසටහන යටතේ ගොවීන්ට ලියාපදිංචි කළ බීත්තර වීද නිකුත් කරන ලදී.

රාජ්‍ය හා පෞද්ගලික අංශවල විවිධ ආයතන විසින් නිපදවන ලද සහතික කළ බීජ ප්‍රමාණයන් වගු අංක 3.2.4හි දැක්වේ. පෞද්ගලික අංශයේ සත්‍ය නිෂ්පාදනය නිකුත් කරන ලද ප්‍රමාණයට වඩා වැඩිය. එයට හේතුව තමන්ගේම තත්ව පාලන ක්‍රම පැවතීම මත සමහර සමාගම් නිල බීජ සහතිකකරණ වැඩසටහනට සහභාගි නොවීමයි. 2010 වර්ෂයේදී නිල සහතිකකරණ වැඩසටහන යටතේ නිපදවන ලද සහතික කළ බීත්තර වී ප්‍රමාණය ටොන්.17,624.18 ක් (බු.859,718ක්) වූ අතර (වගු අංක 3.2.4) එය දිවයිනේ සමස්ත බීත්තර වී අවශ්‍යතාවෙන් 15.6% කට සමානය. 2009 වර්ෂයට සාපේක්ෂව මෙය 6% ක වර්ධනයකි. සමස්ත බීජ අවශ්‍යතාවෙන් 15%ක් පමණ සහතික කළ බීජ මගින් සපුරා ගැනීම සතුටුදායක තත්වයක් වශයෙන් සැලකේ.

වගු අංක 3.2.3 : මිලදී ගන්නා ලද සහතික කළ බීත්තර වී ප්‍රමාණයන්

සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂ කලාපය	මිලදී ගන්නා ලද ප්‍රමාණය			
	2009/10 මහ (ටොන්.)	2010 යල (ටොන්.)	එකතුව (ටොන්.)	එකතුව (බු.)
අළුත්තරම	147.8	129.48	277.29	13,527
අම්පාර	255.7	191.04	446.74	21,792
බටඇත	42.13	67.22	109.35	5,334
කන්තලේ	59.79	132.89	192.68	9,399
මහ ඉල්ලුප්පල්ලම	103.09	48.95	152.04	7,417
නිකවැරටිය	131.34	142.27	273.67	13,347
පැල්වෙහෙර	31.65	37.82	69.47	3,389
පොළොන්නරුව	42.60	103.33	145.96	7,120
වවුනියාව	50.24	-	50.24	2,451
එකතුව (මෙ.ටොන්.)	**864.36**	**855.05**	**1,717.41**	
එකතුව (බු.)	**42,163.74**	**41,612.47**		**83,776**

වගු අංක 3.2.4 : සහතික කළ බීජතර වී නිෂ්පාදනය පිළිබඳ සහයෝගිතා වැඩසටහන

ආයතනය	2009/10 මහ		2010 යල		2010 වර්ෂය		නිෂ්පාදනය	
	කෘෂිකර්ම දෙපා. විසින් නිකුත් කරන ලද ප්‍රමාණය (ටො.)	සහතික කරන ලද වගා බිම් ප්‍රමාණය (අක්.)	කෘෂි.දෙපා. විසින් නිකුත් කරන ලද පමාණය (ටො.)	සහතික කරන ලද වගාබිම් ප්‍රමාණය (අක්.)	කෘෂි.දෙපා. විසින් නිකුත් කරන ලද ප්‍රමාණය (ටො.)	සහතික කරන ලද වගාබිම් ප්‍රමාණය (හෙ.)	ටො.	බු.
කෘෂිකර්ම දෙපාර්ත.							1,706.9	83,265
පළාත්	93.05	2,153.0	93.21	1,879.5	186.26	4,032.5	3,720.0	181,463
අන්තර් පළාත්	58.26	1,187.5	45.98	1,034.5	104.24	2,222.0	2,049.8	99,990
ගොවිජන සේවා	15.27	272.5	35.53	811.5	50.8	1,084.0	1,000.0	48,780
මහවැලි	33.97	781.5	15.21	281.0	49.18	1,062.5	980.2	47,813
සමූපකාර	16.15	361.0	12.47	281.5	28.62	642.5	592.7	28,913
ගොවි සංවිධාන	63.04	1,408.5	93.19	2,107.0	156.23	3,515.5	3,243.0	158,198
ගොවීන්	72.92	1,713.0	45.28	1,068.0	118.2	2,781.0	2,565.5	125,145
පෞද්. සමාගම්	43.15	970.0	26.38	625.5	69.53	1,595.5	1,471.8	71,798
වෙනත්	6.17	144.0	8.10	175.0	14.27	319.0	294.3	14,355
එකතුව	**401.98**	**8,991**	**375.35**	**8,263.5**	**777.33**	**17,254.5**	**17,624.18**	**859,718**

බිත්තර වී නිකුත් කිරීම

බීජ නිෂ්පාදනය සහ වාණිජමය වගාව සඳහා 2010 වර්ෂයට අදාළව කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මුළු බිත්තර වී ප්‍රමාණයන් වගු අංක 3.2.5හි දැක්වේ. පසුගිය කන්නයේ අභිජනන බීජවලින් නිපදවන ගන්නා ලද අත්තිවාරම් බීජ රජයේ බීජ ගොවිපළවල ලියාපදිංචි බීජ නිපදවීම සඳහා භාවිත කෙරිණි. සහතික කළ බීජ නිපදවීම සඳහා ලියාපදිංචි කළ බීජ කොන්ත්‍රාත් වගාකරුවන්ට මෙන්ම පෞද්ගලික අංශයේ ආයතන ඇතුළු පෞද්ගලික බීජ වගාකරුවන්ටද ලබාදෙන ලදී. 2010 වර්ෂයේදී මුළු ලියාපදිංචි කළ බීජ සැපයුම ටො. 1629.26ක් (බු. 79,476ක්) විය. සහතික කළ බිත්තර වී සැපයුම ටො. 1140.07කි (බු. 55,613).

වගු අංක 3.2.5 : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද බිත්තර වී ප්‍රමාණයන් (ටො.)

කන්නය	වැඩසටහන	අත්තිවාරම් බීජ	ලියාපදිංචි බීජ	උප එකතුව	සහතික කළ බීජ	මුළු එකතුව (ටො.)	බු.
2010 යල	ගොවිපළ	12.03	3.50	15.53	-	15.53	758
	කොන්ත්‍රාත් වගාව	2.05	25.81	27.86	3.46	31.32	1,528
	පෞද්ගලික	2.21	358.74	360.95	44.16	405.11	19,761
	ව්‍යාප්ති	0.06	263.73	263.79	254.11	517.90	25,263
	උප එකතුව (ටො.)	16.35	651.78	668.13	301.73	969.86	
	උප එකතුව (බු.)	798	31,794	32,592	14,718		47,310
2010/11 මහ	ගොවිපළ	24.60	3.24	27.84	0.29	28.13	1,372
	කොන්ත්‍රාත් වගාව	1.21	45.61	46.82	3.01	49.83	2,431
	පෞද්ගලික	5.35	422.32	427.67	112.09	539.76	26,330
	ව්‍යාප්ති	3.20	506.31	509.51	722.95	1,232.46	60,120
	උප එකතුව (ටො.)	34.36	977.48	1,011.84	838.34	1,850.18	
	උප එකතුව (බු.)	1,676	47,682	49,358	40,895		90,253
2010 වසර සඳහා නිකුත් කිරීම්	ගොවිපළ	36.63	6.74	43.37	0.29	43.66	2,130
	කොන්ත්‍රාත් වගාව	3.26	71.42	74.68	6.47	81.15	3,959
	පෞද්ගලික	7.56	781.06	788.62	156.25	944.87	46,091
	ව්‍යාප්ති	3.26	770.04	773.30	977.06	1,750.36	85,383
	උප එකතුව (ටො.)	50.71	1,629.26	1,679.97	1,140.07	2,820.04	
	උප එකතුව (බු.)	2,474	79,475	81,950	55,613		137,563

වෙනත් කෙෂ්ත්‍ර බෝග බීජ නිෂ්පාදනය සහ බෙදා හැරීම

2010 වර්ෂයේදී විවිධ බීජ පංති 4ක බීජ (අත්තිවාරම්, ලියාපදිංචි, සහතික කළ සහ වාණිජමය බීජ) නිපදවීම සඳහා වෙනත් කෙෂ්ත්‍ර බෝග ප්‍රභේද 10ක් යොදා ගන්නා ලදී.

මූලික බීජ (අත්තිවාරම් සහ ලියාපදිංචි බීජ) නිෂ්පාදනය

මෙම වසරේදී රජයේ බීජ ගොවිපළවල නිපදවන ලද අත්තිවාරම් බීජ ප්‍රමාණයන් සහ රජයේ ගොවිපළවල සහ කොන්ත්‍රාත් ක්‍රමයට බීජ නිපදවන ගොවිපළවල නිපදවන ලද ලියාපදිංචි බීජ ප්‍රමාණයන් වගු අංක 3.2.6හි දැක්වේ. 2010 වසරේදී නිපදවන ලද මුළු මූලික බීජ ප්‍රමාණය (අත්තිවාරම් සහ ලියාපදිංචි) කි.ග්‍රෑ. 64,369ක් වූ අතර එය පෙර වසරේ නිෂ්පාදනයට (කි.ග්‍රෑ. 45,035) වඩා 43%ක වැඩිවීමකි. මෙය ප්‍රධාන වශයෙන්ම මිරිස් හා බඩඉරිඟු හැරුණු කොට අනෙකුත් සියලුම බෝගවල (කව්පි, උඳු, තල, මුං, රටකජු, කුරක්කන් හා සෝයාබෝංචි) මූලික බීජ ඉහළ ප්‍රමාණයන්ගෙන් නිපදවීම නිසා සිදුවූවකි. කොන්ත්‍රාත් ක්‍රමයට ලියාපදිංචි බීජ නිෂ්පාදනය කිරීමේ වැඩසටහන පුළුල් කිරීම මෙම ජයග්‍රහණයට ප්‍රධාන වශයෙන්ම හේතු විය.

මෙම වසරේදී "දඹුල්ල වරණය" නමැති නව නිර්දේශිත ලොකු ලූනු ප්‍රභේදයේ බීජ නිෂ්පාදනයද මහ ඉලුප්පල්ලම බීජ ගොවිපළේදී ආරම්භ කරන ලද අතර එහිදී මව් බල්බ කි.ග්‍රෑ. 145ක් නිෂ්පාදනය කරන ලදී. 2011 වසරේ ජනවාරි මස බීජ ලබා ගැනීමට බෝග ස්ථාපිත කිරීම සඳහා මේවා භාවිතා කරනු ඇත. නව මිරිස් ප්‍රභේද 2ක (එම්අයි ග්‍රීන් සහ ගල්කිරියාගම වරණය) මූලික බීජ නිෂ්පාදනයද මෙම වසරේදී සිදු කෙරිණි.

සහතික කළ බීජ නිෂ්පාදනය

වෙනත් කෙෂ්ත්‍ර බෝගවල සහතික කළ බීජ නිෂ්පාදනය ප්‍රධාන වශයෙන්ම කොන්ත්‍රාත් බීජ ගොවිපළ හරහා සිදු කෙරිණි. කෙසේ වුවද, සම්පත් නමැති බඩඉරිඟු ප්‍රභේදයේ දෙමුහුම් බීජ ප්‍රධාන වශයෙන්ම මහ ඉලුප්පල්ලම, අලුත්තරම සහ බටඅත පිහිටි රජයේ බීජ ගොවිපළවල නිපදවිණි. නිපදවන ලද මුළු සහතික කළ බීජ නිෂ්පාදනය ටො. 280ක් වූ අතර එය 2009 වසරට වඩා 133.56%කින් වැඩි විය. (වගු අංක 3.2.7). මෙය ප්‍රධාන වශයෙන්ම සියලුම බෝගවල බීජ කොන්ත්‍රාත් ක්‍රමයට නිපදවීමේ වැඩසටහන පුළුල් කිරීම නිසා සිදුවූවකි.

කෙසේ වුවද, බෝග වර්ධන අදියරේදී මෙන්ම අස්වනු නෙළන අදියරේදීද පැවති අයහපත් දේශගුණික තත්වය හේතුවෙන් කොන්ත්‍රාත් ක්‍රමය යටතේ මිරිස් බීජ නිෂ්පාදන ඉලක්කය සපුරා ගැනීමට නොහැකි විය. එමෙන්ම, කරල් ඇති වූ අවධියේදී දිවයිනෙහි අමු මිරිස් සඳහා වඩා ඉහළ මිලක් පැවතීම හේතුවෙන් බීජ සඳහා මිරිස් වගා කළ ගොවීහු තම අස්වැන්න අමු මිරිස් වශයෙන් අලෙවි කළහ. රජයේ බීජ ගොවිපළවල සහ පර්යේෂණ ස්ථානවල භාවිතය සඳහා කොළ පොහොර සඳහා ගන්නා සන්හෙම්ප් සහ සෙස්බනියා රොස්ට්‍රාටා (*Sesbania rostrata*) වැනි බෝග 2ක වාණිජමය බීජ සීමිත ප්‍රමාණයක්ද නිපදවන ලදී.

2010 වර්ෂය තුළ වෙනත් කෙෂ්ත්‍ර බෝග බීජ නිකුත් කිරීම

2010 වර්ෂයේදී නිකුත් කරන ලද මූලික (අත්තිවාරම් සහ ලියාපදිංචි බීජ) සහ සහතික කළ බීජ ප්‍රමාණය වගු අංක 3.2.8හි දැක්වේ. මෙම වසරේදී නිකුත් කරන ලද මුළු බීජ ප්‍රමාණය ටො. 267ක් පමණ වූ අතර එය පෙර වසරට වඩා 80%ක පමණ වැඩිවීමකි. මෙයට ප්‍රධාන හේතුව බඩඉරිඟු සහ කුරක්කන් බීජ හැරුණු විට සියලුම බෝගවල බීජ නිකුත් කිරීම් වැඩිවීමයි. මෙය පසුගිය වසර 25ක කාලය තුළ වාර්තාගත වූ වැඩිම බීජ නිකුත් කිරීම විය.

වගු අංක 3.2.6 : 2010 වර්ෂයේදී වෙනත් ක්ෂේත්‍ර බෝගවල මූලික බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)

බෝගය	අත්තිවාරම්			ලියා පදිංචි කළ							මුළු මූලික බීජ නිෂ්පාදනය
	රජයේ ගොවිපළ			රජයේ ගොවිපළ			කොන්ත්‍රාත් වැඩසටහන			උප එකතුව	
	2009/10 මහ	2010 යල	උප එකතුව	2009/10 මහ	2010 යල	උප එකතුව	2009/10 මහ	2010 යල	උප එකතුව		
උඳු	482	147	629	391	312	703	2,228	1,929	4,157	4,860	5,489
මීරිස් බීජ (මූලික බීජ)	83	180	263	0	0	0	0	0	0	0	263
කව්පි	134	196	330	1,600	812	2,412	1,571	8,124	9,695	12,107	12,437
තල	158	0	158	88	0	88	25	1,304	1329	1,417	1,575
මුං	326	136	462	422	532	954	3,862	9,879	13,741	14,695	15,157
රටකජු	2,270	1,031	3,301	414	366	780	2,301	558	2,859	3,639	6,940
කුරක්කන්	172	387	559	1,445	955	2,400	150	235	385	2,785	3,344
බඩඉරිඟු බීජ (එළිමහනේ පරාගණය වූ ප්‍රභේද)	824	1,716	2,540	103	2,397	2,500	2,532	2,582	5,114	7,614	10,154
සෝයා බෝංචි	0	539	539	139	212	351	471	7,511	7,982	8,333	8,872
ලොකු ඵූනූ (මව් බල්බ)	0	145	145	0	0	0	0	0	0	0	145
එකතුව	**4,449**	**4,477**	**8,926**	**4,602**	**5,586**	**10,188**	**13,140**	**32,122**	**45,262**	**55,450**	**64,376**

වගු අංක 3.2.7 : 2010 වර්ෂයේදී රජයේ බීජ ගොවිපළ සහ කොන්ත්‍රාත් වගාව යටතේ සහතික කළ හා වාණිජමය බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)

බෝගය	කොන්ත්‍රාත් වැඩසටහන							බීජ ගොවිපළ							
	2009/10 මහ			2010 යල				2009/10 මහ			2010 යල				
	සහතික කළ	වාණිජ මය	එකතුව	සහතික කළ	වාණිජමය	එකතුව	උප එකතුව	සහතික කළ	වාණිජ මය	එකතුව	සහතික කළ	වාණිජ මය	එකතුව	උප එකතුව	මුළු එකතුව
උඳු	12284.5	2550	14834.5	5432.5	13893	19325.5	34160	0	0	0	0	0	0	0	34160
මීරිස් බීජ	4.6	0	4.5	271.3	34	305.3	309.9	0	0	0	0	0	0	0	309.9
කව්පි	5402.8	1047.3	6450.1	4965.37	12455	17420.33	23870.43	0	0	0	0	58	58	58	23928.43
තල	4815.5	0	4815.5	3031	693	3724	8539.5	00	0	0	0	0	0	0	8539.5
මුං	25599.8	2331.7	27931.5	38286.85	27578.1	65864.95	93796.45	0	0	0	0	0	0	0	93796.45
රටකජු	8580.9	452	9032.9	21621	5847.2	27468.2	36501.1	204	0	24	0	0	0	204	36705.1
කුරක්කන්	683	0	683	726.5	0	726.5	1409.5	0	0	0	0	0	0	0	1409.5
බඩඉරිඟු බීජ (එළිමහනේ පරාගණය වූ)	34621.13	460.5	35081.63	6307.65	0	6307.65	41389.28	0	0	0	0	0	0	0	41389.82
බඩඉරිඟු (සම්පත්)	0	0	0	0	0	0		3486	0	3486	708.2	0	708.2	4194.19	4194.19
සෝයා බෝංචි	4116.5	0	4116.5	28398	1006	29404	33520.5	0	0	0	0	0	0	0	33520.5
සන්හෙම්ප්								0	154	1504	0	859	859	2363	2363
සෙස්බනියා								0	0	0	0	0	0	0	0
එකතුව	**96108.73**	**6841.5**	**102950.2**	**109040.2**	**61506.3**	**170546.4**	**273496.7**	**3690**	**1504**	**5194**	**708.2**	**917**	**1625**	**6819.19**	**280315.8**

වගු අංක 3.2.8 : 2010 වර්ෂයේ වෙනත් ක්ෂේත්‍ර බෝග බීජ නිකුත් කිරීම (කි.ග්‍රෑ.)

බෝගය	2010 යල						2010/11 මහ						වසර 2010					
	අභිජනන	අත්තිවාරම්/මූලික	ලියාපදිංචි	සහතික කළ/සම්මත	වාණිජමය	එකතුව	අභිජනන	අත්තිවාරම්/මූලික	ලියාපදිංචි	සහතික කළ/සම්මත	වාණිජමය	එකතුව	අභිජනන	අත්තිවාරම්/මූලික	ලියාපදිංචි	සහතික කළ/සම්මත	වාණිජමය	මුළු එකතුව
උඳු	15	220	764	12089	1806	**14893**	20	1231	3332	7440	12573	**24595**	35	**1451**	4095	19529	14379	**39488**
මිරිස් බීජ	1	158		802		**960**		522		1694		**2216**	1	680	0	2496	0	**3177**
කව්පි	29	369	2750	4764	1164	**9076**	103	954	4474	6461	5200	**17192**	132	1323	7225	11225	6363	26268
තල	0	52	354	5368	208	**5981**		50	1025	3120	38	**4232**	0	101	1379	8487	245	**10213**
මුං	8	361	3699	23533	571	**28172**	58	728	8140	25819	12692	**47437**	66	1089	11839	49352	13263	**75609**
රටකජු	116	734	2935	6583	2018	**12385**	191	557	380	25368	11426	**37922**	307	1291	3315	31951	13443	**50307**
කුරක්කන්	1	16	474	293		**784**	5	1333	1674	1543		**4554**	6	1349	2147	1836	0	**5338**
බඩඉරිඟු																		**25420**
(එළිමහනේ පරාගණය වූ)	8	125	1237	1281	4	**2654**	27	208	5474	16442	617	22767	35	332	6711	17722	621	
බඩඉරිඟු (දෙමුහුම්)				632		**632**				2256		**2256**	0	0	0	2888	0	**2888**
සෝයා බෝංචි	17	460	2199	16507	1368	**20550**	60	633	2789	2051	1000	**6532**	76	1093	4988	18557	2368	**27082**
සන්හෙම්ප්					712	712					599	**599**					1311	**1311**
සෙස්බනියා					13	**13**						0					13	**13**
එකතුව	**195**	**2494**	**14410**	**71851**	**7862**	**96812**	**463**	**6215**	**27288**	**92192**	**44144**	**170301**	**657**	**8709**	**41698**	**164042**	**52006**	**26711**

එළවළු බීජ නිෂ්පාදනය සහ සැපයුම

මෙරට වගා කරන එළවළු බෝග 18කට අයත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු නිර්දේශිත ප්‍රභේද 55ක් වේ. රජයේ බීජ ගොවිපළ 7කදී සිදු කරන ලද ප්‍රභේද සමහරක මූලික බීජ නිෂ්පාදනය පිළිබඳ විස්තර වගු අංක 3.2.9හි දැක්වේ. මෙම වසරේ සමස්ත නිෂ්පාදනය 2009 වසරට වඩා වැඩිවිය.

වගු අංක 3.2.9 : 2010 වර්ෂයේදී රජයේ ගොවිපළවල මූලික එළවළු බීජ නිෂ්පාදනය

බෝගය	නිෂ්පාදිත ප්‍රමාණය (කි.ග්‍රෑ.)		
	2009/10 මහ	2010 යල	එකතුව
බෝංචි	2,983.0	471.0	3,454.0
කරවිල	293.5	174.0	467.5
වම්බටු	5.5	-	5.5
බුෂිටා	363.0	-	363.0
මෑ	591.0	95.0	686.0
බණ්ඩක්කා	1,163,.0	351.0	1,514.0
පතෝල	34.0	57.0	91.0
දඹල	-	66.0	66.0
තක්කාලි	36.8	7.5	44.3
රාබු	158.0	-	158.0
එකතුව	**5,627.8**	**1,221.5**	**6,849.3**

සම්මත එළවළු බීජ නිෂ්පාදනය

රාජ්‍ය අංශයේ මෙන්ම පෞද්ගලික අංශයේ ආයතනද සම්මත බීජ නිෂ්පාදනයේ නියැළී සිටියි. බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විසින් රජයේ ගොවිපළවල සහ කොන්ත්‍රාත් වගා වැඩසටහන යටතේ නිපද වූ බීජ ප්‍රමාණයන් වගු අංක 3.2.10හි දැක්වේ. 2010 වසරේ සමස්ත නිෂ්පාදනය පෙර වසරට වඩා බෙහෙවින් වැඩිවිය (200%ක් පමණ). එය මූලික බීජ නිෂ්පාදනයේදී දක්නට ලැබුණා හා සමාන ප්‍රවනතාවකි. කොන්ත්‍රාත් වගාව යටතේ ඉහළ නිෂ්පාදනයක් ඇති වීමට මූලික වශයෙන්ම හේතුවූයේ එම වැඩසටහන යටතේ ඉහළ බෝංචි බීජ ප්‍රමාණයක් මිලදී ගැනීමයි.

වගු අංක 3.2.10 : 2010 වර්ෂයේදී කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් සිදුකළ සම්මත එළවළු බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)

බෝගය	ගොවිපළ වැඩසටහන			කොන්ත්‍රාත් වැඩසටහන			මුළු එකතුව
	2009/10 මහ	2010 යල	එකතුව	2009/10 මහ	2010 යල	එකතුව	
බෝංචි		-		18,975.0	989.0	19,964.0	19,964.0
කරවිල	58.5	-	58.5	174.0	216.0	390.0	448.5
වම්බටු	21.0	16.0	37.0	125.0	60.0	185.0	222.0
බුෂිටා	-	84.0	84.0	120.0	702.0	822.0	906.0
මාළු මිරිස්	31.0	262.0	293.0	17.0	11.0	28.0	321.0
පිපිඤ්ඤා	97.5	167.0	264.5	195.0	284.0	479.0	743.5
වැටකොළු	501.0	-	501.0	56.0	-	56.0	557.0
මෑ	14.0	689.0	703.0	666.0	721.0	1,387.0	2,090.0
බණ්ඩක්කා	155.0	1,977.0	2,132.0	116.0	691.0	807.0	2,939.0
වට්ටක්කා	21.0	-	21.0		-	-	21.0
නිවිතිය	88.0	73.0	161.0	-	-	-	161.0
පතෝල	-	364.0	364.0	-	364.0	364.0	728.0
පැණිකොමඩු	79.0	55.0	134.0	25.0	95.0	120.0	254.0
තක්කාලි	100.0	212.0	312.0		-	-	312.0
තම්පලා	61.0	129.0	190.0	-	-	-	190.0
දඹල	260.0	120.0	380.0	502.0	160.0	662.0	1,042.0
රාබු	-	-	-	419.0	-	419.0	419.0
එකතුව	**1,487.0**	**4,148.0**	**5,635.0**	**21,390.0**	**4,293.0**	**25,683.0**	**31,318.0**

එළවළුවල දෙමුහුම් බීජ නිෂ්පාදනය

වම්බටු ප්‍රභේද 2ක සහ තක්කාලි ප්‍රභේද 2ක එෆ්1 දෙමුහුම් බීජ, බීජ ගොවිපළ වලදී සාර්ථකව නිෂ්පාදනය කරන ලදී (වගු අංක 3.2.11). වම්බටු කුණ්ඩසාලේ, අඹේපුස්ස හා අලුත්තරම යන ගොවිපළවලද තක්කාලි කුණ්ඩසාලේ ගොවිපළෙහි පමණක්ද නිෂ්පාදනය කෙරිණි. නිපදවන ලද තක්කාලි බීජ ප්‍රමාණයන් 2009 වසරේ නිෂ්පාදිත ප්‍රමාණයන්ට බොහෝසෙයින්ම සමාන වූ අතර වම්බටු බීජ නිෂ්පාදනය වඩා අඩු මට්ටමක පැවතිණි.

වගු අංක 3.2.11 : දෙමුහුම් එළවළු බීජ නිෂ්පාදනය (කි.ග්‍රෑ.)

බෝගය	2009/10 මහ	2010 යල	එකතුව
තක්කාලි	7.5	6.4	13.9
වම්බටු	6.3	12.3	18.6
එකතුව	13.8	18.7	32.5

එළවළු බීජ බෙදා හැරීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තු අලෙවිසැල් සහ ලියාපදිංචි අලෙවිකරු ජාලය හරහා එළවළු බීජ බෙදා හරින ලදී. මෙම අලෙවිකරු ජාලයට ගොවිජන සේවා මධ්‍යස්ථාන, සමූපකාර සමිති, ගොවි සංවිධාන, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු සහ පෞද්ගලික ලියාපදිංචි බීජ අලෙවිකරුවන් ඇතුළත් වේ. කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයන ලද එළවළු බීජ ප්‍රමාණයන් වගු අංක 3.2.12 හි දැක්වේ. 2010 වර්ෂයේ සම්මත බීජ සැපයුම 2009 වර්ෂයට සාපේක්ෂව තරමක් වැඩිවිය. කෙසේ වුවද, 2010 වර්ෂයේ මූලික බීජ සැපයුම කැපී පෙනෙන අයුරින් වැඩිවිය.

වගු අංක 3.2.12 : කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් සපයන ලද එළවළු බීජ – 2010

බෝගය	සපයන ලද ප්‍රමාණය (කි.ග්‍රෑ.)						
	මූලික			සම්මත			
	2010 යල	2010/11 මහ	එකතුව	2010 යල	2010/11 මහ	එකතුව	මුළු එකතුව
තම්පලා	64.0	82.0	146.0	5.0	67.0	72.0	218.0
බෝංචි	426.0	1,650.0	2,076.0	3,925.0	8,212.0	12,137.0	14,213.0
කරවිල	29.0	57.0	86.0	508.0	571.0	1,079.0	1,165.0
වම්බටු	6.0	3.0	9.0	45.0	209.0	254.0	263.0
බුෂිටා	200.0	216.0	416.0	804.0	667.0	1,471.0	1,887.0
මාළු මිරිස්	4.0	8.0	22.0	82.0	165.0	247.0	259.0
පිපිඤ්ඤා	5.0	14.0	19.0	78.0	162.0	240.0	259.0
වැටකොළු	14.0	57.0	71.0	277.0	279.0	556.0	627.0
මෑ	268.0	160.0	428.0	194.0	914.0	1,108.0	1,536.0
බණ්ඩක්කා	592.0	212.0	804.0	658.0	1,289.0	1,947.0	2,751.0
වට්ටක්කා	1.0	2.0	3.0	3.0	18.0	21.0	24.0
රාබු	1.0	26.0	27.0	117.0	268.0	385.0	412.0
පතෝල	156.0	119.0	275.0	775.0	568.0	1,343.0	1,618.0
නිවිතිය	-	4.0	4.0	-	70.0	70.0	74.0
පැණි කොමඩු	2.0	2.0	4.0	2.0	70.0	72.0	76.0
තක්කාලි	6.0	6.0	12.0	176.0	244.0	420.0	432.0
දඹල	28.0	26.0	54.0	312.0	746.0	1,058.0	1,112.0
එකතුව	1,802.0	2,644.0	4,446.0	7,961.0	14,519.0	22,480.0	26,926.0
ගෙවතු වගා පැකට්	112,888						

බීජ අර්තාපල් නිෂ්පාදනය සහ සැපයුම

2009/10 මහ කන්නයේදී ගෘනෝලා ප්‍රභේදයේ පූර්ව මූලික (පී.), මූලික (පී1. පී2, පී3) සහ සහතික කළ බීජ නිපද වූ ප්‍රමාණයන් පිළිවෙළින් ටො. 1.48ක්, ටො. 57.92ක් සහ ටො. 60.37ක් විය.

ඩිසයිරී ප්‍රභේදයේ පූර්ව මූලික, මූලික සහ සහතික කළ බීජ නිෂ්පාදනය ටො. 1.8ක් විය.

2010 යල කන්නයේ පූර්ව මූලික, මූලික සහ සහතික කළ බීජ නිෂ්පාදනයන් පිළිවෙළින් ටො. 2.79ක්, ටො. 138.5ක් සහ ටො. 232.79ක් වූ අතර ඩිසයිරී ප්‍රභේදයේ සහතික කළ බීජ නිෂ්පාදනය ටො. 18.55ක් විය. 2010 වර්ෂයේ සමස්ත නිෂ්පාදනය ටො. 514.2ක් වූ අතර සහතික කළ බීජ ටො. 247ක් අර්තාපල් වගාකරන්නන් වෙත නිකුත් කරන ලදී.

පෙර වසර සමග සසඳා බලනවිට 2010 වසරේ 5%ක අස්වනු වර්ධනයක් ඇති වූ බව නිරීක්ෂණය කිරීමට ලැබිණි. නියමිත කලට අර්තාපල් වගා කිරීම සහ වගාව සඳහා විශාල වශයෙන් කාබනික පොහොර යෙදීම මෙම අස්වනු වර්ධනයට හේතුවිය.

පූර්ව මූලික බීජ ප්‍රමාණය අඩු බව පෙනුණද එතුළ සැළකියයුතු බීජ ආකන්ද සංඛ්‍යාවක් අන්තර්ගත විය.

වගු අංක 3.2.13 : 2010 වසරේ පූර්ව මූලික (පී.) සහ මූලික ($පී_1$, $පී_2$ සහ $පී_3$) බීජ අර්තාපල් නිෂ්පාදනය (ටො.)

ප්‍රභේදය	පූර්ව මූලික			මූලික බීජ		
	2009/10 මහ	2010 යල	එකතුව	2009/10 මහ	2010 යල	එකතුව
ගෘනෝලා	1.48	2.79	4.27	57.9	138.5	196.4
ඩිසයිරී		-	-	1.8	-	1.8
එකතුව	**1.48**	**2.79**	**4.27**	**59.69**	**138.5**	**198.19**

වගු අංක 3.2.14 : 2010 වර්ෂයේ සහතික කළ බීජ අර්තාපල් නිෂ්පාදනය (ටො.)

ප්‍රභේදය	2009/10 මහ	2010 යල	එකතුව
ගෘනෝලා	60.37	232.79	293.16
ඩිසයිරී	-	18.55	18.55
එකතුව	**60.37**	**251.34**	**311.71**

වගු අංක 3.2.15 : කෘෂිකර්ම දෙපාර්තමේනුව විසින් සපයන ලද බීජ අර්තාපල් ප්‍රමාණය (ටො.)

ප්‍රභේදය	2010 යල	2010/11 මහ	එකතුව
ගෘනෝලා	86.7	160.3	247.0

රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ සැපයුම

පලතුරු ශාකවල රෝපණ ද්‍රව්‍ය සඳහා මෙරට ඇති ඉල්ලුම සපුරාලීම සඳහා බද්ධ පැළ, රිකිළි පැළ සහ කඳ කැබලි යන කාණ්ඩ යටතේ බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය විසින් උසස් තත්වයේ රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය කරන ලදී. එමනිසා, 2010 වර්ෂයේදී බීජ හා රෝපණ ද්‍රව්‍ය මධ්‍යස්ථානය යටතේ ඇති බීජ ගොවිපළ 10 කදී සහ උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය යටතේ ඇති උද්‍යාන බෝග ගොවිපළ 8 කදී රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදන වැඩසටහන් පවත්වන ලදී. ඒ අනුව, වසර තුළ පලතුරු බෝග 20කට අයත් ප්‍රභේද 30ක් පලතුරු පැළ 230,000ක් නිපදවා බෙදා හරින ලදී.

වගු අංක: 3.2.16 කෘෂිකර්ම දෙපාර්තමේන්තු ගොවිපළවල රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සහ සැපයුම - 2010

බෝගය	නිෂ්පාදනය	නිකුත් කිරීම
බද්ධ පැළ		
අලි පේර	4,854	3,970
බෙලි	1,226	1,034
දුරියන්	7,426	4,341
පේර	1987	1,883
කොස්	7,647	5,183
ජම්බු	2,405	1,310
දෙහි	2,735	2,799
අඹ	168,035	90,167
ජමනාරං	1,540	1,083
මැංගුස්	422	200
දොඩම්	5,118	4,013
ඇපල්	43	17
පෙයාර්ස්	800	25
රඹුටන්	33,439	26,312
සැපදිල්ලා	1,521	768
කාමරංකා	1,583	900
දිවුල්	1,217	1,483
ගොරක	1,207	838
වෙනත්	945	1,842
උප එකතුව	**244,150**	**148,168**
කඳ කැබලි පැළ		
මිදි	970	1,688
ජම්බු	2,078	1,487
දෙළුම්	1,384	664
ලෙමන්	4,684	2,432
දෙහි	640	09
ගම්මිරිස්	3,334	2,334
පේර	462	440
ඩ්‍රැගන් පෲට්	3,055	1,296
වෙනත්	956	721
උප එකතුව	**17,563**	**11,071**
බීජ පැළ		
ඇඹරැල්ලා	9,160	9,036
කාමරංකා	210	140
දිවුල්	734	76
ගොරක	253	263
පැපොල්	14,438	15,467
දෙළුම්	18,283	16,761
පේර	12,189	8,199
බෙලි	300	01
ජම්බු	316	93
කතුරුමුරුංගා	8,898	6,195
දොඩම්	1,557	1,347
මැංගුස්	3,971	2,503
දෙහි	9,506	6,937
කොස්	100	63
උප එකතුව	**79,915**	**67,081**
මොරෙයියන්		
කෙසෙල්	1,898	1,898
උප එකතුව	**1,898**	**1,898**
එළවළු පැළ	**14,270**	**14,133**
උප එකතුව	**14,270**	**14,133**
මුළු එකතුව	**357,797**	**242,351**

වගු අංක : 3.2.17 වෙනත් දෑ නිෂ්පාදනය

නිෂ්පාදනය	ප්‍රමාණය
කෙසෙල් (කි.ග්‍රෑ.)	17,100
අඹ (කි.ග්‍රෑ.)	2,266
පැපොල් (කි.ග්‍රෑ.)	2,132
මිදි (කි.ග්‍රෑ.)	129
පෙයාර්ස් (කි.ග්‍රෑ.)	449
දොඩම් (කි.ග්‍රෑ.)	327
රඹුටන් (කි.ග්‍රෑ.)	174
පරිභෝජනයට ගන්නා අර්තාපල් (කි.ග්‍රෑ.)	26,932
පරිභෝජනයට ගන්නා එළවළු (කි.ග්‍රෑ.)	5,607
කොළ එළවළු (මිටි)	824
මඤ්ඤෙදාක්කා (කි.ග්‍රෑ.)	2,493
පොල් (ගෙඩි)	34,924
තැඹිලි (ගෙඩි)	3,150
වම්බටු (පැකට්)	740
පරිභෝජනයට ගන්නා වෙනත් ක්ෂේත්‍ර බෝග	
බඩඉරිඟු (කි.ග්‍රෑ.)	2,477
අමු බඩඅරිඟු කරල් (සංඛ්‍යාව)	2,822
වියළි මිරිස් (කි.ග්‍රෑ.)	97
මුං (කි.ග්‍රෑ.)	877
කව්පි (කි.ග්‍රෑ.)	350
තල (කි.ග්‍රෑ.)	40
සෝයා (කි.ග්‍රෑ.)	633
කුරක්කන් (කි.ග්‍රෑ.)	104
උඳු (කි.ග්‍රෑ.)	493
රටකජු (කි.ග්‍රෑ.)	1,630
සත්ව නිෂ්පාදන	
කිරි (ලී.)	36,615
යෝගට් (කප්)	4,110
මුදවපු කිරි (හට්ටි)	1,131

අත්තිකාරම් ගිණුම් ක්‍රියාකාරීත්වය - 2010

අත්තිවාරම් ගිණුම් යටතේ බීජ හා රෝපණ ද්‍රව්‍ය නිෂ්පාදනය සිදු කරන ලදී. වසර තුළ අත්තිවාරම් ගිණුම් ක්‍රියාකාරීත්වය වගු අංක 3.2.18 හි දැක්වේ.

වගු අංක 3.2.18 : අත්තිකාරම් ගිණුම් ක්‍රියාකාරීත්වය

ගොවිපළ	ආදායම	වියදම
අළුත්තරම	33,859,223.43	30,061,725.28
මල්වත්ත	24,554,944.65	20,607,882.19
බටඅත	11,514,563.27	25,297,831.30
අම්බලන්තොට	9,305,445.50	8,948,258.00
මිද්දෙනිය	1,351,606.00	8,811,083,50
අඹේපුස්ස	6,568,330.11	11,930,054.67
කන්තලේ	30,668,239.00	19,672,024.05
කුණ්ඩසාලේ	20,401,360.35	16,689,108.55
මහ ඉලුප්පල්ලම	30,202,593.41	31,887,943.67
සීතාඑලිය	25,639,312.13	18,951,257.10
උඩරදැල්ල	8,403,872.50	8,260,093.81
මීපිළිමාන	8,912,933.00	9,166,060.56
කඳපොළ	14,971,420.56	11,253,715.60
පිදුරුතලාගල	29,268,744.86	15,292,579.30
පොළොන්නරුව	34,172,048.00	32,791,887.07
මුරුන්කන්	380,286.62	1,030,970.50
එකතුව	**290,174,923.39**	**270,652,475.15**

ආදායම හා වියදම අතර වෙනස - රු. + 19,522,448.24 (නිකුත් කිරීම් නියෝග යටතේ ගොවිපළවල ප්‍රයෝජනයට ගත් බීජ සඳහා වූ වියදම ඇතුළත් නොවේ.)

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරි/සේවක සංඛ්‍යාව
කෘෂිකර්ම නිලධාරී	18
පර්යේෂණ නිලධාරී	01
ගණකාධිකාරී	01
කෘෂිකර්ම උපදේශක	118
ගොවිපළ යන්ත්‍ර උපදේශක	01
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරී	03
වැඩසටහන් සහකාර	02
පරිපාලන නිලධාරී	02
කළමනාකරණ සහකාර	75
ගොවිපළ ලිපිකරු	17
රියදුරු	45
ට්‍රැක්ටර් ක්‍රියාකරු	16
විදුලි ශිල්පී	02
වඩු කාර්මික	04
බද්ධකරු	02
සංචාරක බංගලා භාරකරු	03
කාර්යාල කාර්ය සහායක	05
ගබඩාකරු	07
මුරකරු	62
ලොරි සහායක	09
විශේෂ ගබඩා කම්කරු	01
සනීපාරක්ෂක කම්කරු	04
කම්කරු (III ශ්‍රේණිය)	361
එකතුව	768

3.3 සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය, පේරාදෙණිය

සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය සමාජ ආර්ථික පර්යේෂණවල හා කෘෂිකාර්මික ප්‍රතිපත්ති විශ්ලේෂණයෙහිද සංවර්ධන සැලසුම්කරණය පිළිබඳ පර්යේෂණවලද නිරත වන අතර කෘෂිකාර්මික ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සහ කෘෂිකර්ම අමාත්‍යාංශයට සහාය වෙයි. කෘෂි සංඛ්‍යාලේඛන තොරතුරු සම්පාදනය කිරීම පිණිස මෙම මධ්‍යස්ථානය විසින් සංඛ්‍යාලේඛන ඒකකයක්ද පවත්වා ගෙන යනු ලැබේ.

එමෙන්ම, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන දේශීය හා විදේශීය අරමුදල් ප්‍රතිපාදිත ව්‍යාපෘතිවල වැඩකටයුතු සම්බන්ධීකරණයෙහිද නිරත වේ.

2010 වර්ෂයේදී සමාජ ආර්ථික පර්යේෂණ සහ ප්‍රතිපත්ති විශ්ලේෂණය තුළින් කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන්වල ආර්ථික සහ මූල්‍යමය ශක්‍යතාව, කෘෂි කර්මාන්තයෙහි ආයෝජනය කිරීම සහ යෙදවුම් ප්‍රතිපත්ති කෙරෙහි අවධානය යොමු කරන ලදී. පර්යේෂණ න්‍යාය පත්‍රය හඳුනාගෙන එය ප්‍රමුඛතාවන් අනුව සකස් කිරීම මඟින් සහ විශේෂයෙන්ම රාජ්‍ය ප්‍රතිපත්තිවල සහ දේශීය හා ගෝලීය ආර්ථික පරිසරයන් තුළ ඇති වූ මෑත කාලීන වෙනස්කම් හමුවේ ආහාර හිඟය සම්බන්ධයෙන් මතු වී ඇති ගැටලු විසඳා ගැනීමේ ක්‍රමෝපාය සකස් කිරීම පිණිස ප්‍රතිපත්ති සම්පාදකයින්ට මග පෙන්වීම මඟින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන් වඩා කාර්යක්ෂම කිරීම පිණිස මෙම මධ්‍යස්ථානය දායක විණි. එමෙන්ම දිස්ත්‍රික් හා කන්න පදනම මත ප්‍රධාන ආහාර බෝග සියල්ලෙහිම පිරිවැය හා ආදායම් පිළිබඳ තොරතුරු සහිත දත්ත මූලයක් සකස් කිරීමේ පුළුල් වැඩසටහන අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී.

අයවැය

විවිධ වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම් වගු අංක 3.3.1හි දැක්වේ.

වගු අංක : 3.3.1 වාර්ෂික අයවැය – 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම
මූලධන	1,122,000	828,254
පුනරාවර්තන	2,766,670	2,480,869
එකතුව	**3,888,670**	**3,309,123**

ප්‍රගතිය

සිදු කරන ලද අධ්‍යයන

- **බෝගවල නිෂ්පාදන පිරිවැය සහ ආදායම්**

2008/2009 මහ කන්නයට සහ 2009 යල කන්නයට අදාළව වී සහ අතිරේක ආහාර බෝග, මුල් හා ආකන්ද බෝග සහ එළවළුවල පිරිවැය හා ආදායම් පිළිබඳ අධ්‍යයනයේ තොරතුරු පිළිවෙළින් 2010 අප්‍රේල් හා අගෝස්තු මාසවලදී ප්‍රකාශයට පත් කෙරිණි. සාමාන්‍ය අස්වැන්න, දළ හා ශුද්ධ ආදායම්, මුළු නිෂ්පාදන පිරිවැය හා ඒකක නිෂ්පාදන පිරිවැය සහ ගොවියාට ලැබෙන මිල පිළිබඳ දත්ත මෙහි ඇතුළත්ය. ගොවිපල මට්ටමින් බෝග නිෂ්පාදනය හා අලෙවි කිරීම පිළිබඳ තීරණ ගැනීමේදී සහ ජාතික මට්ටමින් ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී මෙම දත්ත ප්‍රයෝජනවත් වේ.

- **ශ්‍රී ලංකාවේ වී සඳහා ඇති ඉල්ලුම හා සැපයුම : ඉදිරි දැක්ම**

වී සම්බන්ධයෙන් පවතින ඉල්ලුමෙහි හා සැපයුමෙහි ඇති වූ වෙනස්කම් සහ මීළඟ දශකයේදී මතුවන අභියෝගවලට මුහුණදිය හැකි මාර්ග පිළිබඳව සොයා බැලීමේ අධ්‍යයනයක් පැවැත්විණි. වී තවමත් සාමාන්‍ය භාණ්ඩයක් ලෙස හැසිරෙන අතර එය සඳහා පවතින ඉල්ලුම වසර 2020 වනවිට ජනගහණ වර්ධනය හේතුවෙන් 12% කින් වර්ධනය වනු ඇති බව පුරෝකථනය කෙරේ. ඉල්ලුම සහ සැපයුම අතර තුලනයක් පවත්වාගෙන යෑම උදෙසා යම් ප්‍රමාණයකට උපයෝගී කර ගත හැකි ක්‍රියාමාර්ග වශයෙන් සහල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම, ඒවායෙහි තත්වය වැඩිදියුණු කිරීම, සහල් සඳහා ඇති ඉල්ලුම කෙරෙහි තිරිඟු පිටි මඟින් ඇති කරන බලපෑම අඩු කිරීම, බෝග විවිධාංගීකරණය, කාබනික, සාම්ප්‍රදායික හා ඉහළ වටිනාකමකට අලෙවි කළ හැකි වී වර්ග වගා කිරීම, සහල් අපනයනය වර්ධනය කිරීමේ හැකියාව ගවේෂණය කිරීම හා ආරක්ෂිත තොග පවත්වා ගෙන යෑම දැක්විය හැකිය.

- **බෝග වල් දර්ශ පිළිබඳව මහජනයා දැනුවත් කිරීමට දියත් කළ වැඩසටහන්වල ඵලදායිත්වය**

  බෝග වල් දර්ශ පවතින ස්ථානයේම සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතිය සියලුම පාර්ශ්වකරුවන්ගේ (මූලික අධ්‍යාපනය ලබන කාණ්ඩය, ව්‍යාප්ති සේවකයින්, ප්‍රතිපත්ති සම්පාදකයින්, පර්යේෂකයින්, ආරක්ෂිත ප්‍රදේශවල කළමනාකරුවන්, උසස් අධ්‍යාපනය ලබන කාණ්ඩය සහ ප්‍රජාව) දැනුවත්භාවය වර්ධනය කිරීමෙහිලා සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇති බව අධ්‍යයනයෙන් අනාවරණය විය. කෙසේ වුවද, විශේෂයෙන්ම උසස් අධ්‍යාපනය ලබන කාණ්ඩය හා ප්‍රතිපත්ති සම්පාදකයින් අතර මේ සම්බන්ධයෙන් පවතින දැනුවත්භාවය තවදුරටත් වර්ධනය කළ යුතුයි.

- **ශ්‍රී ලංකාවේ සිදු කරන අර්තාපල් වගාවේ තාක්ෂණික කාර්යක්ෂමතාව හා ප්‍රාදේශීය වෙනස්කම්**

  ඵලදායිතාව පහත වැටීම සහ ලාභදායිත්වය අඩු වීම අර්තාපල් වගාවේ ප්‍රධාන ගැටලු වශයෙන් හඳුනාගෙන ඇත. ලාභදායිත්වය තීරණය කරන ප්‍රධාන සාධකයක් වන්නේ සම්පත් සහ තාක්ෂණය භාවිතා කිරීමේ කාර්යක්ෂමතාවයි. ගොවීන්ගේ කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම මගින් පවතින සම්පත් භාවිතා කර බදුල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල අර්තාපල් නිෂ්පාදනය තව දුරටත් ඉහළ නැංවිය හැකි බව අධ්‍යයනයෙන් අනාවරණය විය.

- **ශ්‍රී ලංකාවේ අන්නාසි කර්මාන්තය සඳහා පවතින අපනයන වෙළඳපොළ අස්ථාවර වීම**

  අන්නාසි, පලතුරු අපනයනයෙන් ලැබෙන විදේශ විනිමය ඉපැයුම්වලින් 40-45% අතර ප්‍රමාණයකට දායක වේ. තරඟකාරී රටවල් අතර ශ්‍රී ලංකාවට හිමි ස්ථානය අනුව, අන්නාසිවල අපනයන වෙළඳපොළ හැසිරීම විශ්ලේෂණය කිරීම අතිශයින්ම වැදගත්ය. අන්නාසි අපනයනය ගල්ෆ් රටවල් කෙරෙහි පමණක් සීමා වී ඇති හෙයින් අපනයන වෙළඳපොළහි ස්ථායිතාව සහ ගතික ස්වභාව පිළිබඳව තක්සේරු කිරීම අවශ්‍යය. අපනයනවල උපනතිය, උච්ඡාවචනය වීම් හා ගතික ස්වභාවය සම්බන්ධයෙන් දැන ගැනීම සඳහා 1995-2007 අතර කාල පරිච්ඡේදයේ අන්නාසි අපනයන පරිමාව සහ ඒකක මිල ගණන් (නැව තෙක් නොමිලයේ මිල-FOB) විශ්ලේෂණය කරන ලදී. ලෝකයේ මිල ගණන් සමඟ සසඳා බලන විට ශ්‍රී ලංකාවේ අපනයන මිල විචලනය වැඩිබව අධ්‍යයනය තුළින් අනාවරණය විය. කෙසේ වුවද, ශ්‍රී ලංකාවේ අන්නාසි කර්මාන්තය සම්පූර්ණයෙන්ම විවිධාංගීකරණය වී නොමැත. එය සැලකියයුතු අන්දමින් ගල්ෆ් රටවලට හා මාල දිවයින්වලට සංකේන්ද්‍රණය වී ඇත. අන්නාසි වෙළඳාමෙහි නිරත රටවල් සඳහා මිල ගණන් පහත වැටීම හේතුවෙන් අහිතකර වෙළඳපොළ තත්වයන් ඇතිවීමේ අවදානම අවම කර ගැනීමට රටවල් රැසක් වෙත යොමුවන අයුරින් අන්නාසි අපනයනය විවිධාංගීකරණය කිරීම යෝජනා කෙරේ.

සහල් පිටි යොදා ගනිමින් නිපදවන නූඩ්ල්ස් සහ බිස්කට් සඳහා ඇති පාරිභෝගික රුචිකත්වය විශ්ලේෂණය කිරීම

ශ්‍රී ලංකාව සහල් නිෂපාදනයෙන් බොහෝදුරට ස්වයංපෝෂිතය. එහෙයින් තිරිඟු පිටි යොදා ගනිමින් කරන නිෂ්පාදනවලින් පාරිභෝගිකයා ඇත් කරවමින් වැඩිවන සහල් නිෂ්පාදනය හේතුවෙන් ඇතිවන ඕනෑම අතිරික්තයක් ප්‍රයෝජනයට ගැනීමට යොදා ගත හැකි යෝග්‍යතම විකල්පයක් වශයෙන් සහල් පිටි පදනම් කරගත් ආහාරමය නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම දැක්විය හැකිය. පාරිභෝගික රුචිකත්වය විශ්ලේෂණය (Conjoint analysis) යොදා ගනිමින් සහල් පිටි භාවිත කර නිපදවන ලද නූඩ්ල්ස් සහ බිස්කට් සඳහා පවතින පාරිභෝගික කැමැත්ත විශ්ලේෂණය කරමින් කුරුණෑගල හා මහනුවර දිස්ත්‍රික්කවල පවත්වන ලද අධ්‍යයනයකින් අනාවරණය වූයේ එම නූඩ්ල්ස් රැල්වල ඝනකම එම කැමැත්ත කෙරෙහි බලපාන වඩාත්ම වැදගත් ලක්ෂණය වූ බවයි. සහල් පිටිවලින් නිපදවන ලද බිස්කට්වල වර්ගය, හැඩය සහ මිල යන ලක්ෂණ පාරිභෝගික කැමැත්ත කෙරෙහි වැදගත් වූ නමුත් කල් තබාගත හැකි කාලය වැදගත් වී නොතිබිණි. රවුම් හැඩැති සාමාන්‍ය හෝ පැණිරස ඇති බිස්කට්වලට වඩා ලුණු රස මිශ්‍ර බිස්කට් කෙරෙහි වැඩි පාරිභෝගික කැමැත්ත හිමිවිය. තරඟකාරී වෙළඳපොළක් සඳහා සහල් පිටි යොදා ගනිමින් නිෂ්පාදනය කිරීමේදී පාරිභෝගිත රුචිකත්වයන් ප්‍රයෝජනවත් පරාමිතියන් වශයෙන් යොදාගත හැකිය.

වී වෙළඳාම සහ අලෙවිකරණය

පසුගිය දශක කිහිපය පුරා ශ්‍රී ලංකාවේ වී අලෙවිකරණ ක්ෂේත්‍රය තුළ වෙනස්කම් මාලාවක් සිදුවී ඇත. වී අලෙවිකරණ ධාරාවේ ව්‍යුහාත්මක වෙනස්කම් සහ එයට අයත් විවිධ පාර්ශ්වකරුවන්ගේ හැසිරීම, ක්‍රියාකාරිත්වය සහ ප්‍රතිඵල සමාලෝචනය කිරීම පිණිස පවත්වන ලද අධ්‍යයනයකින් අනාවරණය වූයේ අලෙවිකරණ ආන්තිකයන්ගේ ස්ථායිතාව සහ වෙළඳපොල ඒකාබද්ධවීම තුළින් කාර්යක්ෂම වී අලෙවිකරණ ක්‍රමයක් පැවතීම පෙන්නුම් කරන බවයි. කෙසේ වුවද, ගොවීන්ගේ මෙන්ම පාරිභෝගිකයින්ගේද සුභ සාධනය ඉහළ නැංවීම පිණිස නිපැයුම්වල තත්වය, නිපැයුම් සන්නම්කරණය, විශේෂිත වෙළඳපොළ සඳහා අලෙවි කිරීම වැනිදෑ වැඩිදියුණු කිරීමේ ඉඩකඩ පවතී. සහල්වල තත්වමය ප්‍රමිති වඩාත්

වැඩි දියුණු කිරීම සඳහා වී ප්‍රභේද අතර පවතින ජානමය විවිධත්වය උපයෝගී කරගත හැකිය. අනුරූපී වෙළඳ ප්‍රතිපත්තියක් පැවතීම, අලෙවිකරණ ව්‍යාප්තිය සහ විවිධ අලෙවිකරණ ප්‍රවේශයන්ට සහායවීම සඳහා ආයතනික සංවර්ධනය ශ්‍රී ලංකාව තුළ සමාජීය වී අලෙවිකරණ ක්‍රමයක් බිහිකිරීම සඳහා අත්‍යවශ්‍යය.

වෙළඳ ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම

ඵලදායී තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා වෙළඳ ප්‍රතිපත්තිය පිළිබඳ පූර්ණ විශ්ලේෂණයක් කිරීම අත්‍යවශ්‍යය. වෙළඳ ප්‍රතිපත්තිය සකස් කිරීමේ ක්‍රියාවලියේදී යෙදවුම් සහ නිමවුම් වෙළඳපොළ කෙරෙහි වෙළඳ ප්‍රතිපත්ති මඟින් ඇති කරන බලපෑම් සහ යෙදවුම් හා නිමවුම් වෙළඳපොළවල ගතික තත්වයන් මුළුමනින්ම සැලකිල්ලට ගැනීම අවශ්‍ය වේ. එමෙන්ම දේශීය කෘෂිකාර්මික ප්‍රතිපත්ති තුළ ඇති අපනයනයට එරෙහි නැඹුරුව සහ වෙළඳ බඳු (සෙස් බද්ද සහ තීරු බද්ද) කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීමද අවශ්‍යය. පහසුවෙන් බිඳ වැටිය හැකි නිෂ්පාදන පරිසරයන් පිළිබඳ දේශීය ප්‍රතිපත්ති හා බැඳි වතු පිරිවැය මෙන්ම පරිසර හායනය හා සම්බන්ධ අනෙකුත් ගැටලු කෘෂි වෙළඳ ප්‍රතිපත්ති සැලසුම් කිරීමේදී සවිස්තරාත්මකව සලකා බැලිය යුතුය. ඒ අතරම සම්පත් භාවිත කිරීමේ කාර්යක්ෂමතාව වෙළඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේදී ප්‍රධාන නිර්ණායකයක් විය යුතුය. අනවශ්‍ය ලෙස වෙළඳපොළට මැදිහත්වීමෙන් එහි අකාර්යක්ෂමතාව වර්ධනය වන අතර එවැනි මැදිහත්වීම්වල ප්‍රතිලාභ වැඩිවශයෙන්ම උපයනුයේ අලෙවිකරණ ධාරාවේ අතරමැදියන් සහ සංවිධානාත්මක මහා පරිමාණ සැකසුම්කරුවන්/නිෂ්පාදකයින්ය. ඉලක්ක කණ්ඩායම් සහ දිළිඳු ගොවීන් වෙත ළඟා වීමට එම ප්‍රතිපත්තිවලට හැකිදැයි විවේචනාත්මකව සමාලෝචනය කර බැලිය යුතු අතර අවම ප්‍රතිපත්තිමය මැදිහත්වීම සමඟ වෙළඳපොළ බල්වේග මත පදනම් වූ මිලක් පවත්වාගෙන යෑම ඕනෑම අවස්ථාවකට යෝග්‍යතම ප්‍රතිපත්තිමය විකල්පය වනු ඇත.

ශ්‍රී ලංකාවේ වී වෙළඳපොළහි ගතික ස්වභාවය

පසුගිය දශක කිහිපය පුරා ශ්‍රී ලංකාවේ වී අලෙවිකරණය වෙනස්කම් රැසකට භාජනය වී ඇත. මෙම වී අලෙවිකරණ ක්‍රමය පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම අරමුණු කරගෙන ක්‍රියාත්මක වන්නකි. වෙළඳ ප්‍රතිපත්ති වෙනස්කම් මඟින් වී නිෂ්පාදකයාගේ මිල කෙරෙහි වූ බලපෑම අඩුකර ඇත. අනුරූපී වෙළඳ ප්‍රතිපත්ති, අලෙවිකරණ ව්‍යාප්තිය සහ විවිධ අලෙවිකරණ ප්‍රවේශයන්ට සහාය වීම සඳහා ආයතනික සංවර්ධනය ශ්‍රී ලංකාව තුළ සමාජීය වී අලෙවිකරණ ක්‍රමයක් බිහි කිරීම සඳහා අත්‍යවශ්‍ය වේ.

ක්ෂුද්‍ර මූල්‍ය සහ දරිද්‍රතාව

ක්ෂුද්‍ර මූල්‍ය දරිද්‍රතාව දුරලිය හැකි ක්‍රමයක් වශයෙන් හඳුනාගෙන ඇත. කුටුම්බ ආදායම සහ දරිද්‍රතාව කෙරෙහි ක්ෂුද්‍ර මූල්‍ය මඟින් ඇති කරන බලපෑම විමසා බැලීම සඳහා අධ්‍යයනයක් සිදු කරන ලදී. ක්ෂුද්‍ර ණය සහ වෙනත් සේවා ලැබී ඇති කුටුම්බ අතර දරිද්‍රතාවෙන් පෙළෙන සංඛ්‍යාව, දරිද්‍රතා මට්ටම සහ දරිද්‍රතාවෙහි තීව්‍රබව හා අසමානතාව අඩු බව සොයා ගන්නා ලදී. ග්‍රාමීය කුටුම්බවල දරිද්‍රතා මට්ටම් අඩුකරලීම සඳහා ක්ෂුද්‍ර මූල්‍ය උපයෝගී කරගත හැකිය. එහෙත් එය ඵලදායීවීමට නම් ආයතනික සහාය ඉහළ මට්ටමෙන් ලැබිය යුතුය.

ආහාර සුරක්ෂිතතාව සහ තෙත් කලාපීය වී නිෂ්පාදනයේ ස්ථාවරත්වය

යෙදවුම් සහ නිමැවුම් අතර ඇති සම්බන්ධය සහ සැපයුම පිළිබඳ ප්‍රතිචාර නිශ්චය කිරීම, විවිධ තෙත් කලාපීය දිස්ත්‍රික්කවල වී නිෂ්පාදනයේ සම්පත් භාවිත කාර්යක්ෂමතාවෙහි ඇතිව ඇති වෙනස්කම් ඇගයීම සහ වී නිෂ්පාදනයේ ආර්ථික විද්‍යාත්මක අංශය (වෙළඳපොළ නොවන වටිනාකම් ඇතුළුව) නිශ්චය කර ගැනීම සඳහා අධ්‍යයනයක් සිදු කෙරිණි. මෙම ආර්ථික විශ්ලේෂණය මඟින් තෙත් කලාපයේ ලාභදායී වී නිෂ්පාදනයක් සිදුවන බැව් පෙන්නුම් කෙරේ. එමනිසා තෙත් කලාපීය දිස්ත්‍රික්කවල වී නිෂ්පාදනය කිරීම ආර්ථිකමය වශයෙන් ලාභදායී වේ. එහිදී වී මිල, ආහාර සුරක්ෂිතතාව කෙරෙහි දක්වන අවධානය සහ තමන්ගේම ක්ෂේත්‍රවල නිපදවන වීවල ගුණාත්මය නිෂ්පාදන ප්‍රමාණය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කරයි.

බෝග ව්‍යාපාර අයවැය (වී, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ එළවළු බෝග)

තෝරාගත් පලතුරු බෝග (දොඩම්, දෙහි, කෙසෙල්, වැල් දොඩම්, අන්නාසි, රඹුටන්, පැපොල්, කජු, පේර, දෙළුම්, ඩ්‍රැගන් ෆෘට් සහ පෙයාර්ස්) සහ මල් බෝග (ඇන්තූරියම්, ඇල්ස්ට්‍රොමෙරියා, ජර්බෙරා, කානේෂන් සහ මැඩෝනා ලිලී) සඳහා ව්‍යාපාර අයවැය සකස් කරන ලද අතර එම ලේඛනය ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

"ඇග් ස්ටැට් – 2010" ප්‍රකාශයට පත් කිරීම

ආහාර-බෝග ක්ෂේත්‍රය පිළිබඳ වැදගත් තොරතුරු අඩංගු කෘෂි සංඛ්‍යා ලේඛන සහිත කුඩා ග්‍රන්ථය සම්පාදනය කර 2010 අගෝස්තු මාසයේදී ප්‍රකාශයට පත් කරන ලදී.

බෝග පුරෝකථනය

"බෝග පුරෝකථනය" සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානයේ මාසික ප්‍රකාශනයකි. එමඟින් වී, වෙනත් ක්ෂේත්‍ර බෝග සහ එළවළුවල මාසික වගා ප්‍රගතිය නිරීක්ෂණය කර ඒවායෙහි නිෂ්පාදන මට්ටම් පුරෝකථනය කෙරේ.

සංවිධානය කරන ලද වැඩමුළු සහ සම්මන්ත්‍රණ

ශ්‍රී ලංකාවේ ආහාර සුරක්ෂිතතාව (2010 මාර්තු 26 දින ගන්නෝරුවේදී පැවති වැඩමුළුව)

විශේෂයෙන්ම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට සම්බන්ධ විවිධ පාර්ශ්වකරුවන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම පිණිස ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සියෙහි ශ්‍රී ලංකා කාර්යාලයේ සහ එම ඒජන්සියෙහි කෘෂිකර්ම ඇලුමිණි සංගමයේ මූල්‍යාධාර උපයෝගී කර ගනිමින් වැඩමුළුවක් පවත්වන ලදී. ජාතියට සුරක්ෂිත බවින් යුතු ආහාර සැපයීම සහතික කිරීම සඳහා යහපත් කෘෂිකාර්මික පිළිවෙත් ප්‍රවර්ධනය කිරීම තුළින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යභාරය ශක්තිමත් කළ යුතු බව මෙම වැඩමුළුව තුළින් පෙන්වා දෙනු ලැබිණි. එමනිසා ආහාර සුරක්ෂිතතාව හා සම්බන්ධ ගැටලු නිරීක්ෂණය / නියාමනය කිරීමේ කාර්යයන් සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහ සෞඛ්‍ය අමාත්‍යාංශයේ නියෝජනය සහිත ඒකාබද්ධ ආයතනයක් පිහිටුවීමට නිර්දේශ කෙරිණි.

බහුවිධ අංශමය තාක්ෂණික හා ආර්ථික සහයෝගිතා වැඩසටහනෙහි (BIMSTEC) තෙවන විශේෂඥ කණ්ඩායම් රැස්වීම (2010 නොවැ. 22-23, මහනුවර)

මෙම දෙදින සම්මන්ත්‍රණය සඳහා බංග්ලාදේශය, භූතානය, ඉන්දියාව, මියන්මාරය, පාකිස්ථානය, නේපාලය, ශ්‍රී ලංකාව යන සාමාජික රටවල් සියල්ල සහභාගි විය. මෙයට සහභාගිවූවන් ප්‍රධාන වශයෙන්ම සාකච්ඡා කරන ලද්දේ පවත්නා සහයෝගිතාවෙහි ප්‍රගතිය සහ අනාගතයේ කෘෂිකර්මය තුළ සහයෝගිතාව ඇතිකර ගත හැකි ක්ෂේත්‍ර පිළිබඳවය. මෙහිදී යහපත් කෘෂිකාර්මික පිළිවෙත් යටතට කාබනික ගොවිතැන, පස අස්වනු තාක්ෂණයන් සහ අගය එකතු කිරීමේ අංශ එක් කිරීමට හා ඉහළ පිරිවැයක් නොමැති ව්‍යාපෘති කඩිනම් කිරීමට තීරණය විය. වී පිළිබඳ සමෝධානික පළිබෝධ කළමනාකරණය, බෝග ප්‍රභේද, බීජ සහතික කිරීම, විශේෂයෙන්ම උසස් තත්වයේ බිත්තර වී නිෂ්පාදනය, සංඛ්‍යානමය ක්‍රම සහ කොන්ත්‍රාත් වගා ක්‍රම සම්බන්ධයෙන් සහාය ලබා දීමට ශ්‍රී ලංකාව කැමැත්ත පළකළේය. එමෙන්ම, මෙහිදී ශ්‍රී ලංකාව සත්ව එන්නත් නිෂ්පාදනය, ආහාර සැකසීම, යහපත් කෘෂිකාර්මික හා නිෂ්පාදන පිළිවෙත්, පේව පළිබෝධනාශක නිෂ්පාදනය, බෝග පුරෝකථනය, කිරි ආහාර වර්ග පිළිබඳ කළමනාකරණ පිළිවෙත් සහ මානව සම්පත් කළමනාකරණය යන ක්ෂේත්‍ර තුළ කාක්ෂණික සහයෝගිතාව ලබා ගැනීමේ මංපෙත් පිළිබඳව සොයා බැලීය.

ප්‍රතිපත්ති ලේඛන සැකසීම

බීජ ගොවිපළ පිළිබඳ ආර්ථික විද්‍යාත්මක ඇගයීම

2010 වර්ෂයේ බීජ ගොවිපළ සංවර්ධන ව්‍යාපෘතියේ පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණය සැලකිල්ලට ගනිමින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ බීජ ගොවිපළ සියල්ල පිළිබඳ ආර්ථික විද්‍යාත්මක ඇගයීමක් සිදු කර එහි වාර්තාව කෘෂිකර්ම අමාත්‍යාංශයට යවන ලදී.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආයතනික සැලැස්ම 2011-2013

2011 – 2013 කාල පරිච්ඡේදයට අදාළ දෙපාර්තමේන්තු පුමුඛතාවන් සහ ආයතනික සැලැස්ම පිළියෙළ කරන ලදී.

වැඩසටහන් සම්බන්ධීකරණය

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආදර්ශ ගම්මාන වැඩසටහන
- ග්‍රීන් සුපර් වී පිළිබඳ ව්‍යාපෘතියේ කාර්යයන් (අන්තර් ජාතික වී පර්යේෂණ ආයතනය සමග සිදු කරන සහයෝගතා අධ්‍යයනයකි.)
- කාබනික පොහොර ව්‍යාපෘතිය

සම්මන්ත්‍රණ, වැඩමුළු සහ පුහුණු වැඩසටහන්වලට සහභාගිවීම

විවිධ කමිටුවලට සහභාගි වීම

- පෙරේරා ටී.එච්.සී.එස්., අධ්‍යක්ෂ, හලාවත වැවිලි සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
- පෙරේරා ටී. එච්.සී. එස්., අධ්‍යක්ෂ, කෘෂිකර්ම සහ ගොවිජන රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික

- පෙරේරා ටී.එච්.සී.එස්., අධ්‍යක්ෂ, කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සහාවේ සමාජ ආර්ථික ප්‍රතිපත්ති විශ්ලේෂණ කමිටු සාමාජික
- පෙරේරා ටී.එච්.සී.සී.එච්., අධ්‍යක්ෂ, ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්මේන්තුවේ ප්‍රසම්පාදන කමිටු සාමාජික
- පෙරේරා ටී.එච්.සී.එස්., අධ්‍යක්ෂ, බහුවිධ අංශමය තාක්ෂණික හා ආර්ථික සහයෝගිතා වැඩසටහනෙහි (BIMSTEC) කෘෂිකාර්මික අංශයට අදාළ පුමුඛතා ක්ෂේත්‍රය පිළිබඳ කමිටුවේ සාමාජික
- පෙරේරා ටී.එච්.සී.එස්., අධ්‍යක්ෂ, බීජ පිළිබඳ කාර්යසාධක බලකා කමිටු සාමාජික
- පෙරේරා ටී.එච්.සී.එස්., අධ්‍යක්ෂ, උතුරු පළාතේ කෘෂිකර්ම සහ වාරිමාර්ග සංවර්ධන කමිටු සාමාජික
- පෙරේරා ටී.එච්.සී.එස්., අධ්‍යක්ෂ, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආදර්ශ ගම්මාන වැඩසටහනෙහි සම්බන්ධීකරණ නිලධාරි
- හේරත් ආර්. එම්., වී සංවර්ධන කමිටු සාමාජික
- හේරත් ආර්.එම්., තාක්ෂණය නිදහස් කිරීමේ කමිටුවේ ලේකම්

දේශන පැවැත්වීම

- පලතුරු බෝග සඳහා පිරිවැය හා ප්‍රතිලාභ විශ්ලේෂණ ක්‍රම
- බෝග හානි තක්සේරු කිරීම්

විදේශ වැඩමුළුවට සහභාගිවීම

- ලෝක වෙළඳ සංවිධාන/ ආසියා හා ශාන්තිකර කලාප පිළිබඳ ආර්ථික හා සමාජීය කොමිසමේ කලාපීය වැඩමුළුව-කෘෂිකර්මය සහ කෘෂිකර්මය පිළිබඳ සාකච්ඡා, හැනෝයි, වියට්නාමය
- සංවර්ධන හා පාරිසරික ආර්ථික විද්‍යාව සඳහා වන දකුණු ආසියා ජාලයේ පාරිසරික හා ස්වභාවික සම්පත් ආර්ථික විද්‍යාව පිළිබඳ පුහුණු පාඨමාලාව

දේශීය වැඩමුළුවලට සහභාගි වීම

- ප්‍රතිඵල පදනම් කර ගනිමින් මෙහෙයුම් කටයුතු සිදු කිරීම පිළිබඳ වැඩමුළුව, 2010.01.05, සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, ගන්නොරුව
- ශ්‍රී ලංකා කෘෂි ආර්ථික විද්‍යා සංගමයේ සිවුවන වාර්ෂික පර්යේෂණ සමුළුව – ශ්‍රී ලංකා කෘෂි ආර්ථික විද්‍යා සංගමය විසින් සංවිධානය කරන ලද වැඩමුළුව, 2010 දෙසැ. 17, කෘෂි විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්ව විද්‍යාලය
- සමාජ ආර්ථික පැතිකඩ සහ බෝග නිෂ්පාදනය පිළිබඳ වැඩමුළුව, පොල් පර්යේෂණ ආයතනය, ලුණුවිල, 2010.02.19
- ඒකාබද්ධ උපායමාර්ගික පරිසර වැඩමුළුව, 2010.03.25, ටාජ් සමුද්‍රා හෝටලය, කොළඹ
- බහුවිධ අංශමය තාක්ෂණික හා ආර්ථික සහයෝගිතා ඩැඩසටනෙහි (BIMSTEC) තෙවන විශේෂඥ කණ්ඩායම් රැස්වීම 2010.11.22 - 2010.11.23, ටොපැස් හොටලය, මහනුවර
- ආසියානු පෙව තාක්ෂණය සහ සංවර්ධනය පිළිබඳ සම්මන්ත්‍රණය - 2010.12.15, අමායා හිලිස් හෝටලය, මහනුවර
- සංඛ්‍යානමය පුරෝකථන ක්‍රම පිළිබඳ සම්මන්ත්‍රණය, 2010 ජූනි 28 - 29, ශ්‍රී ලංකා ව්‍යාහාරික සංඛ්‍යාන සංගමය විසින් සංවිධානය කරන ලද්දකි.

මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා ව්‍යවහාරික සංඛ්‍යාන සංගමය විසින් පවත්වන ලද මූලික සංඛ්‍යානය පිළිබඳ කෙටි කාලීන පාඨමාලාවකදී නිලධාරීහු සිවුදෙනෙක් පුහුණු කරන ලදහ.

2011 වර්ෂය සඳහා සැලැස්ම

සමාජ ආර්ථික පර්යේෂණ

- ප්‍රධාන ආහාර බෝග පිළිබඳ වගා පිරිවැය අධ්‍යයනය – 2010 / 11 මහ කන්නය
- ප්‍රධාන ආහාර බෝග පිළිබඳ වගා පිරිවැය අධ්‍යයනය – 2011 යල කන්නය
- ආහාර බෝග නිෂ්පාදනයේ අවදානම් තක්සේරු කිරීම
- තරුණ පිරිස සහ අනාගත කෘෂිකර්මය
- නිර්දේශිත වී ප්‍රභේද භාවිතය පිළිබඳ ගොවීන්ගේ හැඟීම සහ එම ප්‍රභේද භාවිතා කිරීමේ තීරණය සම්බන්ධ අධ්‍යයනය
- ශ්‍රී ලංකාවේ වී වගා කරන ගොවීන්ගේ ජීවනෝපාය පිළිබඳ උපාය මාර්ග තක්සේරු කෙරෙන කුටුම්බ සමීක්ෂණය
- ශ්‍රී ලංකාවේ මැද්ඥෙදාක්කා නිෂ්පාදනය සහ අලෙවිකරණය
- වී පිළිබඳ තෝරාගත් තාක්ෂණයන් ව්‍යාප්ත කිරීම සහ යොදා ගැනීම

කෘෂිකාර්මික ප්‍රතිපත්ති විශ්ලේෂණය

- කෘෂි වෙළඳ ප්‍රතිපත්තිය ලෝක වෙළඳ සංවිධාන සම්මුතීන්ට අනුකූල වීම

- කලාපීය වෙළඳ ගිවිසුම් පිළිබඳ අධ්‍යයනය (Gravity model approach)

නිෂ්පාදනය සහ අලෙවිකරණය පිළිබඳ අධ්‍යයනය

- කල්පිටිය අර්ධද්වීපය තුළ බෝග නිෂ්පාදනයේ සාධක වෙළඳපොළ පිළිබඳ විශ්ලේෂණය
- මුල් හා ආකන්ද බෝග පිළිබඳ පසු අස්වනු සමීක්ෂණය
- අගය එකතු කරන ලද සහල් සහ සහල් පිටි පදනම් කරගත් නිෂ්පාදන පිළිබඳ වෙළඳපොළ ඇගයීම

පාරිසරික ආර්ථික විද්‍යාව

- ආහාර බෝග අංශය කෙරෙහි දේශගුණ විපර්යාස මඟින් ඇතිවන බලපෑම සහ ගොවීන්ට ඒ සඳහා අනුවර්තනය විය හැකි ක්‍රම ඇගයීම
- පළිබෝධනාශක භාවිතයේ සෞඛ්‍යමය බලපෑම සහ සමාජ ආර්ථික බලපෑම – අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ සිදු කරන ලද සිද්ධි අධ්‍යයනයක්
- කාබනික වී ගොවිතැනෙහි පාරිසරික බලපෑම ඇගයීම

දත්ත එක්රැස් කිරීම, විශ්ලේෂණය සහ කෘෂිකාර්මික තොරතුරු ප්‍රකාශයට පත් කිරීම

- ඇග් ස්ටැට් 2011 (VIII වන වෙළුම)
- වාර්ෂික වාර්තාව – 2011
- බෝග ව්‍යාපාර අයවැය – පලතුරු සහ මල් වගාව
- බෝග පුරෝකථනය – 2010/11 මහ කන්නය
- බෝග පුරෝකථනය – 2011 යල කන්නය
- කෘෂිකාර්මික තොරතුරු එක්රැස් කිරීම, නඩත්තු කිරීම සහ ප්‍රචාරණය

ව්‍යාපෘති මෙහෙයවීම සහ සැලසුම් කිරීම

- කාබනික පොහොර නිෂ්පාදනය කිරීමේ සහ ප්‍රයෝජනයට ගැනීමේ ව්‍යාපෘතිය
- ඒ ඒ විෂය ක්ෂේත්‍රවල ක්‍රියාකාරී කණ්ඩායම් සම්බන්ධීකරණය කිරීම
- ආදර්ශ ගම්මාන වැඩසටහන සම්බන්ධීකරණය කිරීම

මානව සම්පත් සංවර්ධනය

- තාක්ෂණික කාර්ය මණ්ඩලය සඳහා පරිගණක පුහුණුව ලබා දීම
- පරිපාලන කාර්ය මණ්ඩලය සඳහා පරිගණක පුහුණුව ලබා දීම

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරී/සේවක සංඛ්‍යාව
අධ්‍යක්ෂ	01
කෘෂි ආර්ථික විද්‍යාඥ	08
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරී	01
ආර්ථික විද්‍යාඥ සහකාර	12
වැඩසටහන් සහකාර	06
කෘෂිකර්ම උපදේශක	02
කළමනාකරණ සහකාර සේවය	08
රියදුරු	06
කම්කරු	03
කාර්යාල කාර්ය සහායක	01
එකතුව	**48**

3.4 ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය, පේරාදෙණිය

ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සියලුම ආයතන හා මධ්‍යස්ථාන විසින් ඉටු කරන වැඩසටහන් සහ කාර්යන්ට අදාළ මෙහෙයුම් සහ ඇගයීම් කටයුතු සිදු කිරීමේ වගකීම දරයි. එයට අමතරව, මෙම ඒකකය දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සැලැස්ම, වාර්ෂික කාර්ය සාධන වාර්තාව, මාසික ප්‍රගති වාර්තා මෙන්ම කෘෂිකර්ම අමාත්‍යාංශය හා වෙනත් ආයතනවලට අවශ්‍ය වන අනෙකුත් අදාළ වාර්තා පිළියෙල කිරීමේ වගකීමද දරයි. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වැඩකටයුතු වඩා විධිමත්ව සහ කාර්යක්ෂමව කිරීම පිණිස ප්‍රගති සමාලෝචන රැස්වීම් කැඳවීමද මෙමගින් සිදු කෙරේ.

අයවැය

ප්‍රගති මෙහෙයුම් හා ඇගයීම් ඒකකය සඳහා 2010 වර්ෂයට අදාළව විවිධ වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන් සහ දරන ලද වියදම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

වගු අංක 3.4.1 : වාර්ෂික අයවැය – 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	655,000	247,575	38
පුනරාවර්තන	1,559,000	1,207,228	77
එකතුව	**2,214,000**	**1,454,803**	**66**

ප්‍රගතිය

කාර්ය සැලසුම් සම්පාදනය

පහත සඳහන් කාණ්ඩ යටතේ 2010 වර්ෂය සඳහා කාර්ය සැලසුම් සම්පාදනය කරන ලදී.

- මූලධන වියදම්
- පුනරාවර්තන වියදම්
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හරහා අරමුදල් ප්‍රතිපාදනය කෙරෙන විශේෂ ව්‍යාපෘති
- කෘෂිකර්ම අමාත්‍යාශය විසින් අරමුදල් ප්‍රතිපාදනය කෙරෙන විශේෂ ව්‍යාපෘති
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික වැඩසටහන

මූලධන හා පුනරාවර්තන වියදම්වලට අදාළ ප්‍රගති මෙහෙයුම් කටයුතු

මූලධන සහ පුනරාවර්තන වියදම්වලට අදාළ භෞතික සහ මූල්‍ය ප්‍රගති මෙහෙයුම් කටයුතු 2010 වර්ෂය තුළද අඛණ්ඩව සිදු කෙරිණි. මූලධන සහ පුනරාවර්තන වියදම්වලට අදාළව මාසික ප්‍රගති වාර්තා පිළියෙල කර අමාත්‍යාංශයට ඉදිරිපත් කරන ලදී.

ජනාධිපති නියෝගයකට අනුව පළමු මාස 7 සඳහා අතුරු සම්මත ගිණුමක් හරහාද ඉන්පසු 2010 ජූලි මස පාර්ලිමේන්තුව විසින් සම්මත කළ අයවැය මගින්ද වශයෙන් 2010 වර්ෂය සඳහා ප්‍රතිපාදන ලැබුණේ වාරික 3කිනි. මෙනිසා මූලධන වැඩ සමහරක් සම්බන්ධයෙන් සැලසුමෙන් මඳක් බැහැරවීමට සිදුවිය.

අයවැය 3.4.2 : කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ සාරාංශය

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය (රු. මිලියන)	වියදම (රු.මිලියන)	වියදම් %
මූලධන	1 93.7	116.7	60
පුනරාවර්තන	1,765.2	1,666.4	94
කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ වූ ව්‍යාපෘති	377.2	317.4	84
අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ වූ ව්‍යාපෘති	212.3	142.3	67
එකතුව	**2,548.4**	**2,242.8**	**88**

විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය මෙහෙයවීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ පැවති විශේෂ ව්‍යාපෘති

කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ පැවති විශේෂ ව්‍යාපෘති 12කට අදාළ භෞතික හා මූල්‍ය ප්‍රගති මෙහෙයුම් කටයුතු සිදු කර මාසික ප්‍රගති වාර්තා කෘෂිකර්ම අමාත්‍යාංශයට යවන ලදී. එම විශේෂ ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය වගු අංක 3.4.3හි දැක්වේ.

වගු අංක 3.4.3 : කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැය ශීර්ෂ යටතේ පැවති විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය

ව්‍යාපෘතිය	ආයතනය	ප්‍රතිපාදනය (රු. මිලියන)	වියදම (රු. මිලියන)	වියදම %
දෙමුහුම් බීජ වැඩිදියුණු කිරීම	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය / කෙෂ්ත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය / වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය	9.0	6.7	74
සුළු පරිමාණ කෘෂිකාර්මික පර්යේෂණ	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය / වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය	3.5	3.5	100
යටිතල පහසුකම් සංවර්ධනය	වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය	110.0	75.6	69
මාධ්‍ය වැඩසටහන	ව්‍යාප්ති හා පුහුණු අංශය	18.0	17.3	96
කෘෂිකර්ම විද්‍යාල ගොවිපළ සංවර්ධනය	ව්‍යාප්ති හා පුහුණු අංශය	16.0	14.6	91
පුහුණු කටයුතු සහ නිපුණතා වර්ධනය	ව්‍යාප්ති හා පුහුණු අංශය	8.0	7.9	98
කෘෂි උද්‍යාන	ව්‍යාප්ති හා පුහුණු අංශය	4.0	3.9	98
බීජ නිෂ්පාදනය සහ මිලදී ගැනීම	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය	174.5	167.6	96
ජල සම්පාදනය වැඩිදියුණු කිරීම	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය	13.0	3.7	29
බීජ පනත ක්‍රියාත්මක කිරීම	බීජ සහතික කිරීමේ සේවය	15.0	10.8	72
ශ්‍රී ලංකා - අ.එ.ප්‍ර. සං.ආ. ජනකප්ලාස්ම සංවර්ධන වැඩසටහන	පැළෑටි ජාන සම්පත් මධ්‍යස්ථානය	4.2	4.1	98
කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික සමුළුව	ව්‍යාප්ති හා පුහුණු අංශය	2.5	1.8	71
එකතුව		**377.2**	**317.4**	**84**

කෘෂිකර්ම අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ වූ විශේෂ ව්‍යාපෘති

කෘෂිකර්ම අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ පැවති විශේෂ ව්‍යාපෘති 25ක භෞතික හා මූල්‍ය ප්‍රගති මෙහෙයුම් කටයුතු සිදු කර අදාළ මාසික වාර්තා අමාත්‍යාංශයට යවන ලදී. අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ වූ විශේෂ ව්‍යාපෘතිවල මූල්‍ය ප්‍රගතිය වගු අංක 3.4.4හි දැක්වේ.

වගු අංක 3.4.4 : අමාත්‍යාංශ වැය ශීර්ෂ යටතේ පැවති විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය

ව්‍යාපෘතිය	ආයතනය	ප්‍රතිපාදනය (රු. මි.)	වියදම (රු.මි.)	වියදම් %
අපි වවමු රට නගමු				
වී ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම	ව්‍යාප්ති හා පුහුණු අංශය	3.34	2.75	82
වෙනත් ක්ෂේත්‍ර බෝග	ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	3.97	3.94	99
එළවළු	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	4.50	5.20	115
පලතුරු	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	4.80	4.80	100
මාධ්‍ය වැඩසටහන	ව්‍යාප්ති හා පුහුණු අංශය	7.85	7.85	100
මී පැණි නිෂ්පාදනය	ව්‍යාප්ති හා පුහුණු අංශය	0.54	0.54	100
ගොවි කාන්තා වැඩසටහන	ව්‍යාප්ති හා පුහුණු අංශය	0.90	0.65	72
කෘෂි සේවා පියස හරහා ප්‍රජා මූලික බීජ නිෂ්පාදනය	ව්‍යාප්ති හා පුහුණු අංශය/ වී පර්යේෂණ හා සංවර්ධන ආයතනය	0.65	0.50	84
බීජ සහතික කිරීමේ සේවය	බීජ සහතික කිරීමේ සේවය	3.50	3.5	100
ක්ෂුද්‍ර ජල සම්පාදනය	ව්‍යාප්ති හා පුහුණු අංශය	9.7	3.48	36
ගෙවතු වගාව	ව්‍යාප්ති හා පුහුණු අංශය	6.0	5.97	99
ගෙවතු සංවර්ධනය	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය	8.23	5.58	68
අන්තර් පළාත් ව්‍යාප්ති ප්‍රදේශවල ලොකු ලුනු ආදර්ශන	ව්‍යාප්ති හා පුහුණු අංශය	2.3	1.90	83
අන්තර් පළාත් ව්‍යාප්ති ප්‍රදේශවල රතු ලූනු ආදර්ශන	ව්‍යාප්ති හා පුහුණු අංශය	2.97	2.46	83
වැසි ජල සංරක්ෂණය	ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය	1.30	0.21	16
පාංශු සංක්ෂණය	ස්වභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය	0.97	0.08	8
වෙනත් ව්‍යාපෘති				
ශීත කාමරය	බීජ හා රෝපණ ද්‍රව්‍ය සංවර්ධන මධ්‍යස්ථානය	9.63	9.5	9
ගොවි සතිය	ව්‍යාප්ති හා පුහුණු අංශය	10.36	10.08	97

දැයට කිරුළ	ව්‍යාප්ති හා පුහුණු අංශය	2.69	1.06	39
-කෙසෙල්	ව්‍යාප්ති හා පුහුණු අංශය	2.09	2.08	100
- වී	ව්‍යාප්ති හා පුහුණු අංශය	1.0	0.19	19
-දොඩම්	ව්‍යප්ති හා පුහුණු අංශය	4.17	1.12	27
-තොරණ	ව්‍යාප්ති හා පුහුණු අංශය	3.0	0.70	23
එක් බෝගයක් එක් ගම්මානයක්	උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනය	3.87	3.19	82
වෙනත් කුඩා ව්‍යාපෘති		9.90	4.83	49
කාබනික පොහොර		97.55	59.44	61
එකතුව		**212.24**	**142.36**	**67**

ාක්ෂණික වැඩසටහන

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික වැඩසටහන පිළිබඳව කාර්තුගතව ප්‍රගති වාර්තා සම්පාදනය කරන ලදී.

වෙනත් වාර්තා

මහින්ද චින්තනය යටතේ පැවති සමස්ත ඇස්තමේන්තු ගත වියදම රු. මිලියන 50 ඉක්මවූ ව්‍යාපෘතිවල වැඩකටයුතු පිළිබඳ ප්‍රගති වාර්තා පිළියෙල කර කෘෂිකර්ම අමාත්‍යාංශයට යවන ලදී.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කාර්යඵල

පාර්ලිමේන්තු අයවැය කථාව සහ මහ බැංකු වාර්ෂික කාර්යසාධන වාර්තාව සඳහා යවනු ලබන ප්‍රගති වාර්තාවේ ඇතුළත් කිරීම පිණිස 2010 වර්ෂයට අදාළ කාර්යඵල සම්පාදනය කර කෘෂිකර්ම අමාත්‍යාංශයට සහ මහ බැංකුවට ඉදිරිපත් කෙරිණි.

වාර්ෂික කාර්යසාධන වාර්තාව

2009 වර්ෂයට අදාළ කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික වාර්තාව පිළියෙල කර පාර්ලිමේන්තුව, අදාළ සියලුම අමාත්‍යාංශ, විශ්වවිද්‍යාල, පුස්තකාල සහ වෙනත් අදාළ ආයතනවලට බෙදා දෙන ලදී.

2011 වර්ෂය සඳහා සැලැස්ම

- කෘෂිකර්ම දෙපාර්තමේන්තු වැඩසටහන් සඳහා කාර්ය සැලසුම් පිළියෙල කිරීම
- මූලධන සහ පුනරාවර්තන කාර්යයන්හි සහ විශේෂ ව්‍යාපෘතිවල ප්‍රගතිය මෙහෙයවීම
- මාසිකව භෞතික හා මූල්‍ය ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්යසාධන වාර්තාව සම්පාදනය කිරීම
- මහ බැංකු වාර්තාව සහ අයවැය කථාව සඳහා තොරතුරු සැපයීම
- රු. මිලියන 50ට වැඩි ව්‍යාපෘතිවලට අදාළ ප්‍රගති වාර්තා සම්පාදනය

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරී/සේවක සංඛ්‍යාව
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01
කෘෂි ආර්ථික විද්‍යාඥ	02
භාෂා පරිවර්තක	03
වැඩසටහන් සහකාර	02
කළමනාකරණ සහකාර සේවය	02
රියදුරු	03
කාර්යාල කාර්ය සහායක	01
කම්කරු	03
මුරකරු	02
එකතුව	**19**

3.5 ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය
පේරාදෙණිය

ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය ජාතික ඵලදායිතාව තිරසාර අන්දමින් වැඩිදියුණු කිරීම සඳහා විද්‍යාත්මක පදනමක් මත ඉඩම් හා ජල සම්පත් භාවිතය ප්‍රශස්ත කිරීමට ප්‍රයත්න දරයි. මෙම මධ්‍යස්ථානය මගින් ඉටු කරන ප්‍රධාන කාර්යයන් වනුයේ පාංශු සංරක්ෂණය හා ජලාධාර කළමනාකරණය ඉඩම්වල යෝග්‍යතාව ඇගයීම, බෝගවල ක්‍රියාකාරීත්වය මැනීම හා බෝග පුරෝකථනය, කෘෂි කාලගුණික හා දේශගුණික විපර්යාස, ඵලදායිතා වර්ධනය, පසේ හා ජලයේ තත්වය සහ ගොවිපළ ජල සම්පාදන කළමනාකරණය පිළිබඳ පර්යේෂණවල නිරතවීමයි. දිවයිනේ කෘෂි කාලගුණික නිරීක්ෂණ ජාලය නඩත්තු කිරීම, පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම, තාක්ෂණ ප්‍රචාරණය, සේවාදායකයින්ට අදාළ විෂයයන් සම්බන්ධයෙන් තාක්ෂණික සහාය ලබාදීම සහ විවිධ සංවර්ධන ව්‍යාපෘතිවලින් ඇතිවන පාරිසරික බලපෑම තක්සේරු කිරීම මෙම මධ්‍යස්ථානයට පැවරී ඇති අනෙකුත් වගකීම් වේ.

අයවැය

වගු 3.5.1: චාර්ෂික අයවැය - 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	2,173,000	1,324,934	61
පුනරාවර්තන	2,226,500	1,804,003	81
ව්‍යාපෘති			
වැසිජල සංරක්ෂණ ව්‍යාපෘතිය	1,300,000	653,616	50
පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම	968,000	384,103	49
වාරි පුබුදුව	495,991	488,939	99
නියඟය මගින් ඇතිවන බලපෑම අවමකර ගැනීමේ ව්‍යාපෘතිය	225,000	221,118	98
ඉඩම් සංවර්ධන ව්‍යාපෘතිය	191,200	97,840	51
එකතුව	**7,579,691**	**4,974,552**	**66**

ප්‍රගතිය

පර්යේෂණ

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වී වගා ප්‍රදේශවල යල සහ මහ කන්න තුළ වර්ෂාව ආරම්භ වන කාල සීමාව නිර්ණය කිරීම.

වියළි හා අතරමැදි කලාපවල ඇති වී වගා කරන පරිසර පද්ධති 3, එනම් ප්‍රධාන වාරිමාර්ග ආශ්‍රිත ප්‍රදේශ,සුළු වාරිමාර්ග ආශ්‍රිත ප්‍රදේශ සහ වර්ෂාපෝෂිත ප්‍රදේශ අතරින්, අදාළ දේශගුණ කලාපවල යල හා මහ යන කන්න දෙකේදීම ඇතිවන වර්ෂාපතන රටාවට සාපේක්ෂව අඩුවෙන්ම සංවේදී වන්නේ ප්‍රධාන වාරිමාර්ග ආශ්‍රිත ප්‍රදේශ පමණි. නිර්පේක්ෂ පරිමාණය අනුව මෙම වර්ෂා කාල සීමාවන් දෙකම කෙටි හෙයින් බෝගය වර්ධනය වීමට ගතවන වටිනා කාලය අපතේ යෑම වැළැක්වීම සඳහා හැකි තරම් කලින් වී බෝගය ක්ෂේත්‍රයේ ස්ථාපිත කිරීම වැදගත් වේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වී වගා ප්‍රදේශවල යල සහ මහ කන්න තුළ වර්ෂාව ආරම්භ වන කාල සීමාවේ අවකාශමය ව්‍යාප්තිය නිශ්චය කිරීම පිණිස පසුගිය කාල සීමාවන් කෙරෙහි අවධානය යොමු කරමින් අධ්‍යයනයක් සිදු කෙරිණි

යල සහ මහ කන්න දෙක තුළම සාමාන්‍යයෙන් වර්ෂාව ආරම්භ වන කාලයේ ඉහළ අවකාශමය විචලනයක් ඇති බව මෙම අධ්‍යයනය මගින් පෙන්වා දී ඇත. කෙසේවුවද, දේශගුණ විපර්යාසය හේතුවෙන් වර්ෂාපතන කාලසීමාවේ වෙනස්කම් ඇති වුවද දිවයිනේ ප්‍රධාන වී වගා ප්‍රදේශවල සාමාන්‍යයෙන් වර්ෂාව ආරම්භ වන කාලය නොවෙනස්ව පැවති බව පැහැදිලි විය.

මහනුවර දිස්ත්‍රික්කයේ උඩරට වන උයන් ක්‍රමය යටතේ පලතුරු බෝගවල ඵලදායිතාව වර්ධනය කිරීම

උඩරට වන උයන් ක්‍රමය යටතේ පලතුරු බෝග නිෂ්පාදනය කෙරෙහි බලපාන ඉඩම් සම්බන්ධ සීමාවන් හඳුනා ගැනීමේ සහ උසස් කළමනාකරණ පිළිවෙත් මාලාවක ස්වරූපයෙන් නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමේ අරමුණ ඇතිව 2006 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම අධ්‍යයනයේ වැඩ කටයුතු නිම කෙරිණි. මෙහිදී පස හා සමාජ ආර්ථික විද්‍යාත්මක අංශය සහ ඉඩම් පිළිබඳ සීමාවන් හඳුනා ගන්නා ලදී. පලතුරු පැළ රෝපණය කිරීම සඳහා වදුල නොමැති ස්ථාන තෝරා ගැනීම, කුට්ටි කාණු සහ තනි වේදිකා යොදා ගනිමින් පස සංර ක්ෂණය කිරීම, ජලය අපතේ යාමට නොදී රඳවා ගැනීම සඳහා කණින ලද වලවල් යොදා ගනිමින් වැසි ජලය සංරක්ෂණය කිරීම, පැළ ආරක්ෂා කිරීම සඳහා ක්ෂුද්‍ර වැටක් යෙදීම, බෝගය රෝපණය කිරීමට සති 3 කට පෙර වලවල්වලට අළුහුණු යෙදීම, රෝපණය කරන විට වලට ගොම යෙදීම, ගෙඩි හට ගන්නා අවධිය දක්වා නිර්දේශිත පරිදි රසායනික පොහොර යෙදීම හා අවශ්‍ය පරිදි කෘමි හා පළිබෝධ පාලනය කිරීම සහ පැළෑටි වියන පුහුණු කිරීම හා කප්පාදු කිරීම වැනි නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග ගැනීම නිර්දේශ කෙරිණි. මෙම තාක්ෂණය, "තාක්ෂණය නිදහස් කිරීමේ කමිටුවට" ඉදිරිපත් කිරීමට නියමිතය.

මහනුවර දිස්ත්‍රික්කයේ උඩරට වන උයන් ක්‍රමය සඳහා එළවළු නැවත හඳුන්වාදීම

උඩරට වන උයන් ක්‍රමය යටතේ එළවළු නිෂ්පාදනය සඳහා බලපාන ඉඩම් සම්බන්ධ සීමාවන් හඳුනා ගැනීම සහ එළවළු වගාව නැවත හඳුන්වාදීම සඳහා උසස් කළමනාකරණ පිළිවෙත් මාලාවක ස්වරූපයෙන් නිවැරදි කිරීම් ක්‍රියාමාර්ග අනුගමනය කිරීම පිණිස ගොවීන් 5දෙනෙකුගේ සහභාගිත්වයෙන් 2009 වර්ෂයේදී ආරම්භ කරන ලද මෙම අධ්‍යයනයේ කටයුතු නිම කරන ලදී. ලෝහමය රාමුවක රඳවන ලද පස් සහිත බඳුන් තුළ එළවළු වගා කිරීම සඳහා සිරස්ව විහිදෙන ලෝහමය ව්‍යුහයක් හඳුන්වා දෙන ලද අතර එම සිරස් ව්‍යාප්ත තාක්ෂණය, "තාක්ෂණය නිදහස් කිරීමේ කමිටුව" වෙත ඉදිරිපත් කිරීමට නියමිතය.

ජල සම්පාදිත කෘෂිකර්මයේදී ගොවිපළ පාංශු කළමනාකරණය සඳහා "යාය ප්‍රවේශයක්" බිහි කිරීම (පාංශු පරීක්ෂාව හා පොහොර නිර්දේශ කිරීම සඳහා සරල ක්‍රමයක්)

කැනඩා අන්තර්ජාතික සංවර්ධන ඒජන්සියෙන් සහ ජපාන අන්තර්ජාතික සහයෝගිතා ඒජන්සියෙන් ලද අරමුදල් යොදාගනිමින් පාංශු පරීක්ෂාව හා පොහොර නිර්දේශ කිරීම සඳහා දුරස්ථ සංවේදනය හා භූගෝලීය තොරතුරු ක්‍රම තාක්ෂණය මත පදනම් වූ ගොවි සහභාගිත්වය සහිත අඩු පිරිවැයැති බහු කාර්ය ක්‍රමයක් නිර්මාණය කර ක්ෂේත්‍රය තුළ අත්හදා බලන ලදී. මෙම ක්‍රමය ක්ෂේත්‍රයේ අත්හදා බලා තහවුරු කර ගැනීම සඳහා දිළිඳු ජනයාගේ ආර්ථික අභිවෘද්ධිය හා ප්‍රජා සංවර්ධනය උදෙසා කටයුතු කරන ව්‍යාපෘතියක (PEACE) අරමුදල් යොදා ගනිමින් ගල්ගමුව අබකොළවැව සහ ශ්‍රාවස්තිපුර හිඳෝගම යන ගම්මානවලදී අධ්‍යයන සිදු කරන ලදී. එම අධ්‍යයන තුළින් මෙය ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කිරීම යෝග්‍ය බව පෙන්වා දිණි.

අධික ලෙස බැවුම් වූ ඉඩම්වල නායයෑම් වැනි ක්‍රියාකාරිත්වයන් මගින් නිරාවරණය වූ පෘෂ්ටයන් කඩිනමින් ආවරණය කිරීමට සුදුසු අඩු පිරිවැයැති ක්‍රමයක්

අධික ලෙස බැවුම් වූ ඉඩම්වල නායයෑම් වැනි දෑ ඇතිවීමෙන් නිරාවරණය වූ පෘෂ්ටයන් ආවරණය කිරීම සඳහා යෙදවුම් ලෙස දේශීය වශයෙන් ලබාගත හැකි ද්‍රව්‍ය යොදා ගැනීමේ අඩු පිරිවැයැති ක්‍රමයක් නිර්මාණය කර ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ සහයෝගය ඇතිව පේරාදෙණිය නගරයේ පිහිටි නායයෑමට ලක්වූ ස්ථානයේ අත්හදා බලන ලදී. නිරාවරණය වූ ඉඩම් පෘෂ්ටය මට්ටම් කිරීම, එය සෙ.මී. 15ක සනකමකින් යුත් වර්ධන මාධ්‍යයක් යොදා ගනිමින් ආවරණය කිරීම, වර්ධන මාධ්‍යයට පෝෂ්‍ය වශයෙන් හායනය වන ද්‍රව්‍යයකින් යුතු සෙ.මී. 2ක් ඝනකමැති වසුන්ක් යෙදීම, වසුන මත යකඩ දැලක් තබා එය යකඩ කොකු යොදා ගනිමින් පොළොවට සවි කිරීම, පැළෑටි කැබලි රෝපණය කර පැළෑටි ආවරණය ස්ථාපිත කිරීම පිණිස අදාළ පසු මෙහෙයුම් කටයුතු සිදු කිරීම වැනි පියවර කිහිපයක් මෙම ක්‍රමයට අන්තර්ගත වේ. නිර්මාණය කරන ලද මෙම ක්‍රමය දැන් අත්හදා බැලෙමින් පවතී. පාංශු බාදනයට ලක්වූ පෘෂ්ඨය ආවරණය කර ස්ථායිකරණය කිරීම සඳහා මෙය බෙහෙවින් සුදුසු හා සාර්ථක ක්‍රමයක් බව මූලික ප්‍රතිඵල මගින් පෙන්නුම් කෙරේ.

පරිමිති සමීක්ෂණය, පාංශු සමීක්ෂණය සහ බෝග යෝග්‍යතා සමීක්ෂණය

- බටඅත, නිරවිය සහ අඹේපුස්ස ගොවිපළවල පරිමිති සමීක්ෂණය, පාංශු සමීක්ෂණය හා බෝග යෝග්‍යතා සමීක්ෂණය නිම කෙරිණි. පවත්නා දේශගුණික තත්වයන් යටතේ පාංශු සිතියම්, බෝග යෝග්‍යතා සිතියම් සහ සමෝච්ච රේඛා සිතියම් සකස් කරන ලදී.
- පාංශු සිතියම්, සමෝච්ච රේඛා සිතියම් සහ බෝග යෝග්‍යතා සිතියම් හා බෝග යෝග්‍යතා වාර්තා පිළියෙල කර ඉදිරිපත් කරන ලදී.

ගොවිපළ නාමයන් සහ එම ගොවිපළවල සමීක්ෂණය කරන ලද බිම් ප්‍රමාණයන් වගු අංක 3.6.2හි දැක්වේ.

වගු අංක 3.6.2 : සමීක්ෂණය කරන ලද බිම් ප්‍රමාණයන්

ගොවිපළ	බිම් ප්‍රමාණය
බටඅත	අක්. 600
නිරවිය	අක්. 400
අඹේපුස්ස	අක්. 200
දොළුව ප්‍රා.ලේ. කොට්ඨාසය	අක්. 80

- "කුඩා තේ වතු ව්‍යවසායකත්ව වැඩසටහන" යටතේ අක්. 80ක ඉඩමක පාංශු සංරක්ෂණ කටයුතු සිදු කිරීම සඳහා අදාළ මායිම් සලකුණු කෙරිණි. දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී කොට්ඨාස ගණනාවක් තුළ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන්ද පවත්වන ලදී.

තාක්ෂණ ප්‍රචාරණය

පාංශු හා ජල සංරක්ෂණය සහ ඒ හා සම්බන්ධ ක්ෂේත්‍ර පිළිබඳ පුහුණු වැඩසටහන්

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නිලධාරීන් 71දෙනෙකු සඳහා පාංශු සංරක්ෂණය සහ ඉඩම් සංවර්ධනය පිළිබඳ පස් දින පුහුණු වැඩසටහන් 2 ක් පවත්වන ලදී.
- වයඹ පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නිලධාරීන් 40දෙනෙකු සඳහා පාංශු සංරක්ෂණය හා ඉඩම් සංවර්ධනය පිළිබඳ සිවු දින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
- කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවාව සමඟ සහයෝගයෙන් වාණිජමය මට්ටමින් වගාවෙහි යෙදෙන ගොවීන් 30දෙනෙකු සඳහා පාංශු සංරක්ෂණය හා ඉඩම් සංවර්ධනය පිළිබඳ තෙදින පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.
- දකුණු පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ තාක්ෂණික නිලධාරීන් සහ හදබිම ගොවීන් 50 දෙනෙකුගේ සහභාගිත්වයෙන් යුතුව පාංශු සංරක්ෂණය සහ ජලාධාර කළමනාකරණය පිළිබඳ දෙදින පුහුණු වැඩසටහන් 2ක් පැවැත්විණි.
- සිසුන් හා ගොවීන් 681දෙනෙකු සඳහා පාංශු සංරක්ෂණය, ජලාධාර කළමනාකරණය සහ ඉඩම් කළමනාකරණය පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන් 5ක් පවත්වන ලදී.
- ප්ලෑන් ශ්‍රී ලංකා ආයතනය සමඟ සහයෝගයෙන් වතු සේවකයින් 460දෙනෙකු සඳහා පාංශු සංරක්ෂණය පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන් 22ක් පවත්වන ලදී.
- අන්තර්ජාතික කෘෂිකර්ම සංවර්ධන අරමුදල (IFAD) මඟින් අරමුදල් ප්‍රතිපාදිත සුළු ගොවි ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ප්‍රධාන ගොවීන් 380දෙනෙකු සඳහා ඉඩම් භාවිතය සැලසුම් කිරීම පිළිබඳ එක්දින පුහුණු වැඩසටහන් 12ක් පවත්වන ලදී.
- දකුණු පළාතේ ව්‍යාප්ති නිලධාරීන් සඳහා ද වර්ල්ඩ් විෂන් ශ්‍රී ලංකා ආයතනයේ විධායක නිලධාරීන් සඳහා ද රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම පීඨයේ ශිෂ්‍යයින් සඳහා ද වැසිජල සංරක්ෂණය පිළිබඳ එක් දින පුහුණු වැඩසටහන් 3ක් පවත්වන ලදී.

පාංශු හා ජල සංරක්ෂණය පිළිබඳ ආදර්ශන සහ ප්‍රදර්ශන

- දැනට පවතින පාංශු සංරක්ෂණ හා ජලාධාර කළමනාකරණ තාක්ෂණයන් මෙරට තුළ අවසානයේදී භාවිත කරන විවිධ කාණ්ඩවල ප්‍රයෝජනය වෙනුවෙන් ආදර්ශනය කිරීමේ අරමුණ ඇතිව 2004 වර්ෂයේදී ගන්නෝරුව කෘෂි තාක්ෂණ උද්‍යානයේ ස්ථාපිත කරන ලද පාංශු සංරක්ෂණ ආදර්ශනය නඩත්තු කරන ලදී. ගොවීහු 7,647දෙනෙක්, පාසැල් සිසුහු 62,995දෙනෙක්, ගුරුවරු 5,411දෙනෙක් සහ තවත් 17,337ක් පිරිසක් මෙම ආදර්ශනය නැරඹීමට පැමිණියහ.
- ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මරදන්කැල්ල ග්‍රාමයේ ගොවිපළ පාංශු සංරක්ෂණ ආදර්ශනයක් ස්ථාපිත කරන ලදී. වැවේ ජලාධාර ප්‍රදේශයේ හෙ. 50ක බිම් කොටසක වූ ගොවීන් 21දෙනෙකුට අයත් වර්ෂා පෝෂිත ගොඩ ඉඩම් හෙ. 20ක් පමණ

සංරක්ෂණ පියවරක් වශයෙන් මී. 10,077ක පස්වැටි යොදා සංරක්ෂණය කරන ලදී.

- පලුගස්වැව සහ තණමල්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට ලැබෙන වර්ෂාපතනයේ ඵලදායිත්වය ඉහළ නැංවීම පිණිස ඉඩම් හෙල්මළු කිරීම සහ ගොවිපළ පොකුණු සැකසීම වැනි වැසිජල සංරක්ෂණ ක්‍රියාමාර්ග පිළිබිඹු කරන ආදර්ශන 2ක් ස්ථාපිත කරන ලදී. මෙම ආදර්ශන මඟින් පලුගස්වැව ගොවීන් 2 දෙනෙකුට අයත්

  අක්. 3ක් සහ තණමල්විල ගොවීන් 4දෙනෙකුට අයත් අක්. 4ක් ආවරණය කරන ලදී.

- 2010 පෙබරවාරි මාසයේදී මහනුවර කුණ්ඩසාලේ පැවති දැයට කිරුළ ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන ක්ෂේත්‍රයක් සහ ප්‍රදර්ශන කුටියක් ස්ථාපිත කරන ලදී.
- 2010 සැප්තැම්බර් මාසයේදී බටඅත ගොවිපළේ පැවති ගොවි සතිය ප්‍රදර්ශනයේ ප්‍රදර්ශන ක්ෂේත්‍රයක් සහ ප්‍රදර්ශන කුටියක් ස්ථාපිත කරන ලදී.

රූපවාහිනී සහ ගුවන්විදුලි වැඩසටහන්

- නිලධාරීහු පාංශු සංරක්ෂණය, ජලාධාර කළමනාකරණය සහ වැසිජල සංරක්ෂණය පිළිබඳ රූපවාහිනී වැඩසටහන් 5කට සහ ගුවන්විදුලි වැඩසටහන් 4කට සහභාගි වූහ.

වැඩමුළු

- 2010 ලෝක ජල දිනයේදී "සෞඛ්‍යාරක්ෂාව සඳහා ජලය" යන තේමාව යටතේ පුද්ගලයන් 95 දෙනෙකුගේ සහභාගිත්වයෙන් වැඩමුළුවක් පවත්වන ලදී.

තාක්ෂණික සහාය

මෙම මධ්‍යස්ථානයෙන් ඉටු කෙරෙන ප්‍රධාන කාර්යයක් නම් විවිධ සේවාලාභීන් සඳහා විශේෂඥ තාක්ෂණික සහාය ලබා දීමයි. වසර තුළ මෙමගින් පහත සඳහන් අයුරින් තාක්ෂණික සහාය ලබාදෙන ලදී.

- මහවැලි අධිකාරියේ නිරවිය ගොවිපළේ හෙ. 40ක ඉඩම් කට්ටියක පාංශු සමීක්ෂණයක් සිදු කර ඉඩම් යෝග්‍යතා සිතියම සකස් කරන ලදී.
- ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ඉල්ලීම පරිදි පේරාදෙණිය නගරයේ නායයෑම හේතුවෙන් නිරාවරණය වූ ප්‍රදේශයේ පෘෂ්ඨය ස්ථායිකරණය කිරීම
- මාවතුර හදබිම පුහුණු ගොවිපළෙහි පාංශු සංරක්ෂණ ආදර්ශනය වැඩිදියුණු කර නඩත්තු කිරීම.
- කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවාව සඳහා සුළු හා මධ්‍ය පරිමාණ වාණිජ ගොවිපළ සංවර්ධනය පිළිබඳ පුහුණු මොඩියුලය සකස් කිරීම
- කෘෂි ව්‍යාපාර සංවර්ධන හා තොරතුරු සේවාවෙහි සුළු හා මධ්‍ය පරිමාණ වාණිජ ගොවිපළ සංවර්ධන වැඩසටහන සඳහා ඉඩම් සංවර්ධන සැලසුම් සකස් කිරීම

වෙනත් කාර්යයන්

පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම

අදාළ පාර්ශ්වයන්ට අවශ්‍ය තොරතුරු ලබාදීම මඟින් පනතෙහි නව සංශෝධන සඳහා අනුමැතිය ලබාගැනීමේ ක්‍රියාවලිය අබණ්ඩව සිදු කෙරිණි.

දත්ත මූලය නඩත්තු කිරීම

විවිධ සේවාලාභීන්ට තොරතුරු ලබාදීම පිණිස කෘෂි කාලගුණික තත්වය, ඉඩම් හා ජල සම්පත් පිළිබඳ දත්ත එක්රැස් කර, පරිගණකගත කර දත්ත මූලය නඩත්තු කරන ලදී.

කෘෂි කාලගුණ විද්‍යා නිරීක්ෂණ ජාලය නඩත්තු කිරීම

වර්ෂා මානක ස්ථාන 70කින් සහ කෘෂි කාලගුණ විද්‍යා නිරීක්ෂණ මධ්‍යස්ථාන 28කින් සමන්විත කෘෂි කාලගුණ විද්‍යා නිරීක්ෂණ ජාලය ජගත් සෞඛ්‍ය සංවිධාන ප්‍රමිතිවලට අනුකූලව නඩත්තු කරන ලදී.

තාක්ෂණික කමිටු නියෝජනය කිරීම

ස්වාභාවික සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානයේ කාර්ය මණ්ඩලය පහත දැක්වෙන කමිටු සඳහා තම සේවය ලබාදුන්හ.

- උතුරු පළාත සඳහා උපාය මාර්ගික පරිසර ඇගයීම් වැඩසටහන
- ඉඩම් කට්ටි කිරීම් (30), ගල් වලවල් (10), කුඩා විදුලි බල (50) සහ දැව කැපීම් (60), ව්‍යාපෘති වැනි විවිධ ව්‍යාපෘති සඳහා පාරිසරික සුරක්ෂිතතා අනුමැතිය ලබාදෙන මධ්‍යම පරිසර අධිකාරියේ තාක්ෂණික ඇගයීම් කමිටුවල සේවය කිරීම
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ජල කළමනාකරණ මඩුල්ලෙහි සාමාජිකයෙකු වශයෙන් සේවය කිරීම

2011 වර්ෂය සඳහා සැලැස්ම

පර්යේෂණ

- අතුරු කන්නයක් වගා කිරීම සඳහා තෝරාගත් කෘෂි පාරිසරික කලාප සතු යෝග්‍යතාව නිශ්චය කිරීම පිණිස ඒවායෙහි වර්ෂාපතන දත්ත ගැඹුරින් විශ්ලේෂණය කිරීම

- ශ්‍රී ලංකාවේ වෙනස් වන දේශගුණික රටාව තුළ කෘෂිකර්මය කෙරෙහි නියඟය මගින් ඇති කරන බලපෑම අවම කර ගැනීම : මොණරාගල දිස්ත්‍රික්කයේ තෝරාගත් ප්‍රදේශයක සිටින ගොවීන් තුළ එම නත්වයට මුහුණුදීමේ හැකියාවක් ඇති කිරීම සඳහා පද්ධති ප්‍රවේශයක්

- මහනුවර ප්‍රදේශයේ ගෙවතුවල කෘෂිකාර්මික ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා නිර්දේශ සකස් කිරීම : වට්ටප්පොල ග්‍රාමයේ සිදු කෙරෙන සිද්ධි අධ්‍යයනයක්

- වියළි කලාපයේ විශාල පරිමාණයෙන් වර්ෂාපෝෂිත ක්‍රමය යටතේ සිදුකරන බඩ ඉරිඟු- තල බෝග මාරු ක්‍රමයේ ඵලදායිතාව වර්ධනය කිරීම සඳහා නිර්දේශ සකස් කිරීම : මරදන්කැල්ල ග්‍රාමයේ සිදු කෙරෙන සිද්ධි අධ්‍යයනයක්

- පාංශු තෙතමනය රඳවා ගැනීම සහ ව්‍යාප්ත කිරීමෙහිලා, වැසිජල සංරක්ෂණ තාක්ෂණයන් මගින් ඇති කරන බලපෑම ඇගයීම

- විවිධ බෝග වගා ක්‍රම සඳහා කාර්යක්ෂම ජල සම්පත් කළමනාකරණ තාක්ෂණයන් හඳුන්වාදීම

- කන්න 2දීම එම ඉඩම්ම වගා කිරීම සඳහා කාර්යක්ෂම ජල කළමනාකරණ පිළිවෙත් හඳුන්වාදීම පිණිස සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම සහ ජල සංරක්ෂණ ක්ෂේත්‍ර ආදර්ශන පැවැත්වීම (ඉඩම් සංවර්ධනය සහ වැසි ජල සංරක්ෂණය)

- අතරමැදි කන්නයක් වගා කිරීම දිරි ගැන්වීම සඳහා සුදුසු ප්‍රදේශ (DL_{1a}) හඳුනා ගැනීම

- බෝග විවිධාංගීකරණය සඳහා මහවැලි "එච්" කලාපයේ සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම

- වාණිජමය කෘෂිකර්මය සඳහා උතුරු කලාපයේ නව ඉඩම් හඳුනා ගැනීම

- කෘෂිකර්මය සඳහා උතුරු කලාපයේ අත්හැර දැමූ ඉඩම් හඳුනා ගැනීම

- නැගෙනහිර කලාපයේ කුඹුරු ඉඩම් පිළිබඳ නිවැරදි තක්සේරුවක් කිරීම සහ අස්වැන්න ප්‍රරෝකථනය කිරීමේ ක්‍රමයක් සකස් කිරීම

- ශ්‍රී ලංකාවේ උප කෘෂි පාරිසරික කලාප තව දුරටත් පැහැදිලිව වෙන් කර ගැනීම

- ශ්‍රී ලංකාවේ පාංශු සිතියම වැඩිදියුණු කිරීම (උතුරු කලාපයේ පාංශු කාණ්ඩ පිළිබඳ සවිස්තරාත්මක සිතියම)

- උතුරු කලාපයේ නොගැඹුරු භූගත ජලය හා ජලයේ තත්වය පිළිබඳව තක්සේරු කිරීම

- කෘෂි පාරිසරික කලාප තුළ නියඟයට ගොදුරුවිය හැකි ප්‍රදේශ හඳුනා ගැනීම

- නියඟයෙන් ඇතිවන බලපෑම අවම කර ගැනීම සඳහා ඉඩම් මූලික කරගත් තාක්ෂණයන් ජනනය කිරීම

- යෝග්‍ය තාක්ෂණයන් මගින් ජලය අධිකව පැවතීම මගින් ඇතිවන බලපෑම අවම කර ගැනීම

- "යාය ක්‍රමය" පදනම් කර ගනිමින් පාංශු කළමනාකරණ පිළිවෙත් බිහි කිරීම

තාක්ෂණ ප්‍රචාරණය

- පාංශු හා ජල සංරක්ෂණය සහ ස්වාභාවික සම්පත් කළමනාකරණය පිළිබඳව නිලධාරීන් සහ ගොවීන් පුහුණු කිරීම

- නිර්දේශිත පාංශු සංරක්ෂණ ක්‍රියාමාර්ග ආදර්ශනය කිරීම

- කෘෂිකර්මය සඳහා වැසි ජලය සංරක්ෂණය කිරීම පිළිබඳ වැඩමුළුව (ජගත් ජල දින වැඩමුළුව)

- මොණරාගල දිස්ත්‍රික්කය තුළ සිදු කෙරෙන කෘෂිකාර්මික කටයුතු කෙරෙහි නියඟය මඟින් ඇති කරන බලපෑම අවම කර ගැනීම

තාක්ෂණික සහාය

- සංවර්ධන ව්‍යාපෘති සඳහා පාංශු සංරක්ෂණ හා වැසි ජල අපවහන කළමනාකරණ සැලසුම් පිළියෙළ කිරීම

- විවිධ ආයතනවලට පාංශු හා ජල සංරක්ෂණය පිළිබඳ තාක්ෂණික සහාය ලබා දීම

වෙනත් කාර්යයන්

- පාංශු සංරක්ෂණ පනත ක්‍රියාත්මක කිරීම
- කෘෂි දේශගුණික තත්වයන්, ඉඩම් හා ජල සම්පත් පිළිබඳ දත්ත මූලය නඩත්තු කිරීම
- කෘෂි කාලගුණ විද්‍යා නිරීක්ෂණ ජාලය නඩත්තු කිරීම
- සංවර්ධන ව්‍යාපෘති සහ පාරිසරික මෙහෙයුම් කමිටු සඳහා පාරිසරික අනුමැතිය ලබාදෙන තාක්ෂණික ඇගයීම් කමිටු වැනි තාක්ෂණික කමිටුවල නියෝජනය

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරී/සේවක සංඛ්‍යාව
අතිරේක අධ්‍යක්ෂ	01
පර්යේෂණ නිලධාරී	07
කෘෂිකර්ම නිලධාරී	02
විෂයානුගත විශේෂඥ	01
පර්යේෂණ සහකාර	02
කෘෂිකර්ම උපදේශක	06
වැඩසටහන් සහකාර	03
පාංශු සමීක්ෂක	05
පර්යේෂණ උප සහකාර	02
කළමනාකරණ සහකාර සේවය	07
කාර්යාල කාර්ය සහායක	01
රියදුරු	06
මුරකරු	02
කම්කරු	03
එකතුව	**48**

3.6 ව්‍යාප්ති පුහුණු අංශය

ව්‍යාප්ති හා පුහුණු අංශයේ අභිමතාර්ථය මෙරට ආහාර සුරක්ෂිතාව සහතික කිරීම සහ ගොවි ප්‍රජාවේ ජීවන තත්වය වැඩිදියුණු කිරීම පිණිස ආහාර බෝග ක්ෂේත්‍රය තුළ ඉහළම ඵලදායිතා මට්ටමක් අත්කර ගැනීමයි. මෙම අංශය මගින් ඉටු කරන කටයුතු තුළින් ව්‍යාප්ති, පුහුණු හා සංනිවේදන කටයුතු සහ කෘෂිකාර්මික අධ්‍යාපනය හා විභාග යන ප්‍රධාන ක්ෂේත්‍ර හතර කෙරෙහි අවධානය යොමු කෙර්. ව්‍යාප්ති හා පුහුණු අංශයේ අරමුණු ළඟා කර ගැනීම සඳහා අදාළ ක්ෂේත්‍ර තුළ පහත සඳහන් කටයුතු ක්‍රියාවට නැංවේ.

- ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම ආශ්‍රිත ප්‍රදේශවල අන්තර් පළාත් ඒකක 6 මගින් පවත්වන සෘජු ව්‍යාප්ති වැඩසටහන් මෙහෙයවීම
- අදාළ ප්‍රදේශවල පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමග සහයෝගිතා වැඩසටහන් පැවැත්වීම
- ව්‍යාප්ති කාර්ය මණ්ඩලය, ගොවීන් ව්‍යවසායකයින් සහ අනෙකුත් පිරිස් සඳහා සේවා සංස්කරණ පුහුණු මධ්‍යස්ථාන 3කදී, දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථාන 2කදී සහ ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානයේදී පුහුණු වැඩසටහන් පැවැත්වීම
- කුණ්ඩසාලේ, පැල්වෙහෙර, අඟුණකොළපැලැස්ස, වවුනියාව සහ කරපිංච යන කෘෂිකර්ම විද්‍යාලවල දෑවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම

  ගුවන්විදුලි ගොවි සේවා ඒකක 4, ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය, මුද්‍රණාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය යොදා ගනිමින් තොරතුරු එක්රැස් කිරීම, කළමනාකරණය කිරීම සහ බෙදා හැරීම
- ජංගම ව්‍යප්ති වැඩසටහන් සහ තරුණ ගොවි සමාජ කටයුතු කරගෙන යාම
- මී මැසි සංවර්ධන ඒකක දෙකෙහි කෘෂිකාර්මික සංවර්ධන කටයුතු සිදු කිරීම
- පොහොර ඒකකය මගින් කාබනික වගා වැඩසටහන් කරගෙන යාම
- කෘෂි ව්‍යාපාර සහ වෙනත් ක්ෂේත්‍ර බෝග සංවර්ධන වැඩසටහන් හා ගොවි කාන්තා කෘෂි ව්‍යාප්ති කටයුතු සිදු කිරීම
- බිබිලේ උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන ආයතනයේදී උද්‍යාන බෝග පිළිබඳ පුහුණු හා සංවර්ධන කටයුතු සිදු කිරීම

  වාරියපොල, අනුරාධපුරය සහ ලබුදූව යන කෘෂිකර්ම විද්‍යාලවලදී සහ බිබිලේ උද්‍යාන බෝග හා සංවර්ධන මධ්‍යස්ථානයේදී කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම

අයවැය

විවිධ වැය ශීර්ෂ යටතේ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම වගු අංක 3.6.1හි දැක්වේ.

වගු අංක 3.6.1 : වර්ෂික අයවැය - 2010 (රු.)

වැය ශීර්ෂය	ප්‍රතිපාදනය	වියදම	වියදම් %
මූලධන	27,200,000	20,038,000	74
පුනරාවර්තන	103,720,000	94,150,000	91
ව්‍යාපෘති			
පුහුණුව හා හැකියාවන් සහ නිපුණතා වර්ධනය	8,000,000	7,484,000	94
කෘෂිකර්ම පුහුණු ගොවිපළ	16,000,000	14,618,000	91
මාධ්‍ය වැඩසටහන	18,000,000	17,400,000	97
ගොවි කාන්තා කණ්ඩායම් හරහා ආහාර සහ පෝෂණ සුරක්ෂිතතාව ප්‍රවර්ධනය කිරීම	905,000	653,000	72
ශ්‍රී ලංකාවේ මී මැසි නිෂ්පාදනය වර්ධනය කිරීම	540,000	540,000	100
කෘෂි සේවා පියස හරහා ප්‍රජා මූලික බීජ නිෂ්පාදනය	600,000	514,600	86

අපි වවමු - රට නගමු වැඩසටහන යටතේ මාධ්‍ය වැඩසටහන් පැවැත්වීම	7,850,000	7,850,000	100
කුඹුදු ජල සම්පාදන තාක්ෂණය මගින් පලතුරු හා එළවළුවල ඵලදායිතාව වර්ධනය කිරීම	9,700,000	3,477,000	36
කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය කිරීම	48,500,000	30,826,000	64
ගෙවතු වගාව	6,000,000	5,900,000	98
වී ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමේ වැඩසටහන	2,000,000	2,000,000	100
එකතුව	**249,015,000**	**205,450,000**	**83**

ප්‍රගතිය

විශේෂ ව්‍යාපෘති

පුහුණුව සහ හැකියා හා නිපුණතා වර්ධනය

මෙම ව්‍යාපෘතිය යටතේ උප ව්‍යාපෘති 3ක් ක්‍රියාත්මක කරන ලදී.

- කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් සඳහා එක් වසරක පුහුණුව
  මෙම ව්‍යාපෘතිය යටතේ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 222දෙනෙකු සඳහා පුහුණුව ලබාදෙන ලදී.

- කෘෂිකර්ම විද්‍යාලවල පුහුණු කටයුතු සහ හැකියා හා නිපුණතා වර්ධනය
  මිලියන 2.142ක් වටිනා උපකරණ මිලදී ගෙන කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාවෙහි ඉගැන්වීම් කටයුතුවල තත්වය වැඩිදියුණු කිරීම සඳහා ලබාදෙන ලදී.

- සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ සහ ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානයේ ධාරිතාව සහ පහසුකම් වැඡිදියුණු කිරීම
  - පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම සහ පුහුණු මධ්‍යස්ථාන 3ක් සඳහා පුහුණු උපකරණ ආදිය ලබාදීම
  - ගන්නොරුව සේවා සංස්කරණ අභ්‍යාස ආයතනයේ පරිගණක පහසුකම් වැඩිදියුණු කිරීම
  - නේවාසිකාගාරවල තත්වය සහ ධාරිතාව වර්ධනය වන පරිදි පහසුකම් වැඩිදියුණු කිරීම
  - ප්‍රායෝගික පුහුණුව සඳහා අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම

කෘෂිකාර්මික පුහුණු ගොවිපළ

මෙම ව්‍යාපෘතිය යටතේ කෘෂිකර්ම විද්‍යාලවලට සේවා සංස්කරණ අභ්‍යාස ආයතනවලට සහ දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානවලට අයත් කෘෂිකර්ම පුහුණු ගොවිපළ ඉඩම් වැඩිදියුණු කරන ලදී.

මාධ්‍ය වැඩසටහන

- රූපවාහිනී වැඩසටහන් 100ක් නිපදවා සංස්කරණය කර විකාශනය කරන ලදී.
- ගුවන්විදුලි වැඩසටහන් 1,400ක්ද නිපදවා සංස්කරණය කර විකාශනය කරන ලදී.
- විවිධ තාක්ෂණික ප්‍රකාශනවල පිටපත් 2,409,272ක් මුද්‍රණය කර බෙදා හරින ලදී.

ගෙවතු සංවර්ධන වැඩසටහන

අනුරාධපුර, අම්පාර, හම්බන්තොට, හසලක, මොණාරාගල, සහ පොළොන්නරුව යන අන්තර් පළාත් ප්‍රදේශවල තෝරාගත් ගෙවතු 7,700ක් සංවර්ධනය කරන ලදී.

මෙම ගෙවතු සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍යද ලබාදෙන ලදී. ආදර්ශ ගෙවතු සංවර්ධනය කිරීමට අමතරව, අරලගංවිල සහ අඟුණකොළපැලැස්ස සේවා සංස්කරණ අභ්‍යාස ආයතනවල, වීරවිල දිස්ත්‍රික් කෘෂිකාර්මික පුහුණු මධ්‍යස්ථානයේ, අනුරාධපුර,කරපිංච, ලබුදූව, පැල්වෙහෙර,වවුනියා, අඟුණකොළපැලැස්ස, වාරියපොළ කෘෂිකර්ම විද්‍යාලවල සහ වල්පිට හා පස්යාල පර්යේෂණ ස්ථානවල පවතින ගෙවතුවල තත්වය වැඩිදියුණු කරන ලදී. එමෙන්ම, උද්‍යාන බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයේ පිහිටි ගෙවත්තද වැඩිදියුණු කරන ලදී.

ගොවි කාන්තා සංවිධාන හරහා ආහාර හා පෝෂණ තත්වය ප්‍රවර්ධනය කිරීම

වැයවන වියදමෙන් සියයට පණහකට ගොවි දුයකත්වය සහිත ජංගම අලෙවි ඒකක 21ක් ගොවීන්ට ලබාදෙන ලදී. එමෙන්ම, කෘෂිකර්මය, ආහාර හා පෝෂණය පිළිබඳ ජාතික මට්ටමේ ප්‍රශ්න විචාරාත්මක වැඩසටහනක්ද පැවැත්විණි.

ජාතික මී පැණි නිෂ්පාදනය වර්ධනය කිරීම

- මෙම ව්‍යාපෘතිය යටතේ මී පැණි නිෂ්පාදන ගම්මාන 30ක් සහ පුහුණු මධ්‍යස්ථාන 5ක් සංවර්ධනය කරන ලදී.
- නිලධාරීන් 100දෙනෙකු සහ මී පැණි නිෂ්පාදකයින් 650දෙනෙකු සඳහා විශේෂ පුහුණු සැසි පවත්වන ලදී.
- මී මැසි පෙට්ටි 400ක් සහ දුම් විසුරුවන 400ක් නිපදවන ලදී.

පලතුරු වගාවෙන් වැඩි අස්වැන්නක් ලබා ගැනීම සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ස්ථාපිත කිරීම

- ක්ෂුද්‍ර ජල සම්පාදන තාක්ෂණය හඳුන්වා දී පලතුරුවල ඵලදායිතාව වර්ධනය කිරීම පිණිස සහනදායී මිල ගණන් යටතේ ගොවීන්ට ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති 122ක් ලබාදීම.
- නිලධාරීන් සහ ගොවීන් සඳහා ක්ෂුද්‍ර ජල සම්පාදන පද්ධති භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් 22ක් පැවැත්වීම

කෘෂි සේවා පියස වශයෙන් හඳුන්වන කෘෂිකාර්මික සැපයුම් හල් පෞද්ගලික මට්ටමින් ස්ථාපිත කිරීම

මෙම ව්‍යාපෘතියේ අරමුණ දිස්ත්‍රික් මට්ටමින් "කෘෂි සේවා පියස " යනුවෙන් හඳුන්වන සැපයුම් හල් ස්ථාපිත කිරීම මගින් ගොවීන්ට කෘෂිකාර්මික තොරතුරු සහ යෙදවුම් සේවා ලබාදීමයි. මෙහි ඉලක්කය 2010 වසර අවසන් වනවිට එවන් ස්ථාන 19ක් පිහිටුවා විවෘත කිරීමයි.

කෘෂි තාක්ෂණ උද්‍යාන - ගන්නොරුව සහ බටඅත

පහත සඳහන් අරමුණු ළඟා කර ගැනීම සඳහා කෘෂි තාක්ෂණ උද්‍යාන දෙක නඩත්තු කරන ලදී.

- සජීවී ආදර්ශන මගින් ගොවීන්ට තාක්ෂණය ප්‍රචාරණය කිරීම
- පැරණි සහ නව කෘෂි තාක්ෂණයන් ආදර්ශනය කිරීම
- දේශීය සහ විදේශීය සංචාරකයින් අරමුණු කර ගනිමින් කෘෂි සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම
- කෘෂි තාක්ෂණික තොරතුරු සහ උපදෙස් ප්‍රචාරණය කරන මධ්‍යස්ථානයක් වශයෙන් ක්‍රියා කිරීම

2010 වර්ෂය තුළදී ගන්නොරුව සහ බටඅත කෘෂි තාක්ෂණ උද්‍යාන නැරඹීම සඳහා 202,584ක පිරිසක් පැමිණියහ.

කාබනික පොහොර නිෂ්පාදන සහ ප්‍රවර්ධන වැඩසටහන

ගොවීන් 5,293 දෙනෙකු සහ නිලධාරීන් 253දෙනෙකු සඳහා කොම්පෝස්ට් නිෂ්පාදනය පිළිබඳ පුහුණුව ලබාදෙන ලදී.

කොළ පොහොර නිෂ්පාදන වගාවන් පිළිබඳ ආදර්ශන 1309 ක් ද ආදර්ශන 3,466 ක් ද පවත්වන ලදී.

අන්තර් පළාත් ප්‍රදේශවල ව්‍යාප්ති කටයුතු

අන්තර් පළාත් ප්‍රදේශ තුළ 2010 වර්ෂයේදී ඉටු කරන ලද ව්‍යාප්ති කටයුතු පිළිබඳ තොරතුරු පහත වගු තුළ දැක්වේ.

වගු අංක 3.6.2 : අන්තර් පළාත් ප්‍රදේශ තුළ සිදු කරන ලද ව්‍යාප්ති කටයුතු

දර්ශකය	අන්. පළාත - අනුරාධපුරය		අන්. පළාත - පොළොන්නරුව		අන්. පළාත - මොණරාගල		අන්. පළාත- මහනුවර		අන්. පළාත - අම්පාර		අන්. පළාත - හම්බන්තොට		එකතුව	
	2009/10 මහ	2010 යල	2009/ 10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල
මුළු වී වගා බිම් ප්‍රමාණය (හෙ.) - යාය වැඩසටහන	29527	12553	31598	27404	13057	3417	13503	9688	75195	59006	15353	15465	178233	127533
වගා බිම් ප්‍රමාණය (හෙ.) යාය වැඩසටහන	1085	1239	14846	16834	816	1230	1613	76	42551	40325	10159	8492	71070	68196
ගොවීන් සංඛ්‍යාව	1641	3631	15718	13627	945	1390	2180	1305	26702	27335	12386	10258	59572	57546
යාය සංඛ්‍යාව	156	104	534	535	74	65	111	1086	1105	1195	239	215	2219	3200
උපරිම අස්වනු ආදර්ශන යාය (සරුකෙත) - වගා බිම් ප්‍රමාණය	537	695	1501	1732		77	1167	947	9550	9793	1250	1111	14005	14355
ගොවීන් සංඛ්‍යාව	867	1194	1213	1786		90	1635	76	10150	10182	1028	990	14893	14318
යාය සංඛ්‍යාව	126	68	117	128		6	70	59	497	494	66	44	876	799
මහා පරිමාණ නව ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් හඳුන්වාදීම	3	3	3	4	2		4	3			3	3	15	13
සුළු පරිමාණ නව ප්‍රභේද අනුවර්තන අත්හදා බැලීම් හඳුන්වාදීම			2	31	8						1	2	11	40

වගු අංක 3.6.3 : අන්තර් පළාත් ව්‍යාප්ති කටයුතු

දර්ශකය	අන්. පළාත අනුරාධපුරය		අන්. පළාත පොළොන්නරුව		අන්. පළාත මොණරාගල		අන්. පළාත මහනුවර		අන්. පළාත අම්පාර		අන්. පළාත හම්බන්තොට		එකතුව	
	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල
ගොවීන් සංඛ්‍යාව	4180	4885	19885	14215	1442	2178	11600	8652	2550	25581	11591	9820	51248	65331
කාබනික පොහොර භාවිතය සහ පාංශු සාරවත්භාවය අඟුරු යෙදූ බිම් ප්‍රමාණය (හෙ.)	500	147	1616	823	80	94	185	393	950	972	1448	1305	4779	3734
කාබනික පොහොර භාවිතය සහ පාංශු සාරවත්භාවය කාබනික පොහොර භාවිතය ප්‍රවර්ධනය කිරීම - වැඩසටහන් සංඛ්‍යාව			16	83	6		35		37	33	14	8	108	124
තුලිත පොහොර භාවිතය (කාබනික + අකාබනික) - යෙදූ බිම් ප්‍රමාණය	310	2469	5710				45780	46891	4069	4081.2	52318	56992.2		
ගොවීන් සංඛ්‍යාව		4491	7814				25050	25054	3841	3489	33382	36357		
නියැදි සංඛ්‍යාව			1	5	1				16		21	2		

වගු අංක 3.6.4 : අන්තර් පළාත් ප්‍රදේශවල ව්‍යාප්ති කටයුතු

දර්ශකය	අන්. පළාත අනුරාධපුරය		අන්. පළාත පොළොන්නරුව		අන්. පළාත මොණරාගල		අන්. පළාත මහනුවර		අන්. පළාත අම්පාර		අන්. පළාත හම්බන්තොට		එකතුව	
	ප්‍රගතිය													
	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල	2009/10 මහ	2010 යල
සහතික කළ බීජ නිෂ්පාදන වැඩසටහන- වගා බිම් ප්‍රමාණය (හෙ.)	122		317	202	16.2	52	62	84.6	760	741	168.1	295.2	1445.3	1374.8
වෙනත් ආයතන සමග සිදු කරන බීත්තර වී නිෂ්. වැඩසටහන-වගා බිම් ප්‍රමාණය (හෙ.)	112.4	208	272	115			12.2	8.6	280	265	13	55.2	689.6	651.8
සමෝධානික පළිබෝධ කළ. වැඩසටහන - බිම් ප්‍රමාණය (හෙ.)	292	202	262	410		63	102	11	815	698	346	597	1817	1981
සමෝධානික පළිබෝධ කළ.යාය සංඛ්‍යාව	28		23	18		6	10	15	32	27	25	30	118	96
වී, වෙනත් ක්ෂේත්‍ර බෝග,එළවළු හා පලතුරු පිළිබඳව ලබාදෙන ලද පුහුණු සංඛ්‍යාව	118	104	259	432	176	91	503	366	2602	677	405	191	4126	1861
කන්නය (යල/මහ) තුළ ස්ථාපිත කරන ලද ගොවි නිෂ්පාදන සමිති සංඛ්‍යාව	234	213	263	473	57	76			254	705	374	407	1182	1874

සංවර්ධන කාර්යයන්

වසර ආරම්භයේදී වී වගාවේ ඵලදායිතාව වර්ධනය කිරීමේ වැඩසටහන සඳහා රු. මිලියන 13.4 ක මුදලක් වෙන් කෙරිණි. එහෙත් වසරේ 2 වන කාර්තුවේදී අරමුදල් ප්‍රමාණය රු. මිලියන 2.0 දක්වා සීමා කෙරිණි. කෙසේ වුවද, අන්තර් පළාත් ප්‍රදේශ තුළ සැලකිය යුතු ජයග්‍රහණ අත්කර ගැනිණි. යාය සංකල්පය යටතේ, නිෂ්පාදනයේ තත්වය හා ප්‍රමාණය වර්ධනය කිරීම පිණිස ගොවි පුහුණු , ආදර්ශන සහ පැළෑටි සායන වැනි විවිධ තාක්ෂණ ප්‍රචාරණ කටයුතු රැසක් සිදු කරන ලදී. එමෙන්ම, අන්තර් පළාත් සහ පළාත් සභා ප්‍රදේශවල ඇති කුඹුරු ඉඩම්වල බෝග තීව්‍රතාව ඉහළ නැංවීම පිණිස වෙනත් බෝග කන්න මැද වගා කිරීම ප්‍රවර්ධනය කිරීමට අපි වවමු - රට නගමු වැඩසටහන මගින් සහාය දිණි. වසර තුළ ව්‍යාපෘති ප්‍රදේශය තුළින් පහත සඳහන් කාර්යඵල රැසක් වාර්තා විණි.

යාය සංඛ්‍යාව	758
යාය වැඩසටහන යටතේ ඇති ප්‍රදේශය	19,585
පවත්වන ලද පුහුණු සැසි සංඛ්‍යාව	2,483
පුහුණු කළ සංඛ්‍යාව	17,967

සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය - ගන්නොරුව

මෙය ජාතික මට්ටමේ ප්‍රධානතම කෘෂිකාර්මික පුහුණු ආයතනය වන අතර කෘෂිකර්ම නිලධාරීන්ගේ ව්‍යවසායකයින්ගේ, ගොවීන්ගේ සහ කෘෂිකර්මය සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශ්වයන්හි දැනුම, හා නිපුණතා වර්ධනය කිරීමේද ඔවුන්ගේ ආකල්ප වෙනස් කිරීමේද වගකීම දරයි. 2010 වර්ෂයේදී පවත්වන ලද පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 352ක් (මිනිස් දින 6958) වූ අතර එයින් වැඩසටහන් 80ක් නිලධාරීන් සඳහාද (මිනිස් දින 5811), වැඩසටහන් 7ක් ගොවීන් සඳහාද (මිනිස් දින 907) පවත්වන ලද අතර ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 38ක්ද (මිනිස් දින 709) පවත්වන ලදී. එමෙන්ම, වැඩමුළු/සම්මන්ත්‍රණ/ රැස්වීම්/ සාකච්ඡා 89ක්ද (මිනිස් දින 8848) එළිමහන් පුහුණු වැඩසටහන් 5ක්ද (මිනිස් දින 142) පැවැත්විණි.

සේවා සංස්කරණ පුහුණු ආයතනය - අඟුණකොළපැලැස්ස

මෙම ආයතනය කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නියැළි නිලධාරීන් සඳහාද ගාල්ල, මාතර සහ හම්බන්තොට යන පළාත් ව්‍යාප්ති දිස්ත්‍රික්කවල සිටින ගොවීන් සඳහාද සේවා සංස්කරණ ආයතනික පුහුණුවක් ලබාදෙයි. මෙම වසර තුළ පුහුණු වැඩසටහන් 95ක් (මිනිස් දින 3949ක්) පවත්වන ලද අතර එයින් වැඩසටහන් 42ක් නිලධාරීන් සඳහාද (මිනිස් දින 3036ක්) වැඩසටහන් 13ක් (මිනිස් දින 424ක්) ගොවීන් සඳහාද විණි. එමෙන්ම, වැඩමුළු / සම්මන්ත්‍රණ / රැස්වීම්/ සාකච්ඡා 4ක් (මිනිස් දින 186 ක් / ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 40ක් (මිනිස් දින 480ක්) සහ එළිමහන් පුහුණු පංති 5ක් (මිනිස් දින 234ක්) ද පවත්වන ලදී.

සේවා සංස්කරණ අභ්‍යාස ආයතනය, හංසයා පාලම - අරලගංවිල

මෙම ආයතනය විශේෂයෙන්ම මහවැල "බී", "සී", සහ "ජී", කලාපවල සහ අම්පාර, පොළොන්නරුව, මයියංගනය සහ මඩකලපුව යන ප්‍රදේශවල සිටින ගොවීන් සහ නිලධාරීන් සඳහා සේවා සපයයි. පවත්වන ලද මුළු වැඩසටහන් සංඛ්‍යාව 55ක් (මිනිස් දින 4667ක්) වූ අතර එයින් වැඩසටහන් 19ක් (මිනිස් දින 527ක්) නිලධාරීන් සඳහාද ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 41ක් (මිනිස් දින 1872ක්) හා එක් එළිමහන් පුහුණු වැඩසටහනක් (මිනිස් දින 35ක්) ගොවීන් සඳහාද විය.

ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය

අනුරාධපුර පුලියන්කුලම පිහිටි ගොවිපළ යාන්ත්‍රීකරණ පුහුණු මධ්‍යස්ථානය ගොවිපළ යන්ත්‍ර සූත්‍ර පිළිබඳ පුහුණුව ලබාදෙන ජාතික මට්ටමේ එකම ආයතනයයි. මෙම ආයතනය ට්‍රැක්ටර්, ජල පොම්ප, පැළෑටි සංරක්ෂණ උපකරණ, වී අස්වනු නෙළන යන්ත්‍ර, කොළ මඩින යන්ත්‍ර, සංයුක්ත වී අස්වනු නෙළන යන්ත්‍ර සහ අත් උපකරණ පිළිබඳ පුහුණු සැසි පවත්වයි. එයට අමතරව, මෙම ආයතනය ගොවි ප්‍රජාව අතර ක්ෂුද්‍ර ජල සම්පාදන තාක්ෂණයන් ප්‍රචලිත කිරීමේ ප්‍රයත්නයෙහිද නියැළෙයි. කෘෂිකාර්මික ක්ෂේත්‍රයෙහි නිරතව හිඳින ගොවීන් හා නිලධාරීන්ටද කෘෂිකර්ම පීඨ උපාධි අපේක්ෂකයින්ටද කෘෂි විද්‍යාල, කාර්මික විද්‍යාල හා පාසැල් සිසුන්ටද ගොවිපළ යාන්ත්‍රීකරණ කටයුතුවල නිරත පෞද්ගලික අංශයේ පිරිස්වලටද ගොවිපළ යාන්ත්‍රීකරණ පර්යේෂණ මධ්‍යස්ථානයේසේවා ලබාදෙනු ලැබේ. වසර තුළ මෙම ආයතනය නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන්ද (මිනිස් දින 3949) ගොවීන් සඳහා වැඩසටහන් 5ක්ද (මිනිස් දින 252) ගොවීන් සඳහා ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන් 34ක්ද (මිනිස් දින 3610) වැඩමුළු / සම්මන්ත්‍රණ / රැස්වීම් / සාකච්ඡා 5ක්ද (මිනිස් දින 272) එක් එළිමහන් පුහුණු වැඩසටහනක්ද (මිනිස් දින 20) පවත්වන ලදී.

දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය – වීරවිල්

වසර තුළ මෙම පුහුණු මධ්‍යස්ථානය මගින් ගොවීන් සඳහා පුහුණු වැඩසටහන් 13ක්ද නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 6ක්ද පාසැල් සිසුන් සඳහා පුහුණු වැඩසටහන් 11ක්ද පවත්වන ලදී. එමෙන්ම, කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන් 21දෙනෙකු (2009 කණ්ඩායම) සඳහා වූ එක් අවුරුදු පුහුණු වැඩසටහන 2010 මැයි මාසයේදී නිම කරන ලදී.

දිස්ත්‍රික් කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානය - අම්පාර

පවත්වන ලද මුළු පුහුණු වැඩසටහන් සංඛ්‍යාව 33ක් (මිනිස් දින 3324) වූ අතර ඉන් 9ක් නිලධාරීන් සඳහාද (මිනිස් දින 261) 15ක් ගොවීන් සඳහාද (මිනිස් දින 502) 9ක් අනෙකුත් පිරිස් සඳහාද (මිනිස් දින 841) විණි. එමෙන්ම, වැඩමුළු 20ක් (මිනිස් දින 670ක්) ක්ෂේත්‍ර චාරිකා 25ක් (මිනිස් දින 600) සහ ගොවීන් සඳහා එළිමහන් පුහුණු සැසි 6ක් (මිනිසි දින 250) පැවැත්විණි.

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන

ගොවි කාන්තා සංවිධාන හරහා ආහාර හා පෝෂණ තත්වය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘතිය මෙන්ම දින 150 තීව්‍ර සංවර්ධන වැඩසටහන යටතේ වූ වැඩසටහනක්ද පළාත් සහ අන්තර් පළාත් ප්‍රදේශ 28ක් තුළ ක්‍රියාත්මක කරන ලදී.

කාන්තා කෘෂිකර්ම ව්‍යාප්ති වැඩසටහන සම්බන්ධයෙන් ව්‍යාප්ති නිලධාරීන් 234දෙනෙකුට පුහුණුව ලබාදෙන ලදී. මානව පෝෂණ තත්වය, කෘෂිකාර්මික ව්‍යවසායකත්වය සහ සම්පත් කළමනාකරණය පිළිබඳව ගොවි කාන්තාවන් 25,057 දෙනෙකුටද පුහුණුව ලබාදෙන ලදී.

පුද්ගලයින් 1148 දෙනෙකුගේ සාමාජිකත්වයෙන් ගොවි සංවිධාන 456ක් පිහිටුවන ලදී.

වැයවන වියදම සඳහා ගොවි සහභාගිත්වය 50%ක් සහිත ප්‍රංගම අලෙවි ඒකක 31ක් ගොවීන් වෙනුවෙන් ලබාදිණි.

කෘෂි ව්‍යාපාර සංවර්ධන සහ තොරතුරු සේවා

මෙම ඒකකයට පැවරී ඇති වගකීම වන්නේ නව කෘෂි ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ දැනට පවතින ව්‍යාපාර වැඩිදියුණු කිරීමට අවශ්‍ය තොරතුරු සහ සේවා සැපයීමයි. වසර තුළ, කෘෂි ව්‍යාපාර සංවර්ධන සහ තොරතුරු සේවය විසින් කෘෂි ව්‍යාපාර සංවර්ධනය පිළිබඳ පුහුණු වැඩසටහන් 10ක් (මිනිස් දින 499) පවත්වන ලද අතර කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් අරමුදල් ප්‍රතිපාදනය කරන ලද, කෘෂි ව්‍යවසායකයින්ට අවශ්‍ය සේවා සපයන රාජ්‍ය - පෞද්ගලික අංශ සහයෝගිතා වැඩසටහනට සම්බන්ධ විශේෂ ව්‍යාපෘතියක් වන " කෘෂිසේවා පියස " ස්ථාපිත කිරීමේ කටයුතු සම්බන්ධීකරණයද කරන ලදී. මෙම ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික් මට්ටමින් " කෘෂි සේවා පියස " ඒකක 19ක් විවෘත කරන ලදී.

මීමැසි සංවර්ධන ඒකකය, බිඳුණුවැව - බණ්ඩාරවෙල

ප්‍රධාන මීමැසි පාලන ඒකකය බණ්ඩාරවෙල පිහිටුවා ඇති අතර එහි උප ඒකකයක් මාවතගම තිබේ. වසර තුළ ඉටු කරන ලද කාර්යයන්ට මීමැසි පාලන උපකරණ නිෂ්පාදනය, මී පැණි නිෂ්පාදනය හා සැකසුම් කිරීම, මී මැසි පාලනය පිළිබඳ පුහුණුව ලබාදීම සහ පෞද්ගලික අංශයේ නිෂ්පාදකයින් විසින් නිපදවන උපකරණ සහතික කිරීම, පෞද්ගලික සහ රාජ්‍ය සංවිධාන සමග මේ සම්බන්ධ සම්බන්ධීකරණ කටයුතුවල නියැළීම හා මීමැසි පාලනය වැඩිදියුණු කිරීමට අදාළ පර්යේෂණ කටයුතුවලට සහාය වීම ඇතුළත් විය.

වසර තුළ, මෙම ඒකකය විසින් මී පැණි කි.ග්‍රෑ. 307ක්, මී වද 73ක් සහ මීමැසි පෙට්ටි 826ක් නිෂ්පාදනය කරන ලදී. මී මැසි පාලනය පිළිබඳ පුහුණු වැඩසටහන් 04ක් නිලධාරීන් වෙනුවෙන්ද (මිනිස් දින 219) , වැඩසටහන් 11ක් ගොවීන් වෙනුවෙන්ද (මිනිස් දින 492) පවත්වන ලද අතර මීමැසි පාලන උපකරණ නිෂ්පාදනය පිළිබඳ පුහුණු වැඩසටහන් 4ක්ද (මිනිස් දින 86ක්) ක්‍රියාත්මක කරන ලදී.

තරුණ ගොවි සමාජ සහ ප්‍රංගම ව්‍යාප්ති සේවා ඒකකය

තරුණ ගොවි සමාජවල අරමුණු වන්නේ ගම් මට්ටමින් තිරසාර ගොවි සමාජ පිහිටුවීම, තම දෙපයින් නැගී සිටිය හැකි තරුණ පිරිසක් බිහි කිරීම, නව තාක්ෂණයන් පිළිබඳ දැනුමැති නව ගොවි පරපුරක් ඇති කිරීම, තරුණයින්ගේ ව්‍යවසායකත්ව හැකියාවන් වැඩිදියුණු කිරීම සහ කෘෂිකර්මය තුළින් විරුකියාව අඩු කිරීමයි. තරුණ පරපුර කෘෂිකර්මාන්තයට ආයකවීම දිරිගැන්වීම සඳහා දීප ව්‍යාප්ත මට්ටමින් වැඩසටහන් පවත්වන ලදී. නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් 07ක්, තරුණ ගොවි සමාජ සාමාජිකයින් සඳහා පුහුණු වැඩසටහන් 35ක්, සංස්කෘතික වැඩසටහන් 83ක්, ආගමික වැඩසටහන් 95ක්, අධ්‍යාපනික වැඩසටහන් 87ක් සහ සමාජීය වැඩසටහන් 87ක් ක්‍රියාත්මක කරන ලදී.

ජල සම්පාදන කළමනාකරණ සහ උසස් කෘෂි තාක්ෂණ ඒකකය

ක්ෂුද්‍ර ජල සම්පාදනය, ආරක්ෂිත කෘෂිකර්මය, පැපොල් බෝගය වැඩිදියුණු කිරීම (අපි වවමු – රට නගමු), පැළ තවාන් කළමනාකරණය සඳහා උසස් තාක්ෂණය සහ වාණිජමය වගාවෙහි නියැළී ගොවීන් හා රාජ්‍ය ආයතන අතර පොහොර මිශ්‍රිත ජලය යෙදීම ප්‍රචලිත කිරීම් අරමුණෙන් වසර තුළ මෙම ඒකකය විසින් වැඩසටහන් ක්‍රියාවට නගන ලදී.

එමෙන්ම මෙය, ක්ෂුද්‍ර ජල සම්පාදනය,ආරක්ෂිත කෘෂිකර්මය, විශාල පරිමාණයේ වාණිජමය ගොවිපළ පිහිටුවීමට අදාළ සේවා සැපයීම කළ අතර යටෝක්ත තාක්ෂණයන් පිළිබඳ ප්‍රධාන සම්පත් මධ්‍යස්ථානය වශයෙන් ක්‍රියා කළේය.

සැලසුම් සහ ප්‍රගති මෙහෙයුම් ඒකකය

සැලසුම් සහ ප්‍රගති මෙහෙයුම් ඒකකය ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම, මූල්‍ය සහ තාක්ෂණික කටයුතු සහ ව්‍යාප්ති හා පුහුණු අංශය විසින් ක්‍රියාත්මක කරන විශේෂ ව්‍යාපෘති මෙහෙයවීම සහ ඇගයීම පිළිබඳ වගකීම දරයි. මෙම ඒකකය අවශ්‍ය තොරතුරු අදාළ ආයතනවලට ලබාදෙන අතරම වාර්ෂික ක්‍රියාත්මකකිරීම් වැඩසටහන සඳහා අපේක්ෂිත ඉලක්ක පිළියෙල කිරීමෙහි සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තු වාර්ෂික වාර්තාව, මහ බැංකු වාර්තාව සහ අයවැය කථාව සඳහා ව්‍යාප්ති හා පුහුණු අංශයේ කාර්යයන් පිළිබඳ තොරතුරු ලබාදීමෙහි නියැළී සිටී. එයට අමතරව විශේෂ ව්‍යාපෘතියක් වන "මාධ්‍ය වැඩසටහනෙහි" සම්බන්ධීකරණ කටයුතුද මෙමගින් ඉටු කෙරේ.

රූපවාහිනී සහ ගුවන්විදුලි ගොවි සේවාව

මෙමගින් විවිධ ගුවන්විදුලි නාලිකා හරහා ප්‍රධාන වශයෙන්ම සිංහල සහ දමිළ භාෂාවලින් කෘෂිකර්මය අළලා ගුවන්විදුලි වැඩසටහන් දිවයින පුරාම විකාශනය කරන ලද අතර වසර තුළ එලෙස විකාශනය කරන ලද ගුවන්විදුලි වැඩසටහන් සංඛ්‍යාව 2,418කි.

ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය

ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය විසින් ගන්නොරුව හා බටඅත බිහිටි කෘෂි තාක්ෂණික උද්‍යාන දෙක නඩත්තු කෙරේ. 2004 වර්ෂයේදී ඝර්ම කලාපීය කෘෂිකාර්මික උද්‍යානයක් / කෘෂි විද්‍යා උද්‍යානයක්/ සජීවී බෝග කෞතුකාගාරයක් බවට පත් කරන ලද ගන්නොරුව කෘෂිකර්ම සංකීර්ණය අඛණ්ඩව ශිෂ්‍යයින්, ගොවීන්, කෘෂි ව්‍යවසායකයින් සහ සහ මහජනයා විශාල වශයෙන් ආකර්ශනය කර ගැනීමට සමත් විය.

ජාතික කෘෂිකාර්මික තොරතුරු ජාලය (සයිබර් කෘෂි ව්‍යාප්ති කටයුතු)

මෙම වැඩසටහනෙහි අරමුණ කෘෂිකාර්මික අංශය තුළ ශීඝ්‍ර තොරතුරු හුවමාරු යාන්ත්‍රණයක් ඇති කිරීම සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ පර්යේෂණ මධ්‍යස්ථාන, ව්‍යාප්ති හා පුහුණු මධ්‍යස්ථානය හා පෞද්ගලික අංශයේ ආයතන සමග සබඳතා සහිත සයිබර් ව්‍යාප්ති ඒකක (ග්‍රාමීය දැනුම කේන්ද්‍ර) සියලුම ගොවිජන කේන්ද්‍ර තුළ ස්ථාපිත කරීමේ කටයුතු සැලසුම් කිරීමයි. මෙය තවමත් මූලික අදියරෙහි පවතින හෙයින් සංයුක්ත තැටි (CD ROMs) භාවිත කර තොරතුරු බෙදා ගැරීමේ කටයුතු පමණක් සිදු කෙරිණි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය විසින් ෆ්ලිප් චාර්ට් තාක්ෂණය යොදා ගනිමින් මේ වනවිටත් නිර්මාණය කර ඇති සංයුක්ත තැටි (CD ROMs) ග්‍රාමීය මට්ටමින් ව්‍යාප්ති කටයුතුවල නිරතව සිටින සේවකයින්ට, අඩු පිරිවැයක් දරා ග්‍රාමීය මට්ටමින්ම පුහුණු පංති සඳහා ප්‍රයෝජනයට ගත හැකි ශ්‍රව්‍ය දෘෂ්‍ය ආධාරක නිපදවා ගැනීමට උපකාරී වනු ඇත. ගොවීන්ටද සජීවී නියැදි සයිබර් ව්‍යාප්ති ඒකකයට රැගෙනවිත් ඒවායෙහි ජායාරූප විද්‍යුත් තැපෑලෙන් පර්යේෂණ මධ්‍යස්ථාන කරා යැවීමට පිළිවන.

සයිබර් ව්‍යාප්ති කටයුතුවල අගය අවබෝධ කර ගැනීමෙන් පසු නැගෙනහිර පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් එම පළාත තුළ සයිබර් ඒකක 31ක් පිහිටුවීම පිණිස අරමුදල් ලබාදෙන ලදී.

කෘෂිකාර්මික අලෙවිකරණ කටයුතු සඳහා සහාය වීමේ පියවරක් වශයෙන් වාණිජමය මට්ටමේ ගොවීන් පිළිබඳ දත්ත මූලයක් ස්ථාපිත කිරීම තුළින් සයිබර් ව්‍යාප්ති කටයුතු සඳහා නව සංකල්ප

හඳුන්වා දෙන ලදී. ගොවි මහතාගේ නම, වගා කරන බෝග වර්ග, බෝග වගා කළ බිම් ප්‍රමාණය සහ බෝග පුරෝකථනය පිළිබඳ තොරතුරු මෙම දත්ත මූලයට අන්තර්ගත කරන ලදී.

2010 වර්ෂයේදී ශ්‍රව්‍ය දෘෂ්‍ය මධ්‍යස්ථානය විසින් ඉටු කරන ලද අනෙකුත් කාර්යයන් / නිපදවන ලද දෑ පහත දැක්වේ.

වීඩියෝ / ගුවන්විදුලි වැඩසටහන් 101ක් නිපදවන ලද අතර ග්‍රැෆික් සංනිවේදන 1622ක් පිළියෙළ කර පුහුණු සැසි 8ක්ද පවත්වන ලදී. එමෙන්ම ගාස්තු රහිත උපදේශක සේවාද සපයන ලදී.

තොරතුරු මධ්‍යස්ථානය

මෙම ඒකකයේ වගකීම වන්නේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මුද්‍රිත ප්‍රකාශන බෙදා හැරීමයි. ප්‍රධාන අලෙවි මධ්‍යස්ථානය පේරාදෙණියේ ස්ථාපිතව ඇති අතර උප අලෙවි මධ්‍යස්ථාන 34ක් දිවයින පුරා ව්‍යාප්තව ඇත. වගු අංක 3.6.5හි දැක්වෙන පරිදි වසර තුළ මෙම මධ්‍යස්ථානය විසින් ප්‍රකාශන පිටපත් 115,729ක් හා සංයුක්ත තැටි (CD ROM_S) 1387ක් බෙදා හරින ලද අතර එයින් උපයා ගන්නා ලද ආදායම රු.4,045,026කි.

වගු අංක 3.6.5 : ප්‍රකාශන අලෙවිය (සිංහල හා දෙමළ)

ප්‍රකාශනයේ නම	ප්‍රකාශන සංඛ්‍යාව සිංහල	දෙමළ
ගෙවතු වගාව	30,187	1,241
මීමැසි පාලනය	3,683	281
රෝගවලින් තොර කෙසෙල් වගාව	1,085	
බිම්මල් වගාව	5,267	349
දොඩම් සහ ජම්බුනාරං	2,061	
පෝෂණ තත්වය	54	
ආකන්ද බෝග පදනම් කරගත් ආහාර වට්ටෝරු	329	
පලතුරු බෝගවල සිටින කෘමි පළිබෝධ හඳුනා ගැනීම	627	145
ජල රෝපණ වගාව	303	
කුරු ඇඹරුල්ලා	466	
දේශීය බෝග පදනම් කරගත් ආහාර වට්ටෝරු	426	
අලිපේර		129
වර්ෂාපතනය සහ ශ්‍රී ලංකාවේ පාරිසරික කලාප	1,021	
පලතුරු බෝග පිළිබඳ පසු අස්වනු තාක්ෂණය	1,036	
කොමඩු වගාව	1,043	76
දේශීය බෝගවලින් බයිට්ස් " වර්ග නිපදවීම	1,303	
ඒකාබද්ධ පැළෑටි පෝෂණ ක්‍රමය	175	122
අඹ වගාව	1,531	
වී වගාවේ පොහොර භාවිතය	552	
වී වගාවට වැළඳෙන රෝග	3,064	139
කෘෂිකාර්මික තාක්ෂණය ලුහුඬින්	8,000	1,201
නිර්දේශිත වී ප්‍රභේද	723	143
ශ්‍රී ලංකාවේ කෘෂි පාරිසරික සිතියම	365	
පේර වගාව		118
රඹුටන් වගාව		160
මිදි වගාව		276
එළවළු වගාව	9,774	781
කාබනික පොහොර භාවිතය	9,584	691
කෙසෙල් වගාවේ ප්‍රධාන පළිබෝධ සහ රෝග	2,639	
අන්නාසි	934	
ලොකු ලූනු වගාව	597	541
ශාක රෝපණය	584	
සහතික කළ බිත්තර වී නිෂ්පාදනය	1,072	194
වී වගාවෙන් ඉහළ අස්වනු	1,341	282
කෘමි පාලන ක්‍රියාමාර්ග එකතුව	688	
බීජ ගබඩා	867	274
වැල් දොඩම්	865	
ස්වයං බීජ නිෂ්පාදන වැඩසටහන	662	
ශ්‍රී ලංකාවේ පලතුරු බෝගවල පෝෂණීය වටිනාකම	476	
පටක රෝපණය	1,202	
දේශීය ආහාර තාක්ෂණය	1,200	
සහලින් නව රස	1,070	
වම්බටු වගාව	407	
වී වගාවේ කෙෂේත්‍ර ගැටලු	2,075	239
දෙළුම් වගාව	1,550	373
මීපැණි නිෂ්පාදනය සඳහා මීමැසි පාලනය	613	
මැංගුස්	203	121
කොස් වගාව	94	82
කොහොඹ		190
දිවුල් වගාව		136
මිරිස් වගාව		381
කෙසෙල් වගාව		565

කෘෂිකාර්මික අධ්‍යාපනය

කුණ්ඩසාලේ, පැල්වෙහෙර, අඟුණකොළපැලැස්ස, වවුනියාව සහ කරපිංච පිහිටි කෘෂිකර්ම විද්‍යාල පහ මගින් දෑ අවුරුදු කෘෂිකර්ම ඩිප්ලෝමා පාඨමාලාව පවත්වයි. ලබුදූව, වාරියපොළ සහ අනුරාධපුර පිහිටි කෘෂිකර්ම විද්‍යාල විශේෂ පුහුණු මධ්‍යස්ථාන වශයෙන් ක්‍රියා කරන අතර කෘෂිකර්මය පිළිබඳ කෙටිකාලීන පාඨමාලා පවත්වයි. කෘෂිකර්ම පාසැල් පහ තුළ සිසුහු 226දෙනෙක් කෘෂිකර්ම ඩිප්ලෝමාවට අදාළ දෙවන වසර පුහුණු වැඩසටහනට සහභාගි වූහ. කෘෂිකර්ම පාසැල්වල සිටින සිසුන් සංඛ්‍යාව වගු අංක 3.6.6හි දැක්වේ. 2010 වර්ෂයේදී සිසුහු 106 දෙනෙක් ඩිප්ලෝමා සුදුසුකම ලබා ගත්හ.

වගු අංක 3.6.6 :2010 වර්ෂයේදී කෘෂිකර්ම විද්‍යාලවල සිටි සිසුන් සංඛ්‍යාව

කෘෂිකර්ම විද්‍යාලය	වසර	මාධ්‍යය						එකතුව	මුළු එකතුව
		සිංහල		දමිළ		ඉංග්‍රීසි			
		පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු	පිරිමි	ගැහැණු		
කුණ්ඩසාලේ	පළමු	33	29	17	12	08	10	109	207
	දෙවන	24	20	06	14	12	7	98	
අඟුණකොළපැලැස්ස	පළමු	22	10					32	82
	දෙවන	40	10					50	
පැල්වෙහෙර	පළමු	30	12					42	88
	දෙවන	38	08					46	
වවුනියාව	පළමු			10	08			18	50
	දෙවන			13	19			32	
කරපිංච	පළමු	23						23	23
	දෙවන								
එකතුව		**210**	**89**	**51**	**56**	**16**	**28**	**450**	**450**

කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් සඳහා පවත්වන එක් අවුරුදු ප්‍රායෝගික කෘෂිකර්ම පුහුණු පාඨමාලාව

මෙම පාඨමාලාවෙන් ඉලක්ක කරන කණ්ඩායම වන්නේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාරවරුන්ය. 2009/2010 වර්ෂය තුළ පුහුණු කරන ලද නිලධාරීන් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

- භාෂා ප්‍රවීණතාව සඳහා වන වාචික පරීක්ෂණ (සිංහල හා දමිළ)

නිතිපතා සිදු කෙරෙන වෙනත් කෘෂිකාර්මික වැඩසටහන් අන්තර් පළාත් ප්‍රදේශ

- වී වගා කළ යාය සංඛ්‍යාව - 73,332
- යාය වැඩසටහන යටතේ ඇති ප්‍රදේශය - හෙ. 249,742
- වී වගාව පිළිබඳ පුහුණු පංති සංඛ්‍යාව - 24,213
- වී වගාව පිළිබඳ පුහුණු පංතිවලට සහභාගි වූ පුහුණු වන්නන් සංඛ්‍යාව - 551,437

වගු අංක 3.6.7 : 2009/2010 වර්ෂයේ පුහුණු ප්‍රගතිය

පුහුණු මධ්‍යස්ථානය	පුහුණු කරන ලද කෘ.පර්.හා නිෂ්. සහ. සංඛ්‍යාව		පුහුණු කරනු ලබන මුළු කෘ.පර්. හා නිෂ්. සහ සංඛ්‍යාව
	1 වන කණ්ඩායම	2 වන කණ්ඩායම	
කෘෂිකර්ම විද්‍යාලය - අනුරාධපුරය	21	19	40
කෘෂිකර්ම විද්‍යාලය - වාරියපොල	36	40	76
කෘෂිකර්ම විද්‍යාලය - ලබුදූව	20	34	54
උද්‍යාන බෝග පුහුණු හා සංවර්ධන මධ්‍යස්ථානය - බිබිලේ	26	34	60
එකතුව	**101**	**128**	**229**

විභාග ඒකකය

මෙම ඒකකය මගින් 2010 වර්ෂයේදී පහත දැක්වෙන විභාග පවත්වන ලදී.

- කෘෂිකර්ම විද්‍යාල ප්‍රවේශ විභාගය (අයදුම්කරුවන් සංඛ්‍යාව - 255)
- ඩිප්ලෝමා පාඨමාලා විභාග (සිසුන් සංඛ්‍යාව - 416)
- කෘෂිකර්ම උපදේශකයින් සඳහා වන දෙපාර්තමේන්තු විභාග (කෘෂිකර්ම උපදේශකයින් සංඛ්‍යාව – 186
- කෘෂිකර්ම විද්‍යාලයීය එක් අවුරුදු පාඨමාලා විභාගය (කෘෂිකර්ම පර්යේෂණ සහ නිෂ්පාදන සහකාරවරුන් සංඛ්‍යාව – 198)
- ශ්‍රී ලංකා කෘ.සේ.නිලධාරීන්, කෘෂි ඉංජිනේරුවන්, රියදුරන් සහ බීජ කාර්මිකයින් සඳහා වන කාර්යක්ෂමතා වැඩමුළු විභාග
- සහතික කළ බීත්තර වී නිෂ්පාදන වැඩසටහන යටතේ පැවති බිම් ප්‍රමාණය - හෙ. 9116
- ස්වයං බීත්තර වී නිෂ්පාදන වැඩසටහන - සහභාගි වූ ගොවීන් සංඛ්‍යාව : 44, 388

කෘෂි තොරතුරු සංනිවේදනය

- "ගොවිකම්" සඟරාව මුද්‍රණය කර බෙදා හැරීම - පිටපත් 32,000
- "ඇග්ටෙක්" සඟරාව මුද්‍රණය කර බෙදා හැරීම – පිටපත් 28,800
- ගුවන්විදුලි වැඩසටහන් විකාශනය කිරීම - ගුවන්විදුලි වැඩසටහන් සංඛ්‍යාව 3,488 , කෙටි පණිවිඩ සංඛ්‍යාව - 3,036
- ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් පැවැත්වීම - ගුවන්විදුලි වැඩසටහන් සංඛ්‍යාව 720
- රූපවාහිනී වැඩසටහන් විකාශනය කිරීම – වැඩසටහන් සංඛ්‍යාව 100
- කෘෂි උපදේශන සේවා සැපයීම – පිළිතුරු සැපයූ ගොවි ගැටලු සංඛ්‍යාව - 37,200

පුහුණුව

- විවිධ කෘෂිකාර්මික විෂය ක්ෂේත්‍රයන් අළලා, නිලධාරීන්, ගොවීන්, පාසැල් සිසුන් සහ අනෙකුත් පිරිස් වෙනුවෙන් පුහුණු වැඩසටහන් 33,087ක් පවත්වන ලදී.

2011 වසර සඳහා සැලැස්ම

විශේෂ ව්‍යාපෘති

- මාධ්‍ය වැඩසටහන සඳහා අරමුදල් වෙන් කිරීම රු.මිලියන 20
- කෘෂිකර්ම විද්‍යාලවල සහ පුහුණු මධ්‍යස්ථානවල පුහුණු කටයුතු සහ හැකියාවන් වර්ධනය
- කෘෂි තාක්ෂණික උද්‍යාන - ගන්නොරුව / බටඅත
- අන්තර් පළාත් ප්‍රදේශවල කන්නය මැදදී රනිල බෝග වගා කිරීම
- කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය

- " අපි වවමු – රට නගමු " වැඩසටහන යටතේ මාධ්‍ය වැඩසටහන්
- අන්තර් පළාත් ප්‍රදේශවල වෙනත් ක්ෂේත්‍ර බෝග වගා කිරීම
- මී පැණි නිෂ්පාදනය වැඩි කිරීම
- වී වගාවේ ඵලදායිතාව වර්ධනය කිරීම
- ප්‍රජා මූලික බීජ නිෂ්පාදන වැඩසටහන
- බිබිලේ උද්‍යාන බෝග පුහුණු සහ සංවර්ධන ආයතනයේ බඩඉරිඟු වගා කිරීම
- ආදර්ශ ගම්මාන පිහිටුවීම
-

කාර්ය මණ්ඩලය

තනතුර	නිලධාරී/ සේවක සංඛ්‍යාව
වැඩ බලන අධ්‍යක්ෂ	01
නියෝජ්‍ය අධ්‍යක්ෂ	01
වැඩ බලන නියෝජ්‍ය අධ්‍යක්ෂ	02
සහකාර අධ්‍යක්ෂ	28
කෘෂිකර්ම නිලධාරී	13
කථිකාචාර්ය	61
විෂයානුගත විශේෂඥ	16
යාන්ත්‍රික ඉංජිනේරු	01
කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරී	27
වැඩසටහන් සහකාර	36
මාධ්‍ය සහකාර	03
ශ්‍රව්‍ය දෘෂ්‍ය සහකාර	05
කෘෂිකර්ම උපදේශක	349
පර්යේෂණ සහකාර	02
ගොවිපළ යාන්ත්‍රික උපදේශක	01
යාන්ත්‍රික නිලධාරී	01
කෘෂි ව්‍යාප්ති සේවා නිලධාරී	01
ජායාරූප ශිල්පී	01
අකුරු අමුණන්නා	03
කාර්මික (ශ්‍රව්‍ය දෘෂ්‍ය)	01
චිත්‍ර ශිල්පී	02
මී මැසි පාලක	06
මී මැසි ප්‍රදර්ශක	01
යන්ත්‍ර ශිල්පී	02
කාර්මික	05
යන්ත්‍ර පරිචාරක	03
සිනමා යන්ත්‍ර ක්‍රියාකරු	04
පුස්තකාලයාධිපති	01
පරිපාලන නිලධාරී	02
කළමනාකරණ සහායක සේවය	109
භාෂා පරිවර්තක (ඉංග්‍රීසි)	01
ගබඩා භාරකරු	03
පොත් බඳින්නා (මුද්‍රණාලය)	01
ගොවිපළ ලිපිකරු	05
වේලා සටහන්කරු	01
ස්ටුවර්ඩ්	01
අරක්කැමි	30
මුරකරු	60
සනීපාරක්ෂක කම්කරු	09
රියදුරු	71
ලොරි සහායක	04
පෑස්සුම්කරු	01
විදුලි ශිල්පී	02
පින්තාරුකරු	01
පස් අදින යන්ත්‍ර ක්‍රියාකරු	11
ජල පොම්ප ක්‍රියාකරු	01
යන්ත්‍රාගාර සහායක	02
කම්කරු (111 පංතිය)	250
එකතුව	**1,158**

4.1 පාලන අංශය

පාලන අංශයේ කාර්යභාරය තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අනුමැතිය ලබා ගැනීම නියමිත නිර්ණායකවලට අනුකූලව අයදුම්පත් කැඳවීම, අදාළ ලිඛිත විභාග / සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, අදාළ තනතුරු සඳහා වඩාත්ම සුදුසු අයදුම්කරුවන් තෝරා ගැනීම හා බඳවා ගැනීම, උසස්වීම් හා සම්බන්ධ සියලුම ගැටලු, කාර්යක්ෂමතා කඩයිම්, විනයානුකූල කරුණු යනාදිය සම්බන්ධයෙන් පෞද්ගලික ලිපිගොනු හරහා කටයුතු කිරීම වැනි රාජ්‍ය නිලධාරීන් හා සම්බන්ධ විවිධ ආයතනික කටයුතු ඉටුකිරීම මෙන්ම රජයේ සහ දෙපාර්තමේන්තුවේ ප්‍රතිපත්තිමය තීරණ සංනිවේදනය කිරීම වශයෙන් සංක්ෂිප්තව නිර්වචනය කළ හැකිය. මෙම අංශය විවිධ අභියාචනා සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිසම, මානව හිමිකම් කොමිසම, නීතිපති දෙපාර්තමේන්තුව, පාර්ලිමේන්තු උපදේශක කමිටුව සහ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කොමසාරිස් කාර්යාලය වැනි ආයතන සමඟද පරිපාලන කරුණු සම්බන්ධයෙන් අනෙකුත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු සමඟද කටයුතු කරයි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ මගපෙන්වීම සහ උපදෙස් පරිදි මෙම සමස්ත ක්‍රියාදාමයම සම්බන්ධීකරණය කිරීමේ වගකීම පාලන අංශය වෙත පැවරී ඇත.

අයවැය

2010 වර්ෂය තුළ ලද ප්‍රතිපාදන සහ දරන ලද වියදම වගු අංක 4.1.1හි දැක්වේ.

වගු අංක : 4.1.1 වාර්ෂික අයවැය – 2010 (රු.)

